(iii) "yamak anityada he dikveyi hō ? suva veyi hō ? vadālaha. Amāv. p. 96.

(iv) buduhu kavaraha ? Kohiya buduhu hō yi. Amāv.p.121.

## SOURCES OF DHARMAPRADĪPIKĀVA

There are three outstanding works in Sinhalese literature which shows the wide reading of their authors. These are Pañcikāpradīpaya of Sri Rāhula, Visuddhi-mārga-Sannaya of Parākramabāhu II and the present work, Dharmapradīpikāva of Gurulugōmi. Copious references are made in these works to other authors. In Dharmapradīpikāva Gurulugōmi has taken material from other works in two ways. He has extracted the very passages concerned or has represented the meaning of some passages or stanzas in Sinhalese. Of these the sources of the passages quoted

are given in the Appendix, according to their order of occurrence in the work. The sources of the ideas paraphrased or expanded in Sinhalese are given below:-

(1) Description of the 32 physical characteristics.(p.5-18).

(a) Sumaṅgalavilāsinī Lakkhaṇa Sutta Vaṇṇanā or

(b) " , Mahāpadāna Sutta "

(2) Description of the ability of the Buddha to make his voice audible to many spheres of Existence (p.21).

(a) Saṃyutta-Nikāya, Aruṇavatī-Sutta.

(b) Aṅguttara-Nikāya, Saraviññāpana-Sutta.

(c) Manorathapūraṇī, Tika-Nipāta-Vaṇṇanā.

(3) The four stages when Buddha's speech becomes most powerful. (p.28).

(a) Sumaṅgala-Vilāsinī, Brahmajāla-Sutta-Vaṇṇana.

(b) Aṅguttara-Nikāya, Catukka-Nipāta.

(4) Description of the wisdom of the Buddha (Ñāṇavilāsa)p.31. Niddesa-Pāli, Sāriputta-Niddēsa.

(5) Description of the term Bhagavat. (p.41) Visuddhimagga, Buddhānusaati-Niddesa.

(6) Description of Kāyabala. (p.50) Buddhavaṃsa-Aṭṭhakathā, Nidāna-Vaṇṇanā.

(7) Description of Ñāṇabala. (p.56)

(a) Majjhima-Nikāya and Commentary--Mahāsīhanāda sutta and Vaṇṇanā.

(b) Manoratha-Pūraṇī, Tika-Nipāta-Tiṭṭhāyatana Sutta Vaṇṇanā.

(8) Description of Caturvaisāradya. (p.56.)
Aṅguttara-Nikāya, Catukka-Nipāta.

(9) Description of Five Eyes. (p.57)
Niddesa-Pāli, Sāriputta-Niddesa.

(10) How Buddha was praised by gods and men. (p.62)
Aṅguttara-Nikāya, Pañcaka-Nipāta, Vagga, 4.
Kāraṇapāla-Sutta.

(11) How Buddha was an unparalleled gem. (p.65)
Paramattha-Jotikā, Commentary of the Sutta-Nipāta,
Ratana-Sutta-Vaṇṇanā.

(12) Fivefold daily routine of the Buddha, (p.66)
(a) ManorathaPūranī, Ekaka-Nipāta-Vaṇṇanā
(b) Sumaṅgalavilāsini, Brahmajāla Sutta

(13) Comment on the Infinite virtue of Buddha. (p.73)
Papañca-Sūdanī, Mahā-Saccaka-Sutta-Vaṇṇanā

(14) The unthinkable nature of Buddha's virtue. (p.74)
Aṅguttara-Nikāya, Catukka-Nipāta, Acinteyya-Sutta.

(15) Description of Sīhala Bhāsā. (p.78)
Based on the Mahāvaṃsa account of the arrival of
Vijaya.

(16) Description of the 'Three Mahāsāla' families. Dhpd.p.89.
Abhidhānappadīpikā (see under the word).

(17) Why parents are called 'Brahma'. (p.91)
Aṅguttara-Nikāya, Tika-Nipāta.

(18) Account of the span of life of Divine Beings. (p.105)
Aṅguttara-Nikāya, Aṭṭhaka-Nipāta, Visākhopama-Sutta

(19) Account of Vāsudeva etc. (p.135)
Paramattha-Dīpani, Petavatthu-Aṭṭhakathā-Dutiya Vagga-Kaṇhapeta-Vaṇṇanā.

(20) Story of Velāma.
(a) Aṅguttara-Nikāya, Navaka-Nipāta, Velāma-Sutta.
(b) Velāma-Jātaka.

(21) Story of Ānanda. (p.165)
Jātakaṭṭha-Kathā--Mahānāradakassapa-Jātaka.

(22) Story of 500 merchants. (p.181)
Saṃyutta-Nikāya, Devatā-Saṃyutta.

(23) Story of 1000 robbers. (p.183)
Sutta-Nipāta, Kapila-Sutta.

(24) Observance of Pausatha Sīla. (p.187)
Aṅguttara-Nikāya, Aṭṭhaka-Nipāta, Uposatha-Vagga, Anuruddha-Sutta.

(25) Manāpakāyika gods. (p.193)
Aṅguttara-Nikāya, Aṭṭhaka-Nipāta, Uposatha-Vagga, Anuruddha-Sutta.

(26) The reasons why women become beautiful. (p.195)
Aṅguttara-Nikāya, Catukka-Nipāta, Mallikovāda-Sutta.

(27) Description of Himālaya mountain (p.198).
Visuddhimagga, Buddhanussati-Niddesa.

(28) Sufferings of Birth. (p.232)

(a) Visuddhimagga.

(b) Papañca-Sūdanī, Sammāditthi-Sutta-Vannanā
Satipatthāna Sutta.

(c) Vibhaṅgappakarana--Sacca Vibhaṅga

(29) Evils of Jarā. (p.235)

(a) Visuddhimagga, sacca niddesa.

(b) Papanca Sūdani, Sammāditthi-Sutta-Vannanā
Satipatthāna-Sutta-Vannanā

(c) Vibhaṅgappakarana, Sacca Vibhaṅga.

(30) Description of Marana. (p.237)

See No. (29).

(31) An account of Saranagamana. (p.257)

Manorathapūranī, Duka-Nipāta, Adhikarana-Vagga.
Chatthama-Sutta-Vannanā.

(32) Story of an owl. (p.274)

Papañca-Sūdanī, Cūlasīhanāda-Sutta-Vannanā.

(33) Description of Satarasaṅgraha Vastu. (p.293)

Aṅgittara-Nikāya, Catukka-Nipāta.

(34) Story of King Mahāpanāda. (p.299)

Jātakattha-kathā, Mahāpanāda-Jātaka.

(35) Story of Mahāsudassana. (p.301)

(a) Mahāsudassana-Jātaka.

(b) Dīgha-Nikāya, Mahāsudassana-Sutta.

(36) How the pond built for Prince Siddhārtta was called celestial (p.312).
Manoratha-Purani, Tika-Nipata, Sukhumāla-Sutta-Vannana

(37) Story of Jotipāla. (p.314)

Jātakaṭṭha-Kathā -- Jotipāla-Jātaka.

(38) Story of Asadisa. (p.317)

Jatakaṭṭha-kathā--Asadisa-Jātaka.

(39) Description of the 3 palaces. (p.319)

Aṅguttara-Nikāya, Tika-Nipāta, Sukhumāla-Sutta and its commentary.

(40) Account of lineal measurement. (p.324)

Abhidhānappadīpikā (see under the words)

(41) Commotion created by the visit of the Bosat to Rājagaha. (p.329)

Jātakaṭṭhakathā, Nidāna-Kathā.

(42) Sensation created by Bosat's presence at Rājagaha.(p.330

Jātakaṭṭhakathā, Nidāna Khanda.

(43) How Bodhisatva rejected royal pleasures offered by Bimbisāra. (p.331)

(a) Sutta-Nipāta, Pabbajjā-Sutta.

(b) Jātakaṭṭha-Kathā, Nidāna-Kathā.

(44) Five great Dreams. (p.331)

Aṅguttara-Nikāya, Pañcaka-Nipāta, Supina-Sutta.

(45) Description of Uruvelā. (p.332)

(a) Samantapāsādikā, Mahāvagga, Uruvela-Khanda-Vannanā

(b) Manoratha-Pūranī, Catukka-Nipāta, Tatiya-Vagga, Uruvela -Sutta-Vannanā.

(46) Story of Kesī. (p.340)

Aṅguttara-Nikāya, Kesi-Sutta.

(47) How Buddha pleased Upaka and others. (p.341)

Mahāvagga-Pāli--Uruwela-Khanda.

(48) How Buddha visited Uruwelā. (p.345)

(a) Jātakattha-Kathā, Nidāna-Kathā.

(b) Mahāvagga-Pāli, Uruwela-Khanda.

(49) Story how the Buddha converted the 1000 Jatilas led by Uruwela-Kāsyapa. (p.346)

Mahāvagga-Pāli, Pātihāriya-Khanda.

(50) Account of Mahāpajāpatī. (p.357).

(a) Culla-Vagga, Bhikkhunī-Khandhaka.

(b) Manoratha-Pūranī, Ekaka-Nipāta, Etadagga-Pāli.

(51) Description of Pañcakalyāna. (p.359)

Dhammapadattha-Kathā, Visākhā-Sutta.

(52) Story how the gates of Jetavanārāma frightened a Polemic. (p.367).

Jātakattha-Kathā, Duka-Nipāta, Atthama-Vagga, Palāsī-Jātaka.

(53) How Buddha was given ovation on his arrival at Sāvatthi. (p.368)

Jātakattha-Kathā, Nidāna-Kathā.

(54) How amenable beings appear in the mental vision of Buddhas. (p.370).

Papañca-Sūdanī, Pāsarāsisutta-Vannanā.

(55) The two kinds of sermons (p.370)

(a) Manoratha-Pūranī, Ekaka-Nipāta-Vannanā.

Ekapuggala-Vagga.

(b) Papañca-Sūdanī--Anaṅgaṇa Sutta-Vannanā.

(56) Account of Craving. (p.372)

(a) Visuddhimagga, Paṭicca-Samuppāda-Niddesa.

(b) Aṅguttara-Nikāya, Tika-Nipāta.

(57) The mode of Buddha's preaching. (p.375)

Papañca-Sūdanī, Dhammadāyāda-Sutta-Vannanā.

(58) Two kinds of Kulaputtas. (p.385)

Papañca-Sūdanī, Bhayabherava-Sutta-Vannanā.

(59) Story how Buddha met Brahmin Droṇa. (p.386)

Aṅguttara-Nikāya, Catukka-Nipāta, Cakka-Vagga.

(60) Description of the Twin miracle. (p.388)

Dhammapadaṭṭha-Kathā, Yamaka-pāṭihāriya-Vatthu.

(61) The way the Buddha performed miracles. (p.393)

Paṭisambhidā-Pāli, Yamaka-Pāṭihāra-Kathā.

(62) Account of Melapalaṅdanā. (p.405)

Dhammapadaṭṭhakathā--Visākhā-Vatthu.

(63) Five emancipations. (p.415)

Sumaṅgala-Vilāsinī--Mahāpadāna-Sutta-Vannanā.

(64) Story of Sulu Kaliṅgu. (p.417)

Jātakaṭṭha-Kathā, Kāliṅga-Bodhi-Jātaka.

(65) "liyanaṅgalā-liya namāti aṅganan kusum namāti
atin gat muthara baṅdu malin galana diyadahara balā"
p.419.

This description occurring in the story of Sulu-Kaliṅgu is perhaps based on the following verse:-

"liyanaṅgalā kusum-patin galata silil biṅdu
suratañgili aginaṅganan-giliyena dimutu mutu pā."
Kavsiḷumiṇa, v.433.

(66) Tenfold duty of a Cakravarti monarch. (p.426).

Aṅguttara-Nikāya, Pañcaka-Nipāta, Cakkānuvattima Sutta.

(67) Fivefold musical instruments. (p.429).

Abhidhānappadīpikā. (see under 'Pañcaṅgika-Tūrya')

(68) Four noble truths. (p.429).

Vibhaṅgappakaraṇe, Sacca-Vibhaṅga.

(69) How Buddha tours the country.

PapañcaSūdanī, Ratha-Vinīta-Sutta-Vaṇṇanā.

(70) The four ways of sleep. (p.446)

(a) Aṅguttara-Nikāya, Catukka-Nipāta, Pañcama Paṇṇāsaka, Pañcama-Vagga.

(b) ibid. Aṭṭhakathā.

(71) Description of Tīrthakas. (p.447).

Manoratha-Pūraṇī, Tika-Nipāta, Titthāyatana-Sutta. Vaṇṇanā.

(72) Account of Lake Tapodā. (p.448).

Sāratthappakāsinī--Saṃyuttanikāyaṭṭhakathā.

(73) Account of Gotama-Tittha. (p.450).

Dīgha-Nikāya, Parinibbāna-Sutta.

(74) Account of Dasavatthu. (p.451).

(a) Culla-vagga-Pāli, Dutiya-Saṅgīti-Kathā.

(b) Mahāvaṃsa, Dutiya-Saṅgīti Kathā. Chap.4.

(75) Story how Dharmāsoka spent a lakh a day on Nigrodha Sāmaṇera. (p.455).

Mahavamsa. Chap. 5.

(76) How Śramanas are not found among heretics.Dhpd.456.
Papañca-Sūdanī, Cūlasīhanāda-Sutta.

(77) Analysis of Karma. (p. 457)
Manoratha-Pūranī. Tika-Nipāta, Catuttha-Vagga.
Catuttha-Sutta-Vannanā.

(78) Account of the 62 heretical faiths. (p.467).
Dīgha-Nikāya-Brahmajāla-Sutta.

(79) Account of Majjhima-Thera. (p.473).
Manoratha-Pūranī Ekaka-Nipāta.

(80) Some aspects of performing meritorious deeds. (p.477).
Based on citta-paricchedа of the Abhidammattha Saṅgaha.

(81) Sufferings eliminated by a Sotāpanna. (p.478).
Opamma-Samyutta, Nidāna-Vagga, Nakhasikhā-Sutta.

(82) How Ruvanmāli-Dāgaba was an unparalleled shrine in the world. (p.479).
(a) Based on Mahāvamsa, Ratanamāli-Cetiya-Vannanā or
(b) Pāli-Thūpavamsa. " " "

(83) How Novice Sonuttara brought relics from the Naga world. (p.481).
Probably based on the account given in Pāli Thūpavamsa.

(84) Account of the Five Disappearances. (p.482).
Manoratha-Pūranī, Ekaka-Nipāta, Ekapuggala-Vannanā.

(85) Account of the 4 Kulas. (p.489).

Papañca-Sūdanī, Upari-Pannāsaka; Sappurisa-Dhamma Sutta.

(86) Why the Bō Tree should not be struck with a weapon. (p.491).

Based on the account in Bahudhātuka-Sutta-Vannanā, of Papañca-Sūdanī, Upari-Pannāsaka.

(87) Account of Chaddanta-Lake. (p.493).

Sārasaṅgaha, Lokasaṃthita-Saṅgaha-Naya.

(88) Story of Mahale Viduriṅdunāvo. (p.495).

Based on the story found in Pāli Mahābodhivaṃsa itself.

* * *

# ධම්මප්‍රදීපිකාව

නමො තස්ස භගවතො අරහතො
සම්මාසම්බුද්ධස්ස.

---

අප බුදුන් [1]සාරාසඞ්ඛ්‍ය කප් සුවහස් මතුයෙහි කුලුණු නුවණින් යුත් මහතවුසක් වැ දිවකුරුබුදුන් හමු වැ අතට පත් නිවන් සසර සෙ පියා සතුන් සඳහා විදුනා සසරදුක් නිවන් සෙ ගෙනැ හව දුඃඛයට වැද පැරැමි පුරා තුසිපුර පැමිණ දසදහස් ලොධාහි දෙවිබඹුන්ගෙ අයජමෙන් කිඹුල්වත්හි උපද වැඩිවිය පැමිණ [2]මහභිනික්මන් කොට [3]පැවිදී වැ මහාවීර්‍ය කොට බොධිපර්‍යඞ්කාරූඩ වැ මාරවිජය කොට සර්‍වඥපදප්‍රාප්ත වැ භුනස්තෙන් නැඟී පූර්‍වොත්තර දිශාභාග යෙහි වැඩසිට සප්තාහයක් අනිමිෂලොචන යුගළයෙන් පුදන ලද ජයමහාබොධියැ තත්ප්‍රභව වූ විලරුහමහාබොධියැ තදවයව වූ ශාඛාමහාබොධියැ යන තුන්මහාබොධීන්ගෙ වංශයෙහි සහස්‍රශඃ විහක්ත පදයන් අතුරෙහි පරිකර්‍මානුකූල පද ගෙනැ වර්‍ණනා කරනු ලැබේ.

(1). යස්ස යනු චතුර්‍ථිපදයන් කෙරෙහි නාමපදයි. එහි චතුර්‍ථි පද නම් කවර යත්? නාමපදයැ ආඛ්‍යාතපදයැ උපසර්‍ගපදයැ නිපාතපදයි.

---

1 සාරාසඞ්ඛ්‍ය ABEF
2 මහාභිනික්මන් AB
3 පැවිදිව CEF

එහි "නාමපද" නම් සර්වාර්ථයන් නමන්නෙන් නාමපද නම් වෙ. එයින් කිහ:-

1. "යත්ත්‍රිලිඞ්ගං ත්‍රිවචනං සර්වාසු ච විභක්තිෂු
නමත්‍යර්ථෙන සර්වාර්ථාංස්තන්නාම තවයො විදුඃ" යි.

ක්‍රියාවාචකපද "ආඛ්‍යාත" නම් වෙ. එයින් කිහ:-

2. "යත්ත්‍රිකාලං ත්‍රිපුරුෂං ක්‍රියාවාචි ත්‍රිකාරකම්
අත්‍රිලිඞ්ගං ත්‍රිවචනං තදාඛ්‍යාතං ප්‍රචක්ෂතෙ" යි.

ක්‍රියාද්‍යොතක පද "උපසර්ග" නම් වෙ. එයින් කිහ:-

3. "යස්මාදුපසාජන්නර්ථාන් පදස්‍යොපරි ගච්ඡති
ක්‍රියායොගවහස්තස්මාදුපසර්ග ඉති ස්මාතඃ" යි.

[1]පදයන්ගෙ ආද්‍යන්තමධ්‍යයෙහි [2]නිපතිත වූ විවිත්‍රාර්ථපදයො "නිපාත" නම් වෙත්. එයින් කිහ:-

4. "යස්මාදාද්‍යන්තමධ්‍යෙෂු වාක්ප්‍රයොගවිශෙෂතඃ
නිපතන්ති විවිත්‍රාර්ථා [3]නිපාතාස්තෙ තු සංඥිතාඃ" යි.

[4]මෙ චතුර්ධපදයන්ගෙ ප්‍රයොග දක්වන්නට කිහ:-

5. "පදං චතුර්ධං ප්‍රොක්තං නාමාඛ්‍යාතොපසර්ගජම්
නිපාතජඤ්ච ශබ්දඥෛරශ්චඃ ඛල්වහිධාවති" යි.

මෙ ය "චතුර්ධ පද" නම්.

---

1 දක්වනලද පදයන් (ගෙ) ACEFG  2 නිපතත් වූ B
3 විවිත්‍රාර්ථාන්ති පාතාස්තෙන සංඥිතා B  4 මෙසෙ ABCEF

(2). <u>නිසින්නොව</u> යන තන්හි "එව" යන නිපාතය අයොග ව්‍යවච්ඡේදකයෑ අන්‍යයොගව්‍යවච්ඡේදකයෑ අත්‍යන්තායොගව්‍යවච්ඡේදකය" යි ත්‍රිවිධ වූයෙ අන්‍යයොගව්‍යවච්ඡේදක වෙ - එහි විශෙෂණයා කෙරෙන් පර කොට ප්‍රයොග කරනලද එවකාරය අයොගව්‍යවච්ඡේදක වෙයි. "වෛත්‍රො ධනුඛීර එව" යන තන්හි සෙයින් - විශෙෂ්‍යයා කෙරෙන් පර කොට ප්‍රයොග කරනලද එවකාරය අන්‍යයොගව්‍යවච්ඡේදක වෙයි. "පාථි එව ධනුඛීරඃ" යන තන්හි සෙයින් - ක්‍රියායෙන් පර කොට ප්‍රයොග කරනලද එවකාරය අත්‍යන්තායොගව්‍යවච්ඡේදක වෙයි. "නිලං සරොජමස්ත්‍යෙව" යන තන්හි සෙයින් - වාක්‍යයන් ව්‍යවච්ඡේදවල වන බැවින් නිපාතයා ප්‍රයොග නොකළද විවක්ෂාවශයෙන් ඔහුගෙ අර්ථ ප්‍රතික වෙ මැයි.

එයින් කිහ ධර්මකීර්ත්තිපාදයෝ:-

ඉ. "අයොගං යොගමපරෛරත්‍යන්තායොගමෙව ව
ව්‍යවච්ඡිනත්ති ධර්මස්‍ය නිපාතො ව්‍යතිරෙවකඃ.
විශෙෂණවිශෙෂ්‍යාප්‍යාං ක්‍රියයා ව සහොදිතඃ
විවක්ෂාතො'ප්‍රයොගෙ'පි කස්‍යාර්ථෝ'යං ප්‍රතියතෙ.
ව්‍යවච්ඡේදවලං වාක්‍යං යතශ්වෛත්‍රො ධනුඛීරඃ
පාර්ථො ධනුඛීරො නිලං 1/ සරොජමිති වායථා.
ප්‍රතියොගව්‍යවච්ඡේදස්තත්‍රාප්‍යාර්ථෙෂු ගම්‍යතෙ
තථා ප්‍රසිද්ධෙස්සාධර්ම්‍යාදවිවක්ෂානුගමාද්ධවතෙඃ" යි.

---

1/ සරොජමසති G

(3). <u>පත්තො සබ්බඤ්ඤුතං සත්ථා</u> යනුයෙන් දක්වනලද බුදුහු අනන්තාපරිමාණ ගුණ ඇතියො කිසෙයැ යත්? බුදුහු රූපවිලාසයෙනුද් වචනවිලාසයෙනුද් ඥානවිලාසයෙනුද් අචින්ත්‍යයහ, අවාච්‍යයහ, අතුල්‍යයහ, අවෙද්‍යයොයි-එවිහු අචින්ත්‍ය වන බැවින් චින්තාවිෂයාන්තික්‍රාන්තයහ, ආවාච්‍ය වන වන බැවින් වාග්විෂයාතික්‍රාන්තයහ, අතුල්‍ය වන බැවින් උපමා විෂයාතික්‍රාන්තයහ, අවෙද්‍ය වන බැවින් ඥානවිෂයාතික්‍රාන්තයහ. කපකුදු වූ දවස් තමන්සෙ ම වූ බුදුකෙනකුනුද් කියත් නො ගෙවෙන ගුණ ඇතියො- මහමුහුදැ හෙළ සිදුහතුළුදු කළදු සැළදු තම තමා පමණින් දිය ගන්නා සෙ එ බුදුරජහුගෙ ගුණමුහුදට වන් පසෙබුදුහුදු බුදුසව්වො ද තමන් තමන්ගෙ නුවණ පමණින් ගන්ති. ගුණපමණින් ගන්නට නොනිස්සො.

7. "ගඞ්ගාය වාලුකා ඛීයෙ උදකං ඛීයෙ මහණ්ණවෙ
මහියා මත්තිකා ඛීයෙ ලක්ඛෙන මම බුද්ධියා" යි.

ඥානගජිනා කරන්නට සමර්ථ වූ දම්සෙනෙවි සැරියුත් මහතෙරුන් වැනි මහාපුරුෂයනටත් අවිෂය වූ බුදුගුණ පුහුදුන් වැ කියම්හ යි සිතනු මදුරුදළින් විදුරුගිරි [1]විදුනාක් පිනහැඹිලිදළින් මහපොළොව උකුල්දෙනුවක් වැනි බැවින් තමහට අවිෂයවතුද් ප්‍රසාද පරවශ වැ ප්‍රවචන වහල් කොට ශ්‍රද්ධාබුද්ධිසම්පන්න ජනයන් සඳහා කතිපය ගුණයෙන් දක්වනු ලැබෙ.

බුදුන්ගෙ ගුණයෙහි පුහුදුනන් හා ද සව්පසෙබුදුන් හා ද සාධාරණගුණයො ඇත් ම යැ, අසාධාරණගුණයො ඇත් මැයි. එහි [2]තෙසු තිරිසනුන් හා සාධාරණ තණකබළ

---

1 විදුනාක් වැනි ABF 2 සෙසු B

ගඳැත්කුස දිරුණ සිවුදෑ ගද වන සෙයින් පුහුදුන් ආදීන් හා සාධාරණ වූ රූපශොභා ද් ධ්‍යානාභිඥාදිගුණයෝ ද් බුදු සතන්හි ලා අසාධාරණ වෙති, නො රන්බරණෙහි නො සිටුනා සිංහතෙල් සෙයින් දශබල චතුවෛශාරද්‍යාදි අසාධාරණ ගුණයෝ වූ කල නොබුදුසතන්හි ලා නොසිටිත්.

ඔවුන්ගෙ "රූපවිලාස" නමී කවරයත්? ද්වාත්‍රිංශත් මහාපුරුෂ ලක්ෂණයෙන් හා අශීතිඅනුව්‍යඤ්ජනයෙන් ප්‍රකාශිත රූපශොභායි

එහි "ද්වාත්‍රිංශන්මහාපුරුෂලක්ෂණ" නමී කවර යත්?
වදාළෙ මැ [1] නො බුදුන් විසින්:-

ඉ. "සුප්පතිට්ඨිතපාදෝ - හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි සහස්සාරානි සනෙමිකානි සනාභිකානි සබ්බාකාරපරිපූරානි - ආයතපණ්හි - දීඝඞ්ගුලි - මුදුතලුන හත්ථපාදෝ - ජාලහත්ථපාදෝ - උස්සංඛපාදෝ - එණීජඞ්ඝා - ඨිතකොව අනොනමන්තො උභොහි පාණිතලෙහි ජණ්ණුකානි පරිමසති පරිමජ්ජති - කොසොහිත වත්ථගුය්හෝ - සුවණ්ණවණ්ණෝ කඤ්චනසන්නිභත්තචෝ - සුඛුමච්ඡවී සුඛුමත්තා ජවියා රජෝ ජල්ලං කායෙන [2] උපලිම්පති - එකෙක ලොමෝ එකෙකානි ලොමානි ලොමකූපෙසු ජාතානි - උද්ධග්ගා ලොමෝ උද්ධග්ගා නි ලොමානි ජාතානි නීලානි අඤ්ජනවණ්ණානි කුණ්ඩලාවත්තානි පදක්ඛිණාවත්තකජාතානි - බ්‍රහ්මජුගත්තෝ -සත්තුස්සදෝ- සීහපුබ්බද්ධකායෝ- චිතන්තරංසෝ - නිග්‍රොධපරිමණ්ඩලෝ යාවතඤ්ඤ කායෝ තාවතඤ්ඤ ව්‍යාමෝ යාවතඤ්ඤ ව්‍යාමෝ තාවතඤ්ඤ කායෝ - සමවත්තක්ඛන්ධෝ - රසග්ගසග්ගී - සීහහනු - චත්තාලීසදන්තෝ - සමදන්තෝ - අවිවර

---

1 නූ B  2 උපලිම්පති ACEF

දන්තා - සුසුක්කදාඨා - පහූතජිව්හා - බ්‍රහ්මස්සරෝ කරවීකභාණී - අභිනීලනෙත්තා - ගොපඛුමා - උණ්ණා භමුකන්තරෙ ජාතා ඔදාතා මුදුතුලසන්නිභා - උණ්හීසසීසෝ" ති.

මෙහි සුප්පතිට්ඨිතපාදෝ යන තන්හි සුප්‍රතිෂ්ඨිතපාදතා නම් කවර යත්? අනුන් පතුල් බිම ඔබන කලෙ අග්‍රපාදතලය හෝ පාෂ්ණිය හෝ පාර්ශ්වය හෝ පෙරට වැ භූමිස්පර්ශ කෙරෙයි, පාදතලමධ්‍යයෙහි ජිද්‍ර හෝ වෙයි, පත්ල නහන කල ද් අග්‍රපාදතලාදීන් කෙරෙන් අන්‍යතරස්ථානයෙක් පෙරට වැ නැඟෙයි. මොවුන් පතුල් වූ කල සර්ෂපාදුකා සෙයින් එකපැහැර භූමිස්පර්ශ කෙරෙයි. එකපැහැර [1] නැඟේ- ඉදින් අනෙකශතපෝරුෂ නරක ප්‍රපාතයෙහි ඇක්මෙම් යි පය එයට වළවූයෙ වී නම් එ මෙ විගස වළතැන් හසුකා සෙයින් පිරෙයි, ගොඩතැන් හෙරිතල සෙයින් සම වෙ - දුර ඇක්මෙමියි පය නැඟුයෙ වී නම් ප්‍රාතිහාර්‍යවසානයෙහි සෙයින් මෙරුප්‍රමාණ පර්වතයෙකුදු හුයාපි [2] වෙයගබඩක් සෙයින් නැමී පාදසමීපයට උපගත වෙ.

එයින් කිහ:-

ඉ. "නින්නං ඨානං උන්නමති ගච්ඡන්තෝ ලොකනායකෙ
උන්නතඤ්ච සමං හොති පඨවී ච අචෙතනා .

පාසාණා සකඨරා චෙව කඨලා ඛාණුකණ්ටකා
සබ්බෙ මග්ගා විවජ්ජන්ති ගච්ඡන්තෙ ලොකනායකෙ

ගච්ඡතෝ බුද්ධසෙට්ඨස්ස හෙට්ඨාපාදතලං මුදු
සමං සම්ඵුසතෙ භූමිං රජසා නූපලිප්පති.[3]

නාගවික්කන්තචාරෝ සෝ ගමනෙ සොභතෙ ජිනෝ
වාරුං ගච්ඡති ලොකග්ඝෝ හාසයන්තෝ සදෙවකෙ" ති.

---

1 නැඟෙයි AB  2 වෙය අගබඩක් F  3 ලිම්පති E

මෙ සෙයින් සුප්‍රතිෂ්ඨිත වූ පාදතලද්වය ඇති වන බැවින් "සුප්‍රතිෂ්ඨිතපාද" නම් වෙත් බුදුහු.

හෙට්ඨාපාදතලෙසු චක්කානි ජාතානි යන තන්හි චක්‍රයො නම් [1] කවරහ යත්? බුදුන් දෙපත්ලෙහි දෙචක්‍රයෙක් විය. [2] එකෙකි චක්‍රයෙහි දහස් දහස් දැවි විය, නෙමිදු විය, නාභිදු වී. එ චක්‍රයෙහි පාදතලමධ්‍යයට වැ නාභි පැනෙයි, නාභි වටා සිටි වට රෙඛා පැනෙයි, නාභිමුඛ වටා සිටි වට පැනෙයි, ජිද්‍රමුඛ පැනෙයි, දැවි පැනෙයි, දැවියෙහි වට රෙඛා පැනෙයි, නෙමි පැනෙයි, නෙමි මණි පැනෙයි. එ වටා ස්වස්තිකයැ ශ්‍රීවත්සයැ නන්ද්‍යාවර්තයැ [3] සොවස්තිකයැ අවතංසකයැ වර්ධමානකයැ [4] භද්‍රපීඨකයැ ප්‍රාසාදයැ තොරණයැ ශ්වේතච්ඡත්‍රයැ ඛඩිගයැ තාලවෘන්තයැ මයූරහස්තයැ චාමරයැ උෂ්ණීෂයැ මණියැ [5] සුමනදාමයැ නීලොත්පලයැ රක්තොත්පලයැ රක්තපද්මයැ ශ්වේතපද්මයැ පූර්ණකලසයැ පූර්ණපාත්‍රයැ සමුද්‍රයැ [6] චක්‍රවාල පර්වතයැ හිමවත්පර්වතයැ මෙරුපර්වතයැ සූර්‍ය්‍ය මණ්ඩලයැ චන්ද්‍ර මණ්ඩලයැ සපරිවාර සතර මහාද්වීපයැ සපර්ණ් සප්තරත්න චක්‍රවර්තියැ දක්ෂිණාවෘත්තශ්වේතශඞ්ඛයැ ස්වර්ණමත්ස්‍ය සුගළයැ චක්‍රායුධයැ සප්තමහාගඞ්ගායැ සප්තමහාශෛලයැ සප්තමහාහ්‍රදයැ සුපර්ණරාජයැ [7] ගිඟුමාරයැ ධ්වජයැ [8] පතාකායැ ස්වර්ණ ශිවිකායැ ස්වර්ණ වාලව්‍යජනයැ කෛලාසපර්වතයැ සිංහරාජයැ ව්‍යාඝ්‍රරාජයැ වලාහකඅශ්වරාජයැ පොෂඨහස්තිරාජයැ වාසුකි නාගරාජයැ හංසරාජයැ වෘෂභරාජයැ [9] වේරාවණහස්ති රාජයැ ස්වර්ණමකරයැ චතුර්මුඛ ස්වර්ණනොකායැ සවත්සක ධෙනුයැ කිම්පුරුෂයැ කින්නරියැ කුරවිකයැ මයූරරාජයැ ක්‍රොඤ්චරායෙ චක්‍රවාකරාජයැ ජීවඤ්ජීවකරාජයැ ෂඩ්විධ දිව්‍යලොකයැ ෂොඩශවිධ බ්‍රහ්මලොකයැ යන මෙතෙක් [10] මඞ්ගල ලක්ෂණයො පැනෙත්.

---

1 කවරුහ A 2 එකිඑකි BCG 3 සොගන්ධිකයැ F
4 භද්‍රපීඨ DG 5 සුමනාදාමය DG 6 චක්‍රවාල G
7 ගිඟුමාරකයැ F 8 පතාකයැ EF 9 වේරාවත B 10 මඟුල් B

මෙ සෙයින් බුදුන් දෙපත්ලෙහි දහස් දහස් දැවි ඇති නිමි නැබසියො මඟුල්ලකුණුපිරිවරනලද[1] දෙවත්‍රලක්ෂණයො "චක්‍ර" නම් වෙත්.

ආයතපණ්ණි යන තන්හි ආයත වූ පාර්ෂ්ණි නම් කවර යත්? පිරිහුන් දික්විටමැ සෙස්සන් [2]අග්පතුල් [3]දිග්වෙයි, විටම්මුදුනෙහි සිහින් කකුල් වෙයි, විටම් [4]සැසපිවාක් වැනි වෙයි. බුදුනට වූ කල එසෙ නොවෙයි, බුදුන් පත්ලෙහි සතර භාගයෙන් දෙභාගයෙක් අක්පතුල් වෙයි, තුන්වන භාග යෙහි ජඞ්ඝා ප්‍රතිෂ්ඨිත වෙයි, සතරවන භාගයෙහි හිඳිඅගින් වටා තුබුවාක් වැනි රක්තකම්බල ගෙණ්ඩුකයක් බලු විටම් වෙයි. මෙසෙයින් දික්විටම් ඇතිවන බැවින් "ආයතපාර්ෂ්ණි" නම් වෙත්.

දීඝඞ්ගුලි යන තන්හි ඔවුන් දීර්ඝාඞ්ගුලි පරිදි කිසෙයැ යත්? අනුන් ඇතම් ඇඟිලි දික් වෙයි, ඇතම් ඇඟිලි ලුහුඬු වෙයි, බුදුනට වූ කල එසෙ නො වෙයි, බුදුන් [5]හස්ත පාදඞ්ගුලිහි මකුළුවන් ඇඟිලි සෙයින් දික්වැ මුලින් දළ වැ ක්‍රමයෙන් ගොස් අගින් සිහින් වැ නිර්ණාසතෛලයෙන් හසා වැටූ සිරියෙල්වැටි සෙයින් හොබිති. මෙ සෙයින් දිගැඟිලි ඇතිවන බැවින් "දීර්ඝාඞ්ගුලි" නම් වෙත්.

මුදුතලුනහත්ථපාදෙ යන තන්හි ඔවුන් මෘදුතරුණ වූ හස්තපාද ඇතිපරිදි කිසෙයැයත්? බුදුන් අතුල්පතුල් පහන් ගිතෙල් ගලා තුබූ සියක්වට පෙළෑ පුලුන්පෙද සෙයින් මෙලෙක් වෙයි. ජාතමාත්‍ර කුමාරයක්හුගෙ අතුල්පතුල් සෙයින් හැම කල්හි තරුණ වෙයි. මෙසෙයින් මෘදුතරුණ වූ අතුල්පතුල් ඇතිවන බැවින් "මෘදුතරුණ හස්තපාද" නම් වෙත්.

---

1 පිරිවරලද BG 2 අක්පතුල් G 3 දික් G
4 සැසපිවා BC 5 හස්තපාදඞ්ගුලිහු BEG

ජාලහත්ථපාදෙ යන තන්හි ඔවුන් ජාලහත්ථපාද පරිදි කිහෙයැ යත්? සෙස්සනට පැණඅත් පැණපා වෙයි, බුදුනට වූ කල අත සතර ඇඟිල්ලෝ ද පය පස් ඇඟිල්ලෝ ද එකප්‍රමාණ වැ ඔවුනොවුන් විනිවිද සිටිති, දැක්ෂ වඩුවකු විසින් යොදන ලද ජාල කවුළුවක් වැන්නහ. මෙසෙයින් යුග්ම වූ හත්ථපාද ඇතිවන බැවින් "ජාලහත්ථපාද" නමී වෙත්.

උස්සංඛපාදෙ යන තන්හි ඔවුන් උත්ඝඩ්ඛපාද පරිදි කිඹෙයැ යත්? අනුන් බොලට පිටිපය වෙයි, එසින් ඔවුන් පා ඇණපට සෙයින් තද වෙයි, කැමැතිසෙ නොපිරිවැටෙයි, යනුවත් පතුල් නො පැනෙයි. බුදුනට වූ කල[1] නැඟී මත්තෙහි ගුල්වයෝ පිහිටියහ, එසින් බුදුන් වඩනා කළැ නාභිය පටන් ගෙන ඌර්ධ්වකාය නැව සිටි රන්පිළිමයක් සෙසින් නිශ්චල වෙයි, අධඃකාය මැ වළිත වෙයි, සුවයෙන් පාදයෝ පරිවර්ත්තිත වෙයි, පෙරටද් පිටිපසද් දෙපාඬිඹයෙහිද් සිට බලනුවනට පාදතලයෝ පැනෙති, ඇතුන් පතුල් සෙ[2] පිටිපසැ සිට බලනුවනට මැ පැනෙන්නෙ නොවෙයි. මෙසෙයින් උත්ඝතවැ ප්‍රතිෂ්ඨිත වූ ගුල්වයන් ඇතිවන බැවින් "උත්ඝඩ්ඛපාද" නමී වෙත්.

එණීජංඝෂ යන තන්හි ඔවුන් එණීජඝ්ඝ පරිදි කිසෙයැ යත්? ඔවුන්ගෙ ජඝ්ඝා හත්පස්හි සම වැ සිටි මසින් පරික්ෂිප්ත වැ මනාකොට වඩනලද හැල්ගබී[3] සෙයින් පරිපූර්ණ වන බැවින් එණී මෘගයන්ගෙ ජඝ්ඝා වැනි වූ [4]නොසි ඔවිහු "එණීජඝ්ඝ" නමී වෙත්.

---

1 වඩනාබුදුන් B  2 සෙයින් B

3 ගැබී BDEFG  4 නුසි B

[1] ධීතරො අනොතමනෝ යනාදි තත්හි ඔවුන් සිට නො නැමී දෙදණ [2] පිරිමැදුනා පරිදි කියෙයැ යත්? සෙස්සො කුටිජ ගො වෙති, වාමන නො වෙති, කුටිජයන්ගෙ ඌරුවකාය අපරිපූර්ණ වෙයි, වාමනයන්ගෙ අධෝකාය අපරිපූර්ණ වෙයි, [3] ඔවුහු අපරිපූර්ණකාය වන බැවින් සිට නො නැමී දෙදණ පිරිමැදුනට අසමර්ථ වෙති, ඔවුහු වූ කල පරිපූර්ණ උභයකාය ඇතිවන බැවින් සිට නො නැමී දෙඅත්ලෙන් දෙදණ පිරිමදිත්.

කොසොහිතවත්ථගුයෝ යන තත්හි ඔවුන් කොශලයෙහි අවශ්‍ය වූ වස්ත්‍රගුහ්‍ය ඇතිපරිදි කියෙයැ යත්? වාසභවරවාරණ දීඝෙහි අධිගත යෙදිත් බුදුන්ගෙ පූරුෂඉන්ද්‍රියය සබ්බාකාරපරිපූර්ණ කණ්ඨිකාවන් බඳු කොශලයෙහි අවස්ථිත වෙයි, ප්‍රධාන වෙයි, මහ මැ වස්ත්‍රයෙන් ගුහ්‍ය කටයුතු වන බැවින් "වත්ථගුහ්‍ය" නම් වෙයි. මෙසෙයින් කොශලයෙහි අවස්ථිත වූ වත්ථගුහ්‍ය ඇති වන බැවින් "කොශොවහිතවත්ථගුහ්‍ය" නම් වෙත්.

සුවණ්ණවණ්ණෝ තණුතනුසන්හතත්තෙවෝ යන තත්හි ඔවුන් සුවර්ණවර්ණ පරිදි හා තනුතනුසන්හතත්ව පරිදි කියෙයැ යත්? දෑහිඳුලෙන් මැද දිවිදැසින් සටා ගෙරිසපරිකර්ම කොට නිම වූ ගතරන්පිළිමයක් සෙසින් සබ්බාකාරපරිපූර්ණ, තන සිනිදු මට බසුන් කදුන් යෙයින් පඟන් සිවිපැහැ [4] ඇතියවිහු.

සුඛුමච්ඡවී යන තත්හි ඔවුන් සියුම් සිවි ඇති පරිදි කියෙයැ යත්? බුදුන් සිව සියුම් වන බැවින් ධූලි හා දැඩි නො ගරීරයෙහි නො ඇලෙයි, [5] පදුමපත්‍රයෙහි උදකබින්දු යෙයින් විවර්ත වෙයි. අන්‍ය දෙවුවී වකාදි සත්ත්වයන් සඳහා ද බුදුහු මෙරෙති, [6] වාත හිමියන් මෙරෙත්මය. මෙසෙ සියුම් සිවි ඇතිවන බැවින් "සුඛුමච්ඡවී" නම් වෙත්.

එකෙකලොමෝ යන තත්හි ඔවුන් එකෙකි ලොමී ඇති පරිදි කියෙයැ යත්? යෙස්සත් එන් කූපයන්හි දෙදෙනන් තුනතුන්ද වෙයි, බුදුනට වූ කල එකකි කූපයෙහි එකෙකි ලොමී වෙයි, [7] එසිත් "එකෙකලොම" නම් වෙත්.

---

1 ධීතරොව AC  2 පිරිමදිනා DE  3 ඔහු CDF
4 පැ B  5 පදුම පත්‍රයෙන් B  6 වුත (තා) ABEF
7 එසෙයින් CE : එසෙහයින් ADF

උණ්හීසලොමෝ යන තන්හි ඔවුන් උඩුඅග්ලොමී ඇති පරිදි කිසෙයෑ යත්? ඔවුන්ගේ ශරීරයෙහි නිල වූ අඤ්ජනවර්ණ වූ රෝමයෝ දක්ෂිණාවර්ත වෑ ආවර්තපර්යන්තයෙහි ඌර්ධ්වාග්‍ර වෑ මුඛශෝභා බලනුවන් සෙයින් සිටිති, [1]එසින් මුදුන් "ඌර්ධ්වාග්‍ර රෝම" නමී වෙත්.

බ්‍රහ්මඋජුගාත්‍රතා යන තන්හි බ්‍රහ්මයා සෙයින් ඔවුන් සෘජු ගාත්‍ර ඇති පරිදි කිසෙයෑ යත්? බොහෝ සෙ සත්වයෝ ඝානධාතුයෙන් හෝ නැමෙති, කට්ප්‍රදේශයෙන් හෝ නැමෙති, ජාණුමණ්ඩලයෙන් හෝ නැමෙති, කට්ප්‍රදේශයෙන් නැමෙන්නාහු පිටට නැමෙති, තුඹු දෙකැහින් නැමෙන්නාහු පෙරට වෑ නැමෙති, දිඝී ශරීර ඇති ඇතමී තෙනෙක් පාඨීඛයෙන් වක් වෙති, ඇතමී තෙනෙක් උඩු බලා නක්ෂත්‍රරූ ගණනුවන් සෙයින් ඇවිදිති, ඇතමී තෙනෙක් අල්පමාංසරුධිර වන බැවින් ශුෂ්කසන්ධි වෑ වෙවුළමින් ඇවිදිති, මුදුනට වූ කල සෘජු වෑ උන්නත වූ ශරීරය දෙවිනුවර නැඟූ [2]රන්තොරණක් සෙයින් ශොභිතයෑ. මෙසෙ මහා බ්‍රහ්මයාගේ ගාත්‍ර සෙයින් සෘජු වූ දිඝීප්‍රමාණ වූ ගාත්‍ර ඇති වන බැවින් "බ්‍රහ්මඊජුගාත්‍ර" නමී වෙත්.

සත්තුස්සදෝ යන තන්හි ඔවුන් සප්තස්ථානයෙහි උත්සන්න පරිදි කිසෙයෑ යත්? ඔවුහු දෙඅත්පිටයෑ දෙඅංශකූටයෑ කන්ධයෑ යන මෙ සප්තස්ථානයෙහි පරිපූර්ණ වූ මාංසයෙන් උත්සන්නයෝ. අඹුන් අත්පිටද් පාපිටද් ශිරාජාල පැනෙයි, අංශකූටයෙහිද් කන්ධයෙහිද් අස්ථිකොටි පැනෙයි, ඔවුහු මනුෂ්‍ය ප්‍රේතයන් සෙයින් [3] වටහති, මුදුහු වූ කල එසෙ නො වෙති, මුදුන් මෙ සප්තස්ථානයෙහි පරිපූර්ණවූ මාංසොත්සද ඇතිවන බැවින් ප්‍රත්‍යන්ත ශිරාජාල වෙයි, සන්ධිඝාලිඩ්‍යාසඳුණ කන්ධ වෙයි, එසින් මුදුහු "සංපොත්සද" නමී වෙත්.

---

1 එසෙසින් CD  2 රූවත්තොරණක් B

3 වැටහෙති BDFG

සිහපුබ්බඞ්ගමෝ යන තන්හි බවුන් සිංහයාගෙ පූර්‍වාධිකාය බඳු වූ ශරීර ඇති පරිදි කිමයෑ යත්? සිංහයාගෙ පූර්‍වාධිකාය මෑ පරිපූර්‍ණ වෙයි, පශ්චිමකාය අපරිපූර්‍ණ වෙයි. බුදුනට වූ කල සිංහයාගෙ පූර්‍වාධිකාය වෙයින් සර්‍වකාය පරිපූර්‍ණයෑ වෙද සිංහය හට වෙයින් ඒ ඒ තන්හි චිතංතාඥතාදි විසින් ඊසංචිත විසංචිත වන්නෙ නො වෙයි. [1] දිග් වුවමනා තන්හි [1] දිග් වෙයි, පුඵුඩු වුව මනා තන්හි පුඵුඩු වෙයි, දළ වුව මනා තන්හි දළ වෙයි, සිහින් වුව මනා තන්හි සිහින් වෙයි.

එයින් වදාළෙ මුදුහු:-

10. "මනාපියෙව බො භික්ඛවෙ තථාගතෙ පඨවි පඨවිතෙ යෙහි අඞ්ගෙහි දිඝෙහි සොභති තානි අඞ්ගානි දිඝානි සණ්ඨහන්ති, යෙහි අඞ්ගෙහි රස්සෙහි සොභති තානි අඞ්ගානි රස්සානි සණ්ඨහන්ති, යෙහි අඞ්ගෙහි ථූලෙහි සොභති තානි අඞ්ගානි ථූලානි සණ්ඨහන්ති, යෙහි අඞ්ගෙහි කිසෙහි සොභති තානි අඞ්ගානි කිසානි සණ්ඨහන්ති, යෙහි අඞ්ගෙහි පුථුලෙහි සොභති තානි අඞ්ගානි පුථුලානි සණ්ඨහන්ති, යෙහි අඞ්ගෙහි චතූහි සොභති තානි අඞ්ගානි චතූනි සණ්ඨහන්ති."

මෙසයින් නානාපුඤ්ඤඵලඋපචිත්‍යයෙන් [2] විවිත්‍රිත වූ දශ පාරමිතයෙන් සර්‍වඥජ්ඤ වූ බුදුන්ගෙ ආකෘති භාවයට ප්‍රතිරූපයක් ලොකයෙහි [3] සර්‍වඥිප්පිති ඇති සර්‍වඥාධිමත්තු ඇති කරන්නට අසමර්‍ථයෙහ. මෙසයින් සිංහයාගෙ පූර්‍වාධිකාය වෙයින් පරිපූර්‍ණ වූ සර්‍වකාය ඇති වන බැවින් "සිංහපූර්‍වාධිකාය" නම් වෙත්.

චිතඤ්චරංසෝ යන තන්හි බවුන් චිත වූ අක්ඛාරංස ඇති පරිදි කිමයෑ යත්? "අක්ඛාරංස" නම් පිට දෙඅංසයන්ගෙ මධ්‍ය යෑ. ඉහ චිතයෑ- පරිපූර්‍ණයි. වෙස්සතට එ ස්ථානය නිමිත වෙයි. පිට දෙභාගයෝ වෙත වෙත පැනත්. බුදුනට

---

1 දිග් BG  2 විවිත්‍ර වූ EF  3 සර්‍ව ඥිප්ති ABG

වූ කල කටිය පටන් ගෙනෑ මාංසපටලයෙක් ස්කන්ධය දක්වා උද්ගත වෑ නැගී රන් [1] පුවරුවක් සෙයින් පිට වසා පිහිටියෙය. මෙසෙයින් විත වූ අන්තරාංස ඇතිවන බැවින් "විතාන්තරාංස" නම් වෙත්.

<u>නිග්‍රොධපරිමණ්ඩලො</u> යන තන්හි ඔවුන් න්‍යග්‍රොධපරිමණ්ඩල පරිදි කිසෙයැ යත්? යම්සෙ පනස් හත් වන බැවින් හො සියක් හත් වන බැවින් හො සම වූ ස්කන්ධ හා සම වූ ශාඛා ඇති න්‍යග්‍රොධය දිගිනුද් විස්තාරයෙනුද් සම පමණ වේද, එ සෙයින් මැ කයිනුද් ව්‍යාමයෙනුද් සම පමණ වේ. යම් පමණ කාය වී ද එ පමණ ව්‍යාම වෙයි, යම් පමණ ව්‍යාම වී ද එපමණ කාය වෙයි. අනුන්ගෙ කාය හො දිඝී වෙයි ව්‍යාම හො දිඝී වෙයි, මෙ එ සෙයින් විෂම වූ පමණ ඇත්තෙ නො වෙයි. මෙසෙයින් සම ප්‍රමාණ වූ කාය හා ව්‍යාම ඇතිවන බැවින් "න්‍යග්‍රොධපරිමණ්ඩල" නම් වෙත්.

<u>සමවත්තක්ඛන්ධො</u> යන තන්හි ඔවුන් [3] සමවූවෘත්ත ස්කන්ධ ඇති පරිදි කිසෙයැ යත්? ඇතම් කෙනක්නට කොකුන්ගෙ සෙයින් දිග් වූ ගල වෙ මයැ, වක් වූ පළල් වූ ගල වෙ මයැ, බණන කලැ ශිරාජාල පැනෙයි, මඳ වැ ස්වර නිර්ගත වෙයි, බුදුනට වූ කල එසෙ නො වෙයි, ඔවුනට සුවෘත්ත වූ රන්කලස කරන් බදු කඳට වෙයි, බණන කලැ ශිරාජාල නොපැනෙයි, මෙසයක්හුගෙ ගජිනා සෙයින් ගජිනා කරනුවන්ගෙ ස්වර මහත් වෙයි. මෙසෙයින් සමවට කඳට ඇතිවන බැවින් "සමවෘත්තස්කන්ධ" නම් වෙත්.

<u>රසග්ගසග්ගි</u> යන තන්හි ඔවුන් රසග්‍රාසාග්‍ර පරිදි කිසෙයැ යත්? රසයන්ගෙ ග්‍රාසය අදනය [4] කරන්නෙන්

---

1 පොරුවක් B 2 දිග් CDF
3 සමවෘත්තස්කන්ධ BEFG 4 කරවන්නෙන් ACD

"රසග්‍රාස" නම් වෙයි, රසනහරයාගෙ අග්‍ර වී [1]නොයි "රසග්‍රාසාග්‍ර" වෙ - බුදුන්ගෙ සත්සියයක් [2]රසහරණීහි ඌර්ධවාග්‍ර වැ ග්‍රීවායෙහි මැ ප්‍රතිමුක්තය හා තිලබීජයක් පමණ ආහාරයෙකුද් ජිහ්වාග්‍රයෙහි තබනලද්දෙ සර්ව ශරීරයෙහි ඔජස් අනුස්ථරණය කෙරෙයි. [3]එයින් මයැ ඔවුන් [4]ප්‍රධන් භූමියැ මහාවීර්‍ය්‍ය කරන කල්හි එකතණ්ඩුලාදීනුද් කුළුදුලක් පමණ මුංයුසයෙනුද් ශරීරයාපනා කෙළෙ. සෙස්සන්ගෙ ශරීරයෙහි එසෙ ඔජස් ස්ථරණය නො කරන බැවින් ඔහු බහ්වාබාධ වෙති. මෙ මහාපුරුෂලක්ෂණය අල්පාබාධතා සඞ්ඛ්‍යාත නිෂ්‍යන්දඵලවශයෙන් ප්‍රකට වෙයි. මෙසෙයින් රසයන්ගෙ ග්‍රාසයෙහි අග්‍ර වූ රසහරණීන් ඇතිවන බැවින් "රසග්‍රාසාග්‍ර" නම් වෙත්.

<u>සිහහනු</u> යන තන්හි ඔවුන් සිංහහනු පරිදි කිසෙයැ යත්? සිංහයාගෙ හනු සදාශ ඇතියවිහ. ඔහුගෙ අධස්තාත් හනුව මැ පරිපූර්ණ වෙයි, උපරිෂ්ඨාත් හනුව අපරිපූර්ණ වෙයි, බුදුනට වූ කල සිංහයාගෙ අධස්තාත් හනුව සෙයින් දෙ හනුව මැ පරිපූර්ණ වෙයි, පුරදෙළොස්වක[5] සඳ වැන්න. මෙසෙයින් සිංහයාගෙ හනු සදාශ හනු ඇතිවන බැවින් "සිංහහනු" නම් වෙත්.

<u>චත්තාලිසදන්තො</u> යන තන්හි ඔවුන් චත්වාරිංශද්දන්ත පරිදි කිසෙයැ යත්? උපරිෂ්ඨාත් හනුයෙහි පිහිටි දත් විස්සෙකැ අධස්තාත් හනුයෙහි පිහිටි දත් විස්සෙකැයි සතලිස් දත්හ. සෙස්සනට දත් සපිරි වන කලැ දෙතිසෙක් වෙයි, [6]බුදුනට සතලිසෙක් වෙයි. මෙසෙයින් සතලිස් දත් ඇති වන බැවින් "චත්වාරිංශද්දන්ත" නම් වෙත්.

---

[1] නුයි B වේනොයි E [2] රසහරණීහු BEFG [3] එහෙයින්මය AF
[4] පධන් CDG [5] වක් D [6] බුදුනට වූකල G

<u>සමදන්තො</u> යන තන්හි ඔවුන් සමදන්ත පරිදි කිසෙයැ යත්? සෙස්සනට ඇතම් දත් උස් වෙයි, ඇතම් දත් මිටි වෙයි, දන්තයො විෂම වෙති. බුදුනට වූ කල යපතින් සිදුනාලද සත්පතක් සෙයින් සම වෙති. මෙසෙයින් සම වූ දන්තයන් ඇති වන බැවින් "සමදන්ත" නම් වෙත්.

<u>අවිවරදන්තො</u> යන තන්හි ඔවුන් අවිවරදන්ත පරිදි කිසෙයැ යත්? සෙස්සන් දත් [1]කුම්භිරයන් දත් සෙයින් විරල වෙයි, [2]මත්ස්‍යමාංසාදි කන කලැ දත් අතුරු පිරෙයි. බුදුනට වූ කල පබළපත්හි බද විදුරුපෙළක් සෙයින් අවිවරයැ. තෙලි තුඩින් දක්වනලද පරිච්ඡෙද බදු දත් වෙයි. මෙසෙයින් අවිවර වූ දන්තයන් ඇතිවන බැවින් "අවිවරදන්ත" නම් වෙත්.

<u>සුසුක්කදුඨො</u> යන තන්හි ඔවුන් සුශුක්ලදංෂ්ට්‍රා ඇති පරිදි කිසෙයැ යත්? සෙස්සන් පූතිදන්තයො නැගෙති, එයින් ඇතම් දංෂ්ට්‍රා කෘෂ්ණ වෙ මයැ, විවර්ණ වෙ මයැ. බුදුනට වූ කල සුෂ්ඨු ශුක්ලදංෂ්ට්‍රායැ, දවහත්කරු [3]දිලියෙන ප්‍රභායෙන් සමන්වාගතයැ. මෙසෙයින් අතිධවලදංෂ්ට්‍රා ඇතිවන බැවින් "සුශුක්ලදංෂ්ට්‍ර" නම් වෙත්.

<u>පහූතජිව්හො</u> යන තන්හි ඔවුන් ප්‍රභූතජිහ්වා ඇති පරිදි කිසෙයැ යත්? සෙස්සන් දිවි ස්ථූල වෙ මයැ, කෘශ වෙ මයැ, ලුහුඬු වෙ මයැ, බදදිවි වෙ මයැ, විෂමදිවි වෙ මයැ. බුදුනට වූ කල මෙළෙක් වූ දික් වූ පළල් වූ වර්ණසම්පන්නවූ දිවි වෙයි. බුදුහු ඒ ලක්ෂණය නිශ්චය කරනු සඳහා ආටන්ගෙ කාඩීක්ෂා හරනා සඳහා මෙළෙක් වන බැවින් දිව කෙළින් හිදක් සෙයින් වටාගෙනැ දෙනාසිකාච්ඡිද්‍ර පිරිමදිති. [4]දිඟුවන

---

1 කුම්භිල BCDE 2 මත්ස්‍යමාංසාදිය CEFG

3 දිලියෙන B 4 දික් BDEFG

බැවින් දෙකණ්ඩල පිරිමදිති. පළල් වන බැවින් කෙහෙන්න පර්‍යවසාන කොට ඇති සියලු ලොවය ප්‍රභාදනා කෙරෙත්. මෙසෙයින් මුලුතු දිවි මෙලෙස් පරිදි දින් පරිදි පළල් පරිදි ප්‍රකාශ කෙරෙමින් බවුන්ගෙ කාඩිසා විනොදනය කෙරෙත්. මෙසෙයින් ලීලසාණසම්පන්න ජිහ්වා ඇති වන බැවින් "ප්‍රභූතජිහ්ව" නම් වෙත්.

මුහුසාරෝ කරවීනහාති යන තන්හි බවුන් මුහුසාර පරිදි කිපෙයැ යත්? පෙස්සෝ ඒකාසාර වෙත් මයැ, තින්න සාර වෙත් මයැ, කාකසාර වෙත් මයැ. මුලුතු වූ තල මහා මුහුයාගෙ සාර සදෘශ සාරයෙන් සමන්විතයහ. මුහුයාගෙ සාර තින්න ලොහිතාදින් අපරිරූඩ වන බැවින් විභූඩ වෙයි. මුලුතුද් විසින් කරතලද පින්කම් බවුන්ගෙ වසූ සොධයි, වසූතු භූඩ වන බැවින් කාසිය පටන්ගෙන සමුකීර්ණ වන සාරයවිභූඩ වැ අසොඩ සමන්විතත වැ සමුකීර්ණ වෙයි. කුරවිඤවිල්ලන් හඩ සෙයින් මධුර වෙ මැයි. බවුන් මධුර රස ඇති ආම්‍රඵල කුඩින් පැහැර පළාපියා වැනෙහ අඹරස බී පසුකාල දී කුල්තා කල්හි වතුෂ්පාදයිහු ධර්මදේශිතයන් සෙයින් ලලිතාරම්භ කෙරෙත්. මෙවරයෙහි [1] වර්ණිත වූ වතුෂ්පදයෝ මුඛයෙන් ගත් තණකමල් කෙළාපියා සිට එහෙ අසත්, වඩමානයෝ සුළුමානයන් ලුහුබඳනාහු තෙක් ගත් පා ඛහා කෙ තබා සිට අසත්, සුළුමානයෝ මරණභය පියා සිට අසත්. අහසින් යන පක්ෂීහු ද් පක්ෂප්‍රසාරණ [2] කෙ කොට සිට අසත්. දියෙහි මත්ස්‍යයෝ ද් කණ්ඨපටල කෙ සෙල්වා සිට අසත්. මෙබඳු කුරවිරුවට අභාගයෙන් කෙ සහස්‍ර භාගයෙන් කෙ වැඩි මධුරතර සාර ඇතියවින මුලුතු. මෙසෙයින් බහු මහා මුහුයාගෙ සාරසදෘශ ඇතිවන බැවින් "මුහුසාර" නම් වෙත්.

---

[1] වර්ණිත ABCDEF [2] කොට ABF

<u>අභිනීලනෙත්තො</u> යන තන්හි ඔවුන් අභිනීලනෙත්‍ර පරිදි කිසෙයැ යත්? බුදුන් සියලු [1]නුවන් මැ නිල්වන්නෙ නොවෙයි, නිල් වුව මනා තන්හි දියමෙරලියමල්සුදුසු ඉතා පිරිසුදු නිල් පැහැයැ, රන්වන් වුව මනා තන්හි කිණිහිරිමල්සුදුසු රන්වන් පැහැයැ, රත් වුව මනා තන්හි බඳුවදමල්සුදුසු රත්පැහැයැ සුදු වුව මනා තන්හි දවහත්තරු සුදුසු සුදුපැහැයැ, කළු වුව මනා තන්හි රුක්පෙණෙලඇටසුදුසු ඉතා පිරිසුදු කළු පැහැයැ. නෙත්‍ර සුගළයො රන්විමනෙක්හි නැඟූ මිණිසිවුමැදුරක්[2] සෙයින් [3] වටහති. මෙ සෙයින් අභිනීල වූ නෙත්‍රයන් ඇති වන බැවින් "අභිනීලනෙත්‍ර" නම් වෙත්.

<u>ගොපඛුමො</u> යන තන්හි ඔවුන් ගොපක්ෂ්ම ඇති පරිදි කිසෙයැ යත්? මෙහි "පක්ෂ්ම" නම් සකල අක්ෂිගුලයැ. හෙ කළු වස්සහට බහලධාතුක වෙයි, රතු වස්සහට විප්‍රසන්න වෙයි, එබැවින් එවිගස උපන් රතු වස්සක්හුගෙ අක්ෂිගුලසදෘශ වූ අක්ෂිගුලයැ. සෙස්සන්ගෙ අක්ෂිගුලයො අපරිපූර්ණ වෙති, විනිර්ගත වූ ගම්භීර වූ අක්ෂිගුලයො වෙති. බුදුනට වූ කල දෙව මැද තුබූ මණිගුලිකා සෙයින් මෙළෙක් සිනිඳු නිල් සියුම් අක්ෂි ගුලයො වෙත්. මෙසෙයින් එවිගස උපන් රතු වස්සක්හුගෙ අක්ෂිගුලසදෘශ වූ අක්ෂිගුල ඇති වන බැවින් "ගොපක්ෂ්ම" නම් වෙත්.

<u>උණ්ණා හමුකන්තරෙ ජාතා</u> යනාදි තන්හි ඌර්ණාරොම නම් කවර යත්? එ ලොම් නළල්මැද වූයෙය. ඉතා පිරිසුදු දවහත්තරු වැන්න. පහන් ගිතෙල ගලා තුබූ සියක්වට පෙළැ පුලුන් පෙදක් සෙයින් මෙළෙකැ. හිඹුල්පුලුන් ලියපුලුන් හා සමානයැ. එ[4]රොමයො කෙළවර ගෙනැ අදනාලද්දහු අඩිබාහුප්‍රමාණ වෙති, විහුදුනාලද්දහු දක්ෂිණාවර්ත්ත විසින්

---

1 නුවන ම B 2 සිහිමැදුරක් CDE
3 වැටහෙති BDG 4 ලොමයො A

ආවර්ජිත වූ උඩුගු වූ සිටියි.[1] සක්‍රීය වලාකමධ්‍යයෙහි තුබූ රජතබුද්බුදයක් සෙයින් සක්‍රීය කලාපයෙන් නික්මෙන කිරණාවලී සෙයින් අරුණප්‍රභාරඤ්ජිත ගගනතලයෙහි [2]ඔහටිභාරකා සෙයින් අනිමංඛාභරා වූ දිස්සි. මෙය "උෂ්ණරෝම" නමි.

<u>උණිසසිංහා</u> යන නන්හි බවුන් උණිෂශීර්ෂ පරිදි සිංහයෑ යන් පරිපූර්ණලලාටා ද් පරිපූර්ණශීර්ෂා ද් ගෙනෑ සියන [3]ලද්දෙය. බුදුන් දකුණුනන්සිළ පවත් ගෙනෑ මහා පටලයෙක් සලුත්වී නවෑ සියලු නළල වසාපුරා ගොස් වමි නන්සිළ සිටියෙයෑ. රජතු නළල මැද රන්පටක් සෙයින් දිලියෙයි, පශ්චිමඅවික මොටසඑයන්ගෙ මෙ ලක්ෂණය දැන රජතට උණිෂපට බළහ, මෙ එක් අවියෙකැ. සෙසු ජනයෝ අපරිපූර්ණශීරස් ඇති වෙති, ඇතමී කෙසෙක් කලාපිකී වෙති. ඇතමී කෙසෙක් වළඉකී වෙති, ඇතමී කෙසෙක් අස්ථිකී වෙති, ඇතමී කෙසෙක් කුණාඹිකී වෙති, ඇතමී කෙසෙක් ප්‍රාග්භාරයිකී වෙති. බුදුහට වූ තළ හිදි අයිත් වටා තුබුවාක් සෙයින් පරිපූර්ණ වූ [4]උදඹබුද්බුදයක් බදු ශීරස් වෙයි, එහි ප්‍රථමපක්ෂයෙහි උණිෂයෙන් වෙළනලද සිය් වැන්නෙන් "උණිෂශීර්ෂ" විය. අවිනිය පක්ෂයෙහි උණිෂයක් සෙයින් හැම නන්හි පරිමණ්ඩලකී "උණිෂශීර්ෂ" නමි වේ. මෙසෙයින් උණිෂසදෘශ කී ඇති වන බැවින් "උණිෂශීර්ෂ" නමි වෙත් බුදුහු.

මෙබඳු ඛාත්‍රිංශන්මහාපුරුෂලක්ෂණයන්ගෙ [5]ගොහා යෙන් මහිගණප්‍රභාසමුප්පබ්ලිත රශ්මිකරයන්හුගෙ ශ්‍රීවිභූති අතිශයමින් දිලියෙන්.

---

1 සිටුසි CEF 2 ඔහටි ACDEF

3 ලද්දෙයෑ A 4 උදඹබුද්බුදක් ACD

5 ගොහාවෙන් AF

එයින් කිහ:-

11. "මණිගණවිභාසමුජ්ජල - තලස්ස රතනාකරස්ස
සිරිවිභවං තං
භගවන්තමභිභවන්තං - වන්දෙ බත්තිංසවිමල
ලක්ඛණසිරිය" යි.

මෙයෑ "ද්වාත්‍රිංශත්මහාපුරුෂලක්ෂණ" නමී.

---

අශීති අනුව්‍යඤ්ජන නමී කවරේ? යත්: හෙ දැ කියෙ මැ නෝ:-

12. චිතඩහුලිතා - අනුපුබ්බඩහුලිතා - වට්ටඩහුලිතා - තම්බනඛතා - තුඞ්ගනඛතා - සිනිඳුනඛතා - නිගූළ්හ ගොප්ඵකතා - සමපාදතා[1] - ගජයමානක්කමතා - සීහයමානක්කමතා - හංස සමානක්කමතා - උසභසමානක්කමතා - දක්ඛිණාවත්තගතිතා - සමන්තතෝ වාරුජාණුමණ්ඩලතා - පරිපුණ්ණපුරිසව්‍යඤ්ජනතා - අවක්කන්දනාභිතා - ගම්භීරනාභිතා - දක්ඛිණාවත්තනාභිතා - ඛීරදකරසදිසථාරුහුජතා - සුවිභත්තගත්තතා - [2]මට්ඨ ගත්තතා - [3]අනුස්සන්නානනුස්සන්නසබ්බගත්තතා - අළීනගත්තතා - තිලකාදිරහිතගත්තතා - අනුපුබ්බරුචිරගත්තතා - විසුද්ධගත්තතා - කොටිසහස්ස හත්ථිබලධාරණතා - තුඞ්ගනාසතා - සුරත්තදීඝමංසතා සුඛුමනත්තතා - සිනිඳුනත්තතා - විසුද්ධින්ද්‍රියතා - වට්ටදන්තතා - රත්තෝට්ඨතා - ආයතවදනතා - ගම්භීරපාණිලෙඛතා - ආයත ලෙඛතා - උජුකලෙඛතා - [4]සුරුචිරසණ්ඨානලෙඛතා - පරිමණ්ඩලනඛතේජපහාවන්තතා - පරිපුණ්ණකපොලතා - ආයතවිසාල නෙත්තතා - පඤ්චපසාදවන්තනෙත්තතා - ආකුඤ්චිතග්ගපඛුමතා - මුදුතනුකරත්තජීවහතා - ආයතරුචිරකණ්හතා - නිග්ගණ්ඨිසිරතා - නිගූළ්හ සිරතා - ජත්තනිභාරුසිතා - [5]ආයතපුථුලලලාට සොභතා - සුසණ්ඨානභමුකතා - සණ්හභමුකතා - අනුලොමභමුකතා

---

1 B has also කොමළපාදතා 2 වට්ටගත්තතා AF
3 අනුස්සන්නා සන්න ACDEF 4 රුචිර AF
5 නලාට CEF

මහන්තභූමකතා - ආයතභූමකතා - සුඛුමාලගත්තතා - අතිවිය සොම්මගත්තතා - අතිවියඋජුලිතගත්තතා - විමලගත්තතා - කොමලගත්තතා - සිනිද්ධගත්තතා - සුගන්ධතනුතා - සමලෝමතා - දක්ඛිණාවත්තලෝමතා - [1]හිත්තඤ්ජන සදිසනීලලෝමතා - සිනිද්ධලෝමතා - අතිසුඛුමඅසාසපස්සාසධාරණතා - සුගන්ධ මුඛතා - සුගන්ධමුඛනත්තා - සුනීලකෙසතා - දක්ඛිණාවත්තකෙසතා - සුසණ්ඨානකෙසතා - සිනිද්ධකෙසතා - සණ්හකෙසතා - අලුළිත කෙසතා - සමකෙසතා - කොමලකෙසතා - කෙතුමාලාරතන රඤ්ජිතතා" යි.

මෙබඳු අශීති අනුව්‍යඤ්ජනයෙන් බබළන විවිත්‍රලක්ෂණ සම්පත් හා ප්‍රජ්වලිතකෙතුමාලාජාලයෙන් සමුජ්ජලිත රූප ශොභා [2]ඇතියවූහ බුදුහු - වයින් කිහ:-

13. "තමසීතිඅනුව්‍යඤ්ජන - සමනුව්‍යඤ්ජිතවිචිත්ත
ලක්ඛණවිභවං[3]
පජ්ජලිතකෙතුමාලා - ජාලසමුජ්ජලිතරූපසොභං
වන්දෙ" යි.

මෙ යෑ "අශීති අනුව්‍යඤ්ජන" නමී.

---

මෙවිහු "ලක්ෂණ" නමිහ. "අනුව්‍යඤ්ජන" නම් කුමට වූහ යත්? දෙතිස් මහපුරිස්ලකුණින් සැදුම්ලද බුදුන්ගෙ තුනුසපුව දුටු ලක්ෂණඥ මහාදිගම්බරපරිව්‍රාජකබ්‍රාහ්මණ වාදින් විසින් "මොහු වනාහයෙන් සවිනෙ දත් බුදුහු[4]" යි මෙ ලක්ෂණ හෙයින් දන්නා බැවින් "ලක්ෂණ" නම් වෙත්. "ලක්ෂ - දර්ශනාඞ්කනයොඃ" යන ධාතු යි.

---

1 හිත්තඤ්ජනනගBC හිත්තජන්නගA හිත්තජනනගF
2 ඇතියවිහුBCDEF 3 සිරිවිභවංABCDE 4 බුදුහBCDG

අසීති අනුව්‍යඤ්ජනයෝ දෙතිස්මහපුරිස්ලකුණු අනුව ගොස් ලක්ෂණප්‍රකාශ හා ශරීරශොභා හා සුව්‍යක්ත කරන්නෙන් "අනුව්‍යඤ්ජන" නම් වෙත්. "අන්ජු – ම්‍රක්ෂණව්‍යක්තිගතිෂු" යන ධාතුයි.

එයින් කිය සෙල්බමුණු බුදුරජහුගෙ අනුව්‍යඤ්ජනයෙන් දිලියෙන මහාපුරුෂලක්ෂණ දැක:-

14. "නරස්ස හි සුජාතස්ස යෙ භවන්ති වියඤ්ජනා
සබ්බෙ තෙ තව කායස්මිං මහාපුරිසලක්ඛණා.

පසන්නනෙත්තා සුමුඛෝ බ්‍රහා උජු පතාපවා
මජ්ඣ සමණසඩ්ඝස්ස ආදිච්චොව විරොවසි.[1]

බ්‍රහ්මභූතං අතිතුලං මාරසෙනප්පමද්දනං
කො දිස්වා නප්පසීදෙය්‍ය අපි කණ්හාභිජාතිකො" යි

මෙසෙ ලක්ෂණානුව්‍යඤ්ජනයෙන් ප්‍රඥාලිත රූපශොභා ඇති බුදුන් රූපවිලාසයෙන් අචින්ත්‍ය පරිදි කිසෙයෑ යත්?

අප බුදුන් අරුණවතිය යුත් දෙසන දවස් සිඛීසම්මා සම්බුදුන්ගෙ අභිභූ නම් මහතෙරුන් බ්‍රහ්මලොකයෙහි සිට සහස්‍රීලොකධාතුව ඇරයෙන් විඥාපනය කෙරෙමින් සෘද්ධි ප්‍රාතිහාර්‍ය්‍ය කළ පරිදි වදාළ කල්හි අනඳමහතෙරහු "ශ්‍රාවකයන් දහසක් සක්වළ අන්ධකාර විධමා ශරීරාවභාස පතුරුවා ධම් දෙසත්. බුදුහු කෙතෙක් තැන් ශරීරාවභාසයෙන් [2]විහතා න්ධකාර කොට ඇරයෙන් විඥාපනය කරන්නට සමර්ථ වෙති හොත්" යි පුවවුත්හු. එකල බුදුහු "අනඳ. කුමි කියහි? හෙ ප්‍රාදෙශිකඥානයෙහි සිටි ශ්‍රාවකයෙක. තථාගතයෝ වනාහි

---

1 විරොවසි A  විරොවති B  2 විගතාන්ධකාර B

දශපාරමිතා පුරා සර්වඥතාඥානයට පැමිණ අපරිමාණගුණ ගණයෙන් සමුපෙත වැ සිටියාහ. තෙ නියසිළින් පස්බුදක් ගෙනැ මහපොළොවැ පස් හා උපමා කරන්නක්හු වැන්නෙහි, ශ්‍රාවකයන්ගෙ විෂය අනෙකෙකැ. බුදුන්ගෙ විෂය අනෙකෙකැ, ශ්‍රාවකයන්ගෙ ගොචර අනෙකෙකැ. බුදුන්ගෙ ගොචර අනෙකෙකැ. ශ්‍රාවකයන්ගෙ බල අනෙකෙකැ. බුදුන්ගෙ බල අනෙකෙකැ" යි බුදුගුණ [1]අප්‍රමෙය පරිදි කියා තුෂ්ණීම්භූත වූහු.

මහතෙරහු එසෙයින් මැ දෙවන වට ද් පුළුවුත්හු. එසඳ බුදුහු "අනඳ. තෙ සියතක්හු ගෙනැ යෙළසියක් යොදුන් ගුරුළු රජක්හු හා උපමා කරන්නක්හු සෙයින් ඇත් සොඬෙහි[2] දිය ගෙනැ මහගඟ දිය හා උපමා කරන්නක්හු සෙයින් සතරරියන් වළෙඤ දිය ගෙනැ [3]සත්දහතළා හා උපමා කරන්නක්හු සෙයින් නැළියක් සාලෙ බත් ලද මිනිසක්හු ගෙනැ සක්විතිරජක්හු හා උපමා කරන්නක්හු සෙයින් පාංශු පිශාචයක්හු ගෙනැ ශක්‍රදෙවරාජයා හා උපමා කරන්නක්හු සෙයින් ඛද්‍යොතප්‍රභා ගෙනැ සූර්‍යප්‍රභා හා උපමා කරන්නක්හු සෙයින් කුඤ්චිකාවජීද්‍රයක් ගෙනැ අනන්ත ආකාශය හා උපමා කරන්නක්හු සෙයින් කිනම් [4]දෑයක් කියහි" යි දෙවන [5]වටහිද් තුෂ්ණීම්භූත වූහු.

[6]එකල මහතෙරහු "බුදුහු දෙයලක් මා විසින් පුළුවුස්නාලද්දහු තව තෙ වදරති, එසෙ බැවින් තුන්යලක් ආරාධනා කොට සිංහනාද කරවමි" යි තුන්වන වටහිද් අයදියෝ. එසඳ බුදුහු "අනඳ. තා විසින් දහසක් සක්වළ වුළනීයලොකධාතු නම් ලද පරිදි අසනලද තෙ" යි වදරා තුෂ්ණීම්භූතමැවූහු. එකල මහතෙරහු "බුදුහු දැන්කළි සිංහ

---

1 ප්‍රමෙය්‍ය AB 2 ඇත්සොඩB 3සදත්දහතළා A
4 දෙයක් DF 5 වටද B 6 එකල්හි CDEF

නාද කෙරෙති" යි දැනැ "වහන්සෙ[1] මෙ බුද්ධ සිංහනාදයට කලැ" යි ආරාධනා කොළො. එකල බුදුහු "යාවතාවන්දි මසුරියා පරිහරන්ති දිසා හන්ති විරොවනා" යනාදි ක්‍රමයෙන් තමන් අනන්තාපරිමාණලොකධාතුවැ සත්නට ධර්ම දෙසන පරිදි වදාළො.

කිසෙයැ යත්: සඳහිරු දෙදෙනා දහදිගා බබුළුවා දිලියෙමින් [2]ඇවිදිනා තාක් තැන් එක් සක්වළෙක් වෙයි, මෙසෙ එක් සක්වළෙක එක් සඳක් බැගින් දහසක් [3] සඳ ඇති එසෙයින් මැ දහසක් හිරු ඇති දහසක් මෙර ඇති එක් සක්වළෙක සතර මහදිවක් බැගින් සාරදහසක් මහදිවි ඇති සාරදහසක් මුහුදු ඇති සාරදහසක් වරමි මහරදුන් ඇති දහස් දහස් චාතුර්මහාරාජිකාදි දෙව ලොකයන් ඇති දහස් දහස් බ්‍රහ්මපාරිෂද්‍යාදි බ්‍රහ්මලොකයන් ඇති දහසක් සක්වළ "සහස්‍රී චූළනීයලොකධාතු" නම් වෙයි. හෙ සහස්‍රසංඛ්‍යායෙන් උපෙතයෙන් "සහස්‍රීලොකධාතු" නමුදු විය, මධ්‍යම ලොකධාතු පිණිස ක්ෂුද්‍රක වන බැවින් "චූළනීයලොකධාතු" නමුදු වී. මෙ ශ්‍රාවකයනට විෂය යි.

මෙසෙ "සහස්‍රී චූළනීයලොකධාතු" නම් ලද දහසක් සක්වළ එක්කොට ගෙනැ සහස්‍රභාගයෙන් ගණනලද්දෙ ද්විසහස්‍රී මධ්‍යම ලොකධාතු" නම් වෙයි, හෙ දශලක්ෂයක් සක්වළැ. දෙවන සහස්‍රයෙන් ගණිතයෙන් "ද්විසහස්‍රී ලොකධාතු" නමුදු විය. මහාසහස්‍රී ලොකධාතු පිණිස "මධ්‍යම ලොකධාතු" නමුදු වී. මෙ බුදුනට මිස ශ්‍රාවකයනට විෂය නොවෙ.

මෙසෙ "ද්විසහස්‍රී මධ්‍යමලොකධාතු" නම් ලද දශ ලක්ෂයක් සක්වළ එක් කොට ගෙනැ සහස්‍රභාගයෙන් ගණන

---

1 වහන්ස BCG 2 ඇවිදුනා C 3 සඳු C

ලද්දෙ "ත්‍රිසහස්‍රිමහාසහස්‍රිලොකධාතු" නම් වෙයි. හෙ තෙළ සියයක් සක්වළෑ. තුන්වන සහස්‍රයෙක් ගණිතයෙන් "ත්‍රිසහස්‍රි ලොකධාතු" නමුදු වීය. මහත් සහස්‍රයෙන් ගණිතයෙන් "මහා සහස්‍රි ලොකධාතු" නමුදු වී.

ලොකධාතුහු වූකල අනන්තාපරිමාණයෝයි. කිමෙයෑ යත්? කෙළුම්වගයක් සක්වළ මුහොඬය දත්වා සමීපයෙන් පුරා යමෙක් පූර්වදිගාභාගයෙහි එක් සක්වළක එක් සමීපයක් මැහින් ප්‍රක්ෂිප කෙරෙමින් යන්නෙ වී නම් වී සමීපයෝ තැම පරීක්ෂයට යෙහි, එ දිගාභාගයෙහි චක්‍රවාලයෝ පරීක්ෂයට නොයෙක්. දක්ෂිණ දිගාභාගයෙහිද් එසේක් ම යෑ. පශ්චිමොත්තර දිගාභාගයෙහිද් එසේක් මැයි. මෙසෙ අනන්තාපරිමාණ වූ ලොකධාතුවෑ බුදුහට අවිෂය තැනෙක් නම් නැති. එසින් බුදුහු හුනස්නෙහි මැ හිඳ නාත්පස්හි සහස්‍රිකූළලොකධාතුව ද් ද්විසහස්‍රිමධ්‍යමලොකධාතුව ද් ත්‍රිසහස්‍රි මහාසහස්‍රි ලොකධාතුවද් එසින් පිටත් අනන්තාපරිමාණ [1] චක්‍රවාලයෙහිද් සත්නට නොමඬහන චන්ද්‍රයාසෙ මැ පැනෙන්නාහු මධුරස්වරයෙන් ධර්ම දෙසන්.

එසින් වදළහ:-

15. "ආනඬිඹාතෙ ආනසද තථාගතෙ තිසඟසි මහාසඟසි ලොකධාතුං පරෙත චිඤ්ඤපෙය්‍ය යාවතා වා පනානඬෙඹ්‍යා"සි.

මහතෙරහු "ලොකයෑ විෂම යෑ, සක්වළ අනන්තයෑ. එක්තැනෙහ සූර්‍ය උදාහ වෙයි, එක්තැනෙක මධ්‍යහන වෙයි, එක්තැනෙහ අපරාහන වෙයි, එක්තැනෙක ප්‍රථමයාම වෙයි, එක්තැනෙක මධ්‍යමයාම වෙයි, එක්තැනෙක පශ්චිමයාම වෙයි,

---

1 චක්‍රවාලයෙහිදු EFG

සත්වයෙ ද කායීයෙහි ව්‍යාපෘතයහ,[1] ආහාරයෙහි ව්‍යාපෘතයහ, ක්‍රීඩායෙහි ව්‍යාපෘතයහ. මෙසෙ තත්තත්කාරණයෙන් වික්ෂිප්ත ද් වෙති, ප්‍රමත්ත ද වෙති. බුදුහු ඔවුන් කිසෙ ඩරයෙන් විඥාපනය කෙරෙති හො" යි සිතා "යථා කථං පන භන්තෙ" යනාදි විසින් ප්‍රශ්න කොළොා.

අනඳ. යම්කෑනෙක සූයී පෑනෙන්නෙ වී නම් බුදුහු තමන්ගෙ ආනුභාවයෙන් එහි සූයී අත්‍යඩගත කෙරෙති, යම් කෑනෙක නොපෑනෙන්නෙ වී නම් සූයී උදගත කොට මස්තකයෙහි සිටුවත්.[2] එසල්හි යම්කෑනෙක සූයී නො පෑනෙ ද එහි මනුෂ්‍යයෙ "දැන් ම සූයී උදගත විය, හෙ දැන් ම අත්‍යඩගත විය, මෙ නාගාවතීය හො භූතාවතීය හො යක්‍ෂාවතීය හො දෙවතාවතීය හො" යි සිතත්.[3] යම්කෑනෙක සූයී පෑනෙ ද එහි මනුෂ්‍යයෙ "දැන් ම සූයී අත්‍යඩගත විය, හෙ දැන් ම උදගතයැ. කිම හො මෙ නාගාවතීාදින් අන්‍යතරයෙක හො" යි සිතත්.[3]

[4]එක්බිති [5]ඵ මනුෂ්‍යයන් ආලොක ඵූ අන්ධකාර ඵූ දැක "මෙ කවර කාරණයෙන් විය හො" යි පිරික්සන කල්හි බුදුහු නීලකෘත්ස්න සමාපත්ති සමවැදී බහලාන්ධකාර පතුරුවත්. ඵුමක් සඳහායැ[6] යත්? තත්තත්කායීයෙහි [7]ව්‍යාපෘත සත්වයනට සන්ත්‍රාස [8]ජනවනු සඳහා යි. එක්බිති ඔවුනට සන්ත්‍රාස උපන් බවි දැන අවභාසකෘත්ස්න සමාපත්ති සමවැදී පාණ්ඩරසනඵුඩ රශ්මි විහිදී [9]සඳුදහස් හිරු දහස් නැගිකල් සෙයින් එකපැහැර හැමතැන් එකාලොක කෙරෙත්. අවු කරන්නාහු ද් ශරීරයෙහි කිලඵිජයක් පමණ ප්‍රදෙශයෙකින් රශ්මි විසඟිා කෙරෙත්.

---

1 ව්‍යාවෘත CDEF 2 පිහිටුවත් F 3 කියත් B
4 ඉක්බිති BDEG 5 "ඒ" absent in DEF 6 සඳහාදැ D
7 ව්‍යාවෘත CEF 8 ජනකවනු AF 9 සඳුදහස් ACE

යමෙක් 1චක්‍රවාල පෘථිවිය වැටුප්මලා[2] කොට මහා සමුද්‍රයෙහි උදකෑ තෙල් කොට මෙරුපර්වතරාජයා වර්ත්තිකා[3] කොට දැල්වූයෙ වී නම් හෙ එක් සක්වළෙක මැ ආලොක කෙරෙයි. බුදුහු වූ කල තිලබීජයක් පමණ ශරීරප්‍රදෙශයෙකින් රස් විහිදු ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලොකධාතු එකාලොක කෙරෙත් මයැ. එසින් පිටත් අනන්තාපරිමාණ චක්‍රවාලවූ එකාලොක කෙරෙත් මැයි.

එකල්හි මනුෂ්‍යයො ඒ ආලොක දැ බුදුනුදු දැක "යමක්හූ විසින් සූයෙ 4අසාඩ්හත දැ උඳුත දැ බහලාන්ධකාර විසෘෂ්ට දැ හෙ මෙ මහාපුරුෂයැ, දැන් ආලොක කොට සිටියෙයැ, අහො ආශ්චර්‍යය්‍ය පුරුෂයෙකැ" සි අඤ්ජලිප්‍රග්‍රහ කොට නමස්කාර කෙරෙමින් සිටිත්. එකල බුදුහු ඔවුනට බඹගොස්හඬ විහිදු ධර්‍ම දෙසත්.

යමෙක් එක්සක්වළගලක් බෙරකොට සක්වළ මහ පොළොව හෙරිතල කොට මෙරගල් දැඩු කොට 5ආකොටන කරන්නෙ වී නම් එහඬ එක් සක්වළෙක මැ පවත්ති. බුදුහු වූ කල පත්තඩෙක හො 6පුටුවෙක හො හිඳ ත්‍රිසහස්‍රී මහාසහස්‍රී ලොකධාතු දු එසින් පිටත් අනන්තාපරිමාණචක්‍රවාල දැ සැරයෙන් විඥාපනය කෙරෙත්.

එසින් වදළහ:-

16. "ඉධානන්ද තථාගතො තිසහස්‍රිමහාසහස්‍රිලොක ධාතුං ඔභාසෙන ඵරෙය්‍ය, යදූ තෙ සත්තානං ආලොකං සඤ්ජානෙය්‍යුං; අථ තථාගතො ඝොසං කරෙය්‍ය සද්දමනුස්සා වෙය්‍ය. එවං ඛො ආනන්ද තථාගතො තිසහස්‍රිමහාසහස්‍රී ලොකධාතුං සරෙන විඤ්ඤාපෙය්‍ය යවතා වා[7] පනාකඩෙය්‍ය"සි.

---

1 චක්‍රවාට B 2 මලාවක් B 3 වර්ත්තිකාවක් B
4 හස්තාංගත AF 5 ආකොටනය G
6 පුටියෙක E පුටුයෙක F 7 "වා" ab.in C

එකල්හි මහතෙරහු බුදුන්ගෙ සිංහනාද අසා "ලාභා වත මෙ සුලද්ධං වත මෙ යස්ස මෙ සත්ථා එවං මහිද්ධිකො එවං මහානුභාවො" යි ප්‍රසාදපරවස වූ දෙව්මිනිසුන් හා සමග මහානාද පැවැත්වූහු.

මෙසෙයින් බුදුහු හුනස්නෙහි ම හිඳ පෙරට අනන්ත පරිමාණලොකධාතුවැ සිටියානට ද එසෙයින් මැපිටුපස සිටියානට ද් දක්ෂිණපාර්ශ්වයෙහි සිටියානට ද් වාමපාර්ශ්වයෙහි සිටියානට ද් භවාග්‍රයෙහි සිටියානට ද් [1]රසාතලයෙහි සිටියානට ද ඔවුනොවුන් මුහුණු බලා වෙන වෙන දෙසනුවන් සෙයින් පැනෙන්නාහු ධර්ම දෙසත් මැයැ. අනන්තපරිමාණලොක ධාතුව අනෙක සහස්‍ර දිව්‍යපර්ෂදට ද් මනුෂ්‍යපර්ෂදට ද් එක චිත්තක්ෂණයෙහි ගොස් ධර්ම දෙසා වඩිත් මැ යි.

මෙසෙයින් බුදුහු රූපවිලාසයෙන් අවින්ත්‍යයො.

ඔවුන්ගෙ "<u>වචනවිලාස</u>" නම් කවරැ යත්? අර්ධාඩ්ග සමන්වාගත ස්වරයෙන් කරන දෙශනා යි කිසෙයැ යත්?

කීයෙ මැනො ධර්මසෙනෙවි සැරියුත් මහතෙරුන් [2]විසින් නිදේශපාඨයෙහි:-

17. "අට්ඨඩ්ගසමන්නාගතො ඛො [3]පන තස්ස භගවතො මුඛතො ඝොසො නිච්ඡරති විස්සට්ඨො ච විඤ්ඤෙය්‍යො ච මඤ්ජු ච සවනියො ච බින්දු ච අවිසාරි ච ගම්භිරො ච නින්නාදී ච; යථාපරිසං ඛො පන සො භගවා සරෙන විඤ්ඤාපෙති; න ච්ස්ස බහිද්ධා පරිසාය ඝොසො නිච්ඡරති; බ්‍රහ්මස්සරො ඛො පන සො භගවා කරවීකභාණී" යි.

---

1 රසාල්තෙලෙහි AF 2 විසින් ab.in A 3 පනස්ස AEF

මෙසෙ අෂ්ටාඞ්ගසමන්වාගතස්වරයෙන් ධර්ම දෙසන බුදුන්ගෙ ගජිනා සතර ස්ථානයකට පැමිණ මහත් වෙ. කවර සතර ස්ථානයැ යත්? විනයප්‍රඥප්තියැ භූම්‍යන්තරයැ ප්‍රත්‍යයාකාරයැ සමයාන්තරයැ යන මෙ යි.

මෙ[1] හි "<u>විනයප්‍රඥප්ති</u>" නම් කවර යත්? මෙ ආපත්ති ලසුකයැ, මෙ ආපත්ති [2] ගුරුකයැ, මෙ සවිකිත්ස්‍යයැ, මෙ අවිකිත්ස්‍යයැ, මෙ ජෙද්‍යගාමිනියැ, මෙ ව්‍යුත්ථානගාමිනියැ, මෙ දෙශනාගාමිනියැ, මෙ ලොකාවද්‍යයැ, මෙ ප්‍රඥප්ත්‍යවද්‍යයැ, මෙ වස්තුවැ මෙ ශික්ෂාපද පැන්වුව මැනැවැයි අවතීර්ණවස්තුවැ ශික්ෂාපද පන්වනු අන්නට අවිෂය වන බැවින් විනයප්‍රඥප්තියට පැමිණ බුදුන්ගෙ ගජ්ජනා මහත් වෙ.

<u>භූම්‍යන්තර</u> නම් කවර යත්? මෙ සතර ධර්මයො ස්මාත්‍යුප ස්ථානයහ, මෙ සතර ධර්මයො සම්‍යක්ප්‍රධානයහ, මෙ සතර ධර්මයො සාද්ධිපාදයහ යනාදි විසින් සර්ධර්මයන් විභාග කොට ඔවුන් කෙරෙහි මෙතෙක් දෙන කාමාවචරයහ, මෙතෙක් දෙන රූපාවචරයහ, අරූපාවචරයහ, අපර්‍යාජන්නයහ, ලොකිකයහ, ලොකොත්තරයහ යි අනන්තනය [3] අභිධර්මපිටක විභාග කොට දෙසනු අන්නට අවිෂය වන බැවින් භූම්‍යන්තරයට පැමිණ බුදුන්ගෙ ගජිනා මහත් වෙ.

<u>ප්‍රත්‍යයාකාර</u> නම් කවර යත්? හෙතුප්‍රත්‍යයාදි චතුර්වංශති ප්‍රත්‍යයන්ගෙ හෙත්වාදි වශයෙන් ප්‍රත්‍යය වන ආකාරයද අවිද්‍යාදීන්ගෙ සංස්කාරාදීනට ප්‍රත්‍යය වන ආකාරයද විභාග කොට දෙසනු අන්නට අවිෂය වන බැවින් ප්‍රත්‍යයාකාරයට පැමිණැ බුදුන්ගෙ ගජ්ජනා මහත් වෙ.

---

1 එහි BDG 2 ගරුකය BCE 3 අභිධර්මපිටකය CDEFG

සමයාන්තර නම් කවර යත්? බුදු සතර දෙන ගාථෙක වාදයහ, බුදු සතරදෙන එකක්ගාථෙකිකයහ යනාදි විසින් මෙ නිසා මෙ ගත්තියි ආක්ෂේපචිදූෂණ චිදූ දෙගනා කරනු අත්තට අවිෂය වන බැවින් සමයාන්තරයට පෑමිණ බුදුන්ගෙ ගථිනා මහත් වෙ.

මෙසෙ මදුරුතුඩින් මහමුහුදු සෙයින් අනුන්ගෙ නුවණින් නොවරියහැකි පරමගම්භීර ධර්මසාගරය නුවණමෙරමතින් අලලා දෙසන බුදුන්ගෙ ගථිනා මෙ සතර [1]ස්ථානයට පෑමිණ මහත් වෙ. මෙසෙ ගථිනා කරන බුදුන්ගෙ දෙගනා පර්ෂද[2]වක්‍රවාට පයිත්තද වී නම් එතාක් තැනට ඇසෙයි. පිරිසින් පිටත්වූ අඳුලක් පමණ තැනට ද නොසෙ. කුමට [3]නොයෙයි යත්? එබඳු මධුර කථා නිරථික වූ නොගියමනා බැවින් නොසෙ - යම්සෙ සිංහ රාජ ගන්ධහස්තින් ගන්නා කලූ යම් ප්‍රකාරයෙකින් සිංහනාද කෙරෙ ද, ශශකයක්ෂූ ගන්නා කල ද එම ප්‍රකාරයෙන් සිංහනාද කෙරෙයි, එසෙයින් මූ බුදුහු වක්‍රවාටපයිත්තද වූ දිව්‍යබ්‍රහ්ම පර්ෂදට යම් ප්‍රකාරයෙකින් දෙගනා කෙරෙද්ද, එස්සක්ෂට ද් ධම් දෙසත් එම ප්‍රකාරයෙන් දෙගනා කෙරෙත් - මෙ බුදුන්ගෙ වචනවිලාසයෑ.

ඔවුන් වචනවිලාසයෙන් අවිත්‍ය පරිදි කිසෙයෑ යත්? බුදුන් භුක්තානුමොදනා කරන තල්හි මද නොට අනුමොදනා කරනුවන්ගෙ දෙගනා දික්සඟි මැදුමිසඟි පමණ වෙයි, පස්ඛත සම්ප්‍රාපා පර්ෂදට ධම් දෙසනුවන්ගෙ දෙගනා සංයුත්සඟි අඞ්ගුත්තරසඟි පමණ වෙ - බුදුහු තවිතිසාදෙව්ලොවර පරසතු රුක්මුල පඬුඇල්සලස්නෙහි වැඩහිඳ දෙවියනට පරමගම්භීර අභිධම් මධුරභාරතින් තුන්ලොපුරා දෙසන්නාහු ගතභාගයෙන් සහප්‍රභාගයෙන් ධම්න්තරයෙන් ධම්න්තරයට සඞ්ක්‍රමණ කොට විවිධ විචිත්‍රනයමනොහර කොට දෙසූහු. මෙසෙ ආකාශගඞ්ගා

---

1 ස්ථානයකට A 2වක්‍රවාල BG 3 නොයෙය C

ප්‍රවාහයක් සෙයින් නිරන්තර ප්‍රවෘත්ත වූ අනන්ත පරිමාණ දෙශනා මුදුන්ගෙ වචනගති අතිශිෂ්ට වන බැවින් තුන්මසක් දවසින් මහණකප්‍රාප්ත වී.

අපි ව – වියත්සතරඟුල් තල්සෙයක් කෘතහස්ත ධනුර්ධරයෙක් සහප්‍රඥාම දුන්නෙකින් [1] සෙද කොට ලඝුතර ශරයක් විද ඉක්මවාද, එකෙණෙහි පදශතයක් පදසහස්‍රයක් ධරන්නට සමර්ථ වූ මතිසම්පත්ති සම්පන්න වූ ශ්‍රාවකයෝ සතර දෙනෙක් එකපැහැර පැන පුළුවුසිද්ද, මුදුහු ඔවුන් පුළුවුත් පැන එකවට ව ශරය වියත් සතරඟුල් තල්සෙය ඉක්ම නො යනතුරු විසඳත්. කිසෙයැ යත්?

එසින් එක්කෙනෙක් සතරසිවටන්හි කායානුදර්ශනා පුටුවුස්සි, එක්කෙනෙක් වෙදනානුදර්ශනා පුටුවුස්සි, එක්කෙනෙක් චිත්තානුදර්ශනා පුටුවුස්සි, එක්කෙනෙක් ධර්මානුදර්ශනා පුටුවුස්සි; පුටුවුස්නාහු දු මොවුන් පුටුවුත්කල පුටුවුසුමිහයි එක්කෙනෙක් එක්කෙනෙකුන් නො බලා එකපැහැර පුටුවුසිත්, එතෙකුදු වුව මවුන්ගෙ වර පැනෙයි, මුදුන්ගෙ වර නොපැනෙයි, මුදුහු ව ශරය වියත්සතරඟුල් තල්සෙය ඉක්ම නො යනතුරුම චතුර්විධ කායානුදර්ශනා ද නවවිධ වෙදනානුදර්ශනා ද ෂොඩශවිධ චිත්තානුදර්ශනා ද වදරත්.

ව සතරදෙනා තබා අනෙක් සතරදෙනෙක් සතර සම්‍යක් ප්‍රධානයෙහි පැන පුටුවුසිද්ද, එසෙසින් මෑ අනෙක් සතරදෙනෙක් සතරඍද්ධිපාදයෙහි, අනෙක් පස්දෙනෙක් පඤ්චඉන්ද්‍රියයෙහි, අනෙක් පස්දෙනෙක් පඤ්චබලයෙහි, අනෙක් සත්දෙනෙක් සප්තබොධ්‍යඞ්ගයෙහි, අනෙක් අටදෙනෙක් අෂ්ට

---

1 සොද A

මාර්ගාඩ්ගයෙහි පැන එකවට පුළුවුත්හු නම් බුදුහු එම නියායෙන් වදාරත් – එ අටදෙනා තබා අනෙක් සත්තිස්දෙනෙක් සත්තිස් [1] බොධිපාක්ෂික ධර්මයන් කෙරෙහි නිෂ්පර්‍යායයෙන් පැන පුළුවුත්හු නම් බුදුහු අනෙකනයසහප්‍රාලඞ්කාත කොට එම විගස වදාරත්.

මෙ දෙගනා හැමකල මැ මෙසෙ [2] පවතී ද යත්? ඉදින් බුදුහු [3] ශ්‍රානදුර්ලභ වූහු නම් ශ්‍රාවකයො සතරදෙනෙක් බුදුන් මඤ්චාරොපණය කොට ග්‍රාමනිගමරාජධානියැ වර්ෂගතයක් [4] පරිහරණය කෙරෙත් නම් බුදුන්ගෙ දෙගනායෙහි උනු නැත්.

එයින් වදාළහ:–

18. "අට්ඨොමෙ [5] චත්තාරො සාවකා වස්සසතායුකා වස්සසතජීවිනො වස්සසතස්ස අච්චයෙන කාලං කරෙය්‍යුං මඤ්චකෙන චෙපි මං සාරිපුත්ත පරිහරිස්සථ නෙවත්ථි තථා ගතස්ස පඤ්ඤාවෙය්‍යත්තියස්ස අඤ්ඤථත්තං" යි.

බුදුහු ආයුෂයෙහි පස්කොටසින් එක්කොටසක් අව ශිෂ්ටකල මැ ඛාණ්ඩිත්‍යාදීන් අනභිභූතවූවාහු රන්වන් ශරීරයෙහි [6] වෛවර්ණ්‍ය නො උපදනාතුරු දිව්‍යමනුෂ්‍යයනට ප්‍රියමනාප කාලයෙහි මැ [7] පරිනිර්වාණ කෙරෙති; ශ්‍රාවකයන් බුදුන් [8] මඤ්චාරොපණය කොට පරිහරණකළවිරි කල් නැත ද බුද්ධබල දක්වනු සඳහා වදාළෙයි.

මෙසෙ බුදුහු වචනවිලාසයෙන් [9] අවිත්‍ත්‍යයො.

ඔවුන්ගෙ ඥානවිලාස නම් කවර යත්? බුද්ධඥානය අතීතයෙහිදු අනාගතයෙහිදු ප්‍රත්‍යුත්පන්නයෙහිදු ක්‍රමයෙන් පවත්නා කලැ ජීර්ණපත්‍රපුටුයෙහි තප්තනාරාව සෙයින් නොපැකිල

---

1 බොධපාක්ෂිකධර්මයන් CDG 2 පවත්තිද B 3 ගිලාන ABCEF
4 පරිහරණ B 5 අට්මෙතෙ DG 6 වෛවර්ණ ABC 7 පරිනිර්වාණය A
8 මඤ්චාරොපණ කොට CF 9 අවිත්‍ත්‍යයෝයි B

ගොස් ඥෙයපර්‍යන්තයෙහි නවත්ති. ක්‍රම විනා පවත්නා කල්‍ප අනෙක කල්පකොටිශතසහස්‍රයෙන් අන්තරිතවූ අතීතදූ අනාගතූදූ අනෙක [1] චක්‍රවාටකොටිශතසහස්‍රයෙන් අන්තරිතවූ ප්‍රත්‍යුත්පන්නදූ ආවර්ජනප්‍රතිබද්ධ වෙයි මනසිකාරප්‍රතිබද්ධ වෙයි.

අපි ච – බුදුහු පෙරබත දෙලොස්කෙළ [2] සුවහසක් වට මහකුලුණුසමවත් සමවදිති, දෙලොස්කෙළසුවහසක් වට අහීත්වල සමවත් සමවදිති, පස්බතද දෙලොස්කෙළසුවහසක් වට මහකුලුණුසමවත් සමවදිති, දෙලොස්කෙළසුවහසක් වට අහීත්වල සමවත් සමවදිත් – මෙසෙ දවසැ දවසැ සූවිසි කෙළසුවහසක් වට මහකුලුණුසමවත් සමවදිති, සූවිසිකෙළ සුවහසක් වට අහීත්වල සමවත් සමවදිත්.

මෙ [3] චිත්තගණනායෙන් නොගෙනැ සමාපත්තිවාර ගණනායෙන් ගත් බැවින් ලෞකිකසමාපත්තියට අනතුරු පස්වන ගොත්‍රභූ ආදිකොට ලොකොත්තරසමාපත්තියට අනතුරු පස්වන අනුලොම ආදිකොට දෙ තන්හි [4] මැ භවාඩ්‍ග අන්තකොට මධ්‍යයෙහි පැවැති අනන්තාපරිමාණචිත්තයන් එකෙක් සමාපත්ති කොට එකෙක දෙකෙක යනාදි විසින් ගැණ සූවිසි කෙළසුවහස් [5] දතයුතු.

අපි ච – එවිහු බුදු වූ සතරවන සතියැ බොධි පර්‍යඞ්කයට පශ්චිමොත්තර දිශාභාගයෙහි දෙවියන් මැවූ රුවන්ගෙහි ධර්‍ම [6] සම්මර්‍ශනා කරන්නට වැඩහිඳ විනෙයජනයන් බලන්නාහු සූවිසි අසඞ්ඛ්‍යයක් දෙවිමිනිසුන් දැක ඔවිහු ශීලයෙහි

---

1 චක්‍රවාල DG  2 සුවහස් වට A  3 මෙසෙ B

4 තැන්හි BCG  5 සුවහසක් බව F  6 ශම්මර්‍ශනය B

පිහිටා සමාධීන් සිත් එකඟ කොට ප්‍රඥායෙන් විදර්ශනා වඩා අර්ථබිමට[1] පැමිණෙතියි ශීලසන්දීපක වූ අනෙකනයගතවිභූෂිතවූ[2] විනයපිටකය[3] සම්මර්ශනා කොට ඉක්බිති සමාධිසන්දීපක වූ අනෙකනයසහස්‍රාලඞ්කෘත සූත්‍රපිටකය සම්මර්ශනා කොට එක්බිති[4] ප්‍රඥාසන්දීපක වූ අනෙකනයගතසහස්‍රප්‍රතිමණ්ඩිත [5]අභිධර්මපිටකය සම්මර්ශනා කරන්නාහු ධර්ම සඞ්ග්‍රහප්‍රකරණාදි ෂට්ප්‍රකරණයන් සම්මර්ශනා කොට සත්වන චතුර්විංශතිසමන්තප්‍රස්ථාන සම්මර්ශනා කරන්නට ආරම්භකොළො - බුදුන් ඒ පරමගම්භිර ධර්මයන් සම්මර්ශනා කරත් කරත් සර්වධර්මයෙහි අප්‍රතිහත වූ සර්වඥතාඥානය සුවාසූදහසක් යොදුන් ගැඹුරු මහ මුහුදුහි මැ විජ්‍රම්භණයට අවකාශ ලද පන්සියක් යොදුන් තිමිර පිඞ්ගල නම් මහාමත්ස්‍යයා සෙයින් ඒ ධර්මසාගරයෙහි විජ්‍රම්භණයට අවකාශ ලදි.[6]

කිසෙයැ යත්? [7]තිමිරපිඞ්ගල මහාමත්ස්‍යයා දකුණුකන සලන්නට වන් කලැ පන්සියක් යොදුන් තන්හි දිය සැලෙයි, එසෙයින් මැ වම්කන [8]සලනකලුදු වල්පත සලනකලුදු හිස සලනකල ද පන්සියක් පන්සියක් යොදුන් තන්හි දිය සැලෙයි, දෙකන සලා වල්පතින් පැහැර හිස තද්තද්දිශාවට පහකොට කෙළනට ආරම්භ කළ [9]කලැ සත්සියක් අටසියක් යොදුන් තන්හි දිය බඳනෙහි[10] එව උදුනෙහි තුබූ දිය [11] සෙයින් කකියයි, [12]සුවාසූදහසක් යොදුන් ගැඹුරු මහමුහුදුහි දිය ඔහු පිටපොතු[13] සැඟවෙන්නට නො සැහෙයි, හෙ මෙසෙ කියයි "මෙ මහාසමුදුය ගම්භිරයැ ගම්භිරයැ යෙති, මෙහි

---

1 අර්ථඅටබිමට D 2 "වූ" ab.in D 3 "ය" ab.in B
4 ඉක්බිති G 5 අභිධර්මපිටක AB 6 ලදු D
7 තිමිරපිඞ්ගල නම් B 8 කල දB කලුද් AEF
9 කල්හි AF 10 බඳනෙහි 11 සෙ B
12 සියක්යොදුන් B 13 පොතු absent in AB

ගම්බරතා කොට ද? ඇයි පිටපොතු සැඟවෙන [1]පමණ දියත්නක් කොළඹටිහ" යෙ.

මෙසේ සුවාසූදහසක් යොදුන් සැතපුරු මහවුසුදුහි මැ විජාමීහණයට අවකාශ ලද කිතිරපිඩඟල මහාමඝයා සෙයින් ප්‍රඥාන ප්‍රභාරණයෙහි මැ විජාඝාතයට අවකාශ ලද සර්ඥඥා ඥානයෙන් රිසිසෙ ඇසුරු වූ සූක්ෂම වූ ධර්මයන් සක්ඛාත කරන බුදුනට බලවත් ප්‍රතිසඛ්‍යාවෙන් ලොභිත ප්‍රයත්න විය. වැතුරුප ප්‍රයත්න විය. ජවිවර්ධ ප්‍රයත්න විය. විලපිතලොහිතාවදාතාදී සවනත් ඝන බුදුරස්සු [2] දිලිසෙමින් නෙවිමින් සතළොසය වකාලොක කෙරෙමින් හිස්මුහුණු - හිස්මන්නාසූ අවපිනාදින් වින මැ සූනිල්සිනිදු සෙස්ධයින් ඉඳුනිල්මිරිසදහරා [3] සෙයින්, සකල ශරීරයන් රන්රසදහරා සෙයින්, පාදපාණිතලයෙන් හා මඬුවෙයින් පබළුරසදහරා සෙයින්, උතුලාමිඩයින් හා දුසන් පෙළ නියපලින් රිදිරසදහරා සෙයින් තල්තද සා රවිසන් සා තුලාරඟ සා රස්කළඹු හිස්ම දවිසුමුදහස් සඳදහස් හිරු දහස් කැඟිනල් සෙයින් දසසුදස දලවමින් අකනලොකධාතු වකාලොක කෙරෙමින් හිස්මුහුණු - මෙස හිල්මහනල්දමී සෙයින් සිහිහිරිමල්දමී සෙයින් බඳුවදමල්දමී සෙයින් මදිගිය මල්දමී සෙයින් නන්රූවන්දමී සෙයින් දස දසයි දිවන සවනත් රස් විහිදු විහිදු ආකාශය සෙ අනන්තවූ පස්පාලාව සෙ විපුල වූ දියපාලාව සෙ සැඟුරු වූ අනන්තපරිමාණ ධර්මයන් නිරන්තරයෙන් සම්මර්ශන කරන්නාවූ ඥානඝනි අභිමුඛ වන බැවින් සත්ථු සත්දවාලෙකින් මහානප්‍රාප්ත කොළා.

අපි ව - බුදුන් සමනුස්සිහාගී කරන තල්හි බුබුන්ග ශරීරයෙන් නිස්මන්න ඛීතිය [4] රශ්මිහි පුරී පුරී රශ්මියට සුවළු

---

1 පමණ absent in A  2 රස්සු CDEF

3 ධාරා C  4 රශ්මු BDEFG

යුවළ වැ පවත්නවුන් සෙයින් එකක්ෂණයෙහි මැ [1] පවතිත්. කිසෙයැ යත්? දෙසිතෙක් එකවිට [2]උපදනෙ නො වෙයි, තත් තත් රශ්මීන් සඳහා ආවජ්ජන ද පරිකම්ම ද අධිඤ්ඤාන ද වෙන වෙනම යැ. බුදුහු නිල්රස් සඳහා නීලකෘත්ස්නසමාපත්තියට සමවදිති, [3] රන්වන්රස් සඳහා පීතකෘත්ස්නසමාපත්තියට සමවදිති, රත්රස් සඳහා ලොහිතකෘත්ස්නසමාපත්තියට සමවදිති, සුදුරස් සඳහා අවදාතකෘත්ස්නසමාපත්තියට සමවදිති, ඔනිකඳ සඳහා [4]තෙජොකෘත්ස්නසමාපත්තියට සමවදිති, දියකඳ සඳහා [5] අප්කෘත්ස්නසමාපත්තියට සමවදිති, එසෙකුදු වුව [6]බුදුන්ගෙ ඥානගති අතිශීඝ්‍ර වන බැවින් ඒ [7]රශ්මීහි එකක්ෂණයෙහි සෙයින් පවතිත්.

මෙ බුදුන්ගෙ ඥානවිලාසයි.

ඔවුන් ඥානවිලාසයෙන් අවිත්‍ය පරිදි කිසෙයැ යත්?

කියෙ මැ නො මහානිදේශයෙහි:-

19. "යො හි භගවා මහාපඤ්ඤා පුථුපඤ්ඤා හාසු පඤ්ඤා ජවනපඤ්ඤා තික්ඛපඤ්ඤා භිඤ්ඣාධිකපඤ්ඤා පඤ්ඤාපභෙදකුසලෝ පහින්නකිලෙසො අධිගතපටිසම්භිදෙ චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤා පුරිසධොරය්හා අනන්තඤාණො අනන්තතෙජො අනන්තයසො අඩ්ඪා මහද්ධනො ධනවා නෙතා විනෙතා අනුනෙතා [8] පඤ්ඤා පෙතා [9] නිජ්ඣාපෙතා පෙක්ඛිතා පසාදෙතා" ති.

---

1 පවත්ති ABCEF  2 පවත්තේ AD  3 සමවදති C
4 තෙජො B  5 ආපො B  6 බුදුන්ඥානගති AEF
7 රශ්මිහු AEFG  8 සඤ්ඤපෙතා A  සඤ්ඤපෙතා BCD
9 නිජ්ඣඤපෙතා BD

වුත්තු [1] අනුප්පන්නා මාතියහට උප්පාදකයහ, අසඤ්ඤත මාතියහට ජනකයහ, අනාඛ්‍යාතමාතියහට ආඛ්‍යාතාත්තු.

එසේ කිහ:-

20. "යෙ හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා, අසඤ්ඤතස්ස මග්ගස්ස සඤ්ඤෙතා, අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා, මග්ගඤ්ඤූ මග්ගවිදූ [2] මග්ගකොවිදා, මග්ගානුගා ච පන එතරහි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා" සි.

මවුත්තු [3] දන්නාත්තු මෑ දන්නි; [4] දන්නාත්තු මෑ දනිත්. මවුන් නො දත් දෑ නොද ඇති; නො පුටු දෑ නොද ඇත් - එසේ කිහ:-

21. "යෙ හි භගවා ඤාතං ඤාතා පස්සං පස්සති චක්ඛුභූතෙ ඤාණභූතෙ ධම්මභූතෙ බ්‍රහ්මභූතෙ වත්තා පවත්තා අත්ථස්ස නිත්තරතා අමතස්ස දාතා ධම්මස්සාමී තථාගතෙ: නත්ථිතස්ස භගවතා අඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අවසිතං පඤ්ඤාය" සි.

කාලත්‍රයවර්ත්තී වූ සර්ව්වධර්මයෝ සර්ව්වාකාරයෙන් බුදුන්ගෙ ඥාන ලබයෙහි ආපාථගත වෙත් - එසේ කිහ:-

අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සංඛ්‍ය ධම්මා සබ්බා කාරණ බුද්ධස්ස භගවතා ඤාණමුඛෙ ආපාථං [5] ආගච්ඡන්ති" සි.

---

1 වුත්තු BG 2 මග්ගමග්ගඤ්ඤූවිදූ ABDEF

3 දන්නත්තු AB 4 දන්නත්තු AB 5 ගච්ඡන්ති CD

යම් කවර ඥෙය අර්ථයෙක් ඇත්නම් ඒ හැම අනෙක බුදු ඥානයෙහි පරිවර්තනය කෙරෙ. එසින් කිහ:-

23. "යං කිඤ්චි [1] ඥෙය්‍යං නාම අතීතං ධම්මං ආනිතබ්බං - අත්තතෝ වා, පරතෝ වා, උභයතෝ වා, දිට්ඨධම්මිකෝ වා අත්ථෝ, සම්පරායිකෝ වා අත්ථෝ, උත්තානෝ වා අත්ථෝ, ගම්භීරෝ වා අත්ථෝ, ගූළ්හෝ වා අත්ථෝ, පටිච්ඡන්නෝ වා අත්ථෝ, නෙය්‍යෝ වා අත්ථෝ, නීතෝ වා අත්ථෝ, අනවජ්ජෝ වා අත්ථෝ, නික්කිලෙසෝ වා අත්ථෝ, වොදානෝ වා අත්ථෝ, පරමත්ථෝ වා අත්ථෝ, සබ්බං තං අනෙක බුද්ධඤාණෙ පරිවත්තති" සි.

හැම කායකර්මයක්ම බුදුන්ගේ ඥානානුපරිවර්තිත වෙත්.

එසින් කිහ:-

24. "සබ්බං කායකම්මං බුද්ධස්ස භගවතෝ ඤාණානුපරිවත්තති, සබ්බං වචීකම්මං ඤාණානුපරිවත්තති, සබ්බං මනොකම්මං ඤාණානුපරිවත්තති" සි.

අතීතයෙහි බුද්ධඥානය අප්‍රතිහත වූ පවත්ති, අනාගතයෙහිදු ප්‍රත්‍යුත්පන්නයෙහිදු එසෙයින්ම පවත්ති.

එසින් කිහ:-

25. "අතීතෙ බුද්ධස්ස භගවතෝ අප්පටිහතං ඤාණං, අනාගතෙ අප්පටිහතං ඤාණං, පච්චුප්පන්නෙ අප්පටිහතං ඤාණං" සි.

යම්පමණ ඥෙය ඇද්ද එපමණ ඥාන වෙයි; යම්පමණ ඥාන ඇද්ද එපමණ ඥෙය වෙයි. ඥෙයපර්‍යන්තයැ

---

1 ඥෙය්‍යං AF

ඥාන; ඥානපර්‍යන්තයැ ඥෙය. ඥෙයාතික්‍රාන්ත වැ ඥාන නො පවත්ති; ඥානාතික්‍රාන්ත වැ ඥෙයපථ නැත්. අන්‍යෝන්‍ය පර්‍යන්තස්ථායීහ එ[1] දෙධර්මයො.

එයින් කීහ:-

26. "යාවතකං ඤෙය්‍යං තාවතකං ඤාණං; යාවතකං ඤාණං තාවතකං ඤෙය්‍යං. ඤෙය්‍යපරියන්තිකං ඤාණං; ඤාණපරියන්තිකං ඤෙය්‍යං. ඤෙය්‍යං අතික්කමිත්වා ඤාණං නප්පවත්තති; ඤාණං අතික්කමිත්වා ඤෙය්‍යපථො නත්ථි; අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො තෙ ධම්මා" යි.

යම්සෙ සුස්පෘෂ්ටසමුද්ගපටලයන් දෙදෙනාගෙ අධස්තාත් සමුද්ගපටලය උපරිෂ්ඨාත්සමුද්ගපටලය නො ඉක්මෙ ද, උපරිෂ්ඨාත්සමුද්ගපටලය අධස්තාත්සමුද්ගපටලය නො ඉක්මෙ ද, ඔහු යම්සෙ අන්‍යෝන්‍යපර්‍යන්තස්ථායී වෙද්ද, එසෙයින් මැ ඥෙය හා බුද්ධඥානය හා දෙදෙන අන්‍යෝන්‍ය පර්‍යන්තස්ථායි වෙත්.

එයින් කීහ:-

27. "යථා ද්වින්නං සමුග්ගපටලානං සම්මා ඵස්සිතානං හෙට්ඨිමං සමුග්ගපටලං උපරිමංනාතිවත්තති, උපරිමංසමුග්ගපටලං හෙට්ඨිමං නාතිවත්තති, අඤ්ඤමඤ්ඤ පරියන්තට්ඨායිනො; එවමෙවං බුද්ධස්ස භගවතො ඤෙය්‍යඤ්ච ඤාණඤ්ච අඤ්ඤමඤ්ඤපරියන්තට්ඨායිනො" යි.

සර්වධර්මයෙහි බුද්ධඥානය පවත්ති, සර්වධර්මයො බුදුනට ආවර්ජනප්‍රතිබද්ධ වෙත්.

---

1 "දෙ" absent in B

එයින් කිහ:-

28. "සබ්බධම්මෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති, සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ආවජ්ජනපටිබද්ධා ආකඞ්ඛනපටිබද්ධා මනසිකාරපටිබද්ධා චිත්තුප්පාදපටිබද්ධා"යි.

සර්වසත්වයන් කෙරෙහි බුද්ධඥානය පවත්ති, බුදුහු සර්වසත්වයන්ගෙ ආශයානුශයවර්තාධිමුක්ති දනිත්.

එයින් කිහ:-

29. "සබ්බසත්තෙසු බුද්ධස්ස භගවතො ඤාණං පවත්තති, සබ්බෙසංසත්තානං භගවා ආසයං ජානාති, අනුසයං ජානාති, චරිතං ජානාති, අධිමුත්තිං ජානාති, අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ භබ්බාභබ්බෙ සත්තෙ පජානාති"යි.

යම්සෙ දෙසියක් යොදුන් "තිමි" නම් මත්ස්‍ය ද, තුන්සියක් යොදුන් "තිමිඞ්ගල" නම් මත්ස්‍ය ද, පන්සියක් යොදුන් "තිමිර පිඞ්ගල" නම් මත්ස්‍ය ද, දහසක්දහසක් යොදුන් "ආනන්ද" නම්"තිමින්ද"නම් "අධ්‍යාරොහ" නම් "මහාතිමි" නම් මත්ස්‍යයො ද යන යම්තාක් මත්ස්‍යකච්ඡපයො අන්තස්සමුද්‍රයෙහි පර්වර්තනය කෙරෙද්ද, එ සෙයින් මෑ සදෙවලොක අන්තොබුද්ධඥානයෙහි [1] පර්වර්තනය කෙරෙ.

එයින් කිහ:-

30. "යථා යෙ කෙචි මච්ඡකච්ඡපා අන්තමසො [2] තිමිතිමිඞ්ගලං උපාදාය අන්තොමහාසමුද්දෙ පර්වත්තන්ති. එවමෙවං සදෙවතො ලොකො සමාරතො සබ්‍රහ්මතො සස්සමණබ්‍රාහ්මණී පජා සදෙව මනුස්සා අන්තොබුද්ධඤාණෙ පර්වත්තති"යි.

---

1 පර්වර්තන BC  2 තිමිතිමිඞ්ගලෙ B

යම්සෙ [1] පනස්පස්යොදුන් පියා ඇති සැටයොදුන් පිල්වැටි ඇති තිස්යොදුන් ශ්‍රීවා ඇති නවයොදුන් තුඩු ඇති දෙළොස් යොදුන් පා ඇති ආකාශයෙහි සත්සියක් අටසියක් යොදුන් [2] තැන් [3] නො පොහොනා නියායෙන් දක්වනලද ගුරුළුවා [4] ඇති යෙළ සියක්යොදුන් ගුරුළුරජහු පටන්කොට යම්තාක් [5] පක්ෂිහි ආකාශයාගෙ එක් ප්‍රදෙශයෙක්හි පරිවර්තනය කෙරෙද්ද, එ සෙයින් මැ යම් කෙනෙක් සැරියුත් මහතෙරුන්ගෙ නුවණ වැනි නුවණ ඇත්තාහු ද ඔහු ද් පවා බුද්ධඥානයාගෙ එක් ප්‍රදෙශයෙක්හි පරිවර්තනය කෙරෙති, බුද්ධඥානය [6] දිව්‍යමනුෂ්‍යයන්ගෙ ප්‍රඥාස්වරණ අභිභවා සිටී.

එයින් කිහ:-

31. "යථා යෙ කෙවි පක්ෂී අන්තමසො ගරුළං වෙනතෙය්‍යං උපාදාය ආකාසස්ස පදෙසෙ පරිවත්තන්ති; එවමෙවං යෙපි තෙ සාරිපුත්තසමා [7] පඤ්ඤාය තෙපි බුද්ධ ඤාණස්ස පදෙසෙ පරිවත්තන්ති; බුද්ධඤාණං දෙවමනුස්සානං පඤ්ඤං වරිත්වා අභිභවිත්වා තිට්ඨති"යි.

යම්තාක් ක්ෂත්‍රිය පණ්ඩිතාදීහු ප්‍රව්‍රජන්න ප්‍රශ්නයන් අභිසංස්කාර කොට ගෙනැ අවුදු එකවර සිංහයක්හු ගන්නට අත දික් කරනුවන් සෙයින් ප්‍රශින්න වරවාරණයක්හු සොඬ පිරිමදිනවුන් සෙයින් උග්‍රතෙජස් ඇති ආශිවිෂයක්හු ශ්‍රීවායෙහි ගන්නට [8] වද්නවුන් සෙයින් ප්‍රජ්වලිත අග්නිස්කන්ධයක් සිප ගන්නවුන් සෙයින් බුදුන් පැන පුළුවුසති; බුදුහු ඔවුන් පුළුවුත් පැන සුනිශිතශස්ත්‍රයෙන් කුමුදුනළකලප් [9] සෙයින් ප්‍රඥාශස්ත්‍රයෙන් කඩා දිව්‍යාගදයෙන් සර්පයන් සෙයින් පරයන් අභිභවති;

---

1 පනස්යොදුන් AF 2 තන් B 3 නොපොහොන AB
4 "ඇති" ab.in DF 5 පක්ෂිහු G 6 දෙවමනුෂ්‍යයන්ගෙ DG
7 මහාපඤ්ඤා AB 8 වදින G 9 කලාප ABDEF

ඔහු තෙජ නැති වැ මඳ නැති වැ නිපතිතමානධ්වජ වැ දියරට හස්රජක්හු සමීපයෙහි පියාසුන් කවුඩුවන් සෙයින් ගුරුළු රජක්හු සමීපයෙහි පියා වගුළ කොස්ලිහිණියන් සෙයින් [1] වටහති; බුදුහු මැ එහි උද්දීපන වෙත්.

එයින් කිහ:-

32. "යෙපි තෙ ඛත්තියපණ්ඩිතා බ්‍රාහ්මණපණ්ඩිතා ගහපති පණ්ඩිතා සමණපණ්ඩිතා නිපුණා කතපරප්පවාදා වාලවෙධි රූපා වොහින්දන්තා මඤ්ඤෙ චරන්ති පඤ්ඤාගතෙන දිට්ඨිගතානි; තෙ පඤ්ඤං අභිසඞ්ඛරිත්වා [2] අභිසඞ්ඛරිත්වා තථාගතං උපසඞ්ඛමිත්වා පුච්ඡන්ති ගුළ්හානි ච පටිච්ඡන්නානි ච; කථිතා විස්සජ්ජිතාච තෙ පඤ්ඤා භගවතා හොන්ති නිද්දිට්ඨකාරණා; [3] උපක්ඛිත්තකා ච තෙ භගවතො සම්පජ්ජන්ති; අථ ඛො භගවාච තත්ථ අතිරොචති යදිදං පඤ්ඤාය" යි.

මෙ සෙයින් බුදුහු රූපවිලාසයෙනුද් වචනවිලාස යෙනුද් ඥානවිලාසයෙනුද් අචින්තයහ ආවාඩ්‍යයහ අතුල්‍යයහ අවෙද්‍යයො.

අපි ච - එවිහු භගවත් අභිත් සම්‍යක් සම්බුද්ධ වන බැවිනුද් විද්‍යාවරණගුණයෙන් පරිපූර්ණ වන බැවිනුද් දශබල චතුවෛශාරද්‍යාදි අනන්තාපරිමාණගුණරත්නයෙන් ආඪ්‍ය වූ ධර්මකාය ඇතියො.

එහි <u>භගවත්</u> නම් කවර යත්?

"භාග්‍යවානිති භගවාන්, භග්නවානිති භගවාන්, භගෛයර්‍යුක්ත ඉති භගවාන්, විභක්තවානිති භගවාන්, භක්තවානිති භගවාන්, භවෙෂු වාන්තගමන ඉති භගවාන්" යන මෙ ස අර්ථ යෙන් "භගවත්" නම් වෙ.

---

1 වැටහෙති G 2 "අභිසඞ්ඛරිත්වා" only once in CEF
3 උක්ඛිත්තකා CE

එහි ලොකිකලොකොත්තරහිතසුඛාගිනිර්වත්තක [1]දාන ශීලාදියැ පාරප්‍රාප්ත වූ භාග්‍ය ඇති වන බැවින් "භාග්‍යමස්‍යාස්ති" යන වාක්‍යයෙහි "මතුප්" කොට "භාග්‍යවාන්" යි කිවමනා [2]තන්හි නෛරුක්තිකවිධීන් "භගවාන්" යනු වෙ.

"නෛරුක්තිකවිධි" නම් කවර යත්? කියෙ මැ නො:-

33. "වර්ණාගමො වර්ණවිපර්‍යයශ්ච
ද්වෞ චාපරෞ වර්ණවි කාරනාශෞ
ධාතොස්තදර්ථාතිශයෙන යොග -
ස්තදුච්‍යතෙ පඤ්චවිධං නිරුක්තම්" යි.

ලොභදෙවෂමොහාදිප්‍රභෙද ක්ලෙශසහස්‍රයනුදු මාරබල ද භග්න කළ වන බැවින් "භග්නවානිති භගවාන්" යනු වෙ. "භන්ජො - අවමර්දනෙ" යන ධාතුයි.

එයින් කීහ:-

34. "භග්ගරාගො භග්ගදොසො භග්ගමොහො
අනාසවො
භග්ගාස්ස පාපකා ධම්මා භගවා තෙන
[3]වුච්චති" යි.

මෙහි [4]භාග්‍යවන්තතායෙන් රූපකායසම්පත් දීපිතයැ, භග්නදෙෂතායෙන් ධර්මකායසම්පත් දීපිතයි. භගශබ්ද අනන්‍ය සාධාරණ මහදෛශ්වර්‍යයෙහි වැටෙ මැයැ, රූපකායාතිශයෙහි වැටෙ ම යැ, විස්තීර්ණ යශොරාශියෙහි වැටෙ මැ යැ, අතුල්‍යශ්‍රානසම්භාරයෙහි වැටෙ ම යැ, සාතිශයපුණ්‍යසම්භාරයෙහි වැටෙ ම යැ, නිරුත්තර වීර්‍යයෙහි වැටෙ මැයි. එවංවිධ භගයෙන් යුක්ත වන බැවින් "භගා අස්‍ය සන්ති" යන

---

1 දානශීලාදිපාරප්‍රාප්ත EFG  2 කල්හි B
3 පවුච්චති ABCDE  4 භාග්‍යවත්තායෙන් G

අර්ථයෙහි "මතුප්" කළ කලැ "භගෛයර්‍යුක්ත ඉති භගවාන්" යනු වෙ.

සර්ධර්මයන් ස්කන්ධාදි විසින් විභාග කොට ඔවුනුදු නාම රූප විසින් තොර කොට රූප ද භූතභෞතික විසින් ලක්ෂණරස විසින් සභාගවිසභාග විසින් සනිදර්ශනසප්‍රතිඝ විසින් තොර කොට නාම ද වෙදනා විසින් සංඥා විසින් සංස්කාර විසින් විඥාන විසින් ඔවුනුදු කුශලවිසින් අකුශලවිසින් අව්‍යාකෘතවිසින් හෙතු විසින් න හෙතුවිසින් හෙතුසම්ප්‍රයුක්තවිප්‍රයුක්තවිසින් වහිදු කාමාවචරාදිවිසින් චිත්තවෛතසික විසින් ද්වාදශාඞ්ගයෙහි එව ප්‍රත්‍යයප්‍රත්‍යයීභාවයෙන් තොර කොට, මෙ හැම ධර්මයො මැ ඉපද නස්නා බැවින් අනිත්‍යයහ උදයව්‍යය පීඩිත වන බැවින් දුඃඛයහ අවශවර්ත්ති වන බැවින් අනාත්මයහ යි විදර්ශනාරූඪ කොට, ඥානදර්ශනවිශුද්ධි පර්‍යන්ත කොට සර්ඥතාඥානයෙන් විනෙයජනයහට විභාග කොට දෙසූ වන බැවින් "විභක්තවත්" වී නුයි "විභක්තවානිති භගවාන්" යනු වෙ – "භාජ=පාඨක්කමීණි" යන ධාතුයි.

දිව්‍යබ්‍රහ්මආයර්‍යවිහාරයනුද් කායවිත්තොපධිවිවෙක යනුද් සෙසු ලොකිකලොකොත්තරධර්මයනුද් සෙවා කළ වන බැවින් "භක්තවත්" වී නු යි "භක්තවානිති" භගවාන්" යනු වෙ– "භජ=සෙවායාමි" යන ධාතුයි.

යම්සෙ ලොකයෙහි "මෙහනස්‍ය ඛස්‍ය මාලා" යි කිවමනා කල්හි "මෙඛලා" යනු වෙ ද; එ සෙයින් මැ "භවෙෂු වාන්තගමනඃ" යි කිවමනා කලැ "භව" ශබ්දයෙන් භකාරයා "ගමන" ශබ්දයෙන් ගකාරයා "වන්ත" ශබ්දයෙන් වකාරයා දික් කොට ගෙනැ "භවෙෂුවාන්තගමන ඉති භගවාන්" යනු වෙ.

එසින් කිහ:-

35. "භාග්‍යවා භග්ගවා සුත්තා හංගහි ච විහත්තවා
හත්තවා වන්ත ගමනෝ භවෙසු භගවා තථා" යි.

මෙසෙ බුදුන්ගෙ අනෙකගුණවිශෙෂයෙන් සුත් නාම විභාග කෙරෙමින් කිහ ධම්සෙනෙවි සැරියුත් මහතෙරහු:-

36. "භගවාති ගාරවාධිවචනං, අපි ච භග්ගරාගොති භගවා, භග්ගදොසොති භගවා, භග්ගමොහොති භගවා, භග්ග මානොති භගවා, භග්ගදිට්ඨීති භගවා, භග්ගකණ්ටකොති භගවා, භග්ගකිලෙ සොති භගවා, භජී විභජී [1] පවිභජී ධම්මරතනන්ති භගවා, භවානං අන්තකරොති භගවා, භාවිතකායො භාවිත සීලො භාවිතචිත්තො භාවිතපඤ්ඤොති භගවා, භජී වා භගවා අරඤ්ඤවනපත්ථානි පන්තානි සෙනාසනානි අප්පසද්දානි අප්ප නිග්ඝොසානි විජනවාතානි මනුස්සරාහසෙය්‍යකානි පටිසල්ලානසා රුප්පානීති භගවා, භාජී වා භගවා චීවරපිණ්ඩපාතසෙනාසන ගිලානපච්චයභෙසජ්ජ පරික්ඛාරානන්ති භගවා, භාජී වා භග්ගවා අත්ථරසස්ස ධම්මරසස්ස විමුත්තිරසස්ස අධිසීලස්ස අධිචිත්තස්ස අධිපඤ්ඤායාති භගවා, භාජී වා භගවා චතුන්නං ඣානානං චතුන්නං අප්පමඤ්ඤානං චතුන්නං [2] ආරුප්පසමාපත්තීනන්ති භගවා, භාජී වා භගවා අට්ඨන්නං විමොක්ඛානං අට්ඨන්නං අභිභායතනානං නවන්නං අනුපුබ්බ විහාරසමාපත්තීනන්ති භගවා, භාජී වා භගවා දසන්නං සඤ්ඤා භාවනානං දසන්නං කසිණ සමාපත්තීනං ආනාපානසතිසමාධිස්ස අසුභසමාපත්තියාති භගවා, භාජී වා භගවා චතුන්නං සතිපට්ඨානානං චතුන්නං සම්මප්පධානානං චතුන්නං ඉද්ධිපාදානං පඤ්චන්නං ඉන්ද්‍රියානං පඤ්චන්නං බලානං සත්තන්නං බොජ්ඣඞ්ගානං අරියස්ස අට්ඨඞ්ගි කස්ස මග්ගස්සාති භගවා, භාජී වා භගවා දසන්නං තථාගත

---

1 පවිවිභජී A  පවිභජී BD  2 අරූප AB

බලානං වතුන්නං වෙසාරජ්ජානං වතුන්නං පටිසම්භිදානං ඡන්නං අභිඤ්ඤානං ඡන්නං බුද්ධධම්මානන්ති භගවා- භගවාතිනෙතං නාමං මාතරාකතං න පිතරා කතං නභාතරා කතං න භගිනියා කතං නමිත්තාමච්චෙහි කතං න ඤාතිසාලොහිතෙහි කතං න සමණබ්‍රාහ්මණෙහි කතං න දෙවතාහි කතං; විමොක්ඛන්තික මෙතං බුද්ධානං භගවන්තානං බොධියා මූලෙ සහ සබ්බඤ්ඤුත ඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං භගවා"යි.

මෙ යෑ භගවත් නම්.

---

එහි අර්ත් නම් කවර යත්?

"ආරාද් හතත්වාදර්ත්, [1] අරිණාං හතත්වාදර්ත්, අරාණාඤ්ච හතත්වාදර්ත්, ප්‍රත්‍යයාදිනාමර්ත්වාදර්ත්, පාපකරණෙ රහෝභාවාදර්ත්" යන මෙ පස්අර්ථයෙන් අර්ත් නම් වෙ.

එහි "ආරාද් හතත්වාදර්ත්" යන තන්හි [2] හන්තිහි ගතියදු පඨිත වන බැවින් තථාගත සර්ථක්ලෙශයන් කෙරෙන් ආරාද්ගතයෑ, අතිදූරයෙහි ස්ථිතයෑ, මාර්ගඥානයෙන් සවාසන ක්ලෙශයන් විධ්වංසනය කෙළෙයෑ යන අර්ථයි.

එයින් කිහ:-

37. "සො තතො ආරතා නාම යස්ස යෙනාසමඞ්ගිතා
අසමඞ්ගී ච දොසෙහි නාථො තෙනාරහං මතො"යි

"අරිණාං හතත්වාදර්ත්" යන තන්හි [2] හන්තිහි හිංසාර්ථ වන බැවින් තථාගතයා විසින් කෙළෙස් නමැති [3] අරිහි - ශත්‍රැහු මාර්ගඥානයෙන් හතයහ - විධ්වස්තයහ යන අර්ථයි.

---

1 අරිණාං වා EF 2 හන්තිහු G 3 අරිහු G

එසින් කිහ:-

38. "යස්ස රාගාදිසංඛාතා සංඛේපි අරයෝ හතා
පඤ්ඤාසත්ථේන තස්සාපි අරහං මතෝ"යි.

"අරාණාඤ්ච හතත්තාදීහින්" යන තන්හි අවිද්‍යාභව තෘෂ්ණාමයනාගි ඇති පුණ්‍යාදි අභිසංස්කාරමය[1] දැව් ඇති ජරා මරණමය නිමි ඇති ආශ්‍රවසමුදයමය අතුරෙකින් විද ශීඝව නමැති රථයෙහි යොදනලද අනාදිකාලප්‍රවෘත්ත වූ යමී සංසාර චක්‍රයෙක් ඇද්ද එවිහුගෙ අරයෝ මෙවිහු විසින් බොධිමණ්ඩ යෙහි වීර්‍යපාදයෙන් ශීලපාවිවියෑ සිට ශ්‍රද්ධා නමැති හස්තයෙන් කර්මක්ෂය කර ඥාන නමැති පරශුව ගෙනැ හත්ත බරත ලදහ යන අර්ථයි - නොහොත් සංසාරචක්‍රයයි අනවරාග්‍රසංසාරවෘත්තයමැ කියනු ලැබේ. එහිදු අවිද්‍යා නාගි වෙයි මුල් වන බැවින්. ජරා මරණ නිමි වෙයි පර්‍යවසාන වන බැවින්.[2] සෙසු දශධර්මයෝ අර වෙති අවිද්‍යා ජරාමරණ දෙදෙනාගෙ මධ්‍යවර්ත්ති වන බැවින්. භගවත් එවංවිධ ප්‍රතීත්‍යසමුත්පාදචක්‍රය සම්‍යක්කාර යෙන් පරිඥාන කොට එහි නිවේද[3] ජනවා ඔහුගෙ අරයන් විධ්වංසනය කෙළෙයැ යන අර්ථයි.

එසින් කිහ:-

39. "අරා සංසාරචක්කස්ස හතා ඤාණාසිනා යතෝ
ලෝකනාථේන තේනෙස අරහන්ති පවුච්චති"යි.

"ප්‍රත්‍යයාදීනාමර්හත්වාදීහින්" යන තන්හි සතරාමර ලොනස හට අග්‍රදක්ෂිණීය වන බැවින් විවරාදිප්‍රත්‍යයනට ද පූජාවිශෙෂයනට ද අර්හයැ නිස්සයැ යන අර්ථයි - තථා හි - සහස්‍රපත්‍රමහාබ්‍රහ්ම මෙරගල් පමණ රූවන්දමෙකින් බුදුන් පිදිය. සෙසු දෙව බ්‍රහ්ම අසුර ගරුඩ නාග කින්නර සිද්ධ විද්‍යාධරයෝ

---

1 "ය" absent in ABCDEF 2 තස්සCEF 3 දනවා B

යථාශක්තීන් පිදූහු. බිම්බිසාරකොශලරාජාදි මනුෂ්‍යයෝ ද යථාබලයෙන් පිදූහු. පිරිනිවි බුදුන් උදෙසා එකදවස මැ සයානූකෙළක් ධන විසඳ ධර්මාශොකරජ මුළුදඹදිවැ සුවාසූ දහසක් වෙහෙර පිහිටුවී. සෙසු පූජාවිශෙෂයෙහි මැ කවර කථා යැ ?

එසින් කීහ:-

40. "පූජාවිසෙසං සහපව්වයෙහි යස්මා අයං
අරහති ලොකනාථො
අත්ථානුරූපං අරහන්ති ලොකෙ තස්මා ජිනො
අරහති නාමමෙතං" යි.

"පාපකරණෙ රහොභාවාදහීන් යන තන්හි යම්සෙ ලොකයෙහි කිසි පණ්ඩිතමානි බාලකෙනෙක් අකිත්තිභිරු වැ රහස්හි පව් කෙරෙති, මෙ වූ කල එසෙසින් කිසිකලෙක්හිදු [1]නොකෙරෙයි යන අර්ථයි.

එසින් කීහ:-

41. "යස්මා නත්ථි රහො නාම පාප කම්මෙසු භාදිනො
රහාභාවෙන තෙනෙස [2]අරහං ඉති විස්සුතො" යි.

මෙහි "ප්‍රත්‍යයාදීනාමහීත්වාදහීන්" යන තන්හි "අහී= පූජා යාම්" යන ධාතුහු කෙරෙන් "අහීඃ ප්‍රශංසායාම්" යන සූත්‍රයෙන් "ඝඤ්" ප්‍රත්‍යයවිධානයෙන් "අහීත්" වෙයි. සෙසු [3] තන්හි නෙරුක්තිකවිධීන් වර්ණවිකාර හා වර්ණවිනාශ කළ කලැ "අහීත්" යනු වෙ.

මෙසෙසින් "ආරාද්" හත්වාත්, අරීණාං හත්වාත්, අරාණාඤ්ච හත්වාත්, ප්‍රත්‍යයාදීනාමහීත්වාත්, පාපකරණෙ

---

1 නොකෙරෙතිසි CD 2 අරහා ABCD 3 තෙසු B

රහො'භාවාත් අභීත්" යනු වෙ.

එයින් කිහ:-

42. "ආරකත්තා හතත්තා ච හිලෙසාරීන සො මුනි
හතසංසාරචක්කාරො පච්චයාදීන වාරහො
න රහො කරොති පාපානි අරහං තෙන
[1] වුච්චති" යි.

මෙ යැ "අභීත්" නම්.

---

<u>සම්‍යක්සම්බුද්ධ</u> නම් කවර යත්?

සර්වධර්මයන් සර්වාකාරයෙන් පරොපදෙශරහිත වැ සවයම්භූඥානයෙන් නිරවශෙෂ කොට අවගමන කළ වන බැවින් "සම්‍යක් සම්බුද්ධ" නම් වෙ.

එයින් වදාළහ ධම්සෙනෙවි සැරියුත් මහතෙරහු:-

43. "බුද්ධොති යො සො භගවා සයම්භූ අනාචරියතො පුබ්බෙ අනනුස්සුතෙසු ධම්මෙසු සාමං සච්චානි අභිසම්බුජ්ඣි, තත්ථ සබ්බඤ්ඤූ තප්පත්තො බලෙසු ච වසීභාවං- බුද්ධොති කෙනට්ඨෙන බුද්ධො? බුජ්ඣිතා සච්චානීති බුද්ධො, බොධෙතා පජායාති බුද්ධො, සබ්බඤ්ඤුතාය බුද්ධො, සබ්බදස්සවිතාය බුද්ධො, අනඤ්ඤනෙය්‍යතාය බුද්ධො, විසවිතාය බුද්ධො, ඛීණා සවසංඛාතෙන බුද්ධො [2] නිරූපලෙප සඞ්ඛාතෙන බුද්ධො, එකන්තවිතරාගොති බුද්ධො, එකන්ත වීතදොසොති බුද්ධො, එකන්තවීතමොහොති බුද්ධො, එකන්ත නික්කිලෙසොති බුද්ධො, එකායනමග්ගං ගතොති බුද්ධො, එකොඅනුත්තරං සම්මා

---

1 පවුච්චති ABCDEF 2 නිරූපධි BC නිරූපනධි A

සම්මාසම්බුද්ධොති බුද්ධා, [1] අබුජ්ඣිවිහතත්තා [2] බුද්ධි පටිලාභා බුද්ධා. බුද්ධොති නෙතං නාමං මාතරාකතං, න පිතරා කතං, නභාතරා කතං, න භිහිනියා කතං, න මිත්ත මච්චෙහි කතං, න ඤාතිසාලොහිතෙහි කතං, න සමණබ්‍රාහ්මණෙහි කතං, න දෙවතාහි කතං, විමොක්ඛන්තිකමෙතං බුද්ධානං භගවන්තානං බොධියාමූලෙ සහ සබ්බඤ්ඤුතඤාණස්ස පටිලාභා සච්ඡිකා පඤ්ඤත්ති යදිදං බුද්ධා" සි.

මෙ සෑ "සම්‍යක්සම්බුද්ධ"නම්.

---

එහි <u>විද්‍යාවරණ</u> නම් කවර යත්?

විදර්ශනාඥානාදි අෂ්ටවිද්‍යාසෑ ප්‍රාතිමොක්ෂසංවරශීලාදි පඤ්චදශවරණධර්මයොයි. ඒසෙයැ යත්?

ඒසෙ මැ නෙ:-

44. "විපස්සනාඤාණමනොමයිද්ධි ඉද්ධිප්පභෙදෙපි ච
දිබ්බසොතං
පරසත්තචෙතොපරියායඤාණං නිවාසානුගතඤ්ච
ඤාණං.
දිබ්බඤ්ච චක්ඛාසවසංඛයො ච එතානි ඤාණානි
ඉධඩ්ඪවිජ්ජා
අලඞ්කරුං යා මුනිධම්මදෙහං විසෙසසොභා
ගුණමජ්ඣුපෙතා.
සීලං වරං ඉන්ද්‍රියසංවරො ච මත්තාසිතා
ජාගරියානුයොගො.
සද්ධාහිරොත්තප්පබහුස්සුතත්තං පරක්කමො චෙව
සති මති ච.

---

1 අබුද්ධිවිහතත්තා B; අබුද්ධහතත්තා AF
2 බුද්ධපටිලාභත්තා ACEF පටිලාභතාය B

වත්තාරි ඣානානි ච තානිමානි තිපඤ්චධම්මා
චරණානි ජඤ්ඤා
චතෙහි විජ්ජාහි ච සම්පයොගා සම්පන්න විජ්ජා
චරණො මුනිනෙදා" යි.

මේ "විද්‍යාචරණ" ගුණයැ.

දශබල නම් කවර යත්?

හස්තීන් [1] දසදෙනක්හු බල හා සම වූ බුදුන්ගෙ කායබල ද දශබල වෙ ම යැ, දශස්ථානයෙක්හි අකම්ප්‍ය වූ ඥානබල ද දශබල වෙ මැයි.

කිසෙයැ යත්?

45. "කාළාවකඤ්ච ගඩ්ගෙය්‍යං පණ්ඩරං තම්බපිඩ්ගලං
ගන්ධමඩ්ගලහෙමඤ්ච උපොසථජද්දන්තිමෙ දස"යි

දක්වනලද හස්ති කුලයෙහි ආදි කාළාවක නම් ප්‍රකෘති එක් හස්තියෙක් මධ්‍යමපුරුෂයන් දසදෙනක්හට බල ඇත්තෙයැ. කාළාවකහස්තීන් දසදෙනක්හට බල ඇත්තෙයැ. ගඩ්ගෙය්‍ය කුලෙහි එක් ඇතෙක්. ගඩ්ගෙය්‍යයන් දසදෙනක්හට බල ඇත්තෙයැ පාණ්ඩර කුලෙහි එක් ඇතෙක්. පාණ්ඩරයන් දස දෙනක්හට බල ඇත්තෙයැ, තාම්‍රකුලෙහි එක් ඇතෙක්. තාම්‍රයන් දසදෙනක්හට බල ඇත්තෙයැ පිඩ්ගල කුලෙහි එක් ඇතෙක්. පිඩ්ගලයන් දසදෙනක්හට බල ඇත්තෙයැ ගන්ධ හස්ති කුලෙහි එක් ඇතෙක්. ගන්ධ හස්තීන් දසදෙනක්හට බල ඇත්තෙයැ මඩ්ගල කුලෙහි එක් ඇතෙක්. මඩ්ගලයන් දස දෙනක්හට බල ඇත්තෙයැ හෙමකුලෙහි එක් ඇතෙක්. හෙමයන් [2] දසදෙනක්හට බල ඇත්තෙයැ පොෂථකුලෙහි එක් ඇතෙක්. පොෂථයන් දසදෙනක්හට බල ඇත්තෙයැ ෂඩ්දන්ත කුලෙහි එක් ඇතෙක්. ෂඩ්දන්තයන් දසදෙනක්හට බල ඇත්තාහ බුදුහු.

---

1 දසදෙනකුගෙ BEG  2 හෙමවතයන් ACF

චත්තාරි ඣානානි ච තානිමානි තිපඤ්ඤමා
වරණානි ජඤ්ඤ
චංතහි විජ්ජාහි ච සම්පයොගා සම්පන්න විජ්ජා
වරණෝ මුනින්දූ" යි.

මේ "විද්‍යාවරණ" ගුණයෑ.

දශබල නම් කවර යත්?

හස්තීන් [1] දසදෙනක්හු බල හා සම වූ බුදුන්ගෙ කායබල ද දශබල වේ ම යෑ. දශඥානයෙක්හි අසම්‍ය වූ ඥානබල ද දශබල වේ මැයි.

කිසෙයෑ යත්?

45. "කාළාවකඤ්ච ගඞ්ගෙය්‍යං පණ්ඩරං තම්බපිඞ්ගලං
ගන්ධමඞ්ගලහෙමඤ්ච උපොසථජජූනාමෙ දස" යි

දක්වනලදු හස්ති කුලයෙහි ආදි කාළාවක නම් ප්‍රකෘති වක් හස්තියෙක් මධ්‍යමපුරුෂයන් දසදෙනක්හට බල ඇත්තෙයෑ. කාළාවකහස්තීන් දසදෙනක්හට බල ඇත්තෙයෑ. ගඞ්ගෙය්‍ය කුලෙහි වක් ඇතෙක්. ගඞ්ගෙය්‍යයන් දසදෙනක්හට බල ඇත්තෙයෑ පාණ්ඩර කුලෙහි වක් ඇතෙක්. පාණ්ඩරයන් දස දෙනක්හට බල ඇත්තෙයෑ. තාම්‍රකුලෙහි වක් ඇතෙක්. තාම්‍රයන් දසදෙනක්හට බල ඇත්තෙයෑ පිඞ්ගල කුලෙහි වක් ඇතෙක්. පිඞ්ගලයන් දසදෙනක්හට බල ඇත්තෙයෑ ගන්ධ හස්ති කුලෙහි වක් ඇතෙක්. ගන්ධ හස්තීන් දසදෙනක්හට බල ඇත්තෙයෑ මඞ්ගල කුලෙහි වක් ඇතෙක්. මඞ්ගලයන් දස දෙනක්හට බල ඇත්තෙයෑ හෙමකුලෙහි වක් ඇතෙක්. හෙමයන් [2] දසදෙනක්හට බල ඇත්තෙයෑ පොෂථකුලෙහි වක් ඇතෙක්. පොෂථයන් දසදෙනක්හට බල ඇත්තෙයෑ ඡද්දන්ත කුලෙහි වක් ඇතෙක්. ඡද්දන්තයන් දසදෙනක්හට බල ඇත්තාහ බුදුහු.

---

1 දසදෙනකුගෙ BEG  2 හෙමවතයන් ACF

ඔහු ප්‍රකෘතිහස්තිගණනායෙන් කොටිසහස්‍රයක් ඇත්නට බල ඇත්තාහ. පුරුෂගණනායෙන් දශකොටිසහස්‍රයක් පුරුෂයනට බල ඇත්තාහ.

මෙ යැ "නාරායණබල" නම්—මෙ බුදුන්ගෙ කායබලයි.

මෙ බල බාහිර වන බැවිනුද් තියර්‍යග්ගතයන් හා සාධාරණ වන බැවිනුද් මෙයින් දුඃඛක්ෂය නොවන බැවිනුද් කායබල මෙහි ගෘහීත නොවෙයි, ඥානබල මැ ගෘහීත වෙ.

එහි ඥානබල නම් කවර යත්?

ස්ථානාස්ථාන දන්නා නුවණැ කාලත්‍රයවර්ත්ති වූ කර්මසමාදාන යන්ගෙ යථාභූතවිපාක දන්නා නුවණැ සර්වත්‍රගාමිනී වූ ප්‍රතිපත් දන්නා නුවණැ අනෙකධාතුනානාධාතුලොක[1] දන්නා නුවණැ සතුන්ගෙ නානාධිමුක්තිකත්ව දන්නා නුවණැ ඔවුන්ගෙ ම ඉන්ද්‍රිය පරාවරතා දන්නා නුවණැ ධ්‍යානවිමොක්ෂ සමාධිසමාපත්තීන්ගෙ සංක්ලෙශ ව්‍යවදාන ව්‍යුත්ථාන දන්නා නුවණැ පූර්වනිවාස දන්නා නුවණැ සතුන්ගෙ ව්‍යුති උපපත්ති දන්නා නුවණැ ආශ්‍රවක්ෂය දන්නා නුවණැ යන මෙ දශවිධ ඥානබලයි.

මෙහි දෘෂ්ටිසම්පන්න පුද්ගලයක්හු විසින් කිසි කවර සංස්කාර ධර්මයක් නිත්‍යයයි ගන්නට කාරණ නැතියි දන්නා නුවණ ද; එසෙ ම සුඛයයි ගන්නට ද, ආත්මයයි ගන්නට ද, පඤ්චානන්තර්‍යකර්ම කරන්නට ද, අනෙක් ශාස්තෘවක්හු උදෙසන්නට ද, කාරණ නැතියි දන්නා නුවණ ද; එකකාලයෙහි බුදුන් දෙදෙනක්හු චක්‍රවර්ත්තීන් දෙදෙනක්හු උපදනට කාරණ නැතියි දන්නා නුවණ ද; ස්ත්‍රීත්වයෙහි සිට බුදුවන්නට ද, චක්‍රවර්ත්ති වන්නට ද, ශක්‍ර වන්නට ද, මාර වන්නට ද, බ්‍රහ්ම වන්නට ද කාරණ නැතියි දන්නා නුවණ ද; ත්‍රිවිධදුශ්චරිතයෙන් ඉෂ්ටවිපාක වන්නට කාරණ නැතියි දන්නා නුවණ ද; ත්‍රිවිධදුශ්චරිතසමඩ්ගි

---

1 "ලොක" absent in B

වූවහු[1] ඒ හෙතුවින් සුගතියෑ උපදනට කාරණ නැතියි දන්නා නුවණ දැ; යම් යම් ධර්මතෙනෙක් යම් යම් ධර්මතෙනෙක්නට හෙතු නො වෙද්ද ප්‍රත්‍යය නො වෙද්ද ඔහු ඒ ඒ ධර්මයනට අහෙතුහ, අප්‍රත්‍යයහ, අස්ථානයහයි දන්නා නුවණ දැ; පෘථග්ජනයන්හු විසින් වනාහි කිසි කවර සංස්කාර ධර්මයක් නිත්‍යයයි ගන්නට කාරණ ඇතියි දන්නා නුවණ දැ; එසෙ ම සුඛයයි ගන්නට ද, ආත්මයයි ගන්නට ද, පඤ්චානන්තර්‍යකර්ම කරන්නට ද, අනෙක් ශාස්තෘවන්හු උදෙසන්නට ද කාරණ ඇතියි දන්නා නුවණ දැ; එකකාලයෙහි බුදුන් දෙදෙනක්හු සක්විත්තන් දෙදෙනක්හු නො උපදනට කාරණ ඇතියි දන්නා නුවණ දැ; සක්‍රත්වයෙහි සිට බුදු නොවන්නට ද, චක්‍රවර්ත්ති නොවන්නට ද, ශක්‍ර නො වන්නට ද, මාර නො වන්නට ද, බ්‍රහ්ම නොවන්නටද කාරණ ඇතියි දන්නා නුවණ දැ; ත්‍රිවිධසුචරිතයෙහි ඉෂ්ටවිපාක වන්නට කාරණ ඇතියි දන්නා නුවණ දැ; ත්‍රිවිධසුචරිතසමඩියි වැ ඒ හෙතුවින් සුගතියෑ උපදනට කාරණ ඇතියි දන්නා නුවණ දැ; යම් යම් ධර්මතෙනෙක් යම් යම් [2]ධර්මතෙනක්නට හෙතු වෙද්ද ප්‍රත්‍යය වෙද්ද ඒ ඒ ධර්මයෝ ඒ ඒ ධර්මයනට හෙතුහ, ප්‍රත්‍යයහ, ස්ථානයහයි දන්නා නුවණ දැ; යන මෙ පළමුවන ස්ථානාස්ථාන දන්නා ඥානබලයි.

ඇතමි පාපකර්මයන් ගතිසම්පත්තීන් බාධිත වැ කාල සම්පත්තීන් බාධිත වැ උපධිසම්පත්තීන් බාධිත වැ ප්‍රයොග සම්පත්තීන් බාධිත වැ නො විවස්නා පරීදි දන්නා නුවණ දැ; ඇතමි පාපකර්මයන් ගතිවිපත්ති පිණිස කාලවිපත්ති පිණිස උපධිවිපත්ති පිණිස ප්‍රයොගවිපත්ති පිණිස විවස්නා පරීදි දන්නා නුවණ දැ; ඇතමි කුශලකර්මයන් ගතිවිපත්තීන් කාලවිපත්තීන් උපධිවිපත්තීන් ප්‍රයොගවිපත්තීන් බාධිත වැ නො විවස්නාපරීදි දන්නා නුවණ දැ; ඇතමි කුශලකර්මයන් ගතිසම්පත් කාලසම්පත් උපධිසම්පත් ප්‍රයොගසම්පත් පිණිස විවස්නා පරීදි දන්නා නුවණ දැ; යන මෙ යථාභූතවිපාක දන්නා දෙවන ඥානබලයි.

---

1 වූවාහු DEF  2 කෙනකුන්ට B

මෙ[1] මාර්ග පිළිවෙත් නිරයට පමුණුවයි, මෙ මාර්ග[1] පිළිවෙත් තිර්යග්යොනියට පමුණුවයි, මෙ [1]මාර්ග පිළිවෙත් ප්‍රෙතලොකයට පමුණුවයි, මෙ[1] මාර්ග පිළිවෙත් මනුෂ්‍ය ලොකයට පමුණුවයි, මෙ[1] මාර්ග පිළිවෙත් දිව්‍යලොකයට පමුණුවයි, මෙ[1] මාර්ග පිළිවෙත් නිර්වාණයට පමුණුවයි, මෙසෙ සර්වත්‍රගාමිනී ප්‍රතිපත් දන්නා නුවණ තුන්වන ඥානබලයි.

ස්කන්ධයන්ගෙ නානාත්ව දන්නා නුවණ ද, ආයතනයන්ගෙ නානාත්ව දන්නා නුවණ දැයි මෙසෙ අනෙකධාතු නානාධාතුලොකයාගෙ නානාත්ව දන්නා නුවණ සතරවන ඥානබලයි.

හීනාධිමුක්තික සත්වයො ද ඇති, ප්‍රණීතාධිමුක්තික සත්වයො ද ඇති, හීනාධිමුක්තික සත්වයො හීනාධිමුක්තිකසත්වයන් සෙවිති - භජනය පර්යුපාසනය කෙරෙති, ප්‍රණීතාධිමුක්තික සත්වයො ප්‍රණීතාධිමුක්තිකසත්වයන් සෙවිති - භජනය පර්යුපාසනය කෙරෙතියි දන්නා නුවණ ද; අතීතාධ්වයෙහිද් හීනාධිමුක්තික සත්වයො හීනාධිමුක්තික සත්වයන් සෙවියහ - භජනය පර්යුපාසනය කළහ, ප්‍රණීතාධිමුක්තික සත්වයො ප්‍රණීතාධිමුක්තික සත්වයන් සෙවියහ - භජනය පර්යුපාසනය කළහ, අනාගතාධ්වයෙහිද් හීනාධිමුක්තික සත්වයො හීනාධිමුක්තික සත්වයන්, ප්‍රණීතාධිමුක්තික සත්වයො ප්‍රණීතාධිමුක්තික සත්වයන් සෙවිති - භජනය පර්යුපාසනය කෙරෙතියි දන්නා නුවණ ද යන මෙසෙ සත්වයන්ගෙ නානාධිමුක්තිකත්ව දන්නා ප්‍රඥා පස්වන ඥානබලයි.

පරසත්වයන්ගෙ පරපුද්ගලයන්ගෙ ලොක ශාශ්වතයයි ද, [2]ලොක අශාශ්වතයයි ද, අන්ත ඇත්තේයයි ද, අන්ත[3] නැත්තේයයි ද, හෙ මැ ජීවය හෙ මැ ශරීරයයි ද, ජීව

---

1 මේ මාර්ග මේ පිළිවෙත් AF 2 ලොක absent in CE

3 අන්ත absent in CEF

අනෙකෙකැ ශරීර අනෙකෙකැ යිද, සත්ව මරණින් මත්තෙ වෙයි ද්, මරණින් මත්තේ නො වෙයි ද්, සත්ව මරණින් මත්තෙ නොද වෙයි නොද නො වෙයි ද් ගන්නා ශාශ්වතොච්ඡෙද දෘෂ්ටි සඞ්ඛ්‍යාත ආශය දන්නා නුවණ ද; මෙ අන්තද්වය පරිවර්ත කළානට සර්වධර්මයො ප්‍රතීත්‍ය සමුත්පන්න යහයි උපදනා ආනුලොමිකක්ෂාන්තියයි ද – යථාභූත ඥානයයි ද කියනලද ආශය දන්නා නුවණ ද; කාමරාගානුශය ප්‍රතිඝානුශය මානානුශය දෘෂ්ට්‍යනුශය විචිකිත්සානුශය භවරාගානුශය අවිද්‍යානුශය සඞ්ඛ්‍යාත අනුශය දන්නා නුවණ ද; පුණ්‍යාභි සංස්කාර ආනඤ්ජාභි සංස්කාරාදි වර්ත දන්නා නුවණ ද; සත්වයන්ගෙ හීනාධිමුක්තික ප්‍රණීතාධිමුක්තිකාදි අධිමුක්ති දන්නා නුවණ ද; ප්‍රඥාවක්ෂුසැ හුණු ලොභ ද්වෙෂ මොහ මාන දෘෂ්ටි විචිකිත්සා ස්ත්‍යාන ඖද්ධත්‍ය අත්‍රික අනපත්‍රපාසඞ්ඛ්‍යාත දශක්ලෙශයන් විසින් මහාරජස්ක වූ සත්වයන් දන්නා නුවණ ද; මෙම දශක්ලෙශයන් අනාසෙවිත අභාවිත අබහුලීකෘත හෙයින් අල්පරජස්ක වූ සත්වයන් දන්නා නුවණ ද; අනාසෙවිත අභාවිත අබහුලීකෘත අනුත්සදකෘත වූ ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයන් විසින් මෘදු වූ ඉන්ද්‍රියයන් ඇති සත්වයන් දන්නා නුවණ ද; ආසෙවිත භාවිත බහුලීකෘත උත්සදකෘත ශ්‍රද්ධාදි පඤ්චෙන්ද්‍රියයන් විසින් තීක්ෂ්ණෙන්ද්‍රියවූ සත්වයන් දන්නා නුවණ ද; පාපයෙහි ආශා ඇති පාපානුශය වූ පාපවර්ත වූ පාපයෙහි අධිමුක්ති ඇති මහා රජස්ක වූ මෘද්වින්ද්‍රිය වූ ද්වාකාර සත්වයනුද්, දුර්විඥාප්‍යසත්වයනුද්, කල්‍යාණයෙහි ආශා ඇති කල්‍යාණවර්ත වූ කල්‍යාණාධිමුක්තික වූ අල්පරජස්ක වූ තීක්ෂ්ණෙන්ද්‍රිය වූ ස්වාකාරසත්වයනුද්, සුවිඥාප්‍යසත්වයනුද් දන්නා නුවණ ද; පඤ්චානන්තර්‍යාදි කර්මාවරණයෙනුදු, මිථ්‍යා දෘෂ්ටි සඞ්ඛ්‍යාත ක්ලෙශාවරණයෙනුදු, අහෙතුකප්‍රතිසන්ධි සඞ්ඛ්‍යාත විපාකාවරණයෙනුදු සමන්වාගත වූ ශ්‍රද්ධා නැති කුශල

ඡන්දනැති නීවරණ බහුල වූ අභව්‍ය සත්වයන් දන්නා නුවණ ද; උක්තප්‍රකාර කර්මාවරණ ක්ලෙසාවරණ විපාකාවරණයෙන් දුරු වූ ශ්‍රද්ධාසම්පන්න කුශලච්ඡන්ද ඇති නීවරණ නැති භව්‍යසත්වයන් දන්නා නුවණ ද; යන මෙ සවන ඉන්ද්‍රියපරාවරතාඥානබලයි.

ප්‍රථමධ්‍යානාදි ධ්‍යානධර්මයන් දන්නා නුවණ ද්; අෂ්ට විමොක්ෂ ධර්මයන් දන්නා නුවණ ද්; සවිතර්කසවිචාරසමාධිය, අවිතර්කවිචාර මාත්‍රසමාධිය, අවිතර්කඅවිචාරසමාධිය යන ත්‍රිවිධසමාධීන් දන්නා නුවණ ද්; නිරෝධසමාපත්ති හා සමඟ රූපාරූප අෂ්ටසමාපත්ති දන්නා නුවණ ද්; භානභාගිය වූ සංක්ලෙශයන් දන්නා නුවණ ද්; විශෙෂභාගිය වූ ව්‍යවදාන ධර්මයන් දන්නා නුවණ ද්; එ එ සමාපත්තීන් ව්‍යුත්ථාන හා ව්‍යවදානකරධර්මයන් මුහු ව්‍යුත්ථානයහ මුහු ව්‍යවදානකරයහයි දන්නා නුවණ ද්; යන මෙ සත්වන ඥානබලයි.

"එකම්පි ජාතිං ද්වෙපි ජාතියො" යනාදීන් අතීතා පරිමිතකාලයෙහි ස්කන්ධ සන්තානයෙහි පවත්නා නුවණ අටවන ඥානබලයි.

මෙ සත්හු කායදුශ්චරිතයෙන් වාග්දුශ්චරිතයෙන් මනොදුශ්චරිතයෙන් සමන්වාගත වැ පණ්ඩිත ජනයන් කී සෙයින් සම්‍යක් ප්‍රතිපතැ නො පැවත මිථ්‍යාදෘෂ්ටි ගෙනැ මිථ්‍යාදෘෂ්ටි කර්මසමාදාන කළ හෙයින් කාබුන් [1] මරණින් අපායෙහි උපන්නාහයි[2] දන්නා නුවණ ද; මෙ සත්හු කායසුචරිතයෙන් වාක්සුචරිතයෙන් මනස්සුචරිතයෙන් [3] සමන්වාගත වැ පණ්ඩිතජනයනට උපවාද නොකොට උන් කී සෙයින් පිළිවෙත් කොට සම්‍යග්දෘෂ්ටිකවැ සම්‍යග්දෘෂ්ටි කර්මසමාදාන කළ හෙයින් කාබුන් මරණින් සුගතියැ උපන්නාහයි[2] දන්නා නුවණ ද; මෙසෙ මියන සතුනුදු උපදනා

---

1 මරණින් මත්තෙහි E  2 උපදනාහයි B

3 මනොසුචරිතයෙන් CDE

සතුටුදු හින සත්වයනුදු ප්‍රණීතසත්වයනුදු සුවනීසත්වයනුදු දුර්ගී සත්වයනුදු සුගතියෑ දුගතියෑ තමන් තමන් කළ කර්මවශයෙන් සුවවිදුනා දුක්විදුනා සතුන් විශුද්ධ වූ අමානුෂ වූ දිව්‍යචක්ෂුසින් දන්නා නුවණ තවවන ඥානබලයි.

තථාගත[1] තෙමෙහෙ ආශ්‍රවක්ෂය කළ හෙයින් අනාශ්‍රවවූ චෙතොවිමුක්තිප්‍රඥාවිමුක්තිසඛ්‍යාත නිර්මාණලබන ඵලසමාපත්ති සමවැද වාසය කෙරෙයි දන්නා නුවණ දසවන ඥානබලයි.

මෙයෑ "දශබල" නමී.

---

<u>චතුවෛශාරද්‍ය</u> නමී කවරේ යත්?

බුදුන් "සම්‍යක්සම්බුද්ධ යෙමී" යි කී කලෑ "නැති, මෙනමී ධර්ම කෙනෙක් නා විසින් අනභිසම්බුද්ධ යහ" යි කියන්නට නිසි මහණෙක් හෝ බමුණෙක් හෝ දෙවියෙක් හෝ මරෙක් හෝ බඹෙක් හෝ ලොකයෙහි නෝ ද ඇති - "ක්ෂීණාශ්‍රවයෙමී" යි කිකලෑ "නැති, මෙනෙක් ආශ්‍රවයෝ නා විසින් අපරික්ෂයයහ" යි කියන්නට නිසි කෙනෙක් ලොකයෙහි නෝ ද ඇති - මේ ධර්මයෝ සැඟියට මොක්ෂයට අන්තරායකරයහ" යි කිකලෑ "නැති, මේ ධර්ම අන්තරායකර නෝ වේ" යි කියන්නට නිසි කෙනෙක් ලොකයෙහි නෝ ද ඇති - "මේ ධර්මයෝ නෛර්යාණිකයහ" යි කී කලෑ "නැති, මේ ධර්මයෝ අනෛර්යාණිකයහ" යි කියන්නට නිසි කෙනෙක් ලොකයෙහි නෝ ද ඇති.

මේ සතර ස්ථානයෙහි තමන්ගෙ විශාරදභාව ප්‍රත්‍යවෙක්ෂා කරන බුදුනට උපන් සොමනස්‍යමය ඥානය වෛශාරද්‍ය[2] නමී.

---

1 තෙමේ ABG  2 චතුවෛශාරද්‍ය G

එසින් වදළහ:-

46. "සම්මාසම්බුද්ධස්ස තෙ පටිජානතො ඉමෙ ධම්මා අනභිසම්බුද්ධාති තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා දෙවො වා මාරො වා බ්‍රහ්මා වා කොචි වා ලොකස්මිං සහධම්මෙන පටිචොදෙස්සතීති නිමිත්තමෙතං භික්ඛවෙ න සමනුපස්සාමි, එතමපහං භික්ඛවෙ නිමිත්තං අසමනුපස්සන්තො ඛෙමප්පත්තො අභයප්පත්තො වෙසාරජ්ජප්පත්තො විහරාමි. ඛීණාසවස්ස තෙ පටිජානතො ඉමෙ ආසවා අපරික්ඛීණාති - පෙ - යෙ ඛො පන තෙ අන්තරායිකා ධම්මා වුත්තා තෙ පටිසෙවතො නාලං අන්තරා යායාති - පෙ - යස්ස ඛො පන තෙ අත්ථාය ධම්මා දෙසිතා සො න නිය්‍යාති තක්කරස්ස සම්මා දුක්ඛක්ඛයායාති තත්‍ර වත මං සමණො වා බ්‍රාහ්මණො වා - පෙ - වෙසාරජ්ජප්පත්තො විහරාමී"යි.

මෙය "තථාගතවෙශාරද්‍ය" නමි.

මෙසසින් බුදුහු භගවත් අහිත් සම්‍යක්සම්බුද්ධ වන බැව්හුදු, විද්‍යාචරණශුද්ධියෙන් පරිපූර්ණ වන බැව්හුදු, දශබල චතුවෛශාරද්‍ය ෂඩ් අසාධාරණඥාන චතුර්දශබුද්ධඥාන අෂ්ට දශආවෙණික බුද්ධධර්මාදි අනන්තාපරිමාණගුණරත්නයෙන් ආඪ්‍ය වූ ධර්මකාය ඇතියා.

---

ඔහු පස්ඇස් ඇතියා

මෙහි පස්ඇස් නමි කවර යත්?

මසැස, දිවැස, පැණැස, බුදුඇස, සමතැසි.

එහි මසැස පස්පෑ දිස්සි - නිල්පැහැය, රන්වන්පැහැය රත්පැහැය, කළුපැහැය, සුදුපැහැය සි. එහි යම්තැනෙක

අක්ෂි රොම පිහිටියෙ ද එතන්හි දියමෙරළියමල්සුපුසු සිනිදු පිරිසුදු නිල්පැහැයැ. ඒ චක්ඛුති කිණිහිරිමල්සුපුසු සිනිදු පිරිසුදු රන්වන් පැහැයැ. ඒ චක්ඛුති රතිඳුගොවීසුපුසු සිනිදු පිරිසුදු රත්පැහැයැ. මධ්‍යයෙහි රූක්පෙණෙළඇටසුපුසු සිනිදු පිරිසුදු කවපැහැයැ. ඒ වටා දවහත්තරුසුපුසු සිනිදු පිරිසුදු සුදුපැහැයැ.

එසින් කිහ මහානිද්දෙසයෙහි:-

47. "මංසචක්ඛුම්හි භගවතො පඤ්චවණ්ණා සංවිජ්ජන්ති- නීලොපි වණ්ණෝ පීතකොපි වණ්ණෝ ලොහිතකොපි වණ්ණෝ කණ්හොපි වණ්ණෝ ඔදාතොපි වණ්ණෝ අක්ඛිලොමානි පි භගවතො යත්ථ ච අක්ඛිලොමානි පතිට්ඨිතානි, තං නීලං හොති සුනීලං පාසාදිකං දස්සනෙය්‍යං උම්මාපුප්ඵසමානං; තස්ස පරතො පීතකං හොති සුපීතකං සුවණ්ණවණ්ණං පාසාදිකං දස්සනෙය්‍යං කණිකාරපුප්ඵසමානං; උභතො පි අක්ඛිකූටානි[1] භගවතො ලොහිතකානි හොන්ති සුලොහිතකානි පාසාදිකානි දස්සනෙය්‍යානි ඉන්ද්‍රගොපකසමානානි; මජ්ඣෙ කණ්හං හොති සුකණ්හං අලූඛං සිනිද්ධං පාසාදිකං දස්සනෙය්‍යං අඤ්ජනීඵකසමානං; තස්ස පරතො ඔදාතං හොති සුඔදාතං සෙතං පණ්ඩරං පාසාදිකං දස්සනෙය්‍යං ඔසධීතාරකසමානං" සි.

මෙසෙ[2] පස්පෑ දිස්නා පියවිඇසින් චතුරඞ්ගසමන්වාගත අන්ධකාරයෙහිදු යොදුන්බොල් විදුරුගල් පවා වීනිවිද දකිත්.

එසින් වදළහ:-

48. "පාකතිකෙන මංසචක්ඛුනා අත්තභාවපරියාපන්නෙන පුරිම සුවරිතකම්මාභිනිබ්බත්තෙන සමන්නා යොජනං පස්සති දිවා ච රත්තිඤ්ච" සි - මෙ මසැස.

---

1 කූපානිBCDE 2 පස්පැහැ CDEG

මෙහි දිවඇස් නම් කවර යත්?

ව්‍යවමාන උපපද්‍යමානාදි යථාකර්මෝපගසත්වයන් නිරවශෙෂයෙන් දක්නෙ "දිවඇස්" නම්.

එයින් කිහ එම මහානිදේශයෙහි:-

49. "භගවා දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මුපගෙ සත්තෙ පජානාති - ඉමෙ වත භොන්තො සත්තා කායදුච්චරිතෙන සමන්නාගතා වචීදුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙන සමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨි කම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උප්පන්නා; ඉමෙ වා පන භොන්තො සත්තා කායසුචරිතෙන සමන්නාගතා වචීසුචරිතෙන සමන්නාගතා මනොසුචරිතෙන සමන්නාගතා අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨි කම්මසමාදානා, තෙ කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප්පන්නාති" යි.

මෙසෙයින් අපායගත ස්වර්ගත සත්වයන් දිවඇසින් දක්නාහු එක්ලොකධාතුවෙක සතුන් දකිත්මැයැ, අනෙකලොකධාතුවැ සතුන් දකිත්මැයි.

එයින් කිහ එහි මැ:-

50. "ආකඞ්ඛමානො ච භගවා එකම්පි ලොකධාතුං පස්සෙය්‍ය, දෙවපි ලොකධාතුයො තිස්සොපි ලොකධාතුයො චතස්සොපි ලොකධාතුයො පඤ්චපි ලොකධාතුයො දසපි ලොකධාතුයො වීසතිම්පි ලොකධාතුයො තිංසම්පි ලොකධාතුයො චත්තාලීසම්පි ලොකධාතුයො පඤ්ඤාසම්පි ලොකධාතුයො පස්සෙය්‍ය, සහස්සිම්පි චූළනිකං ලොකධාතුං අවි

සහස්සිම්පි මජ්ඣිමිකං ලොකධාතුං තිසහස්සි මහාසහස්සිම්පි ලොකධාතුං පස්සෙය්‍ය, යාවතා පනාකඞ්ඛෙය්‍ය තාවතකං පස්සෙය්‍ය; එවං පරිසුද්ධං භගවතො දිබ්බචක්ඛු"යි – මෙ දිවඇස.

මෙහි <u>පැණඇස්</u> නම් කවර යත්?

අතීතානාගතවර්තමානවිෂය වූ සර්ව ධර්මයන් සර්වාකාරයෙන් දක්නෙ "පැණඇස්" නම්.

එයින් කිහ:-

51. "භගවා මහාපඤ්ඤො පුථුපඤ්ඤො හාසුපඤ්ඤො ජවනපඤ්ඤො තික්ඛපඤ්ඤො නිබ්බෙධිකපඤ්ඤො පඤ්ඤාප්පභෙද කුසලො පහින්නඤ්ඤෙ අධිගතපටිසම්භිදෙ චතුවෙසාරජ්ජප්පත්තො දසබලධාරී පුරිසාසභො පුරිසසීහො පුරිසනාගො පුරිසාජඤ්ඤො පුරිසධොරය්හො අනන්තඤ්ඤෙ අනන්ත තෙජො අනන්ත යසො අඩ්ඩො මහද්ධනො ධනවා නෙතා විනෙතා අනුනෙතා පඤ්ඤාපෙතා[1] නිජ්ඣාපෙතා[2] පෙක්ඛෙතා[3] පසාදෙතා; සො හි භගවා අනුප්පන්නස්ස මග්ගස්ස උප්පාදෙතා අසඤ්ජාතස්ස මග්ගස්ස සඤ්ජනෙතා අනක්ඛාතස්ස මග්ගස්ස අක්ඛාතා මග්ගඤ්ඤූ මග්ගවිදූ මග්ගකොවිදෙ මග්ගානුගා ච පන එතර හි සාවකා විහරන්ති පච්ඡා සමන්නාගතා; සො හි භගවා ජානං ජානාති පස්සං පස්සති චක්ඛුභූතො ඤාණභූතො ධම්මභූතො බ්‍රහ්මභූතො වත්තා පවත්තා අත්ථස්ස නින්නෙතා අමතස්ස දාතා ධම්මස්සාමි තථාගතො; නත්ථි තස්ස භගවතො අනඤ්ඤාතං අදිට්ඨං අවිදිතං අසච්ඡිකතං අඵස්සිතං පඤ්ඤාය; අතීතං අනාගතං පච්චුප්පන්නං උපාදාය සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණමුඛො ආපාථං ආගච්ඡන්ති"යි යනාදි – මෙ පැණඇසැ.

---

1 සඤ්ඤාපෙතා A සඤ්ඤපෙතා BCD 2 නිජ්ඣාපෙතා ABCD

3 පෙක්ඛාපෙතා ADEF

මෙහි <u>බුදුඇස්</u> නම් කවර යත්?

දශසහස්‍රිලොකධාතුවෑ අල්පරජස්කාදි සත්වයන් දක්නෙ "බුදුඇස්" නම්.

එසින් කිහ:-

52. "හගවා බුද්ධචක්ඛුනා ලොකංඔලොකෙන්නො අද්දස සත්තෙ අප්පරජක්ඛෙ මහාරජක්ඛෙ තික්ඛින්ද්‍රියෙ මුදින්ද්‍රියෙ ස්වාකාරෙ ද්වාකාරෙ සුවිඤ්ඤාපයෙ දුවිඤ්ඤාපයෙ අප්පෙකච්චෙ පරලොක වජ්ජභයදස්සා විනො විහරන්තෙ" යනාදි - මෙ බුදුඇසෑ.

මෙහි <u>සමතැස්</u> නම් කවර යත්?

සර්වඥතාඥානයි. ඒ ඇසින් නොදක්නා දෑ නැත්.

එසින් කිහ: -

53. "සමන්තවක්ඛුං වුච්චති සබ්බඤ්ඤුතඤාණං; හගවා සබ්බඤ්ඤුතඤාණෙන උපෙතො හොති සමුපෙතො [1]උපාගතො සමුපාගතො උප්පන්නො [2] සමුප්පන්නො සමන්නාගතො-

54. න තස්ස අද්දිට්ඨමිධත්ථි කිඤ්චි
අථො අවිඤ්ඤාතමජානිතබ්බං
සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං
තථාගතො තෙන සමන්තවක්ඛු" යි.

මෙ සමතැසෑ.

මෙ යෑ "පස්ඇස්" නම්.

---

[1] උපගතො සමුපගතො A  [2] සම්පන්නො BDG

බුදු දිවැසැබලැසින් ප්‍රකාශෙය
සිංහයෑ යත්?

බුදුන් විසූ සිත මහාවනයෙහි වැඩවසන කල්හි යළි ගෘහාශ්‍රයෙහි ප්‍රකම්පයත්වාසප්‍රාප්ත වූ අනාගාමී "පිඬියාණි" නම් බමුණන් උදය මැ ගඳමල් ගෙන්වා ගෙනැ වෙහෙරට ගොස් බුදුන් වැඳ ගඳින් මලින් පූජා කුවර එයි - ලිච්ඡවීරපුත්‍රයා කුවර කවාමී කරවන "කාංඛාරෙවත" නම් බමුණන් විවිධ වන්නා[1] දැක "කොයට ගොස් එපු" සිත්විය "භවද්ගෞතමයා කරා ගොස් එමි" යි සිතයන් "බපුගෙ ප්‍රඥා හා විපත්කමී සිතැ" යි ප්‍රශ්න කෙරෙ.

එකල්හි පිඬියාණි අගසට ගොස් බුදුහු දැක්මට සමං [2]අතපහර යෙ බුදුන් සෙ දැ දශපාරමිතා පුරා සර්වඥයට ප්‍රාප්ත වූ බුදුකමනකුත් මැ බවුන්ගෙ මුඛ දැසමහා පරිදි දක්වන්නට කියා:-

පා. "කෙ වාපං ගෙ මෙ ච සමණෙ ගොතමෙ පඤ්ඤවෙය්‍යතියං [3] ජානිස්සති ගොපි භූතස්ස භාදිසොව ගෙ සමණෙ ගොතමෙ පඤ්ඤවෙය්‍යතියං ජානෙය්‍යාති" යි.

එසඳ කාරණාල "කාංඛ ප්‍රඥා උදුරකය" යි කිය. පිඬියාණි "එ බවරන්හු විසින් ත්‍රිලෝ භවද්ගෞතමයා පසස්නමි? එවිනට අසුන්ගෙ ප්‍රඥාලෙසින් සමී නැති; යම්ලෙස සපුමල් ගොඩ නිල්මහරෙල් ගොඩ රත්පියුම් ගොඩ රත්සඳුන් ගරිසඳුන් ගොඩ කහාගෙ වණ්ණගන්ධගොඩයන්මැ ප්‍රාණඳිය ද්‍යුගන්ධිදු එව දැ එසව ආගන්තුකවණ්ණගන්ධයන් ප්‍රයෝජන නැති; යම් ලෙ මණිරත්නයෝ ගොඩ වස්ත්‍රමණ්ඩලය ගොඩ කහාගෙ ආලෝකමයක්ම දිලිඹිය දැ එසව අංකුත්

---

1 විත්තහු ABCD 2 අත්‍යන්තපූරකරංස් BC
3 ජානිස්සාමි G

ආලොකයෙකින් ප්‍රයොජන නැති; එසෙයින් මෑ ශ්‍රමණ ගොතම සර්ලොකප්‍රශස්‍ය වූ තමාගෙ ගුණයෙන් මෑ ප්‍රශස්‍තයෑ, ස්තුතයෑ, සර්ලොකයා විසින් ශ්‍රෙෂ්ඨත්වයට ප්‍රාපිතයෑ; ඔවිහට අනුන් විසින් කරනලද ප්‍රශංසායෙන් ප්‍රයොජන නැති. නොඉහාත් කොසොල්රජ කාඝිකොශල වාසින් විසින් ප්‍රශස්‍තයෑ, බිම්සර රජ අඟුමගධවාසින් විසින් ප්‍රශස්‍තයෑ, [1]යෙසු තත්තත්ක්ෂත්‍රිය නරපතිහි තත්තත්ජනපදවාසින් විසින් ප්‍රශස්‍තායහ; වඩ්කිආදි බ්‍රාහ්මණයෙ අනෙකබ්‍රාහ්මණශතයන් විසින්, සකුලුදායිආදි පරිව්‍රාජකයෙ අනෙකපරිව්‍රාජකශතයන් විසින්, අනාථපිණ්ඩිකාදි උපාසකයෙ අනෙකඋපාසකශතයන් විසින්, විශාඛාදි උපාසිකාවො අනෙකඋපාසිකාශතයන් විසින්, උත්පලවර්ණාදි මහාශ්‍රාවිකාවො අනෙකභික්ෂුණීශතයන් විසින්, ශාරීපුත්‍රාදි මහාස්ථවිරයෙ අනෙක භික්ෂුශතයන් විසින්, ශක්‍රාදි දෙවරාජයෙ අනෙකදෙවගණ සහස්‍රයන් විසින්, මහා බ්‍රහ්මාදි බ්‍රහ්මයෙ අනෙකබ්‍රහ්මගණසහස්‍රයන් විසින් ප්‍රශස්‍තායහ; මෙසෙ ප්‍රශස්‍ත වූ සුරවරනරවරයන් විසින් ප්‍රශස්‍තයෑ දිව්‍යමනුෂ්‍යයනට ශ්‍රෙෂ්ඨයෑ ච භවද්ගොතම" යෙමින් කිය:-

58. "කො චාහං හො කො ච සමණං ගොතමං පසංසිස්සාමි? පසත්ථපසත්ථොව සො භවං ගොතමො සෙට්ඨො දෙවමනුස්සානන්ති" යි.

එසඳ කාරණපාල "කියග පිඩ්ගියානිය, ඔහුගෙ කවර ගුණයක් දැක මෙසෙ ප්‍රසන්න විහි?" යි පිළිවිත. එකල පිඩ්ගියානි "කාරණපාලය, යම්සෙ අග්‍රරසපරිභෝජන පුරුෂයෙක් සෙසු හීනරසයන් කෙරෙහි ප්‍රාථීනා නොකෙරෙ ද එසෙයින් මෑ යමෙක් ච භවද්ගොතමයාගෙ ධර්මයන් කෙරෙන් සූත්‍රගෙයාදි යම් යම් ධර්මයක් ඇසුයෙ වී නම් හෙ සෙසු ශ්‍රමණබ්‍රාහ්මණයන්ගෙ

---

[1] තෙසු B

ධර්මයෙහි ප්‍රාථිනා නො කෙරෙයි. යම්සෙ බුභුක්ෂාපිපාසා පරිපීඩිත පුරුෂයෙක් මධුපිණ්ඩයක් ලදින් එයින් යමක් යමක් ගෙනැ ආස්වාදනය කෙළෙ නම් හෙ එ රසයෙන් මැ තෘප්ත වෙද එසෙයින් මැ යමෙක් එ භවද්ගෞතමයාගෙ ධර්මයන් කෙරෙන් සූත්‍රගෙයාදි යම් යම් ධර්මයක් ඇසුයෙ වී නම් හෙ එයින් මැ තෘප්ත වෙයි. යම්සෙ පුරුෂයෙක් හරිචන්දනඝටිකාවක් හො ලොහිතචන්දන ඝටිකාවක් හො ලදින් මූලයෙහි වුව මැනැමය[1] මධ්‍යයෙහි වුව මැනැමය[1] අග්‍රයෙහි වුව මැනැමය[1] ගන්ධාඝ්‍රාණය කරනුයෙ එ මැ සුරභිගන්ධයෙන් ප්‍රමුදිත වෙ ද, එසෙයින් මැ යමෙක් එ භවද් ගෞතමයාගෙ ධර්මයන් කෙරෙන් සූත්‍රගෙයාදි යම් යම් ධර්මයක් ඇසුයෙ වී නම් හෙ එයින් මැ ප්‍රමුදිත වෙයි. යම්සෙ රොගග්‍රස්ත පුරුෂයක්හුගෙ රොගයො භිෂග්වරයක්හු කරා පැමිණ අභාවයට යෙද්ද, එසෙයින් මැ යමෙක් එ භවද් ගෞතමයාගෙ ධර්මයන් කෙරෙන් සූත්‍රගෙයාදි යම් යම් ධර්මයක් ඇසුයෙ වී නම් හෙ එයින් මැ ප්‍රමුදිත වෙයි. යම්සෙ රොග ග්‍රස්ත පුරුෂයක්හුගෙ රොගයො භිෂග්වරයක්හු කරා පැමිණ අභාවයට යෙද්ද, එසෙයින් මැ යමෙක් එ භවද්ගෞතමයාගෙ ධර්මයන් කෙරෙන් සූත්‍රගෙයාදි යම් යම් ධර්මයක් ඇසුයෙ වී නම් ඔහුගෙ ශොකපරිදෙවදුඃඛදොර්මනස්‍යොපායාසාදිහු අභාවයට යෙති. යම්සෙ ඝර්මාභිතප්ත පුරුෂයෙක් ප්‍රසන්න මධුර ශීතල සලිල ඇති පුෂ්කරිණියකට වැද ස්නානපානය කොට සර්වදරථක්ලමථපරිදාහයන් සන්හිඳුවා ද, එසෙයින් මැ යමෙක් එ භවද් ගෞතමයාගෙ ධර්මයන් කෙරෙන් සූත්‍රගෙයාදි යම් යම් ධර්මයක් ඇසුයෙ වී නම් ඔහුගෙ සර්වදරථක්ලමථපරිදාහයො සන්හිඳුති" කිය.

---

1 මනාමය AF

මෙසෙ පිඩසියනිහි "සෙය්‍යථාපි හෝ පුරිසෝ අඟහරස පරිතත්තා නාළෙඤ්ඣසං හීනානං රසානං පිහති" යනාදි විසින් තමා නුවණ පමණින් දක්වන ලද බුදුගුණ අසා කාරණපාල බුදුන් කෙරෙ පැහැදී හුනස්නෙන් නැඟී උත්තරිය වසස්කොට දකුණු දණමඩල බිම ඔබා බුදුන් වසන 1 දස බලා මුදුනෙහි ඇඳිලි බැඳ තුන්සලක් උදන්ඇති "නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස; නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස; නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස" යි.

මෙසෙයින් බුදුහු දිව්‍යමනුෂ්‍යයන් විසින් ප්‍රශස්තයෝයි.

---

## මහු අසාධාරණරත්නයෝ.

කිසෙයෑ යත්? රත්න තෙමෙහෙ ද්විවිධ වේ - සවිඤ්ඤානකයෑ අවිඤ්ඤානකයෑයි. එහි අනින්ද්‍රියබද්ධ වූ මණිරත්නාදි අවිඤ්ඤානකයෑ. ඉන්ද්‍රියබද්ධ වූ හත්ථිරත්නාදි සවිඤ්ඤානකයි. එහි මණිමුක්තාදින් හත්ථ්‍යාදිනට අලඞ්කාර වන බැවින් සවිඤ්ඤානකරත්නමෑ අග්‍ර වේ.

සවිඤ්ඤානකරත්න ද් ද්විවිධ වෙ- තිරීඨරත්නයෑ මනුෂ්‍ය රත්නයයි. එහි තිරීඨරත්නය මනුෂ්‍ය රත්නයට වාහන වන බැවින් මනුෂ්‍ය රත්නය අග්‍ර වෙ.

මනුෂ්‍යරත්නය ද් ද්විවිධ වෙ - ස්ත්‍රීරත්නයෑ පුරුෂ රත්නයයි. එහි ස්ත්‍රීරත්නය පුරුෂ රත්නයට පරිවාරක වන බැවින් පුරුෂ රත්නමෑ අග්‍ර වෙ.

පුරුෂරත්න ද් ද්විවිධ වෙ - ආගාරික රත්නයෑ අනාගාරික රත්නයයි. එහි ආගාරිකයන් කෙරෙහි අග්‍ර වත්‍රවර්තීහි ශීලාදි ගුණ යුක්ත අනාගාරික රත්නය පසඟ පිහිටුවා වැඳ උපස්ථාන

---

1 දස A

කොට දිව්‍යමනුෂ්‍ය සම්පතට පැමිණෙන බැවින් අනාගාරිකරත්නමැ අග්‍ර වෙ.

අනාගාරිකරත්න ද් ද්විවිධ වෙ – පාඨග්ජනරත්නයැ ආර්‍ය්‍ය රත්නයයි. එහි ආර්‍ය්‍යරත්නය අපායභය විනිර්මුක්ත වන බැවින් පාඨග්ජනරත්නයට වඩා අග්‍ර වෙ.

ආර්‍ය්‍යරත්න ද් ද්විවිධ වෙ – ශෛක්ෂ රත්නයැ අශෛක්ෂ රත්නයයි. එහි අශෛක්ෂරත්නය සංසාරභය විනිර්මුක්ත වන වන බැවින් ශෛක්ෂරත්නයට අග්‍ර වෙ.

අශෛක්ෂරත්න ද් ද්විවිධ වෙ – ශුෂ්කවිදර්ශකරත්නයැ සමථයානිකරත්නයයි. එහි සමථයානිකරත්නය සුනිශිතඛඩ්ග පත්‍රයෙකින් කදලිවනච්ඡෙද කරනුවක්හු සෙයින් ක්ලෙශච්ඡෙද කළ වන බැවින් ශුෂ්කවිදර්ශකරත්නයට අග්‍ර වෙ.

සමථයානිකරත්න ද් ද්විවිධ වෙ – ශ්‍රාවකපාරමියට ප්‍රාප්ත ශ්‍රාවකරත්නයැ අප්‍රාප්ත ශ්‍රාවකරත්නයයි. එහි ශ්‍රාවකපාරමි ප්‍රාප්ත වූ ශ්‍රාවක රත්නය සම්භාර වශයෙන් විශෙෂභාග් වන බැවින් අප්‍රාප්ත ශ්‍රාවකරත්නයට අග්‍ර වෙ.

ශ්‍රාවකපාරමිප්‍රාප්ත වූ ශ්‍රාවක රත්නයට වඩා පරොපදෙශ රහිත වැ සත්‍යප්‍රතිවෙධ කළ ප්‍රත්‍යෙක බුද්ධරත්නය මැ අග්‍ර වෙ.

ප්‍රත්‍යෙකබුද්ධරත්නයට වඩා සර්වධර්මයන් සර්වාකාරයෙන් ප්‍රතිවෙධ කළ සම්‍යක්සම්බුද්ධරත්නය මැ අග්‍ර වෙ.

බුදුනට වැඩි අනෙක් රත්නයෙක් නම් නැති.

මෙසෙයින් බුදුහු අසාධාරණරත්නයො

---

ඔව්හු යම්තැනෙක්හිදු වසත් පස්බුදුකිසයෙන් දවස් යවත්.

<u>පස්බුදුකිස</u> නම් කවර යත්?

පෙරබත්කිසයැ, පස්බත්කිසයැ, පෙරයම්කිසයැ, මැදිම්යම්කිසයැ, පැසිම්යම්කිසයැ යන මෙයි.

මෙහි <u>පෙරබත්කිස</u> නම් කවර යත්?

බුදුහු අරුණොදගමන වෙලායෙහි සමාපත්තීන් නැඟී උපස්ථායකයනට අනුග්‍රහ සඳහා ශරීරයට සුව සඳහා දැහැටු[1] කිස නිමවා භික්ෂාචාරවෙලා දක්වා විවික්තාසනයෙහි වැඩහිඳ සමාපත්තිසුඛයෙන් දවස් යවා භික්ෂාචාරවෙලායෙහි ලාරෙසෙන් තෙත් මුරුත මල්කලඹක් බඳු දෙපට අඳනාසිවුර රන්කතුරෙකින් රත්පියුම් දලපෙළක් කඩනුවක්හු සෙයින් සංවිධානයෙන් හැඳ රත්මහනෙල්පෙතිකලඹක් රන්පමුදමෙකින් පරීක්ෂෙප කරනුවක්හු සෙයින් විද්‍යුල්ලතාවක් බඳු කායබන්ධනය බැඳ අෂ්ටාදශහස්ත වූ රුවන් ඇගෑයක් රක්තකම්බලකඤ්චුකයෙකින් වසනුවක්හු සෙයින් න්‍යග්‍රොධඵලවර්ණවූ සුගත්මහපවුල් පෙරෙවැ රක්තොත්පල ගර්භයෙකින් නික්ම යමක සුරක්ත පද්ම මධ්‍යයෙක්හි ප්‍රාදුර්භූත වූ [2]මිණිබමරක්හු බඳු පාත්‍රස්තවිකායෙන් නික්ම ජාලාවනද්ධකර තලයෙහි ප්‍රාදුර්භූත වූ නීලමණිවර්ණපාත්‍රය යුවළතින් ගෙනැ තමන්ගෙ පුණ්‍යානුභාවයෙන් විවෘත වූ දෙර ඇති ගන්ධකුටියෙන්[3] මෙඝගර්භයෙකින් නිර්ගත පූර්ණචන්ද්‍රයක්හු සෙයින් නික්ම ඇතමි කලෙක්හි එකලා වැ ඇතමිකලෙක්හි ශ්‍රාවකගණපරිවෘත වැ ඇතමිකලෙක්හි ප්‍රකෘතිගතීන් ඇතමිකලෙක්හි අනෙකප්‍රාතිහාර්‍ය්‍ය යෙන් ග්‍රාමනිගම ජනපද ප්‍රවිෂ්ට වෙත්.

කිසෙයැ යත්?

බුදුනට පෙරට වැ පෙරට වැ ගොස් ඇතමි වාත කෙනෙක් මාර්ගසංශොධනය කෙරෙමින් යෙති, වලාහකයො පොද විහිද රජස් සන්හිඳුවා උඩපස්පැහැදිස්නා වියන් වැ

---

1 දැහිටි B  2 මණි ACEF  3 ගන්ධකුටින් B

ආතප නිවාරණය කෙරෙමින් යෙහි, ඇතැම් විට නොයෙක් නානා වර්ණ සුගන්ධපුෂ්පයන් ඇර මාලිය විචිත්‍ර කොට සදමින් යෙහි, උත්තතස්ථාන භෞරිතල යෙයින් සමවෙමින් යෙයි, නිම්නස්ථාන ගඟුල යෙයින් පිරෙමින් යෙයි, ඇස්මෙනකලෑ පාදතලයට සුබ සෘජු දෙන සම සියුමි සුදු පුලිනතල හෙවෙයි, මුවරඳබර සුවඳගඳවහන පද්මයෙ තෑහි පාදතල හෙ පිළිගන්හි, ඒ පද්ම ගර්භයෙහි රක්ත සුගන්ධමකරන්දයෙ අනවලොමුදුන් දක්වා නැඟී සින්දුරසුණු යෙයින් මුදුන් රන්වන්සිරුරු කවරමින් බස්හි, ඒ මකරන්දසන්හෙ ඝය අභිභවමින් බුදුන්ගෙ ශරීරප්‍රභා නිත්ම යනු නාළිකායෙන් [1]වුහුටු ඝෘතී රසධාරා යෙයින් ඒ පියස් වක්‍රාලෝක කෙරෙයි, බුදුන් දක්ෂිණ පාදතලය ඉන්‍රනීලයෙන් ඇතුළුකළ විගස ශරීරයෙන් ඝඩිවහීරශ්මියි නිහිත වූ ප්‍රාසාද කූටාගාරාදින් ඝෘතී රසයෙන් පරිභෙග කරනුවන් යෙයින් විසිතුරු සතුරුවන්පට [2] පොරොත්තුවන් යෙයින් භෞබවමින් බබින් බබ [3] දිවෙහි, හංස ඝෙමසුරඝාරිකාදිහු තමන් තමන් සිටි ස්ථානයෙහි මැ සිට මධුර ස්වරයෙන් [4] කූජනා කෙරෙති, අවාදිත වූ භෙරීවීණාදිතූර්‍යයියෝ මධුරධ්වනි විහිදිති, මනුෂ්‍යයන් හැඳ පැළඳ සිටි නානාවිධ රත්න නූපුරාදි ආභරණයෝ ද්‍රවණය කෙරෙත්. ඒ සලකුණෙන් මනුෂ්‍යයෝ අද බුදුහු මෙයට වැඩිබන්දහයි පරිකුඤ්ච වූ හැඳ පැළඳ ගඳමල් ගෙන එළිපෙර හැරපියා තමන් තමන් ගෙන් නිත්ම අන්තරවීථියට බැස ප්‍රසන්නලාඝාරසයට වදනුවන් යෙයින් ඝනීපවප්‍රාවරණ කරනුවන් යෙයින් රත්නොත්පලවිත්තනමධ්‍යයට වදනුවන් යෙයින් ඝඩිවඝීබුඛරශ්මි අතුරට වැද බුදුන් සුදු ක්ෂීර සාගරයෙහි ගැලෙනුවන් යෙයින් බුදුන්ගෙ චරණනඛ මණ්ඩලයෙහි ගැලි ගැලි වැද භෞගපමණින් සත දසක් විස්සක් සියක් දහසකුදු ඉල්වාගෙන [5] බුදුහුදු අසින් පා ගෙන ගන්ධදම පුෂ්පදමරත්නදමාදි නෙතදමයෙන් නිගරණය කරනුවන් වූ නානාරත්නමණිකාරකායෙන් විරචිත විචිත්‍රවිතාන බැඳ නානාප්‍රභා

---

1 වුහුටි AF 2 සත්රුවන් BDG 3 දිවෙන් CEF
4 කූඤ්ඤනාද ADEF කොඤ්ඤනාද B
5 බුදුන් අසිනුදු ADF බුදුන් අසිනුද් CE

සමුදයසමුජ්ජවලිත ජවනිකාපරීක්ෂෙප කොට විවිධද්‍යුති නිකර විහිදුනා විචිත්‍රවස්ත්‍රයෙන් අසුන් පන්වා ප්‍රණීතභොජන විකාතීන් ස්වහස්තයෙන් සන්තාපත 1 කොට අනෙකවිධ පූජාවස්තු වින් පුදා වැඳ එකත්පස් වැ හිඳිත්.

එ කල්හි බුදුහු දෙශනාරශ්මීන් විනෙයජනකුමුදුවනයන් ප්‍රබොධ කොට ශරණශීලයෙහි පිහිටුවා මාර්ගඵලප්‍රාප්ත කොට පැවිදිවියටියනට පැවිදි දී වදාරා චතුර්විධපරිශුද්ධශීල ත්‍රයොදශ ධුතාඞ්ග දශකථාවස්තු ආදි කල්‍යාණධර්මයන් ගන්වා ආසනයෙන් උත්ථිත වැ තරුණරවිකිරණයෙන් දිලියෙන කනකගිරිශිඛරයන් සෙයින් චොරජමින් විහාරයට වැඩ සඟුන් ආහාරකෘත්‍ය සම්පාදනය කොට අවුදු රැස්වනතාක් ගන්ධමණ්ඩලමාලකයෙහි ප්‍රඥප්ත බුද්ධාසනයෙහි වැඩහිඳ සඟුන් සන්ධ්‍යාසනප්‍රභාබදු පාංශුකූලච්චරධර වැ මණිවම්වම්මිත ගන්ධහස්තීන් සෙයින් අවුදු පිරිවැරූ කල්හි උපස්ථායකයන් විසින් 2 දක්වනලදු වැ හුනස්නෙන් නැඟී ගන්ධකුටි ප්‍රවිෂ්ට වෙත් – මෙ පූර්වභක්තකෘත්‍යයැ.

<u>පශ්චාත්භක්තකෘත්‍ය</u>

නම් කවර යත්?

මෙසෙ බුදුහු පූර්වභක්තකෘත්‍ය නිමවා ගන්ධකුටිද්වාරයෙහි ප්‍රඥප්තාසනයෙහි වැඩහිඳ තමන් "යථාවාදී තථාකාරී යථාකාරී තථාවාදී" වන බැවින් පාදතලයෙහි රජොජල්ලිකා 3 නැතද වතාවත් සඳහා පා දෙව මණිසොපානඵලකයෙහි වැඩසිට "මහණෙනි, බුද්ධොත්පාද දුර්ලභයැ, මනුෂ්‍යත්ව දුර්ලභයැ, ක්ෂණ සම්පත් දුර්ලභයැ, ප්‍රව්‍රජ්‍යා දුර්ලභයැ, සද්ධර්මශ්‍රවණ දුර්ලභයැ, අප්‍රමත්ත වැ ත්‍රිවිධශික්ෂා සම්පාදනය කරව" යනාදි විසින් අවවාද කෙරෙත්.

එහි ඇතමි සඟ කෙනෙක් බුදුන් වැඳ කර්මස්ථාන පුළුවුස්ති බුදුහු ඔවිනට වයදීනුකූල කොට කර්මස්ථාන වදාරත්.

---

1 සන්තර්පිත B 2 දක්වනලදුව ABCDEF 3 නැතදහොත් ABC

යම්සෙ තරුණ නවයොවනයෙහි සිටි[1] පහසින්සොඬ පුරුෂයෙක් ශිරඃස්නාන කොට සිටියෙ මහනෙල්මල්කඩක් හො සමන්මල්කඩක් හො යොහොඹුමල්කඩක් හො දෙහොඅතින්[2] පිළිගෙන උත්තමාඞ්ග වූ ශිරස්හි පිහිටුවා දෑ, එසෙයින් මැ ධර්ම රාජයාගෙ වචන සිරසින් පිළිගෙන හැමදෙන බුදුන් වැඳ ප්‍රදක්ෂිණ කොට දිවාවිහාරගත වෙත්.

එහි ඇතම්කෙනෙක් අරණ්‍යයට යෙති, ඇතම්කෙනෙක් වෘක්ෂමූලාදි පලාලපුඤ්ජපර්‍යන්ත දශවිධ සෙනාසනයට යෙති, ඇතම්හු චාතුර්මහාරාජිකාදි වශවර්ත්ති දිව්‍යලොක පර්‍යන්ත ෂඩ්විධ දිව්‍යභවනයට යෙති, ඇතම්හු නාගභවනයට යෙති, ඇතම්හු ගරුඩභවනයට යෙති, ඇතම්හු තතතද්රාජ්‍යයෙහි තමන් ජන්මාන්තරයෙහි රජ වැ වුසූ උද්‍යානයට යෙත්.

එකල්හි බුදුහු සුවර්ණසුරභිගන්ධපුෂ්පොපහාරසමලඞ්කෘත භූමිභාග ඇති ගන්ධකුටි ප්‍රවිෂ්ට වැ රිසියුණො වී නම් දක්ෂිණ පාර්ශ්වයෙන් ස්මෘතිසම්ප්‍රඥානයෙන් යුක්ත වැ ශ්‍රීශය්‍යායෙක්හි තුබූ අලඞ්කෘත ස්වර්ණ රූපයක් සෙයින් මුහුර්ත්තයෙක්හි සිංහශය්‍යායෙන් වැදහෙව ශරීර සතපාගෙනැ නැඟී වැඩහිඳ ද්විතිය භාගයෙහි අනෙකකොටිශතසහස්‍රසමාපත්ති සමවැද සමාපත්තීන් නැඟී මුළු ලො බලනුවො තමන් කෙරෙන් කර්මස්ථාන ගෙනැ සත්ප්‍රාය ස්ථානයෙහි වසන සඟුන් ස්මරණය කොට "අසුවල් මහණ මා කෙරෙන් කර්මස්ථාන ගෙන ගියෙයැ, විශෙෂාධිගමයට සමර්ථ හො අසමර්ථ හො" යි බලනුවො ඉදින් ඔහු කර්මස්ථාන විහිද අකුශල විතර්කයක් සිතන්නා දුටුහු නම්[3] "මා වැනි ශාස්තෘවක්හු කෙරෙන් කර්මස්ථාන ගෙනැ වසන මෙ කුලපුත්‍රයා අකුශලවිතර්කයො අභිභවා අනවරාග්‍ර සංසාරදුඃඛයෙහි කිසෙ නම් ගලනුවහ" යි[4] ඔහු කෙරෙහි අනුකම්පායෙන් එහි පැනී ඔව්හට[5] අවවාද කොට පද්මයක් සෙයින් ඔහු පුබුදුවා ආකාශයට නැඟී තමන්ගෙ වාස ස්ථානයට මැ එළඹෙත්.

---

[1] පිහිටි D [2] දෙහොතින් G [3] සිතන්නාහුදු වූහු නම් A
[4] තවරවනුවහයි A [5] ඔහට ED

තෘතිය භාගයෙහි බුදුහු යම් ගමක් හො නියම්ගමක් හො නිසා වෙසෙද්ද එහි ජනයො පෙරවරු දන් දී පස්වරු හැඳ පැළඳ ගඳමල් ගෙනැ "බුද්ධසෙන්ධවයා කරා එළඹ නුවණපද වික්‍රම බලම්හ, බුද්ධගන්ධ ගජයා කරා එළඹ නුවණකුඤ්චනාද අසම්හ බුද්ධකෙශර සිංහයා කරා එළඹ නුවණසිංහනාද විඳුම්හ" යි විහාරයෙහි සන්නිපතිත වෙත්.

එකල්හි බුදුහු සම්ප්‍රාප්තපර්ෂදට අනුරූප ප්‍රාතිහාර්‍යයෙන් ගොස් ධර්මසභායෙහි ප්‍රඥප්තවරබුද්ධාසනයෙහි වැඩහිඳ අෂ්ටාඞ්ග සමුපෙත නානානයනිපුණ වූ අනෙකාධ්‍යාශයසමුත්ථාන වූ[1] අර්ථ ව්‍යඤ්ජනසම්පන්න වූ විවිධප්‍රාතිහාර්‍යයුක්ත වූ ධර්මාර්ථදෙශනා ප්‍රතිවෙධගම්භීර වූ සර්වසත්වයන් විසින් ස්වභාෂානුරූප කොට ලක්ෂණීය ස්වභාව ඇති වචනයෙන් ධර්මදෙශනා කොට අනෙක දිව්‍ය මනුෂ්‍යයන් මාර්ගඵලයට පමුණුවා කල් බලා සමු දෙත්.

මිනිස්හු තමන් තමන් හෘදයට අමෘතාභිෂෙක බඳු ප්‍රෙමණීය වූ ස්වරයෙන් වදරන බුදුන්ගෙ තෙපුල් අසා "සාධු සාධු" යි අනුමොදනා කොට සිරසින් පිළිගෙනැ හුනස්නෙන් නැඟී බුදුන් වැඳ තුන්යඑක් ප්‍රදක්ෂිණ කොට දසනඛසමවධානයෙන් සමුද්ජ්වලිත අඤ්ජලි මුදුනෙහි බැඳ[2] පිහිටුවා දර්ශනයට විෂය තාක් තැන් බුදුනට අභිමුඛ වැ ගොස් බුද්ධ දර්ශන මුවහ වන තැන සිට සුසම්මෘෂ්ට වූ මුක්තාජාලසින්දුවාරසංස්තරසදෘශ වූ වැලි නො[3]මිරිකා පසඟ පිහිටුවා වැඳ ස්තොත්‍ර කෙරෙමින් යෙත් - මෙ පශ්චාද්භක්ත කෘත්‍යයි.

<u>ප්‍රථමයාමකෘත්‍ය</u> නම් කවර යත්?

බුදුහු ධර්මදෙශනායෙන්[4] උත්ථිත වැ රිසියුණො වී නම් ස්නාන ස්ථානයට වැද ජලශාටිකා හැඳ පෙර වැ නිර්මලසලිල ධාරායෙන් ශරීරයෙහි සෘතුග්‍රහණ කොට සුනිවස්ත වැ සුප්‍රාවෘත වැ

---

[1] සමන්නාගතවූ D
[2] බැඳ ab. in AC
[3] නො ab. in AEF
[4] ධර්මාශනයෙන් B

ගඳෙළ පිරිවෙන් එළඹ පැන්වූ අස්නෙහි මුහුර්තයක් එකලා වැ වැඩහිඳ සමාපත්ති සමවදිත් - එකල්හි සඟහු උපස්ථානයට එළඹ ඇතමිහු ප්‍රශ්න පුළුවුස්ති; ඇතමිහු කර්මස්ථාන අරවති; ඇතමිහු සද්ධර්මශ්‍රවණයට ආරාධනා කෙරෙත්.

බුදුහු සඟුන්ගෙ අභිප්‍රාය සම්පාදනය කෙරෙමින් පෙරයම් ගෙවත් - මෙ ප්‍රථමයාමකෘත්‍යයි.

<u>මධ්‍යමයාමකෘත්‍ය</u> නම් කවර යත්?

සඟුන් අමෘතවර්ෂායෙන්[1] අභිෂික්තගාත්‍ර ඇතියවුන් සෙයින් පින පිනා බුදුන් වැඳ ප්‍රදක්ෂිණ කොට රාත්‍රිවිහාරගත වූ කල්හි දසසහස්‍රීලොකධාතුවැ දිව්‍යබ්‍රහ්මයො අවකාශ ලද්දහු ශරීර ප්‍රභායෙන් වෙහෙරවල් බබුළුවමින් බුදුන් කරා එළඹ මකුටමණි රශ්මීන් වරණයුගලය පුදා වැඳ යථාභිසංස්කෘත වූ ප්‍රශ්නයන් කෙරෙහි අවසාන පරිච්ඡෙද විසින් චතුරක්ෂර ප්‍රශ්නයකුදු පුළුවුස්ති. බුදුහු දිව්‍යබ්‍රහ්මයන්ගෙ ප්‍රශ්න විසඳමින් මැදිමියම් ගළවත් - මෙ මධ්‍යමයාමකෘත්‍යයි.

<u>පශ්චිමයාමකෘත්‍ය</u> නම් කවර යත්?

බුදුහු පශ්චිමයාමය සතර භාගයක් කොට එක් භාගයක් සක්මනින් ගෙවති; දෙවන භාගයෙහි ගඳකිළියට වැද ස්මෘති සම්ප්‍රඥානයෙන් යුක්ත වැ දක්ෂිණ පාර්ශ්වයෙන් සිංහශය්‍යා කෙරෙති තුන්වන භාගයෙහි නැගී වැඩහිඳ ඵලසමාපත්තීන් දවස් යවති; සතරවන භාගයෙහි මහාකරුණාසමාපත්ති සමවැද එයින් නැගී පූර්වබුද්ධයන් කෙරෙහි දානශීලාදි දශපුණ්‍යක්‍රියා වශයෙන් කෘතාධිකාර වූ සූර්‍යරශ්මිස්පර්ශයෙන් පරිපාකයට යන පද්මයන් සෙයින් ආර්‍යභූමියට අවක්‍රාන්ත වන්නට නිසි පුද්ගලයන් දක්නා සඳහා බුදුඇසින් දසසහස්‍රීලොකධාතුවැ විනෙයජනයන් බලමින් අරුණු නඟත් - මෙ පශ්චිමයාම කෘත්‍යයි.

---

[1] අමෘතවර්ෂයෙන්G

මෙයැ "පස්බුදුකිස" නම්.

ඔහු[1] ආකාශය සෙ අනන්තගුණ ඇතියො – කිසෙයැ යත්?

කථ බුද්ධරක්ෂිත මහතෙරහු සැගිරියැ කථතිඛිරිරුක්මුල්හි හිඳ කාළකාරාම සුත්[2] දෙසති; ඒ දවස් රජ අවුදු පිරිස්පය්‍යන්ත යෙහි සිට තියමුරු[3] බණ අසා සූත්‍රය සමහර කරනකලැ සාධුකාර දිනි. මහතෙරහු රජු දැක "කවර වෙලෙහි අයි[4]? මහරජ" යි පිළිවිස "සූත්‍රාරම්භයෙහි මැ ආමි" යි කියෙන් "තා තියමුරු[3] සිටි[5] දුෂ්කරය" යි කිහ. "වහන්ස, හෙ දුෂ්කර නො වෙයි; මා එකඟ සිතින් සිට ඇසූයෙ දුෂ්කරයැ, ඉදින් වහන්සේ බණට ආරම්භ කළ තැන් පටන් ගෙන එකද පදයෙක්හිදු අන්‍යවිහිත වීමි නම් සකල ලඞ්කාද්වීපයෙහි කැහැටු[6] දඬුයෙකින් අන්නා පමණ තැනෙක්හි දු හිමි නො වෙමිවයි ශපථ කෙළෙ.

ශපථ කොට සිට එසූත්‍රයෙහි දැක්වූ බොහො බුදුගුණ අසා "බුදුගුණ මෙතෙක්මයැ හො? සෙසු බුදුගුණ ද හා ඇති හො" යි කීය. "මහරජ, මා කී බුදුගුණට වඩා නොකී බුදුගුණ මැ බෙහෙවැ" යි කිහ. "එයට උපමා හා ඇති හො?" යි කීය. "ඇති මහරජ, යම්සෙ දහසක් කිරි කුඹුරු ඇති හැල්කෙතෙකින් එක්කරලක් ගත්කලැ තුබූ කරල් ම බොහො වෙ ද එසෙයින් මැ මා කී බුදුගුණට වඩා නො කී බුදුගුණ මැ බෙහෙවැ" යි වදාළො.

"අනික් උපමායෙක් හා ඇති හො" යි කීය. "ඇති මහරජ, යම්සෙ මහවතුරෙන් පිරුණු මහඟඟට හිදිකටුමළක් පැ කල එසූවිපාශයෙන් ගිය දිය අල්ප වෙ ද සෙසු දිය බොහො වෙ ද, එසෙයින් මැ මා කී බුදුගුණ අල්පයැ නො කී බුදුගුණ මැ බෙහෙවැ" යි[7] වදාළො.

---

[1] ඔහුCDG [2] සුතක්B [3] තියඹුරුAEF [4] අහිABCEF
[5] සිටියේG [6] කැහිටුCE [7] බොහොවෙයිA

"අනික් උපමායෙක් හා ඇති හොඃ" යි කිය. "ඇති මහරජ, තොසියොතුන්[1] පියා පහරා අහසැ කෙළනා කල්හි එයින් එක්සියොතක්හු ආකාශයෙහි පියා පහළ තැන් බොහොවෙ ද? තුබූ තැන් බොහොවෙ දැ?" යි කිහ. "වහන්සේ,[2] බහු පියා පහළ තැන් මඳ වෙයි තුබූ තැන් බොහා වෙයි" කිය. එසෙයින් මැ මහරජ, මා කී බුදුගුණ මඳ; නො කී බුදුගුණ ආකාශය සෙ අනන්තය" යි වදාළොඃ.

එකල්හි රජ පැහැදැ "අනන්ත බුදුගුණ අනන්ත ආකාශය හා උපමා කළසෙ මහපතැ, එයින් වහන්සෙ කෙරෙහි ප්‍රසන්නයෙමි; ප්‍රසාදානුරූප[3] කායශ්‍රී කරන්නට අසමර්ථයෙමි; මෙ මාගෙ දුහී පඩුරු සියක් යොදුන් ලක්දිවිහි රාජ්‍යය තොපවහන්සෙට දෙමි - දින්මි" යි දින. මහතෙරහුදු රජු තමහට දුන් රජය ඇමින්[4] සෙමෙන් රජ කරා මහරජ," යි ඔහට මැ වදාළොඃ - මෙසෙයින් බුදුහු ආකාශය සෙ අනන්ත වූ අවින්‍ය වූ ගුණ ඇතියොඃ.

---

ඔවුන්ගෙ ගුණ අවින්‍ය පරිදි කිසෙයැ යත්?

සතරෙක් අවින්‍ය වෙයි; කවර සතරයැ යත්? බුඛ විෂය අවින්‍යයැ, ඍද්ධිවිෂය අවින්‍යයැ, කර්මවිෂය අවින්‍යයැ, ලොකවිෂය අවින්‍යයි.

එහි බුඛවිෂය අවින්‍ය පරිදි කිසෙයැ යත්?

බුදුන් විජමි දෙසන්නට උස පසළොස්යොදුන් පළල් පනස් යොදුන් දිග සැටයොදුන් පඩුඇඹුල්සලඅස්න වසා වැඩහුන් කල්හි අටළොස්ගත් බුදුන් සඳහා සලඅස්න කුඩා වූසෙ නොවෙයි; සලඅස්න සඳහා බුදුහු මහත් වූවොඃ නොවෙත්.

---

[1] තෙසියොතුන් ABF
[2] වහන්ස G
[3] ප්‍රසාදානුරූප වූ G
[4] දැහැමින් DG

සාරදහස්අටසියක් යොදුන් රාහුඅසුරිඳු "ඔහු මට ද වඩා මහත් කෙනෙක්දැ" යි බුදුන් කරා නො එළඹ වසනුයෙ බුදුන්ගෙ යශොඝොෂා අසා "ගොස් විමසා බැලුව මැනැවැ"යි බුදුන් කරා එළඹ සිංහශය්‍යායෙන් වැදහොත් බුදුන්ගෙ දෙපත්ලෙහි උඩස[1] බවඅග් දක්වා ද නැඟ බලනුවනට[2] නො පෙනෙන බැවින් අග්පත්ලෙනුද් සිට බලාත් නො දිටි.

අකනිටාබඹතෙලෙහි සිටි දෙලොස්යොදුන් මහබඹහු පොළොතෙලෙහි වැඩහුන් බුදුන්[3] අනවලොමුදුන් අග්‍රපාද තලයෙනුදු[4] සිට බලාත් නො දකිත්. බුදුහු අටලොස්හත් බුදු බඳින් සිටියෙ සිට සර්ෂපගර්භයට ප්‍රවිෂ්ට වෙති; බුදුන් සඳහා සර්ෂපගර්භය මහත් නො වෙයි; සර්ෂපගර්භය සඳහා බුදුහු කුඩා නො වෙති; මෙ සෙසු සෘද්ධිමත්නට අවිෂයයැ; එයින් බුද්ධ විෂය අචින්ත්‍ය වෙ.

<u>සෘද්ධිවිෂය</u> අචින්ත්‍ය පරිදි කිසෙයැ යත්?

සෘද්ධිමත්නට චන්ද්‍රසූර්‍යයො පාදපීඨශයනාසනාදි භාවයට ද පැමිණෙති; ප්‍රකෘතිගතිදු නොපියති; නිර්මිතචන්ද්‍ර සූර්‍යයො ද නැත්. මෙ සෙයින් සෘද්ධිවිෂය අචින්ත්‍ය වෙ.

<u>කර්මවිෂය</u> අචින්ත්‍යපරිදි කිසෙයැ යත්?

කුශලාකුශලකර්මයන් කෙරෙහි එකකර්මොපබෘහිත සත්වයන් කෙරෙන් එකෙක් මනුෂ්‍යයන් කෙරෙහි උපද්දි; එකෙක් චාතුර්මහාරාජිකාදි තත්තත්ස්ථානයෙහි උපද්දි; එහිදු එම කර්මයෙන් උපන් සතුන් කෙරෙහි එකෙක් දුර්ඝී වෙයි; එකෙක් සුවර්ණ වෙයි; එකෙක් දීර්ඝ වෙයි; එකෙක් ශ්‍රස්ව වෙයි; එකෙක් අල්පෙශාක්‍ය වෙයි; එකෙක් මහෙශාක්‍ය වෙයි; මෙසෙ සත්වයො අනෙකස්වභාව ගින්න වෙති; අකුශලකර්මයෙහිද් එසෙමයැ[5]. මෙසෙයින් කර්මවිෂය අචින්ත්‍ය වෙ.

---

[1] උස්A [1] උසDEF [2] "බලනුවනට" ab. in ABCD [3] බුදුන්ගෙBCDG
[4] අග්‍රපාදතලයෙහිද්CEF [5] එතෙක්මැයැB [5] එසෙයින්මැයැA

ලොකවිෂය අචින්ත්‍යපරිදි කිසෙයැ යත්?

එක මැ සෘතු විසින් සමුත්ථිත අවකාශලොකය එකාකාර යෙන් සමුත්ථිත නො ද විය අපය්‍යීන්ත ද වී. එයින් ලොකවිෂය අචින්ත්‍ය වෙ.

එයින් වදාළහ:-

57. "චත්තාරිමානි භික්ඛවෙ අචින්තියානි න චින්තෙ තබ්බානියානි චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස, කතමානි චත්තාරි? බුද්ධානං භික්ඛවෙ බුද්ධවිසයො අචින්තියො න චින්තෙ තබ්බො යං චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්සාඣායිස්ස භික්ඛවෙ ඣානවිසයො අචින්තියො න චින්තෙ තබ්බො - පෙ - කම්මවිපාකො භික්ඛවෙ අචින්තියො න චින්තෙ තබ්බො - පෙ - ලොකචින්තා භික්ඛවෙ අචින්තියා න චින්තෙ තබ්බා - පෙ - ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි අචින්තියානි න චින්තෙතබ්බානි යානි චින්තෙන්තො උම්මාදස්ස විඝාතස්ස භාගී අස්ස" යි.

මෙසෙයින් අචින්ත්‍ය වූ බුදුන්ගෙ ගුණ දන්නාහු කවරහ යත්? බුදුන් සෙ මැ දශපාරමිතා පුරා සර්වඥතාඥානසමධිගම කළ බුදුකෙනෙක් මැ දනිත්. තව ඔවුනුද් කියත් කල් නැති.

එයින් වදාළහ:-

58. "බුද්ධොපි බුද්ධස්ස භණෙය්‍ය වණ්ණං
කප්පම්පි වෙ අඤ්ඤමභාසමානො
ඛීයෙථ කප්පො චිරදීඝමන්තරෙ
වණ්ණො න ඛීයෙථ තථාගතස්ස" යි.

මෙසෙයින් පිනිබිඳට මහමුහුදු සෙ තල්පත්බොලට මහපොළො වැ බොල්සෙ මොනරහකුරට සුනෙර සෙ හබබිජුකුසට අහස්කුස් සෙ කදෝපහනට සත්හිරු ප්‍රභා සෙ

සවිපසෙබුදු විෂයට ද දුරින් දුරු වූ බුදුගුණ පුහුදුන්ලෙවි කිසෙ දන්නෑ ? කිහිඹිනට සුනෙරගොදුරු සෙයින් මෑ පුහුදුන් නුවණට කිසෙ විෂය වන්නෑ ?

මෙසෙ බුදුහු අනන්තාපරිමාණ ගුණ ඇතියෝ.

---

(4). "සත්ථා" යන තන්හි යම්සෙ සාථිවාහක සාථියන් චොර කාන්තාරාදීන් තරණය කරවා ද, එසෙයින් මෑ බුදුහු ජනයන් ජාතිකාන්තාරාදීන් තරණය කරවන්නෙන් "ශාස්තෘ" නම් වෙත්.

එසින් වදුළහ ධම්සෙනෙවි සැරියුත් මහතෙරහු:-

59"සත්ථාති සත්ථා භගවා සත්ථවාහෝ, යථා සත්ථවාහෝ සත්තකන්තාරං තාරෙති, චොරකන්තාරං - පෙ - වාළකන්තාරං - දුබ්භික්ඛකන්තාරං - නිරුදකකන්තාරං තාරෙති උත්තාරෙති නිත්තාරෙති පතාරෙති ඛෙමන්තභූමිං සම්පාපෙති. එවමෙවං භගවා සත්ථා සත්ථවාහෝ සත්තෙ කන්තාරං තාරෙති, ජාති කන්තාරං - පෙ - ජරාකන්තාරං - ව්‍යාධිකන්තාරං - මරණ කන්තාරං - සොකපරිදෙවදුක්ඛ දොමනස්සුපායාසකන්තාරං තාරෙති - පෙ - රාගගහනං - දොසගහනං - මොහගහනං - මානගහනං - දිට්ඨිගහනං - කිලෙසගහනං - දුච්චරිතගහනං තාරෙති උත්තාරෙති නිත්තාරෙති පතාරෙති ඛෙමන්තං අමතං නිබ්බානං සම්පාපෙතීති එවං භගවා සත්ථා සත්ථවාහෝ" යි.

මෙසෙයින් බුදුහු "ශාස්තෘ" නම් වෙත්.

---

(5). සිහළභාසාය යන තන්හි "සිංහළභාෂා" නම් කවර යත්?

ඵ. "සිහබාහුනරින්දෝ සොසිහමා දිණවා ඉති
සිහළෝ යන සම්මතා ආහු සංඛාපි සිහළා"

ලූබැවින් කාලිඞ්ගවඞ්ගකිඞ්ගී අග්ගයෙහි උපන් රාජ තනයාව බබ හෝත් සිංහයාට ද සිංහබාහු නම් රජකුමර සිංහ යාහ ලානය ආදනය කළ හෙයි "සිංහළ" නම් විය. යම්සේ "සමයා මහාවීර භගීරථානං" යන තන්හි "භගීරථ" ශබ්දයෙන් භගීරථයාහ අග්ගයෙහි වූ කපිලවතු පුරවාසි රජ දරුවෝ කියන ලදහුද, එසේයින් මෑ සිංහළයා පිත් යක්ෂමතනය කෙට ලද්දාවී හත් විජයයපුද බහු මල් සිංහපුරයෙහි රජ කළ සුමිත් රජු ද බහු පිත් සිංහපුරයෙන් අවුදු ලද්දාවීහි රජ වූ පඬුවස්දෙව් රජු ද බහු මෑ දරුමුනුබුරුවු ද "සිංහළ" නම් වෙත්.

යම්සේ ශත්‍රුයහට නිවාසභූමි වූ පුරය "ශත්‍රුපුර" නම් වී ද, එසේයින් මෑ සිංහළයනට නිවාසභූමි වූ ද්වීපය "සිංහළද්වීප" නම් විය. යම්සේ මඤ්චසවූ ජනයෝ මඤ්චශබ්දයෙන් කියනු ලැබෙද්ද, එසේයින්මෑ සිංහළදඹව වූ ජනයෝ සිංහළශබ්ද යෙන් කියනු ලැබත්. ඔවුන්හ භාෂා "සිංහළභාෂා" නම් වෙ.

(6). දුඛාවාසිනමත්ථාය යන තන්හි අර්ථශබ්දය "පරාර්ථ ප්‍රවෘත්තාදි" යන තන්හි සෙයින් හිතයෙහි වැටෙයි. මෙයින් බැහැර "අර්ථවත් දෙවදත්තාදි" යන තන්හි ධනයෙහි වැටෙයි. "අර්ථවත්" යනු "ධනවත්" ලූසෙයි - "කිමර්ථමාගතෝසි" යන තන්හි කාරණයෙහි වැටෙයි. "කිමර්ථම්" යනු "කිම් ප්‍රයෝජනම්" ලූසෙයි. ප්‍රයෝජනයැ හේතුයැ කාරණයැ යනු පර්‍යායයි - "තච්චමර්ථන ජානියාත්" යන තන්හි බුද්ධියැ වැටෙයි. "අර්ථන" යනු "ඥානන" ලූසෙයි - "සමර්ථි පුරුෂාදි" යන තන්හි ශක්තියැ වැටෙයි. "සමර්ථි යනු "ශක්තාදි" ලූසෙයි -

"අර්ථී දෙෂං න පශ්‍යති" යන තන්හි රූවියැ වැටෙයි. "අභිලාෂී දෙෂං න පශ්‍යති" යූසෙයි – අර්ථවාන් ශ්‍රොකඃ" යන තන්හි අභිධෙයයෙහි වැටෙයි. "අභිධෙයවාන් ශ්‍රොකඃ" යූසෙයි –"මඟකාර්‍ථො ධූමඃ" යන තන්හි නිවෘත්තියැ වැටෙයි. "මඟකනිවෘත්තයෙ ධූමඃ" යූසෙයි.

61. සඞ්ඛ්‍යාකර්මාදයශ්චෙතෙ යද්‍යප්‍යර්ථෙ ප්‍රතිෂ්ඨිතාඃ
තථාප්‍යනෙන නොව්‍යන්තෙ ධාතුභිශ්ශක්තයො යථා"

යන තන්හි වත්වතනුයෙහි වැටෙයි. "සත්වතනු" නම් ද්‍රව්‍ය ශරීරයැ. ද්‍රව්‍යශරීරෙ ප්‍රතිෂ්ඨිතාඃ" යූසෙයි – "බභූව තාසාම්ප්‍රති මණ්ඩිතානාං රාජා සහිෂ්ණුස්ත්‍රිදශාධිපාර්ථඃ" යන තන්හි සාදෘශ්‍යයෙහි වැටෙයි. "ත්‍රිදශාධිපාර්ථඃ" යනු "ත්‍රිදශාධිපසදෘශඃ" යූසෙයි.

එයින් කිහ:–

62. "ධනකාරණබුද්ධිෂු ශක්තිරූවාවභිධෙය
නිවෘත්තිහිතෙෂු තථා
ඉහ සත්වතනො සදෘශෙ කවිනා'ප්‍යයමර්ථ
උදීරිත එව සදෘ"යි.

---

(7). <u>කප්පසතසහස්සාධිකානං</u> යන තන්හි කල්පශබ්දය ත්‍රිවිධකල්පයන් කෙරෙන් මහාකල්පයෙහි වැටෙයි. මෙහි ත්‍රිවිධකල්ප නම් කවර යත්? අන්තඃකල්පයැ අසඞ්ඛ්‍යකල්පයැ මහාකල්පයැ යන මේයි.

## මෙහි <u>අන්තඃකල්ප</u> නම් කවර යත්?

දසඇවිරිදි මිනිසුන් කෙරෙහි පටන්ගෙන මනුෂ්‍යයන්ගෙ ආයුෂ ක්‍රමයෙන් නැගී අසඞ්ඛ්‍යයට පැමිණ අසඞ්ඛ්‍යයෙහි සිටි ආයුෂ ක්‍රමයෙන් බැස දසහවුරුදු වන තැන් දක්වාමෙ දෙඅතුර එක් අන්තඃකල්පයෙක් නම් වෙයි, හෙ පොළොව එක් යොදුන් තුන්ගව්වක් වඩනා පමණ කලි.

හෙ රොගාන්තඃකල්පයැ ශස්ත්‍රාන්තඃකල්පයැ දුර්ක්ෂාන්තඃ කල්පයයි ත්‍රිවිධ වෙ. එහි අන්තඃකල්පයා පෙරළෙන කාලයෙහි ජනයනට ලොභාධික වීනම් සත්වයො රොගයෙන් නස්ති; ද්වෙෂාධික වීනම් ශස්ත්‍රයෙන් නස්ති[1]; මොභාධික වීනම් දුර්ක්ෂයෙන් නස්ති.

එයින් කිහ:-

63. රාගප්‍රතිසමොහානාමාධික්‍යෙන යථාක්‍රමම්
ස්‍යාද්‍රොගශස්ත්‍රදුර්ක්ෂෙරන්තඃකල්පස්‍ය නිර්ගමඃ" යි.

මෙ අන්තඃකල්පයැ

## <u>අසඞ්ඛ්‍යකල්ප</u> නම් කවර යත්?

එක් සංවර්තයෙක් එක් අසඞ්ඛ්‍යකල්පයෙක් නම් වෙයි; හෙ විසි අන්තඃකල්පයක් පමණ කලි. හෙ චතුර්විධ වෙයි සංවර්තයැ සංවර්තස්ථායි යැ විවර්ත යැ විවර්තස්ථායි යයි.

එයින් කිහ:-

64. "අසඞ්ඛ්‍යකල්පස්සංවර්තඃ සවාන්තඃකල්පවිංශතිඃ
තතඃස්ථායි විවර්තශ්ච තතස්ස්ථායි සමා මතාඃ" යි.

මොහු "අසඞ්ඛ්‍යකල්ප" නම් කුමට වූහ යත්? මෙතෙක් වර්ෂයහ මෙතෙක් වර්ෂශතයහ මෙතෙක් වර්ෂසහස්‍රයහ මෙතෙක් වර්ෂශතසහස්‍රයහ යන සඞ්ඛ්‍යා නො කටහැක්කෙන් "අසඞ්ඛ්‍යකල්ප" නම් වූහු.

---

[1] නසත් CDEG

එයින් වදාළහ:-

65. චත්තාරිමානි භික්ඛවෙ කප්පස්ස අසඞ්ඛ්‍යෙය්‍යානි, කතමානි චත්තාරි? යදා භික්ඛවෙ කප්පො සංවට්ටති තං න සුකරං සංඛාතුං එත්තකානි වස්සානීති වා එත්තකානි වස්ස සතානීති වා එත්තකානි වස්සසහස්සානීති වා එත්තකානි වස්ස සතසහස්සානීති වා, යදා භික්ඛවෙ කප්පො සංවට්ටො තිට්ඨති - පෙ - යදා භික්ඛවෙ කප්පො විවට්ටති - පෙ - යදා භික්ඛවෙ කප්පො විවට්ටො තිට්ඨති තං න සුකරං සංඛාතුං - පෙ ඉමානි ඛො භික්ඛවෙ චත්තාරි කප්පස්ස අසඞ්ඛ්‍යෙය්‍යානි" යි.

මෙසෙයින් ලද[1] නම් ඇති සතර අසඞ්ඛ්‍යකල්පයන්ගෙ පරිච්ඡේද කවර යත්? විපත් මේඝයෙහි පටන් ගෙනැ ස්ථාලොප ච්ඡේද දක්වා සංවර්ත යැ. ස්ථාලොපච්ඡේදයෙහි පටන් ගෙනැ සම්පත් මෙඝ දක්වා සංවර්තස්ථායි යැ. සම්පත්මෙඝයෙහි පටන් ගෙනැ හිරසඳ පහළ වන තැන් දක්වා විවර්තයැ. හිරසඳ පහළවූ තැන් පටන් ගෙනැ වැළිද් කප නස්නට වස්නා විපත්මෙඝ දක්වා විවර්තස්ථායි යැ.

එයින් කිහ:-

66. "සංවර්තිතඃ කල්පනාශස්ය ස්ථාලොච්ඡේදස්තු යස්තතඃ[2] සම්පත්මෙඝස්තතශ්චන්ද්‍ර භූතිස්තතඃ ක්ෂයාම්බුදඃ[3]" යි.

මෙ අසඞ්ඛ්‍යකල්පයැ.

<u>මහාකල්ප</u> නම් කවර යත්?

සතර අසඞ්ඛ්‍යකල්පයෙක් එක් මහාකල්පයෙක් වෙයි. මහාකල්පයාගෙ ආයුෂය පරිමාණයෙන් යොදුන් පමණ අයම් විතර උස ඇති හෙළසිදුහතු[4] රැසක් උපමා කොට දක්වනලද්දෙයි.

---

[1] ලක් ACF [1] ලද් E [2] ස්ථාලොපච්ඡේදකස්තතඃ BE
[3] භූමිස්තතඃ ක්ෂයාම්බුධෙඃ ACEF [4] සිද්හතු A

එයින් කිහ:-

67. "අසඞ්ඛ්‍යකල්පාශ්චත්වාරෝ මහාකල්පස්ස සූචිතඃ
යොජනායාමවිස්තාරශ්චෙතසර්ෂපරාශිනා" යි.

එයින් වදාළහ බුදුහු:-

68. "සෙය්‍යථාපි භික්ඛු ආයසං නගරං යොජනං ආයාමෙන යොජනං විත්ථාරෙන යොජනං උබ්බෙධෙන පුණ්ණං සාසපානං වූළකාබද්ධං, තතො පුරිසො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන එකමෙකං සාසපං උද්ධරෙය්‍ය, ඛිප්පතරං ඛො සො භික්ඛු මහා සාසපරාසි ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං[1] ගච්ඡෙය්‍ය නත්වෙව කප්පො" යි.

පර්වතොපම[2] විසිනුද් වදාරනලද්දෙයි:-

69. "සෙය්‍යථාපි භික්ඛු මහාසෙලො පබ්බතො යොජනං ආයාමෙන යොජනං විත්ථාරෙන යොජනං උබ්බෙධෙන අච්ඡිද්දො අසුසිරො එකඝනො, තමෙනං පුරිසො වස්සසතස්ස[3] වස්සසතස්ස අච්චයෙන කාසිකෙන වත්ථෙන සකිං සකිං පරිමජ්ජෙය්‍ය, ඛිප්පතරං ඛො සො භික්ඛු මහාසෙලො පබ්බතො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය නත්වෙව කප්පො" යි.

මෙසෙ සර්ෂපොපමයෙන් හා පර්වතොපමයෙන් කල්පිත වන බැවින් "කල්ප" නම් වෙ - කප්පියති සාසපපබ්බතොපමාහිති කප්පො.

මෙසෙයින් දීර්ඝ වූ මහාකල්පයාගෙ සංවර්ත තුනෙක් වෙ, තෙජස්සංවර්ත යැ අප්සංවර්ත යැ වායුසංවර්තයයි.

මෙ තුන්සංවර්තයෙන් කප නස්නා කලැ විස්තාර විසින් කෙළලක්ෂයක් සත්වළ විනාශයට යෙයි; එහි තෙජස්සංවර්තයෙන් නස්නා කලැ ප්‍රථමධ්‍යාන හිනවිසින් හවා උපදනා කල්පයාගෙ තුන් භාගයෙන් එක්භාගයකට ආයුෂ ඇති බ්‍රහ්මපාරිෂද්‍යතලය ද්

---

[1] පරියොදානං ADEF [1] පරියොසනං B [2] පර්වතොපමා G
[3] සහස්සස්ස D [3] සතසහස්සස්ස E

මධ්‍යමවිසින් හවා උපදනා කල්පාඩියකට ආයුෂ ඇති බ්‍රහ්මපුරෝ හිතතලය ද් ප්‍රණීතවිසින් හවා උපදනා කල්පයකට ආයුෂ ඇති මහාබ්‍රහ්මතලය ද් ඇතුළු වූ අඩොළොසය අග්නින් දැහැ වෙ.

අප්සංඥීයෙන් නස්නා කලැ අකිඤ්චඤ්ඤායතන හිතවිසින් හවා උපදනා දෙකපකට ආයුෂ ඇති පරීත්තාභතලය ද් මධ්‍යම විසින් හවා උපදනා සතරකපකට ආයුෂ ඇති අප්‍රමාණාභතලය ද් ප්‍රණීතවිසින් හවා උපදනා අටකපකට ආයුෂ ඇති ආභාස්වර තලය ද් ඇතුළු වූ අඩොළොසය උදකයෙන් විලීන වෙ.

වායුසංඥීයෙන් නස්නා කලැ නෛවසඤ්ඤානාසඤ්ඤායතන හිතවිසින් හවා උපදනා සොළොස්කපකට ආයුෂ ඇති පරීත්තශුභතලය ද් මධ්‍යමවිසින් හවා උපදනා දෙසිය්කපකට ආයුෂ ඇති අප්‍රමාණ සුභතලය ද් ප්‍රණීතවිසින් හවා උපදනා සූසැටකපකට ආයුෂ ඇති සුභකෘත්ස්නතලය ද් ඇතුළු වූ අඩොළොසය වාතයෙන් විධ්වංසනය වෙ.

එසින් කිහ:-

70. "කොටියතසහස්සානු වත්වානි[1] විසානෙ
නභසාත්‍යඩ්ඩ අච්චියදිධ්‍යානා දග්ඝාසම්මු
මාරුතෙරි" යි.

මෙසෙ තෙජසංඥීයෙන් නස්නා ප්‍රථමධ්‍යානතලයෙහි පරමායුෂ එක්කපෙක් වෙයි, අප්සංඥීයෙන් නස්නා අච්චියධ්‍යාන තලයෙහි පරමායුෂ අටකපෙක් වෙයි, වායුසංඥීයෙන් නස්නා නෛවසඤ්ඤානාසඤ්ඤායතනතලයෙහි පරමායුෂ සූසැටකපෙක් වෙ.

එසින් කිහ:-

71. "ආදිච්චා ඛෝ තෙ භික්ඛවෙ තිණ්ණාගීනං සඩ්ඛ්‍යං කප්පායුෂසඤ්ඤයි
සතසහස්සඤ්ච ඡත්තිංසති සතසහස්සාතිරජ්ජිනි[2]" යි.

---

[1] වත්වාලාසි G [2] ජීවිතාසි ABD

කෙළසුවහසක් සත්වළ සත්වරෙකැ ගිනින් නට කලැ එක් වරෙකැ උදකයෙන් විලින වෙයි, මෙ නියායෙන් සත් වරෙකැ දියෙන් නට කලැ වැළිදු සත්වරෙකැ අග්නින් දග්ධ වෙයි; අටවන වර පළමු කිවා සෙ උදකයෙන් නොනැසී වාතයෙන් විධ්වස්තවෙ.

එයින් කිහ:-

72."සප්තාග්නිනා ජලෙනෛක ඉත්‍යෙවං සප්තකෙ ගතෙ
සප්තකං[1] තෙජසා භූයො නාශස්තදනු වායුනා" යි.

මෙසෙයින් නෂ්ටකල්පයන්ගෙ පුනරුත්පත්තිය කිසෙ වෙයි යත්? සත්වයන්ගෙ කර්මයෙන් ජාත වාතයෙන් උදක ස්කන්ධය පිණ්ඩිත වැ බැස යථාස්ථානයෙහි ලොක සංස්ථිත වෙ.

එයින් කිහ:-

73. "නෂ්ටානාමි පුනරුත්පත්තිස්සත්වකර්මජවායුනා
තෙන තොයං යථාස්ථානෙ පිණ්ඩිතං භාජනී
භවෙත්" යි.

නිර්වීජවායුහුගෙ උද්භවය හුදෙක් කර්මයෙන් කිසෙ වෙයි යත්? කර්මයාගෙ ආධිපත්‍යයෙන් සංවර්තමස්තකයෙහි මාරුතයෙන් උද්භූත වෙ.

එයින් කිහ:-

74."නිර්වීජස්‍යොද්භවො වායොඃ කෙවලාත්
කර්මණඃ කථමි
කර්මාධිපත්‍යාත්තජ්ජන්ම සංවර්තශිෂ්මාරුතාත්" යි.

වාක්ෂාදීන්ගෙ බීජයො කිසෙ වෙති යත්? වාතයො වත්‍රවාටාන්තරයෙන් බීජයන් ඇර උදකයෙහි ප්‍රක්ෂෙප කෙරෙති යෙත්.

---

[1] සප්තකඃ BCD

එයින් කිහ:-

75. "වාක්ෂෝෂධිලතාදීනාං බීජාන්‍යම්භසි වායවඃ
චක්‍රවාටාන්තරෙභ්‍යෝ'න්‍යෙ ප්‍රක්ෂිපන්තීති වක්ෂතෙ" යි.

මෙ මහා කල්පයැ.
මෙයැ "ත්‍රිවිධකල්ප" නම්.

---

(8). <u>චතුන්නං අසඞ්ඛ්‍යානං</u> යන තන්හි "අසඞ්ඛ්‍ය" නම් කවර යත්? - කියෙ මැ නො: -

76. දසදසකං සතං, දසසතං සහස්සං, සහස්සානං සතං සත සහස්සං, සතසහස්සානං සතං කොටි, කොටීනං සතසහස්සං පකොටි, පකොටීනං සතසහස්සං කොටිප්පකොටි, කොටිප්පකොටීනං සතසහස්සං නහුතං, නහුතානං සතසහස්සං නින්නහුතං, නින්නහුතානංසතසහස්සං හුතනහුතං, හුතනහුතානං සතසහස්සං ඛම්භං, ඛම්භානං සතසහස්සං වික්ඛම්භං, වික්ඛම්භානං සතසහස්සං අබබං, අබබානං සතසහස්සං අටටං, අටටානං සතසහස්සං අහහං, අහහානං සතසහස්සං කුමුදං, කුමුදානං සතසහස්සං සොගන්ධිකං, සොගන්ධිකානං සතසහස්සං උප්පලං, උප්පලානං සතසහස්සං පුණ්ඩරීකං, පුණ්ඩරීකානං සතසහස්සං පදුමං, පදුමානං සතසහස්සං කථා, කථානං සතසහස්සං මහාකථා, මහාකථානං සතසහස්සං අසඞ්ඛ්‍යං" යි.

මෙයැ "අසඞ්ඛ්‍ය" නම්.

---

(9). <u>වරජම්බුදීපෙ</u> යන තන්හි "ජම්බුදවීප" නම් කවර යත්? සක්වළගබ විස්තාර විසින් දෙලොස්ලක්ෂ තුන්දහස්

සාරසිය පනස්යොදුන[1]; වාත්තයෙහි සතිස්ලක්ෂ දසදහස් තුන්සිය පනස් යොදුනැ.

එයින් කිහ:-

77. "ලක්ෂද්වාදශකං ත්‍රීණි සහස්‍රාණි ශතානි ච
චත්වාරි චත්‍රවාලස්‍ය පඤ්චාශදෙව විස්තෘතිඃ" යි.

හෙ උසායෙහි දෙයාසූදහස්යොදුන් සත්වළගලින් චත්‍රාකාරයෙන් පරීක්ෂිප්තවී.

එයින් කිහ: -

78. "අෂ්ටාදස සහස්‍රොන්ලක්ෂොච්ඡ්‍රායවතා පුනඃ
නෙමිනා චත්‍රවත් සර්වං තච්චත්‍රිකාතමද්‍රිණා" යි.

සමුද්‍රපර්වතාදි පස්පොළොවැ පිහිටියෙයැ; පස් පොළොව දියපොළොවැ පිහිටියෙයැ; දියපොළොව වාපොළොවැ පිහිටියෙයැ; වාපොළොව ආකාශයෙහි පිහිටියෙයි.

එයින් කිහ:-

79. "ක්ෂොණ්‍යාං ශෛලසමුද්‍රාදිස්ථිතං ක්ෂොණි
ජලෙ ස්ථිතා
උදකං මාරුතාධාරං මාරුතො ව්‍යොම
ගොචරඃ" යි.

පස්පොළොව බොල දෙලක්ෂසතලිස් දහසත් යොදුනැ; දිය පොළොව එයට අවිගුණයැ; වාපොළොව එයට චතුර්ගුණයි.

එයින් කිහ:-

80. "ලක්ෂද්වයං සහස්‍රාණි චත්වාරිංශච්ච භූච්ඡ්‍රයඃ
[3]තොයොදෙවධස්තද්විගුණො වාතොච්ඡ්‍රායශ්චතුර්
ගුණඃ" යි.

---

[2] සහස්‍රෙණ ACD [2] සහස්‍රානි B [3] තොයොච්ඡ්‍රයඃ B

මෙරුපර්වතය උසාසෙයි චක්ලක්ෂඅටසැට දහසක් යොදුනැ; එයට අඩිඅඩියෙන් උනු වැ යුගන්ධරාදි සප්තකුල පර්වතයෝ අඩිඅඩියෙකින්[1] සමුද්‍රයෙහි ගැලී වක්‍රාකාරයෙන් මෙරගල් වටා සිටියාහුයි.

එයින් කිහ:-

ඉ1. "අශීතිසහස්‍රාණි උච්චං මෙරුර්ගිරිණාං වරඃ
අධඃඅධඃ තතඃ ක්‍රමේණ තෙ'ධිගතාඃ පයොනිධෙඃ.
යුගන්ධරශ්චෛවඋදාරඃ කරවිකසුදර්ශිනඃ
නෙමින්ධරෝ විනතකෝ වාජිකර්ණෝ'ද්‍රිසප්තමඃ" යි.

මෙරුපර්වතයාගෙ චතුර්දිශායෙහි සතරමහාද්වීපයහ; ඔවුහු පන්සිය පන්සිය ක්ෂුද්‍ර ද්වීපයෙන් පරිවෘතයෝ.

එයින් කිහ:-

ඉ2. "ද්වීපාශ්චතුර්දිශං මෙරොශ්චතස්‍රඃ සමන්තතඃ
සහස්‍රාධිසහස්‍රාධික්ෂුද්‍රද්වීපවිභූෂිතාඃ" යි.

එහි ජම්බුද්වීපය දසදහස්යොදුනැ; එතුරුකුරුදිව අටදහසක් යොදුනැ; අපරගොයානයද් පූර්වදෙශය ද් සත් දහස් සත්දහස් යොදුනි.

එයින් කිහ:-

ඉ3. "ජම්බුද්වීපපරීක්ෂේපඃ සහස්‍රාණි දශෝර්ධිතඃ
උත්තරස්‍යාඃ කුරොරශ්චෝ සප්ත ගොයාන[2]
දෙහයොඃ" යි.

පූර්වදෙහය[3] අර්ධචන්ද්‍රයක් වැන්නැ; අපරගොයානය ආදර්ශතලයක් වැන්නැ; එතුරුකුරුදිව පුටුවක් වැන්නැ; දඹදිව සකටපඤ්ජරයක් වැන්නැ.

---

[1] අඩියෙකින්EFG [2] ගොදුනABF [3] එහි පූර්වදෙහයBG

එයින් කීහ:-

84. "අධේන්ද්‍රාදර්ශසංස්ථානො දෙහගොයාන
නාමකො
කුරුස්තු පීඨසංස්ථානො ජම්බුද්වීපො
රථාකෘතිඃ" යි.

අවීචිය ද් අසුරභවනය ද් තව්තිසා දෙව්නුවර ද් ජම්බුද්වීපය සෙයින් මැ දසදහස් දසදහස් යොදුනැ; එහි අවීචිය බිම වූයෙයැ; අසුරපුරය මෙර යට වූයෙයැ; තව්තිසා දෙව්පුරය මෙරමුදුනෙහි වූයෙයැ.

එයින් කීහ:-

85. "අවීචිදෛත්‍යභවනං ත්‍රයස්ත්‍රිංශච්ච මානතඃ
ජම්බුද්වීපසමා භූමාවධො මෙරොශ්ච මූර්ධනි" යි.

පරසතුරුක කඳ ද පඤ්චමහාශාඛා ද දිග පනස් පනස් යොදුනැ; කඳ වටා පසළොස්යොදුනි.

එයින් කීහ:-

86. "පඤ්චාශද්‍යොජනස්කන්ධශ්ශාඛායාමස්සමන්තතඃ
මානතඃ පාරිජාතස්‍ය ස්ථොල්‍යන්තු පඤ්චකත්‍රයම්" යි.

අපරගොයානයෙහි කොළොම්රුක ද ගරුඩභවනයෙහි හිඹුල්රුක ද මොබ දඹරුක ද පූර්වවිදෙහයෙහි මහරිරුක ද අසුරභවනයෙහි සිත්පළොල්රුක ද[1] උතුරුකුරු දිව කප්රුක ද පරසතුරුක හා මැ සමයි.

එයින් කීහ:-

87. "කදම්බශ්ශාල්මලී ජම්බුශ්ශිරීෂශ්චිත්‍රපාටලිඃ
කල්පද්‍රුමශ්ච ෂට් තුල්‍යාඃ පාරිජාතෙන මානතඃ" යි.

---

[1] සිත්පළුල්රුක ද C

මෙසෙ මෙ සක්වළ සපතමහාවාකෂයන් කෙරෙහි අන්තර්භූත වූ කලාසඨායි මහාජම්බුවාකෂයෙන් ප්‍රකට වූ ද්වීපය "ජම්බුද්වීප" නම් විය. බුදාදි මහාපුරුෂයනට ජන්මභූමි වන බැවින් වර විය, ප්‍රවර විය, අග්‍ර විය, ශ්‍රෙෂ්ඨ වී.

මෙයැ "ජම්බුද්වීප" නම්.

---

(10). කමලායනසූනුකුලෙ යනු ත්‍රිවිධ මහාසාරකුලයන් කෙරෙහි බ්‍රාහ්මණමහාසාරකුලයැ යූසෙයි.

මෙහි ත්‍රිවිධ මහාසාරකුල නම් කවරෙ යත්?

ගෘහපතිමහාසාරකුලයැ බ්‍රාහ්මණමහාසාරකුලයැ ක්ෂත්‍රිය මහාසාරකුලයි.

එහි යමක්හුගෙ ගෙහි පශ්චිමාන්තයෙන් සතලිස්කෙළක් ධන නිධානගත වෙ ද, පසමුණක් කහවණු[1] දවස වැය වෙ ද, මෙ ගෘහපතිමහාසාරකුල" නම් වෙ.

යමක්හුගෙ ගෙහි පශ්චිමාන්තයෙන් අසූකෙළක් ධන නිධාන ගත වෙ ද, දසාමුණක් කහවණු දවස වැය වෙ ද, මෙ "බ්‍රාහ්මණ මහාසාර කුල" නම් වෙ.

යමක්හුගෙ ගෙහි පශ්චිමාන්තයෙන් සියක්කෙළක් ධන නිධානගත වෙ ද, විසිඅමුණක් කහවණු දවස වැය වෙ ද, මෙ "ක්ෂත්‍රියමහාසාරකුල" නම් වෙ.

මෙයැ "ත්‍රිවිධමහාසාරකුල" නම්.

---

(11). ගුරුවරණපරිචරියාවසානෙ යන තන්හි "පරිචයෝ" නම් කවරෙ යත්? දෙමාපියනට තමා කටයුතු මෙහෙ දැසදැසිනට[2]

---

[1] කහවුණු BC [2] දැසදැසාදිනට AB

නො ඇණවා සියඅතින් උදය නැඟී ශරීරසම්බාහනා කොට හුණු දිය කැමැත හුණුදිය දී සිහිල්දිය[1] කැමැත සිහිල්දිය[1] දී කැමැත දැහැටක්[2] දී තමාගෙ විභවානුරූප කොට ඔවුන් කැමැති අහර පිළිවිස පිළියෙළ කරවා වළඳවා සනහත් හුණු දිය සිහිල්දිය ආදි එළවා සියඅතින් උච්ඡිට්ඨාදි කොට සනහවා තමාගෙ සාමර්ථ්‍ය තුබූ පරිද්දෙන් හඳනා පිළී ද හොනා දෑ ද සපයා පා දෙව පය තෙල් ගල්වා තුන්වෙලෙහි වැඳ මව්පියන් දිවි පවත්නාතාක් කාලයෙහි ආදර ඇති වැ මෙලොව විඤ්ඤූජනයන් විසින් ප්‍රශංසාවූ පරලොකයෙහි සුගතිපවතී පදප්‍රාප්තිහෙතු වූ පුණ්‍යකර්ම සඤ්චය කිරීම "පරිචරියා" නම්.

වදාළෙ මෑ නො:-

පෙ. "තස්මා හි තෙ නමස්සෙය්‍ය සක්කරෙය්‍යාථ පණ්ඩිතෙ
අන්නෙන අථෝ පානෙන වත්ථෙන සයනෙන ච
උච්ඡාදනෙන න්හානෙන පාදානං ධොවනෙන ච.

තාය නං පරිචරියාය මාතාපිතූසු පණ්ඩිතා
ඉධ වෙචනං පසංසන්ති පෙච්ච සග්ගෙ ච මොදති" යි.

මෙසෙ කරන සත්කාරයට මවුපියෝ කවරගුණයන් නිසි වූහ යත්? දරුවනට තමන් බ්‍රහ්ම වන බැවින් පූර්වදෙව වන බැවින් පූර්වාචාර්‍ය්‍ය වන බැවින් ආහුනෙය්‍ය වන බැවින් නිසි වූහු.

වදාළෙ මෑ නො:-

පෙ. "බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතූනං ඒතං අධිවචනං; පුබ්බ දෙවාති භික්ඛවෙ මාතාපිතූනං ඒතං අධිවචනං; පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතූනං ඒතං අධිවචනං; ආහුනෙය්‍යාති භික්ඛවෙ මාතාපිතූනං ඒතං අධිවචනං" යි.

මෙසෙ මවුපියන් පුදන කුල බ්‍රහ්මයන් පූර්වදෙවයන් පූර්වාචාර්‍යීයන් දක්ෂිණාර්හපුද්ගලයන් සහිත කුල නම් වෙ.

---

[1] සිත්දිය B [2] දැහැටු G දැහිටක් B

එයින් වදාළහ:-

90. "සබ්‍රහ්මකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරෝ අජ්ඣාගාරෙ පූජිතා හොන්ති; පුබ්බදෙවතානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරෝ අජ්ඣාගාරෙ පූජිතා හොන්ති; පුබ්බාචරියකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරෝ අජ්ඣාගාරෙ පූජිතා හොන්ති; ආහුනෙය්‍යකානි භික්ඛවෙ තානි කුලානි යෙසං පුත්තානං මාතාපිතරෝ අජ්ඣාගාරෙ පූජිතා හොන්ති" යි.

මෙහි බ්‍රහ්මාදිනාමයෙන් නිර්දිෂ්ටයන් මවුපියන් පරීදි දක්වන්නට කීහ:-

91. බ්‍රහ්මාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං; පුබ්බදෙවාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං; පුබ්බාචරියාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං; ආහුණෙය්‍යාති භික්ඛවෙ මාතාපිතූනං එතං අධිවචනං" යි.

මවුපියන් බ්‍රහ්ම පරීදි කිසෙයෑ යත්?

යම්සෙ මහාබ්‍රහ්මයහට මෛත්‍රීකරුණාමුදිතා උපෙක්ෂා ලක්ෂණ සතර භාවනාවෝ අවිජහිත වෙද්ද එසෙයින් මෑ මවුපියනට පුත්‍රයන් තෙරෙහි එම සතර භාවනාවෝ අවිජහිත වෙත් - කිසෙයෑ යත්? දරුවන් කුක්ෂිගත කල පටන් ගෙන පිරිහුන් අඟපසඟ ඇති නීරොගපුත්‍රයා කවර දවසෙක දක්මහ හොත්?" යි මවුපියනට මෛත්‍රීසිත් උපද්දි. යම්කලෙක හෙ දුක්පත් වී නම් "ඒ දුකින් මිදෙව" යි කම්පිත වන බැවින් මවුපියනට කරුණා උපද්දි. දරුවාගෙ මුඛගොහා දුටුකල "හෙ ඔවුහට තහවුරු වෙව" යි මවුපියන් සිත් පිණන්[1] බැවින්

---

[1] පිනවන ACD

ඔවුනට මුදිතා උපද්දි. ඔහු කළත්‍ර පරිග්‍රහ කොට වෙන ගෙ ගෙනෑ වසන කලෑ "මෙ දරු සඹලයෙන් වැවෙන්නට සමර්ථය" යි මැදහත් වන බැවින් මවුපියනට උපෙක්ෂා උපද්දි. මෙසෙ සතර බ්‍රහ්මවිහාර භාවනායෙන් අවිජහිත වන බැවින් මවුපියො පුත්‍රයනට "බ්‍රහ්ම" වෙත්.

ඔවුන් පූර්වදෙව පරිදි කිසෙයෑ යත්?

හැම ඉෂ්ටදෙවතාවන් කෙරෙහි පළමු වන දෙවියහ; එසින් මවුපියො පුත්‍රයනට "පූර්වදෙව" නම් වෙත්.

ඔවුන් පූර්වාචාර්‍ය්‍ය පරිදි කිසෙයෑ යත්?

පුත්‍රයා උපන් තැන් පටන් ගෙනෑ "මෙසෙ හිඳුනෙයෑ මෙසෙ සිටුනෙයෑ[1]" යනාදි විසින් පළමු ශික්ෂණ කරවති; පැසුව ඇතම් ආචාර්‍ය්‍ය තෙනෙක් හසි ශිල්ප අඟ ශිල්පාදිය ශික්ෂණ කරවති; ඇතමිහු ශරණශීලාදි ගුණධර්මයෙහි පිහිටුවති; මොවුන් හැම ආචාර්‍ය්‍යයන් කෙරෙහි මවුපියො පුත්‍රයනට "පූර්වාචාර්‍ය්‍ය" වෙත්.

ඔවුන් ආහුනෙය්‍ය පරිදි කිසෙයෑ යත්?

අභිසංස්කෘත කොට ඇර දෙන්නට නිසි අන්නපානාදි ප්‍රතිග්‍රහණයට අහී වන බැවින් "ආහුනෙය්‍ය" නම් වෙත්.

එසින් වදළහ:-

99. "බ්‍රහ්මාති මාතාපිතරෝ පුබ්බාචරියාති වුච්චරෙ
ආහුනෙය්‍යා ච පුත්තානං පජාය අනුකම්පකා" යි.

මෙසෙ සත්කාර කරන දරුවො දෙමාපියනට ප්‍රත්‍යුපකාර කළා නම් වෙද්ද යත්? මෙ ඔවුන්ගෙ උපකාර ගුණ අපෙක්ෂා කළ කලෑ කිසි විසමයෙක් නොවෙයි.

---

[1] හිඳිනෙය මෙසෙ සිටිනෙයෑB

කිසෙයෑ යත්?

යමෙක් මවුපියන් තමහට උපකාර බවී දැන ප්‍රත්‍යුපකාර කෙරෙමියි උත්සාහපරවශ වෑ එක්දසරියෙක්[1] මව හිඳුවා එක් දසරියෙක පියා හිඳුවා ගෙතෑ හවුරුදු සියක් පරිහරණ කෙරෙද හෙ මෑ ඔවුන් උඳුවීයෙනුදු හස්තපාදපරිමර්දනයෙනුදු ශීතොදක උෂ්ණොදකස්නාපනයෙනුදු අඩගසම්බාහනයෙනුදු උපස්ථාන කෙරෙ ද මවුපියෝ ඔහු අංසයෙහි මෑ හිඳ මූත්‍රපුරීෂවිසර්ජන කෙරෙද්ද හෙ එසෙ ද වුව මවුපියනට උපකාර නම් නොවෙයි.

එසින් වදාළහ:-

93. "අභිඤ්ඤාහං[2] භික්ඛවෙ න සුප්පතිකාරං වදාමි මාතුඤ්ච පිතුඤ්ච; එකෙන භික්ඛවෙ අංසෙන මාතරං පරිහරෙය්‍ය එකෙන පිතරං පරිහරෙය්‍ය වස්සසතායුකො වස්සසතජීවී සෝ ච නෙසං උච්ඡාදන පරිමද්දනන්හාපනසම්බාහනෙන; තෙ ච තත්ථෙව මූත්‍රකරීසං වපෙය්‍යුං; නත්ථෙව භික්ඛවෙ මාතාපිතූනං කතං වා හොති පතිකතං වා" යි.

මෙසෙ මතු නොවෙයි, යමෙක් සියලු දඹදිවිතලය හෙරිතලයක් සෙයින් සම කොට හිණු[3]පමණ සත්රුවන්[4] පුරා මවුපියන් එහි නායක කොට සක්විතිරජයෙහි පිහිටුවා ද හෙ එසෙ කෙළෙ ද වී නම් මවුපියනට උපකාර නම් නො වෙ.

එසින් වදාළහ:-

94. "ඉමිස්සා භික්ඛවෙ මහාපඨවියා පහූතසත්තරතනාය මාතාපිතරෝ ඉස්සරියාධිපච්චෙ රජ්ජෙ පතිට්ඨාපෙය්‍ය න තත්ථෙව භික්ඛවෙ මාතාපිතූනං කතං වා හොති පතිකතං වා" යි.

කරුණු කිම යත්? මවුපියෝ පුත්‍රයන් ජීවිතයට ආපාදකයහ; හෘදයරුධිර පෙරළා කිරි කොට පොවා අත්පා

---

[2] ඤ්ඤං ABC [3] හිනි B හින් ACEF [4] සතුරුවනින් BFG

හඹා අන්නපානයෙන් සන්තාපත[1] කොටැ වැඩුවාහ; ඉදින් මවු පියො ඔවුන් උපන්දවස් මැ පාදයෙහි ගෙනැ අරණ්‍යයෙහි හො නදීශ්‍රොතස හො ප්‍රපාතයෙහි හො බහාපීහු නම් ඔවුහු මෙ ලොකයා දක්නට අසමර්ථ වෙති; එසෙ නොකොට මවු පියො පුත්‍රයන් පරිපාලනා කොටැ ඉෂ්ටානිෂ්ට ආලම්බන ඇති ලොකයා දක්වත්.

එයින් වදාළහ:-

95. "තං කිස්ස හෙතු, බහුකාරා[2] භික්ඛවෙ මාතා පිතරො පුත්තානං ආපාදකා පොසකා ඉමස්ස ලොකස්ස දස්සෙතාරො" යි.

ඔවුන් මවුපියනට ප්‍රත්‍යුපකාර වන්නෙ නම් කවරකලයැ යත්? පූර්ව්ක්ත ක්‍රමයෙන් ආදර ඇති වැ මවුපියන් පුස්නෙ ශ්‍රද්ධා නැති මවුපියන් ශ්‍රද්ධාසම්පතැ පිහිටුවා ද; දුශ්ශීලයන් ශීල සම්පතැ, මත්සරයන් ත්‍යාගසම්පතැ, අඥානයන් ප්‍රඥාසම්පතැ පිහිටුවා ද; මෙතෙකින් හෙ මවුපියනට ප්‍රත්‍යුපකාර නම් වෙ.

එයින් වදාළහ:-

96. "යො ච ඛො භික්ඛවෙ මාතාපිතරො අස්සද්ධෙ සද්ධාසම්පදාය සමාදපෙති නිවෙසෙති පතිට්ඨාපෙති; දුස්සීලෙ සීලසම්පදාය, මච්ඡරී වාගසම්පදාය, දුප්පඤ්ඤෙ පඤ්ඤාසම්පදාය සමාදපෙති නිවෙසෙති පතිට්ඨාපෙති; එත්තාවතා ඛො භික්ඛවෙ මාතා පිතූන්නං කතඤ්ච හොති පතිකතඤ්ච අතිකතඤ්ච" යි.

අනෙකෙකුදු:-

ලෙව්හි දානමානනාදීන් නො පුදා නො හින්ද හැකි මහඇඟි පින්කෙත්හු සතරදෙනෙක් වෙති; ඔහු කවර යත්? බුදුහ, බුදුසව්වහ, මවුහ, පියොයි[3]. එබැවින් මෙ සතර

---

[1] සන්තපිත B [2] බහුපකාරා ABCD [3] මවුපියෝයි ACDEF

දෙනා තෙරෙහි සම්‍යක්ප්‍රතිපන්න වන පණ්ඩිත වූ ව්‍යක්ත පුරුෂයෝ බොහෝ පුණ්‍යප්‍රසව තෙරෙත්.

එසින් වදළහ:-

97. "වතූසු භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො ව්‍යත්තො සප්පුරිසො අඛතං අනුපහතං අත්තානං පරිහරති අනවජ්ජා ච හොති අනනුවජ්ජා විඤ්ඤූනං බහුඤ්ච පුඤ්ඤං පසවති; කතමෙසු චතූසු, මාතරි භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො පණ්ඩිතෙ, ව්‍යත්තො සප්පුරිසො අඛතං අනුපහතං අත්තානං පරිහරති අනවජ්ජා ච හොති අනනුවජ්ජා විඤ්ඤූනං බහුඤ්ච පුඤ්ඤං පසවති; පිතරි භික්ඛවෙ - පෙ - තථාගතෙ භික්ඛවෙ - පෙ - තථාගත සාවකෙ භික්ඛවෙ සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො ව්‍යත්තො සප්පුරිසො අඛතං අනුපහතං අත්තානං පරිහරති අනවජ්ජා ච හොති අනනුවජ්ජා විඤ්ඤූනං බහුඤ්ච පුඤ්ඤං පසවති; ඉමෙසු ඛො භික්ඛවෙ චතූසු සම්මා පටිපජ්ජමානො පණ්ඩිතො ව්‍යත්තො සප්පුරිසො අඛතං අනුපහතං අත්තානං පරිහරති අනවජ්ජා ච හොති අනනුවජ්ජා විඤ්ඤූනං බහුඤ්ච පුඤ්ඤං පසවති" යි.

යමෙක් මෙසෙ දැනමානනාදීන් පිදියයුතු මවුආදීන් තෙරෙහි මිථ්‍යාප්‍රතිපන්න වී නම් ඔහට කිමක් වෙයි යත්? අපායොත්පත්ති වෙ.

එසින් වදළහ:-

98. "චතූසු භික්ඛවෙ මිච්ඡාපටිපජ්ජමානො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති සාවජ්ජා ච හොති සානුවජ්ජා විඤ්ඤූනං බහුඤ්ච අපුඤ්ඤං පසවති; කත මෙසු චතූසු, මාතරි භික්ඛවෙ මිච්ඡා පටිපජ්ජමානො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති සාවජ්ජා ච හොති සානුවජ්ජා විඤ්ඤූනං බහුඤ්ච අපුඤ්ඤං පසවති; පිතරි භික්ඛවෙ - පෙ - තථාගතෙ භික්ඛවෙ

පෙ - තථාගත සාවකෙ භික්ඛවෙ මිච්ඡාපටිපජ්ජමානො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති සාවජ්ජා ච හොති සානුවජ්ජා විඤ්ඤූනං බහුඤ්ච අපුඤ්ඤං පසවති ඉමෙසු ඛො භික්ඛවෙ චතූසු මිච්ඡා පටිපජ්ජමානො බාලො අව්‍යත්තො අසප්පුරිසො ඛතං උපහතං අත්තානං පරිහරති සාවජ්ජා ච හොති සානුවජ්ජා විඤ්ඤූනං බහුඤ්ච අපුඤ්ඤං පසවති" යි.

(12). සංවේගමුපයාතො යනුයෙන් කුමක් කියූ වෙති යත්?

"සංසාරය අනවරාග්‍ර යැ නරකදුරිඛ භයානක යැ මනුෂ්‍යත්වය දුර්ලභ යැ සෙසු තැන් පුණ්‍ය ක්ෂීයට අස්ථාන යැ මාගෙ පිතෘපිතෘ මහාඍිහු අනෙකකොටිශතධන සඤ්චය කොට තබා මිය පරලොව යන්නාහු මෙයින් එකකාර්‍ෂාපණයක් නො ද ගෙනැ ගියහ; නැවත වළඳන්නට නො ද වෙති; අහෝ පිරිහුණහ; ක්ෂණ සම්පත් වැරැදුවූහ" යි කරුණායෙන් කම්පිත වූ පරිදි කියූ වෙත්.

මෙහි සංසාරය අනවරාග්‍ර පරිදි කිසෙයැ යත්?

බුදුන් විසින් වර්‍ෂශතයක් වර්‍ෂසහස්‍රයකුදු අනාවරණඥානයෙන් අනුගමන කොට බලා "නැත්තා නැති"[1] යි දුටු වන බැවින් අමත වූ අවිද්‍යිත වූ පූර්‍වාවධි ඇති වෙයෙයින් මැ අමත වූ අඥාත වූ පශ්චිමාවධි ඇති මෙසෙයින් අග්මුල් නැසි වන බැවින් අපරිච්ඡින්න වූ පූර්‍වාපරකොටි ඇති තත්මධ්‍යයෙහි සංසරත් සත්වයන්ගෙ අවිච්ඡින්න යෙන් ප්‍රවෘත්ත වූ ස්කන්ධ පරම්පරාව "අනවරාග්‍ර සංසාර" නම් වෙ.

එයින් වදාළහ:-

๑๒. "අනමතග්ගොයං භික්ඛවෙ සංසාරො පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජා නීවරණානං සත්තානං තණ්හා සංයොජනානං සන්ධාවතං සංසරතං" යි.

---

[1] නැතැයි B  [1] නැකි A

මෙසෙ අනවරාග්‍රසංසාරයෙහි පරිභ්‍රමත් සත්වයන් තෙරෙහි චක්ඛතක්ඛු අප්‍රියසම්ප්‍රයොගයෙන් හා ප්‍රියවිප්‍රයොග යෙන් ක්‍රන්දනය කරනුවහු වැලැපි කඳුළු බොහෝ පරිදි හා සතරමහමුහුදු දිය මදුපරිදි දක්වන්නට වදාළහ.

100. "එතදෙව භික්ඛවෙ බහුතරං යං වෝ ඉමිනා දීඝෙන අද්ධුනං සන්ධාවතං සංසරතං අමනාපසම්පයොගා මනාපවිප්පයොගා කන්දන්තානං රොදන්තානං අස්සු පස්සන්නං පග්ඝරිතං නත්වෙව වතූසු මහාසමුද්දෙසු උදකං" යි.

අනවරාග්‍රසංසාරයෙහි චක්ඛතක්ඛු එක මවකගේ මරණින් කම්පිත වූ රොදනය කරනුවහු වැලැපි කඳුළු සතර මහමුහුදු දියට බොහෝ පරිදි දක්වන්නට වදාළහ.

101. "දීඝරත්තං වෝ[1] භික්ඛවෙ මාතුමරණං පච්චනුභූතං, තෙසං වෝ මාතුමරණං පච්චනුභොන්තානං අමනාපසම්පයොගා මනාපවිප්පයොගා කන්දන්තානං රොදන්තානං අස්සුපස්සන්නං පග්ඝරිතං න ත්වෙව වතූසු මහාසමුද්දෙසු උදකං" යි.

එසෙයින් මූ චක්ඛතක්ඛු එක පියකුගෙ එක මලකුගෙ එක බෑයකුගෙ එක නඟකගෙ එක බුහුනකගෙ එක පුතකුගෙ එක දුවකගෙ මරණින් කම්පිත වූ පරිදෙවනා කරනුවහු වැලැපි කඳුළු, එසෙයින් ම එකෙකි නැයන් නට කලැ හොග නට කලැ රොග ග්‍රහණ කලැ වහස්නාහු වැලැපි කඳුළු සතරමහමුහුදු දියට බොහෝ පරිදි දක්වන්නට වදාළහ.

102. "දීඝරත්තං වෝ භික්ඛවෙ පිතුමරණං පච්චනුභූතං – පෙ – භාතුමරණං පච්චනුභූතං – පෙ – භගිනි මරණං පච්චනුභූතං – පෙ – පුත්ත මරණං පච්චනුභූතං – පෙ ධීතුමරණං පච්චනුභූතං – පෙ ඤාති ව්‍යසනං පච්චනුභූතං

---

[1] බොABDEF

පෙ - භොගව්‍යසනං පච්චනුභූතං - පෙ - රොගව්‍යසනං පච්චනුභූතං; තෙසං වො රොගව්‍යසනං පච්චනුභොන්තානං අමනාපසම්පයොගා මනාපවිප්පයොගා කන්දන්තානං රොදන්තානං අස්සු පස්සන්නං පශ්‍යරිතං නත්වෙව චතුසු මහා සමුද්දෙසු උදකං" යි.

මෙහි සතර මහමුහුදු නම් මෙරුරශ්මීන් පරිච්ඡින්න සතර මහාසාගරයයි කිසෙයැ යත්? මෙරගල ප්‍රාචීනපාර්ශ්වය රජතමයයැ දක්ෂිණ පාර්ශ්වය මණිමයයැ පශ්චිමපාර්ශ්වය ස්ඵටිකමයයැ උත්තර පාර්ශ්වය ස්වර්ණමයයි. එහි පූර්වදක්ෂිණ පාර්ශ්වයෙන් නිෂ්ක්‍රාන්ත රජතමණිරශ්මීහි එකක් වැ මහමුහුදු පිටින් ගොස් චක්‍රවාලපර්වතයෙහි පැහැර සිටිති; එසෙයින් මැ දක්ෂිණ පශ්චිම පාර්ශ්වයෙන් නිෂ්ක්‍රාන්ත මණිස්ඵටික රශ්මීහි, පශ්චිමොත්තර පාර්ශ්වයෙන් නිෂ්ක්‍රාන්ත ස්ඵටිකස්වර්ණ රශ්මීහි, උත්තර ප්‍රාචීනපාර්ශ්වයෙන් නිෂ්ක්‍රාන්ත ස්වර්ණ රජතරශ්මීහි එකක්වැ මහමුහුදු පිටින් ගොස් චක්‍රවාලපර්වතයෙහි පැහැර සිටිත්. මෙසෙ මෙරුපර්වතයාගෙ රශ්මීන් විසින් පරිච්ඡින්න සතර මහාසාගරයැ "සතර මහමුහුදු" නම්.

අනවරාග්‍රසංසාරයෙහි එක්සතක්හු කිරි නො බොන පණු පළඟ ඈ දැරිළ උපන් කල් හැර කිරි බොන ගෙරි හූරු ඈ තිරිසන්යොන්හි උපන් කල් හැර මිනිස්පියෙහි නොයෙක් නම් හැර එක නම් ඇති නොයෙක් මවුන් හැර එක මවක මතු තෙනෙන් පූ කිරි සතර මහමුහුදැ දියට බොහො පරිදි දක්වන්නට වදාළහ:-

103. "එතදෙව භික්ඛවෙ බහුතරං යං වො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං මාතු එක්ඤං පීතං න ත්වෙව චතුසු මහාසමුද්දෙසු උදකං" යි.

අපරිච්ඡින්න පූර්වාපරකොටි ඇති සංසාරයෙහි පරිවර්තනය කරන සත්වයන් කෙරෙහි එක් සතක්හු හිස් සුන් කලැ වගුළ ලෙහෙ සතර මහමුහුදැ දියට බොහො පරිදි දක්වන්නට වදාළහ: -

104. "එතදෙව භික්ඛවෙ බහුතරං යං වො ඉමිනා දීඝෙන අද්ධුනා සන්ධාවතං සංසරතං සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නනං පග්ඝරිතං න ත්වෙව චතුසු මහා සමුද්දෙසු උදකං" යි.

අක්මුල් නැති සසර පිරිවැටෙන සතුන් කෙරෙහි එක් සතක්හු රත්පැහැ ඇති වැ කළුපැහැ ඇති වැ සුදුපැහැ ඇතිවැ මුසුපැහැ ඇති වැ උපන් කල් හැර එක්පැහැ ඇති වැ ගොන්වැ උපන් කලැ මතු සුන් හිසින් වගුළ ලෙහෙ එසෙයින් මැ මී වැ උපන් කලැ තිරෙළ වැ උපන් කලැ පලෙළු වැ උපන් කලැ මව වැ උපන් කලැ හූරු වැ උපන් කලැ කුකුළු වැ උපන් කලැ සුන් හිසින් වගුළ ලෙහෙ එසෙයින් මැ යුහු. සොරහයි ගෙනැ කඩපළා සොරහයි ගෙනැ වීරඹුසොරහයි[1] ගෙනැ හිස් සුන් කලැ වගුළ ලෙහෙ සතර මහමුහුදැ දියට බොහො පරිදි දක්වන්නට වදාළහ:-

105. "දීඝරත්තං වො භික්ඛවෙ ගුන්නං සතං ගොභූතානං සීසච්ඡින්නානං, මහිසානං සතං මහිසභූතානං සීසච්ඡින්නානං, අජානං සතං අජභූතානං සීසච්ඡින්නානං, උරබ්භානං සතං උරබ්භභූතානං සීසච්ඡින්නානං, මිගානං සතං මිගභූතානං සීසච්ඡින්නානං, සූකරානං සතං සූකරභූතානං සීසච්ඡින්නානං, කුක්කුටානං සතං කුක්කුටභූතානං සීසච්ඡින්නානං, චොරා ගාමඝාතකාති ගහෙත්වා සීසච්ඡින්නානං, චොරා පාරිපත්ථිකාති ගහෙත්වා සීසච්ඡින්නානං, චොරා පාරදාරිකාති ගහෙත්වා සීසච්ඡින්නානං ලොහිතං පස්සන්නං පග්ඝරිතං නත්වෙව චතුසු මහාසමුද්දෙසු උදකං" යි.

---

[1] විහිරඹු සොරහයි ACEF

දරිද්‍ර වූ කෘපණ වූ විරූප වූ දුස්සංස්ථානගස්තපාද ඇති සත්වයන් දුටු කලැ "අනවරාග්‍රසංසාරයෙහි ඇපිදු මෙසෙ මැ වූමිහ" යි සන්නිෂ්ඨාන කළ මනා පරිදි දක්වන්නට වදාළහ:-

106. "යං භික්ඛවෙ පස්සෙය්‍යාථ දුග්ගතං දුරූපෙතං නිට්ඨමෙත්ථ ගන්තබ්බංඅම්හෙහිපි එවරූපං පච්චනුභූතං ඉමිනා දීඝෙන අද්ධුනා" යි.

මහද්ධන වූ මහාභෝග වූ අලඞ්කෘතපය්‍යාප්ත වූ හස්ති ස්කන්ධවරගත වූ මහත් පරිවාර ඇති ජනයන් දුටු කලැ "සසර වසන කලැ ඇපිදු මෙසෙ මැ වූමිහ" යි සන්නිෂ්ඨාන කළ මනා පරිදි දක්වන්නට වදාළහ:-

107. "යං භික්ඛවෙ පස්සෙය්‍යාථ සුඛිතං සජ්ජිතං නිට්ඨමෙත්ථ ගන්තබ්බං අම්හෙහිපි එවරූපං පච්චනුභූතං ඉමිනා දීඝෙන අද්ධුනා" යි.

අනවරාග්‍රසංසාරයෙහි කර්මානිලවෙගයෙන් පෙරළෙන සතුන් අතුරෙහි එක් සතක්හු මවු නො වූ යම් සතෙක් නැති, පිය නො වූ මල් නො වූ බෑ නො වූ නං නො වූ බුහුන් නො වූ පුත් නො වූ දූ නො වූ යම් සතෙක් නැත්.

එයින් වදාළහ:-

108. "න සො භික්ඛවෙ සත්තො සුලභරූපො යො නමාතා භූතපුබ්බා[1], යො න පිතා භූතපුබ්බා[1], යො න භාතා භූතපුබ්බා[1], යො න භගිනී භූතපුබ්බා[1], යො න පුත්තො භූතපුබ්බා[1], යො න ධීතා භූතපුබ්බා[1] ඉමිනා දීඝෙන අද්ධුනා" යි.

---

[1] භූතපුබ්බො ABD

මෙසෙ එක්පුරුෂයක්හු අඹු නො වූ යමි ස්ත්‍රියක් නැති; එක් ස්ත්‍රියක සැමි නො වූ යමි පුරුෂයෙක් නැති; එක් සතක්හු කුස නො හොත් යමි සතෙක් නැති; හැමසතුන් කුස නො හොත් එක් සතෙක් නැති; ස්ත්‍රී නො වූ යමි පුරුෂයෙක් නැති; පුරුෂ නො වූ යම් ස්ත්‍රියක් නැති; මහපොළොවැ එක් සතක්හු නො හුන් තැනෙක් නො සිටි තැනෙක් නො හොත් තැනෙක් නැති; හෙව නො මළ තැනෙක් නැති; නො දැවූ තැනෙක් නැත්.

එයින් වදළහ:-

මිනි නො දැවූ තැනක් බලන උපසාළහක බමුණහට එතැනැ ඔහු වනම් වැ තුදුස්දහසක් ජනයෙහි දැවූ පරිදි:-

109. "උපසාළහක නාමානං සහස්සානි චතුද්දස
අස්මිං පදෙසෙ දඩ්ඨානි නත්ථි ලොකෙ
අනාමතං" යි.

ආකාශයෙහි එක් සතක්හු නො ගිය මහ නැති; ගුදා වාස[1] මිස නො උපන් තැන් නැති; යම් තැනෙක මැ සුව නැත්; තත්තදභවයෙහි විෂයොපභොගයෙන් උපන් සුව වූ කල සංස්කාරයන් එම විගස පෙරළෙන බැවින් වධබානලප්‍රාප්ත ජලනිධියෙහි ජල්සෙයින් දුර්ගයෙහි මැ නිමග්න වෙ.

එයින් වදළහ:-

110. "යං කිඤ්චි වෙදයිතං සබ්බන්තං දුක්ඛස්මින්ති වදාමී" යි.

අනෙක කාලයෙහි එක්සතක්හු නො උපන් ගති නැති; නො වුන් දුක් නැත්.

එයින් වදළහ:-

111. "අනමතග්ගොයං භික්ඛවෙ සංසාරෝ පුබ්බා කොටි න පඤ්ඤායති අවිජ්ජානීවරණානං සත්තානං තණ්හාසංයොජනානං

---

[1] සුධාවාසයෙහිද

යොජනානං සන්ධාවතං සංසරතං; එවං දීඝරත්තං වො භික්ඛවෙ දුක්ඛං පච්චනුභූතං තිබ්බං පච්චනුභූතං කටුකං පච්චනුභූතං කටසී වඩ්ඩිතා; යාවඤ්චිදං භික්ඛවෙ අලමෙව සබ්බසංඛාරෙසු නිබ්බින්දිතුං අලංවිරජ්ජිතුං අලං විමච්චිතුං" යි.

මෙසෙයින් සංසාරය අනවරාග්‍ර යි.

---

<u>නරකදුඃඛ භයානක</u> පරිදි කිසෙයැ යත්?

අෂ්ටමහානරකාදීන් ඝොර වන බැවිනුද් එහි දුක් අන්නත වන බැවිනුද් භයානකයි.

<u>එහි අෂ්ට මහානරක</u> නම් කවර යත්?

සඤ්ජීවයැ කාලසූත්‍රයැ සඞ්ඝාතයැ රෞරවයැ මහා රෞරවයැ තාපයැ ප්‍රතාපයැ මහාවීචියැ යන මේ යි.

එයින් කීහ:-

112. "සඤ්ජීවඃ කාලසූත්‍රඤ්ච සඞ්ඝාතො රෞරවස්තථා
මහාරෞරවතාපාඛ්‍යප්‍රතාපාවීචි නාමකාඃ" යි.

මෙහි යමපලුන් විසින් ප්‍රජ්වලිත වූ නානායුධ ගෙන කඩ කඩ කොට සිදුනාලද සත්වයන් පුනපුනා දිවි ඇති වන නරකය "සඤ්ජීව" නම් විය. යමපලුන් විසින් ප්‍රජ්වලිත විවිධායුධ ගෙන මහහඬින් හඬා දිව ගොස් නිරිසතුන්[1] දිලියෙන යපොළොවැ පැහැර හෙළා පියා සූත්‍රාහත කොටැ ප්‍රජ්වලිත පරශුවින් හඬව හඬවා අෂ්ටාංශ ෂොඩශාංශ කොටැ සස්නා නරකය "කාලසූත්‍ර" නම් විය. අයොමය පර්වතයෙන් සතුන් සුන් සුන් කොට මිරිකන නරකය "සඞ්ඝාත" නම් වී.

කිසෙයැ යත්?

එ නරකයෙහි සත්වයො නවයොදුන් බොල් දිලියෙන යපොළොවැ කටිප්‍රදෙශය දක්වා ගැලි නිශ්චල වැසිටිති;

---

[1] නෙරිසතුන්

එකල්හි පූර්වදිශාභාගයෙන් ප්‍රජ්වලිත අයො පර්වතයෙක්[1] උත්ථිත වැ අශනිඝොෂයෙන්[2] ගර්ජනා කෙරෙමින් අවුදු ඒ සත්වයන් සියුම් කොට වටනතල සෙයින් සුන්[3] කෙරෙමින් ගොස් පශ්චිමදිශාභාගයෙහි සිටි; පශ්චිමදිශාභාගයෙනුද් උත්තරදිශාභාගයෙනුද් දක්ෂිණදිශාභාගයෙනුද් උත්ථිත පර්වතයො එසෙයින් මැ මිරිකමින් යති; දෙදිශායෙන් දෙපර්වතයෙක් අවුද් සතුන් උක්දඩුකලබක් සෙයින් මිරිකාමැයැ. එයින් එ නරකය "සඞ්ඝාත නම් වී.

නවද්වාරයෙන් වැද සකල ශරීරය හුයන ක්ෂාරධූමයෙන් ගුගුරා පස්නා සතුන් ඇති නරකය "රොරව" නම් විය. රක්ත ලොහිත ජ්වාලායෙන් පරිපූර්ණ වූ බලවත් දුඃඛයෙන් අභිභූත සත්වයන් ඇති නරකය "මහාරොරව" නම් විය. යමපලුන් විසින් දිලියෙන යපොළොවැ දිලියෙන යහුල්හි හිඳුවනලද සත්වයන් දිලිහි දිලිහි[4] නිශ්චල වැ හිඳ පස්නා නරකය "තාප" නම් විය. එසෙයින් මැ ප්‍රකර්ෂයෙන් තවනලද නරකය "ප්‍රතාප" නම් වී.

කිසෙයැ යත්?

හෙරවරූප ඇති රාක්ෂයො භයානකනාදයෙන් හඬා ප්‍රජ්වලිත ආයුධයෙන් පැහැර සත්වයන් ආදිප්ත අයඃපර්වතයට නඟති; ඔවුන් පර්වතමස්තකයෙහි සිටි කලැ කර්මජ වූ ක්ෂාරවාත හමයි; එ සත්හු එහි නො සිටිය හී ඌර්ධ පාද වැ අධශ්ශිරස්වැ හෙති; එකල්හි දිලියෙන යපොළොවින් තාලස්කන්ධ ප්‍රමාණ අයශ්ශූල නැගෙයි; සත්වයො එහි මස්තකයෙන් හී විනිර්විද්ධ ශරීර වැ පස්ති; ඒ යහුලුද් දිලියෙයි සත්වයො ද් දිලියෙති යපොළොව ද් දිලියෙයි; මෙසෙ ප්‍රකර්ෂයෙන් තවන්නෙන් එ නරකය "ප්‍රතාප" නම් වී.

---

[1] අයඃපර්වතයෙක් [1] අයොමය පර්වතයෙක්G
[2] අසනිඝොෂ සෙයින්PG [3] සුන්බුන් [4] දිලිදිලි

ජ්වාලායෙනුදු සඤ්ඤයන් විසිනුදු දුඃඛයෙනුදු වීවි නැති නරකය "අවීචි" නම් වී. "වීචි" ශබ්දය අන්තරපයදීායයි.

එහි ජ්වාලායෙන් අතුරු නැති පරිදි කියෙයැ යත්?

පූර්වහිත්තීන් ජ්වාලා උත්පත්ත වැ සකලනරකමණ්ඩලය පුරමින් සියක්යොදුන් තැන් ගොස් පශ්චිමහිත්තිය විනිවිද ගොස් පිටත සියක්යොදුන් තැනැ පැතිර සිටී, තුබූ පස් දිසායෙහිද් එසෙම යැ. මෙසෙ ෂඩ්විධ ජ්වාලායෙන් නිරන්තර වන බැවින් ඒ නරකය "අවීචි" නම් වෙ ම ය.

සඤ්ඤයන් විසින් අතුරු නැති පරිදි කියෙයැ යත්?

ඒ නරකාභ්‍යන්තරයෙහි සියක්යොදුන් තැන් තළෙක පිරූ මල්තුඹුපිටි සෙයින් සතුන් විසින් නිරන්තරයැ, "මෙ තැනැ[1] සත්වයෝ ඇති, මෙ තැනැ[1] සත්වයෝ නැති" කියන්නට නිසි තැනෙක් නැති. හෙව හිඳ සිට ඇවිද පස්නා සතුන්ගේ අන්ත නැති; යන්නානට සිටියන් විසින් හුන්නවුන්[2] විසින් හොත්තන් විසින් ආවරණ නැති. මෙසෙ සත්වයන් විසින් නිරන්තර වන බැවින් "අවීචි" නම් වෙ මය.

දුඃඛයෙන් නිරන්තර පරිදි කියෙයැ යත්?

කායද්වාරයෙහි සඋපෙක්ෂාසහගත චිත්තයෝ[3] උපදිති; එක් දුඃඛසහගතචිත්තයෙක් උපද්දි; එතෙතුදු වුව යම්සෙ ජිහ්වාග්‍රයෙහි මධුබින්දුවක්[4] තබා එක් තාම්‍රලොහබින්දුවක් තුබූ කලැ අනුදහනය මැ බලවත් වන බැවින් එ මීබිඳින්[5] කමි නැති; එසෙසින් මැ උපෙක්ෂා සහගතචිත්තයන් උපදුනුදු දුඃඛසහගත චිත්තයා මැ බලවත් වන බැවින් දුඃඛය මැ නිරන්තරයැ; තුබූ සිත් ඇතද් නැති; මෙසෙ දුඃඛයෙන්

---

[1] තෙනC [2] හුන්නන්BEG [3] අකුසලවිපාකචිත්තයෝB
[4] සමධුබින්දුවක්EFG [5] මීබින්දු විසින්B [6] කායිකදුඃඛB

නිරන්තර වන බැවින් "අවීචි" නම් වෙ මැයි.

මෙසෙ වූ අෂ්ට මහානරකයො චතුරශ්‍රයහ, චතුර් ද්වාරයහ, සතරදෙසෙහි නවයොදුන් බොල් යබ්තැ, උඩ නවයොදුන් බොල් යපියනැ, යට නවයොදුන් බොල් යපොළොවැ; මෙයින් නික්මෙන අග්නිජ්වාලා බලනුවන් ඇස් සියක්යොදුන් තැන් සිටැ යමකගුළිකා සෙයින් නික්මෙයි; මේ අෂ්ටමහානිරයැ එකෙකි ද්වාරයෙහි සතර සතර උත්සද නරකයැ; මේ නියායෙන් එකෙකි මහානරකයෙහි සොළොස් සොළොස් උත්සද නරක වන බැවින් එක්සිය අටවිස්සෙක් වෙයි; මහානරක හා සමඟ එක්සිය සතිසෙක් වෙ; මෙ අෂ්ට මහානරකයො පවි කළ සතුන් විසින් පරිපූර්ණයහ, ඝොරයහ, දුරුණයහ, දක්නට ද අසන්නට ද භයානකයහ.

එයින් වදාළහ:-

113. "ඉච්චෙතෙ අට්ඨ නිරයා අක්ඛාතා දුරතික්කමා
ආකිණ්ණා ලුද්දකම්මෙහි පච්චෙකා සොළසුස්සදා

කදරියා තපනා ඝොරා අච්චිමන්තො මහබ්ඝයා
ලොමහංසනරූපා ච හෙස්මා පටිභයා දුඛා

චතුක්කණ්ණා චතුද්වාරා විභත්තා භාගසො මිතා
අයොපාකාරපරියන්තා අයසා පටිකුජ්ජිතා

තෙසං අයොමයා භූමි ජලිතා තෙජසා යුතා
සමන්තා යොජනසතං ඵුට්ඨා තිට්ඨන්ති සබ්බදා"යි.

මෙහි ආයුෂ කවර යත්?

මිනිස්නට පනස් හවුරුද්දෙක් සවිමහරජයෙහි දෙවියනට එක් දවසෙක් වෙයි, එ දවසින් තිස්දවසෙක් මසෙක් වෙයි, එ මසින් දොළොස්මසෙක් හවුරුද්දෙක් වෙයි,

ඒ හවුරුද්දෙන් එහි දෙවියනට පන්සියක් හවුරුද්දට ආයුෂයැ. ඒ දිව්‍යායුෂ වූ හවුරුදු පන්සියය සඤ්ජීව නරකයෙහි එක් දවසෙක් වෙයි, ඒ දවසින් තිස්දවසෙක් මසෙක් වෙයි, ඒ මසින් දොළොස් මසෙක් හවුරුද්දෙක් වෙයි, ඒ හවුරුද්දෙන් ඒ නරකයෙහි පන්සියක් හවුරුද්දට ආයුෂයැ.

මිනිස්නට සියක් හවුරුදු තවතිසාවැසි දෙවියනට එක් දවසෙක් වෙයි, ඒ දවසින් එහි දෙවියනට පූර්ණෝක්ත ක්‍රමයෙන් දහසක් හවුරුද්දට ආයුෂයැ. ඒ දිව්‍යායුෂසහස්‍රය කාලසූත්‍ර නරකයෙහි එක් දවසෙක් වෙයි, ඒ දවසින් ඒ නරකයෙහි දහසක් හවුරුද්දට ආයුෂයැ.

මිනිස්නට දෙසියක් හවුරුදු යාමදෙවිලොවැ දෙවියනට එක් දවසෙක් වෙයි, ඒ දවසින් එහි දෙවියනට දෙදහසක් හවුරුද්දට ආයුෂයැ. ඒ දිව්‍යායුෂ දෙදහස් සඞ්ඝාත නරකයෙහි එක් දවසෙක් වෙයි, ඒ දවසින් ඒ නරකයෙහි දෙදහසක් හවුරුද්දට ආයුෂයැ.

මිනිස්නට සාරසියක් හවුරුදු තුසිපුරයෙහි දෙවියනට එක් දවසෙක් වෙයි, ඒ දවසින් එහි දෙවියනට සාරදහසක් හවුරුද්දට ආයුෂයැ. ඒ දිව්‍යායුෂ සාරදහස රෞරව නරකයෙහි එක් දවසෙක් වෙයි, ඒ දවසින් ඒ නරකයෙහි සාර දහසක් හවුරුද්දට ආයුෂයැ.

මිනිස්නට අටසියක් හවුරුදු නිර්මාණරතියැ දෙවියනට එක් දවසෙක් වෙයි, ඒ දවසින් එහි දෙවියනට අට දහසක් හවුරුද්දට ආයුෂයැ. ඒ දිව්‍යායුෂ අටදහස මහාරෞරව නරකයෙහි එක් දවසෙක් වෙයි, ඒ දවසින් ඒ නරකයෙහි අට දහසක් හවුරුද්දට ආයුෂයැ.

මිනිස්නට එක්දහස් සසියක් හවුරුදු පරනිර්මිතවශවර්තියැ දෙවියනට එක් දවසෙක් වෙයි, ඒ දවසින් එහි

දෙවියනට සොළොස්දහසක් හවුරුද්දට ආයුෂයැ. ඒ දිව්‍යායුෂ සොළොස් දහස තාපනරකයෙහි එක් දවසෙක් වෙයි. ඒ දවසින් තිස්දවසෙක් මසෙක් වයි, එමසින් දොළොස් මසෙක් හවුරුද්දෙක් වෙයි, ඒ හවුරුද්දෙන් ඒ නරකයෙහි සොළොස්දහසක් හවුරුද්දට ආයුෂයි. මෙසෙ සදෙවී ලොවැ දෙවියන්ගේ ආයුෂ හා තුල්‍ය වූ එක්දවසෙකින් ඔවුන් හා මැ සමආයුෂ ඇතියවිහ සඤ්ජීවාදි සනරකයෙහි සත්වයෝ.

එහි ප්‍රතාප[1] නම් සත්වන නරකයෙහි අන්තරිකල්පයෙකින් අඩියකට ආයුෂයැ. මහාවීචියැ එක් අන්තරිකල්පයකට ආයුෂයි.

එයින් කිහ:-

114. "තුල්‍යෙඤ්දිවායුෂා කාමෙ'හොරා
ත්‍රෙඤාඤ්සමායුෂඃ
සඤ්ජීවාදූෂ්ෂඩඩීනාන්තරිකල්ප කල්පායුෂෝ
පරෝ"සි.

මෙහි මහාවීචියැ අවයවභූත වූ අර්බුදාදි දශනරකයෙහි ආයුෂ කවර යත්? මගධනැළියෙන් සතරනැළියෙක් තල කොසොල් නැළියෙන් එක්නැළියෙක් වෙයි, ඒ නැළියෙන් සතර නැළියෙක් කොසොල් ප්‍රහස්සෙන් එක් ප්‍රහස්සෙක් වෙයි, ඒ ප්‍රහස්සෙන් සතර ප්‍රහස්සෙක් එක් ද්‍රොණයෙක් වෙයි, ඒ ද්‍රොණයෙන් සතර ද්‍රොණයෙක් එක් ඛාණියෙක්[2] වෙයි, ඒ ඛාණියෙන් සතර ඛාණියෙක්[2] එක් ඛාරියෙක් වෙයි, ඒ ඛාරියින් විසි ඛාරියෙක් එක් වාහයෙක් වෙයි, ඒ තිලවාහයෙන් හවුරුදු සියක් හවුරුදු සියක් ගිය කලැ එකෙකි තලබීජ හරුත් ඒ තිලවාහය ගෙවී යෙයි අර්බුද නරකයෙහි ආයුෂ නො ගෙවී. මෙ අර්බුදනරකයෙහි ආයුෂයෙන් විසිකොටයෙකින් වැඩි

---

[1] මහාප්‍රතාප CDEF [2] මානිකායෙක් EG

ආයුෂයැ, නිරර්බුද නරකයෙහි. මෙ නිරර්බුද නරකයෙහි ආයුෂයෙන් විසිකොටයෙකින් වැඩී ආයුෂයැ අබබනරකයෙහි මෙ අබබනරකයෙහි ආයුෂයෙන් විසිකොටයෙකින් වැඩී ආයුෂයැ අටටනරකයෙහි. මෙ අටටනරකයෙහි ආයුෂයෙන් විසිකොටයෙකින් වැඩී ආයුෂයැ අගහනරකයෙහි. මෙ අගහ නරක යහි ආයුෂයෙන් විසිකොටයෙකින් වැඩී ආයුෂයැ කුමුද නරකයෙහි. මෙ කුමුදනරකයෙහි ආයුෂයෙන් විසිකොටයෙකින් වැඩී ආයුෂයැ සොගන්ධිකනරකයෙහි. මෙ සොගන්ධික නරකයෙහි ආයුෂයෙන් විසිකොටයෙකින් වැඩී ආයුෂයැ උප්පල නරකයෙහි. මෙ උප්පල නරකයෙහි ආයුෂයෙන් විසි කොටයෙකින් වැඩී ආයුෂයැ පුණ්ඩරීකනරකයෙහි. මෙ පුණ්ඩරීක නරකයෙහි ආයුෂයෙන් විසිකොටයෙකින් වැඩී ආයුෂයැ පදුම නරකයෙහි.

එයින් වදාළහ:-

115. "සෙය්‍යථාපි භික්ඛු වීසතිඛාරිකො කොසලකො තිලවාහො, තතොපුරිසො වස්සසතස්ස වස්සසතස්ස අච්චයෙන එකමෙකං තිලං උද්ධරෙය්‍ය, ඛිප්පතරං බො සො භික්ඛු වීසතිඛාරිකො කොසලකො තිලවාහො ඉමිනා උපක්කමෙන පරික්ඛයං පරියාදානං ගච්ඡෙය්‍ය න තෙව ඒකො අබ්බුදෙ නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති අබ්බුද නිරයා එවමෙකො නිරබ්බුදෙ නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති නිරබ්බුද නිරයා එවමෙකො අබබො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති අබබා නිරයා එවමෙකො අටටො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති අටටා නිරයා එවමෙකො අහහො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති අහහා නිරයා එවමෙකො කුමුදෙ නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති කුමුද නිරයා එවමෙකො සොගන්ධිකො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති සොගන්ධික නිරයා එවමෙකො

---

1 එවමෙව බො

උප්පලකො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති උප්පලකා නිරයා එවමෙකො පුණ්ඩරීකො නිරයො, සෙය්‍යථාපි භික්ඛු වීසති පුණ්ඩරීකා නිරයා එවමෙකො පදුමො නිරයො; පදුමං ඛො පන භික්ඛු නිරයං කොකාලිකො භික්ඛු උපපන්නො සාරිපුත්ත මොග්ගල්ලානෙසු චිත්තං ආසාතෙත්වා" යි.

මෙසෙයින් අනන්තාපරිමාණ ආයුෂ ඇති සහොත්සද මහා නරකයෙහි උපන් සත්වයන් ගවු පමණ ශරීර වේ මයැ; දෙගවු පමණ තුන්ගවු පමණ යොදුන් පමණ ශරීර වේ මයැ; දෙවදත්තයන් මැ සියත්යොදුන් පමණ ශරීර විය; ඔවුන් සිරුරු පෙණ පිඩු සෙ නො තර වෙයි; මහනෙල්මල ගබපෙත්තෙනුදු ගැසුව සිවිසමි ආදි කඩා ගොස් ඇටමුල මිස නො නවත්ති; එසෙ උපන් සතුන් යමපල්හු ගිනිගෙන දිලියෙන යපොළොවැ හොවා නහඹ තල්කඳ සා ගිනිගෙන දිලියෙන යහුලක් එක් අතෙක ගසති; එයින් කම්පිත වැ ආතීස්වරයෙන් ගුගුරන්නහු එසෙයින් මැ ගිනිගෙන දිලියෙන යහුලක් දෙවන අත ගසති; එයින් කම්පමාන වූවහු ගිනිගෙන දිලියෙන යහුලක් එක් පයක ගසති; එයින් ප්‍රකම්පිත වැ අඩන්නහු එ මැ බඳු යහුලක් දෙවන පය ගසති; එක්බිති කර්මාරහස්ත්‍රාවක් සෙයින් ශරීරමධ්‍යයෙන් පෙවෙන්නහු එසෙයින් මැ තාලස්කන්ධප්‍රමාණ වූ ආදීප්ත අයශ් ශූලයක් හෘදය මධ්‍යයෙහි ගසා නිශ්චල කෙරෙති; පාපක්ෂය නො වූ තාක් කල් ඔහුට[1] මරණ නැත්.

එයින් වදාළහ:-

116. "තමෙනං භික්ඛවෙ නිරයපාලා පඤ්චවිබන්ධනං[2] නාම කාරෙන්ති තත්තං අයොඛීලං හත්ථෙ ගමෙන්ති තත්තං අයොඛීලං දුතියෙ හත්ථෙ ගමෙන්ති තත්තං අයොඛීලං පාදෙ ගමෙන්ති තත්තං අයොඛීලං දුතියෙ පාදෙ ගමෙන්ති තත්තං

---

[1] උහුට B [2] පඤ්චවිධ බන්ධනං CDEF පඤ්චවිබන්ධනං නාම කාරණං කරොන්ති G

අයොඛීලං මජ්ඣෙ උරස්මිං ගමෙන්ති ; සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති" යි.

එක්බිති බොහොසෙ තුන්ගවු පමණ අන්බැව් ඇති සත්වයන් ගිනිගෙන දිලියෙන ලොහොපොළොවැ හොවා එක් පලයක් පමණ ගිනිගෙන දිලියෙන කුඨාරයෙන්[1] සස්ති; ලොහිත නදී වැ පවත්ති; ලොහොපොළොවින් අග්නිජ්වාලා නැගී සැසි සැසි තැන ඇවිළ ගෙන දවයි; මහත් දුක් උපද්දි; සස්නාහු සූත්‍රාහත කොටැ දැවයක් සෙයින් චතුරංග ෂඩංග අෂ්ටාංග ෂොඩශාංග කොටැ සසිත්. එක්බිති යමපල්හු නෙරිසතුන් පා උඩු බල්වා හිස් බිම් බල්වා සිටුවා මහත් කුලු පමණ ගිනි ගෙන දිලියෙන වැහැයෙන් සස්නාහු සුඹුලෙහි පටන් ගෙන ඇට දක්වා සෙමෙන් සෙමෙන් සස්ති; සැසි සැසි තැන් පිරේ.

එයින් වදාළහ:-

117. "තමෙනං භික්ඛවෙ නිරයපාලා සංවෙසෙත්වා කුඨාරීහි තච්ඡන්ති -තමෙනං භික්ඛවෙ නිරයපාලා උද්ධපාදං අධොසිරං ඨපෙත්වා වාසීහි තච්ඡන්ති" යි.

එක්බිති යමපල්හු නෙරිසතුන් යුග යොත්‍ර පඤ්ජර චක්‍ර කුබර ප්‍රතොද හා සමඟ සර්වප්‍රකාරයෙන් ප්‍රජ්වලිත රථයෙහි යොදා ගිනිගෙන දිලියෙන යපොළොවැ ඇවිදුවත්.

එයින් වදාළහ:-

118. "තමෙනං භික්ඛවෙ නිරයපාලා රථෙ යොජෙත්වා ආදිත්තාය පඨවියා සම්පජ්ජලිතාය සජොතිභූතාය සාරෙන්තිපි පච්චාසාරෙන්තිපි" යි.

---

[1] කුඨාරීන්B

එක්බිති ප්‍රඥලිත අයොමය මහාභූමිතලයෙන් පැහැර මහත් කූටාගාර ප්‍රමාණ වූ සම්ප්‍රඥලිත වූ අඩ්‍යාර පර්වතයට නඟති බහති.

එයින් වදුළහ:-

119. "තමෙනං භික්ඛවෙ නිරයපාලා මහන්තං අඩ්‍යාර පබ්බතං ආදිත්තං සම්පජ්ජලිතං සජොතිභූතං ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි" යි.

එක්බිති යමපල්හු නෙරියකුන් ඌඬිවෑදෑ කොට ගෙන තපා වූ ආදීප්ත වූ සම්ප්‍රඥලිත වූ පර්වතොපම ලොහකුම්භියෑ ප්‍රක්ෂිප කෙරෙත්. හෙ එහි පෙණපිඩක් බඳු දෙහ ඇති වෑ පස්නේ කතියන උදුනෙහි සාල් සෙයින් එක්වට උඩ බැහෙයි, එක්වට යටට බස්සි, එක්වට වටා[1] ඇවිද පැසෙයි. හෙ එහි තීව්‍ර වූ කටුක වූ දුක් විඳුනේ තම්බලයෙන් මිය නොයෙයි.

එයින් වදුළහ:-

120. "තමෙනං භික්ඛවෙ නිරයපාලා උද්ධපාදං අධොසිරං ගහෙත්වා තත්තාය ලොහකුම්භියා පක්ඛිපන්ති ආදිත්තාය සම්පජ්ජලිතාය සජොතිභූතාය; සො තත්ථ වෙණුදෙදහකං පච්චති; සො තත්ථ වෙණුදෙදහකං පච්චමානො සකිම්පි උද්ධං ගච්ඡති, සකිම්පි අධො ගච්ඡති, සකිම්පි තිරියං ගච්ඡති; සො තත්ථ දුක්ඛා තිබ්බා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති" යි.

එක්බිති යමපල්හු නෙරියකුන් ගෙන අවීචි මහා නරකයෙහි බහා පියති; ඒ නරකය දෑ චතුෂ්කණී යෑ, චතුර්ද්වාරයෑ, ප්‍රඥලිත අයඃප්‍රාකාරයෙන් පරික්ෂිප්තයෑ, අයොමයභූමියෑ. මෙ නරකයෙහි අභ්‍යන්තරය් ආයාමයෙනුදු

---

[1] වටවටා ABCD

විසාරයෙනුදු සියක් සියක් යොදුන. ලොහොපොළොව ද් ලොහාපියන ද් එකෙකි භිත්ති ද් බොල නව නව යොදුන. එහි පූර්‍ව භිත්තින් අග්නිජ්වාලා උත්‍පත්ත වූ පශ්චිමභිත්තිය පැහැර ව විනිවිද එයින් පිටත සියක්යොදුන් තැනැ පැතිර සිටී. තුබූ තුන් දිශායෙහිදු උඩ ද යට ද ජ්වාලා එම නියායෙන් පවත්තී. මෙසෙ ජ්වාලානතයෙන් අවීචිය තුන්සිය අටලොස් යොදුන; වටා නවසිය සුපනස් යොදුන; උස්සද හා සමග දැසඳහසක් යොදුන; මෙහි තීව්‍ර කටුක දුක් අනුභව කරනුයෙ කර්‍මඵලයෙන් මිය නො යෙයි.

එයින් වදළහ:-

121. "තමෙනං භික්ඛවෙ නිරයපාලා මහානිරයෙ පක්ඛිපන්ති යො ඛො පන භික්ඛවෙ මහානිරයො:-

චතුක්කණ්ණො චතුද්වාරො විභත්තා භාගසො මිතො
අයොපාකාර පරියන්තා අයසා පටිකුජ්ජිතො

තස්ස අයොමයා භූමි ජලිතා තෙජසා යුතා
සමන්තා යොජනසතං ඵරිත්වා තිට්ඨති සබ්බදා.

තස්ස ඛො පන භික්ඛවෙ මහානිරයස්ස පුරත්ථිමාය භිත්තියා අච්චි උට්ඨහිත්වා පච්ඡිමාය භිත්තියා පටිහඤ්ඤති; පච්ඡිමාය භිත්තියා අච්චි උට්ඨහිත්වා පුරත්ථිමාය භිත්තියා පටිහඤ්ඤති; උත්තරාය භිත්තියා අච්චි උට්ඨහිත්වා දක්ඛිණාය භිත්තියා පටිහඤ්ඤති; දක්ඛිණාය භිත්තියා අච්චි උට්ඨහිත්වා උත්තරාය භිත්තියා පටිහඤ්ඤති; හෙට්ඨා අච්චි උට්ඨහිත්වා උපරි පටිහඤ්ඤති උපරිතො අච්චි උට්ඨහිත්වා හෙට්ඨා පටිහඤ්ඤති; යො තත්‍ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං වියන්ති හොති" යි.

මෙසෙ සදෑල අතුරෙහි පස්නා සැවයහට අනෙකවර්ෂ කොටි සහස්‍රයක් ගිය කලැ වී මහානරකයෙහි පූර්වද්වාරය විවර වෙයි; හෙ එහි ගිහ වැ දිවෙයි; ඔහු දිවනුවහු සිවි දැයි, සම් දැයි, මස් දැයි[1], නහර දැයි, ඇට ඇවිළගෙන දිලියෙයි; ඇකුත්පියවර[2] සිවියෙ පටන් ගෙන තත් කබල බහා ලූ වෙඩරු පිඬු[3] සෙයින් ඇට දක්නා දැයි; කැඟ පියවර ඇට පටන් ගෙන සිවි දක්නා[4] මුළුලූ වෙ. හෙ මෙසෙ අනෙකවර්ෂ කොටි සහස්‍රයෙන් ගොස් සම්ප්‍රාප්ත වී නම් වූ ද්වාරය පිහිත වෙයි. හෙ එහි තීව්‍ර වූ කටුක දුක් අනුභව කරනුයෙ කර්මශක්තින් මිය නො යෙ. එසෙයින් මැ පශ්චිමද්වාරය ද උත්තර ද්වාරය ද දක්ෂිණ ද්වාරය ද විවෘත වෙයි. එසෙයින් මැ ඔහු ගොස් සම්ප්‍රාප්ත වූ කල පිහිත වෙයි.

එසින් වදාළහ:--

122. "හොති ඛෝ සෝ භික්ඛවෙ සමයෝ'යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනෝ අච්චයෙන තස්ස මහානිරයස්ස පුරත්ථිමං ද්වාරං[5] අවාපුරීයති; සෝ තත්‍ර ඨිතෙන ජවෙන ධාවති; තස්ස ඨිතෙන ජවෙන ධාවතෝ ජව්මිපි ඩය්හති චම්මම්පි ඩය්හති මංසම්පි ඩය්හති නහාරුම්පි ඩය්හති අට්ඨිම්පි සම්ප ධූපායන්ති, උඛතං තාදිසමෙව හොති; යතෝ ච ඛෝ සෝ භික්ඛවෙ බහුසම්පත්තෝ හොති අථ තං ද්වාරං පිථීයති. සෝ තත්‍ර දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං වූපසන්තං හොති - හොති ඛෝ සෝ භික්ඛවෙ සමයෝ'යං කදාචි කරහචි දීඝස්ස අද්ධුනෝ අච්චයෙන තස්ස මහානිරයස්ස පච්ඡිමං ද්වාරං[6] අවාපුරීයති - පෙ - උත්තරං ද්වාරං අවාපුරීයති - පෙ - දක්ඛිණං ද්වාරං අවාපුරීයති සෝ තත්‍ර ඨිතෙන ජවෙන ධාවති - පෙ - යාව න තං පාපං කම්මං වූපසන්තං හොති" සි.

---

[1] දවයි B [2] අකුත් B [3] පිඩක් B
[4] කැඟ පියවර පටන්ගෙන ඇට සිවි දක්නා AEF
[5] පුරත්ථිමද්වාරං B [6] පච්ඡිමද්වාරං BC

එසින් වදාළහ:-

124. "තස්ස ඛො පන භික්ඛවෙ ගූථනිරයස්ස සමනන්තරා සහිත මෙව මහන්තා කුක්කුලනිරයො, යො තත්ථ පපතති; සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ව තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති" සි.

මෙසෙ කුක්කුල නරකයෙහි අනෙකවර්ෂ කොටිසහස්‍රයෙහි පැසී ඉක්බිති මහත් ශල්මලීවනයෙක් ඇති; යොදුන් පමණ උසයැ, සොළොස්අඟුල් කණ්ඨකයැ, අග්නිජ්වලිතයැ, සම්ප්‍රජ්වලිතයැ සජොතිභූතයැ; එහි භයානක රාක්ෂයෝ ප්‍රජ්වලිත අයොමුඟුරයෙන් පැහැර ඝොරනාදයෙන් හඬා නෙරිසතුන් එයට නඟති; ඔවුන් නැඟෙන කලැ ඒ කණ්ඨකයෝ අධොමුඛ වෙති, බස්නා කලැ ඌර්ධ්වමුඛ වෙත්; හෙ එහි තීව්‍ර කටුක දුක් විඳුනේ කර්මාධිපත්‍යයෙන් මිය නො යෙ.

එසින් වදාළහ:-

125. "තස්ස ඛො පන භික්ඛවෙ කුක්කුල නිරයස්ස සමනන්තරා සහිතමෙව මහන්තං සිම්බලිවනං උද්ධං යොජන මුග්ගතං සොළ සඞ්ගුලකණ්ටකං ආදිත්තං සම්පජ්වලිතං සජොතිභූතං; තං තත්ථ ආරොපෙන්තිපි ඔරොපෙන්තිපි; සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති; න ව තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති" සි.

මෙසෙ ඒ කූටශල්මලීවනයෙහි අනෙකවර්ෂ කොටි සහස්‍රයෙහි පැසී ඉක්බිති මහත් අසිපත්‍රවනයෙක් ඇති; හෙ එයට ප්‍රවිෂ්ට වෙයි; ඔහුගෙ කර්මජවාතයෙන් කම්පිත වැ ඒ වෙනෙන් වැමිහෙන පත්‍රයෝ අත් සිඳුති, පා සිඳුති, අත්පා

සිඳිති[1], කන් සිඳිති[1], නාසා සිඳිති[1], කන්නාසා සිඳිති[1]. එලකයෙහි තබා කොටන මස් සෙයින් සියල් සිරුරු නිරන්තරයෙන් වස්නා ශස්ත්‍ර වර්ෂයෙන්[2] තෙමෙයි; ඉදින් නැඟී පලායන්නේ වී නම් අයඃප්‍රාකාර සමූහීත වැ වටාලයි; යට ක්ෂුරධාරා ඌර්ධ්වමුඛවැ නිරන්තරයෙන් සමූහීත වෙ; හෙ එහි තීව්‍ර කටුක දුක් විඳුනේ කර්මවශයෙන් මිය නො යෙ.

එයින් වදළහ:-

126. "තස්ස ඛෝ පන භික්ඛවෙ සිම්බලිවනස්ස සමනන්තරා සහිත මෙව මහන්තා අයිපත්තවනං, යෝ තත්ථ පවිසති; තස්ස වෛතරීනි පත්තානි පතන්ති, හත්ථම්පි ඡින්දන්ති, පාදම්පි ඡින්දන්ති, හත්ථපාදම්පි ඡින්දන්ති, කණ්ණම්පි ඡින්දන්ති, නාසම්පි ඡින්දන්ති, කණ්ණනාසම්පි ඡින්දන්ති; යෝ තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති; න ව තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති" යි.

මෙසෙ අසිපත්‍රවනයෙහි අනෙක වර්ෂකොටිසහස්‍රයෙහි වෙහෙසී එක්බිති තාම්‍රලොහොදකපරිපූර්ණ වූ වෛතරණී නම් නදියෙක්[3] ඇති; එහි අයොමය වූ කරවැල් හා පොකුරු පතැ, යට ක්ෂුරධාරායැ, උභයතීරයෙහි ප්‍රඡ්ඡලිත වෙත්‍රලතා හා කුශතෘණයැ; හෙ එහි හී ආවර්තයෙහි ගැලී පාතාලයට බැස ක්ෂුරධාරායෙහි කැඩී බොහෝ තලින් උඩ නැඟී ඌර්ධ්වශ්‍රොතසට ද[4] අධශ්‍රොතසට ද ගෙනයනලද්දෙ පොකුරුපතින් කඩනලැබෙයි කරවැල් කටුයෙන් විදුනාලැබෙයි කුශතෘණයෙන් සිඳුනාලැබෙයි වෙත්‍රලතායෙන් අදුනාලැබෙයි. හෙ එහි තීව්‍ර කටුක දුක් විඳුනෙ

---

[1] සිඳුතිCEP [2] වර්ෂායෙන්ACD [3] නරකයක්B

[4] ශ්‍රොතයට දැACDEP

කම් වශයෙන් මිය නො යෙ.

එයින් වදළහ:-

127. "තස්ස ඛො පන භික්ඛවෙ අසිපත්තවනස්ස සමනන්තරා සහිතමෙව මහති ඛාරොදිකා නදී, සො තත්ථ පපතති; සො තත්ථ අනුසොතම්පි වුය්හති පටිසොතම්පි වුය්හති අනුසොතපටිසොතම්පි වුය්හති; සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ව තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති" යි.

මෙසෙ ඔහු ක්‍ෂාරොදිකා වෙතරණිනදියෑ අනෙක වර්‍ෂකොටිසහස්‍රයෙහි පස්නා කල්හි තීරයෙහි සිටි යමපල්හු දිලියෙන යබිළි බහා ගන්වා නහාගෙන දිලියෙන යපොළොවැ හොවා "තුමක් රුස්ව"යි[1] පිළිවිසෑ "සාමි වහන්සෑ"යි කී කල්හි ගිනි ගෙන දිලියෙන ලොහොගුලා ගිනිගෙන දිලියෙන ලොහොපැසින් ළඟ කෙරෙත්. හෙ ඒ ලොහොගුලා බවී දැන උත්ත්‍රස්තවැ ඇස්මුව පියා ලයි; එකල්හි ගිනිගෙන දිලියෙන යහඬුයෙන් මුව විවෘත කොට තපා වූ ලොහොගුලා මුඛයෙහි ප්‍රක්ෂිප කෙරෙත්. හෙ ඔහු තොල් දවා දිවි දවා උගුරු දවා හෘදය දවා අතුණු දවා අතුණුබහන් දවා අධොභාගයෙන් නික්ම යෙ. හෙ එහි තීව්‍ර කටුක දුක් විඳුනෙ කම්‍ෂය නො වන්නෙන් මිය නො යෙ.

එයින් වදළහ:-

128. "තමෙනං භික්ඛවෙ නිරයපාලා බළිසෙන උද්ධරිත්වා ථලෙ පතිට්ඨාපෙත්වා එවමාහංසු - "අමොහපුරිස කිං ඉච්ඡසී"ති, සො එව මාහ "ජිගච්ඡිතොස්මි භන්තෙ"ති; තමෙනං භික්ඛවෙ නිරයපාලා තත්තෙන අයො

---

[1] රුස්වහියිG

සඞ්කුනා මුඛං විවරිත්වා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජෝතිභූතෙන තත්තං ලොහගුළං මුඛෙ පක්ඛිපන්ති ආදිත්තං සම්පජ්ජලිතං සජෝතිභූතං; තස්ස ඔට්ඨම්පි ඩය්හති[1], මුඛම්පි ඩය්හති, කණ්ඨම්පි ඩය්හති, උරම්පි ඩය්හති, අන්තම්පි අන්තගුණම්පි ආදාය අධොභාගා නික්ඛමති; සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ච තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති"යි.

මෙසෙ ඔහු අනෙක වර්ෂකොටිසහස්‍රයෙහි පස්නාහු "කුමක් රුස්වහි"යි පිළිවිසැ "පිපාසිතයෙමි වහන්සැ"යි[2] කී කල්හි ආදීප්ත වූ ලොහොඨවින් ප්‍රජ්වලිත වූ ලොහොදිය ගන්වාගෙන ළඟ කෙරෙත්; හෙ ච ලොහොදක බවි දැන වෙවුලා ඇස්මුව පියාලයි; එකල්හි යමපල්හු ආදීප්ත සණ්ඩාසයෙන්[3] මුඛය විවෘත කොට ප්‍රජ්වලිත ලොහොදක මුඛයෙහි ප්‍රක්ෂෙප කෙරෙත්; හෙ ඔහු තොල් දිවි උගුරු හෘදය අතුණු අතුණුබහන් දවා අධොභාගයෙන් නික්මෙයි; හෙ එහි තීව්‍ර කටුක බහල දුඃඛයන් අනුභව කරනුයෙ කර්මක්ෂය නොවන්නෙන් මිය නො යෙ.

එයින් වදාළහ:-

129. "තමෙන භික්ඛවෙ නිරයපාලා එවමාහංසු - "අම්හො පුරිස කිං ඉච්ඡසී"ති; සො එවමාහ - "පිපාසි තොස්මි භන්තෙ"ති; තමෙනං භික්ඛවෙ නිරයපාලා තත්තෙන අයොසඞ්කුනා මුඛං විවරිත්වා ආදිත්තෙන සම්පජ්ජලිතෙන සජෝතිභූතෙන තත්තං තම්බලොහං මුඛෙ ආසිඤ්චන්ති ආදිත්තං සම්පජ්ජලිතං සජෝතිභූතං; තස්ස ඔට්ඨම්පි ඩය්හති මුඛම්පි ඩය්හති, කණ්ඨම්පි ඩය්හති, උරම්පි ඩය්හති; අන්තම්පි අන්තගුණම්පි

---

[1] ඩහති CD [2] වහන්සෙයි AB [3] සංන්දංශයෙන්G

ආදය අධොභාගා නික්ඛමති ; සො තත්ථ දුක්ඛා තිප්පා කටුකා වෙදනා වෙදෙති, න ව තාව කාලං කරොති යාව න තං පාපං කම්මං ව්‍යන්ති හොති" යි.

මෙසෙ නෙරිසත්හු[1] පඤ්චවිබන්ධන[2]යෙහි පටන් ගෙන තාම්‍ර ලොහපාන දක්වා අනුලොමයෙන්, තාම්‍රලොහ පානයෙහි පටන් ගෙන පඤ්චවිබන්ධන[2] දක්වා ප්‍රතිලොමයෙන් මහත් නරක දුඃඛ[3] අනුභව කෙරෙති. එහි ඇතමී කෙනෙක් පඤ්චවිබන්ධන[2] කර්මයෙන් මෑ මුක්ත වෙති; ඇතමී කෙනෙක් ඇච්ඡිය්‍යාතියාදි කර්මයෙන් මුක්ත වෙති; ඇතමී කෙනෙක් තාම්‍ර ලොහපානයෙන් මුක්ත වෙති; කර්මය අපරික්ෂීණ කල්හි යම්පල්හු ඔවුන් ගෙන වැළිදු මහානරකයෙහි ඛහාපියත්.

එයින් වදළහ:-

130. "තමෙනං භික්ඛවෙ නිරයපාලා පුන මහා නිරයෙ පක්ඛි පක්ඛි" යි.

මෙසෙයින් සහොත්සද මහානරකයෙහි බුදුනට දහමට සඟනට වෑරද්දහු මවුපියන් සිල්වතුන් මැරුවාහු ජනපදපීඩා කළ රජ්ජුරුවො[4] කූටව්‍යවහාරිකයො කූට සාක්ෂිහි[5] කූටවාණිජයො දුශ්ශීල භික්ෂූහු මිථ්‍යාදෘෂ්ටි ගත්තාහු ගර්හිත කළ මාගමිහු පරදාරපරිග්‍රහ කළ පුරුෂයො සොර සැමියන් හා වැටුණාහු සැමියුහුරුස්නට අවඥා කළාහු ශූරන් මුවන් මැරුවාහු එළුවන් මීවුන් මැරුවාහු මස් මැරුවාහු පක්ෂීවධ මනුෂ්‍යවධ කළාහු පර ද්‍රව්‍ය ගත්තාහු මිත්‍රද්‍රෙහිකම් කළාහු සුරා ගොඬයෝ[6] මෘෂාවාදීහි පෙශුන්‍යවාදීහි පරුෂවචනයෙන් වෘද්ධජනයන් සන්තර්ජන කළාහු මවුපියනටද

---

[1] නිරිසත්හු AF [2] පඤ්චවිධබන්ධනA CDEF [3] දුක්ඛAB
[4] රජදරුවොG [5] කූටසාක්ෂිකයෝB [6] සොඬයෝ CDEF

යුක්තයනටද අභ්‍යාඛ්‍යාන කළාහු දහමි වරදවා ගත්තාහු මත්සරයො සිල් නො රක්නා දුර්ජනයො උපද[1] අනෙකවර්ෂ කොටිසහස්‍රයෙහි පසිත්.

එයින් වදාළහ:-

131. "එතෙ පතන්ති නිරයෙ උද්ධපාදා අවංසිරා
ඉසීනං අතිවත්තාරො සඤ්ඤතානං තපස්සිනං"-

යනාදීන් අපිව - අසිපත්‍රවනයෙහි ශස්ත්‍රවර්ෂයෙන්[2] කැඩෙමින් නිරන්තර වැ උත්ථිත ක්ෂුරධාරායෙහි ඇක්මෙමින් දිවන නෙරිසත් අනෙක් සරණක් නො දැක මෘත්‍යුහුගේ මුඛ කුහරයට වඩා භයානක වූ ශක්තිශූල ඇති දිලියෙන අඩ්ගාර කර්ෂුයෙහි[3] ගොස් හෙයි.

එයින් කීහ:-

132. "ධාවඤ්ජවෙන නිශිතක්ෂුරසංස්තරෙෂු
විච්ඡින්නමූර්තිරසිපත්‍රලතාවනෙෂු
කූපෙ පතත්‍යශරණශ්ශිතශූලශක්ති
ප්‍රාසාසිහාස විජිතාන්තක වක්ත්‍රරන්ධ්‍ර"යි.

තීව්‍ර වූ දුස්සහ වූ ආතපයෙන් කකියන ඛින්නදෙහ ඇති නෙරිසත් ඝනනීලදල ඇති වෘක්ෂයන් බලා එයට යෙයි; එහි පත්‍ර ශස්ත්‍රශතපාතයෙන් විභින්නදෙහ ඇති වැ නො යාහී විර කාලයෙහි එහි මැ හඬ හඬා සිටී[4].

එයින් කීහ:-

133. "තීව්‍රාතපක්වථිතදුස්සහඛින්නදෙහො
වෘක්ෂාන්නිරීක්ෂ්‍ය ඝනනීලදලානුපෙති
තත්පත්‍රශස්ත්‍රශතපාත විභින්නමූර්ති-
ස්තත්‍රෛව තිෂ්ඨති විරං විරුතෛකබන්ධුඃ"යි.

---

[1] ඉපද AB [2] වර්ෂයෙන් ABCEF [3] කාර්ෂුයෙහි BCE [4] ගොස් සිටී ACDEF

හාත්පසින් නික්මෙන ගිනිසිළුසියෙහි ගිනිපුපුරු සුවහසින් ගහන අග්නිභූෂණයෙන් විභූෂිත වූ කියත්කටුසෙයින් කර්කශ ශරීර ඇති ස්ත්‍රීන් විසින් ප්‍රෙමාධිකප්‍රණයයෙන් මෙන් කෘපා නැති වැ තර කොට සිපගන්නා ලැබේ.

එයින් කීහ:-

134. "පය්‍යීන්තනිර්ගීතශිඛාශතවිස්ඵුලිඞ්ග
මාලාකුලප්ඵලනමණ්ඩන මණ්ඩිතාභිඃ[1]
ප්‍රෙමොත්තරප්‍රණයනිර්දැයමඞ්ගනාභි-
රාලිඞ්ග්‍යතෙ ක්‍රකවකර්කශවිග්‍රහාභිඃ" යි.

භීෂණවිෂමපර්වතොපම එළුයුගළයන්ගෙ සංඝට්ටනයෙන් සුන් සුන් වැ විසිරගිය ශරීර ඇතියෙ හමනලද මඳසුළඟෙක්හි ස්පර්ශයෙන් මුළුලුව පුන පුනා නොයෙක්වර සුන් කරනු ලැබේ.

එයින් කීහ:-

135. "ශෛලාභභීෂණවිසඞ්කටමෙෂයුග්ම
සඞ්ඝට්ටචූර්ණිතවිශීර්ණසමස්තගාත්‍රඃ
[2]ආපාතවාතලව ශෛත්‍යසමර්පිතාඞ්ග
ස්සඤ්චූර්ණ්‍යතෙ පුනරසො ශතශස්තථෛව" යි.

කර්කශ වූ කගවිසණසිගල්බලුදහසුන් විසින් උත්ත්‍රාසිත වැ එ කූටශාල්මලියට නැඟෙනුයෙ එහි අධොමුඛ වූ ක්‍රකවකණ්ටක සන්දර්භයෙන් කැඩෙනලද උදර ගැලීගිය ගාඩ්ශල්‍ය ඇති වෙ.

එයින් කීහ:-

136. "උත්ත්‍රාසිතශ්ව ඛර ඛඩ්ගිශිවාසහස්‍රෛ-
රාරොහති ද්‍රැතපදං පුනරෙෂ රොද්‍රාමි
තාං කූටශාලුමලිමධොමුඛකණ්ටකොඝ
නිර්භිද්‍යමානවපුරර්පිතගාඩ්ශල්‍යඃ" යි.

---

[1] මණ්ඩනාභිඃ ABC [2] ආපාතමාරුතR

මෘත්‍යහු අතින් ගුළු කාලපාශ බඳු ආශීවිෂයන් විසින් පණ කොට වැලඳගත් ශරීර ඇති වැ ඔහු එහි වෙවුලවෙවුලා සිටියහු කාගිජුහු ලොහොතුඩින් ඇන ඇස් උපුටා කත්.

එයින් කීහ:-

137. "මෘත්‍යොඃ කරාන්තගලිතෛරිව කාලපාශෛ-
රාශීවිෂෛඃ කෘතව්ණෛර්දෘඪසංයතස්‍ය
උත්පාටයන්ති නයනෙ සුචුරතඃ ප්‍රසභ්‍ය
තත්‍ර ස්ථිතස්‍ය වකවායසකඩකශාඩ්‍රාඃ" යි.

හෙ එහි පක්ෂිගණයන්ගෙ වජ්‍රාග්‍රබඳු තුඩින් අභිභවා විදාරණ කරනලද්දෙ ආර්තස්වරයෙන් හඬ හඬා ලොහමය ප්‍රජ්වලිත ඌඩ්වමුඛකණ්ටකයෙන් නිර්භින්න ශරීර ඇති වැ නෂ්ට වෙතසින් අවරොහණය කෙරෙයි.

එයින් කීහ:-

138. "තෙෂාං මුඛෛඃ කුලිශකොටිනිභෛඃ
නිර්දාර්‍යමාණ වපුරෙෂ කෘතාර්තනාදඃ
ලොහොන්මුඛප්‍රචුරපීවරතීක්ෂ්ණසඩකු
නිර්භින්නමූර්තිරවරොහති නෂ්ටචෙතාඃ" යි.

එහි ඇතමි කෙනෙක් එම කණ්ටකයෙන් කැඩෙනලද දෙහ ඇති වැ නො බැස්ස හී ඝොරනාදයෙන් හඬන්නාහු දිලියෙන ලොහොතුඩු ඇති පක්ෂිගණයන් විසින් නික්මුණු අතුණු ඩැහැ ඩැහැ අදනා ලැබෙත්.

එයින් කීහ:-

139. "ආදීප්තශූලශිතශක්ති විභින්නදෙහා-
ස්තත්‍රෛව කෙචිදවරොඩුමශක්නුවන්තඃ
ඝොරං නදන්ති ශිතශස්ත්‍ර මුඛෛර්යොභි-
රාකෘෂ්‍යමාණවීසරදගලිතාන්ත්‍රසූත්‍රාඃ" යි.

ඇතම් කෙනෙක් ආදීප්ත පර්වතශිඛරයෙන් ගැල විෂම තටයෙහි ප්‍රපතිත වෙති; ඇතම් කෙනෙක් කකියන තෙලකටාහ කුක්ෂියැ හෙති; ඇතම් කෙනෙක් දිලියෙන වැලි ඇති විසිරෙන ගිනිපුපුරු ඇති භූමිභාගයෙහි ගොස් වැද සිටිත්.

එයින් කීහ:-

140. "කෙචිත්පතන්ති විෂමෙෂු ගිරෙස්තටෙෂු
කෙචිත්පරීක්ඛවිතතෙලකටාහකුක්ෂෝ
උත්තප්තවාලුකභුවං විසෘතස්ඵුලිඞ්ගා -
මන්‍යෙ විශන්ති පදසඞ්ගමනාප්නුවන්තඃ" යි.

ඇතම් කෙනෙක් "සිමි සිමි" යන අනුකරණ ඇති සියුම් පණුවන් විසින් ජර්ජරීකෘතපූතිකාය ඇත්තාහු සෙල්වෙන්නට ද් නො පොහොසත් වැ කර්මපාශයෙන් බඳනාලද දිවි ඇති වැ සිටිත්.

එයින් කීහ:-

141. "එකෙ පුනස්සිමිසිමායිතසූක්ෂ්මජන්තු
සඞ්ඝාතජර්ජරීතසූනවිපූතිකායාඃ
සන්ධාලමාත්‍රමපි කර්තුමශක් නුවන්තො
ජීවන්ති කර්මමයපාශනිබද්ධජීවාඃ" යි.

මෙසෙ බුදුනුදු විසින් වර්ෂශතයක් වර්ෂසහස්‍රයකුදු කියත් නො ගෙවෙන දුක් ඇති වන බැවින් නරකදුඃඛ භයානක යි.

---

<u>මනුෂ්‍යත්වය දුර්ලභ පරිදි කිසෙයැ යත්?</u>

බුදුහු "මහණෙනි, යම්සෙ පුරුෂයෙක් එකච්ඡිද්‍ර විය දඬුවක් මහාසමුදුයෙහි ප්‍රක්ෂෙප කෙළෙ ද; එ වියදඬුව පූර්

දිශාභාගයෙන් හමන සුළඟ පශ්චිමදිශාභාගයට ගෙන යෙයි; පශ්චිමදිශාභාගයෙන් හමන සුළඟ පූර්වදිශාභාගයට ගෙන යෙයි; උත්තර දිශාභාගයෙන් හමන සුළඟ දක්ෂිණ දිශාභාගයට ගෙන යෙයි; දක්ෂිණ දිශාභාගයෙන් හමන සුළඟ උත්තර දිශාභාගයට ගෙන යෙයි; එහි ඉදින් කාණකච්ඡපයෙක් වර්ෂ ශතයක් ගිය කලෑ එක්යලක් හිස් නඟා ද; කිම හො මහණෙනි, එ කාණකච්ඡපයා හිස වියදඬුසිදට ප්‍රවිෂ්ට හා වන්නෙ[1] හො ?"යි වදාළො. සඟහු "වහන්සෙ, දීර්ඝ කාලාපගමයෙන් යම් දවසක් ප්‍රවිෂ්ට වෙ නම් කිසෙ දැනෙ දැ ?"යි යූහු – "මහණෙනි, එ කාණකච්ඡපයා සංවත්සරශතයෙන් නඟන හිස ප්‍රබලවාතයෙන් උද්ධූතවීවිමාලා ඇති මුහුදුපිට ඇවිදුනා[2] වියදඬුසිදට ප්‍රවිෂ්ට වනු සුලභයැ, මිනිස්පියෙන් ගැල එක්යලක් අපායට ගිය බාලයක්හු මිනිස්පියට එනු දුර්ලභය"යි වදාළො.

142. "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො එකච්ඡිග්ගළං යුගං මහාසමුද්දෙ පක්ඛිපෙය්‍ය; තමෙනං පුරත්ථිමො වාතො පච්ඡිමෙන සංහරෙය්‍ය, පච්ඡිමො වාතො පුරත්ථිමෙන සංහරෙය්‍ය, උත්තරො වාතො දක්ඛිණෙන සංහරෙය්‍ය, දක්ඛිණො වාතො උත්තරෙන සංහරෙය්‍ය තත්‍රස්ස කාණො කච්ඡපො; සො වස්සසතස්ස වස්ස සතස්ස අච්චයෙන සකිං උම්මුජ්ජෙය්‍ය. තං කිම්මඤ්ඤථ භික්ඛවෙ අපි නු සො කාණො කච්ඡපො අමුස්මිං එකච්ඡිග්ගළෙ යුගෙ ගීවං පවෙසෙය්‍යාති ? "යදි නූන භන්තෙ කදාචි කරහචි දීඝස්ස අද්ධුනො අච්චයෙනා"ති. "ඛිප්පතරං ඛො සො භික්ඛවෙකාණො කච්ඡපො අමුස්මිං එකච්ඡිග්ගළෙ යුගෙ ගීවං පවෙසෙය්‍ය, තතො දුල්ලභ තරාහං භික්ඛවෙ, මනුස්සත්තං වදාමි සකිං විනිපාතගතෙන බාලෙන"යි.

හෙ යම් තලෙක්හි වියදඬුසිදට සම්භව වන[3] කණකැස්බා හිස සෙයින් කිසි විධිවශයෙකින් මිනිස්පියක් ලබන්නේ වී නම්

---

[1] වන්නා C [2] ඇවිද්නා AF [3] සම්භවන ABCDEF

අනාථ නීවකුලයෙහි ආතුරවිරූප වැ උපද ක්ෂුත්පිපාසායෙන් පරිපීඩිත වැ ජීවිකා සඳහා ප්‍රාණාතිපාතාදි අකුශලකර්මකොට වැළිදු ගොස් අපායෙහි මැ හෙයි.

එයින් වදාළහ:-

143. "සඛො සො භික්ඛවෙ බාලො සවෙ කදාවි කරහවි දිඝස්ස අද්ධුනො අච්චයෙන මනුස්සත්තං ආගච්ඡති, යානි තානි නීවකුලානි චණ්ඩාලකුලං වා නෙසාදකුලං වා වෙණකුලං වා රථකාරකුලං වා පුක්කුසකුලං වා තථාරූපෙ කුලෙ පච්චාජායති දලිද්දෙ අප්පන්න පානභොජනෙ කසිරවුත්තිකෙ යත්ථ කසිරෙන සාඝච්ඡාදෙ[1] ලබ්ඝති; සො ච හොති දුබ්බණ්ණො දුද්දසිකො ඔකොටිමකො බව්හාබාධො කාණො වා කුණී වා ඛඤ්ජො වා පක්ඛහතො වා න ලාභී අන්නස්ස පානස්ස වත්ථස්ස යානස්ස මාලාගන්ධවිලෙපනස්ස සෙය්‍යාවසථපදීපෙය්‍යස්ස; සො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති; සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති"යි.

මෙසෙයින් මනුෂ්‍යත්වය දුර්ලභයි.

---

සෙසු තැන් පුණ්‍යකර්මයට අස්ථාන පරිදි කිසෙයැ යත්?

---

නරකයෙහි පඤ්චවිබන්ධනකර්ම[2] කරන තැන් පටන් ගෙන මහත් දුක් අනුභව කරන කල ද, තිරිසන්යොන්හි මරණභයින් වෙවුලන කල ද, දැල් කෙමෙන් කරප්ආදීන් ගත් කල ද,

---

[1] සාසච්ඡාදනො ABCDEF [2] පඤ්චවිධබන්ධනකර්ම ACDEF

මහත් භාරයෙහි බැඳ ප්‍රතොදකණ්ටකයෙන් විද පහර දෙන කල ද, ප්‍රෙතවිෂයෙහි-

144. "නියර්‍යීක්ප්‍රෙතමනුෂ්‍යායුඃ පරිච්ඡෙදෙ විද්‍යතෙ
තථා හි කාලො මන්ඩාතා ප්‍රෙතාඃ
කෙවිච්චිරායුෂඃ"

යූ බැවින් අපරිමිතකාලයෙහි "අහො දුක්ඛං අහො දුක්ඛං" යි උරෙහි පැහැර පැහැර කඳුළු විහිද්නා කල්හි ද්, ගඞ්ගා යමුනා අචිරවතී සරභූ මහී යන පඤ්චමහා නදීන්ගෙ[1] දිය එක්වතුරක් වැ ගොස් එහි එක්ප්‍රෙතයක්හු[2] මුඛයට වදනේ වී නම් ගලබිලයට සම්ප්‍රාප්ත නො වනතුරු මැ වඩබානලප්‍රාප්ත සාගරජල සෙයින් කුයින් නැගෙන ගිනින් දැ යන ප්‍රෙතයොනියැ උපන් කල ද, අස්ථිචර්මමාත්‍ර වූ පනස්යොදුන් සැටයොදුන් ශරීර ඇති අනෙක යොජනකුක්ෂි ඇති සූවිමුඛ ඇති ක්ෂුත්පිපාසායෙන් වෙහෙසෙන ප්‍රෙතයොනියැ උපන් කල ද, බහලාන්ඩකාර වූ ක්ෂාරොදක පරිපූර්ණ වූ ශීතනරකයෙහි හී දියෙහි බහා ලූ පිටුපිඩු[3] සෙයින් විරෙන[4] කල ද, පුණ්‍යකර්ම කරන්නට අශක්‍ය යි.

මෙසෙ අපායෙහි එකාන්තදුඃඛතායෙනුද් දුඃඛ බහුලතායෙනුද් දිව්‍යලොකයෙහි එකාන්තසුඛතායෙනුදු පුණ්‍ය කර්මයට අවකාශ සුලභරූප නො වෙ- මිනිස්පියෙහි වූ කල සුඛබහුලතායෙන් සත්පුරුෂොපාශ්‍රයාදි ප්‍රත්‍යයසමවායභූයො භාවයෙන් සුලභ වන බැවින් පුණ්‍යකර්මයට අවකාශ සුලභරූප වෙ.

එහි යම් දුඃඛයෙක් උපන් නම් හෙ ද "දුක්ඛූපනිසා සද්ධා" යූ බැවින් විශෙෂයෙන් පුණ්‍යක්‍රියාවට උපනිඃශ්‍රය වෙ - කිසෙයැ යත්? අයොඝනයෙන් ශස්ත්‍රය[5] නිෂ්පාදනය කරන

---

[1] ගංගාදීන්ගෙDEF [2] එක්ප්‍රෙතයක්හුගේB [3] පිටිB
[4] විසිරෙනE [5] ශස්ත්‍රයාAB

කල්හි හුදෙක් අග්නිතාපය ද හුදෙක් උදකාවගාහය ද ච
ශක්‍රයාගෙ ජෙදන ක්‍රියා සමර්ථතාවට විශෙෂප්‍රත්‍යය නො වෙයි,
තවා පමණින් දියෙහි ගැලූ කල චයට විශෙෂප්‍රත්‍යය වෙ.
එසෙයින් මෑ සත්වසන්තානයාගෙ එකාන්තදුඃඛසමඩ්ගිතා ද
[1]එකාන්තසුඛ සමඩ්ගිතා ද පුණ්‍යකර්මයට විශෙෂප්‍රත්‍යය නොවෙයි,
දුඃඛසන්තාපනය ද එපමණින් සුඛොපබ්‍රූහණය ද ඇති කළැ
ලබ්ධොපනිශ්ශ්‍රය වැ පුණ්‍යක්‍රියා උපද්දි. උපන්නෙ ද මහාද්‍යුතික
වෙයි, මහා විස්වාර වෙයි, ප්‍රතිපක්ෂොජ්ජෙදන සමර්ථ ද වෙ.
එබැවින් මනුෂ්‍යත්වය මෑ පුණ්‍යකර්මයට විශෙෂ ප්‍රත්‍යය යි.

එහිදු මනුෂ්‍ය නාරකිත වුව පුණ්‍යකර්මයට අවකාශ නො ද
ඇති; මනුෂ්‍යප්‍රෙත වුව මනුෂ්‍යතිර්‍යඤ්ඤ වුව නො ද ඇත්.
කිසෙයැ යත්? යම් මනුෂ්‍යස්වභාව ඇති සත්වයෙක් ප්‍රාණාති
පාතාදි අකර්තව්‍යයක් කොට දණ්ඩාහී වූයෙ තත්තදෙශයෙහි
රාජාදින් විසින් හස්තොජ්ජෙදාදි කර්තරණයට ප්‍රාපිත වැ[2]
මහත් දුක් අනුභව කෙරෙයි; මෙ "මනුෂ්‍යනාරකික" නම්.

අනික් මනුෂ්‍යස්වභාව ඇති සත්වයෙක් පූර්වෙහි කෘත
කර්මයෙන් අශන වසන මාත්‍රයනුදු නො ලදින් ක්ෂුත්පිපාභිභූත වැ
දුඃඛබහුල වැ කිසිතැනෙක්හි ප්‍රතිෂ්ඨා නො ලදින් ඇවිද්දි;
මෙ "මනුෂ්‍යප්‍රෙත" නම්.

අනික් මනුෂ්‍යස්වභාව ඇති සත්වයෙක් පරාධීනවෘත්ති වැ
පරයන්ගෙ භාරොද්වහන කරනුයෙ හින්නමය්‍යාදු වැ අනාචාර
යෙහි ප්‍රවෘත්ත වූයෙ මරණභය භීත වැ ගහනනිශ්‍රිත වැ දුඃඛබහුලවැ
ඇවිද්දි මෙ "මනුෂ්‍යතිර්‍යඤ්ඤ"නම්.

---

[1] එකාන්තසුඛසමඩ්ගිතාද *is followed by* සුඛබහුලතාද *in* B

[2] ප්‍රාප්ත වැ BCD

මෙසෙ මිනිස්පියෙහිදු මනුෂ්‍යනාරකිකයැ මනුෂ්‍යප්‍රෙතයැ මනුෂ්‍යතිර්‍යග්ගතයැ යන තුන්දෙනහට පුණ්‍යකර්මයට අවකාශ නැත්[1]. එයට[2] අවකාශ නො වන කලැ කහට වෙයි යත්? මනුෂ්‍යධර්මයෙහි ප්‍රතිෂ්ඨිතයහට වෙ. කිසෙයැ යත්? යමෙක් ත්‍රාපත්‍රපා සම්පන්නවැ කර්මඵල හදහා තමහට හිතාහිත දැන සත්ව කරුණා ඇති වැ සංවෙගබහුල වැ අකුශලකර්මපථ පරිවර්ජන කොට කුශලකර්මපථසමාදාන කොට වැටෙ ද ඔව්හට[3] පුණ්‍ය කර්මයට අවකාශ සුලභ වෙ.

මෙසෙ සෙසු තැන් පුණ්‍යකර්මයට අස්ථානයි.

---

(13). දානතුහිනනිපාතෙනාපි යන තන්හි දානශබ්දයෙන් අනන්තා පරිමෙය සප්තරත්නාදි සර්වගාහොපකරණ පරිත්‍යාග කිහ. මෙ වනාහි පරිකථා වන බැවින් යම්තාක් දානවිභාග ඇද්ද හෙ එක දෙශයෙන් දක්වනු ලැබෙ[4].

දානය දශපාරමිතාවන් කෙරෙහි පළමුවන පාරමිතායැ[5] සතරසඞ්ග්‍රහවස්තූන් කෙරෙහි පළමුවන සඞ්ග්‍රහවස්තුයැ[6] දාන ශීලභාවනා තුන්පුණ්‍යක්‍රියාවස්තූන් කෙරෙහි පළමුවන පුණ්‍ය ක්‍රියාවස්තුයැ හැම මහබෝසතුන් හසළ මාර්ගයැ, හැම බුදුන්ගෙ වංශයි.

දායකයොතුන් දෙනෙක් වෙත් දානදාසයැ දානසහායයැ දානපතිය යි – යමෙක් මධුර දෙය වළඳ අමධුර දෙයක් අන්නට දෙන්නෙ වී නම් හෙ දානදාස නම් වෙයි. යමෙක් මධුර වුව මනාමය අමධුර වුව මනාමය තම තමා වළඳන නියායෙන්

---

[1] නැතිB [2] එසේ එයටG [3] ඔහුහටB [3] ඔහටACEF
[4] දක්වනලැබෙයිCE [5] පාරමිතාවයB [6] වස්තුවBCEF

දෙන්නෙ වී නම් හෙ දානසභාය නම් වෙයි. යමෙක් තෙමෙ යම්තම් දැයකින් යැපී අන්නට[1] මධුර කොට දෙන්නෙ වීනම් හෙ දානපති වෙ. යම් තැනෙක්හි මැ නො වස්නා වලා සෙයින් යම් කෙනක්නට මැ නො දෙනුයෙ "අවර්ෂි" නම් වෙයි. ඇතම් තැනෙක්හි වස්නා වලා සෙයින් ඇතම් කෙනක්නට දෙනුයෙ "ප්‍රදෙශවර්ෂි" නම් වෙයි. හැම තන්හි වස්නා වලා සෙයින් හැමදෙනහට දෙනුයෙ සර්වත්‍රවර්ෂි[2] නම් වෙ.

දන් දෙනුවන් විසින් දානයෙන් පූර්වභාගයෙහි තුෂ්ට වුව මැනැවැ, දෙමින් චිත්තප්‍රසාද කළ මැනැවැ, දී සොම්නස් වුව මැනැවැ, මෙය දානසම්පත් නම්.

එයින් කීහ:-

145. "පුබ්බෙව දානා සුමනො දදං චිත්තං පසාදයං
[4]දත්වා අත්තමනො හොති එසා යඤ්ඤස්ස සම්පදා" යි.

යමෙක් [4]තෙමෙ හෙ දන් දෙ ද අනුන් සමාදන් නො කරවා ද හෙ උපන් උපන් තන්හි භොගසම්පත් ලැබෙයි, පරිවාරසම්පත් නො ලැබෙ - යමෙක් තෙමෙහෙ දන් නො දෙ ද අනුන් සමාදන් කරවා ද හෙ උපන් උපන් තන්හි පරිවාරසම්පත් ලැබෙයි, භොගසම්පත් නො ලැබෙ - යමෙක් තෙමෙහෙ දන් දෙ ද අනුන් සමාදන් කරවා ද හෙ උපන් උපන් තන්හි භොග සම්පත් ලැබෙයි, පරිවාරසම්පතු ද් ලැබෙ - යමෙක් තෙමෙහෙ දන් නො දෙ ද අනුන් සමාදන් නො කරවා ද හෙ උපන් උපන් තන්හි භොග සම්පත් නො ලැබෙයි, පරිවාරසම්පත් නො ද ලැබෙ.

දන් දෙනුයෙ බොහොදෙනහට ප්‍රිය වෙයි; සජ්ජනයන්ගෙ සමාගමය ලැබෙයි; ඔහුගෙ යශස් දශදිශායෙහි පැතිර බඹලොව[3] දක්වා නැගෙයි; ගිහිගෙවැසියන්ගෙ ධර්මයෙන් අනපෙත වෙයි; ශරීරභෙදයෙන් උත්තරයෙහි ස්වර්ගපදප්‍රාප්ත වෙ.

---

[1]අනුන්ටB [1]අන්හටF [2]සර්වත්‍රාභිවර්ෂිABEF [3]දත්වාවත්තB
[4]තෙමේB [4]තෙමෙG [3]බඹලෝAB

වදුළෙ මෑ නො:-

146. "පඤ්චිමෙ භික්ඛවෙ දුනෙ ආනිසංසා කතමෙ පඤ්ච? බහුනො ජනස්ස පියො හොති මනාපො, සප්පුරිසා භජන්ති, කල්‍යාණො කිත්තිසද්දො අබ්භුග්ගච්ඡති, ගිහිධම්මා අනපෙක්ඛො හොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති; ඉමෙ ඛො භික්ඛවෙ පඤ්ච දුනෙ ආනිසංසා" යි.

යමෙක් දන් ආගන්තුකයහට දෙ ද, ගමික‍යහට දෙ ද, ගිලන්හට දෙ ද, දුර්භික්ෂයෙහි දෙ ද, අග්‍රස්‍ය අග්‍රවල පළමු සිල්වතුන් කෙරෙහි පිහිටුවා ද; මෙ කාලදාන නමී වේ.

වදුළෙ මෑ නො:-

147. "පඤ්චිමානි භික්ඛවෙ කාලදානානි. කතමානි පඤ්ච? ආගන්තුකස්ස දානං දෙති, ගමිකස්ස දානං දෙති, ගිලානස්ස දානං දෙති, දුබ්භික්ඛෙ දානං දෙති, යානි තානි නවස්සානි නවඵලානි තානි පඨමං සීලවන්තෙසු පතිට්ඨාපෙති; ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච කාලදානානි" යි.

යමෙක් දන් නො සකස් කොට දෙ ද, දෙයධර්මයෙහිද් දක්ෂිණාහීයන් කෙරෙහිද්, අගෞරවයෙන් දෙ ද, පරහස්තයෙන් දෙවා ද, දමා පියන දැයක් සෙයින් කිසිකලක්හි දෙ ද, ආගාමී ඵලයෙහි ආදර නැති වැ දෙ ද; මෙ අසත්පුරුෂදාන නමී.

වදුළෙ මෑ නො:-

148. "පඤ්චිමානි භික්ඛවෙ අසප්පුරිසදානානි. කතමානි පඤ්ච? අසක්කච්චං දෙති, අවිත්තීකතවා දෙති, අසහත්ථා දෙති,

අපවිද්ධං දෙති, අනාගමනදිට්ඨිකො දෙති; ඉමානි බො භික්ඛවෙ පඤ්ච අසප්පුරිසදානානි" යි.

යමෙක් දන් සකස් කොට දෙ ද, දෙයධර්මයෙහි බජස් ඇති කොට දක්ඛිණාහියන් සොයාගෙන දෙ ද, අනාදිමත් සංසාරයෙහි "මා අත් පා නැති වැ උපන් කල් පමණ නැති, සිය අතින් දුන මැනැවැ" යි සඤඤායෙන් දෙ ද, හවුරුද්දෙන් වළ දෙන සොඩවැල්[1] යෙයින් කිසිකලෙක්හි නොදී නිරන්තරයෙන් දෙ ද, අනාගතභවයෙහි මට උපද්දියි කර්මවල හදහා දෙ ද; මෙ සත්පුරුෂදාන නම්.

වදාළෙ මැ නොඃ-

149. "පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි. කතමානි පඤ්ච? සක්කච්චං දෙති, චිත්තීකතවා දෙති, සහත්ථා දෙති, අනපවිද්ධං දෙති, ආගමනදිට්ඨිකො දෙති; ඉමානි ඛො භික්ඛවෙ පඤ්ච සප්පුරිසදානානි" යි.

යමෙක් ශ්‍රද්ධායෙන් දෙ ද, සත්කාර කොට දෙ ද, කාලයෙන් දෙ ද, මාත්සර්‍යයෙන් අපරිගාහිතචිත්ත වැ දෙ ද, තමහට ද මෙරමහට ද උපකාර නො කොට දෙ ද; ශ්‍රද්ධායෙන් දන් දුන්නෙ යම් යම්[2] තැනෙක්හි ව දානය වල දුන් කළ මහාභොග ද වෙයි, අභිරූප ද වෙයි; සත්කාර කොට දන් දුන්නෙ වසෙයින් මැ මහාභොග ද වෙයි, ඔහුගෙ පුණ්‍යඵල දායකවීකරාදීහු විධෙය ද වෙති; කාලයෙන් දන් දුන්නෙ මහාභොග ද වෙයි, යුක්තප්‍රාප්ත කාලයෙහි සම්පත් අනුභව කරන්නට නිසි වයසැ ඔහට උපදනා අර්‍යයො විපුල වැ උපදිති; මාත්සර්‍යයෙන් අපරිගාහිතචිත්ත වැ දන් දුන්නෙ මහාභොග ද වෙයි, උදාර වූ පඤ්චකාමගුණ පරිභොගයට චිත්තය අවනත වෙයි;

---

[1] සොඩලවැල් CD [2] යම් Once only in ACDE

තමහට ද මෙරමාහට ද උපඝාත නො කොට දන් දුන්නෙ මහාභොග ද වෙයි, ඔහුගෙ සම්පතට ගිනින් දියෙන් රජුන් සොරුන් විසින් භය නො ද වෙයි; මෙයිද් සත්පුරුෂදානයි.

වදාළෙ මැ නො:-

150. "පඤ්චිමානි භික්ඛවෙ සප්පුරිසදානානි. කතමානි පඤ්ච ? සද්ධාය දානං දෙති, සක්කච්චං දානං දෙති, කාලෙන දානං දෙති, අනග්ගහිතචිත්තො දානං දෙති, අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච දානං දෙති; සද්ධාය ඛො පන භික්ඛවෙදානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො, අභිරූපො ච හොති දස්සනීයො පාසාදිකො පරමාය වණ්ණපොක්ඛරතාය සමන්නාගතො; සක්කච්චං ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො, යෙපිස්ස තෙ හොන්ති පුත්තාති වා දාරාති වා දාසාති වා පෙස්සා වා කම්ම කරාති වා තෙපි සුස්සූසන්ති, සොතං ඔදහන්ති, අඤ්ඤාචිත්තං උපට්ඨපෙන්ති; කාලෙන ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො, කාලාගතා චස්ස අත්ථා පවුරා හොන්ති; අනග්ගහිතචිත්තෙන ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො, උළාරෙසු චස්ස පඤ්චසු කාමගුණෙසු භොගාය චිත්තං නමති; අත්තානඤ්ච පරඤ්ච අනුපහච්ච ඛො පන භික්ඛවෙ දානං දත්වා යත්ථ යත්ථ තස්ස දානස්ස විපාකො නිබ්බත්තති, අඩ්ඪො ච හොති මහද්ධනො මහාභොගො, න චස්ස කුතොචි භොගානං උපඝාතො ආගච්ඡති අග්ගිතො වා උදකතො වා රාජතො වා චොරතො වා අප්පියදායාදතො වා; ඉමානි ඛො පන භික්ඛවෙපඤ්ච සප්පුරිසදානානි" යි.

එක්සමයෙක්හි සමන් රජකුමරි පන්සියක් රථපිරිවරින් දෙවිරම් ගොස් පන්සියක් කුමරියන් පිරිවරා බුදුන් කරා වළඹ වැඳ එකත්පස් වැ හිඳ පැන පුවවුසි[1] - "භගවත්හුගෙ ශ්‍රාවකයො දෙදෙනෙක් ශ්‍රද්ධායෙන් සමයහ, ශීලයෙන් සමයහ, ප්‍රඥායෙන් සමයහ. ඔවුන් දෙදෙනා කෙරෙන් එක්කෙනෙක් තමන්[2] ලද දෑයක්[3] අන්නට බෙදා දී වළඳා කෙරෙති; එක් කෙනෙක් නො දී වළඳා කෙරෙති; මෙ දෙයක අදෙයක දෙදෙනා දිව්‍යලොකයෙහි උපන් කලැ විශෙෂ හා ඇති හො ? යූ.

එකලැ බුදුහු අපරිහොග දුෂ්පරිහොග අඤ්ඤානියොජන ශ්‍රද්ධාදෙය විනිපාතන කූටදූෂණයට නොපමුණුවා සාරාණියධම්යෙහි සිට දුන් දෙයකයා දිව්‍ය වූ ආයුෂයෙන් දිව්‍ය වූ වර්ණයෙන් දිව්‍ය වූ සුඛයෙන් දිව්‍ය වූ යසසින් දිව්‍ය වූ ආධිපත්‍යයෙන් සෙසු දෙවියන් අභිභවන ශක්‍රදෙවරාජයා සෙයින් අදෙයකයා අභිභවන පරිදි දක්වන්නට වදාළහ:-

151. "යො සො සුමනෙ දෙයකො සො අඵුං අදෙයකං දෙවභූතො සමානො පඤ්චහි ඨානෙහි අධිගණ්හාති දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන දිබ්බෙන සුඛෙන දිබ්බෙන යසෙන දිබ්බෙන ආධිපතෙය්‍යෙන"යි.

දෙදෙනා මිනිස්පියෙහි උපන් කලැ විශෙෂ හා ඇති හො ?" යූ. එහිදු බුදුහු දෙයකයා මානුෂක ආයුෂයෙන් මානුෂක වර්ණයෙන් මානුෂක සුඛයෙන් මානුෂක යසසින් මානුෂක ආධිපත්‍යයෙන් සෙසු ජනයන් අභිභවන චක්‍රවර්තිහු සෙයින් අදෙයකයා අභිභවන පරිදි දක්වන්නට වදාළහ:-

152. යො සො සුමනෙ දෙයකො සො අඵුං අදෙයකං මනුස්සභූතො සමානො පඤ්චහි ඨානෙහි අධිගණ්හාති මානුසකෙන

---

[1] පුවවුසිත් CFG [2] තමා CDEF [3] දෙයක් CDEF

ආයුනා මානුසකෙන වණ්ණෙන මානුසකෙන සුඛෙන මානුසකෙන යසෙන මානුසකෙන ආධිපතෙය්‍යෙන" යි.

"දෙදෙනා පැවිජි වුව විශෙෂ හා ඇති හො ?" යූ. එහිදු බුදුහු දයකයා බක්කුලමහතෙරුන් සෙයින් අනුන්ගෙ ආරාධනායෙන් චීවරපරිභොග කරන පරිදි, ඛදිරවනමාර්ගයෙහි සිහිල්මහතෙරුන් සෙයින් දයකයන්ගෙ ආරාධනායෙන් පිණ්ඩපාත පරිභොග කරන පරිදි, අට්ඨකනාගර සූත්‍රයෙහි අනඳ මහතෙරුන් සෙයින් දයකයන්ගෙ ආරාධනායෙන් ශයනාසන පරිභොග කරන පරිදි, පිලින්දිවත්ස මහතෙරුන් සෙයින් දයකයන්ගෙ ආරාධනා යෙන් ශ්‍රානප්‍රත්‍යය පරිභොග කරන පරිදි දක්වන්නට වදාළහ:-

153. "යො සො සුමනෙ දයකො සො අමුං අදයකං පබ්බජ්ජිතො සමානො පඤ්චහි ඨානෙහි අධිගණ්හාති, යාවිතොව බහුලං චීවරං පරිභුඤ්ජති අප්පං අයාවිතො, යාවිතොව බහුලං පිණ්ඩපාතං - පෙ - සෙනාසනං, ගිලාන පච්චය භෙසජ්ජපරිකඛාරං පරිභුඤ්ජති අප්පං අයාවිතො" යනාදි.

දෙදෙනා රහත් වුව විශෙෂ හා ඇති හො?" යූ.

එහි වූ කල බුදුහු විශෙෂ නැති පරිදි දක්වන්නට වදාළහ:-

154. "එත්ථ ඛො පනෙසාහං සුමනෙ න කිඤ්චි නානාකරණං වදාමි" යි.

මෙසෙ දානය නිර්වාණප්‍රාප්ත වන තැන් දක්වා විශිෂ්ටඵල දයකයි.

බුදුහු "මහණෙනි, ඉදින් සත්හු මා සෙ මෑ දානයෙහි ඵල දනිත් නම් නොදී නොවළඳති, මසුරුමල ඔවුන් සිත ඇවිළ ගෙන නො ද සිටි. එක ආලොපයකුදු ලද බෙදා දී වළඳ කෙරෙති ඉදින් ගන්නා කෙනෙක් ඇත් නම්" යි වදාළො:-

155. "එවඤ්හි භික්ඛවෙ සත්තා ජානෙය්‍යුං දාන සංවිභාගස්ස විපාකං යථාහං ජානාමි, න අදත්වා භුඤ්ජෙය්‍යුං; න ච තෙසං මච්ඡෙරමලං චිත්තං පරියාදාය තිට්ඨෙය්‍ය, යොපි තෙසං[1] අස්ස චරිමො ආලොපො චරිමං කබළං තතොපි න අසංවිභජිත්වා භුඤ්ජෙය්‍යුං සචෙ තෙසං පටිග්ගාහකා අස්සු" යි.

මනාපදාන දුන්නේ මනාපස්ථාන ලැබෙයි; අග්‍රදාන දුන්නේ අග්‍රස්ථාන ලැබෙයි; වරදාන දුන්නේ වරපදප්‍රාප්ත වෙයි; ශ්‍රේෂ්ඨ දාන දුන්නේ ශ්‍රේෂ්ඨපදප්‍රාප්ත වෙයි; හෙ උපන් උපන් තන්හි දීඝ වූ ආයුෂ හා මහත් යශස් ඇති වෙ.

වදාළෙ මෑ නො උග්‍රදෙවපුත්‍රයහට:-

156. "මනාපදායී වරදායී මනාපං අග්ගස්ස දානා
ලභතෙ පුනග්ගං
වරස්ස දානා වරලාභි හොති සෙට්ඨඤ්ච
සෙට්ඨමුපෙති ඨානං.

යො අග්ගදායී වරදායී සෙට්ඨදායී ච යො නරො
දීඝායු යසවා හොති යත්ථ යත්ථූපපජ්ජති" යි.

දානයෙන් සිදු නො වන ලොකික ලොකොත්තර සම්පත් නම් නැති.

එයින් කිහ[2]:-

157. "දානංහි ලොකෙ සක්කසම්පත්තිං දෙති, මාර සම්පත්තිං දෙති, බ්‍රහ්මසම්පත්තිං දෙති, චක්කවත්තිසම්පත්තිං දෙති, සාවකපාරමී ඤාණං දෙති, පච්චෙකබොධිඤාණං දෙති, අභිසම්බොධිඤාණං දෙති" යි.

අපි ච- දඹදිව්කෙළෙහි වාසුදෙවයෑ බලදෙවයෑ අර්ජුනයෑ ප්‍රද්‍යුම්නයෑ චන්ද්‍රදෙවයෑ සූර්‍යදෙවයෑ යඟදෙවයෑ අග්නිදෙවයෑ ඝතයෑ අඛුරයෑ යන දසබෑරජ්ජුරුවො දිග්විජය

[1] නෙසං ARD [2] වදාළහ PG

කොට තෙසැටදහසක් නුවර ගෙන ද්වාරවතී නුවර වෙසෙමින් දඹදිවි බෙදන කලැ තමන් බුහුනැණියන් අඤ්ජනදෙවීන් සඳහන් නො කොට දසකොටසක් කොට බෙදා ගත්හු. ඔවුන් හැම දෙනහට සඟ "අඩකුර" නම් රජ "මා ලද භාගය බුහුන්හඹුවට[1] දෙමි, මම වෙණෙදමි[2] කොට වැටෙමි, තොප තොපගෙ ජනපදයට ගිය කලැ මාගෙන් පුක්වත් නොගන්නෙය" යි කීය. හැමදෙන මැ මැනැවැයි ගිවිස්සහ. හෙ වණික්කර්මයෙන් ජීවනය කෙරෙ.

එකල්හි වාසුදෙව මහරජ තමා දසකු භාණ්ඩාගාරික ස්ථානයෙහි තබා ඔව්හට[3] කුලදුවක ගෙන්වාගෙන දක්වා දින. හො ඔව්හට[3] ගර්භග්‍රහණ කොට පුතකු ලද. පුතු උපන් කල්හි භාණ්ඩාගාරික මෙළෙ. වාසුදෙව මහරජ පියහට දුන් භොග පුත්හට මැ දිනි. ඔහු වස්ත්‍රාභරණවිභූෂිත වැ රජකුලෙහි විජාමහණ කෙරෙමින් ඇවිදුනා කල්හි "මෙ දස හො? නො දස හො ?" යන කථා උපන්. එකල්හි අඤ්ජනදෙවී ධෙනුපම න්‍යායයෙන් ඔහු නො දස් කළා – හෙ ලජ්ජා ඇති වැ ද්වාරවතී නුවරින් නික්ම රොරුව නම් නුවරට ගොස් තුණාකම් කොට ජීවනය කෙරෙ.

එනුවර අසඝ නම් සිටෙක් යාචකයනට දන් දෙයි. ඒ තුණා දරු දන් දෙන ගෙය පිළිවිස ආවානට පහන් සිතින් අත් නගා පවි[4]. හෙ ඒ පින්කමින් මරුකාන්තාරයෙහි මහත් නුගයෙක දිව්‍යපුත්‍රයක් වැ උපන. ඔහුගෙ හස්තතලයෙහි පසැඟිල්ලෙන් කැමැති කැමැති දැ වැහෙයි; ඔහු අත කල්ප ලතාවක් වැනි මැ යැ, චින්තාමාණික්‍යයක් වැනි මැයි.

---

[1] බින්හඹුවහට F [1] බින්හැඹුවහට A [1] බැවින්හැඹුවට B
[2] වෙළඳමි A [2] වෙණෙදහමි B [3] ඔහට B [4] පැවි EFG

එකල්හි අඩකුර රජු හා බමුණකු හා දෙදෙන දහසක් ගැලින් බඩු ගෙන කාම්බොජ නම් ජනපදයට යන්නාහු සැට යොදුන් මරුභූමියට ගොස් වන්හු. ඔහු දවල් හුණුවැල්ලෙහි නො ඇක්මිය හැක්කෙන් ගැල් යට වැද හිඳ රෑ ගමන් යෙති; කාන්තාර මධ්‍යයට යන්නා හා මොවුන් ගෙන ගිය උදක ක්ෂය වැ ගියෙ. අඩකුර රජ "යම්තැනෙක විලෙක් හොයෙක් සෙවණෙක් ඇත්නම් කාන්තාරයෙහි කෙළවරෙක් පැනෙ නම් බලා තන් කොට එව"යි සතරදිශාවට දූතයන් සතරදෙනකු යවීයැ. ඔහු අසුන් නැඟී ගොස් තුන්දෙනෙක් නොදැක ආහ. එකෙක් දිව්‍යපුත්‍රයා වසන නුඟය දැක ගොස් රජහට කීයැ. රජ පරිජනයන් ගෙන ගොස් නුඟරුප්පයට වැද "මෙවැනි ශාඛාවිටපසම්පන්න සාන්ද්‍රව්ජාය වූ න්‍යග්‍රොධයෙහි වසන්නෙ මහෙශාක්‍යදිව්‍යපුත්‍රයෙක් වෙයි; ඔහු අපට පැනක් දුනහොත් මැනැවැ"යි කීයැ.

දෙවිපිත් රජු හැඳින න්‍යග්‍රොධවිටපයෙහි සිට අත දික් කෙළෙ. ඔහු අත පස්ඇඟිල්ලෙන් ආකාශගඞ්ගාධාරා සෙයින් ස්ඵටිකමණිවර්ණ උදකධාරා නිෂ්ක්‍රාන්ත වියැ. රජ සහපිරිවරින් ස්නානපාන කොට සිට භොජනයක්[1] දුනහොත් මැනැවැ"යි කීයැ. එම අතින් දිව්‍යභොජන වැහිණ. දිව්‍ය වස්ත්‍ර දිව්‍යාභරණ දිව්‍යමාලාගන්ධවිලෙපන වැහිණ. දිව්‍ය වූ ශයනාසන වැහිණ. රජ පරිජනයන් හා සමඟ දිව්‍යභොජන වළඳ දිව්‍යවස්ත්‍ර හැඳ පෙරෙ වැ දිව්‍යාභරණ විභූෂිත වැ දිව්‍ය වූ මාලාගන්ධවිලෙපන ධර වැ දිව්‍යශය්‍යායෙහි හෙව නිදීයැ.

බමුණු රජහට "ඇපි[2]ධන සඳහා කාම්බොජයට කුමට යම්හ? මෙ යක්ෂයා තිරැකොට බැඳගෙන ගෙට යම්හ, මොහු

---

[1] අපට භොජනයක් BG [2] අපි CDEF

අසින් අප කැමැති කෙනෙක් දැ[1] කෙරෙන කැවිනැ"යි කියැ. රජ "එසෙ වන්නා සා මිනිසුන්ගේ සඳහාවෙහි නො" යි පුකිංකාප කෙළෙ - දිවසපුත බමුණාගෙ කවා අසා එහුගෙ ගැල් පන්සියය අනාථිපිණ්ඩ කෙරෙහි ය. ගැල් පන්සියය දැක්විය[2].

එකල්හි අඩුර රජ දිවසපුත්‍රයනට "සියල්ල හිටි, කා අත පස් ඇඟිල්ලෙන් විහෙළාගිනයක් යසින් කැමැති කැමැති දෑ වෙයි; කා ගමුදුවරුන්ගේ සිතුයෙහි ම ය; ගෙවල් දොරවල්වලැයි සිතුයෙහි වැද්දැ[3]; කා කවරහු? කිනම් සිත්කමක් කෙළහු?" යි විචාළේ ය.

එසින් කිහ:-

158. "පාණි මෙ සක්කසෙවණ්ණා පඤ්ඩරෙ
මධුසංචා
කාකාරසා පක්ඛරත්තී මංසූ' පණ්ඩං පුරිසදං

මෙන පාණි කාමදදා මෙන පාණි මධුසංචා
මෙන මෙ බ්‍රහ්මචරියෙන පුත්තං පාණිකි
ඉඤ්ඤකි" යි.

එකල්හි දෙවිපිසි "මහරජ, මම සත්දුවිරජිවී නො ද වෙමි; ගෙවල් දොරවල්වලැයි නො ද වෙමි; දොරුවසුවර අසතා මහසිටි සාවතයනට දන් දෙමි; මේ වසුවර දරිද්‍ර වන් තුණුදරුවන් වැ දන් දෙන සෙය පිළිවසු ආචාරනට පහන්සිසින් අන් නසා පැමි; ඒ පින්කමින් මෙසි රැස්දෙව් වැ උපන්මි; ඒ පින්කමින් මා අන කල්පලෙනවන් සෙසින් සවිසාමදුදු වීය" යි කි.

එසින් කිහ:-

159. "මෙන පාණි කාමදදා මෙන පාණි මධුසංචා
මෙන මෙ බ්‍රහ්මචරියෙන පුත්තං පාණිකි
ඉඤ්ඤකි" යි.

---

[1] කැමැත්තැ ACD [2] දැක්විය BG [3] සිත්කමක් G

එ අසා පැහැද අඩකුරු රජ තමාගෙ නුවරට ගොස් දෙළොස් යොදනක් තන්හි එප්[1] බඳවා දසවා දහසක් දවස් මුළුදඹදිවි වැස්සනට මහදන් දින්.

මෙසෙ දන් දෙන ගෙයක් අත් නගා පැපමණෙකින් මෙතෙක් දෑ වන කලෑ දන් දුන්නන් ලබන දෙවිසැපත් මැ කෙනම් කියනුවහ?

මෙසෙයින් අනෙකානාගංස ඇති දානය දෙනුවහු සිල්වත්නට මැ දුන ඵල මහත් වෙ. කිසෙයැ යත්? ගවරවළ හො ඔළෙහි[2] හො යම් පණුකෙනෙක් ඇද්ද ඔහු මෙයින් යපෙත්වයි යමෙක් බඳුන් වළන්[3] දෙව දිය පියෙ වී නම් එහි පවා පින් වෙයි, මිනිස්නට දුන් දන්හි මැ කියයුතු කවර? එතෙකුදු වුව සිල්වත්නට දුන් දන්හි ඵල මහත් වෙයි; දුශ්ශීලයනට දුන් දන්හි ඵල එසෙ වන්නෙ නො වෙයි.

එයින් වදාළහ වත්සගොත්‍ර නම් පරිව්‍රාජකයහට:-

160. "යෙපි තෙ වන්දනිකාය වා ඔළිගල්ලෙ වා පාණා තත්‍රපි යො ඵාළිධොවනං වා සරාවධොවනං වා ජඬ්ඩෙති යෙ තත්ථ පාණා තෙනෙන යාපෙන්තුති; තතො නිදානම්පහං වච්ඡ පුඤ්ඤස්ස ආගමං[4] වදාමි. කො පන වාදො මනුස්සභූතෙ? අපි වාහං වච්ඡ සීල වතො දින්නං මහප්ඵලං වදාමි, නො තථා දුස්සීලෙ"යි.

<u>සිල්වත්නට දුන් දන්හි ඵල මහත් වන පරිදි කිසෙයැ යත්?</u>

බුදුන් තව්තිසා දෙව්නුවර දෙව්පිරිස් පිරිවරා විජම් දෙසන්නට වැඩහුන් කල්හි ඉන්ද්‍රක නම් දිව්‍ය පුත්‍රයෙක් අවුද් බුදුන් වැඳ

---

[1] ලිප්FG [2] මොළෙහි BDG [2] මොහොළෙහි ACEF
[3] වළදුCD [3] වළදුන්A [4] ආගමන ABC

දකුණත්පස් වැ හින. අඩකුර නම් දිව්‍යපුත්‍රයෙක් වමත්පස් වැ හින් – ඔවුන් දෙදෙනා කෙරෙහි අඩකුර මහෙශාක්‍ය දෙවියන් එත් එත් ඔවුනට අවසර දෙමින් දෙලොස්යොජනක් තැන් ගිය කලැ හිඳිනා අවකාශයක් ලද; ඉන්ද්‍රක හුනස්නෙහි මැහුන්නෙයි. බුදුහු එ දෙදෙනා බලා සිල්වත්නට දුන් දනැ එල මහත් පරිදි දක්වනු සඳහා "අඩකුරය, තො දෙලොස්යොජනක් තැන එප්[1] බඳවා දසවාදහසක් දවස් මුළුදඹදිවි සංක්ෂොභ[2] කොට මහදන් දුන්නෙහි; දැන් මාගෙ සමාගමයට පැමිණ දෙලොස් යොජනක් තැන් කුමට බැස ගියෙහි? මොබ එ මා වැළැතට" යයි වදාළො:–

161. "මහාදානං තයා දින්නං අඩකුර දීඝමන්තරෙ
සුවිදූරෙ නිසින්නොසි ආගච්ඡ මම සන්තිකං" යි.

එකල්හි අඩිකුර හුනස්නෙන් නැඟී බුදුන් වැඳ මුදුනෙහි ඇඳිලි බැඳ "වහන්සෙ, මම දඹදිවිතෙළෙහි අඩිකුර නම් රජක් වැ දෙලොස්යොජනක් තන්හි එප්[1] බඳවා දසවාදහසක් දවස් මුළු දඹදිවි වැස්සනට මහදන් දෙන්නෙයිමි[3] මාගෙ දන් ගන්නට සිල්වත් එක්කෙනකුනුද් නො ලද්මි; හැම දුග්ගිලයෝයැ දන් ගත්තාහු එතෙකුද් වත් එ දන් මාස්වර්ගයෙහි උපදවත්[4] ඉන්ද්‍රකයා සෙ මහෙශාක්‍ය නොකටහිණ; ඉන්ද්‍රක වූ කලැ සිල්වත් කෙනක්නට මඳදානයක් දී දෙව්පිරිස් මැද තරුපිරිවරන ලද පුන්සඳක් සෙයින් දිලියෙයි" කීය.

එයින් කීහ:–

162. "චොදිතො භාවිතත්තෙන අඩකුරො එතදබ්‍රැවි
කිං මය්හං තෙන දානෙන දක්ඛිණෙය්‍යෙන
සුඤ්ඤකං
අයං සො ඉන්දකො යක්ඛො දත්වා දානං පරිත්තකං
අතිරොචති අම්හෙහි චන්දො තාරාගණෙ යථා" යි

---

[1] ලිප්FG [2] ක්ෂොභා ABCEF [3] දුන්නෙයිමිD [4] උපදවමින්CEFG

එකල්හි බුදුහු "ඉන්ද්‍රකය, තා හා සම වැ හුන් අඩිකුර දෙළොස්යොජනක් තැන් බැස ගියෙ; තෙ හුනස්නෙහි මැ දිලිහි දිලිහි[1] හුන්නෙහි; කවර නමී පින්කමක් කළෙහි[2]?" වදාළා. එසඳ ඉන්ද්‍රක හුනස්නෙන් නැඟී බුදුන් වැඳ මුදුනෙහි ඇඳිලි බැඳ "වහන්ස, මම පූවරණමයෙහි දුගීතපුරුෂයක් වැ භික්ෂා සඳහා එක් දොරෙක සිටියෙමි මට අළු බත්කණෙස්සක් භගවත්හුගෙ සස්නෙහි අනුරුද්ධමහතෙරුන් වදාරට සිහා වැඩියවුන් දැක ඔවුනට දෙවීමි; මෙසෙ එක් සිල්වත් කෙනෙක්නට එක් දවසක් දුන් එක් බත්කණෙස්සෙක්හි වළයෙන් ඇඟීපද ප්‍රාප්ත වැ හැම දෙවියන් විසින් අනභිභවනීය වීමි; නියරු තෙතැ බොහෝ බිජු වපුළ ද වල විපුල නොවෙයි; ගොවිහට පරිතොෂ නො ද වෙයි; එසෙයින් මැ දුශ්ශීලයනට බොහෝ දන් දුන ද වල විපුල නො වෙයි, දායකයහට පරිතොෂ නෝ දැ වෙයි; යම්සෙ සරු තෙතෙතැ මඳබිජයකුදු වපුළ වල විපුල වෙයි; එසෙයින් මැ සිල්වත්නට මඳ දැයකුදු දුන වල මහත් වෙයි" යෙමින් කිය:-

163. "උජ්ඣගලෙ යථා ඛෙත්තෙ බීජං බහුකම්පි රොපිතං
න ඵලං විපුලං හොති නපි තොසෙති කස්සකං.
තථෙව දානං බහුකං[3] දුස්සීලෙසු පතිට්ඨිතං
න ඵලං විපුලං හොති නපි තොසෙති දායකෙ.
යථාපි භද්දකෙඛෙත්තෙ බීජං අප්පම්පි රොපිතං
සම්මා ධාරං වස්සන්තෙ[4] ඵලං තොසෙති කස්සකෙ.
තථෙව සීලවන්තෙසු ගුණවන්තෙසු තාදිසු
අප්පකම්පි කතං කාරං පූඤ්ඤං හොති මහප්ඵලං" යි

---

[1] දිලිදිලිB [2] තෙළෙහොB [3] බහුලංAD
[4] පවෙච්ඡන්තෙBG

ඉන්ද්‍රකයාගෙ බස් අසා බුදුහු "අඩිකුරය, තො සම්ප්‍රාප්ත යාචකයනට දන් දුන්නා මිස සිල්වත් කෙනකුන් නිශ්චය කොට ගෙන දන් නො දුන්නෙහි; එයින් තා දෙළොස් යොජනක් තන්හි ලිප් බඳවා දසවා දහසක් දවස් මුළුදඹදිව් වැස්සනට දුන් දන් ඉන්ද්‍රකයා දුන් බත්කෙනෙස්ස හා සම නො වියහිණ; දැන එල වින්දැටියවුන් විසින් සිල්වතුන් සොයාගෙන දන් දිය යුත්තේයයි:-

164. "විවෙය්‍ය දානං සුතප්පසත්ථං යෙ දක්ඛිණෙය්‍යා
ඉධ ජීවලොකෙ
එතෙසු දින්නානි මහප්ඵලානි බීජානි වුත්තානි
යථා සුඛෙත්තෙ"

යනාදි ක්‍රමයෙන් ධම් දෙසූහු.

මෙසෙයින් සිල්වත්නට දුන් දන්හි එලමහත් වන පරිදි වෙලාමසූත්‍රයෙහි වදාළ නියායෙනුද් දතයුතු වෙ.

කිසෙයැ යත්?

එක් කලක් අප මහසත් බරණැස් රජහුගෙ[1] වෙලාම නම් පුරොහිතයෙක් වී. එබමුණු තරුණ අවස්ථායෙහි මැ දඹදිව සුවාසූ දහසක් නුවර සුවාසූදහසක් රජකුමරුවන් සර්වශිල්පයෙහි නිෂ්පත්තියට පැමිණ වූ හෙයින් ඔවුන් හැමදෙනහට එකාචාර්‍ය්‍ය වී එ රජකුමරහු තමන් තමන්ගෙ රාජ්‍යයෙහි ප්‍රතිෂ්ඨිත වැ හවුරුදු පතා බරණැස් මහරජු කරා උපස්ථානයට එළඹ රජු දැක වෙලාම බ්‍රාහ්මණයා කරා ගොස් "ආචාර්‍ය්‍යය, ඇපි රජයෙහි පිහිටියම්හ; කැමැති යම් දැයක් අපට කියන්නෙය" යි නිමන්ත්‍රණය කොට තමන් තමන්ගෙ නුවර යෙත්.

එක් දවසක් මහසත් ශිරඃස්නාන කොට තමාගෙ අන්තො නිවෙසනයෙහි සත්තරත්න පරිපූර්ණ වූ ගර්භයන්ගෙ ද්වාර විවර කරවා සත්වන කුලපරම්පරායෙහි පටන්ගෙන සඤ්චිත ධනරාශිය

---

[1] මහරජහුගෙ BG

දැක ආයව්‍යය[1] චින්තා කොට "මා සකල ජම්බුද්වීපය ක්ෂොභ කොට දන් දුන මැනැවැ" යි රජහට සැළකොට ගඩ්ගාතීරයෙහි දොළොස් යොජනක් තන්හි එප් බඳවා තන්හි තන්හි ඝෘතගුඩමධු ශර්කරා තෛලතිලතණ්ඩුලාදි තබනු සඳහා මහත් කොෂ්ඨාගාර පිහිටුවා "මෙතෙක් මෙතෙක් තන්හි සිට මෙතෙක් මෙතෙක් දෙනා සංවිධාන කරන්නෙ යැ, මිනිස්නට වුවමනා යම්දැයක් ඇත් නම් එයින් එකකුදු නැත මට කියන්නෙය" යි පරිජනයනට කම්සන් එව "අසුවල් දවස් පටන් කොට වෙලාමබ්‍රාහ්මණයාගෙ දන් ගන්නෙය" යි නුවර බෙර හසුරුවා දන් දෙන දවස් දහස්වටනා වස්ත්‍රයක් හැඳ පන්සියක් වටනා වස්ත්‍රයක් එකස් කොට බහාලා සර්වාභරණවිභූෂිතවැ දන් විමසනු සඳහා ස්ඵටිකමණිවර්ණ උදකයෙන් ස්වර්ණ ගෘඩ්ගාරයක්[2] පුරා ගෙන "මෙ ලොකයෙහි මෙ දන් පිළි ගන්නට නිසි දක්ෂිණිය පුඟුලො ඇත්නම් මෙ උදකය නික්ම ගොස් පොළොව ගනිවයි; ඉදින් නැත්නම් තුබූ සේ මැ තිබෙව" යි[3] සත්‍යක්‍රියා කොට භෘඩ්ගාරය අධොමුඛ කෙළෙ. දිය ඩබරායෙන් ගත් දිය සෙයින් නො නික්මැ සිටියෙය. මහසත් "දඹදිව ශූන්‍යයැ, දක්ෂිණා පිළිගන්නට නිසි එකෙකුද් නැතැ" යි විප්‍රතිසාර නො කොට දායකයා විසින් දක්ෂිණා විශුද්ධ වන්නෙ වී නම් උදකය නිර්ගත වෙව" යි සිතියැ. ස්ඵටිකමණිවර්ණ්ණියක් සෙයින් උදකධාරා නික්ම ගොස් පොළොව ගත. දැන් කලි දන් දුන මැනැවැයි දනගට[4] පැමිණ දානසම්භාර බලා හඹුවේලෙහි හඹු දෙවයි; කන දැ වේලෙහි කනදැ දෙවයි; බත්වේලෙහි බත් දෙවයි. එදනගැ "මෙනම් දැයෙක් ඇති මෙනම් දැයෙක් නැති" යනු නො වී.

මෙ නියායෙන් දවස දවස දන් දෙනුයෙ මෙදන් මෙ පමණෙකින් නො නිම වුව මැනැවැයි රක්තස්වර්ණ හරවාගෙන ස්වර්ණපාත්‍රයක් කරවා සුවාසූ දහසක් රජනට දී යවී. දී යවනුයෙ

---

[1] අයවැය AF [2] භෘඩ්කාරයක් CEF [2] හිඩ්කාරයක් D
[3] තිබියෙවයි ABCD [4] දන්ගෙට AEF

"මෙබඳු පාත්‍රයෙන් එකෙකි රජුන් එකෙකි රන්පා පුරා රිදී දෙන්නෙයැ, එකෙකි රිදීපා පුරා රන් දෙන්නෙයැ, එකෙකි කසුන්පා පුරා සත්රුවන් දෙන්නෙයැ, එකෙකි ඇතුන් සදා දෙන්නෙයැ, එකෙකි අසුන් සදා දෙන්නෙයැ, එකෙකි රථ සදා දෙන්නෙයැ, එකෙකි කිරිදෙනුන් සදා දෙන්නෙයැ, එකෙකි ස්ත්‍රීන් සදා දෙන්නෙයැ, එකෙකි පර්‍යාඩක දෙන්නෙයැ, එකෙකි වස්ත්‍රකොටි දෙන්නෙය" යි යවී.

එකල්හි සුවාසූ දහසක් රජදරුවො "බොහොකලෙකින් ආචාර්‍ය්‍ය අපට අනුග්‍රහ කෙළෙය" යි සතුටු වැ සුවාසූදහසක් රන්පා පුරා රිදී දුන්හ, දෙන්නාහු රිදීකැට රිදීපලු රිදීමසු එවැ රිදීසුන්නෙන් අතුරු හැස්වූහ; එසෙයින් මැ සුවාසූදහසක් රිදීපා පුරා රන් දුන්හ; සුවාසූදහසක් කසුන්පා පුරා සත්රුවන් දුන්හ; ස්වර්ණාලඞ්කාරාදීන් අලඞ්කෘත සුවාසූදහසක් ඇතුන් දුන්හ; එසෙමැ සුවාසූදහසක් අසුන් දුන්හ; සිංහවර්මාදීන් පරිෂ්කෘත සර්වරත්නමය සුවාසූදහසක් රථ දුන්හ; සුවාසූදහසක් කිරිදෙනුන් දුන්හ; කිරිදෝනට රිදීමුවා පාත්‍ර දුන්හ; දෙනුන් හඟැ රන්කොසු කම් කළහ; ග්‍රීවායෙහි සමන්මල්දම් පැළැඳැවූහ; සතරපයැ මණි නූපුර පැළැඳැවූහ; පිට වරදුහුල් බහාලූහ; කණ්ඩයෙහි ස්වර්ණ ඝණ්ටා බැඳැවූහු; නවයොවනවිලාසයෙන් දිලියෙන සර්වාභරණ විභූෂිත සුවාසූදහසක් කන්‍යාවන් දුන්හ; විසුතුරු ආස්තරණ අතුළ සුවාසූදහසක් පර්‍යාඩක දුන්හ; ක්ෂෝමකොශෙ-යාදිවස්ත්‍රයෙන් පරිපූර්ණ සුවාසූදහසක් වස්ත්‍රකොටි දුන්හ.

වෙලාමබ්‍රාහ්මණයා දන් දෙත් දෙත් සත්හවුරුදු සත් මසෙක් අතික්‍රාන්ත වියැ. එකල්හි මහසත් "මුළුදඹදිව් වැස්සනට රුවන් බෙදා දුන මැනැවැ" යි මහත් ප්‍රදෙශයෙක්හි දානසම්භාර

සැදවී. එහි එක්කිරියක් පමණ තන්හි සතරපාත්‍රයෙක් තිබියෙයි; පය මුහුට නවරියනැ, පා මුවවිට දක්වා අටරියනැ, අසුන් සදෙනකු යුත් රථයක් පා මුවවිට වටා ඇවිද්ද හැක්කැ මහයත් ප්‍රතිග්‍රාහකයන් වහිහ වහිහ කොට සිටුවා පළමුපාත්‍රයෙහි ප්‍රක්ෂිප්ත රූවන් දී පැසුට සඬි සඬිය ගළවා පාත්‍ර දින් – මෙසෙ සුවාසූ දහසක් රන්පා පුරා රිදී දන් දින; සුවාසූදහසක් රිදිපා පුරා රන් දන් දින; සුවාසූදහසක් කසුන්පා පුරා සත්රූවන් දන් දින; රත්නාභරණයෙන් විභූෂිත සුවාසූදහසක් ඇතුන් දින; රත්නාභරණ විභූෂිත සුවාසූදහසක් අසුන් දින; රත්නාලඞ්කාරයෙන් දිලියෙන සුවාසූ දහසක් රථ දින; සුවාසූදහසක් කිරිදෙනුන් දින; සුවාසූ දහසක් වරාඞ්ගනාවන් දින; සුවාසූදහසක් පයස්විනී දින; සුවාසූ දහසක් වස්ත්‍රකෝටි දින; මහගඟවතුරක් සෙයින් දානුද් දින්.

එ දනගැ[1] ප්‍රතිග්‍රාහකයන් සමහරහු මස්වලු මෙහෙ නිමවති; සමහරහු නිය කපති; සමහරහු නිය මට කෙරෙති; සමහරහු හිස නහනු ඔවති; සමහරහු පණා ගාති; සමහරහු සුනු ගල්වති; සමහරහු වෙර උළති; සමහරහු තෙල් ගල්වති; සමහරහු ගඳමල් පළඳුවති; සමහරහු වස්ත්‍රාභරණයෙන් සදති; සමහරහු අන්නපානයෙන් සන්තර්පා[2] කෙරෙති; සමහරහු ළදරූවන් නහවා ගඳින් මලින් සද කුමාරාභරණයෙන් විභූෂිත කොට මවුපියන් ඇකයෙහි ඇර හිඳුවති; ඔහු "මොහු අප දරුවහ හෝ? නො දරුවහ හෝ?"යි ඇති වැ බලත්.

මෙසෙ වෙළාම බ්‍රාහ්මණයා ලොකික මහාජනයනට සත් හවුරුදු සත්මස් සත්දවසක් දවස් මෙපමණ හිරණ්‍යසූවී පරිත්‍යාග කරනුවහු විසින් දුන් දන් තෙසරණ පිහිටි එක් පුතුලක්හට දුන් දන්හි සොළොස් වන කලාව අගනෙ නො වෙ; තෙසරණ පිහිටියන් එසියක් දෙනහට දුන් දන් සරණසිලැ පිහිටි එක් පුතුලක්හට දුන් දන් හා සම නො වෙයි; සරණසිලැ පිහිටියන්

---

[1] දනගැහි B [2] සන්තර්පණය A

එසියක් දෙනහට දුන් දන් සොවාන් එක් පුඟුලක්හට දුන් දන් හා සම නො වෙයි; සොවාන් එසියක් දෙනහට දුන් දන් සෙදගැමි එක් පුඟුලක්හට; සෙදගැමියන් එසියක් දෙනහට දුන් දන් අනගැමි එක් පුඟුලක්හට; අනගැමියන්[1] එසියක් දෙනහට දුන් දන් රහත් එක් පුඟුලක්හට; රහතන් එසියක් දෙනහට දුන් දන් එක් පසෙබුදුකෙනක්නට දුන් දන් හා සම නො වෙයි; පසෙ බුදුන් එසියක් දෙනහට දුන් දන් එක් සම්‍යක් සම්බුද්ධකෙනක් නට දුන් දන්හි සොළොස් වන කලාභාගය හා සම නො වෙ.

ඉදින් දඹදිවිතලය හෙරිතලයක් සෙයින් සම කොට කෙළවර පටන් ගෙන පලඟ[2] අතොට ආර්‍යපුද්ගලයන් එහි වඩා හිඳුවූහු ද; එහි සොවානුන්ගෙ දඟපඩික්තියෙක් වී ද, සෙදගැමියන්ගෙ පස්පඩික්තියෙක් වී ද, අනගැමියන්ගෙ අඩුතුන් පඩික්තියෙක් වී ද, රහතන්ගෙ අඩුදෙපඩික්තියෙක් වී ද, පසෙ බුදුන්ගෙ එක් පඩික්තියෙක් වී ද, සම්‍යක්සම්බුද්ධයො හුදකලාහු ද; මෙතෙක් දෙනහට දුන් දනට වඩා බුදුනට දුන් දන මැ මහාඵලයි. එයට වඩා බුදුපාමොක් මහසඟනට දුන් දන් මහාඵල යි. එයට වඩා දගැබි මහබො ඇති බණ පවත්නා අවසෙක සතරදෙසෙන් ආ සඟුන් පා දෙව කෙයි ගෙන අගුළු හැර වැද ලග්නට නිසි සාධිෂික සෙනස්නක් කැරවූයෙහි ඵල මහතැ. එයට වඩා තුනුරුවන්හි පහන්සිතින් සරණගියෙහි ඵල මහතැ. එයට වඩා මෙ කී සෙයින් සරණ පිහිටා පන්සිල් සමාදන් වූයෙහි ඵල මහතැ. එයට වඩා කිරිසිඳක්[3] දෝනා පමණ කලෙක්හිදු හැම සතුන් කෙරෙහි මෛත්‍රී පැවැත්වූයෙහි ඵල මහතැ. මෙ හැම පින්කමට වඩා අසුරුසනෙක්හිදු තුන්ලකුණු මෙනෙහි කෙළෙහි ඵල මහත. මෙ මනස්කාරය පුද්ගලාධිමුක්ති තුබූ පරිද්දෙන්

---

[1] අනාගැමියන් AF [2] පලක් BG [3] කිරිසිඳෙක්හි ACDEF

තුන්බොධියෙන් එක්බොධියකට පමුණුවා මිස නො නවත්නා බැවින් හැමට අග්‍ර වෙ.

මෙසෙ වෙලාමසූත්‍රයෙහි වදාළ නියායෙන් දානාදියැ විභාග දතයුතු.

වදාළෙ මැ නො බුදුන් විසින් අනෙපිඩුමහසිටුහට:-

165. "භූතපුබ්බං ගහපති, වෙලාමො නාම බ්‍රාහ්මණො අහොසි; සො එවරූපං දානං අදාසි මහාදානං" යනාදි විසින්.

<u>දානඵලවිභාග</u> දක්ෂිණාවිභඞ්ග සූත්‍රයෙහි වදාළ නියායෙන් දතයුතු.

කිසෙයැ යත්?

යමෙක් තිරිසන්ගතියැ බඵ කුකුළු බළල් හූරු ආදීන් කෙරෙහි එක්සතක්හුගෙ ගුණ හො උපකාර හො නො සලකා කරුණායෙන් ඔහු වළඳන පමණ අහරක් දින් ද; එපින්කැමින් සියක් ජන්මයෙහි ආයුෂ ඇති වෙයි, යහපත් වෙයි, සුවපත් වෙයි, බල ඇති වෙයි, නුවණැති වෙයි - මෙසෙයින් එ දානය ඔහට සියක් අත්බැවැ පන්සියයක් අනුසස් දෙයි, පිරිතැස්ලි නැති කෙරෙ.

වදාළෙ මැ නො:-

166. තිරච්ඡානගතෙ දානං දත්වා සතගුණා දක්ඛිණා පාටිකංඛි තබ්බා" සි.

මෙසෙයින්[1] මැ දුශ්ශීල මිනිසක්හට දුන් දන් දහසක් අත්බැවැ පන්දහසක් අනුසස් දෙයි; සිල්වත් මිනිසක්හට දුන් දන් ලක්ෂයක් අත්බැවැ පස්ලක්ෂයක් අනුසස් දෙයි; සස්නෙන් පිටත් ධ්‍යානලාභියක්හට දුන් දන් කෙළසුවහසක් අත්බැවැ

---

[1] එසෙයින්BC

පස්කෙළසුවහසක් අනුසස් දෙයි; තෙහරණ පිහිටි උපාසකයක්හට දුන් දන්හි ඵල අසඞ්ඛ්‍යය වෙයි අප්‍රමෙය වෙ. පන්සිල් රක්නා සරණ ගිය උපාසකයක්හට දුන් දන්හි ඵල එයට වඩා අසඞ්ඛ්‍යය වෙයි අප්‍රමෙය වෙ. එසෙයින් ම දසසිල් රක්නා උපාසකයක්හට දුන් දන්හි ඵල එයට වඩා අසඞ්ඛ්‍යය වෙයි අප්‍රමෙය වෙ. පුහුදුන් හෙරණපැවිදි කෙනක්නට දුන් දන්හි ඵල එයට වඩා අසඞ්ඛ්‍යය වෙයි අප්‍රමෙය වෙ. උපසම්පන්න පැවිදිකෙනක්නට දුන් දන්හි ඵල එයට වඩා අසඞ්ඛ්‍යය වෙ. අප්‍රමෙය වෙ. උපසම්පන්න වෘත්තසම්පන්න[1] පැවිදි කෙනක්නට, විදර්ශක පැවිදි කෙනක්නට, ආරබ්ධ විදර්ශක පැවිදි කෙනක්නට දුන් දන්හි ඵල එයින් එයට වඩා අසඞ්ඛ්‍යය වෙ. අප්‍රමෙය වෙ. සොවාන් මාර්ග ප්‍රාප්ත පැවිදි කෙනක්නට, එසෙයින් ම ඵලප්‍රාප්ත, සෙදගැමි මාර්ගප්‍රාප්ත, ඵලප්‍රාප්ත, අනගැමි මාර්ගප්‍රාප්ත, ඵලප්‍රාප්ත, අර්හත්මාර්ග ප්‍රාප්ත, ඵලප්‍රාප්ත පැවිදි කෙනක්නට දුන් දන්හි ඵල එයින් එයට වඩා උත්තරීතර වූ අසඞ්ඛ්‍යය වෙ. අප්‍රමෙය වෙ. එක් පසෙ බුදු කෙනකුන්ට දුන් දන්හි ඵල එයට වඩා අසඞ්ඛ්‍යය වෙ. අප්‍රමෙය වෙ. එක් සම්‍යක්සම්බුදු කෙනක්නට දුන් දන්හි ඵල එයට වඩා අසඞ්ඛ්‍යය වෙ. අප්‍රමෙය වෙ.

බුදුහු දක්ෂිණීයන් කෙරෙහි මහාඵලප්‍රාප්තයහ: බුදුනට වැඩි දක්ෂිණීය පුග්ගලෝ නම් නැත්- යම්සෙ කළවිටිමඩුල්ලෙක්හි[2] පසට වඩා යොදුනක් පමණ තන්හි පස් අනන්තාපරිමාණ වෙ ද, යොදුනක් පමණ තන්හි පසට වඩා සියක්යොදුන් පමණ තන්හි, දහසක් යොදුන් පමණ තන්හි, සුවහසක් යොදුන් පමණ තන්හි පස් අනන්තාපරිමාණ වෙ ද, එසෙයින් ම තෙසරණ පිහිටියන් කෙරෙහි පටන් ගෙන බුදුන් දක්වා සිල්වත් ගුණවත්නට දුන් දන්හි ඵල එයින් එයට වඩා උත්තරීතර වූ අසඞ්ඛ්‍යය වෙ, අප්‍රමෙය වෙ.

---

[1] වෘත්තසම්පන්න B [2] කළවිටිමඩලක් පමණ තන්හි BG

මහහොය දියට මහගඟ දිය සෙයින් මහගඟ දියට මහමුහුදු දිය සෙයින් එයින් වයට අධිකතර වූ අසඞ්ඛ්‍යය වෙ මයැ. අප්‍රමෙය වෙ මැ යි. මෙ හැම දැනයට[1] වඩා බුදුපාමොක් සඟනට දුන් දන්හි ඵල මහත් වෙ. කිසෙයැ යත්?

හෙ එක්පසෙක්හි පිරිමිනිසතුන් වඩා හිඳුවා එක් පසෙක්හි[2] මාගමියතුන් වඩා හිඳුවා මධ්‍යයෙහි බුදුන් වඩා හිඳුවා දෙන දනි.

බුදුන් පිරිනිවිකලැ හා බුදුපාමොක් උභතොසඞ්ඝයහට දන් දෙන්නට ශක්‍ය ද යත්? ශක්‍යයි. කිසෙයැ යත්? උභතොසඞ්ඝයා මධ්‍යයෙහි බුදුනට අසුන් පන්වා ව අස්නට යටා තුක පිළිමසක් වඩා බුදුන් පෙරට ආධාරයක් තබා දක්ෂිණොදක පවත් ගෙන හැම දෑ පළමු බුදුනට දී උභතොසඞ්ඝයහට දිය යුතු මෙතෙකින් බුදුපාමොක්සඟනට දන් දුන්නා වෙ.

බුදුනට දුන් දෑ කුමක් කටයුත්තෙයැ යත්? බුදුන් පිරිමසන[3] වත්සපත් පැවිදිකෙනක්නට හා පියන් අයත් දරුවන් ගැනි වන බැවින් සඟනට හා දියයුතු.

පොද්ගලික දැනයට වඩා සඞ්ඝගතදක්ෂිණායෙහි ඵල මහත් වෙ.

කිසෙයැ යත්?

යමෙක් එක් පැවිදිකෙනක්නට ද සතුන් උදෙසා "සඟදෙමි" යි දුන්නෙ වී නම් ඔහුගෙ දක්ෂිණ සඞ්ඝගත වෙ. යමෙක් "සඞ්ඝගත දක්ෂිණ දෙමි" යි දෙයධර්‍මය පිළිගෙළ[4] කොට තබා වෙහෙරට ගොස් "සඟින් එක්කෙනකුන් දෙන්නෙය" යි කී ද, හෙ සතුන් උදෙසා දුන් හෙරණපැවිදිකෙනකුන් ලදින් "හෙරණ පැවිදි කෙනෙක මා ලද්දහ" යි දෙමිනස් වී නම් ඔහුගෙ

---

[1] දනටBG [2] එකත්පසෙක්හිABCDEF [3] පිරිපස්නාA [4] පිළිවෙළBCG

දක්ෂිණ සඤ්ඤගත නො වෙ.

මහතෙරකෙනකුත් ලදින් "මහතෙරකෙනෙක මා ලද්දහ" යි සොමිනස් වී නමී ඔහුගෙ දක්ෂිණ සඤ්ඤගත නො වෙ. යමෙක් හෙරණපැවිදිකෙනකුත් හෝ මහලුපැවිදිකෙනකුත් හෝ සඟ කෙනකුත් හෝ තෙරකෙනකුත් හෝ බාලකෙනකුත් හෝ පණ්ඩිත කෙනකුත් හෝ උදෙසා දුන් යම් කවරකෙනකුත් සඟින් ලදින් සඟුන් කෙරෙහි කරන බුහුමනින් පුදා "සඟෑ දෙමි" යි විමති නැති වැ දෙන්නෙ වී නමී ඔහුගෙ දක්ෂිණ සඤ්ඤගත වෙ.

දඹදිවැ වෙහෙරක් කැරැවූ කෙළෙඹියෙක් "සඤ්ඤගත දක්ෂිණ දෙමි" යි දෙයධර්‍මය පිළියෙළ[1] කොට තබා වෙහෙරට ගොස් සඟින් එක් පැවිදිකෙනකුත් ඇරැවිය. හෙ එ සඟුන් දුන් එක් දුශ්ශීලයකු ලදින් හෙහි පිරිබඩ කරවා උඩ වියන් බඳවා මලොලඹු දි වැටසිරි පහයා හිඳුනා අසුන් පන්වා වඩා හිඳුවා පා දොවා තෙල් ගල්වා [2]ගඳින් මලින් පුදා සඟුන් කෙරෙහි බුහුමනින් බුදුනට සෙයින් සත්කාර කොට දෙයධර්‍ම දින. ඒ වත්හිමියො පස්වරු වෙහෙරැ තණ සස්නා හුදැල්ලක් ඉල්වා එගෙට හියහ; එගෙයි උපාසිකා හිඳ මැ හුදැල්ල පයින් පැව. මිනිස්හු "තොප පෙරවරු මොවුනට කළ සත්කාර කියන්නට අමිනැ[3]. දැන් හුනස්නෙන් නැඟෙන පමණෙකුදු නො වීය, මෙ කිනම් දැයෙකැ?" යි කිහ. උපාසිකා හිමි "අපි ඒ සත්කාර සඟනට කළමිහ; මොහට කළමො නොවමිහ" යි කිව.

මෙසෙ දෙන දැන් මත්තෙ ගොත්‍රභූ වූ දුශ්ශීලයනට ද් සඟුන් උදෙසා දුන්හු නම් ඵල මහත් වෙයි.

වදළෙ මැ නො:-

167. "හවිස්සන්ති බො පනානන්ද අනාගතමද්ධානං

---

[1] පිළිවෙළ BCG [2] ගඳින් මලින් දුමින් BG [3] අමිතැ G

ගොත්‍රභුනෝ ඛායාවකණ්ඩා දුස්සීලා පාපධම්මා, තෙ දුස්සීලා දුස්සීලෙසු සඞ්ඝං උද්දිස්ස දානං දස්සන්ති, තදුපඨං ආනන්ද සඞ්ඝගතං දක්ඛිණං අසංඛ්‍යෙය්‍යං අප්පමෙය්‍යං වදාමි, නත්වේවාහං ආනන්ද කෙනචි පරියායෙන සඞ්ඝගතස්ස දක්ඛිණස්ස පාටිපුග්ගලිකං දානං මහප්ඵලතරං වදාමි" යි.

මෙසේ[1] වන බැවින් භවභෝගසම්පත් සඳහා දුන් දන් වතීමපාක්ෂික වූ මිථ්‍යාප්‍රතිපත් වෙයි. නිර්වාණසම්පත් සඳහා දුන් දන් විවතීමපාක්ෂික වූ සම්‍යක්ප්‍රතිපත් වෙයි. එබැවින් කුලුණු නුවණින් යෙදි නිර්වාණසම්පත් සඳහා සම්‍යක්ප්‍රතිපත්හි සිට දන් දිය යුතු.

මෙසෙ දන් දෙනුයෙ ප්‍රතිග්‍රාහකයනට ආයුෂ්‍ය මතු දුන්නා නො වෙයි; ආයුෂ ද වර්ණ ද සුඛ ද බල ද ප්‍රතිභාන ද දුන්නා වෙ.

වදාළෙ මෑ නො දනවිල දක්වන බුදුන් විසින්:-

168. "භොජනං භික්ඛවෙ දදමානෝ දායකෝ පටිග්ගාහකානං පඤ්ඨානානි දෙති, ඛතමානි පඤ්ච, ආයුං දෙති; වණ්ණං දෙති; සුඛං දෙති; බලං දෙති; පටිභානං දෙති; ආයුං ඛෝ පන දත්වා ආයුස්ස භාගී හොති දිබ්බස්ස වා මානුස්ස වා; වණ්ණං දත්වා - පෙ - සුඛං දත්වා - බලං දත්වා - පටිභානං දත්වා පටිභානස්ස භාගී හොති දිබ්බස්ස වා මානුස්ස වා" යි.

මෙසේනාක් ප්‍රකාරයෙන් දන් දෙනුයෙ ප්‍රතිග්‍රාහකයනට මතු දායක වෙයි; සිල්රක්නෙ වනාහි හැමසත්නට අභයදායක වෙ.

වදාළෙ මෑ නො සීලයෙහි අනුසස් දක්වන බුදුන් විසින්:-

169. "ඉධ භික්ඛවෙ අරියසාවකෝ පාණාතිපාතං පහාය පාණාතිපාතා පටිවිරතෝ හොති, පාණාතිපාතා පටිවිරතෝ

---

[1] මෙ මෙසේ BG

භික්ඛවෙ අරියසාවකො අපරිමාණානං සත්තානං අභයං දෙති අවෙරං දෙති අබ්‍යාපජ්ඣං දෙති, අපරිමාණානං සත්තානං අභයං දත්වා අවෙරං දත්වා අබ්‍යාපජ්ඣං දත්වා අභයස්ස අවෙරස්ස අබ්‍යාපජ්ඣස්ස භාගී හොති, ඉදං භික්ඛවෙ පඨමං දානං මහාදානං පුන ච පරං භික්ඛවෙ අරියසාවකො අදින්නාදානං පහාය - පෙ - කාමෙසු මිච්ඡාචාරං පහාය - මුසාවාදං පහාය - සුරාමෙරයමජ්ජපමාදට්ඨානං පහාය සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති සුරාමෙරය මජ්ජපමාදට්ඨානා පටිවිරතො භික්ඛවෙ අරියසාවකො අපරිමා ණානං සත්තානං අභයං දෙති අවෙරං දෙති අබ්‍යාපජ්ඣං දෙති, අපරිමාණානං සත්තානං අභයං දත්වා අවෙරං දත්වා අබ්‍යාපජ්ඣං දත්වා අභයස්ස අවෙරස්ස අබ්‍යාපජ්ඣස්ස භාගී හොති, ඉදං භික්ඛවෙ පඤ්චමං දානං මහාදානං" යි.

මෙ හැම දානයට වඩා ත්‍රිවිධපය්‍යාප්තියැ අලගද්දූ පය්‍යාප්තියෙන් විනිර්මුක්ත වූ නිස්සරණාධ්‍යාශයෙන් පවත්වනලද ධර්ම දාන මැ මහාදාන නම් වෙ.

## ත්‍රිවිධපය්‍යාප්ති නම් කවර යත්?

අලගද්දූපය්‍යාප්ති යැ, නිස්සරණ පය්‍යාප්තියැ, භාණ්ඩා ගාරික පය්‍යාප්තියැ යන මෙසි.

යමෙක් බුද්ධවචන ලාභසත්කාර සඳහා ග්‍රහණධාරණ ප්‍රතිපාදන[1] කෙරෙ ද ඔහට[2] ච පය්‍යාප්ති "අලගද්දූපය්‍යාප්ති" නම් වෙ. යමෙක් බුද්ධවචන උගෙන[3] "සිල් ආ තන්හි සිල් පුරමි, සමාධි ආ තන්හි සමාධි ගබ් ගන්වමි, විදර්ශනා ආ තන්හි විදර්ශනා වඩමි, මාර්ගඵල ආ තන්හි මාර්ගභාවනා කෙරෙමි, ඵල සාක්ෂාත් කෙරෙමි" උගනී ද ඔහට[2] ච පය්‍යාප්ති "නිස්සරණ

---

[1] ප්‍රතිපාදනා BEFG [2] උහුට BEFG [3] ඉගෙන BEFG

පයිරීඝි" නමි ඉව. "භාණ්ඩාගාරික පයිරීඝි" නමි කවර යත්? යම් ක්ෂීණාශ්‍රවයන්හු විසින් අපරිඥාත වූ අප්‍රහීණ වූ අභාවිත වූ අසාක්ෂාත්කෘත වූ අර්ථයක් ඇත්තෙ නොවෙයි, ඉහ පරිඥාතස්කන්ධයෑ, ප්‍රහීණක්ලේශයෑ, භාවිතමාර්ගයෑ, සාක්ෂාත්කෘතඵලයෑ; ඉහ බුදුවචන උගන්නෙ සද්ධර්මවංශ පරිපාලක වෑ උගන්නි. එසින් ව පයිරීඝි ඔහට "භාණ්ඩාගාරික පයිරීඝි" නමි ඉව.

මෙහි "අලගද්දූ" නමි කිමෙක යත්? "අලං ගදෙනෙති අලගද්දූ:" යි නිර්දිෂ්ට ආහිවිෂ යෑ. යම්සෙ ව අලගද්දූයා වරදවා ගත් පුරුෂයනට මරණ හා මරණ සම දුක් ඉහා වෙ ද, එසෙයින් මෑ දහම් වරදවා ගත් පුග්ගලයනට වදහම් දිසීරාත්‍රයෙහි අහිතයට දුඃඛයට අනර්ථව්‍යසනයට වෑවෙ.

එසින් වදාළහ:-

170. "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො අලගද්දූකාමෝ අලගද්දූ ගවෙසි අලගද්දූපරියෙසනං චරමානො, සො පස්සෙය්‍ය මහන්තං අලගද්දූං, තමේනං හොගෙ වා නඞ්ගුට්ඨෙ වා ගණ්හෙය්‍ය, තස්ස සො අලගද්දූ පටිපරාවත්තිත්වා හත්ථෙවා බාහාය වා අඤ්ඤතරස්මිං වා අඞ්ගපච්චඞ්ගෙ ඩංසෙය්‍ය, සො තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං, තං කිස්ස හෙතු? දුග්ගහිතත්තා භික්ඛවෙ අලගද්දූස්ස. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චෙ මොඝපුරිසා ධම්මං පරියාපුණන්ති - සුත්තං ගෙය්‍යං වෙය්‍යාකරණං ගාථං උදානං ඉතිවුත්තකං ජාතකං අබ්භුතධම්මං වෙදල්ලං. තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං න උපපරික්ඛන්ති. තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්ථං අනුපපරික්ඛතං න නිජ්ඣානං ඛමන්ති. ඉති උපාරම්භානිසංසා චෙව ධම්මං පරියාපුණන්ති ඉතිවාදප්පමොක්ඛානිසංසා ච. යඤ්ච තස්ස ය ධම්මං පරියාපුණන්ති තඤ්චස්ස අත්ථං නානුභොන්ති. තෙසං තෙ ධම්මා දුග්ගහිතා දීඝරත්තං අහිතාය දුක්ඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු? දුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මානං" යි.

යම්සෙ අලගද්දියා තිරුකොට ගත් පුරුෂයහට ඒ අලගද්දි ජීවනහෙතු වෙ ද, එසෙයින් මෑ දහම් නොවරදවා ගත් පුඟුලහට ඒදහම් සුඛහෙතු වෙ.

එසින් වදාළහ:-

171."සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො අලගද්දත්ථිකො අලගද්දගවෙසි අලගද්දපරියෙසනං චරමානො, සො පස්සෙය්‍ය මහන්තං අලගද්දං තමෙනං අජපදෙන දණ්ඩෙන සුනිග්ගහිතං නිග්ගණ්හෙය්‍ය, අජපදෙන දණ්ඩෙන සුනිග්ගහිතං නිග්ගහෙත්වා ගීවාය සුග්ගහිතං ගණ්හෙය්‍ය, කිඤ්චාපි සො භික්ඛවෙ අලගද්දො තස්ස පුරිසස්ස හත්ථං වා බාහං වා අඤ්ඤතරං වා අඞ්ගපච්චඞ්ගං භොගෙහි පලිවෙඨෙය්‍ය, අථ ඛො සො නෙව තතො නිදානං මරණං වා නිගච්ඡෙය්‍ය මරණමත්තං වා දුක්ඛං; තං කිස්ස හෙතු? සුග්ගහිතත්තා භික්ඛවෙ අලගද්දස්ස. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චෙ කුලපුත්තා ධම්මං පරියාපුණන්ති සුත්තං - පෙ - වෙදල්ලං, තෙ තං ධම්මං පරියාපුණිත්වා තෙසං ධම්මානං පඤ්ඤාය අත්ථං උපපරික්ඛන්ති. තෙසං තෙ ධම්මා පඤ්ඤාය අත්ථං උපපරික්ඛතං නිජ්ඣානං ඛමන්ති. තෙ න චෙව උපාරම්භානිසංසා ධම්මා පරියාපුණන්ති න ඉතිවාදප්පමොක්ඛානිසංසා. යස්ස චත්ථාය ධම්මං පරියාපුණන්ති තඤ්චස්ස අත්ථං අනුභොන්ති. තෙසං තෙ ධම්මා සුග්ගහිතා දීඝරත්තං හිතාය සුඛාය සංවත්තන්ති. තං කිස්ස හෙතු? සුග්ගහිතත්තා භික්ඛවෙ ධම්මානං"යි.

මෙසෙ අලගද්දිපය්‍යාප්තීන් විනිර්මුක්ත වෑ නිස්සරණාධ්‍යාශයෙන් පවත්වනලද ධර්මය මහාදාන වන පරිදි කිසෙයෑ යත්?

යමක්හු ඉදින් සියලු සත්වළගබ බඹලොව දක්වා නිරන්තරයෙන් වැඩහුන් බුදු පසෙබුදු මහරහතනට දුන් සියුම් සිවුරුදනට වඩා එමෑ පිරිස පා පුරා දුන් ප්‍රණීතපිණ්ඩපාතදනට වඩා, එසෙයින් මෑ පා පුරා දුන් සර්පිසාදිභෛෂජ්‍යදානයට වඩා, මහාවිහාර සදාශ වූ විහාරසහස්‍රයන් හා ලොහප්‍රසාද

සදාග වූ ප්‍රාසාදසහස්‍රයන් කරවා දුන් සෙනසුන්දනට වඩා, අනෙපිඬුමහසිටුහු දෙවිරමි සඳහා කරනලද සූපනස්කෙළක් ධනපරිත්‍යාගයට වඩා, යටත්පිරිසෙයින් සිවුපැදි ගයෙකින් කරන අනුමොදනා විසින් පවත්වනලද ධර්මදානය මැ අග්‍රයැ. මෙවැනි මහාදාන ද පවා එකගය[1] පින් සොළසක් කොට බෙදූ කලැ එයින් එක්භාගයක් අගනෙ නො වෙයි - මෙසෙ බණ කියනුද් කියවනුද් අසනුද් මහාඵලයැ, යමක්හු විසින් ධර්මශ්‍රවණ කරවනලදද ඔහට මැ මහාඵලයි. එයට හෙතු කවර යත්? එබඳු පින්කම් කරන්නාහු බණ අසා ම කෙරෙති, නො අසා නො කෙරෙත්. ඉදින් සත්හු බණ නො ඇසූවාහු වූහු නම් එවක්[2] පමණ හඹුදු කෙණෙස්සක් පමණ බතුදු අන්හට නො දෙත්.

අපි ච - කපත් දවස් වට වැස්සෙහි දියබිඳු ගණන්නට පොහොසත් නුවණ ඇති ධම්සෙනෙවි සැරියුත්මහතෙරුන් වැනි මහාපුරුෂයො ද පවා තමන්ගෙ ධර්මතායෙන් සොවාන්ඵල පසක් කරන්නට නො පොහොසත් වූහු; අස්සජිමහතෙරුන් වදාළ ගාථාධියක් අසා සොවාන් වූහ; බුදුන් වදාළ ධම්දෙසුන් අසා රහත් වූහු.

මහාධර්මශ්‍රවණ ද ප්‍රකෘතිධර්මශ්‍රවණ ද උපනිෂණ්ණකකථා ද වතුෂ්පදික ගාථායෙකින් කරනලද අනුමොදනා ද ධර්මදාන යි.

මෙසෙ සර්වදානයට වඩා අග්‍ර වන බැවින් මහාදානයි ධර්මදාන.

එයින් වදාළහ සත්දෙවිරජහට:-

172. "සබ්බදානං ධම්මදානං ජිනාති
සබ්බං රසං ධම්මරසො ජිනාති
සබ්බං රතිං ධම්මරති ජිනාති
තණ්හක්ඛයො සබ්බදුක්ඛං ජිනාති" යි.

---

[1] එගය BG [2] සරඑවක් F

(14). දහනපරිගතා විය කුඤ්ජරො වනගහනා ගෙහා නික්ඛමිත්වා

යන මෙයින් මහාපුරුෂයා ශ්‍රද්ධාදි පඤ්චධර්මයෙහි සිට පඤ්ච දුග්ගිලයෙහි ආදීනව දැක පඤ්චසීල හා උපොසථසීල ගිහි ගෙහි සිට පිරියහැකි වුව ද සර්වාකාරපරිපූර්ණ කොට සමාධිපද ස්ථාන වූ බ්‍රහ්මචර්‍යා පුරන්නට අශක්‍යයෙන් "මනාපකායිකා" නම් දෙවතාවන් බඳු අභිරූපස්ත්‍රීන් විසින් රම්‍ය වූ ගිහිගෙ පියා ළැවී ගිනි ගත් වනගහනයෙකින් නික්මෙන ඇතක්හු සෙයින් නික්මුණු පරිදි කීහු.

මෙහි ශ්‍රද්ධාදි පඤ්චධර්මයො නම් කවරහ යත්?

ශ්‍රද්ධා යැ, ශීල යැ, ශ්‍රැත යැ, ත්‍යාග යැ, ප්‍රඥා යැ යන මොවුහු යි.

යමක්හට ශ්‍රද්ධාදිපඤ්චධර්මයො ඇද්ද, හෙ "ක්ෂත්‍රිය මහාසාර කුලයෙහි උපදිමි" යි සිතුව උපද්දි.

එයින් වදාළහ:-

173. "ඉධ භික්ඛවෙ භික්ඛු සද්ධාය සමන්නාගතො හොති සීලෙන- පෙ- සුතෙන - චාගෙන - පඤ්ඤාය සමන්නාගතො හොති, අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා ඛත්තිය මහාසාලානං[1] සභව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, සො තං චිත්තං දහති තං චිත්තං අඩ්ඪෙති තං චිත්තං භාවෙති. තස්ස තෙ සඞ්ඛාරා ච විරාගා ච එවං භාවිතා එවං බහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති" යි.

එසෙයින් මැ "බ්‍රාහ්මණ මහාසාරකුලයෙහි ගෘහපති මහාසාර කුලයෙහි චාතුර්මහාරාජිකයන් කෙරෙහි ත්‍රයස්ත්‍රිංශත්, යාම තුෂිත, නිර්මාණරති, පරනිර්මිතවශවර්ත්ති දෙවියන් කෙරෙහි උපදිමි" යි සිතුව ඔවුන් කෙරෙහි උපද්දි - එම පඤ්චධර්මයෙහි.

---

[1] ඛත්තියමහාසාරකුලානං BCD

සිට රූප ධ්‍යාන උපයා "සහස්‍රිලෝකධාතු වැ ආලෝකස්ඵරණයට සමර්ථ වූ සහබ්‍රහ්මයා කෙරෙහි උපදිමි" යි සිතුව ඔහු කෙරෙහි උපද්දි - එසෙසින් මැ ද්විසහස්‍රී, ත්‍රිසහස්‍රී, චතුස්සහස්‍රී, පඤ්චසහස්‍රී දශසහස්‍රී, ශතසහස්‍රීලෝකධාතුවැ ආලෝකස්ඵරණයට සමර්ථ වූ සතසහස්‍ර බ්‍රහ්මයා කෙරෙහි උපදිමි" යි සිතුව ඔහු කෙරෙහි උපද්දි.

එසින් වදළහ:-

174. "පුන චපරං භික්ඛවෙ භික්ඛු සඳ්ධාය සමන්නාගතෝ හොති, සීලෙන සුතෙන චාගෙන පඤ්ඤාය සමන්නාගතෝ හොති. තස්ස සුතං හොති සතසහස්සා බ්‍රහ්මා දීඝායුකා වණ්ණවා සුඛ බහුලොති. සතසහස්සා භික්ඛවෙ බ්‍රහ්මා සතසහස්සිං ලෝකධාතුං ඵරිත්වා අධිමුච්චිත්වා විහරති, යෙපි තත්‍ර යත්තා උපපන්නා තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරන්ති. සෙය්‍යථාපි භික්ඛවෙ නෙක්ඛං ජම්බොනදං දක්ඛකම්මාරපුත්තොන[1]. උක්කාමුඛෙ[2] සුකුසලසම්පහට්ඨං පණ්ඩුකම්බලෙ නික්ඛිත්තං භාසතෙ ච තපතෙ ච විරොචතිව, එවමෙව ඛො භික්ඛවෙ සතසහස්සා බ්‍රහ්මා සත සහස්සිං ලෝක ධාතුං ඵරිත්වා අධිමුච්චිත්වා විහරති, යෙපි තත්‍ර සත්තා උපපන්නා තෙපි ඵරිත්වා අධිමුච්චිත්වා විහරන්ති. තස්ස එවං හොති අහො වතාහං කායස්ස භෙදා පරම්මරණා සත සහස්සස්ස බ්‍රහ්මුනො සහව්‍යතං උපපජ්ජෙය්‍යන්ති, සො තං චිත්තං දහති තං චිත්තං අධිට්ඨාති තං චිත්තං භාවෙති, තස්ස තෙ සංඛාරා ච විරාගා ච එවං භාවිතා එවං බහුලීකතා තත්‍රූපපත්තියා සංවත්තන්ති" යි.

එසෙසින් මැ "පරිත්තාභදෙවියන් කෙරෙහි අප්‍රමාණාභයන් කෙරෙහි ආභාස්වරයන් කෙරෙහි උපදිමි" යි සිතුව ඔවුන් කෙරෙහි උපද්දි. "පරිත්තසුභයන් කෙරෙහි අප්‍රමාණසුභයන් සුභකෘත්ස්නයන් බෘහත්ඵලයන් කෙරෙහි උපදිමි" යි සිතුව ඔවුන් කෙරෙහි උපද්දි. එසෙසින් මැ එම පණ්ඩිතියෙහි සිට

---

[1] දක්ඛකම්මාරපුත්තොCDEF [1] දක්ඛකම්මාරපුත්තා යූපරිකම්මකතංG

[2] උක්කාමුඛිCP

සමාපත්ති පදස්ථාන විදර්ශනා වඩා අනාගාමිඵල පසක් කොට "අවිහාදි අකනිට්ඨපර්‍යන්ත පඤ්චශුද්ධාවාසයෙන් එක්තලයෙක්හි උපදිමි" යි සිතුව එහි උපද්දි. එම පඤ්චධර්මයෙහි සිට අරූපධ්‍යාන උපයා "ආකාශානන්ත්‍යායතනාදි සතර අරූප භවයෙන් එක්තරා භවයෙක්හි උපදිමි" යි සිතුව එහි උපද්දි. එම පඤ්චධර්මයෙහි සිට "රහත්වෙමි" යි සිතුව උපරිමා විභාවනා කොට ආශ්‍රවක්ෂයට පැමිණේ.

එයින් වදාළහ:-

175. "පුන ච පරං භික්ඛවෙ භික්ඛු සද්ධාය සමන්නාගතෙ හොති, සීලෙන, සුතෙන, චාගෙන, පඤ්ඤාය සමන්නාගතෙ හොති, තස්ස එවං හොති, අහො වතාහං ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරෙය්‍යන්ති. සො ආසවානං ඛයා - පෙ - උපසම්පජ්ජ විහරති. අයං භික්ඛවෙ භික්ඛු න කත්ථචි උපපජ්ජති න කුහිඤ්චි උපපජ්ජති"යි.

යමක්හට ශ්‍රද්ධාදි පඤ්චධර්ම හා ප්‍රාර්ථනා ඇත්නම් ඔහට ගති නියතයි.

එයින් කීහ සඟිඅනුවාදයෙහි:-

176. "යස්ස හි පඤ්චධම්මා අත්ථි න පත්ථනා, තස්ස ගති අනිබද්ධා; යස්ස පත්ථනා අත්ථි න පඤ්චධම්මා, තස්සපි ගති අනිබද්ධාව; යෙසං උභයමත්ථි, තෙසං ගති නිබද්ධා, යථා හි ආකාසෙ ඛිත්තදණ්ඩා අග්ගෙන වා මජ්ඣෙන වා මූලෙන වා නිපතිස්සතීති නියමො නත්ථි. එවං සත්තානං පටිසන්ධිගහණං අනියතං; තස්මා කුසල කම්මං කත්වා එකස්මිං ඨානෙ පත්ථනං කාතුං වට්ටති"යි.

මූලය "ශ්‍රද්ධාදි පඤ්චධර්මයෝ" නම්.

---

<u>පඤ්චදුශ්ශීල</u> නම් කවර ? යත්;

ප්‍රාණාතිපාතයැ අදත්තාදානයැ කාමමිථ්‍යාචාරයැ මෘෂාවාදයැ සුරාපානයි.

මෙහි <u>ආදීනව</u> නම් කවර ? යත්;

ප්‍රාණවධ කරනුයෙ මෙමැ ජන්මයෙහි ශස්ත්‍රශාඩ්ගාදීන් උපහත වෙයි. නරකයෙහි උපද අනෙකවර්ෂකොටිසහස්‍රයෙහි පැසී එයින් මුක්ත වූ කලැ මහත් විභූති ඇති කුලයෙහි අභිරූප වැ උපන්නෙ ද වී නම් සම්පත් නො වළඳ මැ නවයොවුනෙහි මරණ ලැබෙ.

එයින් කිහ:-

177. "සබ්බොපභොගධනධඤ්ඤවිසෙසලාභී
රූපෙන භො ස මකරද්ධජසන්නිභොපි
යො යොබ්බනෙපි මරණං ලභතෙ අකාමං
කාමං සදා තු පරපාණහරො නරො හි" යි.

යමෙක් ප්‍රාණවධ කෙළෙ ද ඔහට අන්තරීක්ෂයෙහිද් සිටිය සමුද්‍රමධ්‍යයෙහිද් සිටිය විදුරුගුහාවට ද වන පාප කර්මයෙන් මුක්ති නැත්.

කිසෙයැ යත් ?

කර්මාන්තයෙහි නො පවත්නා ගොනක්හු බැඳ හොවා පිදුරු ගිනින් දවා මැරූ මිනිසෙක් අවීචිමහානරකයෙහි උපද අනෙක වර්ෂකොටි සහස්‍රයෙහි පැසී එයින් මුක්ත වැ[1] ගිය කලැ සියක් අත්බැවැ ආකාශගතකල ද පිදුරු ගිනින් දදා මෙළෙ.

---

[1] මිදී

බල්ලකු කර වැලිකළයක් බැඳ දියෙහි ගලා මැරූ සූකරයක් අවීචියෙහි උපද අනෙවාසුවහස් පැසී එයින් මිදී ගිය කලැ සියක් අත්බැව් සමුද්‍රමධ්‍යගතකල ද කර වැලිකළ බැඳ දියෙහි ගලා මරනලදු.

ගොයකු තුඹ සක තිරැ කොට හොවා යතින් හළ ගොපලු දරුවො සත්දෙනෙක් ඔහු නො මැරූයෙන් නිරැ නො ගොස් තුදුස් අත්බැවෙකැ පව්තව්වරයට වන්නාහු පහණින් පිහිත වූ ලෙනදොර ඇති වැ සත් යත් දවස් නිරාහාර වූහු.

මෙසෙයින් අන්තරීක්ෂයෙහිද් සිටිය සමුද්‍රමධ්‍යයෙහිද් සිටිය විදුරුගුහාවට ද වත පාපකර්මයෙන් මුක්ති නැත්.

එයින් වදළ'හ:-

178. "න අන්තලික්ඛෙ න සමුද්දමජ්ඣෙ
න පබ්බතානං විවරං පවිස්ස
න විජ්ජති සො ජගතිප්පදෙසො
යත්ථට්ඨතො මුච්චෙය්‍ය[1] පාපකම්මා" යි.

අපි ව - මල්ලිකාදෙවී එක් ජන්මයෙක්හි කුලදුවක් වැ පතිකුලයෙහි වසන්නී අමුත්තක්හු දැක ඔහට බත් දියටී වැ මස් සොයා නො ලදින් පැසුවදොර හොත් වළියක හිස් සුන. ඒ පාපයෙන් අනෙවාසුවහස් නරකයෙහි පැසී එයින් මිදී ගිය කලැ උපන් උපන් තන්හි ඒ වළියගෙ ලොමගණනින් හිස් සිදුනාලදු. එයින් කිව තමා දින්නාදෙවී කල්හි ජාතිස්මරඥානයෙන් තමා වුන් දුක් දැක එසියක් රජුන් හිස් සිදුවන්නට සිටි බරණැස් රජහට:-

---

[1] මුඤ්චය්‍ය AEF

179. "එකිස්සා කණ්ඩං ඡින්දිත්වා ලොමගණනාය පවවිසං
බහුන්නං කණ්ඩ ජෙත්වාන කථං කාහසි ඛත්තිය" යි.

එ මැ දක්වන්නට වදාළහ බුදුහු:-

180. "එවඤ්ච සත්තා ජානෙය්‍යුං දුක්ඛායං ජාතිසම්භවො
න පාණො පාණීනං හඤ්ඤෙ පාණඝාතී හි සොවති" යි.

අපි ච - සිහිල්මහතෙරහු සසර වසන කලැ එක් ජන්මයෙක රජ වැ සිවුරඟසෙනඟ ගෙන ගොස් අනෙක් නුවරක් වටාපිහිත කොටගෙන සිට සත්වන දවස් අවසර දුන්හ. එ පාපයෙන් රහත් වන අත්බැවැ සත්හවුරුදු සත්මස් සත්දවසක් මවුකුසැ -

181. "ජරායො හස්ත්‍රායං නියමනතිරුව්ජවාසවිධුරො
වසන් වර්ෂ්ඃකුපෙ ජඨරදහනඤ්චාඨකටුකෙ
න වක්තුං න ශ්‍රොතුං න වලිතුමධීශො න ශයිතුං
නරො ගර්භක්ලෙශානනුභවතී මාසාන් පරිදශාන්"

යනාදි විසින් ගර්භවාසයෙහි දක්වනලද මහත් දුක් අනුභව කළහ. මෙපමණක් මෙසෙ වන කලැ ප්‍රාණාතිපාතයෙහිමැ කවර කථා යැ? එබැවින්[1] තමන් තමනට[2] සෙනෙහැති කෙනකුන් සත්නට දුක් නුදුන මැනැවැ.

එසින් කිහ:-

182. "සවප්‍රාණාත්ම ප්‍රගල්භත්වාත් කො නු භක්ත්‍යා න පාලයෙත්
සවජීවිතමිව ප්‍රාණාන් ප්‍රාණීනාං හිතවෙතනඃ" යි.

ප්‍රාණාතිපාතයෙන් අපායභාග් වන පරිදිද් මනුෂ්‍යත්වයක් ලද ද අල්පායුෂ්ක වන පරිදිද් දක්වන්නට වදාළහ බුදුහු:-

---

[1] හෙබැවින් ACDEF [2] තමතමනට F

183. "පාණාතිපාතෝ භික්ඛවෙ ආසෙවිතෝ භාවිතෝ බහුලීකතෝ නිරයසංවත්තනිකෝ හොති, තිරච්ඡානයොනිසංවත්තනිකෝ හොති, පෙත්තිවිසයසංවත්තනිකෝ හොති, යෝ සබ්බලහුසෝ පාණාතිපාතස්ස විපාකෝ මනුස්සභූතස්ස අප්පායුකසංවත්තනිකෝ හොති" යි.

මෙ ප්‍රාණාතිපාතයෙහි ආදීනව යැ.

අදත්තාදානයෙහි ආදීනව නම් කවර යත්?

පරද්‍රව්‍යයාගෙ ආදානය ආත්මද්‍රව්‍යයාගෙ විනාශයට හෙතු වෙ සොරකම් කළවුන්ගෙ සථිඝ ගන්නා බැවින්.

එසින් කිහ නිතිශාස්ත්‍රයෙහි :-

184. "පරද්‍රව්‍යහරණමාත්මද්‍රව්‍යස්‍ය විනාශහෙතුර්" යි.

පරස්වහරණයෙන් මෙ මැ ජන්මයෙහි කණ්ඩකලත්තාභිඝාතාදි අනෙකප්‍රකාර කම්කටුලට පැමිණෙත්.

එසින් වදාළහ:-

185. "යථාරූපානං ඛො පන පාපකානංකම්මානං හෙතූ රාජානෝ චොරං ආගුචාරිං ගහෙත්වා විවිධා කම්මකාරණා[1] කාරෙන්ති කසා හිපි තාළෙන්ති වෙත්තෙහිපි තාළෙන්ති අද්ධදණ්ඩකෙහිපි තාළෙන්ති හත්ථම්පි ඡින්දන්ති පාදම්පි ඡින්දන්ති හත්ථපාදම්පි ඡින්දන්ති කණ්ණම්පි ඡින්දන්ති නාසම්පි ඡින්දන්ති කණ්ණනාසම්පි ඡින්දන්ති බිලඞ්ගථාලිකම්පි කරොන්ති සංඛමුණ්ඩිකම්පි කරොන්ති රාහුමුඛම්පි කරොන්ති ජොතිමාලිකම්පි කරොන්ති හත්ථපජ්ජොතිකම්පි කරොන්ති එරකවත්තිකම්පි කරොන්ති චීරකවාසිකම්පි කරොන්ති එණෙය්‍ය

[1] කම්මකරණා A

කම්පි කරොන්ති බළිසමංසිකම්පි කරොන්ති කහාපණ කම්පි කරොන්ති ඛාරාපතච්ඡිකම්පි කරොන්ති පලිඝපරිවත්තිතකම්පි කරොන්ති පලාලපීඨකම්පි කරොන්ති තත්තෙනපි තෙලෙන ඔසිඤ්චන්ති සුනඛෙහිපි ඛාදාපෙන්ති ජීවන්තම්පි සූලෙ උත්තාසෙන්ති අසිනාපි සීසං ඡින්දන්ති" යි.

වොරකර්මයට වැඩි අනෙක් මරණපාශයෙක් ඇත්තෙ නො වෙයි. එයින් කීහ නීතියැ "න වොය්‍යාත්පරං මෘත්‍යුපාශඃ" යි.

මෙසෙයින් ජන්මාන්තරයට නො යනතුරු මැ මහානර්කර වන බැවින් පරද්‍රව්‍ය ගිනි සෙයින් විෂ සෙයින් ආශීවිෂයන් සෙයින් ඝොරවිෂ සර්පයන් සෙයින් දුරින් මැ දුරු කටයුතු.

එයින් කීහ:-

186. "හස්තපාදශිරශ්ඡෙදි බහුවිඝ්නස්‍ය කාරණම්
ස්වප්නෙනාපි පරද්‍රව්‍යං විෂවත් කො න
වාරයෙත්" යි.

මෙසෙ මෙ මැජන්මයෙහි මහත් අනයව්‍යසනයට පමුණුවන අදත්තාදානය කළාහු නරකයෙහි උපද අනෙකවර්ෂ කොටිසහස්‍රයෙහි පැසී එයින් මිදී ගිය කලැ ප්‍රෙතාත්මභාවයට පැමිණ බලවත් ක්ෂුත්පිපාසායෙන් අභිභූත වැ අනෙක අන්තඃ කල්පයෙහි වෙහෙසී මිනිස්පියක් ලදහු නම් යදි වැ කපණ වැ විවණ වැ "ඛික් ඛික්" යන අක්ෂරශතයෙන් සන්තර්ජිත වැ හිණ පිරුණු රෙදි ඇති වැ හිස්පිරුණු උකුණන් ඇති වැ වෙරපිරුණු දැලි ඇති වැ සිත් පිරුණ ශොක ඇති වැ ඇස්පිරුණු කඳුළු ඇති වැ මුවපිරුණු වලප් ඇති වැ කැඳ නො ලදින් බත් නොලදින් මනුෂ්‍යප්‍රෙත වැ වෙවුලමින් ඇවිදිත්.

එයින් කිහ:-

187. "යො යාවකො ගවති හින්නකපාලහත්ථො
මුණ්ඩො ඨිගක්කරසතෙහි ච තජ්ජයන්තො
භික්ඛං සදාරිභවනෙ ස කුවෙලවාසො
දෙහී පරත්ථ පරවිත්තහරෙ නරෙ හි" යි.

මෙසෙ අදත්තාදානයෙන් අපායභාග් වන පරිදි හා මිනිස් පියක් ලදහොත් මනුෂ්‍යදුර්ගත වන පරිදි දක්වන්නට වදාළහ බුදුහු:-

188. "අදින්නාදානං භික්ඛවෙ ආසෙවිතං භාවිතං බහුලීකතං නිරයසංවත්තනිකං හොති, තිරච්ඡානයොනිසංවත්තනිකං හොති, පෙත්තිවිසයසංවත්තනිකං හොති, යො සබ්බලහුසෙ අදින්නාදානස්ස විපාකො මනුස්සභූතස්ස මනුස්ස දුග්ගතිසංවත්තනිකො හොති" යි.

මෙ අදත්තාදානයෙහි ආදීනව යැ.

කාමමිථ්‍යාචාරයෙහි ආදීනව නම් කවරෙ? යත්:

පරදාරපරිග්‍රහ කළාහු වෙ මැ ජන්මයෙහි ධිග්දණ්ඩයෙන් ධනදණ්ඩයෙන් වධදණ්ඩයෙන් අභිභූත වැ ගොස් නරකයෙහි උපද අනෙවාසුවහස් පැසී මිනිස්පියක් ලදහු නම් සියක් අත්බැවැ ස්ත්‍රී බවට පැමිණෙත්.

එයින් කිහ:-

189. "පුරිසා හි ඉත්ථියො වා ඉත්ථියො වා පුරිසා අභූතපුබ්බා නාම නත්ථි, පුරිසා හි පරස්ස දාරෙ අතිවරිත්වා කාලං කත්වා බහූනි වස්ස සතසහස්සානි නිරයෙ පච්චත්වා මනුස්ස ජාතිං ආගච්ඡන්තා අත්ත භාවසතෙ ඉත්ථිභාවං ආපජ්ජන්ති" යි.

කප්ලක්ෂයක් පිරූ පැරුම් ඇති අප අනඳමහතෙරහු එක් ජන්මයෙක්හි සිද්ධකළ පරස්ත්‍රීසමාගමයෙකින් නරකයෙහි පැසී එයින් මිදී ගිය කලැ තුදුස්බැවෙක ස්ත්‍රී වූහු; සත්අත් බැවෙක අණ්ඩච්ඡෙද බවට පැමිණියෝ.

කිසෙයැ යත්?

එවුහු සසර වසන කලැ මගධරට රජගහානුවර තරහල්දරුවක් වැ පාපමිත්‍රසංසර්ගයෙන් පරදාරපරිග්‍රහ කොට ජීවිතපර්‍යවසානයෙහි අවසරගත් අනෙක් පින්කමෙකින් වඟුරට කොසඹෑ නුවර අසූකෙළක් ධන ඇති සිටුදරුවක් වැ ඉපද කල්‍යාණමිත්‍ර සංසර්ගයෙන් බොහො පින්කම් කොට මියනකල්හි රජගහානුවර ලා කළ පව් අවසර ගත්තෙන් රොරවමහා නරකයෙහි ඉපද අනෙකවර්ෂකොටිසහස්‍රයෙහි පැසී බොහො දුක් විඳ පව් ගෙවා කණ්ටජනපදයෙහි කොටළුවක් වැ උපන්හු. එහි ඇමැති දරුවො "මේ[1] පිළිකළ කලැ ජවසම්පන්න බල සම්පන්න වෙ" යි අණ්ඩච්ඡෙද කොට තමනට වාහන කොළො.

එයින් සැවැ මහත් වනයෙක්හි වදුරුයොනෙක්හි උපද උපන් දවස් මැ යූථපතිහු විසින් "මපුතු මුඹ ගෙනෙව" යි ගෙන්වා ගෙන හඬව හඬවා තරකොට දතින් ඩැහැ එලය උපුට පියන ලදහු.

එයින් සැවැ දශාණ්දෙශයෙහි ගොනක් වැ උපද නහඹු කල්හි මැ උද්ඛාතඵල වූහු.

එයින් සැවැ වැදිරට මහාභොගකුලයෙක්හි නපුංසක වැ උපද දිළිඹු මිනිස්පියෙහි නො ගැහැනි නො පිරිමි වූහු.

---

[1] මොහුට

එයින් සැවැ තවිතිසා දෙවිනුවර සක්දෙවිරජහට දිව්‍යකන්‍යාවක් වූහු. දෙවන වර ද තුන්වන වර ද සතරවන වර ද එසෙයින් මැ දෙවකන්‍යා වූහු. පස්වන වර එ මැ දෙවි ලොව ජවන නම් දෙවිපුතක් හට අගමෙහෙසුන් වූහු.

එයින් සැවැ වැදැහැරට මියුලුනුවර අඩ්ඝාති නම් රජුගෙ අගමෙහෙස්න කුස උපද අභිරූප වැරුජා නම් රාජ කන්‍යාවක් වූහු. පියරජ රතිවඩ්න නම් සත්බුමුපහයක් කරවා දී දවස් පතා පස් විසි සුමුහක් මල් දෙවයි. වස්ත්‍රාභරණයෙහිද් අන්නපානයෙහිද් පමණ නැත්, දන් දෙනු සඳහා අඩමසකට රන් දහසක් දෙවයි, එ ගෙන දන් දී සිල් රැක ජීවිතාවසානයෙහි තවිතිසා දෙවිනුවර මහෙශාක්‍ය දිව්‍යපුත්‍රයක් වැ උපන්හු.

එයින් කිහ:-

190. "ඉත්ථී න මුච්චති සදා පුන ඉත්ථීභාවා
නාරී සදා භවති සෝ පුරිසෝ පරත්ථ
යෝ ආවරෙය්‍ය පරදාරමලඩ්ඝනීයං
සොරඤ්ච විඳති සදා ව්‍යසනඤ්ච නෙකං" යි.

අපි ච - පසෙබෝසත් තෙනෙක් දෙඅසඞ්ඛ්‍ය කප් ලක්ෂයක් පැරුම් පුරා අවුද් කසුප් සම්මාසම්බුදුන්ගෙ සස්නෙහි පැවිදි වැ විසිවා දහසක්[1] මහණුවම් කොටැ කාමාවචර දෙව ලොකයෙහි උපද එයින් සැවැ බරණැස සිටුදරුවක් වැ පාප මිත්‍රසංසර්ගයෙන් පරදාරපරිග්‍රහ කොට නරකයෙහි උපද අනෙක වර්ෂකොටි සහස්‍රයෙහි පැසී පවි ගෙවා එයින් සැවැ බරණැස සිටුදුවක කුස අඹුන්මිනිස්පිළිසඳින් පිළිසිඳගෙන[2] ගැහැනී වැ උපද මව්පියන් විසින් දොළඟ වැ සර්ජනයනට අප්‍රිය වැ පති කුලයට ගොස් එහිදු සර්ජනයන් විසින් දොළඟ වැ වැටෙන්නාහු

---

[1] විසිවා දහසක් හවුරුදු ACDG [2] පිළිසැඳින් පිළිසැඳැගෙනැ ACE

පසෙබුදු කෙනක්නට බත්පයක් දී පියුම්කලබක් පුදා පිරිමිබවට පතා ජීවිතාවසානයෙහි තව්තිසා දෙව්නුවරෙහි මහාපුදුම නම් දිව්‍ය පුත්‍රයක් වැ උපද දෙව්සපු වළඳ වසන්නාහු බඹදත්රජහුගෙ අගමෙහෙස්න ශීලවතී දෙවියට දරු දියටි සක්දෙව්රජහුගෙ අයජමෙන් දෙව්ලොවින් සැවැ රජඋයන්හි මඟුල්පොකුරුණියැ පියුම්ගැබ්හි[1] උපද ශීලවතී දෙවිය හස්තගත වැ මහපෙරහරින් වඩනාහු ඉසිපතන් ගොස් පසෙබුදු වූහු.

මෙසෙ අප අනඳමහතෙරුන් වැනි පුන් පැරුම් සවි බෝසත්නට ද මහපියුම් කුමරහු වැනි පුන් පැරුම් පසෙ බෝසත්නට ද අපායදුඃඛ දයක වැ එයින් මිදී ගිය කල්හි අණ්ඩවෙජ දකත්වයට නපුංසකත්වයට ස්ත්‍රීත්වයට පමුණුවනු වූ පරදාරයන් ඩාකිනීන් සෙ[2] දැක්ක යුතු.

එයින් කීහ:-

191. "සඵදුඃඛාස්පදාන් සොරාන් පරදාරානපායදාන්
න පශ්‍යෙන් මනසා වා'පි ඩාකිනීරිව
න ස්පාශෙත්" යි.

අපි ච - කසුප් සම්මාසම්බුදුන් දවස බරණැස්නුවර සිටුදරුවො සතරදෙනෙක් පරදාරපරිග්‍රහ කොට අවීචියැ උපද එක් අතුරු කපක් පැසී එයින් සැවැ සැටයොදුන් ලොහොකුඹු නරකයෙහි උපද කකියන උදුනෙහි සාල් සෙයින් උඩුයටි වැ පස්නාහු තිස්වා දහසෙකින් පත්ලට බැස තිස්වා දහසෙකින් මුවවිටට නැංගාහු ඔවුනොවුන් දැක එකෙකි ගාථා කියටි වැ කියන්නට කල් නැත්තෙන් "දු" යන "ස" යන "න" යන "සො" යන සතර අකුරක් සතර දෙන කියා ලොහොකුඹුහි

---

[1] ගැප්හිA [2] ඩැකිනින් සෙAF

ගැලී ගියහ. කොසොල් රජ මැදිමියමිහි අසා බියපත්වැ මල්ලිකා දෙවියගෙ නියොගයෙන් බුදුන් කරා ගොස් සැළ කෙළෙ.

බුදුහු සතරනෙරියත්කෙනකුන් පරදුරපරිශ්‍රහ කළ හෙයින් නිරයදුක් විඳුනා පරිදි දක්වා ඔවුන් කී සතර අකුරු ඉගන ඔවුන් විසින් අපරිපූණී සතර ගාථාවන් පරිපූණී කොට වදාළොා:-

192."දුජ්ජීවිතං අජීවිම්හ යෙ සන්තෙ න දදම්හසෙ
විජාමානෙසු භොගෙසු දීපං නාකම්හ අත්තනො.

සට්ඨිං වස්සසහස්සානි පරිපුණ්ණානි සබ්බසො
නිරයෙ පච්චමානානං කදා අන්තො භවිස්සති.

නත්ථි අන්තො කුතො අන්තො න අන්තො පතිදිස්සති
තදා හි පකතං පාපං මම කුහඤ්ච මාරිස.

සො හි නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං
වදඤ්ඤූ සීලසම්පන්නො කාහාමි කුසලං බහුං"යි.

මෙ සතර ශබ්දයන් කොසොල් රජු ඇසූ තැන් පටන් ගෙන බහු යටට බස්නි; ඔවුන් බස්නා තිස්වාදහසින් තව එක්වාදහසෙකුදු නො ගියෙයැ. ඔහු අනෙකවර්ෂ කෝටි සහස්‍රයෙහි පැසී සතර අපායෙහි වෙහෙසී කුරිරු දරුණු දුක් විඳ පවී ගෙවී ගිය කල[1] මිනිස්පියක් ලද ගැහැනී වෙති, මවුපියනට ද් පවා අප්‍රිය වෙති, සජ්ජනයන් විසින් උපහාස වෙත්.

එයින් වදාළහ:-

193. "කාමෙසු මිච්ඡාචාරො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති, තිරච්ඡාන යොනිසංවත්තනිකො හොති, පෙත්තිවිසයසංවත්තනිකො හොති,

---

[1] හී ගියකලැ B

යෝ සඞ්ඝභේදෝ කාමෙසු මිච්ඡාචාරස්ස විපාකෝ මනුස්සභූතස්ස සපත්ත වෙරසංවත්තනිකෝ හෝති" යි - මෙ කාමමිථ්‍යාචාරයෙහි ආදීනවයැ.

මෘෂාවාදයෙහි ආදීනව නම් කවරෙ යත්?

මෘෂාවාදී පුද්ගලයා නො කටහැකි පව් නම් නැත්.

එයින් වදළහ:-

194. "එකං ධම්මං අතීතස්ස මුසාවාදිස්ස ජන්තුනෝ
විතිණ්ණපරලෝකස්ස නත්ථි පාපං අකාරියං" යි.

යම් ගිහිගෙවැසි කෙනක්නට මෘෂාවාදයෙහි හැකුවම් නැත්නම් ඔවුන්ගෙ සන්තානයෙහි ගුණලව නැති, සසුන්වැසි කෙනක්නට මෘෂාවාදයෙහි ලජ්ජා නැත්නම් ඔවුනට මහණුවම් නැත්.

එයින් වදළහ:-

195. "පස්සසි නෝ තුවං රාහුල ඉමං උදකධානං රිත්තං තුච්ඡන්ති, එවං භන්තෙ. එවං රිත්තං තුච්ඡං බෝ රාහුල තෙසං සාමඤ්ඤං යෙසං නත්ථි සම්පජානමුසාවාදෙ ලජ්ජා" යි.

මෙසෙ මහාදොෂාවහ වූ මෘෂාවාද සේවා කෙළෙ අභූතවාදි නිරයං උපෙති" යි වදළ බැවින් නරකයෙහි උපද අනෙක වර්ෂකෝටි සහස්‍රයෙහි පැසී එයින් මුක්ත වූ කළ මිනිස් පියට පැමිණ නොයෙක් දෑ සියෙහි අභූතයෙන් අභ්‍යාඛ්‍යාන කරනු ලැබෙයි. දීන වෙයි, ජඩ වෙයි, අඥාන වෙයි, මූක වෙයි, අප්‍රියදර්ශන වෙයි, මීනයන් සෙ දිවි නැති වෙයි, සර්පියන්ස දෙදිවි වෙයි, කපිල මත්ස්‍යයා සෙ දුර්ගන්ධමුඛ වෙයි, දරුවො නො උපදිති, උපදිත් නම් දුහු[1] වෙති, උපන්ද වහල් නොව යෙත්.

---

[1] දූවෙති B

එයින් කීහ:-

196."දීනො විගන්ධවදනො ච ජළො අපඤ්ඤො
මූගො සදා භවති අප්පියදස්සනො ච
පප්පොති දුක්ඛමතුලඤ්ච මනුස්සභූතො
වාචං මුසා භණති යො හි අපඤ්ඤසත්තො"යි.

වෙතිය රජු මුඛයෙන් උත්පලගන්ධ වැහෙයි, ශරීරයෙන් චන්දනගන්ධ වැහෙයි, ආකාශයෙහි බද්ධපර්යඞ්ක වෙයි, ඛඩ්ග හස්ත විද්‍යාධරයො සතරදෙනෙක් චතුර්දිශායෙහි රක්ෂා කෙරෙති; එ රජු මෘෂාවාද කී තැනැසිට විද්‍යාධරයො කඩු දමා පියා ගියහ, මීයෙන් වැහෙන මහනෙල්මල්ගඳ ද ඇඟින් වැහෙන සඳුන්ගඳ ද අන්තර්හිත විය, ආකාශයෙහි නො හින්ද ගී බිමට බට, බිම ඇක්මෙත් මැ පොළොව විවර විය, එ විවරයෙන් ගොස් ස්වකායයෙන් මැ නිරැ වන්.

එයින් වදාළහ බුදුහු:-

197. "මුසාවාදො භික්ඛවෙ ආසෙවිතො භාවිතො බහුලීකතො නිරයසංවත්තනිකො හොති, තිරච්ඡානයොනි සංවත්තනිකො හොති, පෙත්තිවිසයසංවත්තනිකො හොති, යො සබ්බලහුසො මුසාවාදස්ස විපාකො මනුස්සභූතස්ස අභූතබ්භක්ඛාන සංවත්තනිකො හොති"යි.

මෙසෙ බැවින් සුභාෂිතවචනයෙක්[1] මැ බිණියයුතු වෙයි; දුර්භාෂිතවචනයෙක් නො මැ බිණියයුතු වෙ.

මෙහි සුභාෂිතවචන නම් කවරැ යත්? හෙ බුදුන් විසින් මැ දර්ශිතයි:-

---

[1] සුභාෂිතවචනයෙන්:

198. "ඉධ භික්ඛවෙ භික්ඛු සුභාසිතඤ්ඤව භාසති නො දුබ්භාසිතං, ධම්මඤ්ඤව භාසති නො අධම්මං, පියඤ්ඤව භාසති නො අප්පියං, සච්චඤ්ඤව භාසති නො අලිකං; ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි අඞ්ගෙහි සමන්නාගතා වාචා සුභාසිතා හොති නො දුබ්භාසිතා" යි.

එසින් වදළහ වඩ්ඪිස මහතෙරහු:-

199. "තමෙව වාචං භාසෙය්‍ය යායත්තානං න තාපයෙ
පරෙ ච න විහිංසෙය්‍ය සා වෙ වාචා සුභාසිතා.

පියවාචමෙව භාසෙය්‍ය යාවාචා පතිනන්දිතා
යං අනාදාය[1] පාපානි පරෙසං භාසතෙ පියං.

සච්චං වෙ අමතා වාචා එස ධම්මො සනන්තනො
සච්චෙ අත්ථෙ ච ධම්මෙ ච ආහු සන්තො පතිට්ඨිතා.

යං බුද්ධා භාසතී වාචං ඛෙමං නිබ්බානපත්තියා
දුක්ඛස්සන්තකිරියාය සා වෙ වාචානමුත්තමා" යි.

මෙසෙ වූ සුභාෂිතවචනයක් මෑ මිස දුර්භාෂිතවචනයක් නො මැ බිණුවමනා බැවින් බොහො නොබිණියයුතු වෙ. බොහො බිණුව කවර දොෂයෑ යත්? එහි පස් ආදීනවයෙක් වෙ. කවර පස් ආදීනවයෑ යත්?

වදළෙ මැ නො:-

200. "පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා බහුභාණිස්මිං පුග්ගලෙ. කතමෙ පඤ්ච? මුසා භණති, පිසුනං භණති, ඵරුසං භණති, සම්ඵං පලපති, නායස්ස හෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති" යි.

---

[1] අනාදියB

පරිමිතභාෂායෙහි කවර අනුසස යත්? හෙ ද වදාළෙ මැ නො:-

201. "පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා මත්තභාණිස්මිං, කතමෙ පඤ්ච? න මුසා භණති, න පිසුණං භණති, න ඵරුසං භණති, න සම්ඵං පලපති, කායස්ස භෙදා පරම්මරණා සුගති සග්ගං ලොකං උපපජ්ජති"යි.

මෙසෙයින් සුභාෂිතපරිමිතවචනයක් මැ මිස මහානර්ථ කර වූ දුර්භාෂිතවචනයෙක් නො මැ බිණියයුතු වෙ - මෙ මෘෂා වාදයෙහි ආදීනවයැ.

<u>මද්‍යපානයෙහි ආදීනව</u> නම් කවර යත්?

යම් කෙනෙක් හලාහලවිෂ සෙයින් සුරාමෙරයමද්‍යපාන කොළො ද ඔහු නරකයෙහි උපද අනෙකවර්ෂකොටිසහස්‍රයෙහි පැසී එයින් මුක්ත වූ කල්හි උන්මත්ත වෙති, ලජ්ජා නැති වෙති, දීන වෙති, දුඃඛිත වෙති, ශොකී වෙති, විරූප වෙත්.

එයින් කීහ:-

202. "උම්මත්තකා විගතලජ්ජගුණා භවන්ති
දීනා සදා ව්‍යසනසොකපරායනා ච
ජාතා භවෙසු විවිධෙසු විරූපදෙහා
පීත්වා හලාහලවිසංච සුරං විපඤ්ඤා"යි.

සුරා දිව්‍යලොකයට ආවරණ යැ, රාගාදීනට ප්‍රභව යැ, තුන් භවයට පිහිට යැ, තුන්මහාපුරුෂයන් විසින් ගර්හිත යැ, ත්‍රිවිධ දුශ්චරිතයට කාරණ යැ, තුන්ලොවට පිහිට වූ සස්නට විනාශ කරයි.

එයින් කිහ:-

203. "තිදිවාවරණං තිමලපාභවං - තිභවස්ස ගතිං
තිජනාවමතං
තිවිධස්සපි දුච්චරිතස්ස හිතං - තිභවූබභව
සාසනනාසකරං" යි.

ජනයෝ පිපාසාමාත්‍රයක් නො සැහැ මද්‍යපාන කරන්නාහු නරකයෙහි තන්නිදාන වූ ගොරබිරම් දුක් කෙසේ සහනුවහ?

කීයෙ මැ නො:-

204. "පිබන්ති[1] යෙ මජ්ජමයාධුකන්තං
පිපාසමත්තං සහිතා සහන්තා
තෙ තන්නිදානං නරකෙසු දුක්ඛං
කථං සහිස්සන්ති සුඝොරරූපං" යි.

මද්‍යපාන නො කළාහු නරලෙවිහි රෑවන්රස් කඳඹන් වොරජනා සක්රුවනින් සක්වළ විජය කොට සක්විතිරජසිරි විඳිති; දෙවිලෙවිහි නන්විසිතුරුමිණිරසින් අලු රෑවන්විමන් කුස්හි නැටුම් ගදෑවි ගත් සුර කතුන්ගෙ මඳලස්වහස් බැල්මෙන් පිනපිනා දෙවිරජ කෙරෙති; අවසන්හි නුවණතුරඟසියෝ අරී අටඟිමහරිය අරා සසර කතර කැරැ නිවන්පුර වදිත්.

එයින් කිහ:-

205. "නරින්දසම්පත්ති නරින්දලොකෙ
සුරින්දසම්පත්ති සුරඩඹරජ්ජෙ
මුනින්දසම්පත්ති මහාරහන්ත
නදුල්ලභෙකන්තසුරාවිරත්ත" යි.

---

[1] පිවන්ති CE

මද්‍යපානයෙන් අපායභාග් වන පරිදිද් මිනිස්පියට පැමිණ උන්මත්ත වන පරිදිද් දක්වන්නට වදාළහ:-

206. "සුරාමෙරයපානං භික්ඛවෙ ආසෙවිතං බහුලීකතං නිරයසංවත්තනිකං හොති, තිරච්ඡානයොනි සංවත්තනිකං හොති, පෙත්තිවිසයසංවත්තනිකං හොති; යො සබ්බලහුසො සුරාමෙරය පානස්ස විපාකො මනුස්සභූතස්ස උම්මත්තකසංවත්තනිකො හොති" යි.

අපි ච - මද්‍යපානකොට රහමෙදෙන් උදම් වූවාහු ස්වතන්ත්‍ර වැ යන්නට නො නිසි වන බැවින් තත්තත්ස්ථානයෙහි ප්‍රපතනය කෙරෙති, භක්ෂ්‍යාභක්ෂ්‍යවිචාරණයට නො නිසි වන බැවින් තත් තත් ආස්වාදනය කෙරෙති, ස්වචිත්තයෙහි ඊශ්වර නො වන බැවින් මුඛපටහයෙහි පැහැර පර්ෂද්මධ්‍යයෙහි නර්ත්තනය කෙරෙති, ලජ්ජාවිරහිත වන බැවින් නග්න වැ පොරජනා කුල මාර්ගයට අවතීර්ණ වෙති, සුරායෙන් පරිමුෂිතමති වන බැවින් මාතෘදුහිතෘ ආදීන්[1] කෙරෙහි නිරවධි වැ ප්‍රවෘත්ත වෙති, ආත්මයට ද ජීවිතයට ද සම්පතට ද විනාශ කෙරෙත්.

එයින් කීහ:-

207. "ආද්‍යන්තමශිවං මද්‍යං කඃ පිබෙද්විෂයොත්සවම්
ආත්මජීවිතසම්පත්ති විපත්තිමතිදූස්කරම්" යි.

සකලජම්බුද්වීපයෙහි තෙසැටදහසක් නුවර පිරිවරනලද ද්වාරවතී නුවර වාසුදෙව නරෙන්ද්‍රාදි දසබෑරජ්ජුරුවො රහ බී මහමුගුරු ගෙනැ උනුන් සපා මිය අපායභාග් වූහු.

එයින් කීහ ගුරපාදයො:-

---

[1] මාතෘපිතෘ ආදීන්

208. "යාම්පිතවන්තො මදලුප්තසංඥා
වාණ්‍යන්ධකා විස්මාත[1]බන්ධුභාවාඃ
පරස්පරං නිෂ්පිපිෂුර්ගදාභි -
රුන්මාදනී සා නිහිතෙහ කුම්භෙ"යි.

පූර්වදෙවයො සුරාපාන කොට මෙරුමස්තකයෙහි නිපන්න වූවාහු ත්‍රිදශයන් විසින් අපහෘත වැ ක්ෂාරසාගරයෙහි නිමග්න වූහු.

එයින් කිහ:-

209. "යස්‍යා දෙෂාත් පූර්වදෙවාඃ ප්‍රමත්තා
[2]ගෘතාශ්‍රයාස්ත්‍රිදශෛර්ගන්මානාඃ
ත්‍රාණෙෂිණො ලවණජලෙ මමජ්ජු -
ස්තස්‍යාඃ පූර්ණං කුම්භම්මං [3]ත්‍රිණිඩ්වමි"යි.

සුරා උන්මාදවිද්‍යා යැ, ව්‍යසනප්‍රතිෂ්ඨා යැ, දාරිද්‍රයකර යැ, පාපජනක යැ, අපායමාර්ග යැ, අන්ධකාරගර්භයි.

එයින් කිහ:-

210. "උන්මාදවිද්‍යාං ව්‍යසනප්‍රතිෂ්ඨාං
සාක්ෂාදලක්ෂ්මිං ජනනිමඝානාමි
අදෛවසිද්ධාං[4] කලිපද්ධතිං තාං
ත්‍රිණිත සොරාං මනසස්තමිස්‍රාමි"යි.

---

[1] විස්මිත Jātakamālā

[2] ලක්ෂ්මීමොෂං දෙවරාජාදවාප්‍ය
ත්‍රාණපෙක්ෂං සෙතායරාගො මමජ්ජු Jā. mālā

[3] වාණිත Jātakamālā

[4] අලෛතසිඩාං Ja. mālā.

මද්‍යපාන කළාහු භයානක වූ නරකප්‍රපාතයෙහි ප්‍රපතිත වෙති; තිර්‍යක්ප්‍රෙතගතියට උපගත වෙති; එබැවින් සුරා[1] මනසිනුදු දුෂ්ටව්‍ය නො වෙ.

එයින් කීහ:-

211. "නිෂෙව්‍ය යද්දුශ්චරිතප්‍රසක්තාඃ
පතන්ති භීෂ්මාන්නරකප්‍රපාතාන්
තිර්‍යග්ගතිං ප්‍රෙතදරිද්‍රතාඤ්ච
කො නාම තද්ද්‍රෂ්ටුමපි ව්‍යවස්‍යෙත්" යි.

මද්‍යපාන කළාහු ගොරබිරම් දෙලෙන් අවුල් දස යොදුන් දහස් ඇවිදුමඩලෙහි වෙසෙති, තිරිසන්යොන්හි බලු කවුඩු ගර බරණ සිනි පළඟ පණු කිහිඹි වැ[2] පුනපුනා උපදති[3], ප්‍රෙතලොකයෙහි "අහො දුක්ඛං අහො දුක්ඛං" යි ලෙහි පැහැර පැහැර දළ කඳුළු විහදුවති[4], අසුරකාහි බිහිසුණු දරුණු දුක් අනුභව කෙරෙත්.

එයින් කීහ:-

212. "ලඝුරපි ච විපාකො මද්‍යපානස්‍ය යස්මාන්[5]-
මනුජගතිගතානාං ශීලදෘෂ්ටිං ජහාති[6]
ජ්වලිතදහනරොද්‍ර යෙන භූයො'ප්‍යවීචො
නිවසති පිතෘලොකෙ හීනතිර්‍යක්ෂු වෛච" යි.

සුරාපාන ශීල සංක්ලිෂ්ට කෙරෙයි, යශස් නසයි, ලජ්ජා නිරස්ත කෙරෙයි, ප්‍රඥා[7] නැති කෙරෙයි, තත්තද්ගුණයන් විධ්වංසනය කෙරෙ.

---

[1] සුරාපාන B [2] කිහිඹු වැ C [3] උපදුති A [3] උපදිති CDEF
[4] විහිදුති CDEF [5] යඃස්‍යං Ta. mālā [6] ශීලදෘෂ්ටිඃ සහන්ති Ta. mālā
[7] ඤාණ DE

එයින් කීහ:-

213. "ශීලං නිමීලයති හන්ති යශඃ ප්‍රසභ්‍ය
ලජ්ජාං නිරස්‍යති මතිං මලිනී කරොති
යන්නාම පීතමුපහන්ති ගුණාංශ්ච තාංස්තාං-
ස්තත් පාතුමර්හසි කථං නෘප මද්‍යමද්‍ය" යි.

මෙ මද්‍යපානයෙහි ආදීනවයැ.

එබැවින් ප්‍රාණවධ නො ද කටයුත්තෙයැ, නො ද කැරවිය යුත්තෙ යැ, නො ද පැසැස්ස යුත්තෙ යි.

වදාළෙ මැ නො:-

214. "පාණං න හානෙ[1] න ච ඝාතයෙය්‍ය
න චානුජඤ්ඤා හනතං පරෙසං
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
යෙ ථාවරා යෙ ච තසන්ති ලොකෙ" යි.

අදත්තාදාන නො ද ගතයුත්තෙ යැ, නොද ගැන්විය යුත්තෙ යැ, නො ද පැසැස්ස යුත්තෙ යි.

වදාළෙ මැ නො:-

215. "තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය
කිඤ්චි ඤ්චවී සාවකො බුජ්ඣමානො
න හාරයෙ හරතං නානුජඤ්ඤා
සබ්බං අදින්නං පරිවජ්ජයෙය්‍ය" යි.

දිලියෙන අඩ්ගාරකර්ෂුවක්[2] සෙයින් අබ්‍රහ්මචය්‍යා පරිවර්ජන කටයුත්තෙ යැ, බ්‍රහ්මචය්‍යා නො රක්කහෙන්නක්හු විසින් පරදාරපරිග්‍රහ නො කට යුත්තෙ යි.

---

[1] හඤ්ඤෙ D [2] කර්ෂාවක් ADE

වදුළෙ මැ නො:-

216. "අබ්‍රහ්මචරියං පරිවජ්ජයෙය්‍ය
අඞ්ගාරකාසුං ජලිතංව විඤ්ඤූ
අසම්භුණන්තො පන බ්‍රහ්මචරියං
පරස්ස දුරං නාතික්කමෙය්‍ය" යි.

මෘෂාවාද නො ද කිය යුත්තෙ යැ, නො ද කියවිය යුත්තෙ යැ, නො ද පැසැස්ස යුත්තෙ යි.

වදුළෙ මැ නො:-

217. "සභග්ගතො වා පරිසග්ගතො වා
එකස්ස වෙකො න මුසා භණෙය්‍ය
න භාණයෙ භණතං නානුජඤ්ඤා
සබ්බං අභූතං පරිවජ්ජයෙය්‍ය" යි.

සුරා නො ද පිය යුත්තෙ යැ, නො ද පෙවිය යුත්තෙ යැ, නො ද පැසැස්ස යුත්තෙ යි.

218. "මජ්ජඤ්ච පානං න සමාචරෙය්‍ය
ධම්මං ඉමං රොවයෙ යො ගහට්ඨො
න පායයෙ පිවතං නානුජඤ්ඤා
උම්මාදනන්තං ඉති නං විදිත්වා" යි.

මදුහි පාපානි කරොන්ති බාලා
කරොන්ති[1] චඤ්ඤෙපි ජනෙ පමත්තෙ
එතං අපුඤ්ඤායතනං විවජ්ජයෙ
උම්මාදනං මොහනං බාලකන්තං" යි.

මෙයැ පඤ්චදුශ්ශීලයෙහි ආදීනව නම්.

---

[1] කාරෙන්ති

පඤ්චසීල නම් කවර යත්?

ප්‍රාණාතිපාතාදීන් විරතියැ, ඔහු සමාධානොපධාරණයෙන් "ශීල" නම් වෙත් - "ශීල සමාධෝ" යන ධාතුහු ගත් පක්ෂයෙහි කායකර්මාදීන්ගෙ අව්ප්‍රකීර්තතායෙන් සමාධානය "ශීල" නම් වෙයි. "ශීල උපධාරණෙ" යන ධාතුහු ගත් පක්ෂයෙහි සර්වකුශලධර්මයනට ප්‍රතිෂ්ඨා වන බැවින් ආධාරය "ශීල" නම් වෙ. නොහොත් ශිරෝ'ර්ථයෙන් "ශීල" නම් වෙ මැයැ. ශීතලාර්ථයෙන් "ශීල" වෙ මැයැ. ශලනාර්ථයෙන් "ශීල" වෙ මැයැ. ශාලාර්ථයෙන් "ශීල" වෙ මැයි.

කිසෙයැ යත්?

යම්සෙ ශිරශ්ඡෙදෑ කළ කලැ සියලු ආත්මභාවය විනාශයට යෙ දැ වසෙයින් මැ ශීලභෙදෑ වූ කලැ සියලු ගුණශරීරය විනාශයට යෙයි; ඒ හෙතුවින් ගුණශිරශ් නෛරුක්තිකව්ධීන් "ශීල" වෙ. සර්වක්ලෙශපරිදාහ සන්හිදුවන බැවින් ශීතලාර්ථයෙන් "ශීල" වෙයි; සර්වකුශල ධර්මයන්ගෙ ශලන සංවරණ කරන බැවින් ශලනාර්ථයෙන් "ශීල" වෙයි; සර්වකුශලධර්මප්‍රවෙශයට ශාලා වන බැවින් ශාලාර්ථයෙන් "ශීල" වෙ.

එහි ඵල කවර යත්?

සිල් නම් බියමුහුදු තරන මහනැව, රෑ තවරන වණවැටිය, කුසලසඳ[1] දිනූ කිරිමුහුදැ, කුසල්ධර්ම හටන බිජුවළ, ගුණරුවන් පිරූ[2] විදුරුදෙණ, බුහුමන්බිඟුමුට වතුළ[3] කුසුම්කැන, හැමසැපත් කැඳවන අත්සන, මරණ නොබන පුරිසර, මුළුලොව දස්කළ පත්කරණ, සගමහරුක්

---

[1] කුලසඳB [2] පිරිL [3] වතළA

හැමිනු දෙරණ, නා දෙවිබඹගජමුදුන් නමන අකුසුයැ[1], දෙවිලොමහපා අරන රුවන්හිණ, සතුන් සිරිරූ පහයන රසයින, ධර්මසක්විතියහට කිරුළකුළ, හැම මනදෙළ පුරන කප්රුක, සසුන්මහවිල්හි පුබුදු ගුණගඳවහන මහපියුම, තුනුරුවන් උපන් මහසයුර, හැදහැවිලි හස්මුව සරන පියුම් විල, දුගිඅඳුරු හරන සරාහිර, මෙත්ලාල් සිලියෙන වසාවිට කෙලෙස් ගජකුඹු පළන සිහිසපුර, නිවන්පුර වදුන් චක්යහන සසරසයුරු තරත්[2] මහඔය, රජමුව කිරුවකුව මිණිරස්නි දෝ පාපිළ, සිවු අවයට මහහකුල[3] දෑ ජරමරණ මහගිම් නිවනුවට මහමෙයැ, හැමසත්නට අඛාදු දහම්රජ, අට අකණ අඳුරු දුරුකරන සරාහිර අටඅරිකෙලෙසියන් අත්සරි යැ, බුදුසසුන් රක්නා මහමතුරි.

එබැවින් රටසකින් මිරිකෙන ගුරුවපිළවුන් දැක දිවියෙහි ආශා පියා අසුරසමර වන් සක්දෙවිරජහු සෙයින්, ගිලු මසුගෙ අග්වලැ පොපි දැක නහාගෙන දියෙහි බහා හෙවූ කෙකින්න සෙයින්, තුන්හවුරුද්දෙකින් එන පුරුෂයා දැක පණයම්දහසට දික්කළ අත හකුටවාගත් ගණිකාව සෙයින් කුකුළකු නො මරන්නෙන් තමා දහම්ගෙඩියෙහි නොවා හිස් සිදුනට නෑකු පොරොව දැක "කුකුව හිමි මා දිවි තොපට දින්මි" යි කී දරුවා සෙයින්, වටුමස්රස වැළඳියවි වැ තුන් හවුරුද්දක් ගිය කලැ විමසා ගත් දරුවහට කී දැහැමි තිස් රජහු සෙයින්, ප්‍රිය පුතක්හු රක්නා මවක සෙයින්, එක ඇසක් රක්නා මිනිසක්හු සෙයින්, සිල් නො කඩ කොට රක්ක සුතු.

---

[1] අකුස්ස EFG [2] තරන EFG [3] මහහගුළG

එයින් වදාළහ:-

219. "කිකීව අණ්ඩං චමරීව වාලධිං පියංව පුත්තං
නයනංව එකකං
තථේව සීලං අනුරක්ඛමානකා සුපෙසලා
හොථ සදා සගාරවා" යි.

අපි ච - ශීලසම්පන්න පුද්ගල අප්‍රමත්ත වැ මහත් භොගස්කන්ධයට පැමිණෙයි; යශස් දශදිශායෙහි පහළ වෙයි; යම් පර්ෂදකටද් වදී නම් විශාරද වැ එළඹෙයි; අසම්මූඪ වැ කාලක්‍රියා කෙරෙයි; ස්වර්ගයෙහි උපද්දී.

එයින් වදාළහ:-

220. "පඤ්චිමෙ ගහපතයො ආනිසංසා සීලවතො සීලසම්පදාය" යන එවමාදි ධම්දෙසුන්.

අපි ච - බුදුන් දෙව්රම්හි වැඩවසන කල්හි වණිග් ජනයො සත්සියයක්දෙන නැව් නැඟී සමුද්‍රයට ප්‍රස්කන්න වූහ. ඔවුන් නැඟි නැව ශරවෙගයෙන් යන කලැ සත්වන දවස් සමුද්‍රමධ්‍යයෙහි මහත් උත්පාතයෙක් ප්‍රාදුර්භූත විය. රළ නැඟිනැඟී නැව දියෙන් පුරයි; නැව ගැලෙන කලැ ජනයො තමන් තමන්ගෙ දෙවතා[1] නම් කියා අයජ අයජ[2] වලප්ති; ඔවුන් කෙරෙහි එක් පුරුෂයෙක් "මට මෙ භයෙහි ප්‍රතිෂ්ඨා ඇති හො" යි ආවර්ජනා කරනුයෙ තමාගෙ පිරිසුදු සරණසිල් දැක රළපිට පලක් බැඳ හුන්නෙයැ; තුබුවො ඔහුගෙ අභයකාරණ දැක පුළුවුත්හ. හෙ "මම් නැව් නැඟෙන දවස් සඟනට දන් දී සරණසිල් ගත්මි, එහෙයින් මට භය නැතැ" යි

---

[1] දෙවියන් BG [2] අයද අයද B

කීය. "කිම හිමි, එ සරණසිල්හු අන්නට වටිද්දැ ?"යි කීහ. "වටිති[1]"යි කීය. "එසෙ වුව අපට ද් දෙව"යි කීහ. එ මිනිසුන් සිය සිය බැගින් සත් කොටසක් කෙළෙ. එක්බිති පන්සිල් දින. ඔවුන් කෙරෙහි පළමු සියක්දෙන ගොප්මස ගැලෙන පමණ දියෙහි සිට සිල් ගත්හ. දෙවන සියය දණ පමණ දියෙහි සිට සිල් ගත්හ. තුන්වන සියය හිඟී[2] පමණ දියෙහි සිට සිල් ගත්හ. සතරවන සියය නාභි පමණ දියෙහි සිට සිල් ගත්හ. පස්වන සියය තන පමණ දියෙහි සිට සිල් ගත්හ. සවන සියය ගල පමණ දියෙහි සිට සිල් ගත්හ. සත්වන සියය මුවට කරදිය වදනා කලැ සිල් ගත්හු. හෙ ඔවුනට සිල් දී "තොපට අනෙක් පිළිසරණෙක් නැති, සිල් මැ ආවර්ජනා කරව"යි ඝොෂණය කෙළෙ. එ සත්සියක් වෙණෙදෙ එහි මිය ආසන්න කාලයෙහිද් ගත් සීලයෙහි ආනුභාවයෙන් තව්තිසා දෙවිනුවර උපන්හු. ඔවුන් හැමදෙනහට එකතෙනැ විමන් උපන. ආචාර්‍යහට සියක්යොදුන් රන්විමනෙක් විය. සෙසු විමන් එයට පරිවාරවැ පසු පසු වැ සිල් ගතුවනට උනුවෙමින් උපන. හැමයෙන් කුඩා විමන් දෙළොස්යොදුන් වී. ඔහු උපන් විගස තමන් කළ පින්කම් ආවර්ජනා කරනුවො ආචාර්‍ය නිසා එ සම්පත් ලද බැවි දැන "යම්හ බුදුන් කෙරෙහි අපගෙ ආචාර්‍යයාගෙ ගුණ කියම්හ"යි දෙවතාසංයුක්තයෙහි කී පරිද්දෙන් මධ්‍යම යාමයෙහි බුදුන් කරා එළැඹැ ආචාර්‍යයා තමනට වහල් වූ පරිදි කියා බුදුන් වැඳ පැදකුණු කොට දෙවිලොගියො .

එයින් වදාළහ:-

221. "පඤ්චහි ගික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාහතං නික්ඛිත්තො එවං සග්ගෙ කතමෙහි පඤ්චහි ?

---

[1] වටතිB [2] හිඟීB

පාණාතිපාතා පටිවිරතෝ හොති, අදින්නාදනා පටිවිරතෝ හොති, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතෝ හොති, මුසාවාදා පටිවිරතෝ හොති, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතෝ හොති; ඉමෙහි ඛෝ භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතෝ යථාභතං නික්ඛිත්තෝ එවං සග්ගෙ"යි.

අපි ච - කසුප් සම්මාසම්බුදුන් දවස සොරහු දහසක් දෙන ජනපද මනුෂ්‍යයන් විසින් ලුහුබඳනාලද්දහු පලාගොස් අරණ්‍යයට වැද සැඟවෙන්නට නිසි ගහනයක් නො ලදින් වැළත ගල්තලෙක්හි වසන තපස්විතෙනකුන් දැක "වහන්සෙ, අපට සරණවව"යි කීහ.

ඔහු "තොපට සිල් හා සම පිළිසරණෙක් නැති; හැම දෙනෙ පන්සිල් ගන්ව" යූහු.

සොරහු මැනැවැයි සිල් සමාදන් වූහු[1]. තෙරහු "තෙපි සිල්වත් වව, දැන් තොප ජීවිතවිනාශ වන කල ද් පරදෙවඟ නහමක් කරව"යි අවවාද කළහ. ඔවුන් මැනැවැයි ගිවිසි කල්හි ජනපදමනුෂ්‍යයො ගොස් සොරුන් දැක හැම දෙනාම මැරූහු. ඔහු මිය කාමාවචර දිව්‍යලොකයෙහි උපන්හු. ඔවුන් කෙරෙහි සොරදෙවු[2] දෙවදිව්‍යපුත්‍ර විය. කුබුවො ඔවුහට මැ පරිවාරදිව්‍ය පුත්‍ර වූහ. ඔවුහු අනුලොම ප්‍රතිලොමයෙන් සදෙව්ලොව දිව්‍ය සම්පත් වළඳා එක් බුදුන්තර යක් ඉක්මකළ අප බුදුන් උපන් කල දිව්‍යලොකයෙන් සැවැ සැවත්නුවරට නුදුරු තන්හි දහසක් කෙවුළන් ඇති ගමෙක්හි උපැදැ වැඩිවිය පැමිණ සූත්‍රනිපාතයෙහි නී පරිද්දෙන් කපිල මහ්‍යයා ගෙන බුදුන් කරා දෙවිරම් වෙහෙරට ගොස් බණ අසා මහණ වැ රහත් වූහු.

---

සම්බුදු දෙනෙ :- [1]කළහ
[2]දෙව[2]B ගියකලැ BEG

එයින් වදාළහ:-

222. "ඤාතීනඤ්ච පියො හොති මිත්තෙසු ච විරොචති
කායස්ස භෙදා සුගතිං උපපජ්ජති සීලවා" යි.

අපි ච - රජගහනුවර දරිද්‍ර වූ නිවකම් කරන සර්ජනයන් විසින් ගර්හිත බොහොදෙනා වඳනා[1] සුනිත නම් චණ්ඩාලපුත්‍රයෙක් පැවිදි වැ ශීලාදිගුණයෙහි පිහිටියෙ එම ජන්මයෙහි ශත්‍ර බ්‍රහ්මාදීන් විසින්:-

223. "නමො තෙ පුරිසාජඤ්ඤ නමො තෙ පුරිසුත්තම
යස්ස තෙ ආසවා ඛීණා දක්ඛිණෙය්‍යොසි මාරිස"

යනාදීන් නමස්කාර කොට වඳනා පුදනලද.

බුදුහු ඔවුන් දවිපිරිස් පිරිවරා සිටියන්[2] දැක සිනා පහළ කොට ඔවුන් මහබඹහට ද් උතුම් සෙ වදාළො.

කියෙ මැනො ච මැ මහතෙරුන් විසින්:-

224. "කතො දිස්වාන මං සත්ථා දෙවසඞ්ඝපුරක්ඛතං
සිතං පාතු කරිත්වාන ඉමමත්ථං අභාසථ.

තපෙන බ්‍රහ්මචරියෙන සඤ්ඤමෙන දමෙන ච
එතෙන බ්‍රාහ්මණො හොති එතං බ්‍රාහ්මණමුත්තමං" යි.

මෙසෙයින් සිල් ලොකික ලොකොත්තර ඵෙහලොකික පාරලොකික සම්පතට කාරණයි.

එයින් වදාළහ:-

225. "සීලමෙවෙධ සික්ඛෙථ අස්මිං ලොකෙ සුසික්ඛිතං
සීලං හි සබ්බසම්පත්තිං උපනාමෙති සෙවිතං.

---

[1] වඳුනා ACD [2] සිටියවුන් B

සීලං රක්ඛස්‍ය මෙධාවී පත්ථයානෝ තයෝ සුඛෙ
පසංසං චිත්තලාභඤ්ච පෙච්ච සග්ගෞ ච මොදනං.

සීලවා හි බහූ මිත්තෙ සඤ්ඤමෙනාධිගච්ඡති
දුස්සීලෝ පන මිත්තෙහි ධංසතෙ පාපමාවරං

අවණ්ණඤ්ච අකිත්තිඤ්ච දුස්සීලෝ ලභතෙ නරෝ
වණ්ණං කිත්තිං පසංසඤ්ච සදා ලභති සීලවා.

ආදි සීලං පතිට්ඨා ච කල්‍යාණානඤ්ච මාතුකං
පමුඛං සබ්බධම්මානං තස්මා සීලං විසොධයෙ.

වෙලා ච සංවරෝ සීලං චිත්තස්ස අභිභාසනං
තිත්ථඤ්ච සබ්බබුද්ධානං තස්මා සීලං විසොධයෙ.

සීලං බලං අප්පටිමං සීලං ආවුධමුත්තමං
සීලං ආභරණං සෙට්ඨං සීලං කවචමබ්භුතං.

සීලං සෙතු මහෙසක්ඛා සීලං ගන්ධා අනුත්තරෝ
සීලං විලෙපනං සෙට්ඨං යෙන වාති දිසොදිසං.

සීලං සම්බලමෙවග්ගං සීලං පාථෙය්‍යමුත්තමං
සීලං සෙට්ඨා අතිවාහෝ යෙන වාති දිසොදිසං.

ඉධෙව නින්දං ලභති පෙච්චාපායෙ ච දුම්මනෝ
සබ්බත්ථ දුම්මනෝ බාලෝ සීලෙසු අසමාහිතෝ.

ඉධෙව කිත්තිං ලභති පෙච්ච සග්ගෞ ච සුම්මනෝ
සබ්බත්ථ සුමනෝ ධීරෝ සීලෙසු සුසමාහිතෝ.

සීලමෙව ඉධ අග්ගං පඤ්ඤවා පන උත්තමෝ
මනුස්සෙසු ච දෙවෙසු සීලපඤ්ඤාණතෝ ජයං" යි.

යම් ගිහිමිනිසක්හුගෙ සිල් නිර්මල[1] වී ද ඔහුගෙ ජන්ම ලාභ සඵල වෙයි, හෙ අනෙකානාශංසලාභි වෙ. යම් භික්ෂුවක්හුගෙ ශීල නිර්මල වී ද ඔහුගෙ ප්‍රව්‍රජ්‍යා සඵල වෙයි, හෙ ද[2] අනෙකානාශංසලාභි වෙ.

එයින් කීහ:-

226. "තස්ස පාසාදිකං හොති පත්තචීවරධාරණං
පබ්බජ්ජා සඵලා තස්ස යස්ස සීලං සුනිම්මලං.

අත්තානුවාදදිහයං සුද්ධසීලස්ස භික්ඛුනො
අන්ධකාරං විය රවිං හදයං නාවගාහති.

සීලසම්පත්තියා භික්ඛු සොභමානො තපොවනෙ
පභාසම්පත්තියා වන්දෙ ගගනෙ විය සොභති.

සීලගන්ධසමො ගන්ධො කුතො නාම භවිස්සති
යො සමං අනුවාතෙ ච පටිවාතෙ ච වායති.

සග්ගාරොහනසොපානං අඤ්ඤං සීලසමං කුතො
ද්වාරං වා පන නිබ්බානනගරස්ස පවෙසනෙ.

ගුණානං මූලභූතස්ස දොසානං බලඝාතිනො
ඉති සීලස්ස විඤ්ඤෙය්‍යං ආනිසංසකථාමුඛං" යි.

යථොක්ත ක්‍රමයෙන් සත්සියයක් වෙළඳනුද් දහසක් සොරනුද් මුහුත්තයෙක්හි රැකි පන්සිලින් එබඳු ස්වර්ගමොක්ෂසුඛ ලද වන[3] බැවින් අනෙකදිවසමාසසංවත්සරයෙහි අඛණ්ඩයැ අච්ඡිද්‍රයැ අශබලයැ අකල්මාෂයැ භූජිෂ්‍යයැ විද්වත්ප්‍රශස්තයැ[4] අපරාමෘෂ්ටයැ සමාධිසංවර්තනිකයැ යන අෂ්ටාඞ්ගසමන්වාගත කොට පඤ්චශීල අෂ්ටාඞ්ගශීල[5] දශශීල ප්‍රව්‍රජ්‍යාශීල ප්‍රාතිමොක්ෂ සංවරශීල ඉන්ද්‍රිය සංවරශීල ආජීවපාරිශුද්ධිශීල ප්‍රත්‍යය සන්නිශ්ශ්‍රිතශීල යාවජ්ජීවයෙන් පිරූවන් ලබන ස්වර්ගමොක්ෂ සම්පත් කෙ නම් කියනුවහ?

---

[1] නිමල් B [2] හෙත් A [3] ලදුවන B [3] ලදමනා A
[4] විඥප්‍රශස්ත B [5] අෂ්ටශීල ABC

ආයස්මියො වනාහි භවාන්තරගත කල ද තමන් ආයුෂ්මත් බවී නො දන්නාහුද් දෙවිරජක්හු අහස සිට තමන් විමසනු සඳහා "මෙ පිපිළිකාව මරා පිහි නම් සක්විති වැ සියලු සක්වළ ඇබ රජ කෙරෙහි" කිව ද ඇය දිවි නො ද ගළවති. "නො මෙ පිපිළිකාව මිරිකා නොපිහි නම් තා හිස සිඳපියමි" කියා තමන් හිරශ්ඡෙද කරත් ප්‍රාණවධ නො කෙරෙත්[1] - අදත්තා දානාදිය ද මෙ මැ නයයි.

මෙ පඤ්චශීලය.

<u>පොෂථශීල</u> නම් කවර යත්?

අෂ්ටාඞ්ගසමන්වාගත[2] කොට පොහොදවස ගෘහස්ථයන් විසින් රක්ක යුතු ශීලයි.

කිසෙයැ යත්?

යමෙක් "ආයස්මියො යාවජ්ජීවයෙන්[3] ප්‍රාණාතිපාත පරිත්‍යාග කොට යථිසත්වහිතානුකම්පී වැ වෙසෙති, මම අද මෙ රෑ මෙ දවල් ප්‍රාණාතිපාත පරිත්‍යාග කොට සථිසත්වහිතානුකම්පිවැ වෙසෙමි, මෙ ඇඟින්[4] ආයස්යන් කළා කෙරෙමි, පෙහෙවස් වෙසෙමි" යි පළමුවන ඇඟින්[4] සමන්වාගත වෙ ද - "ආයුෂ්මියො යාවජ්ජීවයෙන් අදත්තාදාන පරිත්‍යාග කොට අනෙයවිත්තයෙන් වෙසෙති, මම ද අද මෙ රෑ මෙ දවල් අදත්තාදාන පරිත්‍යාග කොට අනෙයවිත්තයෙන් වෙසෙමි, මෙ ඇඟින්[4] ආයුෂ්මත් කළා කෙරෙමි, පෙහෙවස් වෙසෙමි" යි දෙවන ඇඟින් සමන්වාගත වෙද "ආයස්මියො යාවජ්ජීවයෙන් අබ්‍රහ්මචර්‍යා පරිත්‍යාග කොට බ්‍රහ්මචාරී වැ වෙසෙති, මම ද අද මෙ රෑ මෙ දවල් අබ්‍රහ්මචර්‍යා පරිත්‍යාග කොට බ්‍රහ්මචාරී වැ වෙසෙමි, මෙ ඇඟින් ආයස්මියන්

---

[1] නො ද මරත් F
[2] සමන්නාගත AEBF
[3] යාවජීවයෙන් EF
[4] අඟින් G

කළා කෙරෙමි, පෙහෙවස් වසෙමි" යි තුන්වන ඇඟින් සමන්වාගත වෙ ද - "ආයස්මියො යාවජ්ජීවයෙන් මුසාවාද පරිත්‍යාග කොට සත්‍යවාදී වූ වෙසෙති, මම ද අද මෙ රෑ මෙ දුවල් මුසාවාද පරිත්‍යාග කොට සත්‍යවාදී වූ වෙසෙමි, මෙ ඇඟින් ආයස්මියන් කළා කෙරෙමි, පෙහෙවස් වෙසෙමි" යි සතරවන ඇඟින් සමන්වාගත වෙ ද - "ආයස්මියො යාවජ්ජීවයෙන් සුරාමෙරයමද්‍යපානපරිත්‍යාග කොට එයින් විරත වූ වෙසෙති, මම ද අද මෙ රෑ මෙ දුවල් සුරාමෙරයමද්‍යපාන පරිත්‍යාග කොට එයින් විරත වූ වෙසෙමි, මෙ ඇඟින් ආයස්මියන් කළා කෙරෙමි, පෙහෙවස් වසෙමි" යි පස්වන ඇඟින් සමන්වාගත වෙ ද - "ආයස්මියො යාවජ්ජීවයෙන් එකභක්තික වූ විකාල භොජන පරිත්‍යාග කොට එයින් විරත වූ වෙසෙති, මම ද අද මෙ රෑ මෙ දුවල් එකභක්තික වූ විකාල භොජන පරිත්‍යාග කොට එයින් විරත වූ වෙසෙමි, මෙ අඟින් ආයස්මියන් කළා කෙරෙමි, පෙහෙවස් වෙසෙමි" යි සවන අඟින් සමන්වාගත වෙ ද - "ආයස්මියො යාවජ්ජීවයෙන් නෘත්‍යගීතවාදිත විභූකදර්ශනමාලා ගන්ධවිලෙපනධාරණමණ්ඩන පරිත්‍යාග කොට එයින් විරත වූ වෙසෙති, මම ද අද මෙ රෑ මෙ දුවල් නෘත්‍යගීත වාදිත විභූක දර්ශනමාලාගන්ධවිලෙපනධාරණමණ්ඩන පරිත්‍යාග කොට එයින් විරත වූ වෙසෙමි, මෙ අඟින් අයස්මියන් කළා කෙරෙමි, පෙහෙවස් වෙසෙමි" යි සත්වන අඟින් සමන්වාගත වෙ ද - "ආයස්මියො යාවජ්ජීවයෙන් උච්චාසයන මහාසයන පරිත්‍යාග කොට නීචාසනයෙහි ශය්‍යා කෙරෙති, මම ද අද මෙ රෑ මෙ දුවල් උච්චාසයන මහාසයන පරිත්‍යාග කොට නීචාසනයෙහි ශය්‍යා කෙරෙමි, මෙ අඟින් ආයස්මියන් කළා කෙරෙමි, පෙහෙවස් වෙසෙමි" යි අටවන අඟින් සමන්වාගත වෙ ද - යන මෙ අෂ්ටාඞ්ගයෙන් යමන්වාගත කොට වුසූ පෙහෙවස් මහත්ඵල මහානිසංස වේ.

එසින් වදළහ:-

227. "එවං උපවුත්ථෝ බෝ විසාඛෙ අධාඩඪ සමන්නාගතෝ උපෝසථෝ මහාලෝ හෝති මහානිසංසෝ මහාප්‍රතිඵෝ මහාවිප්ඵාරෝ" යි.

කිළිටි[1] කැටපත් සැඳ පැළඳ ඇවිදි[2] අත්බවි බලන කලැ හොඹන නො වෙයි, පිරිසුදුකලැමැ හොබී[3]. එසේසින්මැ කිළිටි සිත වුසූ[4] පෙ- හවස් මහත්වල වන්නෙ නො වෙයි, පිරිසුදු සිත මැ මහත්වල වෙයි. එබැවින් අපට පෙනෙවෙමියි සිතූ දවස් මෙසිද් මෙසිදු කරන්නෙ යසි ආහාරාදියට විධාන කට යුත්තෙයැ. පෝසාදවස් රැසින් මැ භික්ෂුවතු හෝ භික්ෂුණියක හෝ පළ පුපුදු උපාසකයතු හෝ උපාසිකාවක හෝ චිත්තරා නෙනතුන් නෙරෙහි වැහැඳ හොට පෝසථාඩඪ සමාදන කට යුත්තෙයැ. ඔවුන් පළ පුපුදු වුවහොත් "බුඛප්‍රඥා පෝසථාඩඪ අධිෂ්ඨාන කෙරෙමි" යි ඉවා හැර්විය යුත්තෙයැ. අනෙකක්‍රු නො ලදහොත් තමා ඉවා ගතයුත්තෙයැ. ඉවා ගත්තා කලැ වාහි පෙදෙ කවයුත්තෙයැ. පෙනෙවස් වසනුවතු විසින් පරපීඩාවෙන් යුක් නම්නා නො කැරවිය[5] යුත්තෙයැ. අයවැය[6] ගණන් හොට දවස් නො දැයිය යුත්තෙයැ. එහි ලදු අතර නිත්‍ය සහිත භික්ෂුවන්හු ඔය වළඳු විහාරයට ගොස් බණ නො අසිය යුත්තෙයැ. චිත්තරා නම්ඵානයන් හොමනාකාර කට යුත්තෙයි.

මෙසෙ වුසූ පෙනෙවස්හි වල කවර යන්? යමෙන් ගෙරිහලයන් සෙසින් සම වූ ඔබගමහාජනපදයන් අලඩාන වූ සිව්[7] පෙණ සතුරුවසින්[8] පරිපූර්ණ වූ දඹදිව් තෙලෙහි

---

[1] කිළිටි CE [1] කිළුටු BD [2] සිටී E [4] විසූ B [3] හොබී CDE
[5] නොදකැරවිය BLG [6] ආයව්‍යය CDEG [7] සිව් B
[8] සතුරුවසින් CDE

චක්‍රවර්ත්ති වැ රජ කෙරෙ ද, එබඳු චේශ්‍වර්‍ය අහොරාත්‍රයෙහි[1] වුසූ පෙහෙවස්හි පින්කම් සොළොසක් කොට බෙදූ කලැ එයින් එක්භාගයක් අගනෙ නො වෙයි; එයට හෙතු කවර යත්? මානුෂක වූ චක්‍රවර්ත්තිරාජ්‍ය දිව්‍යසුඛ පිණිස පරිත්ත වෙ.

එයින් විදාළහ:-

228. "සෙය්‍යථාපි විසාඛෙ ඉමෙසං සොළසන්නං මහාජනපදානං පහූතසත්තරතනානං ඉස්සරාධිපච්චං රජ්ජං කාරෙය්‍ය, සෙය්‍යථීදං අඞ්ගානං මගධානං කාසීනං කොසලානං වජ්ජිනං මල්ලානං වෙතීනං වඞ්ගානං කුරූනං පඤ්චාලානං මච්ඡානං සූරසෙනානං අස්සකානං අවන්තීනං ගන්ධාරානං කම්බොජානං[2], අට්ඨඞ්ගසමන්නා ගතස්ස උපොසථස්ස එතං[3] කලං නාග්ඝති සොළසිං තං කිස්ස හෙතු? කපණං විසාඛෙ මානුසකං[4] රජ්ජං දිබ්බං සුඛං[5] උපනිධාය" යි.

මෙහි දිව්‍යසුඛ නම් කවර යත්?

චාතුර්මහාරාජික නම් දිව්‍යලොකයෙහි දෙවියො මනුෂ්‍ය ගණනායෙන් අනූලක්ෂයක් හවුරුදු දිව්‍යසුඛ[6] අනුභව කෙරෙති. තව්තිසා වැසි දෙවියො තුන්කෙළසැටලක්ෂයක්, යාමයො තුදුස් කෙළ සතලිස් ලක්ෂයක්, තුෂිතයො සත්පනස්කෙළසැටලක්ෂයක්, නිර්මාණරතීහි දෙසියතිස්කෙළ සතලිස්ලක්ෂයක්, පරනිර්මිත වශවර්ත්තීහි නවසියඑක්විසිකෙළසැටලක්ෂයක් හවුරුදු දිව්‍යසුඛ අනුභව කෙරෙත්.

යම් ස්ත්‍රියක් හො පුරුෂයෙක් හො අෂ්ටාඞ්ගසමන්වාගත කොට පෙහෙවස් වුසූවාහු වූහු නම් ජීවිතපර්‍යවසානයෙහි

---

[1] අහොරාත්‍රි ABEF [2] කාම්බොජානං AF [3] එකං BE
[4] මානුසිකං E [5] අදිබ්බසුඛං A [6] සුව DE

චාතුම්මහාරාජිකයන් කෙරෙහි උපදිත් මැ යැ. තව්තිසා[1]වැසි දෙවියන් කෙරෙහි, යාමයන් කෙරෙහි, තුෂිතයන් කෙරෙහි, නිම්මාණරතීන් කෙරෙහි, පරනිම්මිතවශවර්තීන් කෙරෙහි උපදිත් මැසි.

වදාළෙ මැ නොවැ:-

229. "ඨානං ඛෝ පනෙතං විජ්ජති යං ඉධෙකච්චෝ ඉත්ථී වා පුරිසෝ වා අට්ඨඞ්ගසමන්නාගතං උපෝසථං උපවසිත්වා කායස්ස භෙදා පරම්මරණා චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය. තාවතිංසානං දෙවානං, යාමානං දෙවානං, තුසිතානං දෙවානං, නිම්මානරතීනං දෙවානං, පරනිම්මිතවසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජෙය්‍ය" යි.

මෙයැ "පොෂධශීල" නම්.

මෙසෙ පෙහෙවස් වුසූ ජනයන් පොහොය පොහොය අවුද් දෙවියෝ රන්පත ලියා ගන්ති[2]. කියෙයැ යත්? අෂ්ටමියැ සතරවරම් මහරජුන්ගෙ පරිවාරකදෙවතාවෝ අවුද් තත්තදිග්භාගයට එළැඹැ තමනට පඩුරු ගෙන පෙරමඟට එන තන්වැසි[3] දෙවියන් විසින් එහි මවුපියන් පුස්නන් මහණුවම් කරනුවන් බ්‍රාහ්මසරවස් රක්නන් කුලදෙටුවන් පුදනුවන් පෙහෙවනුවන් සරණසිලැ පිහිටියන් තුනුරුවන්හි මල්දාම්ගඳපහන් පුදනුවන් දන් දෙනුවන් හල් පැන් පොකුණු හේ කරනුවන් මහ[4] සොඳනුවන් පිළිවිස ඔවුන්ගෙ නම්ගොත් රන්පත ලියාගන්ති. චාතුද්දීපියැ සතරවරම් මහරජුන් දරුවෝ අවුද් එසෙයින් මැ පින් කළ ජනයන් රන්පත ලියාගන්ති. පන්නරසියැ සතරවරම් මහරජහු තුම්[5]මැ අවුද් පින් කළ ජනයන් සමනා රන්පත ලියා ගනිත්.

---

[1] තව්තියැ AB [2] ගනිත් G [3] තැන්වැසි E
[4] ම oA [5] තුම්හු D

එසින් වදළහ:-

230. "අඩ්ඩමියං භික්ඛවෙ පඤ්ඤස්ස චතුන්නං මහාරාජානං අමච්චා පාරිසජ්ජා ඉමං ලොකං අනුවිචරන්ති, කච්චි බහූ මනුස්සා මනුස්සෙසු මත්තෙය්‍යා පෙත්තෙය්‍යා සාමඤ්ඤා බ්‍රහ්මඤ්ඤා කුලෙ ජෙට්ඨාපචායිනො උපොසථං උපවසන්ති පටිජාගරොන්ති පුඤ්ඤානි කරොන්තීති. චාතුද්දසිම්පි භික්ඛවෙ පඤ්ඤස්ස චතුන්නං මහාරාජානං පුත්තා ඉමං ලොකං අනුවිචරන්ති, කච්චි බහූ මනුස්සා මනුස්සෙසු - පෙ - පුඤ්ඤානි කරොන්තීති. තදහු භික්ඛවෙ උපොසථෙ පන්නරසෙ චත්තාරො මහාරාජා සාමඤ්ඤව ඉමං ලොකං අනුවිචරන්ති, කච්චි බහූ මනුස්සා මනුස්සෙසු - පෙ - පුඤ්ඤානි කරොන්තීති"යි.

මෙසෙයින් පින්[1] කළවුන්ගෙ නම්ගොත් රන්පත ලියාගෙන තව්තිසා[2] දෙවිනුවර සුධම්මි දෙවිසභායෙහි දෙවිපිරිස් මැද ඇර කියවති; ඉදින් පින් කළාහු මඳ වූහු නම් දෙවියො "රමණී දසයොදුන් දහස් දෙවිනුවර සිස් වෙයි, සතරඅපාය පිරියෙයි[3], පරිපූර්‍ණී වූ දෙවිනුවර දෙවිපිරිස් මැද[4] සැණ[5] කෙළනා නො ලබමිහ"යි රහැණි වෙත්.

231. "තමෙනං භික්ඛවෙ චත්තාරො මහාරාජා[6] දෙවානං තාවතිංසානං සුධම්මායං සභායං සන්නිසින්නානං සන්නිපතිතානං ආරොචෙන්ති, අප්පකා බො මාරිසා මනුස්සා මනුස්සෙසු - පෙ - පුඤ්ඤානි කරොන්තීති, තෙන භික්ඛවෙ දෙවා තාවතිංසා අනත්තා මනා හොන්ති, දිබ්බා වත හො කායා පරිහායිස්සන්ති, පරිපූරිස්සන්ති අසුරා කායාති"යි.

ඉදින් පින් කළාහු බොහො වූහු නම් සතුටු වෙත්.

වදළෙ මෑ නො:-

---

[1] පින්කම්B [2] තව්තිසැAB [3] පිරෙයිB
[4] දෙවිපිරිස්මැදදෙවිනුවරEF [5] සණB [6] මහාරාජානොB

232. "තෙන භික්ඛවෙ දෙවා තාවතිංසා අත්තමනා හොන්ති, දිබ්බාවත හො කායා පරිපූරිස්සන්ති පරිහායිස්සන්ති අසුරා කායාති" යි.

<u>මනාපකායික දෙවතාවො</u> නම් කවරහ යත්?

"මනාපකාය" නම් ලද් නිර්මාණරතිදෙවලොකයෙහි මනාපකායිකා නම් දෙවතාවන් කෙරෙහි බොහො දෙවතා කෙනෙක් තමන්ගෙ සම්පත් බලා "මෙ සම්පත් කා නිසා ලදම්හ[1] හො?" යි ආවර්ජනා කරන්නාහු අනුරුත් මහතෙරුන් දැක "අපි මොවුන් වහන්සෙ පූර්වජන්මයෙහි චක්‍රවර්ත්තිරාජ්‍යය කරනුවනට පාදපරි චාරිකා වැ මොවුන් දුන් අවවාදයෙහි සිට මෙ සම්පත් ලදම්හ[1], යම්හ මහතෙරුන් ඇර මෙ සම්පත් අනුභව කරම්හ" යි දිවසභාගයෙහි මැ බැස ඝොෂිතාරාමයෙහි දිවාවිහාරගත මහතෙරුන් කරා එළැඹැ වැඳ එකත්පස්වැ සිට "වහන්සෙ, ඇපි මනාපකායිකා නම් දෙවතා වම්හ, තුන් තැනෙක්හි ඓශ්වර්‍ය්‍ය ඇත්තම්හ:- යම් යම් වර්ණයක් කැමැතිවූමො නම් එවැනි වර්ණ ලබම්හ, යම් යම් ස්වරයක් කැමැති වූමො නම් එ වැනි ස්වර ලබම්හ, යම් යම් සුඛයක් කැමැති වූමො නම් එ වැනි සුඛ ලබම්හ. මෙ තුන්ස්ථානයෙහි අප කැමැති කැමැති සෙ ඓශ්වර්‍ය්‍ය ලබම්හ[2]" යි යූහු.

එ අසා මහතෙරහු "මෙ දෙවතාවන් හැමදෙනා නීලවර්ණ නීලවස්ත්‍ර නීලාලඞ්කාර වුවහොත් මැනැවැ" යි සිතූහු. ඒ දෙවතාවො මහතෙරුන් සිත් දැන හැමදෙනෙ මැ නීලවර්ණ නීලවස්ත්‍ර නීලාලඞ්කාර වූහු. එ දැක මහතෙරහු "මෙ දෙවතාවන් හැමදෙනා පීතවර්ණ පීතවස්ත්‍ර පීතාලඞ්කාර වුවහොත්, ලොහිත[3] වර්ණ ලොහිත වස්ත්‍ර ලොහිතාලඞ්කාර වුවහොත්, අවදාතවර්ණ

---

[1] ලදුම්හG [2] කරම්හBG [3] ලොහිතකD

අවදාත වස්ත්‍ර අවදාතාලඞ්කාර වුවහොත් මැනැවැ"යි සිතූහු. දෙවතාවො මහතෙරුන් සිත් දැන කැමැති කැමැති සෙ මැවී ඇතැම්හු නර්ත්තනයට[1] වන්හ, ඇතම්හු ගායනාවට[2] වන්හ, ඇතම්හු හස්තතාලයට වන්හු. ඔවුන්ගෙ පළඳනෙහි[3] හඬ පසඟතුරුරැවී සෙයින් රජනීය විය, කමනීය විය, මදනීය වී.

එයින් වදාළහ:-

233. "සෙය්‍යථාපි නාම පඤ්චඞ්ගිකස්ස තූරියස්ස සුවිනීතස්ස සුප්පටිපතාළිතස්ස කුසලෙහි සමන්නාගතස්ස[4] සද්දො හොති, වග්ගූ ච රජනීයො ච කමනීයො ච මදනීයො ච, එව මෙව තාසං දෙවතානං අලඞ්කාරානං සද්දො හොති වග්ගූ ච රජනීයො ච කමනීයො ච මදනීයො ච"යි.

එසඳ මහතෙරහු "මෙ දෙවතාවන් කරන දෑ අසාරුප්‍යය"යි ඇස්පියාලූහු. "වහන්සෙ නො කැමැති දෑ වනැ"යි දෙවතාවො අන්තරහිත[5] වූහු. මහතෙරහු සවස හුනස්නෙන් නැඟි බුදුන් කරා එළැඹැ වැඳ එකත්පස් වැ හිඳ එ දෙවතාවන් කළ බිණු දෑ කියා "වහන්සෙ, කිතෙක් ධර්මයෙන් සමන්වාගත ස්ත්‍රී මනාපකායිකා නම් දෙවතාවන් කෙරෙහි උපද්දි හො?"යි පුළුවුත්හු.

එසඳ බුදුහු අෂ්ටධර්මයෙකින් සමන්වාගත ස්ත්‍රිය මනාපකායිකා නම් දෙවියන් කෙරෙහි උපදනා පරිදි වදාළො.

කවර අෂ්ටධර්මයෙනැ යත්?

යම් ස්ත්‍රියක් ස්වාමිහි කෙරෙහි අනුකම්පායෙන් ශය්‍යාස්ථානයෙන් පළමු නැඟී පරිජනයනට කටයුතු යොදා ගෙදොර හමඳවා ක්ෂීරදොහනාදි කරවා ස්වාමිහි මනවඩනා නියායෙන්

---

[1] නෘත්‍යයට AD [2] ගායනයට B [3] පළඳුනෙහි ACEF
[4] සුසමන්නාගතස්ස AB [5] අන්තර්හිත EFG

පිළිපැද පෙම්වඩනා නියායෙන් බැණ ස්නානභොජනාදි පිළිවිස සපයා සායාහුනයෙහි ලදමනාතාක් දෙනහට භොජන දෙවා නො ලද්දනට භොජන සම්පාදනය කරවා දී ව්‍රජාගත[1] ගොගණයන් සමන්වා ද්වාරකොෂ්ඨාදිය රක්ෂාවිධාන කරවා කෙසිමුදු ගෙන්වා ගෙන අගුප්තභාණ්ඩ ගොපන කොට අනෙක් දවස් කළමනා කාර්‍ය්‍ය විචාරා පශ්චාත් ශය්‍යා කෙරෙ ද;ස්වාමිහි මවුපියනට ද් ඔව්හට ගුරුවැ සිටි මහණබමුණනට ද් සත්කාර ගරුකාර කොට ආවානට හිඳුනා අසුන් දී පා දෙවා භොජන දන කෙරෙ ද;ස්වාමිහිගෙ සූත්‍රකර්තනාදි මෙහෙයැ දක්ෂ වැ ගත් ගත් දැය අනලස වැ කළමනා තාක් දැ කොටැ කැරවිය යුතු තාක් දැ කරවා ද; ස්වාමිහිගෙ දස්දැස්සන් දෙවරු මෙහෙ කළානට ද එක්වරු මෙහෙ කළානට ද මෙහෙ නො කළානට ද කළමනා දැන ඉදින් හිලන් වූහු නම් ඔවුන්ගෙ බලාබල දැන භෛෂජ්‍ය භොජනයෙන් සඞ්ග්‍රහ කෙරෙ ද; ස්වාමිහි විසින් සඤ්චිත ධනධාන්‍ය සුරැකී කොට තබා ද, නො ධූර්ත වැ නො සෙරවැ නො රහසොඬ වැ වැටෙ ද; ශරණ ශීලයෙහි ප්‍රතිෂ්ඨිත ද; නො මසුරු වැ දනසංවිභාගයෙහි රත ද; යන මෙ අෂ්ටධර්මයෙන් සමන්වාගත ස්ත්‍රී "මනාපකායිකා" නම් දෙවතාවන් කෙරෙහි උපද්දි.

වදළෙ මැ නො:-

234. "ඉමෙහි ඛො අනුරුද්ධ අට්ඨහි ධම්මෙහි සමන්නාගතො මාතුගාමො කායස්ස භෙදා පරම්මරණා මනාපකායිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජති"යි.

මොහුයැ "මනාපකායිකා" නම් දෙවතාවො.

ස්ත්‍රීන් අහිරු පවන්නට නිසි[2] හෙතු කවර යත් ?

ක්‍රොධ නො කළාහු යහපත් වෙති, දන් දුන්නාහු සුවපත් වෙති, ඊර්ෂ්‍යාවමාන නො කළාහු අනුභාවසම්පත් හා පරිවාර සම්පත් ඇති වෙත්.

---

[1] ව්‍රජගත ACEF [2] නිසි ab. in CEF

කිසෙයෑ යත්?

එක්සමයෙක්හි මල්ලිකා දෙවී දෙවිරම් ගොස් බුදුන් වැඳ එකත්පස් වැ හිඳ සතර පැනයක් පුවවුත්හු[1]. "ඇතමී ස්ත්‍රී කෙනෙක් දුර්භී වෙති දරිද්‍ර වෙති අල්පෙශාක්‍ය වෙති, ඇතමී කෙනෙක් විරූප වෙති ආඩ්‍ය වෙති මහෙශාක්‍ය වෙති. ඇතමී කෙනෙක් අභිරූප වෙති දරිද්‍ර වෙති අල්පෙශාක්‍ය වෙති, ඇතමී කෙනෙක් අභිරූප වෙති ආඩ්‍ය වෙති මහෙශාක්‍ය වෙති, ඔවුන් එසෙ වන්නට හෙතු කවරෙ හෝ?" යූ.

එසඳ බුදුහු "මල්ලිකාව, මෙ ලොකයෙහි යම් ස්ත්‍රියක් ක්‍රොධ බහුල ද ශ්‍රමණබ්‍රාහ්මණයනට අන්නපානාදින් උපස්ථාන නො කෙරෙ ද පරලාභසත්කාරයෙහි ඊර්ෂ්‍යාවමාන කෙරෙ ද, හෙ ව් අත්බැවින් සැව ගොස් මිනිස්පියට ආ කලැ විරූප වෙයි දරිද්‍ර වෙයි අල්පෙශාක්‍ය වෙ. යමක් ක්‍රොධ කෙරෙ ද දන් දෙ ද පරලාභසත්කාරයෙහි ඊර්ෂ්‍යාවමාන නො කෙරෙ ද, හෙ උපන් උපන් තන්හි විරූප වෙයි ධනවත් වෙයි මහෙශාක්‍ය වෙ. යමක් ක්‍රොධ නො කෙරෙ ද දන් නො දෙ ද පරලාභසත්කාරයෙහි ඊර්ෂ්‍යාවමාන කෙරෙ ද, හෙ උපන් උපන් තන්හි අභිරූප වෙයි දරිද්‍ර වෙයි අල්පෙශාක්‍ය වෙ. යමක් ක්‍රොධ නො කෙරෙ ද ශ්‍රමණ බ්‍රාහ්මණයනට අන්නපානාදින් උපස්ථාන කෙරෙ ද පරලාභ සත්කාරයෙහි ඊර්ෂ්‍යාවමාන නො කෙරෙ ද, හෙ උපන් උපන් තන්හි අභිරූප වෙයි ආඩ්‍ය වෙයි මහෙශාක්‍ය වෙ" යි වදාළෝ.

එකල්හි මල්ලිකා දෙවී "වහන්සෙ, මම් පූර්වජන්මයෙහි ක්‍රොධ බහුල වූ බන්දෙමි එයින් දැන් දුර්භී වීමි, ශ්‍රමණ බ්‍රාහ්මණයනට අන්නපානාදින් උපස්ථාන කළ බන්දෙමි එයින් දැන් මහාභොග වීමි, පරලාභසත්කාරයෙහි ඊර්ෂ්‍යාවමාන නො කළ බන්දෙමි එයින් දැන් මහෙශාක්‍ය වීමි. මෙ රාජකුලයෙහි

---

[1] පුවවුත්හB

අනෙක ක්ෂත්‍රිය බ්‍රාහ්මණ ගෘහපති කන්‍යාවන් මධ්‍යයෙහි ඓශ්වර්‍යාධිපත්‍ය ඇත්තෙමි. වහන්සෙ, මම් අද පටන් ගෙන ක්‍රොධ නො ද කෙරෙමි, ශ්‍රමණ බ්‍රාහ්මණයනට අන්නපානාදීන් උපස්ථාන ද් කෙරෙමි, පරලාභසත්කාරයෙහි ඊර්ෂ්‍යාවමාන නො ද කෙරෙමි" යි වැඳ සරණ ගියා.

මෙසෙයින් ක්‍රොධ නො කළ ස්ත්‍රීහු යහපත් වෙති, දන් දුන්නාහු සුවපත් වෙති, සෙස්සන්ගෙ ඓශ්වර්‍යය දැක ඊර්ෂ්‍යාවමාන නො කළාහු අනුභාවසම්පත් හා පරිවාරසම්පත් ඇති වෙත්.

---

ඔවුන් ළැවිගිනිගත් වනගහනයෙකින් නික්මෙන ඇතක්හු සෙයින් නික්මුණු පරිදි කිසෙසැ යත්? යම්සෙ පිළිය හො හිස හො ගිනිගත් පුරුෂයෙක් එ ගිනි නිවන්නට බලවත් උත්සාහ කෙරෙ ද, එසෙයින් මැකුසලධර්මප්‍රතිලාභයට බලවත් උත්සාහ කටයුතු වෙ.

එයින් වදාළහ තමන් බුදු වූ කල්හි:-

235. "සෙය්‍යථාපි භික්ඛවෙ ආදිත්තචෙලොවා ආදිත්තසීසො වා තස්සෙව වෙලස්ස වා සීසස්ස වා නිබ්බාපනාය අධිමත්තං ඡන්දඤ්ච වායාමඤ්ච උස්සාහඤ්ච උස්සොළ්හිඤ්ච අප්පටිවානිඤ්ච සතිඤ්ච සම්පජඤ්ඤඤ්ච කරෙය්‍ය, එවමෙව ඛො භික්ඛවෙ තෙන පුග්ගලෙන තෙසඤ්ඤෙව කුසලානං ධම්මානං පටිලාභාය අධිමත්තො ඡන්දො ච වායාමො ච උස්සාහො ච උස්සොළ්හි ච අප්පටිවානි ච සති ච සම්පජඤ්ඤඤ්ච කරණීයො" ති.

මෙතෙකින් දහනපරිගතා විය කුඤ්ජරො වනගහනා ගෙහා නික්ඛමිත්වා යනුයෙහි සම්භව වන[1] පරිකථා උද්දෙශයෙන් දක්වන ලදි.

(15). භූතසතනිසෙවිතං යන තන්හි "භූත" ශබ්දය "සබ්බෙව නික්ඛිපිස්සන්ති භූතා ලොකෙ සමුස්සයං" යන තන්හි සෙයින් දෙවදානවාදීන් කෙරෙහි වැටෙයි. මෙයින් බැහැර "භූතම්දන්ති භික්ඛවෙ සමනුපස්සථ" යන තන්හි පඤ්චස්කන්ධයෙහි වැටෙයි. "යානීධ භූතානි සමාගතානි යන තන්හි අමනුෂ්‍යයන් කෙරෙහි වැටෙයි. "චත්තාරොමෙ භික්ඛවෙ මහාභූතා[2] හෙතු" යන තන්හි පෘථිව්‍යාදි සතරධාතුන් කෙරෙහි වැටෙයි "භූතස්මිං පාචිත්තියං" යන තන්හි විද්‍යමානයෙහි වැටෙයි. "යො ච කාලඝසො භූතො" යන තන්හි ක්ෂීණාශ්‍රවයන් කෙරෙහි වැටෙයි. "භූතගාමපාතව්‍යතාය" යන තන්හි වෘක්ෂාදීන් කෙරෙහි වැටෙ.

---

(16). හිමවන්තං අජ්ඣොගහෙත්වා යන තන්හි හිමවත්පර්වත නම් කවර යත්?

හෙ ජයමහාබොධීන් උතුරුදෙසෙහි තුන්සියක් යොදුන් තැනින්[3] මත්තෙහි පිහිටියෙයැ, උස පන්සියක් යොදුනැ. ආයාම විසින් විස්තාරවිසිනුදු තුන් තුන් දහස් යොදුන.

එයින් කිහ:-

236. "යොජනානාං ශතාන්‍යුච්චො[4] හිමවාන් පඤ්චපර්වතඃ
යොජනානාං සහස්‍රාණි ත්‍රීණි වායතවිස්තෘතඃ" යි.

එ පර්වතය සුදර්ශනකූටයැ චිත්‍රකූටයැ කෛලාසකූටයැ ගන්ධමාදනකූටයැ යනාදි සියක් සියක් යොදුන් සුවාසූ දහසක්

---

[1] සම්භවන AC [1] සම්භව වචන B [2] මහාභූතානි AB
[3] තැනින් ACD [4] ශතාන්‍යුචෙවර්ර B

රූවත්කුළින් දිලියෙනු වූයෙ යැ. රථකාරදහතළායැ මඤ්ඤ කිතිදහතළායැ හංසපාතදහතළායැ අනවතප්තදහතළායැ ඡද්දන්තදහතළායැ කුණාලදහතළායැ කණ්ණමුණ්ඩදහතළායැ යන ආයාමයෙහි පනස් පනස් යොදුන් විස්තාරයෙහි පනස් පනස් යොදුන් ගැඹුරෙහි පනස් පනස් යොදුන් වටා යෙළසිය යොදුන් සත්දහතෙළෙයින් සැදුම් ලද්දෙයි.

එයින් කිහ:-

237. "ස මොඩගසහස්සොනිලක්ඛකුටෙවිගූහිතෝ
අලඞ්ඝෙය්‍යඤ්ච පතිගිය්හුක්කා රථකාරභූදුභිදුං"යි

අනවතප්තයෙහි චතුර්මුඛයෙන් නිර්මිත ආවර්තඝඩාදි හාත්පසින් බස්නා පත්සියක් ගඩාවෙන් විචිත්‍ර වූයෙයි.

එයින් කිහ:-

238. "ගඩා සරඤ්ච සින්ධුඤ්ච මහාපගාදුං
යෙසාමනවතප්තාඛ්‍යාත් ප්‍රවන්ත්‍යෝ ඝපයන්ති නෝ"සි.

මෙසෙ උක්තානුක්තවර්ණනයෙන් විචිත්‍ර පර්වතය "හිමවත්" නමී.

---

(17). පවාළවණ්ණසදිසං යන තන්හි "වණ්ණ" ශබ්දය "සුවණ්ණවණ්ණා" යන තන්හි සෙයින් පැහැයෙහි වැටෙයි. මෙයින් බැහැර "කදා සංසුද්ධා පන තෙ ගහපති ඉමෙ සමණස්ස ගොතමස්ස වණ්ණා" යන තන්හි කුතියැ වැටෙයි. "චත්තාරෝ වණ්ණා" යන තන්හි කුලයෙහි වැටෙයි. "අථඛෙන නු වණ්ණෙන ගන්ධතෙජොති වුච්චති" යන තන්හි කාරණයෙහි වැටෙයි. "තයො පත්තස්ස වණ්ණා" යන තන්හි ප්‍රමාණයෙහි වැටෙ.

---

සහස්සෙන

(1ප). ජීත්තං මෙ ගිහිබන්ධනං යන තන්හි ගෘහීන්ගෙ බන්ධන නම් කලත්‍රයෑ. කලත්‍ර නම් ස්ත්‍රිය. ඔහු ජීවලොකයහට බන්ධන යෝ යි.

කියෙයෑ යත්? - වදාළේ මෑ නෝ:-

239. "නාහං භික්ඛවෙ අඤ්ඤං එකරූපම්පි සමනුපස්සාමි එවං රජනීයං එවං කමනීයං එවං මදනීයං එවං බන්ධනීයං එවං මුච්ඡනීයං එවං අන්තරායකරං අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය, යථයිදං භික්ඛවෙ ඉත්ථිරූපං. ඉත්ථිරූපෙ හි භික්ඛවෙ සත්තා රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා, තෙ දීඝරත්තං සොචන්ති ඉත්ථිරූපවසානුගා. නාහං භික්ඛවෙ අඤ්ඤං එක සද්දම්පි - පෙ - එකගන්ධම්පි, එකරසම්පි, එකඵොට්ඨබ්බම්පි සමනුපස්සාමි එවං රජනීයං එවං කමනීයං එවං මදනීයං එවං බන්ධනීයං එවං මුච්ඡනීයං එවං අන්තරායකරං අනුත්තරස්ස යොගක්ඛෙමස්ස අධිගමාය, යථයිදං භික්ඛවෙ ඉත්ථිඵොට්ඨබ්බා. ඉත්ථිඵොට්ඨබ්බෙ හි භික්ඛවෙ සත්තා රත්තා ගිද්ධා ගථිතා මුච්ඡිතා අජ්ඣොපන්නා, තෙ දීඝරත්තං සොචන්ති ඉත්ථිඵොට්ඨබ්බවසානුගා. ඉත්ථී භික්ඛවෙ ගච්ඡන්තීපි පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති, ඨිතාපි - පෙ - නිසින්නාපි, සයානාපි, හසන්තීපි, භණන්තීපි, ගායන්තීපි, රොදන්තීපි, උග්ගායන්තීපි මතා පුරිසස්ස චිත්තං පරියාදාය තිට්ඨති"යි.

ඔව්හු මෙසෙ බන්ධන මතු නො වෙති මාරපාශ ද වෙත්.

කියෙයෑ යත්? - වදාළේ මෑ නෝ:-

240. "යං හි තං භික්ඛවෙ සම්මා වදමානෙ වදෙය්‍ය සමන්තපාසෙ මාරස්සාති මාතුගාමං යෙව සම්මා වදමානෙ වදෙය්‍ය සමන්ත පාසෙ මාරස්සාති"යි.

සම්ප්‍රාප්ත වන බැවින් මෙතැන සිට ඔවුන්ගෙ කතිපය ප්‍රකාරයෙක් දක්වනු ලැබේ.

කිසෙයැ යත්?

යම්සෙ සිංහයාගෙ මුඛහස්තපාද පඤ්චායුධ නම් වෙ ද එ සෙයින් මැ ස්ත්‍රීන්ගෙ රූප ශබ්ද ගන්ධ රස ස්ප්‍රෂ්ටව්‍ය පඤ්චායුධ වෙ. යම්සෙ සිංහ තමහට භක්ෂ්‍ය වූ ගොචරයන් ගන්නෙ තමාගෙ පඤ්චායුධයෙන් පැහැර ගනී ද එසෙයින් මැ ස්ත්‍රීහු ද් ක්ලෙශ භක්ෂ්‍යයන් ගන්නාහු තමන්ගෙ රූපාදිපඤ්චායුධයෙන් පැහැරගනිත්.

එයින් වදාළහ:-

241. "සීහො යථා ලොහිතමංසභොජනො
වාළමිගො පඤ්චහත්ථො සුරුද්ධො
පසය්හ ඛාදී පරහිංසනෙ රතො
තථිත්ථියො තාසු න විස්සසෙ නරො" යි.

ඔවුහු මොලි බැඳ අටවියෙහි සිටි චොරයන් සෙ ජනයන් විලුම්පනය කරනුවහ, විෂදිග්ධ සුරාවක් සෙයින් විනාශයට පමුණුවනුවහ, භාණ්ඩයෙහි ගුණ වණන වණිග්ජනයන්[1] සෙයින් තමන්ගෙ අසද්ගුණ වණනුවහ, කාලසිංහයන්ගෙ හඟ සෙයින් විපරාවෘත්තයහ, හෘදයෙහි අනෙකක් තබා තෙපුලෙහි අනෙකක් ඕනා බැවින් දෙදිවි ඇති සර්පයන් වැනියවිහ, තෘණයෙන් ප්‍රච්ඡන්න සර්පාකීර්ණ නරකාවාටයක් සෙයින් පඤ්චකාමගුණතෘණයෙන් ප්‍රච්ඡන්නයහ, පාතාල සෙයින් වස්ත්‍රාලඩ්කාරමෛථුනාදීන් දුෂ්පූරයහ, මාංස රුධිරයෙන් දුස්තොෂ රාක්ෂෂීන් සෙයින් මෛථුනාදීන් දුස්තොෂයහ ජනයන් එකාන්තයෙන් නරකයට ගෙන යන බැවින් යමපලුන් යමපලුන් වැනියවිහ, ගුවි අගුවි භක්ෂණය කරන ගිනි සෙයින්

---

[1] වණිග්ජනයක්හු ABC

උත්තමාධම යෙවිය. සච්චාහි නදි යෙයින් උත්තමාධම වෘහිය. යම්කැනෙක්හිදු හමන මාරුත යෙයින් පිරිරහු නැතියවිය. යම්යෙ සිමවියෙහිපුංනරු නම් රත්ගල් සැපත් කාසයන් හා හංසයන් තමාගෙ පැතැයෙන් එක්පැහැ කරන විසින් විශෙෂ නැත්ත ද එයෙයින් මෑ උත්තමාධමයන් කෙරෙහි විශෙෂ නැතියවිය. එසිගන්ධරසයෙන් ආමුවලසදාග වූ "කිපක්" නම් විෂවෘක්ෂයෙහි එල පරිභොග කළ ජනයන් විනාශයාග් වන යෙයින් තමන් කෙරෙහි රක්ෂයන් විනාශයාග් කරන බැවින් විෂවෘක්ෂ යෙයින් නිත්‍යවලිතයෝ.

එයින් වදළහ:-

242. "චොරා විය චෙතීතත්‍ථා මදිරා විය විසදිග්ධා, වාහිංසා විය වාචාය සන්ධුසියෝ, ඉත්‍යසිඩගමිව විපරිවත්තයෝ, උරගමිව දුරිච්ඡා, සොණ්ඩාමිව පටිග්ගහා, පාතාලමිව දුප්පූරා, රක්ඛසී විය දුත්තොසා, යමාවෙකන්තකාරියෝ, සිඛිරිව සබ්බභක්ඛා, නදිරිව සබ්බවාහි අසිලා විය යෙන කාමඛාරා, නෙරු විය අවිසෙස කරා, විසරුක්ඛා විය නිත්‍යවලිතියෝ" යි.

බවිසු අත්‍ථාතජාතකයෙහි - මහසාගරයිහිංග ගිලගෙද කළ ගහීකාව යෙයින් සුදිදනන්ගෙ සිල්රුවන් වුලුලුන්ා යෙරහ.

ධම්මධජජාතකයෙහි - සඩ්ග්‍රාමයට යන රජු කෙරෙන් යොදුන් යොදුනෙහි සිට ආ පුරුෂයන් හා මෙවුන නොට රජු සුවර වදන දවස් රජගට වන් පෙරවිදරුවා ලොකාමිෂයට නොලැබුණෙන් වට කැරවියට වූ බිසාව යෙයින් විෂ දිඹයහ.

කුණාලජාතකයෙහි - පඤ්ඤාඩවයන් විසින් අහාපා වූ කුබිජයාහා මෙවුන නොට බවිහට "නා යෙ මට ප්‍රිය පුරුෂ යෙක්

---

නැති, රාජපුත්‍රයන්ගෙ ගල්ලොහිතයෙන් තා පාද ප්‍රක්ෂාලනය[1] කෙරෙමි" යි බැණ පඤ්චපාණ්ඩවයනට ද වෙන වෙන "තා හා සම මට ප්‍රිය පුරුෂයෙක් නැති, මාගෙ ජීවිතය තට පරිත්‍යක්ත යැ මා පියරජහු ඇවැමෙන් තට රජය දෙමි" යි තමාගෙ අසද්ගුණ කියන රාජකන්‍යාව සෙයින් බඩුයෙහි ගුණ වණනුවන් වැනියහ.

චුල්ලධනුග්ගහජාතකයෙහි – ච විගස දුටු සොරු කෙරෙහි බැඳි කුලදරු[2] සැමියහට වධ කළ මාගම සෙයින් විපරාවෘත්තයහ.

කුණාලජාතකයෙහි – සැමියා කෙරෙහි යෙහෙළිය ඇර හොවා පරපුරුෂයන් කරා ගොස් සැමියා ඇය නාසා කැපූ කල්හි අවුද් ඇය පහ කොට පියා "තට නිවරද වීමි නම් මා නාසා නැහෙව" යි යස් කළ මාගම සෙයින් මෘෂාවාදි වන බැවින් දෙදිවි ඇතියවිහ.

කණවේරනාළකයෙහි – දවස දහසක් දෙන සිටුදරුවා මරවා සොරු ගෙන වායය කළ සාමා නම් ගණිකාව සෙයින් ප්‍රව්‍රජන ශ්‍රව්‍රයක් වැන්නහ.

ගාමණීචණ්ඩජාතකයෙහි – අතරමග පුරුෂයක්හු කෙරෙහි බැඳි ඤාති[3] කුලයෙහිද් පක්කුලයෙහිද් නො හින්ද හි ඇවිදුනා මාගම සෙයින් දුෂ්පූරයහ.

කුණාලජාතකයෙහි – දෙතෙරේ දෙරද්දනට[4] මෙහෙයුන් ව ද ගඟමැද සිට මහලු කොර කෙවුළා හා මෙවුන කරන පඤ්ච පාපා නම් බිසොව සෙයින් දුස්සෝෂ්‍යයහ.

---

[1] ප්‍රක්ෂණයCD [2] කුලදූAB [3] ජාතB
[4] දෙරදූනටF [4] දෙරජනටBD

මහාපදුමජාතකයෙහි – අත් පා සුන් කොටකු කෙරෙ බැඳි තමා මරණින් මිදූ රජකුමරහු පව්තමඤ්ඤකයෙහි සිට ප්‍රජාතයෙහි බහා පි රාජකන්‍යාව සෙයින් යමපලුන් වැනියවිහ.

කුණාලජාතකයෙහි – උත්තමාධමයන් හා මෙවුන කළ කුරඩාවී නම් බිසොව සෙයින් සව්හක්‍ෂයහ.

කණ්ඩරීජාතකයෙහි – රජු හා හොත් යහනින් නැඟි කවළියෙන් නික්ම පිළිරැහැනින් බැස දඹරුකට නැඟී පවුරු පැන පිට කරා ගිය කින්නරා නම් දෙව්ය සෙයින් සව්වාහිහ.

කුණාලජාතකයෙහි – අතරමඟ පසල්හැඩ[1] නම් බමුණු දරුවකු කෙරෙහි බැඳි පුතු කසිරජු කෙරෙහි නො හින්දහී සැමියා කොසොල්රජු කරා යන, සැමියා කොසොල්රජු කෙරෙහි නො හින්දහී පුතු කසිරජු කරා යන, බිසොව සෙයින් කාමවරයහ[2].

මහඋමංදුයෙහි – සත්හවුරුද්දක් පතා ලද සැමියා පියා මඟ දුටු පුරුෂයකු හා ගමන්ගත් දිග්තල සෙයින් අව්ඝෙෂ කරයහ.

අසාතමන්තජාතකයෙහි – ආගන්තු කයකු කෙරෙ බැඳි සිය අතින් මෙහෙ කොට පස්වටන පුතු ළැමිඩියෙහි පොරොවින් ඇති මාගම සෙයින් විෂවාක්‍ෂයන් වැනියො.

අපි ව – කුණාලජාතකයෙහි ජනයන් කිවුටුකල[3] ද නමස්කාර කරන තපස් ඇති වැ ධූතියකු හා ගිය සව්වතපාවිය[4] සෙයින් වලව්හකයහ.

---

[1] පසල්සැඩු AD
[2] කාමවාරයහ B කාමාවවරයහ ACDEF
[3] කිවටු A කිවුට CEF
[4] සව්වපාපියා BCE සව්වකපාපිය A සව්වකපාපි F

තක්කජාතකයෙහි – දියෙන් යන්නිය නගාගෙන පුස්නා පුරුෂයක්හට සොරකු ලවා අපකාර කැර වූ මාගම සෙයින් මිත්‍රද්‍රොහයහ.

අණ්ඩභූතජාතකයෙහි – සොරසැමියා ලවා සියසැමියා හිසැ ටොකු ඔවා තමා අත් පෑ ගිනි මඩනට[1] යෙමින් අනෙකකු අත් අත පහළියෙන් "දැන් කලි ගිනි මඩනට නො නිස්සෙමි" යි ගිනි නො මැඩි මණෙවිය සෙයින් මායාවීහ.

ධරපත්තජාතකයෙහි – රජු හා විල්කෙළිමින් සිට දියබරණකු හා මෛථුන කළ නාමණෙවිය සෙයින් දුරාචාරයහ.

මුදුපාණිජාතකයෙහි – අන්ධකාරවර්ෂයෙහි[2] නහනවන්වැ කවළියෙන් නික්මැ අත ගෙන සිටි රජු වඤ්චා කොට ගිය රාජ කන්‍යාව සෙයින් වලවිත්තයහ.

සුස්සොණිජාතකයෙහි – සෙරුම ද්වීපයෙහි ගරුඩවිමාන යෙහි වෙසෙමින් නැවිබුනු වැ ගිය ගඳවියක්හු හා මෛථුන කළ බිසොව සෙයින් සමුද්‍රමධ්‍යයෙහි ද් ලා නො රැක්ක හැකියවීහ.

කාකාතිජාතකයෙහි – සප්තසාගරයෙනුද්, සප්තකුල පර්වතයෙනුද් පිරිඛෙවි ලද ශල්මලීවනයෙහි වෙසෙමින් ගුරුළු පියා ගැබින් ගිය ගඳවියා හා මෛථුන කළ බිසොව සෙයින් ගුරුළු විමන්හිදු[3] ලා නො රැක්ක හැකියවීහ.

සමුග්ගජාතකයෙහි – විද්‍යාධරයා සුමුඟට ගෙන වැද ඔහු හා මෛථුන කළ මාගම සෙයින් රකුස්කුස්හිද් ලා නොරැක්ක හැකියවීහ.

---

[1] මඩුනට AF [2] වර්ෂායෙහි ABC [3] සමුද්‍රමධ්‍යයෙහිදු CD

පැළඳුහුණ මහනැටුම් බලමින් හිඳ යැමියා ඔර හිස තබා බැස ගෙව ජවනිකායෙන් පිටත හුන් පුරුෂයකු හා මෛථුනයට අධිකාය වූන් මාගම සෙයින් විළිබිරෑ[1] නැතියවිහ.

උතුරුමුහුණ හඬා නැඟි පුතු කර අඹරා මරා හැඳ ඉදඅතුරෙහි හොවා[2] සොරසැමියහට දෙර හැර වීමසා බලා උහු යන්නහු දැක "ගෙට වන් සොරෙක් මපුතු මරා යෙ" යි තීරණ කළ මාගම සෙයින් කාමක්‍රෝධයෙන් උද්දීපනයෝ.

එයින් වදාළහ ඔවුන් කාණාසප්පීපම කොට:-

243. "පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා කණ්හසප්පෙ:- කත මෙ පඤ්ච ? කොධනෝ උපනාහී ඝොරවිසෝ දුප්පඤ්ඤෝ චිත්තදුහී. ඉමෙ ඛෝ භික්ඛවෙ පඤ්ච ආදීනවා කණ්හසප්පෙ. එවමෙව ඛෝ භික්ඛවෙපඤ්ච ආදීනවා මාතුගාමෙ:- කතමෙ පඤ්ච ? කොධනෝ උපනාහී ඝොරවිසෝ දුප්පඤ්ඤෝ චිත්තදුහී" යි.

ඔවුහු සර්වසාධාරණ වන බැවින් වතුර්භූමියන් බැස ස්නාන පාන කරන නදීතීර්ථයක් වැන්නෝ මයැ, මහවතක් වැන්නෝමයැ, පානාගාරයෙහි තැටියක් වැන්නෝ මයැ, සතරදිගායෙන් ආවන් ලග්නා ශාලාවක් වැන්නෝ මයැ, සතරමහ එක් වූ තැනැ පොකුණක් වැන්නෝ මයැ; ඔවුනට මොහු හීනයහ මධ්‍යමයහ උත්තමයහ යන අවධි නැත්.

එයින් වදාළහ:-

244. "යථා නදි ච පථවී ච පානාගාරං සභා පපා
එවං ලොකිත්ථියො නාම වෙලා තාසං න විජ්ජති" යි.

---

[1] විඵබිරිC [2] මරා හොවා හැඳ දෙඅතුරෙහි හෙළාපියා ACDEF

හැම නදිහි[1] වක් ව මිස නොයෙති, හැම වනයො කාෂ්ඨමය මිස නො වෙති, හැම මාගමිහු අවකාශයක් ලදහු නම් පවි මිස නො කෙරෙත්.

එයින් වදාළහ:-

245. "සබ්බං නදී වඩ්කගතා සබ්බෙ කට්ඨමයා වනා
සබ්බිත්ථියො කරෙ පාපං ලභමානා නිවාතකෙ" යි.

ඔව්හු එක්කෙනකුන් නො ද අයත්හ, දෙදෙනකුන් නො ද අයත්හ, සදා තුබූ අවුණුදොරක් වැන්නහ, යමෙක් ඔවුන් තමායයි හඟී නම් මහඇසිදැල් ගෙන සුළඟ බදා.

එයින් වදාළහ:-

246. "න තා එකස්ස න දවිනනං ආපණො සො පසාරිතො
යො තා මය්හන්ති මඤ්ඤෙය්‍ය වාතං ජාලෙන
බාධයෙ" යි.

ඔවුනට[2] ප්‍රිය කෙනෙක්[3] නැති, අප්‍රිය කෙනෙක් නැති, ඔහු රුක් වළඳනා ලිය සෙයින් ධන ඇතියන් වැළඳගෙන සිටිත්.

එයින් වදාළහ:-

247. "නත්ථිත්ථීනං පියො නාම අප්පියොපි න විජ්ජති
ධනං තා පතිවෙලෙන්ති ලතාව දුමනිස්සිතා" යි

ඔව්හු ඇත්ගොවිවන් අස්ගොවිවන් ගොපල්ලන් සැඩොලුන් මහබැළවුන් පුස්වඩුවන් ධනවත්වුව ඔවුන්[4] කරා එළඹෙති, කුලපුත්‍රයනුද් පියත්.

---

[1] නදිB [2] ඕනටB [3] එකෙක්B [4] උන්AC

එයින් වදාළහ:-

248. "හත්ථිබන්ධං අස්සබන්ධං ගොපුරිසං
වණ්ඩාලජවඛාහකං පුප්ඵජඩකං
සධනමපි පතන්ති[1] නාරියෝ
කුලපුත්තමපි ජහන්ති අකිඤ්චනං" යි.

ඔවුන් සැබෑයි කී දෑයෙක් බොරු වෙයි, බොරුයයි කී දෑයෙක් සබා වෙයි, බොහොතණට වන් ගෙරී යෙයින් හැඟෙන හැඟෙන තැන් බලත්.

එයින් වදාළහ:-

249. "මුසා නාසං යථා සච්චං සච්චං නාසං යථා මුසා
ගාවෝ බහුතිණඤ්ඤව ඔමසන්ති වරං වරං" යි.

ඒ මායාවීන්ගෙ අධ්‍යාශය දිගෙහි මසුන් ගිය මඟ යෙයින් නො දත හැකි.

එයින් වදාළහ:-

250. "චොරීනං බහුබුද්ධීනං යාසු සච්චං සුදුල්ලභං
ථීනං භාවෝ පුරාජානෝ මච්ඡසෙවොදකෙ
ගතං" යි.

ළදරුකල[2] පටන්ගෙන පුරුදු වූ ප්‍රිය වූ මනාප වූ අනුකම්පා ඇති ප්‍රාණ හා සම කොට ගත් පුරුෂයා ආපදාගතකල දී කායසීයක් ඇති කල දී පියත්.

---

[1] වත්තන්ති B [2] ළදරුතැන B

එයින් වදාළහ:-

251. "චිරානුවුත්ථම්පි පියං මනාපං
අනුකම්පකං[1] පාණසමම්පි සන්තං
ආපස්සු කිච්චෙසු ච නං ජහන්ති
තස්මා හි ඉත්ථිසු න විස්සසාමි" යි.

යම් පුරුෂයෙක් ධනධාන්‍යයෙන් පරිපූර්ණ වූ මෙ පොළොවි තලය ස්ත්‍රියකට දක්වා දී සම්මත කොට පෙරහර දී සිටුවූයෙ වී නම් හො ඔහට අවඥා මැ කෙරෙයි, එබැවින් ඒ අසජ්ජනයන් වශග නො වුව මැනැ[2].

එයින් වදාළහ:-

252. "පුණ්ණම්පි වෙමං පඨවිං ධනෙන
දජ්ජිත්ථියා පුරිසො සම්මතාය
ලද්ධා ධණං අතිමඤ්ඤෙය්‍ය තම්පි
තාසං වසං අසතීනං න ගච්ඡෙ" යි.

ඔවුන් තමහට සෙනෙහැත්තහයි විස්වස් නො ද කරන්නෙයැ, වැළත සිට වලප්ති විස්වස් නො ද කරන්නෙයැ, ඔහු එක්වට එතෙර දිවන එක්වට මෙතෙර දිවන නැවක් සෙයින් ප්‍රිය අප්‍රිය සෙවා කෙරෙත්.

එයින් වදාළහ:-

253. "න විස්සසෙ ඉච්ඡති මන්ති පොසො
න විස්සසෙ රොදති මෙ සකාසෙ
සෙවන්ති හෙතා පියමප්පියඤ්ච
නාවා යථා ඔරකූලං පරඤ්ච" යි.

---

[1] අනුකම්පිකංB [2] නොවනුමැනB

පෙර අතොටලා වැළඳගත් තොළ විස්වස් නො ද කරන්නෙයැ, හඳුනන සොරුන් කෙරෙහි විස්වස් නො ද කරන්නෙයැ, සබඳ රජු කෙරෙහි නියැක නො ද වන්නෙයැ, තමහට දසදරුවකු ලද ද ස්ත්‍රිය කෙරෙහි විස්වශ් නො ද කරන්නෙයි.

එයින් වදළහ:-

254. "න විස්සසෙ සාඛපුරාණසඤ්ඤතං
නවිස්සසෙ මිත්තපුරාණ චොරකං[1]
නවිස්සසෙ රාජසඛා මමන්ති නං
න විස්සසෙ ඉත්ථි දුසන්නමාතරං" යි.

ඔවිහු තමන් රිසින් හො ධනහෙයින් හො යමක්හු හා සංසඳී කොළොං නම් තුබූ තැන් දවන ගිනි සෙයින් ව මැ විගස ඔහු දවත්.

එයින් වදළහ:-

255. "යං හෙතා උපයෙවන්ති ජන්තුසා වා ධනෙන වා
ජාතවෙදොව සංඛානං ඛිප්පං අනුඩහන්ති නං" යි.

ඔහු මායා මරීචි ශොක රොග උපද්‍රව වැන්නො මයැ. ඛර වූ නිගඩබන්ධන වැන්නො මයැ. මෘත්‍යුහු වසන ගුහා වැන්නො මයැ. ඔවුන් කෙරෙහි යමෙක් විස්වස් කළෙ නම් හෙ නරයන් කෙරෙහි අධමයැ ලාමකයැ පාපකයි.

එයින් වදළහ:-

256. "මායාවෙසා මරීචීව සොකා රොගා වුපද්දවා
ඛරා ව බන්ධනා වෙතා මච්චුආසා[2] ගුහාසයා
තාසු යා විස්සසෙ පොසා සා නරෙසු
නරාධමා" යි.

---

[1] චොර ංBCDEF [2] මච්චුවා සා B

ඔහු හැළී සිටි මුවකු විදුනා ශරයක් සයින් හැඹුරෙහි හොත් මසකු බඳන බිළියක් සෙයින් වඳුරන් බඳන ලහා[1] සෙයින් පුහුද්නන් බඳත්.

එයින් වදළහ:-

257. "මගං නිළීනං කූටෙන බලිසෙනෙව අඞ්ගුජං
වානරං විය ලෙපෙන බාධයන්ති පුථුජ්ජනං" යි.

ඛඩ්ගහස්ත සතුරන් හා සමාෂණ කරනු මැනැවැ, බුභුක්ෂිත රාක්ෂයන් හා සංලාප කරනු මැනැවැ, ඝොරවිෂ උරගයන් සිප ගන්නෙ මැනැවැ, එකලා වැ එකලා මාගමක හා සල්ලාප කරනු නො මැනැවි.

එයින් වදළහ:-

258. "සල්ලපෙ අසිහත්ථෙන පිසාචෙනපි සල්ලපෙ
ආසීවිසම්පි ආසීදෙ යෙන දට්ඨා න ජීවති
න ත්වෙව එකෝ එකාය මාතුගාමෙන සල්ලපෙ" යි.

ඔහු හලාහලවිෂ සෙයින් කකියන තෙල් සෙයින් විරි වූ[2] ලොහොදිය සෙයින් දුරු කටයුත්තෝ.

එයින් වදළහ:-

259. "විසං යථා හලාහලං තෙලමුක්කඩ්ඪිතං යථා
තම්බලොහවිලීනංව මාතුගාමං විවජ්ජයෙ" යි.

පඤ්චකාමගුණයෝ ස්ත්‍රීරූපයෙහි පැනෙත්.

එයින් වදළහ:-

260. "පඤ්චකාමගුණා චෙතෙ ඉත්ථිරූපස්මිං දිස්සරෙ
රූපා සද්දා රසා ගන්ධා ඵොට්ඨබ්බා ච මනොරමා" යි.

---

මඤ්ඤාසෝ [1]ලැහැF [2]විරින වූB

ඔහු බැල්මෙනුද් සිනායෙනුද් රහස්පියෙස් දැක්වීමෙනුද් මධුරතෙපුලෙනුද් මූඪස්මෘතිපුරුෂයන් බදත්.

එයින් වදාළහ:-

261. "මුට්ඨස්සතිං තා බන්ධන්ති පෙක්ඛිතෙන සිතෙන ච
අථොපි දුන්නිවත්ථෙන මුදුනා[1] භණිතෙන ච" යි.

ඔව්හු තන්හි තන්හි මාරයා ඔත් මල වැන්නහ, සුව කැමැතියන් විසින් පරිවර්ජන කටයුතු වෙත්.

එයින් වදාළහ:-

262. "තා කුලෙසු විසිඛන්තරෙසු වා
රාජධානිනිගමෙසු වා පන
ඔඩ්ඩිතං නමුවිපාසවාකරං
චක්ඛුමා පරිවජ්ජෙ[2] සුඛත්ථිකො" යි.

කුසදායෙහි සෙයින් තෙජස්වී අගරජහුද් හරිතවුස්දායෙහි සෙයින් මුළුලො[3] දත් වියත්හුද්, මුදුලකුණුදායෙහි සෙයින් ලො මුදුන්පත් මහත්හුද් සකපුදායෙහි සෙයින් පුන්පැරුම් මහසත් හුදු ස්ත්‍රීවශග වන්නාහු රාහු ගිලූ සඳක් සෙයින් නො දිලියෙත්.

එයින් වදාළහ:-

263. "තෙජවාපි හි නරො විචක්ඛණො
සක්කතො බහුජනස්ස පූජිතො
නාරීනං වසගතො[4] න භාසති[5]
රාහුනා මුපගතොව චන්දිමා" යි.

---

[1] මඤ්ජුනා G [2] පරිවජ්ජයෙ A [3] මුළුලොවි AC
[4] නාරිවසගතො AD [4] නාරිභවසගතො B [5] නසොභති B

චුල්ලපලොභන ජාතකයෙහි සෙයින් අට්ඨාන ජාතකයෙහි සෙයින් ස්ත්‍රීවශග වූ කිසිවැනි බලවත්හුද් දුර්බල[1] වෙති, ශක්ති මහත්හුද් ශක්තිරහිත වෙති, ඇසැත්තාහුද් ඇස් නැති වෙති, ගුණවත්හුද් නිර්ගුණ වෙති, නුවණැත්තාහුදු නුවණ නැති වෙති, ප්‍රමුක්තයො බන්ධනගත වෙත්.

එයින් වදාළහ:-

264. "බලවන්තො දුබ්බලා හොන්ති ඨාමවන්තොපි හායරෙ
චක්ඛුමා අන්ධිතා හොන්ති මාතුගාමවසං ගතා

ගුණවන්තො නිග්ගුණා හොන්ති පඤ්ඤවන්තොපි හායරෙ
පමුත්තා බන්ධනෙ සෙන්ති මාතුගාමවසං ගතා" යි.

ඔහු අලම්බුසා ජාතකයෙහි සෙයින් නළිනී ජාතකයෙහි සෙයින් සිල්වතුන්ගෙ ධ්‍යානාදිගුණරත්නයන් පැහැර ගන්නා කඩපළා සොරුන් වැන්නො මයැ, කාෂ්ඨරාශියක් සෙයින් ඔවුන්මැගෙ[2] ගුණරාශීන් දවන ගිනි වැන්නො මැයි.

එයින් වදාළහ:-

265. "අජ්ඣෙනඤ්ච[3] තපං සීලං සච්චං චාගං සතිං මතිං
අච්ඡින්දන්ති පමත්තස්ස පන්ථදූහීව තක්කරා
යසං කිත්තිං ඨිතිං සූරං බාහුසච්චං පජානනං
ඛෙපයන්ති පමත්තස්ස කට්ඨපුඤ්ජංව පාවකො" යි.

එ මහාමායාවීහු[4] සුවන්මොනරදයෙහි සෙයින් මහ මොනරදයෙහි සෙයින් උම්මදන්තිදයෙහි සෙයින් කිසිවැනි මහතුන් ගම්භිර උදකාවර්තයෙහි ගලා නිඩුහුරු කරනුවන් සෙයින් ප්‍රමථනය කරන ශීලයො.

---

[1] දුර්බල ABE [2] පමාවූවන්ගෙ G
[3] අජ්ඣානඤ්ච ABD [4] හැමමායාවීහු ABF

එයින් වදාළහ:-

266. "ආවට්ටනී මහාමායා බ්‍රහ්මවර්ය විකොපනා
සීදන්තිනං විදිත්වාන ආරකා පරිවජ්ජයෙ" යි.

ස්ත්‍රීවශග වූයෙ භයානක නරකප්‍රපාතයෙහි ගෙයි, අයොමය ශල්මලිවනයෙහි කැඩෙයි, තිර්‍යග්ගතියැ වෙහෙසෙයි, ප්‍රෙතවිෂයෙහි වෙහෙසෙයි.

එයින් වදාළහ:-

267. "සො උපෙති නිරයං පපාතනං
සත්තිසිම්බලී වනඤ්ච මායසං
ආවසිත්වා[1] තිරච්ඡානයොනියං
පෙතරාජවිසයා න මුච්චති" යි.

යම්කෙනක්නට ස්ත්‍රීන් කෙරෙහි ආශා නැත්නම් දෙව්ලොව්හි දෙව්රජ ද් මිනිස්ලොව්හි සක්විතිරජ ද් රුවන්විමනුදු දිව්‍යාඩ්ගනාවොදු දුර්ලභ නො වෙත්.

එයින් වදාළහ:-

268. "දිබ්බ ඛිඩ්ඩරතියො න දුල්ලභා
වක්කවට්ටිවරිතඤ්ච මානුසෙ
සොණ්ණව්‍යම්හනිලයා ච අච්ඡරා
යෙ චරන්ති පමදාහනත්ථිකා" යි.

යම් කෙනෙක් ස්ත්‍රීසංසර්ග දුරු කොළො නම් ඔවිනට කාමභව පරිත්‍යාග ද රූපභවනිවාස ද ශුද්ධාවාසයෙහි උත්පත්ති ද් අමෘතමහානිර්වාණයට ප්‍රාප්තිද්[2] දුර්ලභ නො වෙ.

---

[1] අවසිත්ව B [2] අන්ත මහානිර්වාණ ප්‍රාප්තිද් B

එසින් වදළහ:-

269. "කාමධාතුයමතික්කමා ගති
රූපධාතුයා ගවෝ න දුල්ලහෝ
විකරාගවිසයූපපත්ති යා
යෙ වරන්ති පමදහනත්ථිකා" යි.

අපි ව - ඔවිහු අශුචි වූ දුගන්ධ වූ සහිරු වූ සප්‍රතිභයවූ මිත්‍රද්‍රෝහි වූ කාණසපියන් වැන්නෝ.

එසින් වදළහ:-

270. "පඤ්චිමෙ භික්ඛවෙ ආදීනවා කණහසප්පෙ. කතමෙ පඤ්ච? අසුචි දුග්ගන්ධෝ සහිරු සප්පටිභයෝ මිත්තදුහී. ඉමෙ ඛෝ භික්ඛවෙ පඤ්ච ආදීනවා කණහසප්පෙ. එවමෙව ඛෝ භික්ඛවෙ පඤ්ච ආදීනවා මාතුගාමෙ. කතමෙ පඤ්ච? අසුචි දුග්ගන්ධෝ සහිරු සප්පටිභයෝ මිත්තදුහී ඉමෙ ඛෝ භික්ඛවෙ පඤ්ච ආදීනවා මාතුගාමෙ" යි.

ඔවුන් අශුචි පරිදි කිසෙයැ යත්?

ඔවිහු දිව්‍යකන්‍යාවන් සෙයින් සැදුණාහුවූ වුහු නම් කෙශාදී අශුචිභාව අනතික්‍රාන්ත වන බැවින් අශුචි කොට දැක්ක යුතු වෙත්.

කිසෙයැ යත්?

හිස්පිරුණු මූලැ, ඇස්පිරුණු කඳුලැ, නාසාපිරුණුමුකුණුයැ, මුවපිරුණු ලාලායැ, උගුරුපිරුණු සෙමැ, උදරපිරුණු මූත්‍රපුරීෂ එකුගඩු හදමස් අක්මා දළබු බඩදිවි පපු අතුණු අතුණුවැටියැ, නවද්වාරයෙන් වැහෙන අශුචියැ, රොමකූපයෙන් වැහෙන අශුචි යුෂයැ, හෙ ස්ත්‍රීරූපයෙක් නො වෙයි දෙපයින් ඇවිදුනා අශුචි රාශියෙකැයි.

එයින් වදාළහ:-

271. "දිපාදකොයං අසුචි දුග්ගන්ධෝ බහුකණ්ටකෝ
නානාකුණපපරිපූරෝ විසමවන්තෝ තතෝ තතෝ
පුබ්බලෝහිත සම්පුණ්ණං බහුස්ස කුණපස්ස ව
නරවීරකතං වග්ගු සමුග්ගමිව චිත්තිතං" යි.

එයින් මෑ කිව එක් සිටුදුවක් තමා කෙරෙහි රක්ත වූ තමා සැමී වූ සිටුදරුවහට තමා සිරිරු ගුවි නො වන පරිදි කියන්නී:-

272. "සචෙ ඉමස්ස කායස්ස අන්තෝ බාහිරතෝ සියා
දණ්ඩංනූනගහෙත්වාන කාකෙ සොණෙව වාරයෙ" යි.

මෙසෙයින් ඔහු අගුවි වෙත්.

ඔවුන් දුගන්ධ පරිදි කියෙයැ යත්?

ඒ මෑ සිටුදූ කිව සිටුදරුවහට "සැමිය, මෙ ශරීරය දුගන්ධ යැ, අගුවි යැ, කුණප යැ, කාගරිකජනයන් විසින් මලමූත්‍ර විසඟී කරන උත්කාරගෘහයක් වැන්නැ, පණ්ඩිතජනයන් විසින් නින්දිත යැ, බාලජනයන් විසින් නන්දිතයැ, මෙහි තවර මැනැවක් දැක රාගතෙරෙහි" යි.

273. "දුග්ගන්ධෝ අසුචි කායෝ කුණපෝ උක්කරූපමෝ
නින්දිතෝ චක්ඛුභූතෙහි කායෝ බාලාභිනන්දිතෝ" යි.

සෙස්සෝ දැ කීහු මෑ නො:-

274. "ජාතං නිගීමනාථීං යථාරිරතගරාගුවෙ:
විවරං තජ්ජනෙර්මූඩෙ රක්ෂාථීමුපකල්පිතම්.

උත්තානොච්ඡූනමණ්ඩුක පාටිතොදරසන්නිහෙ
ක්ලෙදිනි ස්ත්‍රීව්‍රණෙ සක්තිරක්‍රිමෙ: කස්‍ය ජායතෙ" යි.

මෙසෙයින් ඔහු දුර්ගන්ධ වෙත්.

ඔවුන් සහිරු සප්‍රතිභය පරිදි කිසෙයැ යත්? මෙකිතාක් අගුණාඩ්‍යයෙන් භයඩ්කර වන බැවින් සහිරු වෙත් - අසිවසහොත් තුඹස් සෙයින් වලස් හොත් ගස් සෙයින් වග් හොත් ළැහැප් සෙයින් සහළඟුරු පිරුණු වළ සෙයින් සොරුන් සිටි කඩ සෙයින් යකුන් වසන වල් සෙයින් රකුස්පිරිගා විල් සෙයින් පරිවර්ජනය කටයුතු වන බැවින් සප්‍රතිභය වෙත්.

ඔවුන් මිත්‍රද්‍රොහ පරිදි කිසෙයැ යත්? සර්වාභරණයෙන් සදා පැරහැර[1] දී පතිකුලයෙහි රක්නා ලදුව ද ස්වාමින් ඉක්මැ මිථ්‍යාචාරයෙහි පවතිත්.

එයින් වදාළහ:-

275. "ජාතරූපමණිමුත්තභූසිතා
සක්කතා පතිකුලෙසු නාරියො
රක්ඛිතා අතිවරන්ති සාමිකං
දානවංව හදයන්තරස්සිතා" යි.

මෙසෙයින් ඔහු මිත්‍රබිඳි වෙත්. බොහො කීමෙන් කිම?

ඔවිහු සංසක්තයනට ආවර්ත්තයහ, අසංවරයට ආස්පදයහ, සාහසයනට පත්තනයහ, දෙෂයනට සන්තිපාතයහ, කපටමූර්ත්තීහ, ශඨමූර්ත්තීහ, දීනතාවට ක්ෂෙත්‍රයහ, ස්වර්ගයට ආවරණයහ, නරකයට මාර්ගයහ, සර්වමායාවට සමුද්ගයහ, ජීවලොකයහට මාරපාශයොයි.

---

[1] පෙරහැර

එයින් කීහ:-

276. "ආවර්ත්ඃ සංශ්‍රිතානාමවිනයභවනං පත්තනං
සාහසානාං
දෙෂාණාං සන්නිපාතං[1] කපටශඨමයං
ක්ෂෙත්‍රමප්‍රත්‍යයානාමි
ස්වර්ගවාරස්‍ය විඝ්නං නරකපුරමුඛං සර්වමායා
කරණ්ඩං
ස්ත්‍රියන්ත්‍රං කෙන සෘෂ්ටං විෂමමෘතසමං ජීව
ලොකස්‍ය පාශමි" යි.

මෙසෙ ඔවුන් අනෙකාදීනවකාරණ වූ ස්ත්‍රීන් පරිත්‍යාග කළ සෙ කීහ ජින්නං මෙ ගිහිබන්ධනංයි.

---

(19). සොසාපිතො කාමපඩ්කො යන තන්හි කාමයෙහි ආදීනව නම් කවර යත්?

යම්සෙ පඩකයෙහි ජාත වූ තෘණශෛවාලනලකුමුදු වනාදීහු පිහිනන්නහු නොපිහිනියදී උදකයෙහි නිමග්න කෙරෙද්ද, එසෙයින් මෑ සංසාරසාගරය පිහිනන යොගාවචරයා සර්ව වස්තු කාමක්ලෙශකාමයො සංසාරජලනිධියැ ගලා නිමග්න කෙරෙත්. යම්සෙ පලිප නම් ලද මහාකදීමයෙහි නිමග්න වූ ශුකරමෘගයොද සිංහවාරණයො ද එයින් නැගී යන්නට අසමර්ථ වෙද්ද, එ සෙයින් මෑ ප්‍රඥාවත් සත්වයො ද කාමපලිපයෙහි ලග්න වූවාහු එයින් නැගී රමණීය ප්‍රව්‍රජ්‍යාවට එළඹෙන්නට අසමර්ථ වෙත්. යම්සෙ සුස්නාතවූ සුවිලිප්තාලඩ්කෘත වූ පුරුෂයක්හුගෙ ශරීරයෙහි වගුළ සියුම් රජස්හු ඔහු දූර්ණී කෙරෙද්ද, එසෙයින් මෑ සෘද්ධි බලයෙන් ආකාශයෙන් යන හිරසඳ සෙයින් ලොකයෙහි ප්‍රසිද්ධ

---

[1] සන්නිධානං

පුරුෂයො ද කාමරජසින් ඇතුළත් වූ තැන් පටන් ගෙන ගුණ වර්ණවිරහිතයෙන් දුර්වර්ණ වෙත්. යම්සෙ ධූමයෙන් පහරනා ලද සුපරිශුද්ධ භිත්තිදු කාලවර්ණ වෙ ද, එ සෙයින් මැ කාම ධූමයෙන් පහරනා ලද අතිපරිශුද්ධශ්‍රාන ද ගුණවිනාශයට පැමිණ කාලවර්ණ වෙ.

එයින් වදාළහ:-

277. "පඞ්කො ච කාමා පලිපා ච කාමා
භයඤ්චමෙතං තිමූලං පවුත්තං
රජො ච ධූමො ච මයා පකාසිතා[1]
හිත්වා තුවං පබ්බජ බ්‍රහ්මදත්ත" යි.

කාමාස්වාදය සර්ෂපයක් සෙයින් නිවතරයැ, කාමනිබන්ධන[2] දුඃඛ වූ කල මෙරුපර්වතය සෙයින් උච්චතරයි. කාමාස්වාදය පිනිබිඳක් සෙයින් අල්පතරයැ, කාමනිදාන දුඃඛ වූ කල සාගර ජලය සෙයින් අප්‍රමෙයයි. කාමාස්වාදය තිලබීජයක් සෙයින් අණුතරයැ, කාමහෙතු දුඃඛ වූ කල මහීතල සෙයින් විපුලයි. කාමාස්වාදය සර්ෂපගර්භයක් සෙයින් සම්බාධයැ. කාමනිමිත්ත දුඃඛ වූ කල ආකාශය සෙයින් අනන්තයි.

මෙ සෙයින් කාමතෙමෙහෙ පරිත්තසුඛ වන බැවින් අල්පාස්වාදයැ, දෘෂ්ටධර්මයෙහි ද් සම්පරායභවයෙහිද්[3] අනන්තාපරිමාණ දුඃඛදායක වන බැවින් බහුදුඃඛයැ ඓහලෝකික පාරලෝකික උප ක්ලෙශසාධක වන බැවින් බහුපායාසයැ, දෘෂ්ට ධාර්මිකසාම්පරායික උපද්‍රවාධිෂ්ඨාන වන බැවින් බහ්වාදීනවයැ. අල්පාස්වාද වන බැවින් අස්ථිකඩකාලයක් වැන්නැ, බහුසාධාරණ වන බැවින් මාංසපෙශියක් වැන්නැ, දහනකෘත්‍යසම්පාදක වන බැවින් තෘණොල්කාවක් වැන්නැ. මහාහිතාපකර වන බැවින්

---

[1] පකාසිතොB [2] කාමහෙතු ACD [3] සම්පරායයෙහිදුB

අඩ්ගාරකර්ෂුවක් වැන්නැ, ඉත්වර වැ ප්‍රත්‍යුපස්ථිත වන බැවින් ස්වප්නයක් වැන්නැ, තාවත්කාලික වන බැවින් පිරුළු අළ දැයක් වැන්නැ, සියලු අඩ්ගප්‍රත්‍යඩ්ගයන් භක්ෂනය කරවන බැවින් වෘක්ෂඵල වැන්නැ, අතිකූට්ටනාර්ථයෙන් අසිසසූනුවක්[1] වැන්නැ, විනිවෙධනාර්ථයෙන්[2] ශක්තිශූල වැන්නැ, සප්‍රතිභයාර්ථයෙන් සර්පමුඛ වැනි.

එයින් වදාළහ:-

278. "අප්පස්සාදා කාමා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො ඵත්ථභිය්‍යො. අට්ඨිකඩ්කලූපමා කාමා - පෙ - තිණුක්කූපමා කාමා, අඩ්ගාර කාසූපමා කාමා, සුපිනකූපමා කාමා, යාචිතකූපමා කාමා, රුක්ඛ ඵලූපමා කාමා, අසිසූනුපමා කාමා, සත්තිසූලූපමා කාමා, සප්පසිරූපමා කාමා බහුදුක්ඛා බහූපායාසා ආදීනවො ඵත්ථ භිය්‍යො" යි.

මෙ සෙයින් අල්පාස්වාද වූ කාමබන්ධනයෙහි බැඳී සත්වයො සංසාරකාන්තාරය තැර නො යාහි භවයෙහි මහත් දුක් අනුභව කෙරෙත්.

එයින් වදාළහ:-

279. "අප්පස්සාදා දුඛා කාමා නත්ථි කාමපරං දුඛං
යෙ කාමෙ පතිසෙවන්ති නිරයං තෙ
උප්පජ්ජරෙ" යි.

යම්සෙ සර්මාභිතප්ත පුරුෂයෙක් පිපාසාතුර වැ පානාගාරයට වැද වර්ණගන්ධරසසම්පන්න විෂසුරා දැක එහි ගිජු වැ හිතකාමයන් කියමන් නො ගෙන වසරහ බී විනාශයට යෙ ද, එසෙයින් මැ යමෙක් පඤ්චකාමයෙහි ගිජු වැ විදර්ජනයන්

---

[1] අසිසූනා DEF [2] විනිවේධනාර්ථයෙන් G

කියමන් නො ගෙන කාමපරිභොග කෙරෙමියි ත්‍රිවිධ දුශ්චරිත පුරා ද, හෙ දෘෂ්ටධර්මයෙහි මැ මහත් අනයව්‍යසනයට පැමිණ සම්පරායභවයෙහි මහත් අපායදුක් අනුභව කෙරෙ.

එයින් වදාළහ:-

280. "යො වෙ පියං මෙති පියානුකඩ්ඛී
අත්ථං නිරංකත්වා පියානි සෙවති
සොණ්ඩොව පිත්වාන විසස්ස ථාලාං
තෙනෙව සො හොති දුඛී පරත්ථ" යි.

යමෙක් අනාගතභවය[1] නො නහමා කාමසේවා කෙරෙ නම් බුභුක්ෂායෙන් කන කිපක් සෙයින් හෙ ඔහු නසයි.

එයින් වදාළහ:-

281. "ආයතිදොසං නාඤ්ඤාය යො කාමෙ පතිසෙවති
විපාකන්තෙ හනති නං කිම්පක්කම්ව භක්ඛිතං" යි.

ජනයො ක්ෂුරධාරයෙහි තුබූ මීබිදක් දිවින් ලෝනවුන් සෙයින් කාමාස්වාදයම කටටියහ. එයින් වන කටුකදුඃඛ නො නහමත්.

එයින් වදාළහ:-

282. "කටුකං මධුරස්සාදං පියං නිබ්බන්ධනං දුඛං
ඛුරංව මධුනා ලිත්තං උල්ලෙහං නාවබුජ්ඣති" යි.

සුනිශිත අසිපත්‍රයට ද් සුපායිත නිස්ත්‍රිංශයට ද් හෘදය දෙශයෙහි ප්‍රක්ෂිප්ත ශක්තියට ද් පොරුෂප්‍රමාණ වූ ප්‍රජ්වලිත අඞ්ගාර කර්ෂුවට ද් ආදිප්ත අයඃස්කන්ධයට ද් හලාහලවිෂයට ද් ප්‍රක්වථිත තෛලයට ද් විලින තාම්‍රලොහොදකයට ද් වඩා කාමය දුඃඛ පරිදි දක්වන්නට වදාළහ.

---

[1] අනාගතභය BC

283. "අයි යථා සුනිසිතෝ තෙත්තිංසොව සුපායිතෝ
සත්තීව උරසිඛිත්තෝ කාමා දුක්ඛතරා තතෝ.

අඞ්ගාරානංව ජලිතං කාසුං සාධිකපොරිසං
වාලංව දිවසං තත්තං කාමා දුක්ඛතරා තතෝ.

විසංයථා හලාහලං තෙලමුක්කඨිතං යථා
තම්බලොහවිලිනංව කාමා දුක්ඛතරා තතෝ" යි.

බුදුන් විසින් මායා මරීචි ජලචන්ද්‍ර තරඞ්ග හා සම කොට දක්වනලද ඇප්පෙපම කාමයෙහි ආසක්ති ඇති බාලයෝ නරක යෙහි නිපතිත වෙත්.

එසින් කීහ:-

284. "මායාමරීචිජලචන්ද්‍රතරඞ්ගකල්පා
කාමා ජිනෙන ගදිතා විභවාභි සත්‍රියඤ්ච
ඇප්පාණකදූර්ලලිතවිභ්‍රමවිප්‍රලබ්ධා[1]
බාලාභි පතන්ති නිරයෙෂ්වපි යෙඅු සක්තාභි" යි.

විෂ හා විෂය හා දෙදෙන මධුරයහ, කටුකයහ, ගහනයහ, චපලයෝයි. කියෙයැ යත්? ඔහු පරිභොග මාත්‍රයෙන් මධුරයහ, ඝෝර වූ විපාකයෙන් කටුකයහ, මොහ නමැති අන්ධකාරයෙන් ගහනයහ, දුර්වාර වූ විෂවෙගයෙන් හා විෂයවෙගයෙන්[2] චපලයෝයි.

එසින් කීහ:-

285. "ආපාතමාත්‍රමධුරා විෂයා විෂඤ්ච
ඝෝරා විපාකකටුකා විෂයා විෂඤ්ච
මොහාන්ධකාරගහනා විෂයා විෂඤ්ච
දුර්වාරවෙගචපලා විෂයා විෂඤ්ච" යි.

---

[1] විප්‍රලුබ්ධා - B [2] විෂවෙගයෙන් - විෂයෙන් - CD

විෂ හා විෂය හා බලන කලැ විෂ මැ මැනැවැ, විෂය නො මැනැවැ, කවර හෙතුවින යත්? විෂතෙමෙහෙ එක් ජන්මයෙක්හි මැ විෂබවට යෙයි, විෂයයො ජන්මාන්තරයෙහිදු විෂ බවට යෙත්.

එයින් කීහ:-

286. "කාමං විෂඤ්චවිෂයාශ්ච නිරූප්‍යමාණාඃ
ශ්‍රෙයො විෂං න විෂයා විෂමඤ්චභාවාඃ
එකත්‍ර ජන්මනි විෂං විෂතාමි ප්‍රයාති
ජන්මාන්තරෙ'පි විෂයා විෂතාමි ප්‍රයාන්ති" යි.

යම්සෙ වෘෂභයෙක් විෂමකූපතටසමීපයෙහි ජාත වූ තෘණපණීයෙහි ලොභ ඇති වැ ගොස් ප්‍රපාතයෙහි හෙ ද, එ සෙයින් මැ කාමානුගත සිත් ඇති බාලජනයො ගොස් නරක ප්‍රපාතයෙහි ප්‍රපතිත වෙත්.

එයින් කීහ:-

287. "යද්වද්වෘෂො විෂමකූපතටාන්තරූඪ
දුර්වාප්‍රවාලලවලාලසමානසස්සන්
ශ්වභ්‍රෙ පතත්‍යථ ච නාශ්නුත එව ලොභං
තද්වත් සුඛාන්විතමතිඃ ඛලු ජීවලොකඃ" යි.

නීල්වෙලෙහෙන් දසමඬුලු[1] මුවහ නො වනතුරු සුඛලොවයෙහි නො ඇවිළ වනවිලින් හැවිළ නැඟී යන හසුන් සෙයින් වස්තු කාමක්ලෙශකාමයනුද් පුත්‍රදාරාවනුද් වෛපුල්‍යයට නො යන තුරු ක්ෂණසුඛලවයෙහි ලුබ්ධ[2]වැ විනාශයට නො ගොස් තපොවනයට යනු මැනැ.

---

[1]සදමඬුලුC [2]ප්‍රලුබ්ධB

එයින් කීහ:-

288. "අලිගවලකලඩ්කශ්‍යාමලා මෙඝමාලාඃ
පිදධති හි න යාවදෙව්‍යාමදික්වක්‍රවාලම්
අපසරත සරස්තස්‍ය ත්වරං මල්ලිකාක්ෂාඃ
ක්ෂණසුඛලවලුබ්ධා මා විපත්තිම්භජධ්වම්" යි.

පුඟුලො දෙදෙනෙක් වෙති, අනුසොතගාමියැ පටිසොතගාමියයි. එහි යටහොයට යනුවක්හු සෙයින් කාමසෙවා කොට අපායභාග් වනුයෙ අනුසොතගාමී නම් වෙයි; උඩුහොයට යනුවක්හු සෙයින් වැලප වැලප ද බ්‍රම්සරවස් රැක ස්වර්ගයට යනුයෙ පටිසොතගාමී නම් වෙ.

එයින් වදාළහ:-

289. "ඉධ භික්ඛවෙ එකව්වො පුග්ගලො කාමෙ ව පටිසෙවති පාපඤ්ච කම්මං කරොති, අයං වුච්චති භික්ඛවෙ අනුසොතගාමී පුග්ගලො. ඉධ භික්ඛවෙ එකව්වො පුග්ගලො කාමෙ ව න පටිසෙවති, පාපඤ්ච කම්මං න කරොති, සහාපි දුක්ඛෙන සහාපි දොමනස්සෙන අස්සුමුඛොපි රුදමානො පරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං චරති, අයං වුච්චති භික්ඛවෙ පටිසොතගාමී පුග්ගලො" යි.

කාමයෙහි රක්තයො පව්කම් කොට නරකයට යෙති, කාමය පිවාහු පින්කම් කොට ස්වර්ගයට යෙත්.

එයින් වදාළහ:-

290. "කාමෙසු ගිද්ධා කාමරතා කාමෙසු අධිමුච්ඡිතා
නරා පපානි කත්වාන උපපජ්ජන්ති දුග්ගතිං

යෙ ච කාමෙ පහත්වාන නික්ඛන්තා අකුතොභයා
එකොදිභාවාධිගතා න තෙ ගච්ඡන්ති දුග්ගතිං" යි.

ආදීප්ත වූ තෘණොල්කා ගත්තාහු දවයි, පිවාහු නො දවා, එසෙයින් මැ කාමයෝ ගතුවන් දවති, පිවන් නො දවත්.

එසින් වදළහ:-

291. "ආදිත්තා තිණුක්කා ගණ්හන්තං ඩහති, නො මුච්චන්තං. උක්කාපමා හි කාමා ඩහන්ති යෙ තෙ න මුඤ්චන්ති" යි.

මෙයැ "කාමයෙහි ආදීනව" නමී

---

(20). කරිස්සාමි සමණධම්මං යන තන්හි ශ්‍රමණධර්‍ම නම් කවරැ යත්? ශීලසම්පදාදි ගුණධර්‍මයි.

වදළෙ මැනෙ:-

292. "චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ, කතමෙහි චතූහි? ඉධ භික්ඛවෙ භික්ඛු සීලවා හොති, ඉන්ද්‍රියෙසු ගුත්තදවාරො හොති, භොජනෙ මත්තඤ්ඤූ හොති, ජාගරියං අනුයුත්තා හොති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු සීලවා හොති? ඉධ භික්ඛවෙභික්ඛු සීලවා හොති, පාතිමොක්ඛසංවරසංවුතො විහරති ආචාරගොචරසම්පන්නො අණුමත්තෙසු වජ්ජෙසු භයදස්සාවී සමාදාය සික්ඛති සික්ඛාපදෙසු. එවං ඛො භික්ඛවෙ භික්ඛු සීල සම්පන්නො හොති. කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්ත දවාරො හොති? ඉධ භික්ඛවෙ භික්ඛු චක්ඛුනා රූපං දිස්වා න

නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං චක්ඛුන්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්සවෙය්‍යුං තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති චක්ඛුන්ද්‍රියං, චක්ඛුන්ද්‍රියෙ සංවරං ආපජ්ජති. සොතෙන සද්දං සුත්වා - පෙ - ඝානෙන ගන්ධං ඝායිත්වා, ජිව්හාය රසං සායිත්වා, කායෙන ඵොට්ඨබ්බං ඵුසිත්වා - මනසා ධම්මං විඤ්ඤාය න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී. යත්වාධිකරණමෙනං මනින්ද්‍රියං අසංවුතං විහරන්තං අභිජ්ඣාදෙමනස්සා පාපකා අකුසලා ධම්මා අන්වාස්ස වෙය්‍යුං. තස්ස සංවරාය පටිපජ්ජති, රක්ඛති මනින්ද්‍රියං, මනින්ද්‍රියෙ සංවර ආපජ්ජති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඉන්ද්‍රියෙසු ගුත්තද්වාරෝ හොති, කථඤ්ච භික්ඛවෙ භික්ඛු ඉොජනෙ මත්තඤ්ඤූ හොති? ඉධ භික්ඛවෙ භික්ඛු පටිසංඛායොනිසෝ ආහාරං ආහාරෙති, නෙවදවාය න මදාය න මණ්ඩනාය න විභූසනාය යාවදෙව ඉමස්ස කායස්ස ඨිතියා යාපනාය විහිංසූපරතියා බ්‍රහ්මචරියානුග්ගහාය ඉති පුරාණඤ්ච වෙදනං පටිහංඛාමි, නවඤ්ච වෙදනං න උප්පාදෙස්සාමි, යාත්රා ච මෙ භවිස්සති, අනවජ්ජතා ච ඵාසුවිහාරෝ චාති. එවං ඛො භික්ඛවෙ භික්ඛු ඉොජනෙ මත්තඤ්ඤූ හොති, කථඤ්ච භික්ඛවෙ භික්ඛු ජාගරියං අනුයුත්තෝ හොති? ඉධ භික්ඛවෙ භික්ඛු දිවසං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා පඨමං යාමං චඞ්කමෙන නිසජ්ජාය ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, රත්තියා මජ්ඣිමං යාමං දක්ඛිණෙන පස්සෙන සීහසෙය්‍යං කප්පෙති පාදෙ පාදං අච්චාධාය සතෝ සම්පජානෝ උට්ඨානසඤ්ඤං මනසි කරිත්වා, රත්තියා පච්ඡිමං යාමං පච්චුට්ඨාය චඞ්කමෙන නිසජ්ජාය

ආවරණීයෙහි ධම්මෙහි චිත්තං පරිසොධෙති, එවං ඛො භික්ඛවෙ භික්ඛු ජාගරියං අනුයුත්තො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ චතුහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙති.

"සීලෙ පතිට්ඨිතො භික්ඛු ඉන්ද්‍රියෙසු ච සංවුතො
භොජනම්හි ච මත්තඤ්ඤූ ජාගරියං අනුයුඤ්ජති.

එවං විහරමානොපි අහොරත්තමතන්දිතො
භාවයං කුසලං ධම්මං යොගක්ඛෙමස්ස පත්තියා.

අප්පමාදරතො භික්ඛු පමාදෙ භයදස්සිවා
අභබ්බො පරිහානාය නිබ්බානස්සෙව සන්තිකෙ" යි.

මෙ මතු නො වෙයි, කුහනාදිනට සිද්ධවන ව්‍යාපතුද් කුහනාදින් වියුක්ත වූවානට වන සම්පතුද් වදාළෙ මැ නො - කිසෙයැ යත්?

යම් කෙනෙක් කුහනාදියැ නියුක්ත වූහු ද ඔහු බුද්ධ ධර්මයෙහි ප්‍රතිෂ්ඨා නො ලබත්.

එයින් වදාළහ:-

293. "කුහා ඵද්ධා ලපා සිඞ්ගී උන්නලා අසමාහිතා
න තෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධ දෙසිතෙ" යි

යම් කෙනෙක් කුහනාදින් වියුක්ත වූහු ද ඔවිහු බුද්ධ ධර්මයෙහි ප්‍රතිෂ්ඨිත වෙත්.

එයින් වදාළහ:-

294. "නිත්තුහා නිල්ලපා ධීරා අත්ඵද්ධා සුසමාහිතා
තෙ වෙ ධම්මෙ විරූහන්ති සම්මාසම්බුද්ධ
දෙසිතෙ" යි.

යමෙක් ලාභසත්කාරපරවශ වැ ක්‍රෝධාදියෑ නියුක්ත වී නම් හෙ සරූකෙත වූ පූතිබීජ සෙ සද්ධර්මයෙහි රූඩ නො වෙ.

එයින් වදළහ:-

295. "කොධමක්ඛගරූ භික්ඛු ලාභසක්කාරගාරවෝ[1]
සුඛෙත්තෙ පූතිබීජංව සද්ධම්මෙන විරූහති" යි.

යම් කෙනෙක් සොභානුගත ධාෂධරය සෙයින් ධර්මානුගත වෙද්ද ඔහු සද්ධර්මයෙහි ප්‍රරූඩ[2] වෙත්.

එයින් වදළහ:-

296. "යෙ ච සද්ධම්මගරූ නො විහංසු විහරන්ති ච
තෙ වෙ ධම්මෙ විරූහන්ති සොහනඤ[3]
මිවොසධා" යි.

යමෙක් චතුර්විධ ඊර්ෂ්‍යාපථයෙහි ගෙහාශ්‍රිත විතර්කයක්[4] විතර්කණය කරන්නෙ වී නම් හෙ නිර්වාණප්‍රාප්තියට අසමර්ථ වෙ.

එයින් වදළහ:-

297. "වරං වා යදි වා තිට්ඨං නිසින්නො උදවා සයං
යං විතක්කං විතක්කෙති පාපකං ගෙහනිස්සිතං
කුම්මග්ගපටිපන්නො සො මොහනෙය්‍යෙසු
මුච්ඡිතො
අහඛ්බා තාදිසො භික්ඛු වුට්ඨුං සංඛ්‍යාති
මුත්තමං" යි.

යමෙක් විතර්කප්‍රශමනයෙහි රත වී නම් හෙ නිර්වාණ ප්‍රාප්තියට සමර්ථ වෙ.

---

[1] කාරණාABCD [2] ප්‍රතිරූඩA [3] රූඩB
[4] සොහමන්නයG [5] විතර්කියන්B

එයින් වදාළහ:-

298. යො ච චරං වා තිට්ඨං වා නිසින්නො උදවා සයං
විතක්කං සමයිත්වාන විතක්කූපසමෙ රතො
හබ්බා සො තාදිසො භික්ඛු වුට්ඨුං සම්බොධි
මුත්තමං" යි.

යමෙක් තෘෂ්ණාවශග වී නම් හෙ සංසාරාතික්‍රමණයට අසමර්ථ වෙයි, නො වීනම් සමර්ථ වෙ.

එයින් වදාළහ:-

299. "තණ්හාදුතියො පුරිසො දීඝමද්ධාන සංසරං
ඉත්ථභාවඤ්ඤථාභාවං සංසාරං නාතිවත්තති.

එතමාදිනවං ඤත්වා තණ්හං දුක්ඛස්ස සම්භවං
විතතණ්හො අනාදානො සතො භික්ඛු පරිබ්බජෙ" යි.

යමක්හට සබ්‍රහ්මචාරීන් කෙරෙහි ගොරව නැද්ද හෙ අහසට පොළොව සෙයින් සද්ධර්මයට දුරු වෙ

එයින් වදාළහ:-

300. "යස්ස සබ්‍රහ්මචාරීසු ගාරවො නූපලබ්භති
ආරකා හොති සද්ධම්මා නභා සො පඨවී යථා" යි.

යම් තෙනක්නට සබ්‍රහ්මචාරීන් කෙරෙහි හ්‍රීඅපත්‍රප්‍ය ඇද්ද ඔහු සංසාරදුඃඛක්ෂය කරනුවට සමර්ථ වෙත්.

එයින් වදාළහ:-

301. "යෙසඤ්ච හිරිඔත්තප්පං සදා සම්මා උපට්ඨිතං
විරූළ්හබ්‍රහ්මචරියා තෙ සන්තො ඛීණපුනබ්භවා" යි.

---

[1] සම්මිසරුන්AB

උද්ධත චපල මහණ පවුල්[1] පෙරෙවියෙ සිංහසමි පෙරෙවි වදුරක්හු සෙයින් හෙ එයින් හොබනෙ නො වෙ.

එයින් වදාළහ:-

302. "උද්ධතො චපලො භික්ඛු පංසුකූලෙන පාරුතො
කපීව සිහවම්මෙන න සො තෙනූපසොභති" යි.

අනුද්ධත අචපල සංයම ඇති මහණ පවුල්[1] පෙරවියෙ ගිරි ගහ්වරයෙහි[2] සිංහමෘගරාජයක්හු සෙයින් ශොභමාන වෙ.

එයින් වදාළහ:-

303. "අනුද්ධතො අචපලො නිපකො සංවුතින්ද්‍රියො
සොභති පංසුකූලෙන සීහොව ගිරිගබ්භරෙ" යි.

යමෙක් අඟුවින් පරිලිප්ත ක්‍රිමියක්හු සෙයින් ලාභසත්කාර යෙහි ප්‍රගල්භ වූයෙ ද, හෙ ජුගුප්සිත ද් වෙයි; තුච්ඡ වැද යෙ.

එයින් වදාළහ:-

304. "කිමීව මීළ්හසංලිත්තො සංඛාරෙ අධිමුච්ඡිතො
පගාළ්හො ලාභසක්කාරෙ තුච්ඡො ගච්ඡති
පොඨිලො" යි.

අධර්මයෙන් දිවිරක්නෙ මැනෑ ද? ධර්මයෙන් මරණ මැනෑ ද? යත්: අධර්මයෙන් දිවි රක්නෙ නො මැනැවැ; ධර්මයෙන් මරණ මැනැවි.

එයින් වදාළහ:-

305. "ජීවිතඤ්ච අධම්මෙන ධම්මෙන මරණඤ්ච යං
මරණං ධම්මිකං සෙය්‍යො යඤ්ච ජීවෙ
අධම්මිකං" යි.

---

[1] පහුල්G [2] ගුහාවරයෙහිB [2] ගබ්භරයෙහිACD

යම් මහණෙක් ධර්මාභිරත ද, ධර්මචින්තා කෙරෙ ද, හෙ ධර්මයෙන් ප්‍රභ්‍රෂ්ට නො වෙ.

එසින් වදළහ:-

306. "ධම්මාරාමො ධම්මරතෝ ධම්මං අනුවිචින්තයං
ධම්මං අනුස්සරං භික්ඛු සද්ධම්මා න පරිහායති" යි.

යම් මහණෙක් උපශාන්ත ද, උපරත ද, පරිනිර්වෘත ද, හෙ මාරුතයෙන් වෘක්ෂපර්ණ සෙයින් පාපධර්මයන් ප්‍රලය කෙරෙ.

එසින් වදළහ:-

307. "උපසන්තෝ උපරතෝ මන්තභාණී අනුද්ධතෝ
ධුනාති පාපකෙ ධම්මෙ දුමපත්තංව මාලුතෝ" යි.

පසඟතුරුරැවින් උපදනා සොම්නස් සමාහිතචිත්තයින් ධර්ම චින්තා කරනුවහට උපදනා සොම්නස් හා සම නො වෙ.

එසින් වදළහ:-

308. "පඤ්චඞ්ගිකස්ස තූරියස්ස න රති හොති තාදිසී
යථා එකග්ගචිත්තස්ස සම්මා ධම්මං විපස්සතෝ" යි.

මෙතෙකින් කරිස්සාමි සමණධම්මං යනුයෙහි කථිතව්‍ය අර්ථ සඞ්ක්ෂෙපයෙන් දක්වනලදි.

---

(21). ලභිස්සාමි සමණඵලං යන තන්හි ශ්‍රමණඵල නම් කවර යත්? ජාතිජරාමරණදුඃඛයෙන් පරිමුක්තිය යැ.

එහි ජාති නම් කවර යත්? වදළෙ මැ නො:-

309. "යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජාති සඤ්ජාති ඔක්කන්ති අභිනිබ්බත්ති ඛන්ධානං

පාතුභාවො ආයතනානං පටිලාභො අයං වුච්චති[1] ජාති" යි.

ජාති කිසෙ දුක් වුව යත්? ගබ්භාවක්කන්තිමූලකදුක්ඛයැ, ගබ්භ පරිහරණමූලකදුක්ඛයැ, ගබ්භවිපත්තිමූලකදුක්ඛයැ, විජායන මූලකදුක්ඛයැ, ගබ්භයෙන් බහිර්නිෂ්ක්‍රමණමූලකදුක්ඛයැ, අත්තොපක්‍රම මූලකදුක්ඛයැ, පරොපක්‍රමමූලකදුක්ඛයැ, යන එවමාදි අනෙක දුක්ඛයනට මුල්වන බැවින් ජාති දුක්ඛ නම් වෙ.

## මෙහි ගබ්භාවක්කන්තිමූලදුක්ඛ නම් කවර යත්?

සත්ව මාතෘකුක්ෂියැ උපදනෙ උත්පලපද්මපුණ්ඩරීකාදියැ උපදනෙ නො වෙයි. කොහි උපද්දි යත්? අමාශයෙන් යට පක්වාශයෙන් මතුයෙහි උදරපටලය හා පාර්ශ්වතණ්ඩක හා දෙක මධ්‍යයෙහි පරමසම්බාධ වූ තීව්‍රාන්ධකාර වූ නානාකුණපගන්ධ පරිභාවිත පරමදුර්ගන්ධපවනවිවරිත වූ අධිමාත්‍රජුගුප්සා ඇති කුක්ෂිප්‍රදෙශයෙහි පූතිමත්ස්‍ය පූතිකුල්මාෂ සදෘශනිකායෙහි ක්‍රිමියන්හු සෙයින් උපද්දි. හෙ එහි උපත්තෙ දසමසක් දවස් මාතෘකුක්ෂිසම්භව වූ උෂ්මයෙන් පුටපාකයක් සෙයින් පැසෙන්නෙ පිටිපිඬක් සෙයින් හිඳෙන්නෙ ආකුඤ්චනප්‍රසාරණාදිරහිත වූයෙ අධිමාත්‍රදුක්ඛානුභව කෙරෙයි - මෙ ගබ්භාවක්කන්තිමූලකදුක්ඛයැ.

## ගර්භපරිහරණමූලකදුක්ඛ නම් කවර යත්?

මාතෘව සාහස වැ උපස්බලන ගමන නිෂදන ව්‍යුත්ථාන පරිවර්තනාදියැ සුරාධූර්තහස්තගත වූවක්හු සෙයින් අහිතුණ්ඩික[2] හස්තගත සර්පොත්තකයන්හු සෙයින් ආකර්ෂණ[3] පරිකර්ෂණ අවධූනන නිර්ධූනනාදි උපක්‍රමයෙන් අධිමාත්‍රදුක්ඛානුභව කෙරෙයි, මව ගිතොදකපානකාලයෙහි ගීත නරකොත්පන්නයන්හු සෙයින්

---

[1] වුච්චති ගික්ඛවෙEF [2] අහිගුණ්ඩිකABC [3] අවකර්ෂණABC

උෂ්ණාහාරාභ්‍යවහරණකාලයෙහි අඩ්ගාරවෘෂ්ටිසම්පරිකිණියක්හු[1] සෙයින් ලවණාම්ලාදිඅභ්‍යවහරණකාලයෙහි ක්ෂාරවතක්ෂකාදි කර්මකාරණා ප්‍රපතයක්හු සෙයින් තීව්‍රදුඃඛානුභව කෙරෙයි - මෙ ගර්භපරිහරණමූලකදුඃඛයැ.

ගර්භවිපත්ති මූලකදුඃඛ නම් කවර යත්?

එ සත්වයහට මූඩගර්භමාතෘවගෙ මිත්‍රාමාත්‍යසුහෘජ්ජනයනුදු විසින් අදර්ශනාර්ශ වූ දුඃඛොත්පත්ති ස්ථානයෙහි ඡෙදනස්ඵාලනාදි විසින් යම් දුඃඛයෙක් උපදී ද, මෙ ගර්භවිපත්ති මූලකදුඃඛයැ.

විජායනමූලකදුඃඛ නම් කවර යත්?

විජයමාන මාතෘවගෙ කර්මජවාතයන් විසින් පරිවර්තනය කොට නරකප්‍රපාතයක් බඳු අතිභයානක වූ යොනිමාර්ගයට ප්‍රතිපාද්‍යමාන සත්වයහට පරමසම්බාධ වූ යොනිමුඛයෙන් කුඤ්චිකාච්ඡිද්‍රයෙන් (මෙන්) නිෂ්කෘෂ්‍යමාණයහට සඞ්ඝාතපර්වතයෙන් විවූර්ණ්‍යමාන නරකසත්වයක්හට සෙයින් යම් දුඃඛයෙක් උපදී ද, මෙ විජායනමූලකදුඃඛයැ.

ගර්භයෙන් බහිර්නිෂ්ක්‍රමණමූලකදුඃඛ නම් කවර යත්?

ජාතසත්වයහට තරුණව්‍රණසදෘශ සුකුමාරශරීරයහට හස්තග්‍රහණ සනාපනධොවනවොල පරිමාර්ජනාදිකාලයෙහි සූචිමුඛ ක්ෂුරධාරායෙන් වෙධනස්ඵාලනසමාන යම් දුඃඛයෙක් උපදී ද, මෙ ගර්භයෙන් බහිර්නිෂ්ක්‍රමණමූලකදුඃඛයැ.

ආත්මොපක්‍රමමූලකදුඃඛ නම් කවර යත්?

එයින් උත්තරයෙහි ප්‍රවෘත්තියැ තමා මැ තමහට වධ කරන්නාහට, අවෙලකව්‍රතාදි විසින් ආතාපන පරිතාපනානුයොග යෙහි යුක්තයහට, ක්‍රොධවශයෙන් අභුඤ්ජමානයහට, රජ්ජු විසින්

---

[1] ක්ෂාරාපතක්ෂිකාදි AB [1] ක්ෂාරාවතක්ෂිකාදි EF

උද්බධ්‍යමානයහට යම් දුඃඛයෙක් උපදීද, මෙ ආත්මොපක්‍රම මූලකදුඃඛයැ.

<u>පරොපක්‍රමමූලකදුඃඛ</u> නම් කවර යත්?

පරයා කෙරෙන් වධබන්ධනාදීන් අනුභව කරන්නාහට යම් දුඃඛයෙක් උපදී ද, මෙ පරොපක්‍රමමූලකදුඃඛයි.

මෙහි ආදිශබ්දයෙන් දුඃඛදුඃඛ, විපරිණාමදුඃඛ, සංස්කාරදුඃඛ, ප්‍රච්ඡන්නදුඃඛ, අප්‍රච්ඡන්නදුඃඛ, පර්‍යායදුඃඛ, නිෂ්පර්‍යායදුඃඛාදි සඞ්ග්‍රහ කරනු.

දැන් මෙහි උක්තානුක්තදුඃඛ සඞ්ග්‍රහකළ ගාථා දක්වනු ලැබේ.

310. "යඤ්චාපි ගුථනරකෙ විය මාතුගබ්භ
සත්තො වසං චිරමථො බහිනික්ඛමඤ්ච
පප්පොති දුක්ඛමතිඝොරම්දම්පි නත්ථි
ජාතිං විනා ඉතිපි ජාතිරයං හි දුක්ඛා.

ජායෙථ නො වෙ නරකෙසු සත්තො
තත්ථග්ගිදාහාදිකමප්පසය්හං
ලභෙථ දුක්ඛං නු කුහිං පතිට්ඨං
ඉච්චාහ දුක්ඛාති මුනීධ ජාතිං.

දුක්ඛං තිරච්ඡෙසු කසාපතොද-
දණ්ඩාභිඝාතාදිභවං අනෙකං
යන්තං කථං තත්ථ භවෙය්‍ය ජාතිං
විනා තහිං ජාති තතොපි දුක්ඛා.

පෙතෙසු දුක්ඛං පන ඛුප්පිපාසා-
වාතාතපාදිප්පභවං විචිත්තං
යස්මා නජාතස්ස න තත්ථ අත්ථි
තස්මාපි දුක්ඛං මුනිජාතිමාහ.

තිබ්බන්ධකාරෙ ච අසය්හසීතෙ
ලොකන්තරෙ යං අසුරෙසු දුක්ඛං -
නතං භවෙ තත්ථ න වස්ස ජාති
යතො අයං ජාති තතොපි දුක්ඛා.

කිං භාසිතෙන බහුනා නනුයං කුහිඤ්චි
අත්ථිධ කිඤ්චිදපි දුක්ඛමිදං කදාචි
නෙවත්ථිජාතිවිරහෙ යදතො මහෙසි
දුක්ඛාති සබ්බපඨමං ඉමමාහ ජාතිං" යි.

මෙ ජාතිදුඃඛයි.

ජරා නම් කවර යත්? වදාළෙ මැනො:-

311. "යා තෙසං තෙසං සත්තානං තම්හි තම්හි සත්තනිකායෙ ජරා ජීරණතා ඛණ්ඩිච්චං චලිත්තවතා ආයුනො සංහානි ඉන්ද්‍රියානං පරිපාකො අයං වුච්චති ජරා" යි.

මෙසෙයින් නිර්දිෂ්ටවූ සර්වජරා ප්‍රකටයැ ප්‍රච්ඡන්නයයි ද්විවිධ වෙ. එහි දන්තාදීන් කෙරෙහි ඛණ්ඩාදිභාදිභාවදර්ශන හෙයින් රූපධර්මයන් කෙරෙහි ජරා "ප්‍රකටජරා" නම් වෙයි. අරූපධර්මයන් කෙරෙහි ජරා වූ කල තාදාශ විකාරයක්හුගෙ අදර්ශන හෙයින් "ප්‍රච්ඡන්න ජරා" නම් වෙ - සවීවියැ අවීවියැ යිද් ජරා ද්විවිධ වෙ - එහි මණි කනක රජත ප්‍රවාලවන්ද්‍ර සූර්‍යාදීන්ගෙ

ජරා මන්දදශකාදියැ ප්‍රාණීනට සෙයිනුද් පුෂ්පඵලපල්ලවාදීන් කෙරෙහි අප්‍රාණීනට සෙයිනුදු අතුරතුරෙහි වර්ණවිශෙෂාදීන් දුර්විඥෙය වන බැවින් අවීචි ජරා නම් වෙයි, අතුරු නො පැනෙන ජරායැ යුසෙයි. එයින් පිටත් සවොක්තයන් කෙරෙහි අතුරතුරෙහි වර්ණවිශෙෂාදීන් සුවිඥෙය වන බැවින් ජරා "සවීචි" ජරා නම් වෙ.

ජරා තොමොහො[1] කුමට දුක් වුව යත්? සංස්කාර දුඃඛ වන බැවින් දුඃඛ මැයැ, කායික වෛතසික දුඃඛයනට වස්තු වන බැවින් දුඃඛ මැයි.

කිසෙයැ යත්?

ජීර්ණයාගෙ ආත්මභාවය ජරත් ශකටයක් සෙයින් දුර්වල වෙයි, ස්ථානගමනාසන සඳහා ව්‍යායාම කරන්නාහට බලවත් කායදුඃඛ උපද්දි. යම් හෙතුවෙකින් දහරකාලයෙහි සූක්ෂ්ම දවූ ස්වවිෂය සුවයෙන් ගන්නට සමර්ථ වූ චක්ෂුරාදීන්ද්‍රිය ජරාප්‍රාප්තය හට පරිකක්වැ ආලුලිත අවිශද වූයෙ ඖදාරික ද වූ ස්වවිෂය ග්‍රහණයට අසමර්ථ වෙ ද, එ හෙතුවින් පුත්‍රදාරාවන් පූර්වයෙහි සෙයින් සංරක්ෂණය නො කටහෙන්නාහට දොර්මනස්‍ය උපද්දි. මෙසෙයින් අඞ්ගප්‍රත්‍යඞ්ගශෛවිල්‍ය ඉන්ද්‍රියවිකාර විරූපතා යොවන විනාශ වීර්‍ය්‍ය හානි ස්මෘතිමතිවිප්‍රවාස පරපරිභවාදි අනෙක ප්‍රත්‍යය වූ කායික වෛතසික දුඃඛ උපද්දි, ජරා එයට වස්තුවැ.

එයින් කිහ:-

312. "අඞ්ගානං සිථිලිභාවා[2] ඉන්ද්‍රියානං විකාරතො
යොබ්බනස්ස විනාසෙන බලස්ස උපඝාතතො.

---

[1] තොමොB [2] භාවොABCD

විප්පවාසා සතාදීනං පුත්තදාරෙහි පත්තනො[1]
අපසාදනීයතො වෙව හියෝ බාලත්තපත්තියා.

පප්පොති දුක්ඛං යං මව්වො කායිකං මානසං තථා
සබ්බමෙතං ජරාහෙතු යස්මා තස්මා ජරා දුඛා" යි.

මෙ ජරාදුඃඛ යි.

මරණ නම් කවර යත්? තිෂ්‍ය මෘත යැ, පුෂ්‍ය මෘත යැ. යන තන්හි සෙයින් එකභවපර්‍යාපන්න ජීවිතෙන්ද්‍රිය ප්‍රබන්ධවිච්ඡෙද සඞ්ඛ්‍යාත සංවෘතිමරණ මැ "මරණ" නම්.

වදාළෙ මැ නො:-

313. "යං තෙසං තෙසං සත්තානං තම්හා තම්හා සත්තනිකායා චුති චවනතා හෙදෙ අන්තරධානං මච්චුමරණං කාලකිරියා බන්ධානං හෙදෙ කළෙබරස්ස නික්ඛෙපො ජීවිතින්ද්‍රියස්ස උපච්ඡෙදෙ. ඉදං වුච්චති මරණං" යි.

මෙහි ජාතිප්‍රත්‍යයෙන් වන මරණ උපක්‍රම මරණ ස්වරස මරණ ආයුඃක්ෂය මරණ පුණ්‍යක්ෂය මරණ යනු "සංවෘතිමරණ" නම්. යම්සෙ අහිච්ඡත්‍ර මුකුලය[2] මස්තකයෙන් පාංශුග්‍රහණය කොට මැ උද්ගත වෙ ද, එ සෙයින් මැ සත්වයො ජරාමරණ ගෙන නිර්වෘත්ත වෙත්.

කිසෙයැ යත්?

ප්‍රතිසන්ධිචිත්ත ය උත්පත්ති සමනන්තරයෙහි මැ ජරාප්‍රාප්ත වැ පර්වතශිඛරයෙන් පරිගලිත ශිලා සෙයින් සම්ප්‍රයුක්ත ස්කන්ධයන් හා සමඟ බිඳෙයි. මෙසෙ ක්ෂණිකමරණ හා වුව ජාති හා සමඟ

---

[1] අපත්තනොCE [1] අත්තනොD [2] මකුලයB

ආගතයැ. ජාතයා වූ කල එකාන්තයෙන් මියන බැවින් ඉහාහි ප්‍රෙත වූ සංවෘතිමරණ ද ජාති හා සමඟ ආගතයි. එයින් මැ සත්ව ජාතකාලයෙහි පටන්ගෙන යම්සෙ උත්ථිත වූ සූර්‍ය්‍ය අස්තාභි මුඛ වූයෙ මැ යෙ ද, ගිය ගිය තන්හි මඳකුදු නො නවතී ද, යම්සෙ පාර්වතෙය වූ ශීඝ්‍රශ්‍රොතස් ඇති භාරභාරිණී නදී ස්‍යන්දනය කෙරෙ මැ ද, මඳකුදු[1] නොනවතී ද, එසෙයින් මැ මඳකුදු නො නවත්නෙ මරණාභිමුඛ වූයෙ මැ යෙයි.

එයින් කීහ:-

314. "යමෙකරත්තිං පඨමං ගබ්භෙ වසති මාණවො
අබ්භුට්ඨිතොව සයති ස ගච්ඡං න නිවත්තති" යි.

මෙසෙ යන සත්වයහට ග්‍රීෂ්මාභිතප්ත වූ ක්ෂුද්‍රනදී ජලයන්ගෙ ක්ෂයක් සෙයින් ප්‍රහාතවෙලායෙහි ආපොරසානුගත බන්ධන ඇති ද්‍රැමඵලයන්ගෙ පතනයක් සෙයින් මුද්ගරාභිතාඩිත මෘද්භාජනයන්ගෙ භෙදයක් සෙයින් සූර්‍ය්‍යරශ්මීන් ස්පෘෂ්ට වූ අවශ්‍යාය බින්දුන්ගෙ විධ්වංසනයක් සෙයින් මරණ මැ ආසන්න වෙ.

එයින් කීහ:-

315. "අච්චයන්ති අහොරත්තා ජීවිතං උපරුජ්ඣති
ආයු ඛීයති මච්චානං කුන්නදීනංව ඔදකං

ඵලානමිව පක්කානං නිච්චං පපතතො භයං
එවං ජාතානං මච්චානං නිච්චං මරණතො භයං

යථාපි කුම්භකාරස්ස කතං මත්තිකභාජනං
සබ්බං භෙදනපරියන්තං එවං මච්චානජීවිතං

උස්සාවොව තිණග්ගම්හි සුරියස්සුග්ගමනං පති
එවමායු මනුස්සානං මා මං අම්ම නිවාරය" යි.

---

[1] මනාකුදු

මරණ තෙමෙහෙ කවරහෙතුවින් දුක්වීය යත්? කායික චෛතසික දුඃඛයනට වස්තු වන බැවින් දුඃඛයි.

කිසෙයැ යත්?

මාරණාන්තික වූ ශරීරවෙදනාවො ප්‍රතිවාතයෙහි ගාහිත ආදීප්ත තාණොල්කා සෙයින් ශරීරයන් දවති, නරකනිමිත්තාදීන් වටහන කලැ බලවත් දොර්මනස්‍ය උපද්දි. මෙසෙ මෙ දුඃඛ ද්වයට වස්තු වන බැවින් දුඃඛ යැ මරණ.

එයින් කීහ:-

316. "පාපස්ස පාපකම්මාදි නිමිත්තමනුපස්සතො
හද්දස්සාපසහන්තස්ස වියොගං පියවත්ථුකං

මීයමානස්ස යං දුක්ඛං මානසං අවිසෙසතො
සබ්බෙසඤ්ඤාපි යං සන්ධිබන්ධනච්ඡෙදනාදිකං
විතුජ්ජමාන[1]මම්මානං හොති දුක්ඛං සරීරජං

අසය්හමප්පතීකාරං දුක්ඛස්සෙතස්සිදං යතො
මරණං වන්ථු තෙනෙතං දුක්ඛමිච්චෙව භාසිතං" යි.

මෙ මරණදුඃඛයි.

මෙහි දක්වනලද සංවාතිමරණ මතු මරණ නම් නොවෙයි, ප්‍රවාත්තියැ රූපාරූපධර්මයන්ගෙ හෙදසඞ්ඛ්‍යාත ක්ෂණිකමරණ ද් ක්ෂීණාශ්‍රවයන්ගෙ අප්‍රතිසන්ධික කාලක්‍රියා සඞ්ඛ්‍යාත සමුච්ඡෙද මරණ ද් මරණ නම් වෙ.

මෙසෙයින් දක්වනලද ජාතිජරාමරණදුඃඛයෙන් පරිමුක්ති ලක්ෂණ නිර්වාණපදප්‍රාප්තිය යැ ශ්‍රමණඵල නම්.

---

[1] විරජ්ජමාන

(22). <u>වනදෙවතානං</u> යන තන්හි දෙවතා ශබ්දය "දෙවතා සමිති තත්ථ අප්පමෙය්‍යා අනප්පිකා" යන තන්හි සෙයින් දෙවියන් හා දෙවිදූන් කෙරෙහි වැටෙයි. මෙයින් බැහැර "අථ ඛො අඤ්ඤතරා දෙවතා" යන තන්හි දිව්‍යපුත්‍රයන් කෙරෙහි වැටෙයි. "දෙවොයෙව දෙවතා"යි. "අභික්කන්තෙන වණ්ණෙන යා ත්වං තිට්ඨසි දෙවතෙ" යන තන්හි දිව්‍යකන්‍යාවන් කෙරෙහි වැටෙයි. "තා දෙවතා සත්තසතා උළාරා බ්‍රහ්මවිමානා අභිනික්ඛමිත්වා" යන තන්හි බ්‍රහ්මයන් කෙරෙහි වැටෙ.

---

(23). <u>තපොවනං පවිට්ඨො'ස්මි</u> යන තන්හි "කලහයෙහි ආදීනව දැක ක්ෂමායෙහි ගුණ දැක දෙවෂයෙහි දොස් දැක මෛත්‍රී මහානාශංස සෙ දැක තපස් කරන ජනයන්ගෙ වනයට වන්මි" යූසෙයි.

<u>එහි කලහයෙහි ආදීනව</u> නම් කවර යත්?

කලහවිසින් අස්ථානයෙහි වෛර කොට එක් රුක් දෙවියක්හු හා කාලසිංහයක්හු හා දෙදෙනා ඔවුනොවුන් කෙරෙහි කළ වෛර සියලු මෙකප පවත්නා පරිදි එන්දන ජාතකයෙන් දන්නෙයැ. හාසවිසින් එක් බකමුහුණුවකු හා කවුඩුවකු[1] හා දෙදෙනා ඔවුනොවුන් කෙරෙහි කළ වෛර යුගාන්ත දක්වා පවත්නා පරිදි කාකොලුකජාතකයෙන් දන්නෙයැ. නොවිචාරා එක් ශශකයක්හුගේ[2] තෙපුල් ගෙන තුන්දහසක් යොදුන් හිමවියෙහි සීපාවන් මුහුදට ප්‍රස්කන්නවූ පරිදි පඨවි උද්‍රියන ජාතකයෙන් දන්නෙයැ. දුර්ලව ද "ලටුකිකා" නම්

---

[1] කපුටුවකු EF [2] සසකුගෙ B

කුඩා ලිහිණියක සෝමසමාපන්න වූ මහත් ඇතක්හට විනාශ කළ පරිදි ලටුකික ජාතකයෙන් දන්නෙයෑ. දඹදිවි දෑනැ[1] තෙයෑට දහසක් නුවර ගත් දසබෑරජුන් ඔවුනොවුන් හා කලහ කොට විනාශයට ගිය පරිදි සතජාතකයෙන් දන්නෙයෑ. සමග්‍රයන්ගෙ සිදුරු[2] දක්නට නො පිළිවන් පරිදි රුක්ඛධම්මජාතකයෙන් දන්නෙයෑ. සමග්‍රයන් විග්‍රහයෙන් විනාශපත් පරිදි වට්ටක ජාතකයෙන් දන්නෙයෑ. සමග්‍රයන් උනුන් හෑරබෑ[3] නට පරිදි ලිච්ඡවි රාජවංශය උච්ඡින්නමූල වූ පරිද්දෙන් දන්නෙයෑ. මවුපියනුද් මෑරූ සතුරනුද් හා සමඟ වූවන් මහත් යසසුවයට පැමිණෙන පරිදි දීඝිති කොසලජාතකයෙන් දන්නෙයෑ. යමෙක් කලහකරු[4] වී නම් හෙ නො ලද ගුණ නො ලබයි, ලද ගුණෙන් පිරිහෙයි, අයශස් දඟදිගෑයෙහි පැතිරෙයි, මරණකාලයෙහි සම්මූඩ වෙයි, මිය ගොස් නරකයෙහි ප්‍රාදුර්භූත වෙ.

එසින් වදළහ:-

317. "යෝ යෝ භික්ඛවෙ භික්ඛු භණ්ඩනකාරකෝ කලහකාරකෝ විවාදකාරකෝ භස්සකාරකෝ සඞ්ඝෙ අධිකරණ කාරකෝ තස්ස පඤ්ඤ ආදීනවා පාටිකඞ්ඛා. කතමෙ පඤ්ච? අනධිගතං නාධි ගච්ඡති, අධිගතා පරිහායති, පාපකෝ කිත්ති සද්දෝ අබ්භුග්ගච්ඡති, සම්මූළ්හෝ කාලං කරෝති, කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති" යි.

මෙ කලහයෙහි ආදීනව යෑ.

<u>ක්ෂමා</u>යෙහි ගුණ නම් කවර යත්?

හෙ ද බොධිසත්ත්වචරිතයෙන් මෑ දතයුතු කිසෙයෑ යත්?

ඔවුන් එක් ජන්මයෙක්හි තාපසයක් වෑ රුක්මූලෙක්හි හිඳ රජුගෙ[5] අවරොධජනයනට ක්ෂමා කළමනා පරිදි කියනුවන්

---

[1] දැනැ C [2] සිදුරක් CEF [3] ඇරබෑ B [4] කරු B [5] රජුන්ගෙ AB

දැක නුවණ නැති කසීරජහු විසින් "තාගෙ ක්ෂමා බලමි" යි කටුමතිගායෙන් සියල් සිරුරේ දෙදහසක් පහර ඔවා[1] මස් ලොඹුවක් වැනි සිරුරු දැක ද චතෙකිනුදු නොනැවත අත්පා සිදුවා හිඟුල්හැලි සෙ හෙන ලෙහෙ දැකැ වසිනුද් නොනැවත කන්නැහැ කප්පවා පා විවමෙන් හෘදයෙහි ඇන ලෙහෙ කටින්[2] නංවාපියා[3] ගිය කල්හි සෙනාපතිහි අවුදු "රජහට දහවුත් මිස ලොවට නොදහනෙ මැනැවැ" යි කීයෙන් -

318. "යො මෙ හත්ථෙ ච පාදෙ ච කණ්ණනාසඤ්ච ඡෙදයි
විරං ජීවතු සො රාජා න හි කුජ්ඣන්ති මාදිසා"[4] යි

රජහට ආවැඩිනි[5] කළ පරිදි ඛන්තිවාදජාතකයෙන් දන්නෙ යැ.

මෙසෙ ඔවුන්[6] වියත් කල්හි ක්ෂමා කරනු විසමය නොවෙයි[7]. ඔවුන් සුවදම්පල් නම් රජකුමරක් වැ පිටින් මිස නොහොත හෙන ළදවියෙහි පියරජහු විසින් කිළිල්කඩ සෙයින් දෙඅත් දෙපා සිදුවාපියා චතෙකිනුදු නොසතුටු වැ "මොහු හිස් සිඳ හෘදයෙහි කඩුසිළින් හැන අඟසට නඟාගෙන හිස් මත්තෙහි සිසාරා මස් ලියා වගුරුවා පියව" යි යෙදූ කල්හි "දැන් කලි දම්පල් කුමර, මෙ තා සිත් නිගන්නට කලැ, තා හිස් සිදුවන්නට යෙදූ පියා කෙරෙහි ද හිස් සිදුනා මිනිසුන් කෙරෙහි ද කඩාපි අත් පා හිඟැ වවගෙන වලප්නා මව කෙරෙහි ද තා කෙරෙහි ද මෙ සතර තැන සමයිත් වා" යි තර කොට ඉටා කැත්[8] කළ පරිදි චූළධම්මපාල ජාතකයෙන් දන්නෙයැ.

ඔවුන් මෙසෙ සංහේපිළිසඳ මිනිස්පියට පැමිණ ක්ෂමා කරනු විසමය නොවෙයි, අහේපිළිසිඳ තිරිසන්යොන්හි සදැත් ඇත් වැ වසපු හියෙන් නාගිය විද හදවත් කඩාපි වැද්දු

---

[1] ඔහොවා CEF [2] කටක් E [3] නහවාපියා E [4] මාරියා B
[5] ආවඩනී CDEF [6] ඔවුන් විසින් D [7] විශෙෂ නොවෙයි B [8] කැත් ABF

කෙරෙහි දෙස්නම් නො කොට සිනිදු මියුරු තෙපුලෙන් "සබඳ, මට කුමට වධ කෙළෙහි" යි පිළිවිස බලා සියඅතින් සරස් වරෙන දළ ඛඩා දුන් පරිදි ඡද්දන්ත ජාතකයෙන් දත්තෙයැ.

තවද මෙසිදු විසමය නො වෙයි, ඔවුන් සක්පල් නාරජ කල්හි දඩ වැද මස් නො ලදින් යන වැදිකෙනකුන් විසින් වල්හි ගෙන ඇද දික්කොට ගොවා තියුණු බිහිසුණු සැතින් කොටා හුලින් අටහැනෙක්හි විද සහකටු වේවැලින් අවුණා නැහැයෙහිද් විද රැහැන ලා නහා බැඳ යොළොස්දෙනකු අටතඩියෙකින් බිම සිප සිපා ගෙන යන කල්හි දෙයොදුන් සුවහස් සතරනුහුවක් බොල් පස්පොළොව ද් පවා දැහැවැබැලූ බැල්මෙකින් මැ දවා හළු කරන්නට පොහොසත් සැඩ දරුණු විසගොර නාරද වැ ද ක්ෂමා කළ පරිදි සඩ්ඛපාල ජාතකයෙන් දත්තෙ යැ.

තවද මෙසිද් විසමය නො වෙයි, ඔවුන් වදුරු යොන්හි උපද මහාකපි නම් වදුරක් වැ තමා නරාවළින් හැඳුම්නිසක්හු පහණක් ඔසවා ගෙන තමන් මුදුනෙහි ඇන පළාපී කල්හි කදුව පිරුණු ඇසින් ඔහු බලා "සබඳ, නො ද මට මෙසෙ විහි" යි මනා මෙලෙක් තෙපුලෙන් බැණ මුහුණ හුණු සම එක් අතෙකින් හමිනා ගෙන[1] උහුට මඟ පෑ මහවත ඇර සිටුවා ගිය පරිදි මහාකපි ජාතකයෙන් දත්තෙ යැ.

එයින් කිහ:-

319. "සුජනෝ න යාති වෛරං පරහිතබුද්ධිර්
විනාඝකාලෙ'පි
ජෙදෙ'පි චන්දනතරුඃසුරභයති මුඛං
කුඨාරස්‍ය"යි.

---

[1] එකතින් නහා ගෙන

ක්ෂමා කරනුයෙ බොහොදෙනහට ප්‍රියමනාප වැ වැටෙයි, වෛර බහුල නො වෙයි, අවද්‍ය[1] බහුල නො වෙයි, අසම්මූඪ වැ කාලක්‍රියා කෙරෙයි, ශරීරභෙදයෙන් උත්තරයෙහි ස්වර්ගලොකයෙහි උපද්දි.

එයින් වදාළහ:-

320. "පඤ්චිමෙ භික්ඛවෙ ආනිසංසා ඛන්තියා, කතමෙ පඤ්ච ? බහුනො ජනස්ස පියො හොති මනාපො, න වෙරබහුලො හොති, න වජ්ජබහුලො හොති, අසම්මූළ්හො කාලං කරොති, කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජති" යි.

මෙ ක්ෂමායෙහි ගුණ යැ.

<u>වෙෂයෙහි දෙෂ නම් කවර ? යත්</u>

දෙවෂයෙන් දහනකලැ ව්‍යවහාරයෙන් දැහැවියමනා බැවින් මුඛ්‍යරූපයෙන් සිට ශරීරාවදාරණ කළ දණ්ඩකාණ්ඩාදියට නො දැහැ වැ තත්ප්‍රෙරක පුරුෂයහට දහවුත් හෙ ද දෙවෂයෙන් කෙරෙයි. එබැවින් දෙවෂයෙහි මැ දෙවෂ කරනු මැනැවැ; උහු කෙරෙහි දෙවෂ නො කළ මැනැ.

දෙවෂ කරන කලැ එ නැසුව මැනැවැ, නො වැඩුව මැනැවැ. එ නසනකලැ ක්ෂාන්ති මෛත්‍රී ද කළ මැනැවැ, හෙ එකලැ නසී.

එයින් කීහ:-

321. "මුඛ්‍යං දණ්ඩාදිකං හිත්වා ප්‍රෙරකෙ යදි කුප්‍යති
දෙවෂෙණ ප්‍රෙරිතස්සො'පි වෙෂෙ වෙෂස්තු
මෙ වරම්" යි.

---

[1] වද්‍ය[illegible]

ආකාශය සෙ අනන්තාපරිමාණ දුපීනයන් හැමදෙනා මරත් නො පිළිවත් බැවින් ක්‍රොධචිත්තයා මරනුමැනැවැ. එකලැ හැම සතුරෝ මාරිත වෙත්.

එයින් කීහ:-

322. "කියඤ්හා[1] මාරයිෂ්‍යාමි දුපීනාන් ගගනොපමාන්
මාරිතෙ ක්‍රොධචිත්තෙ තු මාරිතාඃසර්‍වශත්‍රවඃ" යි.

යම්සෙ කෙළුමුතුණු ඇ අඟුවීන් ම්‍රක්ෂිතස්ථාන ච ම අඟුවීන් දෙනෙ[2] පිරිසුදු කරන්නට නිඝීන්ධ කරන්නට අසමර්‍ථ වෙයි. එතැන් භූයොභාවයෙන් අඟුඬ වෙයි, දුඝීන්ධ ද වෙයි. එසෙයින් මැ හැවුවාහු භවනුයෙ හැසුවාහු ශයනුයෙ වෙරීන්වෙර සංහිදුවන්නට අසමර්‍ථ වෙයි. භූයොභාවයෙන් වෙර මැ කෙරෙ. මෙසෙ වෙරීන් වෙර කිසිකලෙක්හිදු සන්හිදුනෙ නො වෙයි, සිට සිට වඩී. යම්සෙ කෙළුමුතුණු ඇ අඟුවීහු විප්‍රසන්නොදකයෙන් දෙවුනා ලද්දාහු නස්ති, එතැන් ගුඬ ද වෙයි, නිඝීන්ධ ද වෙයි. එසෙයින් මැ අවෙරයෙන් ක්‍ෂාන්ති මෛත්‍රි නමැති උදකයෙන් වෙරයෝ සන්හිදුති, නස්ති, අභාවයට යෙත්. මෙසෙ අවෙරයෙන් වෙර සන්හිදුවනු හැම බුදුපසෙබුදුමහරහතන් හිය මහි.

එයින් වදාළහ:-

323. "නහි වෙරෙන වෙරානි සම්මන්තීධ කුදාචනං
අවෙරෙන ච සම්මන්ති එස ධම්මොා සනන්තනොා" යි.

යම්සෙ කෑඬ මවනයෙන්[3] නැහී ගිනි එම කෑඬයෙහි ඇවිළ ගෙන දවා ද, එ සෙයින් මැ යමක්හට සංරම්භයෙන් මැ ක්‍රොධ උපන්නෙ වී නම් ඔහු මැ ගෙ යන්නා දවයි.

---

[1] කියඤ්හා BG. [2] දෙවුනොා A [3] මවනායෙන් A

එයින් වදාළහ:-

324. "කට්ඨස්මිං මත්ථමානස්මිං පාවකෝ නාම ජායති
තමෙව කට්ඨං ඩහති යස්මා යෝ ජායතෙ ඝිනි.

එවං මන්දස්ස පොසස්ස බාලස්ස අවිජානතෝ
සංරම්භා ජායති කොධෝ යොපි තෙනෙව
ඩය්හති" යි.

කාණයෙන් හා කාෂ්ඨයෙන් හා වඩනා ඝිනි යෙයින් යමක්
හුගෙ ක්‍රෝධ වඩී ද, ඔහුගෙ යශස් කාණ පක්ෂයෙහි සඳහු
යෙයින් පිරිහෙයි.

එයින් වදාළහ:-

325. "අඝිව තිණකට්ඨස්මිං කොධෝ යස්ස පවඩ්ඪති
නිහීයති තස්ස යශෝ කාළපක්ඛෙව චන්දිමා" යි.

ඉන්ධනරහිත ඝිනියක් යෙයින් යමක්හුගෙ ක්‍රෝධ සන්හිඳී ද,
ඔහුගෙ යශස් ශුක්ලපක්ෂයෙහි සඳහු යෙයින් වඩී.

එයින් වදාළහ:-

326. "අනෙධෝ ධූමකෙතුව කොධෝ යස්සූපසම්මති
ආපූරති තස්ස යශෝ සුක්කපක්ඛෙව චන්දිමා" යි.

ඝනවර්ෂායෙන් රජස් සන්හිඳුනා නියායෙන් ක්ෂාන්ති
මෛත්‍රීන් දොෂ සන්හිඳු වූ පරිදි දක්වන්නට වදාළහ තමන්
සුළුබෝතවුස් කල්හි -

327. "උප්පජ්ජෙ මෙ න මුච්චෙය්‍ය න මෙ මුච්චෙය්‍ය
ජීවතෝ
රජංව විපුලා වුට්ඨී ඛිප්පමෙව නිවාරයෙ" යි.

ගූථකූපයක් බඳු ක්‍රොධනපුද්ගලයා හා බුදුහු සංවාස නො කරන්නට වදාළහ:-

328. "සෙය්‍යථාපි භික්ඛවෙ ගූථකූපො කට්ඨෙන වා කඨලාය වා ඝට්ටිතො භිය්‍යොසොමත්තාය දුග්ගන්ධො හොති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො කොධනො හොති උපායාස බහුලො, අප්පම්පි වුත්තො සමානො අභිසජ්ජති කුප්පති ව්‍යාපජ්ජති පතිත්ථියති කොපඤ්ච දොසඤ්ච අප්පච්චයඤ්ච පාතු කරොති. එවරූපො භික්ඛවෙ පුග්ගලො අජ්ඣුපෙක්ඛිතබ්බො, න සෙවිතබ්බො න භජිතබ්බො න පයිරූපාසිතබ්බො" යි.

දෙමිටුඇති කියදෙකින්[1] සොරහු යමක්හුගෙ අඟපසඟ කඩද්ද, හෙ එවැනි කලුද් දෙවෂ නොකෙළෙ වී නම් මෙ සස්නෙහි පිළිවෙත් කළා වෙ.

එයින් වදාළහ:-

329. "උභතො දණ්ඩකෙන වෙපි භික්ඛවෙ කකවෙන වොරා ඔචරකා අඞ්ගමඩ්ගානි ඔක්කන්තෙය්‍යුං, තත්‍රාපි යො මනො පදූසෙය්‍ය න මෙ සො තෙන සාසනකරො" යි.

යමෙක් ක්‍රොධොපනාහ බහුල වී ද, හෙ නරකයෙහි නිඃක්ෂිප්ත මැයි.

එයින් වදාළහ:-

330. "ද්වීහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො යථාභතං නික්ඛිත්තො එවං නිරයෙ. කතමෙහි ද්වීහි? කොධෙන ච උප නාහෙන ච" යි.

මෙ දෙවෂයෙහි දොෂයි.

---

[1] කියදෙකින් BCDEF

<u>මෛත්‍රී මහානෘශංස</u> පරිදි කිසෙයැ යත්?

බුදුහු බෝමඩ හිඳ මෛත්‍රීන් මැ මාරවිජය කළහ. ධනපාලකාදි ප්‍රචණ්ඩසත්වයන් මෛත්‍රීන් මැ දමනය කළහ. මඝමාණවාදී ත්‍රයස්ත්‍රිංශත් සත්පුරුෂයො මගධරාජයා වුහුටි ප්‍රචණ්ඩ හස්තිහි මෛත්‍රීන් මැ පාදවනත කළහ. සාමාවතී[1] ප්‍රමුඛ පන්සියයක් ස්ත්‍රීහි උදයනයා සහස්‍රස්ථාමයෙන් වුහුටි ශරය මෛත්‍රීන් මැ පරාඩ්මුඛ කොළො.

බුදුහු සසර වසන කලැ එක් ජන්මයෙක්හි තමන්ගෙ රාජ්‍යය අසිඳ ගෙන තමන් දෙරතුරෙ එල්වාපී රජකු ප්‍රිය පුතකු සෙ දුටුහු.

එයින් වදාළහ:-

331. "අමව්‍ව්‍ලමණ්ඩලං රජ්ජං අන්තෙපුරං[2] මම
අච්ඡින්දිත්වාන ගහිතං පියං පුත්තංව
පස්සයිං[3]" යි.

මෛත්‍රීභාවනා කරනුවන් වසන පියෙස්හි වග්දෙන්හු අඩසා[4] මුවපොල්ලන් දැක තමන් දරුවන් සෙයින් පෙම් කොට කිරි පොවති, ආතපයෙන් ඛින්නදෙහ ඇති නාගයො මයූරයන්ගෙ පිල්සෙවලට වැද[5] සැතප්ති[6], මූෂිකාවො ආශී විෂයන්ගෙ දරණගැබැ ඇවිද කෙළිත්.

එයින් කීහ:-

332. "ව්‍යාඝ්‍රී දෘෂ්ටවා හරිණ්‍යාස්ස්වසුතම්ව
කාශම්පායයත්‍යාශු ශාවං
බර්හිව්‍ජායං භුජඞ්ගඃ ප්‍රවිශනි ශිඛිනාමාතපෙඃ
ඛින්නදෙහඃ

---

[1] සාමවතිG [2] අන්තෝපුරංB [3] පස්සිහංD [4] අඩ at. in. E
[5] පිල්සෙවණල වැදE [5] පිල්සෙවණටG [6] සතපතිBC

ක්‍රීඩන්ත්‍යාශීවිෂාණාං විෂදහනවතාං මූෂිකා
හොගගහේ
කුර්වන්නෙවං හි මෛත්‍ර්‍යා වසති ගිරිවනෙ යස්තු
තස්මෙ නමොස්තු" යි.

යමක්හුගෙ චීවරයක් හො පිණ්ඩපාතයක් හො ශයනාසන යක් හො ගිලානප්‍රත්‍යයභෛෂජ්‍යපරිෂ්කාරයක් හො පරිභොග කරන භික්ෂුවෙක් මෛත්‍රීභාවනා කෙරෙ ද, ඔහුගෙ පුණ්‍යස්කන්ධ මහාසමුද්‍රයෙහි උදකස්කන්ධ සෙයින් අසඞ්ඛෙය්‍ය වෙයි. අප්‍ර මෙය වෙ.

එයින් වදාළහ:-

333. "සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දෙ[1] න සුකරං උදකස්ස පමාණං ගහෙතුං එත්තකානි උදකාළ්හකානීති වා එත්තකානි උදකාළ්හකසතානීති වා එත්තකානි උදකාළ්හකසහස්සානීතිවා එත්තකානි උදකාළ්හකසතසහස්සානීති වා, අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාඋදකක්ඛන්ධොත්ත්වෙව සඞ්ඛං ගච්ඡති. එවමෙව ඛො භික්ඛවෙ ඉමෙහි චතූහි පුඤ්ඤාභිසන්දෙහි කුසලාභිසන්දෙහි සමන්නාගතස්ස අරියසාවකස්ස න සුකරං පුඤ්ඤස්ස පමාණං ගහෙතුං එත්තකො පුඤ්ඤාභිසන්දො කුසලාභිසන්දො සුඛස්සාහාරො සොවග්ගිකො සුඛවිපාකො සග්ගසංවත්තනිකො ඉට්ඨාය කන්තාය මනාපාය හිතාය සුඛාය සංවත්තනීති, අථ ඛො අසඞ්ඛෙය්‍යො අප්පමෙය්‍යො මහාපුඤ්ඤක්ඛන්ධොත්ත්වෙව සඞ්ඛං ගච්ඡති" යනාදි.

මෙසෙයින් දායකයහට ඵල විපුලවන කලැ[2] භාවකයහට කියයුතු කිම? එයින් මැ සුභූතිමහතෙරහු දායකයහට ඵල විපුල වනු සඳහා කෙණෙසිඅහර සිඟන්නාහු දොර දොර සිට අහර ගෙන එනතුරු මෛත්‍රීධ්‍යානසමාපත්ති සමවැද එයින් නැඟී දෙය

---

[1] මහාසමුද්දස්ස ACD [2] විපුල ඵල වනු B

ධර්ම පිළිගනිත්, දෙර දෙර සිට නිරෝධසමාපත්ති සමවදනා ධර්ම සෙනෙවි සැරියුත් මහතෙරුන් සෙයින්.

එයින් කිහ සඟිඅටුවායෙහි:-

334. "ධම්මසෙනාපති කිර වන්ථුං සොධෙති. සුභූතිත්ථෙරෝ දක්ඛිණං සොධෙති. තථා හි:- ධම්මසෙනාපති පිණ්ඩාය චරන්තො ගෙහද්වාරඞ්ගණෙ[1] ඨිතො යාව භික්ඛං ආහරන්ති තාව පුබ්බ භාගෙන පරිච්ඡින්දිත්වා නිරෝධං සමාපජ්ජති, නිරෝධා වුට්ඨාය දෙය්‍යධම්මං පතිගණ්හාති. සුභූතිත්ථෙරෝ තථෙව මෙත්තජ්ඣානං සමාපජ්ජිත්වා මෙත්තජ්ඣානා වුට්ඨාය දෙය්‍යධම්මං පතිගණ්හාති" යි.

යම් භික්ෂුවෙක් මෛත්‍රීභාවනායෙහි අර්ජිණොපචාර විනා මැ සර්වසත්වයනට හිතස්ථරණචිත්තය අසුරුසනෙක්හිද් ආසෙවනය කෙරෙ ද, හෙ අපරිත්‍යක්තධ්‍යාන වැ වෙසෙයි, බුදුන්ගෙ සසුන් කම් කළා වෙයි, හෙ ඔව්හට දුන් දානය මහත්ඵල මහානෘශංස වන බැවින් ක්ෂිණාශ්‍රවයා සෙයින් ස්වාමි වැ ශෛක්ෂයා සෙයින් දායාදභාග් වැ අනෘණ වැ අවොර වැ පිණ්ඩපාත පරිභොග කෙරෙ.

එයින් වදාළහ:-

335. "අච්ඡරාසඞ්ඝාතමත්තම්පි වෙ භික්ඛවෙ භික්ඛු මෙත්තං චිත්තං ආසෙවති, අයං වුච්චති භික්ඛවෙ භික්ඛු අරිත්තජ්ඣානො[2] විහරති සත්ථුසාසනකරො ඔවාදපතිකරො අමොඝං රට්ඨපිණ්ඩං භුඤ්ජති; කො පන වාදෙ යෙ නං බහුලීකරොන්ති" යි.

මෛත්‍රීභාවනා කරනුයෙ සුවයෙන් නිදයි, සුවයෙන් පුබුද්දි, දුස්ස්වප්න නො දක්කි, මනුෂ්‍යයනට ද් අමනුෂ්‍යයනට ද්

---

[1] ගෙහඞ්ගණෙB [2] අපරිත්තජ්ඣානොABCD

ප්‍රිය වෙයි, දෙවතාවෝ ඔහු රක්ති, අග්නිවිෂශස්ත්‍රයෙන් උපද්‍රව නොවෙයි, වහා චිත්තසමාධාන ඇති වෙයි, මුහුණ පහන්පැහැ වෙයි, නො මුළා වැ කාලක්‍රියා කෙරෙයි, අධිගම නො කෙළෙ වී නමි බ්‍රහ්මලොකයෙහි උපද්දි.

එසින් වදළහ:-

336. "මෙත්තාය භික්ඛවෙ චෙතොවිමුත්තියා - පෙ - උත්තරිං අප්පටිවිජ්ඣන්තෝ බ්‍රහ්මලොකූපගෝ හොති" යි.

මුදුහු සසර වසනකලැ එක් ජන්මයෙක්හි සත්හවුරුද්දක් හැවූ මෛත්‍රීභාවනායෙහි බලයෙන් බ්‍රහ්මලොකයෙහි උපද සත් සංවර්තකල්පයෙක්හිදු සත්විවර්තකල්පයෙක්හිදු මනුෂ්‍යලොකයට නො ආවහ. සංවර්තන කල්පයෙහි ආභාස්වර තලයෙහි උපදත්[1]; විවර්තන කල්පයෙහි ශූන්‍යබ්‍රහ්මවිමානයෙහි ප්‍රාදුර්භූත වෙති. එහි බ්‍රහ්ම භවති, එන්නා හෙ මහාබ්‍රහ්ම වෙති; තමන්ගෙ යශශ්‍රීන් අනුන් අභිභවා දිළියෙති, අනුන් විසින් නුමුහු අනභිභවනීය වෙති. සතිස්වරෙක්හි ශක්‍රදෙවරාජ වැ දෙවිරජ කළහ; අනෙකශතජන්මයෙහි චක්‍රවර්ති වැ සතරමහද්වීහි චක්‍රරජ කළහ; දඹදිව අග්‍රරජ වූ කල් පමණ නැත්.

එයින් වදළහ:-

337. "අභිජානාමි ඛෝ පනාහං භික්ඛවෙ දීඝරත්තං කන්තානං පුඤ්ඤානං දීඝරත්තං ඉට්ඨං කන්තං පියං මනාපං විපාකං පච්චනුභූතං සත්තවස්සානි මෙත්තං චිත්තං භාවෙත්වා සත්තසංවට්ට විවට්ටකප්පෙ නයිමං ලොකං පුනරාගමාසිං, සංවට්ටමානඤ්චුදං භික්ඛවෙ කප්පෙ ආභස්සරූපගෝ හොමි, විවට්ටමානෙ කප්පෙ සුඤ්ඤං බ්‍රහ්මවිමානං උපපජ්ජාමි, තත්‍රසුදං භික්ඛවෙ බ්‍රහ්මා හොමි මහාබ්‍රහ්මා අභිභූ අනභිභූතෝ අඤ්ඤදත්ථු දසෝ වසවත්ති. ජත්තිං

---

[1] උපදිති EF

සක්කත්තුං ඛෝ පනාහං භික්ඛවෙ සක්ඛිං අභාසිං දෙවානමින්දං, අනෙකසතක්ඛත්තුං රාජා අහොසිං චක්කවත්ති ධම්මිකො ධම්මරාජා චාතුරන්තො විජිතාවී ජනපදත්ථාවරියප්පත්තො සත්තරතන සමන්නාගතො. තස්ස මය්හං ඉමානි සත්ත රතනානි අහෙසුං සෙය්‍යථිදං චක්කරතනං හත්ථිරතනං අස්සරතනං මණිරතනං ඉත්ථිරතනං ගහපතිරතනං පරිණායකරතනමෙව සත්තමං. පරොසහස්සා ඛො පනස්ස පුත්තා අහෙසුං සූරා වීරඞ්ගරූපා පරසෙනප්පමද්දනා. සොහං භික්ඛවෙ ඉමං පඨවිං සාගරන්තං අදණ්ඩෙන අසත්ථෙන ධම්මෙන අභිවිජිය අජ්ඣාවසිං. තස්ස මය්හං භික්ඛවෙ චතුරාසීති නගරසහස්සානි අහෙසුං සත්තභූමිකානි පාසාදවරානි. චතුරාසීති කූටාගාරසහස්සානි. චතුරාසීති පල්ලඞ්කසහස්සානි. චතුරාසීති නාගසහස්සානි. චතුරාසීති රථසහස්සානි. චතුරාසීති මණිධජසහස්සානි. චතුරාසීති සයනසහස්සානි. චතුරාසීති වත්ථකොටිසහස්සානි. චතුරාසීති භාජනසහස්සානි. චතුරාසීති භත්තසහස්සානි. චතුරාසීති භත්තකාරසහස්සානි. චතුරාසීති ඛීරපාසසහස්සානි. චතුරාසීති ගාවුතසහස්සානි. චතුරාසීති ධෙනුසහස්සානි. චතුරාසීති දුස්සකොටිසහස්සානි. චතුරාසීති සුවණ්ණකොටිසහස්සානි. චතුරාසීති සුවණ්ණපාතිසහස්සානි. චතුරාසීති සුවණ්ණඵාලසහස්සානි. චතුරාසීති සුවණ්ණකූටසහස්සානි. චතුරාසීති සුවණ්ණවාලිකාසහස්සානි. චතුරාසීති සුවණ්ණඝටසහස්සානි. චතුරාසීති සුවණ්ණඝටසහස්සානි. චතුරාසීති සුවණ්ණඝට

අබ්භූස්සක්කමානො සබ්බං ආකාසගතං තමගතං අභිවිහච්ච[1] භාසතෙ ච තපතෙ ච විරොචති ච. එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං, මෙත්තායෙව තානි චෙතොවිමුත්ති අතිග්ගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචතිච"යි.

යම්සෙ අලුයම්හි නැඟී දවහත්තරුව උද්දීප්ත වැ දිලියෙද, එ සෙයින් මැ යම්තාක් භවභොගදායක පින්කම්හු මෛත්‍රීභාවනා ලක්ෂණ පුණ්‍යකර්මයාගෙ සොළොස්වන කලාව නො වටිති, මෛත්‍රී මැ එ පුණ්‍යකර්මයන් අභිභවා දිලියෙයි.

වදාළෙ මැ නො:-

340. "සෙය්‍යථාපි භික්ඛවෙ රත්තියා පච්චූසසමයං ඔසධිතාරකා භාසතෙ ච තපතෙ ච විරොචති ච, එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි ඔපධිකානි පුඤ්ඤකිරියවත්ථූනි සබ්බානි තානි මෙත්තාය චෙතොවිමුත්තියා කලං නාග්ඝන්ති සොළසිං. මෙත්තායෙව තානි චෙතොවිමුත්ති අතිග්ගහෙත්වා භාසතෙ ච තපතෙ ච විරොචති ච"යි.

එබැවින් හැමසත්හු සුවපත් වෙත්වයි නිරන්තරයෙන් සිතිය යුතු.

මෙ මෛත්‍රියැ අනුසසි.

මෙසෙ කලහයෙහි ආදීනව දැක ක්ෂමායෙහි ගුණ දැක ද්වෙෂයෙහි දොස් දැක මෛත්‍රී මහානාශංස සෙ දැක තපස් කරන ජනයන්ගෙ වනයට තමන්වහන්සෙ වුටුහු "තපොවනං පවිට්ඨොස්මි"යි.

---

[1] අභි ab. in ABD

(24). <u>ජරාජීරණබ්‍යාධිමතපබ්බජිතෙ දිස්වා</u> යන[1] මෙයින් ඔවුන් ජරාරූපසඤ්ඤීනයෙන් යොවනමද පරිත්‍යාග හා ව්‍යාධි රූප සඤ්ඤීනයෙන් ආරොග්‍යමද පරිත්‍යාග හා මාතරූපසඤ්ඤීනයෙන් ජීවිතමද පරිත්‍යාග කළ සෙ කීහු.

මෙ ලොකයෙහි අශ්‍රුතවත් පෘථග්ජනයො වනාහි යොවන මද මත් වැ තමන්ගෙ යොවනය ජරායෙන් මිරිකෙන පරිදි නො දන්නවුන් සෙ පමා වැ අකුසල් කොට නරකයට යෙති, ඇතමි කෙනෙක් ආරොග්‍යමදමත් වැ තමන්ගෙ ආරොග්‍යය ව්‍යාධීන් අභිභූත වන පරිදි නො දන්නවුන් සෙ පමා වැ කුසල් නොකොට නරකයට යෙති, ඇතමි කෙනෙක් ජීවිතමදමත් වැ තමන්ගෙ ජීවිතය මරණින් මැකෙන[2] පරිදි නො දන්නවුන් සෙ පමා වැ පින්කම් නො කොට නරකයට යෙති – යස්මෙහි ද් යොවනමදමත් භික්‍ෂූහු තමන් ජරායෙන් මිරිකෙන පරිදි ව්‍යාධීන් අභිභූත වන පරිදි මරණින් මැකෙන පරිදි නොදන්නවුන් සෙ ශික්‍ෂාප්‍රත්‍යාඛ්‍යාන කොට ගිහිගෙට යෙත්.

වදාළෙ මැ නොඃ-

341. "තයොමෙ භික්ඛවෙ මදා. කතමෙ තයොඃ? යොබ්බනමදො, ආරොග්‍යමදො, ජීවිතමදො. යොබ්බනමද මත්තො වා භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො කායෙන දුච්චරිතං චරති, වාචාය දුච්චරිතං චරති, මනසා දුච්චරිතං චරති. සො කායෙන දුච්චරිතං චරිත්වා වාචාය දුච්චරිතං චරිත්වා මනසා දුච්චරිතං චරිත්වා කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. ආරොග්‍යමදමත්තො වා භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො – පෙ – ජීවිතමදමත්තො වා භික්ඛවෙ අස්සුතවා පුථුජ්ජනො – පෙ – කායස්ස භෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපජ්ජති. යොබ්බනමදමත්තො වා

---

[1]සන තන්හිD [2]අකුසල් කොටE [3]මිරිකෙනB

හිඤ්ඤවෙ හිඤ්ඤ සිඤ්ඤං පච්චඤ්ඤාය හිනා යාවත්තති. ආරෝග්‍ය මදමත්තො වා හිඤ්ඤවෙ හිඤ්ඤ - පෙ - ජීවිතමදමත්තො වා හිඤ්ඤවෙ හිඤ්ඤ සිඤ්ඤං පච්චඤ්ඤාය හිනායාවත්තති" යි.

---

25. රම්මනගරවාසීහි යනු තුනුරුවන් සරණගිය රම්‍යපුරවාසී උපාසකයන් විසිනැයි යූ සෙයි.

මෙතැන්හි සිට තුනුරුවන්හි ද් සරණගමනයෙහි ද් උපාසක ලක්ෂණයෙහි ද් විභාග දනයුතු.

මෙහි තුනුරුවන් නම් කවර යත්? බුද්ධරත්නයැ, ධර්ම රත්නයැ සඞ්ඝරත්නයයි.

හෙ කවර අර්ථයෙන් "රත්න" නම් වීය යත්?

චක්‍රවර්ත්තිහට පාදුර්භූත වූ චක්‍රය විත්‍රිකාත වන බැවිනු ද් මහාර්ඝ වන බැවිනු ද් අතුල්‍ය වන බැවිනු ද් දුර්ලභදර්ශන වන බැවිනු ද් අලාමකසත්වයන් විසින් පරිභොග කටයුතු වන බැවිනු දු "රත්න" නම් වූවා සෙයින් මෙයි දු විත්‍රිකාතාදිගුණ යොගයෙන් "රත්න" නම් වෙ.

කිසෙයැ යත්?

යම්සෙ චක්‍රවර්ත්තිහට චක්‍රරත්නය ප්‍රාදුර්භූත වූ තැන් පටන් ගෙන ජනයො ගන්ධ පුෂ්පාදිය ගෙන යක්ෂස්ථාන භූතස්ථාන නො ගොස් චක්‍රරත්නය මැ පුදත් ද, එසෙයින් මැ ලොකයෙහි බුදුන් උපන්තැන් පටන්ගෙන මහෙශාක්‍යදිව්‍යමනුෂ්‍යයො අන්නට පූජා සත්කාර නො කොට බුදුනට ම කෙරෙති. මෙසෙ බුදුහු විත්‍රිකාත වන බැවින් "රත්න" නම් වෙත් - මෙහි අවිත්‍ර වූ[1] ලොකයා

---

[1] අවිත්‍ර වූ BCE

චිත්‍ර[1] කරනුයෙ "චිත්‍රිකාර" නම් වෙ. යම්සෙ චක්‍රරත්නය මෙතෙක් කොටි මෙතෙක් ප්‍රකොටි අග්ගි යනාදිවිසින් අගය නො කට හැකි මහාඝී වන බැවින් "රත්න" නම් වෙ ද, එසෙයින් මැ බුදුහු යමක්හුගෙන් පස්මිටකුදු පිළිගත්හු[2] නම් ඔහට මහතවල මහානුභාවසදෘයක වන බැවින් මහාඝී වන බැවින් "රත්න" නම් වෙත් - යම්සෙ චක්‍රරත්නය තුලනා කටහැකි අනෙකක්හු ලෙවිහි නැති වන බැවින් "රත්න" නම් වෙ ද, එසෙයින් මැ බුදුහු ශීල සමාධිප්‍රඥාදි ගුණයෙන් තමන් හා තුලනා කටහැකි අනෙක් කෙනකුන් ලෙවිහි නැති වන බැවින් "රත්න" නම් වෙත් - යම්සෙ චක්‍ර රත්නය ඇතැම් කලෙක්හි මැ ලොකයෙහි ප්‍රාදුර්භූත වන බැවින් දුර්ලභදර්ශන වන බැවින් "රත්න" නම් වෙ ද, එ සෙයින් මැ බුදුහු කල්පකොටි ගතසහස්‍රයෙකිනු ඳ් දුර්ලභදර්ශන වන බැවින් "රත්න" නම් වෙත් - යම්සෙ චක්‍රරත්නය චක්‍රවර්ත්තිව්‍රත පිරූ උත්තමසත්ත්වයන්හු විසින් මැ පරිභොග කළමනා බැවින් "රත්න" නම් වෙ ද, එ සෙයින් මැ බුදුහු අග්‍රශ්‍රාවකාදි මහා ශ්‍රාවකයන් විසිනුද් මහා බ්‍රහ්මාදි බ්‍රහ්මයන් විසිනුද් සෙවියයුතු වන බැවින් "රත්න" නම් වෙත්.

මෙසෙ මැ ධර්මරත්නද් සඞ්ඝරත්න ද් චිත්‍රිකාතාදිගුණ යොගයෙන් "රත්න" නම් වෙ.

එසින් වදළහ:-

342. "චිත්තීකතං මහග්ඝඤ්ච අතුලං දුල්ලභදස්සනං
අනොමසත්තපරිභොගං රතනං තෙන පවුච්චති" යි.

මෙසෙයින් බුද්ධාදීහු රත්න නම් වෙත්.

---

[1] චිත්‍රී BL [2] පිළිගත්තාහු ACD

සරණගමන නම් කවර යත්? බුද්ධාදීන් තෙරෙහි ශ්‍රේෂ්ඨ වශයෙන් ආත්මනියය්‍යාතනාදි කිරීමැ.

එතද්විභාගජිඥාසුන් විසින් සරණයැ, සරණගමනයැ, සරණගතයැ, සරණගමනප්‍රභෙදයැ, සරණගමනඵලයැ, සංක්ලෙශයැ, භෙදයැ යන විධි දතයුතු වෙ.

මෙහි සරණ නම් කවර යත්?

සරණගතයනට එම සරණගමනයෙන් භයසන්ත්‍රාසදුර්ධ දුර්ගතිපරික්ලෙශයන් හිංසනය හනනය විනාශය කරන්නෙන් රත්නත්‍රය "සරණ" නම් වෙ - "සෘ = හිංසායාම්" යන ධාතුයි.

තත්ප්‍රසාදකර්තෘත්වාදය "සරණගමන" නම් වෙ - තත්සමඞ්ගි සත්ව "සරණගත" නම් වෙ.

සරණගමන[1] ප්‍රභෙද නම් කවර යත්? භෙ ද්විවිධ වෙ, ලොකොත්තරයැ ලොකිකය යි. එහි ලොකොත්තරසරණගමනය දෘෂ්ට සත්‍යයනට මාර්ගක්ෂණයෙහි සරණගමනොපක්ලෙශ සමුච්ඡෙදක වන බැවින් ආලම්බන විසින් නිර්වාණාලම්බන වැ කෘත්‍ය විසින් රත්නත්‍රයෙහි අවෙත්‍යප්‍රසාදවශයෙන් සිද්ධ වෙයි - ලොකික සරණගමනය පුහුදුනනට සරණගමනොපක්ලෙශවිෂ්කම්භනයෙන් ආලම්බන විසින් බුද්ධාදිගුණාලම්බන වැ සිද්ධ වෙ - භෙ වස්තු විසින් රත්නත්‍රයෙහි ශ්‍රද්ධාප්‍රතිලාභයැ, ශ්‍රද්ධාමූලකසම්‍යග්දෘෂ්ටියැ, දශපුණ්‍යක්‍රියාවස්තූන් තෙරෙහි දෘෂ්ටි සාධු කිරීමයි.

මෙයෙයින් සිද්ධවන සරණගමනය සතරප්‍රකාරයෙකින් ප්‍රවෘත්තවෙ, ආත්මනියය්‍යාතනයෙන් තත්පරායණතායෙන් ශිෂ්‍ය භාවොපගමනයෙන් ප්‍රණිපාතයෙනැයි.

---

[1] සරණාගමන AB

මෙහි ආත්මනිර්යාතන නම් අද පටන් කොට මම ආත්මය බුදුනට නිර්යාතන කෙරෙමි, දහමට ද සඟනට ද නිර්යාතන කෙරෙමි. යි මෙසෙ බුදුආදීනට ආත්මපරිත්‍යාග කිරීමයි.

තත්පරායණතා නම්: අද පටන් කොට මම බුදුපරායණ යෙමි, ධර්මපරායණයෙමි, සඞ්ඝපරායණයෙමි, මා තත්පරායණ බව් දන්නෙය. යි මෙසෙ තත්පරවීමයි.

ශිෂ්‍යභාවෝපගමන නම්: අද පටන් කොට මම බුදුන්ගෙ ශිෂ්‍යයෙමි, ධර්මයාගෙ ශිෂ්‍යයෙමි, සඞ්ඝයාගෙ ශිෂ්‍යයෙමි, මා තත්ශිෂ්‍ය පරිදි දන්නෙය. යි මෙසෙ ශිෂ්‍යභාවය උපගමනය කිරීමයි.

ප්‍රණිපාත නම්: අද පටන් කොට මම අභිවාදන ප්‍රත්‍යුත්ථාන අඤ්ජලිකර්ම සාමීචිකර්ම බුදුආදී තුන්වසුනට මෑ කෙරෙමි. මා තත්පරපරිදි දන්නෙය. යි බුදුආදීන් කෙරෙහි පරමනිපච්චාකාරයි. මෙ සතර ප්‍රකාරයෙහි අන්‍යතර ප්‍රකාරයෙකින් මෑ සරණගමන සිදුවෙ.

අපි ච – "භගවතෝ අත්තානං පරිච්චජාමි, ධම්මස්ස, සඞ්ඝස්ස අත්තානං පරිච්චජාමි, ජීවිතඤ්ච පරිච්චජාමි, පරිච්චත්තා යෙව මෙ අත්තා, පරිච්චත්තංයෙව මෙ ජීවිතං, ජීවිතපරියන්තිකං බුද්ධං සරණං ගච්ඡාමි, බුද්ධා මෙ සරණං ලෙණං තාණන්ති" යි. මෙසෙ ආත්ම නිර්යාතන වෙදිතව්‍යයි.

343. "යඤ්චාරඤ්ච වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යං. සුගතඤ්ච වතාහං වතාහං පස්සෙය්‍යං භගවන්ත මෙව පස්සෙය්‍යං. සම්මාසම්බුද්ධඤ්ච වතාහං පස්සෙය්‍යං භගවන්තමෙව පස්සෙය්‍යං"

යන මහසුප් මහතෙරුන්ගෙ සරණගමනයෙහි සෙයින් ගිහ්‍යභාවොපගමනය ද්‍රෂ්ටව්‍යයි.

344. "සො අහං විචරිස්සාමි ගාමං පුරා පුරං
නමස්සමානො සම්බුද්ධං ධම්මස්ස ච සුධම්මතං"

යන ආලවකාදින්ගෙ සරණගමන[1] සෙයින් තත්පරායණතා වෙදිතව්‍යයි.

345. "අථ ඛො බ්‍රහ්මායු බ්‍රාහ්මණො උට්ඨායාසනා එකංසං උත්තරා සඞ්ඝං කරිත්වා භගවතො පාදෙසු සිරසා නිපතිත්වා භගවතො පාදානි මුඛෙන ච පරිචුම්බති, පාණීහි ච පරිසම්බාහති. නාමඤ්ච සාවෙති, බ්‍රහ්මායු අහං භො ගොතම බ්‍රාහ්මණො, බ්‍රහ්මායු අහං භො ගොතම බ්‍රාහ්මණො" යි. මෙසෙයින් ප්‍රණිපාත ද්‍රෂ්ටව්‍යයි.

ඒ ප්‍රණිපාතය ඥාති භය ආචාර්‍ය දක්ෂිණීය වශයෙන් චතුර්විධ වෙ. එහි දක්ෂිණීයප්‍රණිපාතයෙන් සරණගමන සිද්ධ වෙයි, සෙස්සන් කෙරෙහි ප්‍රණිපාතයෙන් නො වෙයි. ශ්‍රෙෂ්ඨ වශයෙන් මෑ සරණගමන වෙයි, ශ්‍රෙෂ්ඨවශයෙන් මෑ හිණ වෙ. එබැවින් මෑ යම් ශාක්‍යයෙක් හෝ කොලියවංශජයෙක් හෝ "බුදුහු අප නැයහ" යි වඳි ද; හෙ සරණගත නො වෙ. යමෙක් "ශ්‍රමණ ගොතම රාජපූජිතයෑ, මහානුභාවයෑ, නො වැඳිකලැ අනර්‍ථයකුදු කරන්නෙය" යි හසින් වඳි ද, හෙ ද සරණගත නොවෙ. යමෙක් බොසත්කලැ බුදුන් කෙරෙන් උගත්දෑයක් සිහිකරනුයෙ බුදු වූ කලැහෝ:-

346. "එකෙන භොගෙ භුඤ්ජය්‍ය අථ්හි තම්මං
පයොජයෙ
චතුත්ථඤ්ච නිධාපෙය්‍ය ආපදාසු භවිස්සති"

---

[1] සරණාගමනAB

යන මෙබඳු අනුශාසනයක් උගෙන "මෙ මාගෙ ආචාර්‍යයි" යි වඳී ද, හෙ ද සරණගත නො වෙ. යමෙක් වනාහි "මෙ ලොකයෙහි අග්‍රදක්ෂිණීය" යයි වඳී ද, ඔහු විසින් මැ ගෘහීත වෙයි සරණ.

මෙසෙයින් ගෘහීත වූ සරණ ඇති උපාසකයක්හට හෝ උපාසිකාවකට හෝ අන්‍යතීර්‍ථිකයන් කෙරෙහි පැවිදි වූ නැයක්හු "මුහු අප නැයහ" යි වඳනාහට සරණ නො ලිඳෙයි, නො පැවිදිවූ නැයන් වඳනාහට මැ කවරදෙෂයැ? "රජු රටවැස්සන් විසින් පූජ්‍යයැ, නො වැන්ද අනර්‍ථයකු දු කරන්නෙය" යි භයින් වඳනා හට සරණ නො බිඳෙයි. කිසියම් ශිල්පයක් උගැන් වූ තීර්‍ථිකයක්හු "මෙ මාගෙ ආචාර්‍යයි" යි වඳනාහට සරණ නො බිඳෙයි. මෙ චතුර්‍විධ ප්‍රණිපාතයැ.

මෙසෙයින් සරණගමන ප්‍රභෙද වෙදිතව්‍යයි.

සරණගමන ඵල නම් කවර යත්?

හෙ ද්‍විවිධ වෙ:- ලොකොත්තරයැ, ලෞකිකයයි. එහි ලොකොත්තරසරණගමනඵල ද ද්‍විවිධ වෙයි:- විපාකඵලයැ අනාශංසඵලයයි. එහි විපාකඵල යතර ශ්‍රාමණ්‍යඵලයැ, අනාශංස ඵල සර්‍ව දුඃඛක්ෂයයි.

එයින් වදළහ:-

347. "යොව බුද්ධඤ්ච ධම්මඤ්ච සඞ්ඝඤ්ච සරණං ගතො
චත්තාරි අරියසච්චානි සම්මප්පඤ්ඤාය පස්සති

දුක්ඛං දුක්ඛසමුප්පාදං දුක්ඛස්ස ච අතික්කමං
අරියං චට්ඨඞ්ගිකං මග්ගං දුක්ඛූපසමගාමිනං

එතං ඛො සරණං ඛෙමං එතං සරණමුත්තමං
එතං සරණමාගම්ම සබ්බදුක්ඛා පමුච්චති"යි.

අපි ච නිත්‍යාදි[1] විසින් අනුපගමනවශයෙනු ද් අනෘශංස ඵල වෙදිතව්‍යයි.

එයින් වදාළහ:-

348. "අට්ඨානමෙතං භික්ඛවෙ අනවකාසෝ යං දිට්ඨිසම්පන්නෝ පුග්ගලෝ කඤ්චි සංඛාරා නිච්චතෝ උපගච්ඡෙය්‍ය, සුඛතෝ උපගච්ඡෙය්‍ය, කඤ්චි ධම්මං අත්තතෝ උපගච්ඡෙය්‍ය, මාතරං ජීවිතාවොරොපෙය්‍ය, පිතරං - පෙ අරහන්තං ජීවිතා වොරොපෙය්‍ය, දුට්ඨචිත්තෝ තථාගතස්ස ලොහිතං උප්පාදෙය්‍ය, සඞ්ඝං භින්දෙය්‍ය, අඤ්ඤං සත්ථාරං උද්දිසෙය්‍ය, නෙතං ඨානං විජ්ජති" යි.

මෙ අනෘශංසඵලයෑ - මෙසෙයින් ලොකොත්තරසරණ ගමනයෙහි විපාකඵල ද අනෘශංසඵල ද වෙදිතව්‍යයි.

ලෞකික සරණගමනයෙන් භවසම්පත් භොගසම්පත් හස්නගත මෑ වේ.

එයින් කීහ:-

349. "යෙ කෙචි බුද්ධං සරණං ගතාසෙ - න තෙ
ගමිස්සන්ති අපායං
පහාය මානුසං දෙහං - දෙවකායං
පරිපූරෙස්සන්ති" යි.

අනෙකෙකූදු උක්ත මෑයි:-

350. "අථ ඛො සක්කො දෙවානමින්දො අසීතියා දෙවතාසහස්සෙහි සද්ධිං යෙනායස්මා මහාමොග්ගල්ලානෙ තෙනුපසඞ්කමි - පෙ - එකමන්තං ඨිතං ඛො සක්කං දෙවානමින්දං ආයස්මා මහාමොග්ගල්ලානෙ එතදවොච:- යාඩු ඛො

---

[1] නිත්‍යාදින් B

දෙවානමින්ද බුද්ධසරණගමනං හොති, බුද්ධං සරණගමනහේතු ඛෝ පන දෙවානමින්ද එවම්ධෙකච්චෝ සත්ත්ථා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලෝකං උපපජ්ජන්ති. තෙ අඤ්ඤෙ දෙවෙ දසහි ඨානෙහි අධිගණ්හන්ති[1]:- දිබ්බෙන ආයුනා දිබ්බෙන වණ්ණෙන - පෙ - සුඛෙන යසෙන, ආධිපතෙය්‍යෙන, දිබ්බෙහි රූපෙහි - පෙ - සද්දෙහි, ගන්ධෙහි, රසෙහි, ඵොට්ඨබ්බෙහි"යි.

ධම්මසරණගමනයෙහි දු සඞ්ඝසරණගමනයෙහි දු ඒ මෙනයයි.

අපි ච - "සනත්කුමාර" නම් මහබඹ තවිතිසා දෙව් නුවරට බැස සුධම්මදෙවිසභායෙහි සක්දෙවිරජහුගෙ අස්නෙහි දෙව් පිරිස් පිරිවරා හිඳ සරණගමන ඵල දක්වන්නට කීය:-

351. "යෙ කෙචි හොන්තා බුද්ධං සරණං ගතා, ධම්මං සරණං ගතා, සඞ්ඝං සරණං ගතා, සීලෙසු පරිපූරකාරිනො, තෙ කායස්ස භෙදා පරම්මරණා අප්පෙකච්චෙ පරනිම්මිතසවත්තීනං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති. අප්පෙකච්චෙ නිම්මානරතීනං දෙවානං - පෙ - තුසිතානං දෙවානං, යාමානං දෙවානං, තාවතිංසානං දෙවානං, චාතුම්මහාරාජිකානං දෙවානං සහව්‍යතං උපපජ්ජන්ති. යෙ සබ්බනිහීනකායං උපපජ්ජන්ති, තෙ ගන්ධබ්බකායං පරිපූරෙන්ති"යි.

වෙළාමසූත්‍රවශයෙනු දු සරණගමනයාගෙ ඵලවිශෙෂ දැකවෙයි.

352. අපි ච - "හෙට්ඨිමකොටියා තිසරණගතො උපාසකො සොතාපත්තිඵලසච්ඡිකිරියාය පටිපන්නො හොති" යූ

---

[1] අභිභවන්තිB

බැවින් අධිමුක්ති තුළ පරිද්දෙන් ත්‍රිවිධබොධියෙන් එක්තරා බොධියකට[1] කාරණයි.

මෙසෙයින් සරණගමන වල වෙදිතව්‍යයි.

එහි සංක්ලේශ කවර යත්?

ලෞකිකසරණගමනය රත්නත්‍රයෙහි අඥානයෙන්, සංශයෙන්, මිථ්‍යාඥානයෙන්, සංක්ලිෂ්ටවෙයි. එබැවින් හෙ මහාද්‍යුතික නො ද වෙයි, මහාවිස්වාර නො ද වෙයි. ලෝකොත්තර සරණගමනයට සංක්ලේශ මැ නැත්.

මෙසෙයින් සංක්ලේශ වෙදිතව්‍යයි.

එහි භෙද කවර යත්?

ලෝකොත්තර සරණගමනයෙහි භෙද නැති, එහෙයින් ජන්මාන්තරයෙහි දූ ආර්‍යශ්‍රාවක අනෙක් ශාස්තෘවරුන් උදෙසා නො වෙසෙ. ලෞකිකසරණගමනයෙහි වනාහි භෙද ඇති; හෙ ද්විවිධ වෙ:- සාවද්‍යයැ, අනවද්‍යයයි. එහි සාවද්‍ය නම් අන්‍යශාස්තෘන් කෙරෙහි ආත්මනිර්‍යාතනාදීන් වන භෙදයැ, හෙ අනිෂ්ටවලයි. අනවද්‍ය නම් අන්‍යශාස්තෘන් කෙරෙහි ආත්ම නිර්‍යාතනාදි නො කළවුන්ගෙ නො බුන්සරණට මරණින් වන භෙදයැ, හෙ අනවද්‍යයි. මෙසෙ මරණින් සරණ බුන ද උත්තරොත්තර ජන්මයෙහි සුචරිතයට කාරණ වන බැවින් එසත්හු විශෙෂභාග් වෙත්. මෙ නියායෙන් රත්නත්‍රයට ආත්මනිර්‍යාතනාදි කොට සරණගතයන් මෙ රත්නත්‍රයෙන් පිටත් අනෙක් බුදුකෙනකුන් ඇති[2] ගෙන මෙ දැහැමෙන් පිටත් අනෙක් දැහැමෙක් ඇති[2] ගෙන මෙ සඟුන් කෙරෙන් පිටත් අනෙක් සඟකෙනකුන් ඇති[2] ගෙන ප්‍රණාම කළ සරණ බිඳෙ.

---

[1] එක්බොධියකට B [2] ඇතැයි B

මෙසෙයින් "සරණයැ, සරණගමණයැ, සරණගතයැ, සරණගමනප්‍රභෙදයැ, සරණගමනඵලයැ, සංක්ලෙශයැ, භෙදයැ" යන මෙ විධි වෙදිතව්‍යයි.

උපාසකලක්ෂණ නම් කවර යත්?

උපාසක කවර? හෙ කවර හෙතුවින් උපාසකයැ? උහුගෙ[1] සිල් කවර? ආජීව කවර? විපත් කවර? සම්පත් කවර? යන මෙ විධි වෙදිතව්‍යයි.

එහි උපාසක නම් කවර යත්?

යම් කවර ත්‍රිශරණගත ගෘහස්ථයෙක් "උපාසක" නම් වෙ.

එසින් වදළහ:-

353. "යතො ඛො මහානාම[2] බුද්ධං සරණං ගතො හොති, ධම්මං සරණං ගතො හොති, සඞ්ඝං සරණං ගතො හොති; එත්තාවතා ඛො මහානාම උපාසකො හොති" සි.

හෙ කවර හෙතුවින් උපාසක නම් වියැ යත්? රත්නත්‍රයොපාසනයෙන් උපාසක නම් වෙ.

එසින් වදළහ:-

354. "බුද්ධං උපාසතීති උපාසකො, ධම්මං, සඞ්ඝං උපාසතීති උපාසකො" සි.

ඔහුගෙ සිල් කවර යත්? ප්‍රාණාතිපාතාදීන් විරතිය යි.

වදළෙ මැ නො:-

355. "යතො ඛො මහානාම උපාසකො පාණාතිපාතා පටිවිරතො හොති, අදින්නාදානා - පෙ - කාමෙසු මිච්ඡාචාරා, මුසාවාදා, සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතො හොති" සි.

---

[1] ඔහුගෙ G [2] මහානාම උපාසකො BC

## ආජීව කවර යත්?

පඤ්චමිථ්‍යාවණික්කම් පරිත්‍යාග කොට ධැමින් සෙමෙන්[1] ජීවිකාකල්පනයයි.

වදාළේ මැ නොවැ:-

356. "පඤ්චිමා භික්ඛවෙ වණිජ්ජා උපාසකෙන අකරණීයා. කතමා පඤ්ච? සත්ථවණිජ්ජා සත්තවණිජ්ජා මංසවණිජ්ජා මජ්ජ වණිජ්ජා විසවණිජ්ජා. ඉමා ඛො භික්ඛවෙ පඤ්ච වණිජ්ජා උපාසකෙන අකරණීයා" යි.

## විපත් කවර යත්?

ඒ මැ ශීලයාගෙ ද ආජීවයාගෙ ද විකොපනය ඔවිහට විපත් නම් වෙ. අපි ව - යමෙකින් මෙ වඤ්ඣල වෙ ද, මල වෙ ද, නිකෘෂ්ටතර වෙ ද; හෙ ද ඔවිහට විපත් නම්. හෙ අවී විසින් ශ්‍රද්ධාචිරහාදි පඤ්චධර්මයි.

වදාළේ මැනොවැ:-

357. "පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකචණ්ඩාලො ච හොති, උපාසකමලඤ්ච, උපාසක පතිරූපඤ්ච. කතමෙහි පඤ්චහි? අස්සද්ධා හොති, දුස්සීලො හොති, කොතූහල මඞ්ගලිකො හොති, මඞ්ගලං පච්චෙති නො කම්මං, ඉතො බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති[2] තත්ථ ච පුබ්බකාරං කරොති" යි.

## සම්පත් කවර යත්?

ඒ මැ ශීලසම්පතුදු ආජීවසම්පතුදු ඔහට සම්පත් නම්. ඔහට රත්නත්‍රයාදිකර පඤ්ච ධර්මද සම්පත් නම්.

---

[1] දැහැමින් සෙමින් A

[2] පරියෙසති BCD

එයින් වදාළහ:-

358. පඤ්ච හි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො උපාසකො උපාසකරතනඤ්ච හොති, උපාසකපදුමඤ්ච, උපාසක පුණ්ඩරීකඤ්ච. කතමෙහි පඤ්ච හි? සද්ධා හොති, සීලවා හොති, න කොතූහල මඞ්ගලිජකා හොති, කම්මං පටිච්ච නො මඞ්ගලං, න ඉතො බහිද්ධා දක්ඛිණෙය්‍යං ගවෙසති, ඉධ ච පුබ්බකාරං කරොති" සි.

මෙ උපාසකලක්ෂණයි.

---

(26). චක්කවත්ති නරපති යන තන්හි "චක්ර" ශබ්දය "දිබ්බං චක්කරතනං පාතුරහොසි" යන තන්හි සෙයින් රත්න චක්‍රයෙහි වැටෙයි. මෙයින් බැහැර "චත්තාරීමානි භික්ඛවෙ චක්කානි යෙහි සමන්නාගතානං දෙවමනුස්සානං" යන තන්හි සම්පත් චක්‍රයෙහි වැටෙයි. "පාදතලෙසු චක්කානි ජාතානි" යන තන්හි ලක්ෂණ චක්‍රයෙහි වැටෙයි. "චක්කංව වහතො පදං" යන තන්හි රථාඞ්ගයෙහි වැටෙයි. "චතුවක්කං නවද්වාරං පූණං ලොභෙන සංයුතං" යන තන්හි ඊර්ෂ්‍යා පටවක්‍රයෙහි වැටෙයි. "දද භුඤ්ජ ව මා ච පමාදෙ චක්කං වත්තය සබ්බපාණිනං" යන තන්හි දානයෙහි වැටෙයි. "ඉච්ඡාහතස්ස පොසස්ස චක්කං භමති මත්ථකෙ" යන තන්හි උරසිචක්‍රයෙහි වැටෙයි. බුරපරියන්තෙන වෙපි චක්කෙන" යන තන්හි ප්‍රහරණ චක්‍රයෙහි වැටෙයි. "අසනි විය චක්කං" යන තන්හි අශනිමණ්ඩලයෙහි වැටෙයි. "අථ ඛො සො භික්ඛවෙ රථකාරො යන්තං චක්කං ජහි මාසෙහි නිට්ඨිතං තං පවත්තෙසි" යන තන්හි දරුචක්‍රයෙහි වැටෙයි. "මාතා

හුත්වා මෙට්ඨිනී සංසාරවක්කෙ පරිවත්තයමානා" යන තන්හි සංසාරවක්‍රයෙහි වැටෙයි. පවත්තිතෙ ව භගවතා ධම්ම චක්ක" යන තන්හි ධර්මචක්‍රයෙහි වැටෙයි.

---

(27). දෙවමනුස්සෙහි පූජියමානං යන තන්හි දෙවිමිනිසුන් විසින් පුෂ්පපූජාදීන් පූදනලදු වන සූසෙයි.

පුෂ්පපූජායෙහි ඵල කවර යත්? හෙ වනාහි උත්තර මහතෙරුන්ගෙ අපදානයෙන් දැතයුතු වේ.

කියෙයෑ යත්?

අතීතයෙහි තිස්දහසක් කපින් මත්තෙහි ලොකයෙහි සුමෙධ නම් සම්‍යක්සම්බුද්ධයෙනෙක් ප්‍රාදුර්භූත වූවාහු එක් දවසක් එකලා වැ හිමවිපියේසට වළඹ එත්නැනෙක්හි පලග බැඳ සමාපත්ති සමවැද වැඩහුන්හු.

එසින් කිහ:-

359. "සුමෙධෝ නාම සම්බුද්ධෝ බත්තිංස[1]වර
ලක්ඛණෝ
විවෙකකා මෝ භගවා හිමවන්තමුපාගමී.

අජ්ඣෝගහෙත්වා හිමවන්තං අග්ගෝ
කාරුණිකෝ මුනි
පල්ලඞ්කං ආභුජිත්වාන නිසීදි පුරිසුත්තමෝ" යි.

එකල්හි විද්‍යාධරපුරුෂයෙක් ත්‍රිශූලායුධයක් ගෙන ආකාශයෙන් යන්නෙ බුදුන් ගල් මුදුනෙහි දිලියෙන ගිනිකඳක්

---

[1] මත්තිංසADEF

සෙයින්, නුබමුදුනෙහි වොරජනා පුන්සඳක් සෙයින් සුපිපි මහ සල්රුකක් සෙයින් වනමැද දිලියෙනුවන් දැක වනඅගින් නික්මැ දිවන බුදුරැස් දිව.

එයින් කීහ උත්තරමහතෙරහු :-

360. විජ්ජාධරො තදා ආසිං අන්තලික්ඛ චරො අහං
තිසූලං සුකතං ගය්හ ගච්ඡාමි අම්බරෙ තදා.

පබ්බතග්ගෙ යථා අග්ගි පුණ්ණමාසෙව චන්දිමා
වනං ඔභාසතෙ බුද්ධො සාලරාජාව ඵුල්ලිතො.

වනග්ගා නික්ඛමිත්වාන බුද්ධරංසා විධාවරෙ
නළග්ගිවණ්ණ සඞ්කාසා දිස්වා චිත්තං පසාදයිං" යි

මෙසෙ බුදුන් දැක චිත්තප්‍රසාද කොට තුන්කිණිහිරිමලක් බිඳ ගෙන එයින් බුදුන් පිදීයැ. හෙ බුදුන්ගෙ ආනුභාවයෙන් තුවටු උඩු බලා මල්ගැබි බිම් බලා බුදුන් මුදුනට ඡායා කොට අහස්හි සිටියෙයි.

එයින් කීහ එ මැ මහතෙරහු:-

361. "විචිනං අද්දසං පුප්ඵං කණිකාරං දෙවගන්ධිකං
තිණි පුප්ඵානි ආදාය බුද්ධසෙට්ඨං අපූජයිං.

බුද්ධස්ස ආනුභාවෙන තිණි පුප්ඵානි මෙ තදා
උද්ධවණ්ටා අධොපත්තා ඡායං කුබ්බන්ති
සත්ථුනො" යි.

එ පින්කමින් මිනිස්පියෙන් සැව තව්තිසාදෙවිනුවර උසා යෙහි සැටයොදුන් අයම්විතර[1] තිස්යොදුන් නන්විසිතුරු දද පෙළින් සැදුම්ලද සියක්දහස් කූටාගාර ඇති තන්හි තන්හි රුවන් පලඟ හා මහරු මහයහන් ඇති "කිණිහිරිවිමන්" නම් රුවන් විමනෙක්හි උපන.

---

[1]අයම්විතරහිCD [1]අයම්විතරින්E

එයින් කීහ තමන් අනුභූත වස්තු දක්වන
උත්තරමහතෙරහු :-

362. "තෙන කම්මෙන සුකතෙන චෙතනාපණිධීහි ච
ජහිත්වා මානුසං දෙහං තාවතිංසං අගඤ්ඡහං.

තත්ථ මෙ සුකතං ව්‍යම්හං කණිකාරිති ඤායති
සට්ඨියොජනමුබ්බෙධං තිංසයොජනවිත්ථතං.

සහස්සකණ්ඩං සතභෙණ්ඩුං ධජාලු හරිතාමයං
සතසහස්සං නියුහා ව්‍යම්හෙ පාතුරහංසු මෙ.

සොවණ්ණමයා මණිමයා ලොහිතඩ්කමයාපි ච
ඵලිකාපි ච පල්ලඩ්කා යෙනිච්ඡක යදිච්ඡකා.

මහාරහඤ්ච සයනං තූලිකාවිකතියුතං
උද්දලොමිකථකන්තං ඛිම්බොහනසමායුතං" යි.

හෙ දෙවිපිරිස් පිරිවරා විමනින් නික්ම යම්තෙනකට යෙ නම් යට කිණිහිරිමල් අතුරු වෙයි, උඩ කිණිහිරිමල් වියන් වෙයි, හාත්පස්හි සියක්යොදුන් තන්හි කිණිහිරිමලින් සැදී ගැවසී සිටී.

එයින් කීහ:-

363. "භවනා නික්ඛමිත්වාන චරන්තො දෙවචාරිකං
යදා ගච්ඡාමි ගමනං දෙවසඩ්ඝපුරක්ඛතො.

පුප්ඵස්ස හෙට්ඨා තිට්ඨාමි උපරිච්ඡදනං මම
සමන්තා යොජනසතං කණිකාරෙහි ඡාදිතං" යි.

ඔහට දිව්‍ය නාටකයෝ[1] සැටදහසක් තූර්‍යයෙන් උපස්ථාන කෙරෙති; හෙ ඒ දිව්‍ය වූ නෘත්‍යගීතවාදිතයෙන්[2] පිනපිනා දිව්‍ය කන්‍යාවන් විසින් පරිවෘත වූ දිව්‍යභෝජන වළඳා දිව්‍ය විමානයෙහි විසී.

එයින් කීහ:-

364. "සට්ඨිංතූරියසහස්සානි සායංපාතං[3] උපට්ඨහුං
පරිවාරෙන්ති[4]මං නිච්චං රක්ඛන්ති චමතන්දිතා.

තත්ථ නච්චෙහි ගීතෙහි තාළෙහි වාදිතෙහි ච
රමාමි ඛිඩ්ඩරතියා[5] මොදාමි කාමකාමහං.

තත්ථ භුත්වා ච පිත්වා ච මොදාමි දිවසෙ තදා
නාරිගණෙහි සහිතෝ[6] මොදාමි ව්‍යමහමුත්තමෙ" යි.

ඒ මෑ පින්කමින් පන්සියක්වර දෙවිරජ වූ ශක්‍රසම්පත් වැළඳිය. තුන්සියක්වර සක්විති වූ සක්වළ එක්රජ කෙළෙ. අසඞ්ඛ්‍යයක් වර දඹදිව අගරජ වීය. භවාභවයෙහි මහත්භොග ලැබීය. භොගයෙහි උනුවනු නැත්.

එයින් කීහ:-

365. "සතානං පඤ්චකඛත්තුං[7] දෙවරජ්ජමකාරයිං
සතානං තිණීකඛත්තුං චක්කවත්ති අහොසහං

පදෙසරජ්ජං විපුලං ගණනාතෝ අසංඛියං
භවාභවෙ සංසරන්තෝ මහාභොගං ලභාමහං
භොගෙ මෙ ඤානතා නත්ථි බුද්ධපූජායිදං ඵලං" යි.

දෙවිලොව දිවසපු වළඳා මිනිස්ලොවට එයි. මිනිස් ලොව රජ සපු වළඳා දෙවිලොවට යෙයි. මෙ දෙගතින්

---

[1] දිව්‍යාඩ්ගනා නාටකාවෝB [2] නෘත්‍යගීතවාදිත්‍රයෙන්G
[3] සායපාතංEF [4] පරිවාරෙසුන්තිAF [5] ඛිඩ්ඩාරතියාCL
[6] පරිවුතෝABEF [7] කඛත්තුඤ්චC

අනෙක් ගතියකට නොගියෙයැ. මිනිස්පියෙහි උපදනෙ රජ කුලෙහි හෝ බමුණු කුලෙහි උපද්දි, මෙ දෙකුලයෙන් අනෙක් නීචකුලයෙක්හි නො උපන්නෙයි.

366. "දුවෙ භවෙ සංසරාමි දෙවත්තෙ අථ මානුසෙ
අඤ්ඤං ගතිං න ජානාමි බුද්ධපූජායිදං ඵලං.

දුවෙ[1] කුලෙ පජායාමි ඛත්තියෙ වාපි බ්‍රාහ්මණෙ
නීවෙ කුලෙ න ජායාමි[2] බුද්ධපූජායිදං ඵලං"යි.

එ මෑ පින්කමින් උපන් උපන් තන්හි අනඝී යානවාහන ලැබෙයි, විධෙය දැසිදසුන් ලැබෙයි, අලඞ්කෘත නාරීගණයන් ලැබෙයි, අනඝී ආභරණ ප්‍රාවරණ ලැබෙයි, අග්‍රවසූ අග්‍රඵල අග්‍රභොජන ලැබෙයි. "මෙ භොජනය වළඳන්නෙයැ, මෙ පානය බොන්නෙයැ, මෙ යහන්හි හොනෙය"යි අයදනා ලැබෙයි, හැම තන්හි පූජ්‍යවෙයි, හිවියස ඇතිවෙයි, මහත් පඤ්ඤ ඇතිවෙයි, අහෙතුක පිරිස් ඇති වෙයි. නැයනට උත්තම වෙයි, හුණු නො ද වෙයි, සිහිල් නො ද වෙයි, පරිදුහ නො ද වෙයි, සිතට දුක් නො ද වෙයි, උපන් උපන් තන්හි රන්වන් වෙයි, නො යහපත් වැ උපන් කල් නැත්.

එසින් කීහ:-

367. "හත්ථියානං අස්සයානං සිවිකං සන්දමානිකං
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

දාසිගණං දාසගණං නාරියො ච අලඞ්කතං
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං

කොසෙය්‍යකම්බලියානි ඛොමකප්පාසිකානි ච
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

---

[1] වෙමෙ [2] ජානාමි AEF

නවවත්ථං නවඵලං නවග්ගරසභොජනං
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

ඉමං ඛාද ඉමං භුඤ්ජ ඉමම්හි සයනෙ සය
ලභාමි සබ්බමෙවෙතං බුද්ධපූජායිදං ඵලං.

සබ්බත්ථ පූජිතො හොමි යසො අච්චුග්ගතො මම
මහා පක්ඛො සදා[1] හොමි අභෙජ්ජපරිසො සදා.
ඤාතීනං උත්තමො හොමි බුද්ධපූජායිදං ඵලං.

සීතං උණ්හං න ජානාමි පරිළාහො න විජ්ජති
අථො චෙතසිකං දුක්ඛං හදයෙ මෙ න විජ්ජති.

සුවණ්ණවණ්ණො හුත්වාන සංසරාමි භවාභවෙ
වෙවණ්ණිකං[2] න ජානාමි බුද්ධපූජායිදං ඵලං"සි.

මෙසෙ තිස්දහසක් කප් දුගතියැ රැහැ නො දැනැ දෙවි සපු මිනිස්සපු වළඳ මෙ බුදුරජයෙහි දෙවිලොවින් සැවැ සැවැත් නුවර මහාසාරකුලයෙහි උපද "උත්තර" නම් කුමාරයක්වැ බුදුසස්නෙහි පැවිදි වැ සත්හැවිරිදි[3] වියෙහි මැ සිවුපිළිසඹියාපත්[4] රහත් වැ බුදුන් උපසපුයෙන් තුරුණුවියෙහි මැ පූජ්‍ය වූහු.

එයින් කීහ:-

368."දෙවලොකා චවිත්වාන සුක්කමූලෙන චොදිතො
සාවත්ථියං පුරෙ ජාතො මහාසාලෙ සුඅඩ්ඪකෙ.
පඤ්ච කාමගුණෙ හිත්වා පබ්බජිං අනගාරියං
ජාතියා සත්තවස්සොහං අරහත්තං අපාපුණිං.

---

[1]තදා AEF [2]වෙවණ්ණියං B [3]වියෙහි මෙසෙ සිවි AEF
[4]පිළිසිඹියා ACD

උපයම්පදෑසී බුද්ධා ගුණමඤ්ඤාය චක්ඛුමා
තරුණොව පූජනීයොහං බුද්ධපූජාසිදං ඵලං.

දිබ්බචක්ඛුං විසුද්ධං මෙ සමාධිකුසලෝ අහං
අභිඤ්ඤාපාරමිප්පත්තෝ බුද්ධපූජායිදං ඵලං.

පටිසම්භිදා අනුප්පත්තෝ ඉද්ධිපාදෙසු කොවිදෝ
ධම්මෙසු පාරමිංපත්තෝ[1] බුද්ධපූජායිදං ඵලං.

තිංසකප්පසහස්සම්හි යං බුද්ධමභිපූජයිං
දුග්ගතිං නාභිජානාමි බුද්ධපූජායිදං ඵලං.
කිලෙසා ඣාපිතා මය්හං භතං බුද්ධස්ස
සාසනං" යි.

මෙ උත්තරමහතෙරුන්ගෙ අපදානයෑ.

ධණ්ඩසුමන මහතෙරහු වනාහි තමන් සසර වසනකලෑ එක මලක් පූදෑ අසීතිවස්සීකොටියක් සඟී සම්පත් වළඳෑ පුණ්‍යක්ෂය නො වනතුරු මෑ නිවන්පත් වූහු.

එයින් කීහ:-

369. "එකපුප්ඵං වජිත්වාන අසීතිං වස්සකෝටියෝ
සඟ්ඝස්සු පරිවාරෙත්වා සෙසකෙනමහි නිබ්බුතෝ"යි.

මෙසෙ තුන්මලක් එක්මලක්[2] පහන්සිකින් බුදුනට පිදූයෙහි ඵල අනන්ත වී යෑ. එබැවින් එවදස් රම්‍යපුරවැසියන් කළතාක් බුද්ධපූජායෙහි ඵල ද දැන් මෙවත්මනුයෙහි සැදැහෑ ඇතියවුන් තුන්රුවන්හි පැහැදී කරනතාක් පූජායෙහි ඵල දැනෙමි කියනුවහ?

---

[1] පාරම්පත්තෝ C1 [2] සලක් C1-F

(28). <u>පරමපීතිපසාදපූණ්ණහදයෝ</u> යන තන්හි සිට බුදුන්ගේ කෙරෙහි චිත්ත[1]ප්‍රසාදයෙන් සිදුවන විල දතයුතු.

කිමෙයැ යත්?

යම්කෙනක්නට සෙසු ආයතීඨමී නැත ද බුදුන් කෙරෙහි ශ්‍රද්ධාමාත්‍රයෙක් ප්‍රේමමාත්‍රයෙක් ඇත්නම් ඔහු එ ශ්‍රද්ධායෙන් හා ප්‍රේමයෙන් අතගෙන සඞ්ගීයෙහි ඇර සිටුවූවන් වැනි වෙත්.

එයින් කිහ:-

370. "යෙසං අඤ්ඤා අරියධම්මා නත්ථි, තථාගතෙ පන සද්ධා මත්තං පෙමමත්තමෙව හොති, තෙ තාය සද්ධාය තෙන පෙමෙන හත්ථෙ ගහෙත්වා සඞ්ගාඨපිතා විය හොන්ති" යි.

බුදුන් වෙදිය[2] පර්වතයෙහි ඉන්ද්‍රශාලගුහායෙහි වැඩ වසන කල්හි එක් බකමූහුණුයෙක් බුදුන් දැක පැහැද බුදුන් කුල ගෙට වඩනාකලැ ගමත්වල් දක්වා යෙයි, කුලගෙන් වඩනාකලැ වෙහෙරත්වල් දක්වා යෙයි. හෙ එක් දවසක් සවස සඟුන් පිරිවරා ලෙණදොර වැඩහුන් බුදුන් දැක ප්‍රසාද කොට පර්වතයෙන් බැස අවුදු වැන්ද, බුදුහු ඔහු දැක සිනා පහළකළහ බුදුන් සිනා පහළ කරන කල්හි ඔවුන්ගෙ සතරදළින් මහාමෙඝමුඛයෙන් නික්මෙන සියරැළි විදුලියකලබ සෙයින් මහත් තල්කඳපමණ සදරස්[3] බඳු සුදුරස්කළප්හු නික්ම තුන්යලක් හිස වටා පැදකුණු කොට ගොස් දළඅග්හි මැ අන්තර්හිත වෙත් - මෙසෙ බුදුන් සිනා පහළකළ කල්හි අනඳමහතෙරහු "බුදුහු නො කරුණෙහි සිනා පහළ නො කෙරෙති" යි හුනස්නෙන් නැඟී බුදුන් වැඳ මුදුනෙහි ඇඳිලි බැඳ සිට "වහන්සෙ, සිනා පහළ කරන්නට කරුණු කිමහො" යි

---

[1] චිත්ත ab. in B [2] වෙදියක G [2] වෙදිස D
[3] වන D [4] සදරස් කලබ

පුළුවුත්හු - එසඳ බුදුහු "අනඳ, මෙ බකමුහුණු මා කෙරෙහි දූ භික්ෂු සඞ්ඝයා කෙරෙහි දූ කළ චිත්තප්‍රසාදයෙන් කප්ලක්ෂයක් දුර්ගතියට නො ගොස් දිව්‍යමනුෂ්‍ය සම්පත් වළඳ කෙළවර "සොම්නස්" නම් පසෙබුදු වෙයි" වදාළො.

මෙසෙ බුදුරුවන් කෙරෙහි කළ චිත්තප්‍රසාදයෙහි ඵල සුමන මාලාකාරවස්තු මට්ටකුණ්ඩලිවස්තු ආදීනු දූ දතයුතු.

දහම්රුවන්හි කළ චිත්තප්‍රසාදයෙහි ඵල කවර යත්? ස්වර මාත්‍රයෙහි නිමිත්තග්‍රහණ කළ මණ්ඩුකයාගෙ වස්තුවිනු දූ අනෙක දෙවමනුෂ්‍යසහස්‍රයන්ගෙ වස්තුවිනු දූ දතයුතු.

සඟුරුවන්හි කළ චිත්තප්‍රසාදයෙහි ඵල කවර යත්? යම් පැවිජිකෙනකුන්ගෙ මිය පරලොව ගිය මවක් හොපියෙක් හො "අප නෑ තෙරකෙනෙක් සිල්වත්හ ගුණවත්හයි" චිත්තප්‍රසාද කොට ස්මරණ කෙරෙ ද, ඔහුගෙ ඒ චිත්තප්‍රසාදය ද ස්මරණ මාත්‍රය ද මහාඵල මහානාශංස වෙයි, අනෙකකල්ප සහස්‍රයෙහි දුර්ගතියට නො යාදී අන්තයෙහි අමාමහනිවන් පමුණුවා.

එයින් වදාළහ:-

371. "යෙ තෙ භික්ඛවෙ භික්ඛු සීලසම්පන්නා සමාධි - පෙ - පඤ්ඤා - විමුත්ති - විමුත්තිඤාණදස්සනසම්පන්නා, දස්සනම්පහං භික්ඛවෙ තෙසං භික්ඛුනං බහුකාරං වදාමි. සවනං - පෙ - අනුස්සතිං - අනුපබ්බජ්ජං - උපසඞ්කමනං - පයිරුපාසනම්පහං භික්ඛවෙ තෙසං භික්ඛුනං බහුකාරං වදාමි"යි.

කුලයට එළැඹි සිල්වතුන් දැක චිත්තප්‍රසාද කළාහු ස්වර්ගයෙහි උපදුති, හුනස්නෙන් නැඟී වැඳ අසුන් දුන්නාහු උතුම්

කුලයෙහි උපදුනි, මසුරු මල කැඩුවාහු මහෙශාක්‍ය වෙති, යථා බලයෙන් දන් දුන්නාහු මහාභොග වෙති, බණ ඇසුවාහු මහත් ප්‍රඥා ඇති වෙත්.

එයින් වදළහ:-

372. "යං භික්ඛවෙ සීලවන්තා පබ්බජිතා කුලානි උපසඞ්කමන්ති, තත්‍ර මනුස්සා පඤ්ඡි ඨානෙහි ඔහුං පූජෙං පසවන්ති" යනාදීන්.

අපි ව - පහන්සිතින් බුදුන් වඳනට යමිහ, බණ අසන්නට යමිහ, සඟුරුවන් වඳනට යමිහයි නැඟූ චිකපියවරත් සොළොසක් කොට බෙදූ එයින් එක්කලාවක් ගෙන සොළොසක් කොට බෙදූ එයිනු දු එක් කලාවක් ගෙන වැළි දු සොළොසක් කොට බෙදූ මෙ නියායෙන් සොළොස්වරෙක බෙදූකලැ අන්තකලාව අස්වලෙක එක් කෙහෙ අගක් ඔබන පමණ තැන් වෙයි, එතැනැ පැවති කුසල් සිතැ වල පූර්වොක්තක්‍රමයෙන් සොළොස්වරෙක බෙදූ කලැ සවිඤාණවිභූෂිත සියක්දහස් ඇත්හු දු සියක්දහස් අස්හු දු සියක් දහස් රථ දැ සියක්දහස් කන්‍යාවො ද එහි අන්ත කලාව නො අඟිත්.

කියෙ මැ නො:-

373. "සතං හත්ථී සතං අස්සා සතං අස්සතරී රථා
සතං කඤ්ඤා සහස්සානි ආමුත්තමණිකුණ්ඩලා
එකස්ස පදවීතිහාරස්ස කලං නාග්ඝන්ති සොළසිං" යි.

අග්‍ර වූ බුදුරුවන්හි චිත්තප්‍රසාද කලාහු අග්‍ර වූ ආයුෂ ඇති වැ අග්‍ර වූ වර්ණ ඇති වැ අග්‍ර වූ යශස් ඇති වැ අග්‍ර වූ සිරිති

ඇති වැ අග්‍ර වූ සුඛ ඇති වැ අග්‍ර වූ බල ඇති වැ, දෙව් වැ උපන දෙවියන් කෙරෙහි අග්‍ර වැ, මිනිස් වැ උපන මිනිසුන් කෙරෙහි අග්‍ර වැ අග්‍ර සම්පත් අනුභව කෙරෙත්.

එයින් වදාළහ:-

374. "යාවතා භික්ඛවෙ සත්තා අපදා වා චතුප්පදා වා බහුප්පදා වා රූපිනො වා අරූපිනො වා සඤ්ඤිනො වා අසඤ්ඤිනො වා නෙවසඤ්ඤිනා සඤ්ඤිනො වා තථාගතො තෙසං අග්ගමක්ඛා යති අරහං සම්මාසම්බුද්ධා යෙ ඛො භික්ඛවෙ බුද්ධෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා. අග්ගෙ ඛො පන පසන්නානං අග්ගෝ විපාකො හොති" යි.

අග්‍ර වූ ගුණයන්හි චිත්තප්‍රසාද කළාහු ඒ සෙයින් මැ අග්‍රපදප්‍රාප්ත වැ අග්‍රඵල අනුභව කෙරෙත්.

එයින් වදාළහ:-

375. "යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා අරියො අට්ඨඞ්ගිකො මග්ගො තෙසං අග්ගමක්ඛායති. යෙ ඛො[1] භික්ඛවෙ අරියෙ අට්ඨඞ්ගිකෙ මග්ගෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගෝ විපාකො හොති - යාවතා භික්ඛවෙ ධම්මා සඞ්ඛතා වා අසඞ්ඛතා වා විරාගො තෙසං ධම්මානං අග්ගමක්ඛා යති යදිදං මදනිම්මදනා පිපාසවිනයො ආලයසමුග්ඝාතො වට්ටුපච්ඡෙදො තණ්හක්ඛයො විරාගො නිරොධො නිබ්බානං. යෙ ඛො භික්ඛවෙ විරාගෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගෝ විපාකො හොති" යි.

---

[1] යෙ ඛො තෙ (A1)

අග්‍ර වූ සඟුරුවන්හි චිත්තප්‍රසාද කළාහූ ච් සෙයින් මැ අග්‍රපදප්‍රාප්ත වැ අග්‍රඵල අනුභව කෙරෙත්.

එයින් වදළහ:-

376. "යාවතා භික්ඛවෙ සඞ්ඝා වා ගණා වා තථාගත සාවකසඞ්ඝා තෙසං අග්ගමක්ඛායති යදිදං චත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිස පුග්ගලා එස භගවතො සාවකසඞ්ඝා ආහුනෙය්‍යා පාහුනෙය්‍යා දක්ඛිණෙය්‍යා අඤ්ජලිකරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. යෙ ඛො භික්ඛවෙ සඞ්ඝෙ පසන්නා අග්ගෙ තෙ පසන්නා, අග්ගෙ ඛො පන පසන්නානං අග්ගෝ විපාකො හොති" යි.

ඒ මැ අර්‍ථයන් ගාථායෙන් දක්වන්නට වදළහ:-

377. "අග්ගතෙ වෙ පසන්නානං අග්ගං ධම්මං විජානතං
අග්ගෙ බුද්ධෙ පසන්නානං දක්ඛිණෙය්‍යෙ අනුත්තරෙ.

අග්ගෙ ධම්මෙ පසන්නානං විරාගූපසමෙ සඛෙ
අග්ගෙ සඞ්ඝෙ පසන්නානං පුඤ්ඤක්ඛෙත්තෙ අනුත්තරෙ.

අග්ගඤ්ඤං දදතං දදතං අග්ගං පුඤ්ඤං පවඩ්ඪති
අග්ගං ආයුඤ්ච වණ්ණෝ ච යසො කිත්ති සුඛං බලං.

අග්ගස්ස දාතා මෙධාවී අග්ගධම්මෙ සමාහිතො
දෙවභූතො මනුස්සෝ වා අග්ගප්පත්තො
පමොදති" යි.

මෙ බුද්ධාදීන් කෙරෙහි ප්‍රසාදයෙන් සිදුවන ඵලයි.

---

(29). සම්පත්තාභිනීහාරෝ යන තන්හි ඔවුන් පරිපූර්ණ වූ අභිනීහාර ඇතිවනු බුදුආදිකල්‍යාණමිත්‍රයන්ගෙ සංසර්ගයෙන් වියැ. කල්‍යාණමිත්‍රසංසර්ගයෙන් මෙවැනි අවෙච්චිකා[1] බෝධි සත්ත්වභාවට සම්ප්‍රාප්ත වන්නට නිසි පුණ්‍යෝපචය සිදු වී.

එබැවින් මෙතැන්හි සිට සර්වාත්මමූලක වූ බාලජන සෙවයෙහි ආදීනව ද සර්වාත්මසම්පදාප්තිකාරණ වූ පණ්ඩිතජන සෙවයෙහි අනුසංසය ද එකදෙසයෙකින් දක්වනු ලැබේ.

කියයැ යත්?

ජනයා පාපමිත්‍රසංසර්ගයෙන් දූෂිත වෙති, කල්‍යාණමිත්‍ර සංසර්ගයෙන් සජ්ජන වෙත්.

එසින් වදාළහ:-

378. "යාදිසං කුරුතෙ මිත්තං යාදිසඤ්චූපසෙවති[2]
සොපි තාදිසකෝ හොති සහවාසෝ හි තාදිසෝ" යි.

යම්සෙ හලාහලවිෂලිප්ත ශරයෙක් ශරකලාපයෙහි ක්ෂිප්ත වූයෙ විෂයෙන් අලිප්ත ශරකලාපය විෂදිග්ධ කෙරෙ ද එසෙයින් මැ පාපමිත්‍රතෙමෙහෙ තමා ළඟ වූ පාපයෙන් අලිප්ත පුරුෂයා තමා හා එකාධ්‍යාශය කරනුයෙ පාපයෙන් උපලිප්ත කෙරෙයි; එබැවින් පාපමිත්‍රසංසර්ග නො කරනු මැනැ.

එසින් වදාළහ:-

379. "සෙවමානෝ සෙවමානං සම්ඵුට්ඨෝ සම්ඵුසං පරං
සරෝ දිද්ධෝ කලාපංව අලිත්තමුපලිම්පති
උපලෙපභයා ධීරෝ නෙව පාපසඛා සියා" යි.

---

[1] අවිවත්තිකා [2] යාදිසං උපසෙවතිCDEF ලිපතිABF

යමෙක් පූතිභාවයට ගිය දියමස් පිදුරෙන් වසා බඳනමි ඒ පිදුරෙනු දු පූතිගන්ධ වැහෙයි; එසෙයින් මැ බාල ජනයන්ගෙ සඞ්ගමයෙන් බාලභාවයට පැමිණෙත්.

එසින් වදළහ:-

380. "පූතිමච්ඡං කුසග්ගෙන යෝ නරෝ උපනයති
කුසාපි පූති වායන්ති එවං බාලූපසෙවනා" යි.

යමෙක් තුවරලෙහි[1] පලාශපත්‍රපුටයෙන් වසා බඳනමි ඒ පත්‍රයෙනු දු සුරභිගන්ධ වැහෙයි; එ සෙයින් මැ ප්‍රාඥයන්ගෙ සමාගමයෙන් ප්‍රාඥභාවයට පැමිණෙත්.

එසින් වදළහ:-

381. "තගරඤ්ච පලාසෙන යෝ නරෝ උපනයති
පත්තාපි සුරභි වායන්ති එවං ධීරූපසෙවනා" යි.

එබැවින් තගරගන්ධපරිමලපලාශපත්‍රපුටයක් සෙයින් පණ්ඩිත ජනසමාගමයෙන් තමහට වන පරිපාක දැන බාල ජනයන් පියා පණ්ඩිතජනයන් හා සමාගම කරනු මැනැවැ. එයට හෙතු කවරැ යත්? බාලජනයෝ දෙවදුක්ඛසමාගමයෙන් නිරුවන් අනෙක ජනසහස්‍රයන් සෙයින් තමන් හා නරකයට ගෙන යෙති; පණ්ඩිතජනයෝ යැරියුත් මහතෙරුන්ගෙ සමාගමයෙන් සඞ්ගීහාග්වූ අනෙකජනසහස්‍රයන් සෙයින් සඞ්ගීයට පමුණුවත්.

එසින් වදළහ:-

382. "තස්මා පලපුටසෙසව ඤත්වා සප්පඤ්ඤතං නෝ
අසන්තෙ නොපසෙවෙය්‍ය සන්තෙ සෙවෙය්‍ය පණ්ඩිතෙ
අසන්තා නිරයං නෙන්ති සන්තා පාපෙන්ති සුගතිං" යි.

---

[1] තුවරලාහාEF

ජනයෝ සත්සමාගමයෙන් සජ්ජන වෙති, අසත්සමාගමයෙන් අසජ්ජන වෙති, සිල්වතුන් හා සමාගමයෙන් සිල්වත් වෙති, දුශ්ශීලයන් හා සමාගමයෙන් දුශ්ශීල වෙත්.

එයින් වදාළහ:-

384. "යං යං හි රාජ භජති සත්තං වා යදි වා අසං
සීලවන්තං විසීලං වා වසං තස්සව ගච්ඡති"යි.

එක්කලෙක මහසත් "අඩිත්" නම් මහතවුසක් වැ සමුද්‍ර මධ්‍යයෙහි දිවයිනෙක වසනුයෙ ශක්‍රයා අවුදු තමහට වර දෙන කල්හි "මහරජ, මට වරයක් දෙහි නම් බාලජනයන්ගෙ දැකීන ද් ශ්‍රවණ ද් සංසර්ගී ද් නො ලබන වරයක් දෙයි[1] යෙමින් කීය:-

384. "බාලං න පස්සෙ න සුණෙ න ච බාලෙන සංවසෙ
බාලෙන අලාපසල්ලාපං න කරෙ න ච රොචයෙ"යි

යළිදු[2] වරයත් ගන්නට කීයෙන් "මහරජ, මට අනෙක් වරයක් දෙහි නම් පණ්ඩිතජනයන්ගෙ දැකීන ද් ශ්‍රවණ ද් සංසර්ගී ද් ලබන වරයක් දෙයි යෙමින් කීය:-

385. "ධීරං පස්සෙ සුණෙ ධීරං ධීරෙන සහ සංවසෙ
ධීරෙන අලාපසල්ලාපං තං කරෙ තඤ්ච
රොචයෙ"යි.

යම්සෙ නළපැලෙකින් හොතණපැලෙකින් හො කැහි ගිනි උල්ලිහා වළිහා වූ නිවාත වූ සුපිහිතද්වාරවාතපාන ඇති කූටාගාරයනුදු දවා ද, එසෙයින් මැ යම් කවර භයෙක් උපදී නම් ඒ හැම බාලජනයන් කෙරෙන් උපද්දී, පණ්ඩිතජනයන් කෙරෙන් උපදනෙ නො වෙ.

---

[1] දෙහි [2] වැලිදු

එයින් වදාළහ:-

386. "සෙය්‍යථාපි භික්ඛවෙ නළාගාරො වා තිණාගාරො වා අග්ගිමුක්කො කූටාගාරානිපි දහති උල්ලිතාවලිත්තානි නිවාතානි ථූඤ්ඤි තග්ගළානි පිහිතවාතපානානි. එවමෙව ඛො භික්ඛවෙ යානි කානිචි භයානි උප්පජ්ජන්ති සබ්බානි තානි බාලතො උප්පජ්ජන්ති නො පණ්ඩිතතො" යි.

මෙසෙයින් පාපමිත්‍ර සංසර්ගය මහත් අනර්ථයට වැටෙ.

එයින් වදාළහ:-

387. "නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යො එවං මහතො අනත්ථාය සංවත්තති යථයිදං භික්ඛවෙ පාපමිත්තතා" යි.

කල්‍යාණමිත්‍රසංසර්ගය මහත් අර්ථයට වැටෙ.

එයින් වදාළහ:-

388. "නාහං භික්ඛවෙ අඤ්ඤං එකධම්මම්පි සමනුපස්සාමි යො එවං මහතො අත්ථාය සංවත්තති යථයිදං භික්ඛවෙ කල්‍යාණ මිත්තතා" යි.

බුදුහු තමන්ගෙ ත්‍රිවිධශාසනය කල්‍යාණමිත්‍රසංසර්ගයෙන් අභිවෘද්ධි වන පරිදි දක්වන්නට වදාළහ:-

389. "සකලමෙව හිදං ආනන්ද බ්‍රහ්මචරියං යදිදං කල්‍යාණමිත්තතා කල්‍යාණසන්දිට්ඨතා කල්‍යාණසම්භත්තතා කල්‍යාණ සම්පවඩ්කතා කල්‍යාණසහායතා" යි.

අනවරාග්‍රසංසාරයෙහි අනෙකකොටිසතසහස්‍ර සම්‍යක් සම්බුද්ධයන් උපද අනන්තාපරිමාණ සත්වයන් සංසාරදුඃඛයෙන් මුදා පරිනිර්වාණ කළ තැනැ තව දක්වා තමා සංසාරස්ථ වනු පූර්වයෙහි කල්‍යාණමිත්‍ර සංසර්ග නො ලද්දෙන් කැරුණෙය යි විචාරා දක්නවුන්[1] විසින් සජ්ජනසඞ්ගමය අමෘත සෙ අනුභව කරනු මැනැවැ, දුර්ජනයන්ගෙ දර්ශනය උග්‍රවිෂ සෙයින් දුරු කරනු මැනැවි.

එයින් කිහ:-

390. "අමෘතමිව භජධ්වං සඞ්ගමං සජ්ජනානාං
ත්‍යජත විෂමිවොග්‍රං දර්ශනං දුර්ජනානාමි
විනුත හිතමතන්ද්‍රාඃ කිල්විෂං මා කුරුධ්වං
භවති විධිරයං වශ්ශ්‍රෙයසාමෙව පත්ථාඃ" යි.

(30). කලලපිටෙඩ නිපජ්ජි යන තන්හි බුදුහු සතරලක්ෂයක් සඟුන් හා සමඟ මා පිටින්[2] වඩිත්වයි බුදුනට ජීවිතපරිත්‍යාග කොට ස්වර්ණසෙතුවක් සෙයින් මඩපිට හොත් මහාපුරුෂ බුදුන් හා සමානාධ්‍යාශය වී.

කිසෙයැ යත්?

අමරවතී නුවර මනුෂ්‍යයො තමන් සෙ මැ හීනාධ්‍යාශය ඇති සර්වකාමානුභව කරන ජනයන් හා එක්වූහ. මහාපුරුෂයා හා ගිය ඒක්කෙනකුනු දූ නැති වූහ. මහාපුරුෂ හීනාධ්‍යාශය ඇති සත්වයන් පියා ගොස් තමා සෙ මැ කල්‍යාණාධ්‍යාශය ඇති බුදුන් දැක ඔවුන් දුටු විගස මැ ජීවිත පරිත්‍යාග කෙළෙ. යම්සෙ ඒ බුදුහු සත්වකරුණායෙන් දශපාරමිතා පුරා සම්‍යක් සම්බෝධියට

---

[1] දන්නවුන්F [2] පිටින් මැDF

ප්‍රාප්ත වුව මැනැවැයි සිතියැ. එහෙයින් බුදුන් හා සමානාධ්‍යාශයවී.

මෙසෙයින් හීනාධ්‍යාශය ඇති සත්වයො හීනාධ්‍යාශය ඇති සත්වයන් හා එක්වෙති, කල්‍යාණාධ්‍යාශය ඇති සත්වයො කල්‍යාණාධ්‍යාශය ඇති සත්වයන් හා එක් වෙත්. අතීතයෙහි දු අනාගතයෙහි දු වර්තමානයෙහි දු එතෙක් මැයි.

එයින් වදාළහ:-

391. "ඨාතුසො භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති - හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති; අතීතම්පි භික්ඛවෙ අද්ධානං - පෙ - අනාගතම්පි භික්ඛවෙ අද්ධානං, එතරහිපි භික්ඛවෙ පච්චුප්පන්නං අද්ධානං" යනාදි වීයින්.

මෙහි "ඨාතු" ශබ්ද ද් "අධිමුත්ති" ශබ්ද ද් අධ්‍යාශය වාචකයි.

යම්සෙ ගුළුතෙමෙහෙ ජනපදාන්තරයෙහි ද්වීපාන්තරයෙහි චක්‍රවාලාන්තරයෙහි දු තුබූ ගුළු හා වර්ණයෙනු දු ගන්ධයෙනු දු රසයෙනු දු නානාත්වයට නො ගොස් එක් වැ අතුරු නැති වැ සිටී ද, එ සෙයින් මැ හීනාධ්‍යාශය ඇති සත්වයො යම්තැනෙක ද වූ හීනාධ්‍යාශය සත්වයන් හා එක්වෙත්.

එයින් වදාළහ:-

392. "සෙය්‍යථාපි භික්ඛවෙ ගුළො ගුළෙන සංසන්දති සමෙති, මුත්තං මුත්තෙන - පෙ - ඛෙළො ඛෙළෙන, පුබ්බො

පුබ්බන, ලොහිතං ලොහිතෙන සංසන්දති සමෙති. එවමෙව ඛො භික්ඛවෙ ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති - හීනාධිමුත්තිකා හීනාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති" සි.

යථෙ ක්ෂීරතෙමෙහෙ ජනපදන්තරයෙහි ද් තුබූ ක්ෂීර හා වණීයෙනුදු[1] ගන්ධයෙනුදු[2] රසයෙනුදු[3] නානාත්වයට නො ගොස් එක් වැ අතුරු නැතිවැ සිටී ද, එ සෙයින් මැ කල්‍යාණාධ්‍යාශය ඇති සත්වයො ජනපදන්තරයෙහි දු[4] කල්‍යාණාධ්‍යාශය සත්වයන් හා එක්වෙත්.

එයින් වදළහ:-

393. "සෙය්‍යථාපි භික්ඛවෙ ඛීරං ඛීරෙන සංසන්දති සමෙති තෙලං තෙලෙන - පෙ - සප්පිං සප්පිනා, මධුං මධුනා, ඵාණිතං ඵාණිතෙන සංසන්දන්ති සමෙති. එවමෙව ඛො භික්ඛවෙ ධාතුසොව සත්තා සංසන්දන්ති සමෙන්ති - කල්‍යාණාධිමුත්තිකා කල්‍යාණාධිමුත්තිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති" සි.

යථෙ පූතිමූත්‍රතෙමෙහෙ ද්වීපාන්තරයෙහි ද් තුබූ පූතිමූත්‍ර හා සංසක්ත වෙ ද, එ සෙයින් මැ ශ්‍රද්ධාරහිත සත්වයො යම් තැනෙක්හිදු ශ්‍රද්ධාරහිත සත්වයන් හා සංසක්ත වෙත්.

එයින් වදළහ:-

394. "ධාතුසො භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති - අස්සද්ධා අස්සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, අහිරිකා අහිරිකෙහි - පෙ - අනොත්තාපිනො අනොත්තාපීහි, අපස්සුකා

---

[1] වණියෙහිද් AF [2] ගන්ධයෙහිද් AF [3] රසයෙහිද් AF
[4] ජනපදන්තරයෙහි දු වූ CD

අප්පස්සුතෙහි, කුසීතා කුසීතෙහි, මුට්ඨස්සතිනො මුට්ඨස්සතීහි, දුප්පඤ්ඤා දුප්පඤ්ඤෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති"යි.

යම්සෙ තෛලතෙමෙහෙ ද්වීපාන්තරයෙහි ද් තුබූ තෛල හා සංසක්ත වෙ ද, එ සෙයින් මැ ශ්‍රද්ධාසම්පන්න සත්වයො[1] යම් තැනෙක්හිදු ශ්‍රද්ධාසම්පන්න සත්වයන් හා සංසක්ත වෙත්.

එයින් වදාළහ:-

395. "ධාතුසො භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති - සද්ධා සද්ධෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති, හිරිමන්තා හිරිමන්තෙහි[2] - පෙ - ඔත්තාපිනො ඔත්තාපීහි, බහුස්සුතා බහුස්සුතෙහි, ආරද්ධවිරියා ආරද්ධවිරියෙහි, උපට්ඨිතසතිනො උපට්ඨිතසතීහි, පඤ්ඤාවන්තො පඤ්ඤාවන්තෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති"යි.

යම්සෙ පූයාතෙමෙහෙ චක්‍රවාටාන්තරයෙහි ද් තුබූ පූයා හා සංසක්ත වෙ ද, එ සෙයින් මැ ප්‍රාණාතිපාතයෙහි නියුක්ත දුශ්ශීල සත්වයො දූරයෙහි ද් වූ ප්‍රාණාතිපාතයෙහි නියුක්ත දුශ්ශීල සත්වයන් හා සංසක්ත වෙත්.

එයින් වදාළහ:-

396. "ධාතුසො භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති - පාණාතිපාතිනො පාණාතිපාතීහි සද්ධිං, අදින්නාදායිනො අදින්නාදායීහි සද්ධිං, කාමෙසු මිච්ඡාචාරිනො කාමෙසු මිච්ඡාචාරීහි සද්ධිං, මුසාවාදිනො මුසාවාදීහි සද්ධිං, සුරාමෙරයමජ්ජපමාදට්ඨායිනො සුරාමෙරයමජ්ජපමාදට්ඨායීහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති"යි.

---

[1] ජනයොACDEF [2] හිරිමනා හිරිමනෙහිBC

යම්සෙ සර්පිෂතෙමෙහෙ චක්‍රවාචාන්තරයෙහි ද් තුබූ සර්පිෂ හා සංසක්ත වෙ ද. එසෙයින් මැ ප්‍රාණාතිපාතයෙන් විරත[1] සත්වයො දූරයෙහිදූ වූ ප්‍රාණාතිපාතයෙන් විරත[1] සත්වයන් හා සංසක්ත වෙත්.

එයින් වදාළහ:-

397. "ධාතුසො භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති - පාණාතිපාතා පටිවිරතා පාණාතිපාතා පටිවිරතෙහි සද්ධිං, අදින්නාදානා පටිවිරතා අදින්නාදානා පටිවිරතෙහි සද්ධිං, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතෙහි සද්ධිං, මුසාවාදා පටිවිරතා මුසාවාදා පටිවිරතෙහි සද්ධිං, සුරාමෙරය මජ්ජපමා දට්ඨානා පටිවිරතා සුරාමෙරයමජ්ජපමාදට්ඨානා පටිවිරතෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති"යි.

යම්සෙ රුධිරතෙමෙහෙ දෙශාන්තරයෙහි ද් තුබූ රුධිර හා සංසක්ත වෙ ද, එ සෙයින් මැ අකුශලකර්මපථසමාපන්න සත්වයො දෙශාන්තරයෙහි ද් වූ අකුසලකර්මපථසමාපන්න සත්වයන් හා සංසක්ත වෙත්.

එයින් වදාළහ:-

398. "ධාතුසො භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති - පාණාති පාතිනො පාණාතිපාතීහි සද්ධිං, අදින්නාදායිනො අදින්නා දායීහි සද්ධිං, කාමෙසු මිච්ඡාචාරිනො කාමෙසු මිච්ඡාචාරීහි සද්ධිං, මුසාවාදිනො මුසාවාදීහි, පිසුණාවාචිනො[2] පිසුණාවාචී එරුසාවාචිනො[2] එරුසාවාචී, සම්ඵප්පලාපිනො සම්ඵප්පලාපීහි, අභිජ්ඣාලුනො අභිජ්ඣාලූහි, ව්‍යාපන්නචිත්තා ව්‍යාපන්නචිත්තෙහි, මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති"යි.

---

[1] විරක්ත ACDEF [2] වාචා - වාචෙහි CD

යම්සෙ මධුගඞ්කරා තොමොහා[1] සමුද්‍රයෙන් මෙතෙර වූවා[2] පරතෙර ද වූ මධුගඞ්කරා හා සංසන්ද වෙ ද, එ සෙයින් මැ කුසලකම්පථසමාපන්න සත්වයෝ සමුද්‍රයෙන් මෙතෙර වූවාහු පරතෙර ද වූ කුශලකම්පථසමාපන්න සත්වයන් හා එක් වෙත්.

එයින් වදළහ:-

399. "ධාතුයෝ භික්ඛවෙ සත්තා සංසන්දන්ති සමෙන්ති - පාණාතිපාතා පටිවිරතා පාණාතිපාතා පටිවිරතෙහි, අදින්නාදානා පටිවිරතා අදින්නාදානා පටිවිරතෙහි, කාමෙසු මිච්ඡාචාරා පටිවිරතා කාමෙසු මිච්ඡාචාරා පටිවිරතෙහි, මුසාවාද පටිවිරතා මුසාවාද පටිවිරතෙහි, පිසුණාවාචා පටිවිරතා පිසුණාවාචා පටිවිරතෙහි, ඵරුසාවාචා පටිවිරතා ඵරුසාවාචා පටිවිරතෙහි, සම්ඵප්පලාපා පටිවිරතා සම්ඵප්පලාපා පටිවිරතෙහි, අනභිජ්ඣාලුනෙ අනභිජ්ඣාලූහි, අව්‍යාපන්නචිත්තා අව්‍යාපන්න චිත්තෙහි, සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකෙහි සද්ධිං සංසන්දන්ති සමෙන්ති" සි.

මෙසෙ තුන්කල්හි මැ හීනාධ්‍යාශය ඇති සත්වයෝ හීනාධ්‍යාශය ඇති සත්වයන් හා එක් වෙති, කල්‍යාණාධ්‍යාශය ඇති සත්වයෝ කල්‍යාණාධ්‍යාශය ඇති සත්වයන් හා එක් වෙත්.

---

(ඍ). සංසාරකන්තාරං යන තන්හි කන්තාර නම් කවරේ යන්?

චොරකන්තාරයැ, ව්‍යාලකන්තාරයැ, අමනුෂ්‍යකන්තාරයැ, නිරුදකකන්තාරයැ, අල්පභක්ෂ්‍යකන්තාරයයි පඤ්චවිධ වෙ.

---

[1] තෙමෙහි CDEF [2] වූයේ CEF

එහි යම්තැනෙක්හි චොරභය ඇද්ද හෙ චොර කාන්තාරයැ, යම්තැනෙක්හි සිංහව්‍යාඝ්‍රාදින්ගෙ භය ඇද්ද හෙ ව්‍යාලකාන්තාරයැ, යම්තැනෙක්හි යක්ෂරාක්ෂසභය ඇද්ද හෙ අමනුෂ්‍යකාන්තාරයැ, යම් තැනෙක්හි ඝානපානයට නිසි උදක නැද්ද හෙ නිරුදක කාන්තාරයැ, යම් තැනෙක්හි භක්ෂණය කරන්නට නිසි කන්දමූලඵලපණ්ණමාත්‍රයකුදු නැද්ද හෙ අල්පභක්ෂ්‍ය කාන්තාරයයි. යම්සෙ මෙ පඤ්චවිධ කාන්තාර චොරභයාදියෙන් සභය ද, එසෙයින් මෑ සංසාරය ද ජාතිභයාදියෙන් සභය වන බැවින් "කාන්තාර" නම් වෙ.

---

(§ 2). පඤ්චවණ්ණපසාදසම්පන්නානි ලොචනානි යන තන්හි "සම්පන්න" ශබ්දය "සම්පන්නං සාලිතෙදුරං සුචා භුඤ්ජන්ති කොසිය" යන තන්හි සෙයින් පරිපූර්ණ සම්පන්නයෙහි වැටෙයි. මෙයින් බැහැර "ඉමිනා පාතිමොක්ඛසංවරෙන උපෙතො හොති සමුපෙතො උපාගතො සමුපාගතො උපපන්නො උපපන්නා[1] සමන්නාගතො හොති" යන තන්හි සමඩහි සම්පන්නයෙහි වැටෙයි. "ඉමිස්සා හෙට්ඨා මහාපඨවියා හෙට්ඨිමතලං සම්පන්නං සෙය්‍යථාපි නාම සුඛං මධුං අනේළකං" යන තන්හි මධුර සම්පන්නයෙහි වැටෙයි.

---

(§ 3). චතූහි ඛීණාසවසතසහස්සෙහි යන තන්හි ක්ෂීණාශ්‍රවයෝ නම් කවරහ්[2] යත්?

ආශ්‍රව මෑ චතුර්විධ වෙ:- කාමාශ්‍රවයැ, භවාශ්‍රවයැ අවිද්‍යාශ්‍රවයයි. එහි චක්ෂුරාදි පඤ්චද්වාරයෙහි ආපාතගත[4] වූ

---

[1] උපපන්නා සම්පන්නා DG [2] කවරා A
[3] මෑ ab. in BC [4] ආපාතභූත CEF

රූපාදි පඤ්ච ඉට්ඨාලම්බනයන් කාමාස්වාද වියින් ආස්වාදනය අභිනන්දනය කරනුවහට කාමාශ්‍රව උපද්දි මෙබඳු ආලම්බන අනෙක් සුගතිභවයෙන්හි[1] ලැබෙමිවයි භවවිෂයප්‍රාර්ථනායෙන් ආස්වාදනය කරනුවහට භවාශ්‍රව උපද්දි. සත්වයයි හෝ සත්වයා ගැත්තෙයයි[2] හෝ ගන්නාහට දෘෂ්ට්‍යාශ්‍රව උපද්දි. මොවුන් හැමදෙනා හා සහජාත වූ අඥානය අවිද්‍යාශ්‍රව නමි වෙ.

මොහු "ආශ්‍රව" නමි කුමට වූහ යත්? "ආ ශ්‍රවන්ති - ක්ෂාශ්‍රවාඃ" යි ගත් වන බැවින් ආ භවාග්‍ර දක්වා සවි අවකාශ ලොකය ඇතුව කොට ආ ගොත්‍රභූඥාන දක්වා සවිධමියෙහි ව්‍යාප්ත වැ ශ්‍රවත් වන බැවින් "ආශ්‍රව" නමි වෙත්.

එයින් කිහ:-

400. "තත්ථ ආ සවන්තීති ආසවා:- චක්ඛුතොපි සොතතොපි ඝානතොපි ජිව්හාතොපි කායතොපි මනතොපි සවන්ති පවත්තන්තීති වුත්තං හොති. ධම්මතෝ යාව ගොත්‍රභු ඔකාසතෝ යාව භවග්ගා සවන්තීති වා ආසවා; එතෙ ධම්මෙ එතඤ්ච ඔකාසං අන්තෝ කරිත්වා පවත්තන්තීති අත්ථෝ" යි.

මෙ සතර ආශ්‍රවයෝ යම් රහත්තෙනකුන් විසින් පරික්ෂය කරනලදහු ද ඔහු "ක්ෂීණාශ්‍රව" නමි වෙත්.

එයින් කිහ:-

401. "ඉමෙ චත්තාරෝ ආසවා අරහතො ඛීණා පහීණා සමුච්ඡින්නා පටිනිස්සට්ඨා අභබ්බුප්පත්තිකා ඤාණග්ගිනා දඩ්ඪා, තෙන වුච්චති ඛීණාසවෝ" යි.

මොහුය ක්ෂීණාශ්‍රවයෝ නමි.

---

[1] සුගතිභවයෙහි CDE [2] ගත්තෙය ABCDEF
[3] අභබ්බුප්පත්තියා CE

(34). පාදපඩකජො යන තන්හි සුරාසුරයන්ගෙ මුහුළුමිණියෙහි දිස්නා ඡායා උපචාරයෙන් "පාදපඩකජ" ශබ්දයෙන් කියනලද.

මෙහි උපචාර නම් අතථාභූතවස්තුහු කෙරෙහි තථාභූත ඥාන විශෙෂයයි. හෙ චතුර්විධ වෙ:- තාත්ස්ථ්‍යයැ, තාද්ධර්ම්‍යයැ, තත්සාහචර්‍ය්‍යයැ, තත්සාමීප්‍යයයි.

එහි තාත්ස්ථ්‍ය නම් කවර යත්? "මඤ්චාඃ ක්‍රොශන්ති, ගිරිදීහ්‍යති" යන තන්හි මඤ්චස්ථ ජනයො "මඤ්ච" ශබ්දයෙන් කියනු ලැබෙති[1]. ගිරිස්ථ දහනය "ගිරි" ශබ්දයෙන් කියනු ලැබේ.

තාද්ධර්ම්‍ය නම් කවර යත්? "අග්නිමාණවකඃ, ගොමාහිකඃ" යන තන්හි අග්නිධර්ම මාණවක "අග්නි" ශබ්දයෙන් කියනු ලැබෙයි[1]. ගොධර්ම වාහික[2] "ගො" ශබ්දයෙන් කියනු ලැබෙයි[1]. මෙ තැන "ධර්ම" ශබ්ද ස්වභාවපර්‍ය්‍යායයි.

තත්සාහචර්‍ය්‍ය නම් කවර යත්? "යෂ්ටින් ප්‍රවෙශය, කුන්තාන් ප්‍රවෙශය" යන තන්හි යෂ්ටිසහචරිත පුරුෂයො "යෂ්ටි" ශබ්දයෙන් කියනු ලැබෙති[1], කුන්තසහචරිත පුරුෂයො "කුන්ත" ශබ්දයෙන් කියනු ලැබෙත්[1].

තත්සාමීප්‍ය නම් කවර යත්? "ගඩ්ගායාං ඝොෂඃ" කූපෙගර්ගකුලම්" යන තන්හි ගඩ්ගාසමීපවර්ත්ති වූ ඝොෂාධාරදෙශය "ගඩ්ගා" ශබ්දයෙන් කියනු ලැබෙයි[1], කූපසමීපවර්ත්ති වූ ගර්ගකුල නිවාසදෙශය "කූප" ශබ්දයෙන් කියනු ලැබේ[1].

මෙයැ "උපචාර" නම්.

---

[1] කියන ලැබෙEF [2] ගාහිකCDEF

(35). එකස්මිං කප්පෙ යන තන්හි "කල්ප" ශබ්දය "වත්තාරිමානි භික්ඛවෙ කප්පස්ස අසඞ්ඛෙය්‍යානි" යන තන්හි සෙයින් මහාකල්පයෙහි වැටෙයි – මෙයින් බැහැර "නෙක්ඛම්ම සඞ්කප්පො අව්‍යාපාද සඞ්කප්පො" යන තන්හි විතර්කයෙහි වැටෙයි – "චීවරෙ විකප්පං ආපජ්ජෙය්‍ය" යන තන්හි විධානයෙහි වැටෙයි – "සත්ථු කප්පෙන වත කිර හො සාවකෙන සද්ධිං මන්තයමානා න ජානිම්හ" යන තන්හි සාදෘශ්‍යයෙහි වැටෙයි. "ඉච්චායස්මා කප්පො" යන තන්හි ප්‍රඥප්තියැ වැටෙයි – "යෙන සුදං නිච්චකප්පං විහරාමි" යන තන්හි කාලයෙහි වැටෙයි – ආකඞ්ඛමානො ආනන්ද තථාගතො කප්පං වා තිට්ඨෙය්‍ය කප්පාවසෙසං වා" යන තන්හි පරමා යුෂයෙහි වැටෙයි – අනුජානාමි භික්ඛවෙ පඤ්චහි සමණකප්පෙහි ඵලං පරිභුඤ්ජිතුං" යන තන්හි ශ්‍රමණව්‍යවහාරයෙහි වැටෙයි – "කෙවල කප්පං ජෙතවනං ඔභාසෙත්වා" යන තන්හි සමන්තභාවයෙහි වැටෙයි – "සද්ධා සද්දහනා ඔකප්පනා අභිප්පසාදෙ" යන තන්හි ඡෙදනයෙහි වැටෙයි – "එවමෙව ඉතො දින්නං පෙතානං උපකප්පති" යන තන්හි විනියොගයෙහි වැටෙයි – "කප්පකතෙන අකප්පකතං සංසිබ්බිතං හොති" යන තන්හි විනයක්‍රියායෙහි වැටෙයි – "අත්ථි කප්පො නිපජ්ජිතුං" යන තන්හි ලෙශයෙහි වැටෙයි – "න කප්පයන්ති න පුරක්ඛරොන්ති ධම්මාපි තෙසං න පනිච්ඡිතාසෙ" යන තන්හි තෘෂ්ණාදෘෂ්ටියැ වැටෙයි – "ආපායිකො නෙරයිකො කප්පට්ඨො සඞ්ඝභෙදකො කප්පං නිරයම්හි පච්චති" යන තන්හි අන්තඃකල්පයෙහි වැටෙයි – "අනෙකෙපි සංවට්ට කප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ" යන තන්හි අසඞ්ඛ්‍ය කල්පයෙහි වැටෙයි.

---

(36). චක්කවත්තිරාජා යන තන්හි සතරසඞ්ග්‍රහවස්තුවින් ජනයන් තමා කෙරෙහි අනුරාග කරවනුයෙ "රජ" නම් වෙ.

එහි[1] <u>සතරසඞ්ග්‍රහවස්තු</u> නම් කවර යත්? දානයැ, ප්‍රිය වචනයැ, අර්ථචර්‍යායැ, සමානාත්මතායැ යන මෙයි.

එහි[1] යම් කෙනෙක් භොග කැමැති වූහු නම් ඔව්නට භොගදානයෙන් රක්ෂනය කරවයි; යම්කෙනෙක් රජුකෙරෙන් ප්‍රිය වචන කැමැති වූහු නම් ඔව්නට ප්‍රියංවද වැ රක්ෂනය කරවයි; යම්කෙනෙක් තමනට අනර්ථයක් උපස්ථිත වූ කලැ තත් ප්‍රතිකාර කැමැති වූහු නම් ඔව්නට වහල් වනුයෙ අර්ථචර්‍යායෙන් රක්ෂනය කරවයි; යම් නැ කෙනෙක් එකාසනනිෂද්‍යාදීන් රජු හා සමාන භාවය කැමැති වූහු නම් ඔව්නට තත්සම්පාදනය කරනුයෙ සමානාත්මතායෙන් රක්ෂනය කෙරෙයි. මෙ හැම රජුන්ගෙ ධර්මතායැ. එ නො කරනුයෙ ද තාලවෘන්තව්‍යවහාරයෙන් "රජ" නම් වෙ.

මෙයැ සතරසඞ්ග්‍රහවස්තු නම්.

---

(37). ඉමස්මිං පන හද්දකප්පෙ යන තන්හි බුදුන් පස්දෙනකු උපදනෙන් මෙ "භද්‍රකල්ප" නම් වී.

මෙහි පස්වන බුදුහු නම් කවරහ යත්? මෛත්‍රෙය තථාගතයොයි.

ඔවුන් උපදනා පරිදි කිසෙයැ යත්?

මෙ සස්න පඤ්චප්‍රකාර අන්තර්ධානයෙන් අන්තර්හිත වූ කල්හි මනුෂ්‍යයන්ගෙ අධර්මසමාදානයෙන් වර්ෂශතයෙහි සිටි ආයුෂය පිරිහී දශවර්ෂායුෂ වූ කල්හි මෘගසංවර්තනයෙන් සත්වයො විනාශයට යෙති; එකල්හි ගහනනිඃශ්‍රිත වැ රකුණු සත්වයන්ගෙ ධර්ම සමාදානයෙන් ආයුෂ ක්‍රමයෙන් වඩමින්[2] ගොස් අසඞ්ඛ්‍යයට යෙයි; අසඞ්ඛ්‍යයෙහි සිටි ආයුෂ ක්‍රමයෙන් බස්මින් ගොස් අසූවා

---

[1] මෙහිB [2] වඩිමින්BD

දහසකට යෙයි. එකල්හි දඹදිවිතෙලෙහි සුවාසූදහසක් නුවර පිරිවර[1] ලද "කෙතුමතී" නම් රාජධානියක් වෙයි; එනුවර දිග දොළොස්යොදුන් වෙයි; පළල සත්යොදුන් වෙයි; දෙවියන්ගෙ අලවිමඳ නුවර සෙයින් යහපත් වෙයි. එනුවර "සඞ්ඛ නම් චක්‍රවර්ත්තියෙක් වෙයි; එ රජහට නුවර මධ්‍යයෙහි පස්විසියොදුන් රුවන්පහයෙක් වෙයි; එනුවර රුවන් මුවා සත්පවුරෙකින් පරීක්ෂිප්ත වෙයි; එරජුගෙ පිනින් තන්හි තන්හි පොළොව පළා[2] නැඟි කප්රුක් වෙයි; ඔහුගෙ සුවාසූදහසක් නඵවො වෙති; අනන්තාපරිමාණ බලවාහන වෙ. එකල්හි දඹදිවිතලය දෙවිනුවරක් සෙයින් විසිතුරු වෙයි; උතුරුකුරදිවි සෙයින් සුලභාන්ත පාන වෙයි, අත්‍යන්තසුඛසමර්පිතමනුෂ්‍යයන් විසින් නලවන්[3] ශරවන සෙයින් ගහන වෙයි; දශවිධශබ්දයෙන් එකනින්නාද වෙයි.

එකල්හි මෛත්‍රෙය බොධිසත්වයො තුසීපුරෙන් සැව කෙතුමතී නුවර සඞ්ඛචක්‍රවර්ත්තිහට අර්ථධර්මානුශාසනා කරන "සුබ්‍රහ්ම" නම් පුරොහිතයා පිණිස "බ්‍රහ්මවතී" නම් බ්‍රාහ්මණීය කුස පිළිසිඳ ගෙන දසමාසාවසානයෙහි අනෙකප්‍රාතිහාර්‍යසහස්‍ර දක්වමින් මවුකුසින් ප්‍රසූත වැ වැඩැ විය[4] පැමිණ නඵගණ පිරිවරා පොළොව පළා නැඟි රුවන්මුවා ප්‍රාසාදත්‍රයෙහි වාසය කෙරෙත්.

එ පහා ප්‍රවාලෙන්ද්‍රනීලස්ඵටිකමණීමයකූටාගාරසහස්‍රයෙන් ඉන්ද්‍රායුධසහස්‍ර නැඟිකල් සෙයින් දිලියෙයි; පහාකුස් නොයෙක් දහස් වෙරළුමිණිපලගින් මිණිපුඩුසේසතින් සිරියහනින් රුවන් හිණින්[5] මිණිපහන්රසින් සැදුම්ලදු වෙයි. සියන්[6] දද අග්හි ලළන කිඞ්කිණික රවයෙන් කන්කලු වෙයි; නිරන්තරයෙන් වස්නා දිව කුසුම්වර්ෂායෙන් සුගන්ධිත වෙයි; සියක් දහස් නඵවො වෙති;

---

[1] පිරිවරන DEF
[2] පැළී BCDEFG
[3] නළවන G
[4] වැඩිවිය E
[5] කොතින් CDEF
[6] සියල් ACD
[6] සියන් අග්හි B

අගමෙහෙසුන් "චන්ද්‍රමුඛී" නම් වෙයි; ඇය කයින් දිවයදුන්ගඳ වැහෙයි; මියෙන් දිවමහනෙල්ගඳ වැහෙයි; අන්සුවහස් ඇමැති මඩුලු වෙයි; සඬ්ඛචක්‍රවර්ත්ති සුවාසූදහසක් රජුන් හා සමග අවුද් උපස්ථානකොට සිටී.

එකල්හි මෛත්‍රේබෝසතාණෝ ච පහාහි මහත්සම්පත් අනුභව කරන්නාහු අටවාදහසක් ගිහිගෙයි වාස කොට "බ්‍රහ්මවර්ධන" නම් පුත්‍රයා උපන්කල්හි චතුර්විධනිමිත්ත දැක පැවිදි වැ සප්තාහයක් පධන්හි යොග කොට චන්ද්‍රමුඛිය දුන් කිරිපිඬු වළඳා පහයින් බෝස් මහබෝමඬට පැමිණ දකුණුදෙසෙන් නැඟී තුන්යලක් පැදකුණු කොට නාරුක්මුල්හි පැදුම්ලොධා බලා වැඩහිඳ බුදු වෙත්.

එරුක් එක්සියවිසිරියන් කඳ වෙයි; එපමණ පඬුමහා ශාඛා වෙයි; හැමකල්හි පුප්නා රථසක් පමණ මල් වෙයි; එක් මලෙක්හි නැළියක් පමණ මුවරඳ වෙයි; දසයොජනක් තන්හි වැහෙන ගඳ වෙයි; හාත්පසින් තුන්යොජනක් පමණ තන්හි වෘක්ෂයෝ මහබොයට වැදුම්ගෙන සිටිති; සුපිපි ලියගස්හු දක්ෂිණාවෘත්ත වැ මුතු මැණික් පවුරු යෙසින් පිරිවරා සිටිති; ආකාශයෙන් යන නානාවර්ණද්විජ ගණයෝ මධුරස්වරයෙන් පූජා කෙරෙමින් පැදකුණු කොට යෙති; ශාඛාවිටපපත්‍රයෙහි දු හිඳුනා ලිහිණියෝ නැති.

බුදු වැ යහපහා භාවයානයෙහි බ්‍රහ්මාරාධනායෙන් බෝස් ඉසිපතන්හි ධම්සක් පවත්වත්. එදවස් සියක්යොදුන් තන්හි මනුෂ්‍යපෂීද වෙයි; සත්වළඟබ පිරී සිටි දෙවිබඹපිරිස් වෙයි; අනෙකදෙවමනුෂ්‍යසහස්‍රයනට ධර්මාභිසමය වෙයි; සඬ්ඛ චක්‍රවර්ත්ති සහපිරිවරින් බෝස් බණ අසා රහත් වැ "එහි භික්ෂු" භාවයෙන් පැවජී වෙ.

ඒ බුදුහට "අසෝක" නමී "බ්‍රහ්මදෙව නමී මහතෙරහු දෙදෙනෙක් අගසවී වෙති; "සීහ" නමී මහතෙරකෙනෙක් අග්‍රුපස්ථායක වෙති; "පදුමා" නමී "සුමනා" නමී වෙරිහි[1] දෙදෙනෙක් අගසැවී වෙත්.

බුදුහු අටාසූහත් වෙති; ව්‍යාමප්‍රභාමණ්ඩලය පස්විසි යොජනක් තන්හි පැතිර සිටී. අසූවාදහසකට ආයුෂ වෙයි; බුදුන් ඇතුත් ඇතුත්[2] පියෙහි පුත්තා පියුම් වෙයි; එහි මුවරඳරොන්සළා බුදුන් අනවලෝ මුදුන් දක්වා නැහි ලාරස පරිෂෙකයක් යෙයින් රන්වන්සිරුරු තවරමින් බස්සි, එරොන් අභිභවමින් මෙත් ශරීරප්‍රභා නික්ම දෙවිදුනු සුවහස් නැඟිකල් යෙයින් දඟදිඟා බබුළුවයි; බුදුහු අනෙසුවහස් සවිඟණ පිරිවරා දනවු සැරිසරා ධර්‍ම දෙසී වස්වා අනන්තාපරිමාණ දෙවිමිනිසුන් දෑජරමරණීන් මුදා අමාමහනිවන් පමුණුවත්.

එයින් වදාළහ සක්විටි සූත් දෙසන බුදුහු:-

402. "අසීතිවස්සසහස්සායුකෙසු භික්ඛවෙ මනුස්සෙසු මෙත්තෙය්‍යෝ නාම භගවා ලොකෙ උපපජ්ජිස්සති අරහං සම්මාසම්බුද්ධා" යනාදීන්.

මෙසෙ අනාගතයෙහි උපදනා බුදුන් ඇතුළුව පස්දෙනකු උපදනෙන් මෙ "භද්‍රකල්ප" නමී වී.

---

(38). එවමාදිසු යන තන්හි "එවං" ශබ්දය "එවඤ්ච වදෙහි" යන තන්හි සෙයින් නිදර්ශනයෙහි වැටෙයි. මෙයින් බැහැර "එවං ජාතෙන මච්චෙන" යන තන්හි උපමායෙහි වැටෙයි. "එවං තෙ අභික්කමිතබ්බං" යන තන්හි උපදේශයෙහි වැටෙයි.

---

[1] තෙරිහි CG [2] අතුත් අතුත් BL

"එවමෙතං සුගත" යන තන්හි සම්ප්‍රහර්ෂණයෙහි වැටෙයි. "එව මෙවං පනායං වසලී" යන තන්හි ගර්හායෙහි වැටෙයි. "එවං හනෙත" යන තන්හි සම්ප්‍රතිග්‍රහණයෙහි වැටෙයි. "එවං ව්‍යාඛෝ'හං" යන තන්හි ආකාරයෙහි වැටෙයි. "එවං නෝ එතං හොති" යන තන්හි ඉදමර්ථයෙහි වැටෙයි. "එවං නුඛෝ" යන තන්හි පෘච්ඡායෙහි වැටෙයි. "එවං ලහුපරිවත්තං" යන තන්හි පරිමාණයෙහි වැටෙයි.

---

(39). රොජචරරොජ යනාදි වාක්‍යයෙහි "මාන්ධාතා" රජ කාමභොගීනට අග්‍රයි.

කිසෙයෑ යත්? වදාළෙ මෑ නෝ:-

403. "එතදග්ගං භික්ඛවෙ අත්තභාවීනං යදිදං රාහු අසුරින්ද, එතදග්ගං භික්ඛවෙකාමභොගීනං යදිදං රාජා මන්ධාතා, එතදග්ගං භික්ඛවෙ ආධිපතෙය්‍යානං යදිදං මාරෙ පාපිමා, සදෙවකෙ භික්ඛවෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය තථාගතො අග්ග මක්ඛායති අරහං සම්මා සම්බුද්ධා" යි.

මෙහි රාහු අසුරේන්ද්‍රයා ආත්මභාවීනට අග්‍ර පරිදි කිසෙයෑ යත්?

හෙ උස සාරදහස් අටසියක් යොජනෑ, ඔහු බාහු අතුරු එක්දහස් දෙසියක් යොජනෑ, බොල සසියක් යොජනෑ, හිස නවසියක් යොජනෑ. නළල තුන්සියක් යොජනෑ, බැම අතුර පනස් යොජනෑ, මුවය දෙසියක් යොජනෑ. ඇඹුරෙහි තුන්සියක් යොජනෑ, අතුල් පතුල් පළල දෙසියක් යොජනෑ, ඇඟිලිපවී පනස් යොජනෑ, මෙ පමණ ආත්මභාවයෙක් අනෙක් කෙනක්නට නැති වන බැවින් රාහු අසුරේන්ද්‍ර ආත්මභාවීනට අග්‍ර වී.

මන්ධාතාහු කාමභොගිනට අග්‍රපරිදි කිසෙයැයත්?

එරජ සුවාසූදහසක් හවුරුදු කුමාරක්‍රීඩා කොට සුවාසූ දහසක් හවුරුදු යුවරජ ක්‍රීඩා කොට සුවාසූදහසක් හවුරුදු සපරිවාර සතරමහාද්වීපයෙහි චක්‍රවර්ත්ති ඓශ්වර්‍ය්‍ය කොට අපොළා චක්‍රවාට ගර්භයෙහි රත්නවර්ෂා වස්වා දිව්‍යලොකයට ගොස් සත්දෙවිරජහුගෙ අඩිරාජ්‍ය ගෙන එක් ශක්‍රයක්හු තුන් කෙළ සැටලක්ෂයක් හවුරුදු බැවින් දෙවරාජයන් සතිස්දෙනක්හු ක්‍රමයෙන් දිව්‍ය සම්පත් වළඳ වුත වැ යන තැන් දක්වා සිට දිව්‍ය කාම අනුභව කෙළෙ. එයින් එරජ කාමභොගිනට අග්‍ර වී.

මාරයා ආධිපත්‍ය ඇත්තානට අග්‍රපරිදි කිසෙයැ යත්?

බුදුන් බොධිපර්‍ය්‍යඩ්කාරූඩ් වූ කල්හි එන මරපිරිස් දැක දශසහස්‍රී ලොකධාතුවින් ආ දිව්‍ය බ්‍රහ්මනාගසුපර්ණකරුඩගන්ධර්ව යක්ෂරාක්ෂයන් කෙරෙන් සිටි එකකුදු නැති වැ බුදුන් එකලා කොට හිඳුවා තමන් තමන්ගෙ[1] භවන්[2] ගියහ. මෙසෙ මර දෙවිපුත් තමාගෙ දර්ශනයෙන් මැ දෙවිබඹුන් ප්‍රලය කරන පමණ ආධිපත්‍ය ඇත්තෙයැ. එයින් හෙ ආධිපත්‍ය ඇත්තානට අග්‍ර වෙ.

බුදුන් හැමසත්නට අග්‍රපරිදි කිසෙයැ යත්?

බුදුහු එදවස් එවැනි මරපිරිස් දැක ද හුනස්නෙන් නො නැඟී තමන් බෝසත්කල්හි පවා ඔහු වස්වන නවවිධවර්ෂා පරාඩිමුඛ කොට මරසෙනඟ බිඳ ප්‍රලය කොට සම්‍යක් සම්බුද්ධ වැ අසාධාරණ ගුණයෙන් යුක්ත වූහ. එයින් බුදුහු සනරාමරලොකයහට අග්‍රවූහු.

එයින් වදාළහ:-

404. "රාහග්ගං අත්තභාවීනං මන්ධාතා කාමභොගිනං
මාරො ආධිපතෙය්‍යානං සම්බුද්ධො දිපදුත්තමො" යි.

---

[1] තමතමන්ගෙ CDE [2] භවනයට A

(40). සගරසාගරභරතභගීරථපථෙ යන තන්හි භගීරථයා කෙරෙන් සතරවනු වැ උපන් මහාපණාද නම් රජෙක් වී.

එරජු පියේ ඔහු මහපෙරහරින් වැඩැ වියපත් කල්හි රජයෙහි පිහිටුවියටි වැ වඩුවන් ගෙන්වා ගෙන ප්‍රාසාදයක් කරන්නට භූමි පරිග්‍රහ කැරැවිය. එකල්හි ශක්‍රදෙවරාජයාගෙ නියොගයෙන් විශ්වකර්ම අවුදු වඩුවෙසක් මවා ගෙන දඬුයෙකින් බිම පහළ; එකෙණෙහි පළල අඩයොදුන් උස පස්විසි යොදුන් සියක් බුමු ඇති නිල්මිණිමුවා දෙරකවුළු ඇති රුවන්පහයෙක් පොළොව පැළී නැංග; කුමාරයාහට ප්‍රාසාදමඩ්ගල ද රාජ මඩ්ගල ද විවාහ මඩ්ගල ද එකක් වැ වී.

ඔහුගෙ මඟුලට ආ දනවිනුවරවැසියො සත්හවුරුද්දක් සැණකෙළි කෙළියහ, ඔවිනට මාලාගන්ධවිලෙපන ද වස්ත්‍රාභරණ භොජන ද රාජකුලයෙන් ම පැවැත්ත. ඔහු සප්තසංවත්සරා-වසානයෙහි "මහරජ. මෙ මඩ්ගල කවරකාලයෙහි පරිසමාප්ත වෙ?"යි පියරජහු පුළුවුත්හ. එකල්හි රජ "මපිත් පූර්වයෙහි සිනා නො කළ විරියැ. යම් දවසක් හෙ සිනා දැක්වී ද එදවස් සමහර වෙ"යි කීය. එකල්හි මහාජනයො බෙර ලවා සකල ජම්බුද්වීපයෙහි නාටකයන් කැටි කැරැවූහ. සත්දහසක් නාටකයො සත්රැසක් වැ සිට නටා රජු නො සෙවිය හුණුහු. ඔහු පූර්වභවයෙහි දිව්‍ය නෘත්‍යයෙන් තෘප්ත වැ දෙවිරජ කෙළෙන් ඔවුන්ගෙ නෘත්‍යගීත හර්ෂනිමිත්ත නො වී.

එකල්හි "භාණ්ඩුකර්ණ" නම් "පාණ්ඩුකර්ණ" නම් නාටකයො දෙදෙනෙක් "ඇපි රදු සෙවම්හ"යි අවුදු වන්හු. ඔවුන් කෙරෙහි "භාණ්ඩුකර්ණ" නම් නාටක රාජාඩ්ගණයෙහි "අතුල" නම් මහත් ආම්‍රවෘක්ෂයක් නිර්මාණ කොට හූකෙළවර ගෙන සිට සූත්‍රගුලයක් දමාලා වෘක්ෂශාඛායෙහි ලග්න කොට සූත්‍රයෙන්

---

පියCDEF

අතුලාම්‍රයට ආරූඩ විය. "අතුලාම්‍ර" නම් වෛශ්‍රවණදෙව රාජයා[1] ගැන්තෙයි. වෘක්ෂරක්ෂාවෙහි අධිෂ්ඨිත යක්ෂරාක්ෂසයෝ ඔහුගෙ අඩහ ප්‍රත්‍යඩහ කඩකඩා බහාපිහ. සෙසු නාටකයන් ච කැටිකොටලා උදකාසෙක කළ කල්හි හෙ එක් පුෂ්පපටයක් හැඳ එක් පුෂ්පපටයක් පෙරෙව ගෙන නටමින් නැංග; මහාපණාද ච දැක සිනා නො කෙළෙ. "පාණ්ඩුකම්බී" නම් නාටක රාජාඩහණයෙහි දරුසෑ බඳවා තමා පිරිස් ගෙන ගිනි වැද ද, හසමභාවයට ගියෙ දිය ඉස නිවූ කල්හි සහපිරිවරින් පුෂ්පපට හැඳ පෙරෙව නටමින් නැංග; මහාපණාද ච ද දැක සිනා නො කෙළෙ.

මෙසෙ මනුෂ්‍යයන් ඔහු නො යෙවිය හී දුර්ලභ්‍රාප්ත යෙ බලා ශක්‍රදෙවරාජ එක් දිව්‍ය නාටකයක්හු එවීය. හෙ සහපිරිවරින් අවුදු රාජාඩහණයෙහි ආකාශස්ථ වැ සිට "අඩීරඩහ" නම් නැටුමක්[2] දැක්වීය. ච දැක මහාපණාද මඳසිනාවක් කෙළෙ. මහාජනයෝ චූකළ සිරාජාඩහණයෙහි වැමිහ ගියහ. එකල මහාපණාදයාගෙ මඩහල පරිසමාප්ත වී.

මොවිහට මෙ පහය කවරනම් පුණ්‍යකර්මයෙකින් නිපන්නෙයැ? යත්:

පූර්වයෙහි නළකාර පුත්පියදෙදෙනෙක්[3] කුලුවියන පත්තට වල් ගියාහු වවලැ වැඩහුන් පසෙබුදුකෙනකුන් දැක දුඹුල්පා හිඳුවා හුණපත්තෙන් පන්සලක් කොට පසෙබුදුන් ඇතවසැ වහි වස්වා දන් දී යන කලැ සිවුරු දී මෙ නියායෙන් සත් ඇතවසෙක්හි සත්පසෙබුදුකෙනකුන් වහි වැස්වූහ. පැසුට ච පිනින් ඔවුන් තව්තිසා දෙව්ලොවර උපද සදෙව්ලෙවිහි අනුලෝම ප්‍රතිලෝමයෙන් දිව්‍ය සම්පත් අනුභව කෙරෙමින් ඇවිදුනාකල්හි ඔවුන් කෙරෙන් එකක්හු ශක්‍රදෙවරාජ පණාදයාගෙ අග්‍රමහිෂී සුමෙධා දෙවිය කෙරෙ ප්‍රසාදයෙන් ඇය දරු ව උපදනට ආරාධනා ගෙන ආය. හෙ "මහාපණාද" නම් වැ පස්විසියොදුන් රුවන්පහයැ

---

[1] රාජයාගෙACD [2] නැටමක්B [3] පුත්පියකෙනෙක්CD

වැස අයඩ්ඛ්‍යයක් හවුරුදු රජ කොට දිව්‍යලොකයට ගොස් අප බුදුන් උපන්කල්හි "සබ්බී සම්පත් බොහෝ වැළඳුමිහ නිබ්බාණසම්පත් හා වැළඳුව මනාමිහ" යි මිනිස්පියෙහි උපදා රාත් විය - අනික් දිව්‍යපුත්‍ර වෙස මැ සිට දිව්‍යසම්පත් වළඳමින් ගොස් මත්තෙ මෛත්‍රෙයනාථයන් දවසැ "සඞ්ඛ" නම් චක්‍ර වර්ත්තියක් වැ නිබ්බාණපුර ප්‍රවිෂ්ට වෙ.

(41) මහාසුදස්සනසුත්තෙ යන වාක්‍යයෙහි දක්වනලද මහාසුදර්ශන නම් රජහට වනාහි දඹදිව්තලයෙහි සුවාසූදහසක් නුවරපිරිවරනලද "කුසාවතීරාජධානි" නම් නුවරෙක් විය. ඒ නුවර පූර්ව්වද්වාරයෙන් පශ්චිමද්වාර දක්වා දිග දෙලොස්යොදුන් විය. උත්තරද්වාරයෙන් දක්ෂිණද්වාර දක්වා පළල යත්යොදුන් විය. දෙවියන්ගෙ "ආළකමන්දා" නම් රාජධානිය සෙයින් අභිරම්‍ය විය. ධනධාන්‍යයෙන් සමෘද්ධ විය. හිරණ්‍යසුවර්ණයෙන් ස්ඵීත විය. සුඛිත මුදිත මනුෂ්‍යයන් විසින් ආකීර්ණ විය. දශවිධ ශබ්දයෙන් එකනිනාද විය.

එනුවර පොළොව පැළී නැඟි රුවන්මුවා සත්ප්‍රාකාරයෙකින් පරික්ෂිප්ත විය; එහි එක් ප්‍රාකාරයෙක් සුවර්ණමයයැ, එක් ප්‍රාකාරයෙක් රජතමයයැ, එක් ප්‍රාකාරයෙක් වෛදූර්‍යමාණික්‍යමයයැ, එක් ප්‍රාකාරයෙක් ස්ඵටික මාණික්‍යමයයැ, එක් ප්‍රකාරයෙක් පද්මරාග මාණික්‍යමයයැ, එක් ප්‍රාකාරයෙක් මරකතමණිමයයැ, එක් ප්‍රාකාරයෙක් සප්තරත්නමයයි. සප්තරත්නමය ප්‍රාකාරයෙහි එක් උවයෙක් සුවර්ණමයයැ, එක් උවයෙක් රජතමයයැ, එක් උවයෙක් වෛදූර්‍යමණිමයයැ, එක් උවයෙක් ස්ඵටික මණිමයයැ, එක් උවයෙක් පද්මරාගමණිමයයැ, එක් උවයෙක් මරකතමණිමයයැ, එක් උවයෙක් සප්තරත්නමයයි.

එ නුවරෙහි පොළොව පැළී නැහි සතරවණී ඇති රුවන්මුවා දෙරටුපඬක්කි විය; එහි එක් දෙරටුයෙක් ඝණීමයයැ, එක් දෙරටුයෙක් රජතමයයැ, එක් දෙරටුයෙක් වෙදූර්‍ය්‍ය මණීමයයැ, එක් දෙරටුයෙක් ඵටිකමණිමයයි. එකෙකි දෙරටු වෙහි වට පසළොස්රියන් උස සැටරියන් රුවන්මුවා සත් සත් එෂිකාසනමය වී. සැටහත් පවුරු අතුරෙහි පොළොව පැළී නැහි රුවන්මුවා සත් සත් තාලපඬක්කි විය. එහි ඝණීමය තල් ගස ඝණීමය සකඬ විය; පත්‍රඳ ඵලඳ රජතමය වී. රජතමය තල්ගස රජතමය සකඬ විය; පත්‍රඵල ඝණීමය වී. වෙදූර්‍ය්‍ය මණිමය තල්ගස වෙදූර්‍ය්‍යමණිමය සකඬ විය; පත්‍රඵල ඵටික මණිමය වී. ඵටික මණිමය තල්ගස ඵටිකමණිමය සකඬ විය; පත්‍රඵල වෙදූර්‍ය්‍යමණීමය වී. පද්මරාගමණීමය තල්ගස පද්මරාගමණීමය සකඬ විය; පත්‍රඵල මරකතමණීමය වී. මරකතමණීමය තල්ගස මරකතමණිමය සකඬ විය; පත්‍රඵල පද්මරාගමණිමය වී. සවීරත්නමය තල්ගස එක් පවීයෙක් ඝණීමයයැ, එක් පවීයෙක් රජතමයයැ, එක් පවීයෙක් වෙදූර්‍ය්‍ය මණීමයයැ, එක්පවීයෙක් ඵටිකමණිමයයැ, එක් පවීයෙක් පද්මරාග මණිමයයැ, එක් පවීයෙක් මරකතමණිමයයැ, එක් පවීයෙක් සවී රත්නමයයි. එ තාලපඬක්කීන් වාතයෙන් වලිතවූ කල්හි දිව්‍ය ගඬවීයන් විසින් වයනලද පඤ්චාඩඹික තූර්‍ය්‍යරව යෙයින් ඇසෙයි. [1]දෙව රදු සිට අසාත් නො දිගිය හැක්ක.

එසින් වදාළහ මහසුදසුන්සුත් දෙසන බුදුහු:-

405. "සෙය්‍යථාපි ආනන්ද පඤ්චඩ්ගිකස්ස තූරියස්ස සුවීනිතස්ස සුපට්පතාළිතස්ස කුසලෙහි සුසම්පාහතස්ස සද්දෝ හොති වග්ගූ ච රජනීයෝ ච කමනීයෝ ච මදනීයෝ ච. එව මෙව ඛෝ ආනන්ද තාසං තාලපන්තීනං වාතෙරිතානං සද්දෝ අහොසි වග්ගූ ච රජනීයෝ ච කමනීයෝ ච මදනීයෝ ච"සි.

---

[1]දෙවිරදු සිටCD [1]දෙවිරදුසිට අසත් නොහියAF ගතස්ස

එනුවර ධූර්තයෝ හස්තවාර පදවාර ග්‍රහණකොට තලින්තලට[1] නටා කෙළිත්. එ තාලපඩක්තීන් අතුරෙහි සියක් සියක් දුනු පමණ තන්හි පොළොව පැළී නැඟි රුවන්මුවා සුවාසූ දහසක් පොකුණු වී.

එ පුෂ්කරිණියැ? සතරවණී උළුවිය; එහි එක් උළුයෙක් ස්වර්ණමයයැ, එක් උළුයෙක් රජතමයයැ, එක් උළුයෙක් වෛදූර්‍ය්‍ය මණිමයයැ, එක් උළුයෙක් ස්ඵටිකමණිමයයි. එ සෙයින් මැ සතරවණී පියගැටපෙළින් දිලියෙන සතර සතර තොට විය; එහි එක් පියගැටෙක් ස්වර්ණමය විය, එක් පියගැටෙක් රජතමය විය, එක් පියගැටෙක් වෛදූර්‍ය්‍ය මණිමය විය, එක් පියගැටෙක් ස්ඵටිකමණිමය විය; පියගැටවෙහෙලි සර්වරත්නමය වී. එ පුෂ්කරිණියැ ස්වර්ණමය රජතමය වෙදිකාවලය විය; එහි එක් වෙදිකායෙක් පුෂ්කරිණිය වටා විය, එක් වෙදිකායෙක් පුෂ්කරිණිය වැලිපිරිසෙ වටා වී. මෙසෙ සර්වරත්නයෙන් සජ්ජිත වූ ප්‍රසන්න මධුරොදකයෙන් සම්පූර්ණ වූ පුෂ්කරිණියැ සර්ව ඍතුයෙහි පුප්නා කමලකුමුදෙත්පලකුවලයාදි විවිධ විචිත්‍ර පුෂ්ප වී.

එකල්හි එරජ කුසාවති නුවර බෙරපියවි කැරවිය; එයින් උපගත ජනයන් රජුගෙ පරිජනයො සමහරහු ස්නාන කරවති; සමහරහු ගඳවිලවුන් ගන්වති; සමහරහු මල් පළඳවති; සමහරහු වස්ත්‍රාභරණයෙන් සදති; සමහරහු අන්නපානයෙන් සන්තෘප්ත කෙරෙති; සමහරහු යහන් සලසති; සමහරහු ස්ත්‍රීන් සදා එළවති; සමහරහු හස්ත්‍යශ්වරට සදා එළවත්.

මෙසෙ මහාජනයො මහාසුදර්ශනයාගෙ රුවන්මුවා පුෂ්කරිණියැ නහා කැමැති පුෂ්පයක් පැළඳ කැමැති ගන්ධයෙකින් විලිප්ත වැ කැමැති වස්ත්‍රයක් හැඳැ කැමැති ආභරණයෙකින්

---

[1] තල්තලට ACF

විභූෂිත වැ කැමැති භෝජනයක් වළඳ කැමැති පානයක් බී කැමැති යහනෙක හෙව කැමැති ස්ත්‍රියක හා කෙළ කැමැති වාහනයකට නැඟී තමන් තමන්ගෙ ගෙට යෙත්. ඔහු හන් පිළී පළන් පළඳනා හොත් යහන් රහස්කෙළියට පත් ස්ත්‍රීන් තමන්ගෙ ගෙහි ඇත තබා යෙති, නැත ගෙන යෙත්. හස්ත්‍යශ්වරථශිවිකා ද නැඟී කෙළ ඇවිද තමන් ගෙ ඇත තබා යෙති, නැත ගෙන යෙත්.

එකල්හි මහාසුදර්ශනයහට කුසාවතී නුවර පොළෝ පැළී නැඟි රුවන්මුවා සුවාසූදහසක් පහා පිරිවර ලද "ධර්මප්‍රාසාද" නම් පහයෙක් වී.

එපහයැ දිග යොදුන් විය. පළල අඩියොජන විය. එපහයැ පූර්වොක්ත ක්‍රමයෙන් ස්වර්ණ රජත වෛදූර්‍ය්‍ය ස්ඵටික මණිමය උළු විය. එසෙයින් මැ රුවන්මුවා සඟළ වළලු කිසවට විය. සුවාසූදහසක් රුවන්ටැඹ විය. සූවිසිරුවන්හිණෙක් විය. ස්වර්ණ රජතවෛදූර්‍ය්‍ය ස්ඵටිකමණිමය සුවාසූදහසක් කූටාගාර විය. එ කූටාගාරයෙහි ස්වර්ණමය රජතමය දන්තමය රක්තචන්දනමය සුවාසූදහසක් පර්‍ය්‍යඞ්ක විය. එකෙකි කූටාගාරද්වාරයෙහි එකෙකි තල්ගස් බැවින්[1] පූර්වොක්ත ප්‍රකාර ඇති සුවාසූදහසක් රුවන්තල් විය. එ තල් චලමාරුතයෙන්[2] කම්පිත වූ කල්හි දිව්‍යනාටකයන් විසින් වයනලද මාදඞ්ගධ්වනි සෙයින් ඇසෙයි; එයට ද් මත් වළහු[3] නටා කෙළිත්.

එහි "මහාබ්‍යුහ" නම් රජතමය කූටාගාරද්වාරයෙහි සර්වස්වර්ණමය තාලවනයෙක් විය. එනරදෙවි එහි දිවාවිහාර කෙරෙයි. එපහය වටා ස්වර්ණමය රජතමය වෙදිකාවලය විය; ස්වර්ණමය රජතමය කිඞ්කිණික ජාල වී. එහි ස්වර්ණමය කිඞ්කිණික ජාල යෙහි රිදී රසු විය. රජතමය කිඞ්කිණිකජාලයෙහි රන්රසු විය. එ ජාලයන් අනිලයෙන් චලිත කල්හි දිව්‍යකින්නරයන් විසින් වයන

---

[1] බැගින් D [2] එතල්හි පතළමාරුතයෙන් CDE [3] මත්ව උහු A

ලද වීණාරව සෙයින් ඇසෙයි; එයට ද ලලිතජනයො නටති. එ පහා රත්නරශ්මි කදම්බයෙන් වොරජමින් බලනුවන් නුවන් හකුළුවමින් නභොමධ්‍යගත සූර්‍ය්‍ය සෙයින් දිලියෙ.

එ පහාදොර "ධර්මපුෂ්කරිණී" නම් පොකුණෙක් විය. එ පුෂ්කරිණිය දිග යොදුන් විය; පළල අඩියොජන වී. එ පුෂ්කරිණියෙහි පූර්වොක්ත ක්‍රමයෙන් ස්වර්ණ රජතවෛදූර්‍ය්‍ය ස්ඵටික මණිමය උළු විය. එසෙයින් මැ රුවන්මුවා පියගැට හා පියගැට වෙහෙලි ඇති සුවිසි තොටෙක් වී. එහි ස්වර්ණමය රජතමය වෙදිකා වලය විය. එ පුෂ්කරිණිය වටා පූර්වොක්ත ප්‍රකාර ඇති සප්තතාල පඩක්තියෙක් වී. එහි තල් වලවාතයෙන් විලුළිත වූ කල්හි දිව්‍ය සඞ්ගීතනිර්ක්‍රෝෂ සෙයින් ඇසෙයි; එයට ද භූජඩ්ග ජනයො නටා කෙළිත්.

මෙ සම්පත් මහාසුදර්ශනයහට කවර නම් පුණ්‍යකර්මයෙකින් නිපන්නෙයැ යත්? පූර්වජන්මයෙහි ඔහු ගැහැවියෙක් වැ වල වසන පසිලි කෙනකුන් දැක ඔවිනට පන්සලක් කොට දී ඒ වටා වැටක් කොට වැටින් ඇතුළත තල්ගස්බුදක් එව දී සක්මනක් බැඳ දී පොකුණක් කැණ දී එයිදු වටා තල්ගස්බුදක් එව දුන් පින්කමින් නිපන්නෙයි.

මෙසෙ මහාසුදර්ශනයහට කුසාවතීරාජධානිප්‍රමුඛ සුවාසූ දහසක් නුවර විය; ධර්මප්‍රාසාදප්‍රමුඛ සුවාසූදහසක් පහා විය; මහාබ්‍යූහකූටාගාරප්‍රමුඛ සුවාසූදහසක් කූටාගාර විය; විචිත්‍ර දිව්‍ය වස්ත්‍රයෙන් විභූෂිත වූ සුවාසූදහසක් පර්‍ය්‍යඩ්ක විය. පොෂට්[1] හස්ති රත්නප්‍රමුඛ රත්නාභරණයෙන් අලඩ්කෘත වූ සුවාසූදහසක් ඇත්හු වූහ. වලාහකඅශ්වරත්නප්‍රමුඛ සර්වරත්නමය අශ්වාලඩ්කාර යෙන් දිලියෙන සුවාසූදහසක් අස්හු වූහ. වෛජයන්තරට්

---

[1] උපොසට් ABCEF

ප්‍රමුඛ රත්නාලඞ්කාරයෙන් දිලියෙන සුවාසූදහසක් රථ විය. මණි රත්නප්‍රමුඛ ප්‍රභාභාසුර සුවාසූදහසක් මිණි විය. ධර්මපුෂ්කරිණී ප්‍රමුඛ ස්ඵටික මණිසදෘශ උදක ඇති සුවාසූදහසක් පුෂ්කරිණී විය. සුභද්‍රාදෙවි ප්‍රමුඛ දිව්‍යාප්සරාසමාන සුවාසූදහසක් මෙහෙස්නා වූහ. ගෘහපතිරත්නප්‍රමුඛ අපරිමිතධන ඇති සුවාසූදහසක් සිටුහු වූහ. පරිණායකරත්නප්‍රමුඛ සුවිනීත වූ සුවාසූදහසක් පෙදෙසි රජහු වූහ. සෑළ පිරෙනතාක් වැහෙන ඕරි ඇති "සුරභි" නම් දිව්‍යධෙනුව බඳු වූ සුවාසූදහසක් ඉදන්හු වූහ. ක්ෂෝම කොහෙයාදි විචිත්‍ර වස්ත්‍රයෙන් පරිපූර්ණ වූ සුවාසූදහසක් වස්ත්‍රකොටි විය. එක් සෑළෙක්හි දසදෙනක්හට බත්පැසෙන සැළින් පෙරවරු පිස නහන සෑළ සුවාසූදහසෙක් විය. පස්වරු පිස නහන සෑළ සුවාසූ දහසෙක් වී.

මෙහි සුවාසූදහසක් නුවර හා සුවාසූදහසක් පහා හා සුවාසූ දහසක් කූටාගාර ද එකපන්සලෑ පින්කමින් නිපන්නෙයෑ. සුවාසූදහසක් පර්‍යඞ්ක හෝනට දුන් හැඳ පින්කමින්[1] නිපන්නෙයෑ. සුවාසූදහසක් ඇත්හුදු සුවාසූදහසක් අස්හුදු සුවාසූදහසක් රථ දහිඳිනට දුන් පුටුයෙහි පින්කමින් නිපන්නාහ. සුවාසූදහසක් මිණි එකපහනෙක්හි පින්කමින් නිපන්නෙයෑ. සුවාසූදහසක් පුෂ්කරිණී එක පොකුණක් කොට දුන් පින්කමින් නිපන්නෙයෑ. සුවාසූදහසක් මෙහෙස්නා ද සුවාසූදහසක් පුත්හු ද සුවාසූදහසක් සිටුහු ද පැන්බදුන් පා තලු කුඹු පෙරහන් හිඳිකටු කතුරු නියයෑත් කෙසි මලහරණී පත්ලේ ගහනඵට වහන් සත් කතුරු යට දුන් පින්කමින් නිපන්නාහ. සුවාසූදහසක් දෙන්හු පස්ගොරස දුන් පින්කමින් නිපන්නාහ. සුවාසූදහසක් වස්ත්‍රකොටි හදනා පොරොනා දෑ දුන් පින්කමින් නිපන්නෙයෑ. සුවාසූදහසක් බත්සෑළ හොජන දුන් පින්කමින් නිපන්නෙයි.

---

[1] පිනින්B

මෙ මහාසුදර්ශන සුවාසූදහසක් හවුරුදු කුමාරක්‍රීඩා කෙළැ සුවාසූදහසක් හවුරුදු යුවරාජක්‍රීඩා කෙළැ ඉක්බිති චක්‍රවර්ත්ති පදප්‍රාප්ත වැ අනෙකවර්ෂශතසහස්‍රයෙහි සතරමහා ද්වීපයෙහි එක් රජ කොට කොට සුවාසූදහසක් හවුරුදු ධර්ම ප්‍රාසාදයෙහි මහණුවම් කොට අපරිහීණධ්‍යාන වැ බ්‍රහ්මලොකොප ගත වී.

---

(42). තුසිතපුරතො චවිත්වා යනු පඤ්චපූර්වනිමිත්තයෙන් උත්තර ගෙන කීහු; මෙහි පඤ්චපූර්වනිමිත්ත නම් කවර යත්? හෙ චුත වැ යන දෙවියනට මනුෂ්‍යගණනායෙන් සත්දවසක් ඇති කලැ ප්‍රාදුර්භූත වෙ. කිසෙයැ? යත්: මල් මලයි; පිළි කිලුටු වෙයි; කක්ෂයෙන් ස්වෙද සිලියෙයි; ශරීරයෙහි දුර්ගන්ධ ඇති වෙයි; දෙවාසනයෙහි ශයනාසන නො කටහෙත්.

එහි මල් නම් උපන්දවස් පළන් මලැ; හෙ සත්පනස් කෙළ සැටලක්ෂයක් හවුරුදු නො මලා සිට එදවස් මලයි[1]. පිළිදු එසෙමැයි. එතාක් කල් දෙවියනට නො ද උෂ්ණයැ, නො ද ශීතයැ, එකල්හි ශරීරයෙන් බින්දු බින්දු වැ ස්වෙදජල වැහෙයි. එතාක්කල් ඔවුන්ගෙ ශරීරයෙහි විවර්ණතා නොපැනෙයි; දිව්‍ය කන්‍යාවො සොළොස්හැවිරිද්දන් සෙයින් දිව්‍යපුත්‍රයො විසිහැවිරිද්දන් සෙයින් පැනෙති. මරණකාලයෙහි වූ කල ඔවුනට ක්ලාන්ත ස්වභාව ආත්මභාව වෙයි. එතාක්කල් ඔවුනට දිව්‍ය ලොකයෙහි උත්කණ්ඨා නම් නැති. මරණකාලයෙහි වූ කල නිඃශ්වාස විහිදුති[2]; විජෘම්භිත වෙති; ස්වකීය ආසනයෙහි අභිරමණය නො කෙරෙත්.

---

[1] මලායෙයි F [2] විහිදිති B

මෙ පඤ්චපූර්වනිමිත්තයෝ යම්සෙ ලොකයෙහි මහත් පින් ඇති රාජරාජමහාමාත්‍යාදීනට මැ උල්කාපාත භූමිචාල චන්ද්‍ර ග්‍රහාදි නිමිත්තයෝ පෑනෙද්ද, හැමදෙනහට නොපෑනෙද්ද; එසෙයින් මැ මහගාක්‍යදෙවියනට මැ පෑනෙති, හැමදෙවියනට පෑනෙන්නාහු නො වෙති.

යම්සෙ මනුෂ්‍යයන් කෙරෙහි පූර්වනිමිත්තයන් නක්ෂත්‍ර පාඨකාදීහු මැ දනිද්ද; එසෙයින් මැ එ පූර්වනිමිත්තයන් හැම දෙවියෝ මැ දන්නාහු නො වෙති පණ්ඩිතදිව්‍යපුත්‍රයෝ මැ දනිත්.

එහි යම් දිව්‍යපුත්‍රකෙනෙක් මද පින්කමෙකින් උපන්නාහුද ඔහු පූර්වනිමිත්ත පෑනුණු[1] කල "කොහි උපදුම්හ හෝ ?" යි හිරු වෙති. යම් කෙනෙක් මහත් පින් ඇත්තාහු ද ඔහු "අප දුන් දන් රැකි සිල් කරනලද භාවනා අපරිමෙය වන බැවින් උපරි දිව්‍ය ලොකයෙහි මහත් සම්පත් අනුභව කරම්හ" යි නො බත්. මෙසෙසින් සැව යන දිව්‍යපුත්‍රයන් දැක දෙවියෝ තුන්වවන යෙකින් අනුමොදනා කෙරෙත්.

එයින් වදළහ:-

406. "යදා භික්ඛවෙ දෙවා දෙවකායා වවන ධම්මා හොති, පඤ්චස්ස පුබ්බනිමිත්තානි පාතුභවන්ති :- මාලානි මිලායන්ති, වත්ථානි කිලිස්සන්ති, කචෙජහි සෙදා මුච්චන්ති, කායෙ දුබ්බණ්‍ණියං ඔක්කමති, සකෙ දෙවා දෙවාසනෙ නාභිරමති. තමෙනං භික්ඛවෙ දෙවා "වවනධම්මා අයං දෙවපුත්තො'ති ඉති විදිත්වා තීහි වාචාහි අනුමොදන්ති:- ඉතො හෝ සුගතිං ගච්ඡ, සුගතිං ගන්ත්වා සුලද්ධලාභං ලභ, සුලද්ධලාභං ලභිත්වා සුපතිට්ඨිතො භවාහි" යි.

---

[1] පෙනුණු AD

මෙහි "සුගතිගමන" නම් මනුෂ්‍යලොකයෙහි උත්පත්තියැ, "සුලද්ධලාභ" නම් බුද්ධධර්මයෙහි ශ්‍රද්ධායැ, "සුප්‍රතිෂ්ඨිතභාව" නම් ශ්‍රද්ධායෙහි අවලතායි.

මෙයැ "පඤ්ච පූර්වනිමිත්ත" නම්.

---

(43). චාතුද්දීපගතජලධරමාලාසු වස්සමානාසු යනු පඤ්ච ප්‍රකාරවර්ෂාන්තරාය විරහිත වැ වස්නා කල්හියැ" යුසෙයි.

මෙහි පඤ්චප්‍රකාරවර්ෂාන්තරාය නම් කවර යත්?

වදාළෙ මැ නො:-

407. "පඤ්චිමෙ භික්ඛවෙ වස්සස්ස අන්තරායා යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමති. කතමෙ පඤ්ච? උපරි භික්ඛවෙ ආකාසෙ තෙජොධාතු කුප්පති,[1] තෙන උප්පන්නා මහාමෙඝා විගච්ඡන්ති[2]. අයං භික්ඛවෙ පඨමො වස්සස්ස අන්තරායො යං නෙමිත්තා න ජානන්ති, යත්ථ නෙමිත්තානං චක්ඛුං න කමති. පුන ච පරං භික්ඛවෙ ආකාසෙ[3] වායොධාතු කුප්පති, තෙන උප්පන්නා මෙඝා විගච්ඡන්ති. අයං භික්ඛවෙ දුතියො වස්සස්ස අන්තරායො - පෙ - පුන ච පරං භික්ඛවෙ රාහුඅසුරින්දෙ පාණිනා උදකං පටිච්ඡිත්වා මහා සමුද්දෙ ඡඩ්ඩෙති. අයං භික්ඛවෙ තතියො වස්සස්ස අන්තරායො. පුන ච පරං භික්ඛවෙ වස්සවලාහකා දෙවා පමත්තා හොන්ති. අයං භික්ඛවෙ චතුත්ථො වස්සස්ස අන්තරායො. පුන ච පරං භික්ඛවෙ මනුස්සා අධම්මිකා හොන්ති. අයං භික්ඛවෙ පඤ්චමො වස්සස්ස

---

[1] පකුප්පතිG [2] පටිවිගච්ඡන්තිG [3] උපරි ආකාසෙDEF

අන්තරායෝ යං නෙමිත්තා න ජානන්ති, යතෝ නෙමිත්තානං වක්‍කුං න කමති[1]. ඉමෙ ඛෝ භික්ඛවෙ පඤ්ච වස්සාසා අන්තරායා යං නෙමිත්තා න ජානන්ති යතෝ නෙමිත්තානං වක්‍කුං න කමති" යි.

මෙහි මනුෂ්‍යයන් අධර්‍මිෂ්ඨ වුව නො වස්නා පරිදි කියෙයෑ යත්?

යම් කලෙක්හි රජ්ජුරුවො අධර්‍මිෂ්ඨ වෙද්ද, රජුන් අධර්‍මිෂ්ඨ වූ කලෑ රාජපුරුෂයෝ අධර්‍මිෂ්ඨ වෙත්; රාජ පුරුෂයන් අධර්‍මිෂ්ඨ වූ කලෑ බ්‍රාහ්මණගෘහපතිහි අධර්‍මිෂ්ඨ වෙත්; බ්‍රාහ්මණ ගෘහපතීන් අධර්‍මිෂ්ඨ වූ කලෑ නිගමවාසීහුදු ජනපද වාසීහුදු අධර්‍මිෂ්ඨ වෙත්; නිගමජනපදවාසීන් අධර්‍මිෂ්ඨ වූ කලෑ විෂම වෑ චන්ද්‍රසූර්‍යයීයෝ ප්‍රවෘත්ත වෙත්; විෂම වෑ චන්ද්‍ර සූර්‍යයීයන් පවත්නා කලෑ විෂම වෑ නක්ෂත්‍රතාරකාරූපයෝ ප්‍රවෘත්ත වෙත්; විෂම වෑ නක්ෂත්‍රතාරකාරූපයන් ප්‍රවෘත්ත වූ කලෑ විෂම වෑ රාත්‍රින්දිවයෝ ප්‍රවර්‍තනය කෙරෙත්; විෂම වෑ රාත්‍රින්දිවයන් ප්‍රවර්‍තනය කළ කලෑ විෂම වෑ මාසාර්‍ධමාසයෝ පරිවර්‍තනය කෙරෙත්; විෂම වෑ මාසාර්‍ධමාසයන් පරිවර්‍තනය කළ කලෑ විෂම වෑ සෘතු සංවත්සරයෝ පරිවර්‍තනය කෙරෙත්. විෂම වෑ සෘතුසංවත්සරයන් පරිවර්‍තනය කළ කලෑ විෂමවෘත්ත හමයි; විෂම වෘත්ත හැමූ කලෑ දෙවතාවො ප්‍රකුපිත වෙත්; දෙවතාවන් ප්‍රකුපිතවූ කලෑ වර්‍ෂා සම්‍යක්ධාරායෙන් වර්‍ෂණය නො කෙරෙ; වර්‍ෂා සම්‍යග් ධාරායෙන් වර්‍ෂණය නො කළ කලෑ සස්‍යයෝ විෂමපාකී වෙති; සස්‍යයන් විෂමපාකී වූ කලෑ විෂමපාකී සස්‍යඵල පරිභෝග කරන මනුෂ්‍යයෝ අල්පායුෂ්ක[2] වෙති, දුර්‍වර්‍ණී වෙති, දුර්‍වර්‍ණ වෙති, බහ්වාබාධ වෙත්.

එයින් වදාළහ:-

408. "යස්මිං භික්ඛවෙ සමයෙ රාජානො අධම්මිකා හොන්ති" යනාදි.

---

[1] නක්‍කමතිABDEF [2] අල්පායුෂDEF

යම් කලෙක්හි රජහු ධම්මිටු[1] වෙද්ද, රජුන් ධම්මිටු වූ කලැ යථොක්ත ක්‍රමයෙන් රාජපුරුෂයෝ ද බ්‍රාහ්මණගෘහපතිකයෝද නිගමවාසී ජනපදවාසීහි ද ධර්මිෂ්ඨ වෙති; ඔවුන් ධර්මිෂ්ඨ වූ කලැ සම වැ චන්ද්‍ර සූර්‍යයෝ ප්‍රවෘත්ත වෙති; එසෙයින් මැ නක්ෂත්‍ර තාරකාරූපයෝ ද රාත්‍රින්දිවයෝ ද මා සාර්ධමාසයෝ ද සාතූ සංවත්සරයෝ ද සම වැ පරිවර්තනය කෙරෙති; එකල්හි විෂම වාත නො හමයි; දෙවියෝ ප්‍රකුපිත නො වෙති; සම්‍යග්ධාරා යෙන් වර්ෂා කෙරෙයි; සමපාකී සස්‍යයෝ වෙති; සමපාකී සස්‍ය ඵල අනුභව[2] කරන මනුෂ්‍යයෝ දීර්ඝායුෂ්ක වෙති, බලවත් වෙති, වර්ණවත් වෙති, නිරාබාධ වෙත්.

එයින් වදාළහ:-

409. "යස්මිං භික්ඛවෙ සමයෙ රාජානො ධම්මිකා හොන්ති" යනාදියි.

මෙයැ පඤ්චප්‍රකාරවර්ණනාරාය නම්

---

(44). බහූවිධලක්ඛණානුබ්‍යඤ්ජනපතිමණ්ඩිතදෙහො යන තන්හි "අනුබ්‍යඤ්ජන" ශබ්දය අර්ථතිඅනුව්‍යඤ්ජනයෙහි වැටෙයි. මෙයින් බැහැර "සූපං වා බ්‍යඤ්ජනං වා" යන තන්හි උපසෙචනයෙහි වැටෙයි. "උභතො බ්‍යඤ්ජනෙ" යන තන්හි ලිඞ්ගයෙහි වැටෙයි; "පදබ්‍යඤ්ජනානි සාධුකං උග්ගහෙත්වා" යන තන්හි වාක්‍ය විෂයෙහි වැටෙයි; "චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති නානුබ්‍යඤ්ජනග්ගාහී" යන තන්හි ශරීරාවයවයෙහි වැටෙයි; "දුන්නික්ඛිත්තස්ස භික්ඛවෙ පදබ්‍යඤ්ජනස්ස අත්ථොපි දුන්නයො හොති" යන තන්හි අක්ෂරයෙහි වැටෙ.

---

[1] ධම්මිෂ්ඨ BG [2] පරිභොග BG

(45). දිබ්බමයං පොක්ඛරණිං යන තන්හි ච පුෂ්කරිණිය දිව්‍යමය වූ පරිදි කිසෙයැ යත්?

පියරජ ඔවුන් සත්හැවිරිදි කල්හි "ළදරුවො කිනම් කෙළි රුස්වතී?" ඇමැතියන් පිළිවිසැ "දියකෙළි රුස්වති" යනු අසා පොකුණු කැරවියටි වැ යන් ගැන්විය. එකල්හි යක් දෙවිරජ "මහාපුරුෂයහට මානුෂකපරිභොග යුක්ත නොවෙයි, දිව්‍යපරිභොග යුක්තයැ" යි සිතා විශ්වකර්මයා ගෙන්වාගෙන "මහාපුරුෂයහට ක්‍රීඩාභූමියැ පුෂ්කරිණී නිර්මාණ කරා" යි යෙදී. ඔහු "කිබඳු කොට නිර්මාණ කෙරෙමි හොත්?"යි පුවවුත්තෙන් "රුවන්මුවා පවුරු දොරටු වුව මැනැවැ, මුතුමැණික් වැලි වුව මැනැවැ, මිණිමුවා පියගැට වෙහෙලි වුව මැනැවැ, පබළමුවා වෙහෙලිහිස් වුව මැනැවැ, රන්රිදිමිණිමුවා පියගැටපෙළ වුව මැනැවැ, පත්ලෙහි මඩ නැත මැනැවැ, පහන් සිහිදු දියෙන් පිරුණ මැනැවැ, එහි රන්රිදිමිණිපබළමුවා නැවී වුව මැනැවැ, රන්නැවැරිදිපලඟ වුව මැනැවැ, රිදිනැවැ රන්පලඟ වුව මැනැවැ, මිණිනැවැ පබළපලඟ වුව මැනැවැ, පබළනැවැ මිණිපලඟ වුව මැනැවැ. එක් පොකුණක් නිල්මහනෙල් වනයෙන් සැදුම්ලද මැනැවැ, එකක් හෙළනෙළුඹු වනයෙන් එකක් රත්නෙළුඹු වනයෙන් එකක් පස්පියුම් වනයෙන් සැදුම්ලද මැනැවැ" යි ඇණවී. එකල්හි විශ්වකර්මී "මැනැවැ මහරජ" යි යක්දෙවිරජහුගෙ හසුන් පිළිගෙන රාත්‍රිභාගයෙහි බැස රජු සලකුණු ගැන්වූ තැන්හි උක්තක්‍රමයෙන් පුෂ්කරිණී නිර්මාණ කෙළෙ.

එයින් වදාළහ:-

410. "මම සුදං භික්ඛවෙ පිතු නිවෙසනෙ පොක්ඛරණියො කාරිතා[1] හොන්ති. එකත්ථ සුදං භික්ඛවෙ උප්පලං පුඤ්ඤති, එකත්ථ පදුමං එකත්ථ පුණ්ඩරීකං යාවදෙව මමත්ථාය" යි.

---

[1]කාරාපිතා BCDEF

එහි මධ නැත පියුම් කෙසෙ පූප්පි යත්? විඤ්ඤකමී තත් තත් ස්ථානයෙහි රත්නදීපබළමිනිමුවා කුදුනැවී මවා එහි කලල් පිරෙනු කොට පස්පියුම් පුප්නා කොට ඉටී. මෙසෙ පස්පියුම්හු සුපුෂ්පිත වූහු. මෙසෙ විඤ්ඤකමීයා පස්පියුමෙන් සුසුත් සවීරත්නමය පුෂ්කරිණී නිමීණ කොට දෙවිලොව ගිය කල්හි පහතැ දුටු ජනයෝ ගොස් රජහට සැලකළහ. රජ මහාජනපරිවාරයෙන් ගොස් පුෂ්කරිණී දැක, පියුම්ගැබින් නැඟී දියපිට වැටීහෙන මුව රදෙරොන්සළා දැක, උපකූජිත භ්‍රමරගණයන් හා තුෂ්ටරවයෙන් ගුගුරන හංසවක්‍රවාකයන් බලා පුතණුවන්ගෙ පුණ්‍යයෙන් දිව්‍යයන් මැවූ බව දැන සතුටු වී. එතැන් පටන් ගෙන මහසත් සහපිරිවරින් ජල ක්‍රීඩා කෙළෙ.

(46). කප්පාසිකවාපගුණං යන තන්හි "ගුණ" ශබ්දය දුනු දියෙහි වැටෙයි. මෙයින් බැහැර "අහතානං වත්ථානං දිගුණං සඩ්ඝාටිං" යන තන්හි පටලයෙහි වැටෙයි. "අවෙච්චන්ති කාලාතරයන්ති රත්තියෝ වයොගුණා අනුපුබ්බං ජහන්ති" යන තන්හි රාශියැ වැටෙයි. "සතගුණා දක්ඛිණා පාටි කඩ්ඛා" යන තන්හි අනෘශංසයෙහි වැටෙයි. "අන්තං අන්තගුණං" යන තන්හි බන්ධනයෙහි වැටෙ.

---

(47). අවිඝාවිතතූණීරමුඛ[1] ධනුගුණගමනාගමනසරසන්ධාන මොක්ඛකරකලොා යනාදීන් දක්වනලද ශිල්පයෝ කෙසෙ නම් වෙද්ද යත්? ඔවුන් සංසාරභූමියැ සිටි කලැ ජෝතිපාල මණවී කල්හිද් අසදිසරජකුමර කල්හිද් දැක්වූ ශිල්ප බැලූ කලැ මෙ විසමයෙන් නොවෙයි.

---

[1] තූණීරමුඛABC

## කිසෙයෑ යත්?

එක් කලක් මහසත් ජෝතිපාල නම් බමුණුදරුවක්[1] ධනුශ්ශිල්පයෙහි මහකප්‍රාප්ත වැ දවසෑ දහසක් දෙන රජක්හට උපස්ථාන කොට වෙසෙයි. එරජ ඔහුගෙ ශිල්ප දැක්කැවී වැ නුවර බෙර පියවී කරවා තමාගෙ විජිතයෙහි දුනුවාවන්[2] සෑට දහසක් දෙනා ගෙන්වා ගෙන රාජාඩ්ගණයෙහි මණ්ඩප මැද සිංහාසනාරූඩ වැ මහපිරිස් පිරිවරා හිඳ "ජෝතිපාලයා එනු කරා" යි කියෑ. මහසත් දිසාපාමොක්ඇජරා තමා කෙරෙහි පැහැදි දුන් සන්නියුක්ත පඤ්චායුධාදීන් හිඟ කබා ගෙන පියවී වෙසින් ගොස් වැඳ සිට "තාගෙ ශිල්ප බලමිහ" යි කීයෙන් "මැනැවැ මහරජ" යි රාජාඩ්ගණයෙහි කඩතුරාවක් බඳවාලා ඇතුළත සිට මත්තෙ හන් සළුව හැර එක් රත්පටක් හැඳ එක් රත්පටක් උරෙහි බැඳ නඩුව වම්දසරියෙහි බැඳ හියොවුර දකුණුදසරියෙහි බැඳ සන්නාහ කය්ස පෙරව ගෙන උෂ්ණීෂපට්ටය මකුටයක් සෙ හිස ගන්වාලා සන්නි යුක්ත වූ මැඩහඳු දුන්නෙහි පඬුවන් දිය නහා විදුරු අග් නාරාචය නිය අග බමවමින් කඩතුරාව පළාපියා පොළොව පළාපියා නැඟි අලඬකෘත මණිවිවක්හු සෙයින් නික්ම ගත් රණ වෙසින් මැ මහ පිරිස් හුගුරුවමින් සිට "මහරජ, තොපගෙ දුනුවාවන් කෙරෙහි අක්ෂණවෙධී වූ වාලවෙධී වූ ශබ්දවෙධී වූ ශරවෙධී වූ දුනුවාවන් සතරදෙනකු ගෙන්වව" යි ගෙන්වා ගෙන රාජාඩ්ගණයෙහි සතර සිරිමඩුල්ලක් කොට ගෙන සතර කනැ සතර දුනුවාවන් සිටුවා එකක් එකක්හට තිස්තිස්දහස් හී දෙවා එකක් එකක්හු කෙරෙහි හී ගෙන දෙන ශූරපුරුෂයන් සිටුවා තෙමෙ වජ්‍රාග්‍ර නාරාචය ගෙන මණ්ඩලමධ්‍යයෙහි සිට "මහරජ, මෙ සතර ධනුර්ධරයන් එකපැහැර හියෙන් මා විදුනෙ ය, මම් ඔවුන් විදි හී මා වෙර නො හියදී වලකම්" යි කීයෑ. එරජ දුනුවාවනට "එසෙ කරව" යි යෙදී ය. "මහරජ, ඇපි අක්ෂණවෙධී වාලවෙධී ශරවෙධී ශබ්දවෙධී මහායොධයම්හ, ජෝතිපාල දරු ළදරුය

---

[1] මණිවිදරුවක්වැ ACIE [2] දුනුවායන්ට

අපි බහු නො විදුමිහ" යි කිහ. එයද මහසත් "තොප නො විද්දහෙත් මිස විද්දහෙත් මා විදුව" යි කිය. "ඉතා මැනැවැ, තෙලෙසි බැවින් විදුමිහ" යි වෙග ඇති වැ දුනුවාවෝ වෙග දනවා එකපැහැර සතරදෙසෙන් ශරයන් වුහුටහ. මහසත් ඒ ශරයන් නාරාචයෙන් පැහැර පැහැර යම් තැනකට දමා නො පියා මහබෝ කොටුවක් කරන්නක්හු සෙයින් තලයෙන් තලුදු දැඩියෙන් පඩුදු පක්කඩින් පක්කඩ දැ දැත්තෙන් දැහිදු නො ඉක්මවා පැහැර බහ බහා ලන හීයෙන් ශරගහීයක් කළෙ. ධනුර්ධරයන්ගෙ ශරයෝ පරික්ෂයට ගියහ. මහසත් ඒ ශරයන් පිරිහී ගිය බවි දැන ශරගහීය නො නසා මැ පැන ගොස් රජු කෙරෙහි සිටියෙය. මහජනයෝ උන්නාද කරන්නාහු අපොළන්නාහු මහත් කොලාහල කෙට තමන් තමන්ගෙ වස්ත්‍රාභරණ මහසත්හට ඉසපිහ. මෙසෙ රැස්වූයෙ අටලොස්කෙළක් ධන විය. එක්බිති[1] රජු "මෙ කිනම් ශිල්පයකැ? පුතැ" යි පුළුවුත්තෙන් "මහරජ, මෙ "ශරප්‍රතිබාධන" නමැ" යි කියැ. "මෙ දන්නා සෙස්සො හා ඇද්දැ?" යි කියෙන් "මුළු දඹදිව මා මිස නැත මහරජ," යි කියැ.

"පුතැ අනෙකක් හා පාව" යි කියෙන් "මහරජ, මෙ සතර ධනුර්ධරයෝ සතරකනැ සිට එක්ලක්ෂවිසි දහසක් හීයෙන් මා නො විද්ද හුණහ. මම වූ කල මෙ සතරදෙනා සතරකනැ සිටියවුන් එක ශරයෙන්[2] විදිමි" යි කියැ. දුනුවාවෝ සිටිනට නො ලැබුණහ. මහසත් සතරකනැ සතරකෙහෙල්ගසක් හිඳුවාලා නාරාව දැත්තෙ රත්හුයක් බැඳ එක් කෙහෙල්ගසකට විද්ද. නාරාවය ඒ කෙහෙල්ගස විද දෙවනගස විද තුන්වනගස විද සතරවනගස විද නිමාමී වැ පළමු විදි ගස මැවිද වටාලා අත ම අවුදු තුබුයෙයැ. කෙහෙල්ගස්හු සූත්‍රයෙන් පරික්ෂිප්ත වැ සිටියාහුයැ. මහජනයෝ නාදසහස්‍රයන් පැවැත්වූහ, "පුතැ, මෙ කිනම් ශිල්පයකැ" යි රජු පුළුවුත්තෙන් "වක්‍රවෙධ නමැ මහරජ," යි කියැ. "පුතැ, අනෙකක් හා පාව" යි කියෙන් මහසත්

---

[1] ඉක්බිති A [2] හීයෙන් BG

පළමු දෙහියක් ලක විදැ තබා එහි පටන් ගෙන තමා සිටී තැන් දක්වා යටක් සෙ වට කොට දික් කොට "ශරයෂ්ට" නම් ශිලාසයක් දැක්වියැ. එසෙයින් මැ නොයෙක් වැලයෙන් වැටූ රැහැනක් සෙ "ශරරජ්ජු" නම් ශිලාසයක් දැක්වියැ. එසෙයින් මැ නොයෙක් දඟයෙන් ගැවසූ වෙණියක් සෙ "ශරවෙණී" නම් ශිලාසයක් දැක්විය. ආකාශයෙහි ශරයෙන් පහසක් කොට "ශරප්‍රාසාද" නම් ශිලාසයක් දැක්වියැ. ශරයෙන් මඩුවක් කොට "ශරමණ්ඩප" නම් ශිලාසයක් දැක්වියැ. ශරයෙන් හිණක් කොට "ශරසොපාන" නම් ශිලාසයක් දැක්වයැ. ශරයෙන් පවුරක් කොට "ශරප්‍රාකාර" නම් ශිලාසයක් දැක්වියැ. ශරයෙන් පොකුණක් කොට "ශරපුෂ්කරිණී" නම් ශිලාසයක් දැක්වියැ. ශරයෙන් පියුම් පුප්වා "ශරපද්ම" නම් ශිලාසයක් දැක්වියැ. ශරවැස්සක් වස්වා "ශරවර්ෂී" නම් ශිලාසයක් දැක්වියැ. මෙසෙ අනුන් හා අසාධාරණ වූ මෙ දෙලොස් ශිලාසයන් දක්වා චක්ඛිත්[1] අනුන් හා සාධාරණ වූ සපතමහා කායප්‍රදූලනා කෙළෙ.

අන්හු විදිනා කලැ අටඟුල්බොල් එක් දුඹුල්පුවරුවක්[2] විදිති; මෙ අටඟුල්බොල් සියක් දුඹුල්පුවරු[2] එක් කොට තබා විනිවිදුවා විද්ද. අන්හු සතරඟුල් බොල් එක් පියාපුවරුවක්[2] විදිති; මෙ සතරඟුල් බොල් සියක් පියාපුවරු[3] විද්ද. අන්හු දෙඅඟුල්බොල් එක් තඹපටක් විදිති[4]; මෙ දෙඅඟුල් බොල් සියක් තඹපට විද්ද. අන්හු එකඟුල්බොල් එක් යපටක් විදිති[4]; මෙ එකඟුල් බොල්සියක් යපට විද්ද. අන්හු පිදුරුගැල් වැලිගැල් පුවරුගැල් එකෙකිගැල් විදිති[4]; මෙ සියක් පිදුරුගැල් සියක් වැලිගැල් සියක් පුවරුගැල් පිළිවෙළින් තබා විනිවිදුවා[5] විද්ද. විදිනෙ[6] ද පූර්වභාගයෙන් විද පශ්චාද්භාගයෙන් නෙරපියයි. පශ්චාද්භාගයෙන් විද පූර්වභාගයෙන් නෙරපියයි. දියෙහි සතර ඉස්බක් තැන් විද්ද. ගොඩ අටඉස්බක් තැන් විද්ද, කරබටුපකැ සලකුණෙන් ඉස්බෙකින් මත්තෙහි බැඳ තුබූ වල් පලා විද්ද.

---

[1] චක්ඛිති A [2] පොරුවක් AC [3] පොරු AC
[4] විද්ති A [6] විද්නෙ A [5] විද්වා A

මෙවිහු මෙතෙක් ශිල්පයන් දක්වත් දක්වත් මැ සූයඹ අස්ත ඝත විය. එකල්හි රජ මහසත්හට පැහැද "පුතැ, අද නොවෙලා යැ, සෙට තට සෙනාපතිතන් දෙමි මස්වලු මෙහෙ නිමවානහා ව"යි එදා වියදමට ලක්ෂයක් දිනැ.. මහසත් එ මහජනා තමහට දුන් අටලොස්කෙළක් ධන හිමියනට මැ දෙවා මහපිරිවරින් ගොස් නහා පහයින් ගෙන සවිබරණින් සැදී මහත් යසසින් වොරජමින්[1] ප්‍රාසාදයට ආරූඪවී.

ඔවුන් අසදිස රජකුමර කල්හි ශිල්ප දැක්වූ පරිදි
කිසෙසැ යත්?

එකල්හි මහසත් සවිශිල්පයෙහි නිෂ්පත්ති ප්‍රාප්ත වැ තමහට පත් රජය මල්හට දී ධනුඨරවෙෂයෙන් ගොස් අනෙක් රජක්හට උපස්ථාන කොට වෙසෙයි. එරජ එක් දවසක් උයන් ගොස් මඟුල්සලවට වෙත අඹමළියෙක්හි යහන්මත්තෙ හෙව උඩු බල නුයෙ රුක් අග එක් අඹකැනක් දැක නැඟී බහා ගනුත් නොපිළි වනින් දුනුවාවන් කැඳවාගෙන "මෙ අඹකැන හීයෙන් කපා හෙළන්නට හැකියවි දැ ?"යි කීයැ . එසඳ දුනුවාවො "මහරජ, මෙ අපට උගහටෙක් නොවෙයි, නොයෙක්වර අපගෙ දුනුකම් දුටුවිරි බැවින් හවුරුද්දෙන් ලක්ෂ ලබන දැන් ආ දුනුවාවා ලවා විදුවා ගන්නෙය"යි කීහ. එකල්හි රජ මහසත්හු කැඳවා ගෙන "පුතැ, මෙ අඹකැන හීයෙන් කපා හෙළන්නට හැක්කෙහිදැ"යි[2] පිළිවිත. "මැනැවැ මහරජ, මෙ තොපගෙ යහන තුබූ තැන් ලදීමි නම් හැක්කෙමි"යි කීයැ. රජ "යහපතැ"යි යහන පහකරවා එතැන අවසර කොට දින්. මහසත් රණවෙස් ගෙන හීය විදිනට[3] නිසි තැනට ගොස් පැර හීය හිඳුවා ගෙන සිට "කියග මහරජ, මෙ අඹකැන නැඟෙන හීයෙන් විද හෙළමි ද? බස්නා හීයෙන්

---

[1] වොරොජමින්B [3] විත්නටB [2] නිස්සහුදැයිB

විද හෙළමි දැ?" යි පිළිවිත. "පුතැ, නැහෙන හියෙන් විද හෙළන දෑ බොහෝ දුටු විරිමි, බස්නා හියෙන් විද හෙළන දෑ නුදුටු විරිමි. එබැවින් බස්නා හියෙන් විද හෙළවනු කැමැත්තෙමි" යි කිය. "මහරජ, මෙ හිය ඉතා දුරු තැනට නැහෙයි, සවිමහරජය දක්වා ගොස් තෙමෙ මැ බස්සි. එ බස්නා තාක් තෙප වුහුව[1] මැනැවැ" යි කියැ. "ඉතා මැනැවැ" යි රජු ගිවිසි කල්හි "මහරජ, මෙ හිය නැහෙන්නෙ මෙ අඹකැන තුවටුව මැද දක්වා කපා[2] ගෙන නැහෙයි; බස්නෙ කෙසඟක් පමණ තැනට ද මොබින් හෝ ඔබින් හෝ නො ගොස් කැප්මෙහි ම හී අඹකැන කපා[2] ගෙන බස්සි" යි කියා "බලව මහරජ" යි වෙග ජනවා[3] හිය විද්ද. හිය අඹකැන තුවටුව මැද දක්වා කපා ගෙන නැඟී දෙසාළිස්දහසක් යොදුන් තැන් ගෙවා ගොස් සවිමහරජයට හියෙ. එකල්හි මහසත් "දැන් කළී හිය සවිමහරජයට හියෙය" යි දැන පළමු විදි හියට අධිකතර කොට වෙග දනවා අනික් හියක් විද්ද. එ හිය ගොස් පළමු විදි හියෙහි හිදැත්තෙහි පැහැර නවතා පියා තෙමෙ සුවාසූදහසක් යොදුන් තැන් ගෙවා ගොස් තවතිසා දෙවිලොවට නැංග. එ හිය දෙවියො දැක විසමිත වැ ගෙන පුදා කළහ. නවත්නා හිය සුළඟ නඩමින් බස්නා හඬ සෙණහඬ වැනි විය. මහජනා "හෙ කුමන හඬෙකැ" යි කියෙන් මහසත් "නවත්නා හියෙහි හඬය" යි කියැ. තමන් තමන් වෙර හිය හෙන බියෙන් වෙවුලන ජනයන් "නො බව නො බව, හිය බිම නො හිය දෙමි" යි අස්වැසී යැ. හිය බස්නෙ කෙසඟක් පමණ තැනට ද ඔබින් හෝ මොබින් හෝ නො ගොස් අවධියමැ හී අඹකැන කැපි ය. මහසත් අඹකැන ද හිය ද බිම නොහියදී අහස බලා එක් අතෙකින් අඹකැන ද එක් අතෙකින් හිය ද ගත්.

---

[1] වුහුට ADF [2] කඩා ACD [3] දනවා BL

මහජනයො ඒ විස්මය දැක විස්මිත වැ උන්නාද කොට අපොළා අසුරුසන් පොළා හිස් මතුයෙහි පිළි සිසාරා පැහැද කෙළක් පමණ ධන දුන්හ. රජ ද් ඝනවැස්සක් වස්වන්නාක්හු මෙන් ඔහට බොහො ධන දින. මහත් යසසුදු දින්.

මෙසෙ ඔවුන් ජොතිපාලමණෙවි කල්හිද් අසදිස රජ කුමර කල්හිද් ත්‍රිභුවන විස්මාපනීය වූ අනෙකවිධ ශිල්ප දක්වනුවන් දැන් පුන්පැරුම් වැ පශ්චිමභවයෙහි සිට දැක්වූ ධනුශ්ශිල්පයෙහි විශෙෂ කෙනම් කියනුවහ?

එයින් කීහ සඟිඅටුවායෙහි:-

"තං දිවසං පන මහාසත්තො ලොකෙ වත්තමානං සිප්පං සබ්බමෙව දස්සෙසි" යි.

---

(48). අලඞ්කරිත්වා නීතානං යනු "සැහැරජුන් විසින් මහ පුරිසා පිනින් නිපද පියදස්නෙන් ලෙවි නුවන්මන පොලඹමින් නඵගදෙවිහි[1] හික්මෙමින් පියෙහි මඟුල්පෙරහරින් පෙර ඩමස සඳ සෙයින් වැඩැ වියපත් වූ තමන් දූරුවනුන් වස්ත්‍රා හරණාදීන් අනඞ්ග පූජාවට සෙයින් සඳ දෙනලදුවන් මධ්‍යයෙහි"යයි සබඳකරනු.

---

(49). තීසු පාසාදෙසු යන තන්හි තුන්පහය වූ පරිදි කිසෙයැ යත්?

මහාපුරුෂයාගෙ රාජාභිෂෙකයෙන් පූර්වයෙහි මැ පිය රජහු විසින් හිමත්[2] ගිමන් වසත් තුන්සාතුවට තුන්පහයක් කරවන ලද.

---

[1] නඵගණෙහි AEF [2] හිමන්C

එහි හිමත්පහය[1] නවභූමක යැ, උෂ්ණඍතු පවත්නා සඳහා සම්බාධ කොට කරවනලද මහල්තල යැ, සුසඥ්ඡ ද්වාරවාතපාන යැ, නිර්වීවර යැ, චිත්‍රකර්මයෙහි තන්හි තන්හි ප්‍රජ්වලිත අග්නි ස්කන්ධ යැ, භූම්‍යාස්තරණ කම්බල යැ, විතානශයන ජවනිකා ද් නිවාසනප්‍රාවරණවෙෂ්ටන ද් කම්බලමැ යැ, ද්වාර වාතපානයෝ උෂ්ණඍතුග්‍රහණයට දිවාවිවෘත වෙති, ශීතඍතු ප්‍රතිබාධනයට රාත්‍රියැ පිහිත වෙත්.

හිමන්පහය පඤ්චභූමක යැ, ශීතඍතු පවත්නා සඳහා විශාල කොට කරවනලද මහල්තල යැ, අසඥ්ඡ ද්වාරවාත පාන යැ, සවීවර යැ, සජාල යැ, චිත්‍රකර්මයෙහි උත්පලපද්ම පුණ්ඩරීකවනයෙන් සැදුම්ලද විල්පිඹයැ, භූම්‍යාස්තරණ දුකුලයැ, විතානශයන ජවනිකා ද් නිවාසනප්‍රාවරණවෙෂ්ටන ද් දුකුලමැයැ, ද්වාරවාතපානයෝ උෂ්ණඍතුප්‍රතිබාධනයට දිවා පිහිත වෙති, ශීතඍතු ග්‍රහණයට රාත්‍රියැ විවෘත වෙත්. වාතපානසමීපයෙහි තබනලද උදකපරිපූර්ණ නවභාජනයෝ නීලෝත්පල කලාපාදීන් සඤ්ඡන්නයහ. ඇතුළුපහයැ තන්හි තන්හි කලල්සියෝ දිය පිරුණු දෙණ තබා රොපණ කළ පඬු පද්මයෝ විකශිත වැ ජනනයන ආකර්ෂණය කෙරෙති. තත්තත්ප්‍රදෙශයෙහි යොදන ලද ජලයන්ත්‍රයෙන් වර්ෂා සෙයින් උදකධාරාවෝ නිෂ්ක්‍රාන්ත වෙති. ප්‍රාසාදමස්තකයෙහි වියළි මීසම් වියන් බැඳ යන්ත්‍රයෙන් පාෂාණයන් තහා එහි විහිදිති. වර්ෂයෙහි පරිවර්තනය කරන පාෂාණයෝ මෙඝනාද ධ්වනි විහිදිමින්[2] ඇවිදිත්.

වසන්පහය සප්තභූමක යැ. ඍතුඋෂ්ණානුකූල නාති විශාල නාතිසම්බාධ මහල්තල යැ, ඇතම් ද්වාරවාතපානයෝ සුසඥ්ඡයහ, ඇතම් ද්වාරවාතපානයෝ අසඥ්ඡයහ. චිත්‍ර කර්මයෙහිදු ඇතම් තැන ප්‍රජ්වලිත අග්නිස්කන්ධ යැ, ඇතම් තැන

---

[1] හිමන්පහයC [2] විහිදුම්න්DE

පස්පියුමෙන් සුසන් විල්පියෙසැ, භූම්‍යාස්තරණාදීහු කම්බලදු කුල ද්වයෙන් ව්‍යති මිශ්‍රයහ, ඇතමි ද්වාර වාතපානකෙනෙක් රාත්‍රියැ විවෘත වෙති, දිවා පිහිත වෙති. ඇතම්හු දිවාවිවෘත වෙති, රාත්‍රියැ පිහිත වෙත්. තුන්ප්‍රාසාදයො මැ උසායෙන් සමයහ, බුමුයෙන් වෙන් වෙන්හු.[1]

එයින් වදාළහ:-

411. "තස්ස මය්හං භික්ඛවෙ තයො පාසාදා අහෙසුං:- එකො හෙමන්තිකො එකො ගිම්හිකො එකො වස්සිකො. සො ඛො අහං භික්ඛවෙ වස්සිකෙ පාසාදෙ වස්සිකෙ චත්තාරො මාසෙ නිප්පුරිසෙහි තූරියෙහි පරිචාරියමානො න හෙට්ඨා පාසාදං ඔරොහාමි" යි.

(50). "<u>වනභවනසුඛමනුභවන්තො</u> යන තන්හි ඔවුන් <u>වනභවන සුඛය</u> අනුභව කළ පරිදි කිසෙයැ යත්?

එදා[2] මහසත් සතලිස්දහසක් නළුවන් පිරිවරා සහතර තරු මැදෙක්හි පුන්සඳක් සෙයින් වොරජමින් - ඇතොවුරන් නුවන් මන වුලුඹුමින්[3] - සපුසඳුන්සල්වෙනෙහි බිඟුමුමන අසමින් - වෙහෙල්මියුල්කැල[4] කෙළියෙහි රැඳෙමින් මඳනෙලෙන් සසල පලුපත් මැ සුරත්අතින් නැටුම්ගත් ලියවමියන් නහමමින් - ධාරා ග්‍රාහයෙහි[5] මකරමුඛ විනිර්ගත නිර්ඣරඝොෂයෙන් පිලඹරන මත් මොනරගණා බලමින් - සහමල් සහපලු සහබමර සාමඩලෙන් සැදි තුරුපෙතට වදිමින් - මදමත්ගඳගජකොපොල්හි ගුම් ගත් බමරකැල ඇලළු හිමවිපවන්පහස් ලැබෙමින් - තන්හි තන්හි සපුසළලමළුලියගෙ සලවටහි සතප්මින් - නැටුම්ගඳෙවි විදුමින් - මියුරුසරයෙන් ගාන ලියගී අසමින් - ඇතොවුරන්[6]

---

[1] වුපු AF

[2] එහි G [3] පොලොඹමින් B [4] මිහිල්කැල ACEF

[5] ධාරාග්‍රයෙහි CEF [6] ඇතොරන් AEF

නුවන් මහනෙල්වහරෙයින් තම තුනුරුක්හි ලොමුදහඅකුරු සලවමින් – තමා යමනුවන්බිඟුන් නළුගණා වුවන්පියුම්වනයට විහිදුවමින් – හමන සුළඟ වහන මල්ගඳ උදහන මල්රොන් විසිරෙන මල්පත් ළිදිරෙන[1] ලියකොළ කිමිතිරෙන අකුරු මිහිකිරෙන කැකුළු විහිදුනා පලු ගජනා බමර නටනා මොනර කුල්නා පරපුටුන් විසින් සසිරි උයන්සිරි විදුමින් – වසත්නල පහස් ලද ගඳගජක්හු සෙයින් සොම්නස් වැ සඳුන්පලුයෙන් යුවළඇස් සඳ නන්විසිතුරු මුවරඳබර සුවඳකුසුමින් සැදී සරාසිරින් ළිදිරු වසත්සිරින් පුබුදු රන්ලියඉළකට වන් කාමෙශ්වරයා පරයමින් වනභවනයෙහි සුඛ අනුභව කෙළෙ.

---

(51). ජලධරදිවසායමානාය යන තන්හි එදවස් ඇතුන් විසින් එසෙනඟ වහරේදවසක් බඳු වී.

කිසෙයැ යත්?

ගජබඳ මැ නිල්මේකුළු වැනි විය, හිවිදළදළ මැ කොක්වැළ වැනි විය, ලෙළෙන[2] රන්දම් මැ විදුලිය වැනි වියැ, සත්රුවන් පොරොදු මැ දෙවිදුනු වැනි වියැ, ගජ ගොස් මැ මේගැජුම් වැනි වියැ, මමන මදපොද මැ වැසි දහරා වැනි වියැ, කන්තළනල මැ බමන වලානල වැනි වියැ. මෙසෙයින් සිවුරඟසෙනඟ ඇතුන් විසින් වහරේදවසක් බඳු වී.

(52). මහතා සිරිසමුදයෙන ගජ්ජන්තො යනු "තුර්‍ය්‍යරවයෙන් ගජිනා කරන බලමුහුදුමැදහි රුවන්සුනෙරක් සෙයින් හිවියෙ මදුරුමත්පහර ලැබ ගුගුළු කිරිමුහුදුගොසක් සෙයින් මුළුලො එක්ගොස් කැරැ දෙහොපස්හි නිල්දිගැස්පින්පියොවුරන්

---

[1] ළෙදිරෙනB [2] ලෙනAC

විදුනා සෙමරපවනසින් මිණිවොටුනු[1] මුතුලැල් ලළවමින් සඳරස් පහසින්[2] පුබුදු කුමුදුවනයක් සෙයින් පුරවමියන් මනකුමුදු පුබුදුවමින් වලානලපහසින් පුබුදු කොළඹවනයක් සෙයින් පුරකතුන් සියලඟහි ලොමුදහ ගන්වමින් නදුන්ද්‍රයන් කෙළැ දෙව්පිරිස් පිරිවරා සුදසුන් මහවෙයැ පත් සක්දෙවි රජහු සෙයින් පුරවේහි වජඹමින් යනුයෙයැ" යූසෙයි.

---

(53). <u>නිබ්බුතපදනිහිතගීතං සුත්වා</u> යන තන්හි නිර්වාතපද නිඃක්ෂිප්ත ගාථාව ඇසූ පරිදි කිසෙයැ යත්? ඇය සව්බරණින් සව්සැජ වැ දිවසරන් බඳු යෙහෙළිගණා මැද සුනිල්මිණිදැල් හයාලූ සිහිමැඳුරෙහි සිට තුරුණුරිව්මෙරජවතුළ සුපුල්පියුමක් බඳු වුවන්හි නවපුබුදුනිල්මහනෙල් යුවළසිරි ඉසුලූ දිගපුළුලු නුවනින් මහපුරිසා බලා ලොමුදෙහෙන් සියලඟ හපුස්වමින් සඳ හමු වැ පුබුදු කුමුදන් බඳු හාස යුත් දසන්මිණිමෙරජින් සඳවලා සුදුසු රතොට තවරමින් මියුරුසරයෙන් කියනු ඇසී.

---

(54). නව්වගීතවාදිතානි පයොජයිංසු යන තන්හි නැටුම් ගඳැව් පැවැති පරිදි කිසෙයැ යත්? හිරුහු අවරන්පත්කල්හි, කුමුදුවන පුබුදුවමින් අමාරස් වීරමින්[3] මුළුලෙව් කිරිමුහුදුහි ගලවමින්[4] මෙන් පුන්සඳ නැඟි කල්හි, අඩමුකුළු මලිගියමල් ගැබිහි තුඩු දී මත් බමරුන් හඬ නැඟුකල්හි මුහුළුපියුම් දැහැ වන් බමර ගණහට පුබුදු කුමුදිළින් මුවරදමුඩු[5] මිබිඳු මමන කල්හි සතලිස් දහසක් නාටිකාවො ශ්වෙතාඩ්ගරාග ගෙන ශුද්ධ ශ්වෙත වස්ත්‍ර මුක්තාභරණයෙන් විරචිත වැ සුගන්ධශුද්ධ කුසුම

---

[1] වුටුණුC [2] පහනින්ABCEF [3] විහිරමින්BG
[4] ගලමින්ACD [5] මුවරදුමුදුCDEF

දමයෙන් මුඩුමාල ලා මීසිඳුවරින් කියඹුලිය සදු ලතුඅතුල්[1] පතුල්තඹුරෙහි නූපුරරවයෙන් සුලභ වූ මෙවුල්ගිගුරුසියො මිණිවළලු රවවමින් ගොස් සුරවමියන් බඳු වරවමියො මියුරු රැව් ඇති පසඟතුරු ගෙන මහපුරිසා පිරවරා රමණය කරනුවො නෘත්‍යගීතවාදිත්‍රයන්[2] ප්‍රයොග කළො.

(55). <u>නිබ්බානාමතරසෙන</u> යන තන්හි නිශ්ශබ්දය නිෂ්ක්‍රාන්ත වූ වානය නිර්වාණ වන බැවින් නිෂ්ක්‍රමණයෙහි වැටෙයි. මෙයින් බැහැර "අභිනිප්ඵාදෙය්‍ය" යන තන්හි නිෂ්පාදනයෙහි වැටෙයි. "නිප්පිළෙය්‍ය" යන තන්හි පීඩායෙහි වැටෙයි. "නිග්ගණ්හෙය්‍ය සකං චිත්තං" යන තන්හි නිග්‍රහයෙහි වැටෙයි. "නීහරන්තො" යන තන්හි නිර්හරණයෙහි වැටෙ.

---

(56). <u>තිංසයොජනිකං මග්ගං ගන්ත්වා</u> යන තන්හි යොජනයෙක් නම් කිපමණෙක යත්? ෂට්ත්‍රිංශත් පරමාණුයෙක් එක් අණුයෙක් වෙයි, ෂට්ත්‍රිංශත්අණුයෙක් එක් තජ්ජාරිකායෙක් වෙයි. ෂට්ත්‍රිංශත් තජ්ජාරිකායෙක් එක් රථරෙනුයෙක් වෙයි, ෂට්ත්‍රිංශත් රථරෙණුයෙක් එක් ලික්ෂායෙක් වෙයි; සප්තලික්ෂායෙක් එක් යූකායෙක් වෙයි, සප්තයූකායෙක් එක් යවයෙක් වෙයි, සප්ත යවයෙක් එක් අඩ්ගුලයෙක් වෙයි, ද්වාදශාඩ්ගුලයෙක් එක් විතස්තියෙක් වෙයි, විතස්ති ද්වයෙක් එක් අරත්නියෙක්[3] වෙයි; සප්තාරත්නියෙක් එක් යෂ්ටියෙක් වෙයි, විංසතියෂ්ටියෙක් එක් උසභයෙක් වෙයි, අසීතිඋසභයෙක් එක් ක්‍රොශයෙක් වෙයි, ක්‍රොෂචතුෂ්ටයෙක්[4] එක් යොජනයෙක් වෙයි.

---

[1] අලුත්BCLG [2] වාදිකයන්ABCF
[3] රත්නිකායෙක්CDF [3] රතනිකාවෙක්BE [4] චතුෂ්කයෙක්A

(57). සත්තාහං පබ්බජ්ජාසුඛෙන වීතිනාමෙසි යන තන්හි

"වට මට සලළ දළ රුක්කඳ මැ සතම්භ වූ, සුනිල්දලසාමඩුලුමැ වියන් වූ, සුපිපි සපුමුහුළුමුරුතරුක් මැ රන්රිදීමිණිසත් වූ, සුදු සිනිඳු මොළොක් වැලිපිටු මැ සිංහාසන වූ, නලලොළ උක්මැලි[1] මැ වල්විදුනා වූ, පරපුටුරැවි මැ ලියහි වූ, බමර රැවි මැ වෙණහඬ වූ, සියුරුරැවි මැ මිහිඟුහඬ වූ, මල්දෙලෙන් ගැවසීගත් පොළොතල රහමඩලෙහි මදනෙලෙන් තනන මල්ලිය මැ පුරවම්යන් ගත් නැටුම් වූ, තන්හි තන්හි මොනර කිඳුරු[2] මුවමුළු මැ සිතියම් වූ, මත්ගජකැන් මැ යොධයන් ගත් අරක්ඇති වූ රාජභවනයක් බඳු අඹවනයෙහි ප්‍රව්‍රජ්‍යා සමාදානයෙන් උපන් ප්‍රීතිසුඛයෙන් දවස් යැවීය" යූසෙයි.

---

(58). අලඞ්කාරොවිය බ්‍රහ්මචරියස්ස යන තන්හි මහාපුරුෂ බ්‍රහ්ම වූ උත්තම වූ සම්‍යක් සම්බුද්ධ යන්ගෙ පර්‍යාප්ති ප්‍රතිපත්ති ස්වභාව වූ ලෞකික ශීලසමාධිප්‍රඥාලක්ෂණ ශාසනබ්‍රහ්මචර්‍යාවටද්, ප්‍රතිවෙධශාසනස්වභාව වූ මාර්ගඵලලක්ෂණ මාර්ගබ්‍රහ්මචර්‍යාවට ද් අලඞ්කාරයක් බඳු වී.

බ්‍රහ්මචරිය ශබ්දයෙන් වනාහි සකලශාසන ද් දාන ද් පරිචර්‍යා ද් ශික්ෂාපද ද් බ්‍රහ්මවිහාර ද් ධර්මදෙශනා ද් මෛථුන විරති ද් ස්වදාරසන්තොෂ ද් ආර්‍ය මාර්ග ද් අධ්‍යාශය ද් වීර්‍ය ද් කියනු ලැබේ.

කිසෙයැ යත්?

412. "තයිදං බ්‍රහ්මචරියං ඉද්ධඤ්චෙව වීතඤ්ච බාහුජඤ්ඤං පුථුභූතං යාව දෙවමනුස්සෙසු සුප්පකාසිතං" යන

---

[1] උක්මල්B [2] කිඳුරුBEF

මේ ප්‍රාසාදිකසූත්‍රයෙහි ශික්ෂාත්‍රයසඞ්ග්‍රහ සකලශාසන "බ්‍රහ්මචර්‍ය්‍ය"[1] යයි කියනලද.

413. "කින්තෙ වතං කිං පන බ්‍රහ්මචරියං
කිස්ස සුචිණ්ණස්ස අයං විපාකො
ඉද්ධි ජුතී බලවිරියූපපත්ති
අක්ඛාහි මෙ නාග මහාවිමානං

අහඤ්ච භරියා ච මනුස්සලොකෙ
සද්ධා උභො දානපතී අහුම්හ
ඔපානභූතං මෙ ඝරං තදාසි
සන්තප්පිතා සමණා බ්‍රාහ්මණා ච

තං මෙ වතං තං පන බ්‍රහ්මචරියං
තස්ස සුචිණ්ණස්ස අයං විපාකො
ඉද්ධි ජුතී බලවිරියූපපත්ති
ඉදඤ්ච මෙ චීර[2] මහාවිමානං"

යන මෙ පුණ්ණකජාතකයෙහි දානය "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියන ලද.

414. "කෙනපාණී කාමදදො කෙන පාණී මධුස්සවො
කෙන තෙ බ්‍රහ්මචරියෙන පුඤ්ඤං පාණීම්හි ඉජ්ඣති

තෙන පාණී කාමදදො තෙන පාණී මධුස්සවො
තෙන මෙ බ්‍රහ්මචරියෙන පුඤ්ඤං පාණීම්හි ඉජ්ඣති"

යන මෙ අඞ්කූරප්‍රෙතවස්තුවැ පරිචර්‍ය්‍යා "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියන ලද – "ඉදං ඛො තං භික්ඛවෙ තිත්තිරියං නාම බ්‍රහ්මචරියං අහොසි" යන මෙ තිත්තිරජාතකයෙහි පඤ්චශික්ෂාපද

---

[1] බ්‍රහ්මචර්‍ය්‍යා G [2] ධීර CD

"බ්‍රහ්මචර්‍ය්‍ය යයි කියනලද – "තං ඛො පන පඤ්චසිඛ බ්‍රහ්මචර්යං නෙව නිබ්බිදාය න විරාගාය යාවදෙව බ්‍රහ්මලොකූපපත්තියා" යන මෙ මහා ගොවින්ද සූත්‍රයෙහි බ්‍රහ්මවිහාර "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියන ලද – "එකස්මිං බ්‍රහ්මචර්යස්මිං සහස්සං මව්වූහායිනො" යන මෙහි ධර්මදෙශනා "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියනලද – "පරෙ අබ්‍රහ්ම චාරි භවිස්සන්ති, මයමෙත්ථ බ්‍රහ්මචාරිනො භවිස්සාම" යන මෙ සල්ලෙඛ සූත්‍රයෙහි මෛථුනවිරති "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියනලද.

415. "මයඤ්ච භරියා නාතික්කමාම
අම්හෙ ච භරියා නාතික්කමන්ති
අඤ්ඤත්‍ර තාහි බ්‍රහ්මචර්යං චරාම
තස්මාති අම්හං[1] දහරා න මීයරෙ"

යන මෙ මහාධර්මපාලජාතකයෙහි ස්වදාරසන්තොෂ "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියනලද.

416. "හිනෙන බ්‍රහ්මචර්යෙන ඛත්තියෙ උපපජ්ජති
මජ්ඣිමෙන ච දෙවත්තං උත්තමෙන විසුජ්ඣති"

යන මෙ නිමිජාතකයෙහි ආත්මදමනවශයෙන් කරනලද අෂ්ටාඞ්ගික පොෂථ "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියනලද – "ඉදං ඛො පන පඤ්චසිඛ බ්‍රහ්මචර්යං එකන්තනිබ්බිදාය විරාගාය නිරොධාය උප සමාය අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති, අය මෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො" යන මෙ මහාගොවින්ද සූත්‍රයෙහි මෑ ආර්‍ය්‍යඅෂ්ටාඞ්ගික මාර්ග "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියනලද.

417. "අපි අතරමානානං එලාසාව සමිජ්ඣති
විපක්ක බ්‍රහ්මචර්යො'ස්මි එවං ජානාහි ගාමණී"

---

[1] තස්මා හි අම්හංB

යන මෙහි අධ්‍යාශය "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියනලද – "අභිජානාමි ඛො පනාහං සාරිපුත්ත චතුරඞ්ග සමන්නාගතං බ්‍රහ්මචරියං චරිතා[1] – තපස්සී සුදං හොමි පරමතපස්සී, ලූඛස්සුදං හොමි පරම ලූඛො, ජෙගුච්ඡී සුදං හොමි පරම ජෙගුච්ඡී, පවිවිත්තස්සුදං හොමි පරමපවිවිත්තො" යන මෙ මහාසීහනාද සූත්‍රයෙහි වීර්‍ය "බ්‍රහ්මචර්‍ය්‍ය" යයි කියනලද.

---

(59). <u>වරරාජගහං</u> <u>රාජගහං</u> <u>නාම</u> <u>අතිමනොහරං</u> <u>නගරං</u> <u>පවිසිත්වා</u> යන තන්හි එනුවර අතිමනොහර පරිදි කිසෙයැ යත්?

දිලියෙන රන්රිදිමිණිතොරණින්, පුරෙව්හි දිවසරන් පරයන පුරඅඟනන් පදනා[2] දදගළ[3] රියදහසින්, ගජනා ඇතුන් විසින්, තුල්නා අසුන්විසින්, විසිරෙන පෙදෙසිමුළින්, අපොළන යෝධ[4] මුළින්, ලළන දෙදෙන්, තළන බෙරින්, වයන වෙණින්, නටන මත්වළුන් විසින්, දිලියෙන රුවන්පහසින්, තෙවුනා මුතුලලින්[5], රවන රන්රස්සෙන්, විසිතුරු කප්රුකින් සවිසජ[6] වන බැවින් අතිමනොහර වී.

---

(60). <u>පිණ්ඩාය</u> <u>චරිත්වා</u> යන තන්හි පිඩු සඳහා සුරු[7] පරිදි කිසෙයැ යත්? එදා මහසත් නුවරදොර සිට "ඉදින් මම් බිම්සර රජහට මා ආ පරිදි දැන්වීම් නම් "සුදොවුන් රජහු පිත් සිද්ධත් තුමර ආය" යි කියා මට බොහො ප්‍රත්‍යය එළවයි; කියා යවා පස ගැනුම් පැවිජියනට සරුප් නො වෙ" යි බඹදැති පවුල් පෙරෙවැ මැටිපා ගෙන පුරවේ බැස පිඩු සිරි[8].

---

[2] වදුනා A [3] දදහළ A [4] යොධ CDEF [5] මුතුලැලින් BEF
[6] සැජ BEF [7] සැරු G [8] සැරි G

ACDEF

(61). <u>ආකුලී කත්වා</u> යන තන්හි නුවරුන් උලෙළ කළ පරිදි කියයුතු යත්?

එදා පිඬුසරන මහපුරුෂ තමා දුටු පුරවැසියන් විසින් "මෙ අනඝ යැ, අපපුරෙහි පුරවයමින් යහපත්සෙ දැක ඔවුන් මනවුලුඹුනට ආයෙ යැ" යනු කියවනුයෙ - ඒ ඇසුවන් විසින් "මෙ අනඝ නො වෙයි, හෙ අග්නිදඟයැ, මෙවැනි සොම්පැහැයෙක් ත්‍රිභුවනයෙහි යම්කෙනක්නට ඇත්තෙ නො වෙයි; මෙ සඳදෙවි පුතැ, මෙනුවරැ සොම්පහන් බැහැවී තමහට හාස කරනුවන් බඳු පුරඅහනන්ගෙ තුනුකැලුම් මඩනට ආයෙ යැ" යනු කියවනුයෙ - ඒ ඇසුවන් විසින් "මෙ සඳ නො වෙයි, හෙ සකලඩකයැ; මෙ අකලඩකයැ; මෙවැනි දීප්තියෙක් අනිත් කෙනක්නට ඇත්තෙ නො වෙයි; මෙ සූයඃ දිව්‍යපුත්‍ර යැ, මෙපුරෙහි විලඹුවන්ගෙ ඉසුරු විඳිනට ආයෙ යැ" යනු කියවනුයෙ - ඒ ඇසුවන් විසින් "මෙ සූයඃ නො වෙයි; හෙ උෂ්ණ රශ්මියැ, මෙ මනොඥරශ්මි යැ; මහත් අනුභාව සම්පත් ඇත්තෙ යැ; මෙවැනි අනුභාවයෙක් අනෙක් කෙනක්නට ඇත්තෙ නො වෙයි; මෙ ශක්‍රදෙවරාජයැ, අප පුරට සෙත් කරනුවට ආයෙ යැ" යනු කියවනුයෙ - ඒ ඇසුවන් විසින් "මෙ සක්දෙවිරජ නො වෙයි, හෙ යවජ්‍ර යැ, සෙරාවත යැ, මෙවූකල එසෙ නො වෙයි; මෙවැනි ආරොහපරිණාහසම්පත් හා ශාන්තපියොවි හා අනෙක් කෙනක්නට ඇත්තෙ නො වෙයි; එබැවින් මෙ මහා බ්‍රහ්මයැ, මෙනුවර ත්‍රිවෙදයෙහි පාරප්‍රාප්ත ව්‍යක්තජනයනට බුහුමන් කරනුවට ආයෙ යැ" යනු කියවනුයෙ - ඒ ඇසුවන් විසින් "මෙ මහාබ්‍රහ්ම නො වෙයි; හෙ චතුර්මුඛයැ, මෙ සමන්තාමුඛ යැ, මෙවැනි සර්‍වාකාරපරිපූර්‍ණතායෙක් භුවනත්‍රයෙහි යම්කෙනක්නට ඇත්තෙ නො වෙයි; එබැවින් මෙ සකල ලොකයහට වැඩ සඳහා පාරමිතා පුණ්‍යබලයෙන් නිපන් මනුෂ්‍ය

රත්නයෙකැ" යනු කියවනුයෙ මුළුනුවර මදුරුමත්පහර ලද මුහුදක් සෙයින් එක පැහැර උලෙළ කෙළෙ.

---

(62). බිම්බිසාරතරාධිපෙනොපගන්ත්වා යන තන්හි වරපුබවුන් කරා උපගත වූ පරිදි කියෙයැ යත්?

එදවස් රාජපුරුෂයෝ ගොස් "මහරජ, ශත්‍රුයා බවි නො දන්මහ[1] මාරබ්‍රහ්මාදීන් කෙරෙන් අන්‍යතරයකු බවි නොද දන්මහ[1], මෙසෙ මෙසෙ වූ පුරුෂයෙක් පුරවීථියට බැස භික්ෂාටන කෙරෙ"යි දැන්වූහු. එකල්හි රජ සිංහපඤ්ජරයෙන් බලනුයෙ මහා පුරුෂයා ජඩාමරුවන්මෙරක් සෙයින් වඩනහු දැක "මම ද මොහු නො දන්මි, තෙපි පසුපස්සෙ යව, ඉදින් යක්ෂයෙක් වී නම් නුවරින් නික්ම අන්තර්ධාන වෙයි; දිව්‍යයෙක් බ්‍රහ්මයෙක් වී නම් ආකාශයෙන් යෙයි; ගරුඩයෙක් වී නම් පක්ෂප්‍රසාරණ කොට යෙයි; නාගයෙක් වී නම් පොළොව කිමිද යෙයි; මනුෂ්‍යයෙක් වී නම් ලද අහර එක් ස්ථානයෙහිද වළඳ කෙරෙ"යි වරයන් යවා ඔවුන් අහර වළඳන්නට වන්කල්හි දිවගොස් සැලකළ වරයන් විසින් දැන ශීඝ්‍ර වගොස් ඔවුන් ආහාරකෘත්‍ය නිමවා වැඩහුන් තැනට උපගත වී.

---

(63). ආගතො මෙ සහායො යන තන්හි මොවුන් ඔහු හා සබඳ පරිදි කියෙයැ යත්?

මෙ රජහු හා මහපුරිසා හා දෙදෙන නො හැඳින ම සබඳහ, දෙදෙනා පියා ද ඔවුනොවුන් හා සබඳහු. බිම්සර රජහට සිඩත් කුමර පස්හවුරුද්දකට මහල්ලැ. සොළොස් හැවිරිදි කල රජ වැ එකුන්තිස්හැවිරිදිකලැ මහභිනික්මන්

---

[1]දනුම්හ

කොට පැවිදි වැ එදා සබඳ රජහුගෙ නුවර වන්.

---

(64). <u>රජ්ජං පටික්ඛිපිත්වා</u> යන තන්හි රාජ්‍ය ප්‍රතික්ෂෙප කළ පරිදි කිසෙයැ යත්?

"මම ඉදින් රජ කැමැති වීමි නම් සතර වරම්මහරජුන් ඇ සදෙව්ලෙවිහි දෙව්රජහු තමන් තමන්ගෙ රාජ්‍යයෙන් නිමන්ත්‍රණ කෙරෙති; ගිහිගෙයි සිටියෙ චක්‍රවර්ත්ති වෙමි; මෙරජ මෙ නො දැන කියයි; මා රජ නො කැමැතිපරිදි මොහු දැන්වුව මැනැවැ"යි දිවම්හිඟුරුවක් සෙයින් කන්කලු, පරපුටුහඬක් සෙයින් සිත්ගත්, බමරමුමණක් සෙයින් මියුරු, මහමෙහඬක් සෙයින් ගැඹුරු සරයෙන් දසන්රස් විහිදුවමින් "න මමත්ථො මහාරාජ" යනාදීන් රාජ්‍යප්‍රතික්ෂෙප කළහ. එසඳ රජ "පළමු මැ මම "සුදොවුන් මහරජහු පිත් සිද්ධත් කුමර සතර නිමිත්තක් දැක පැවිජ් වැ බුදු වෙ ල" යනු ඇසීමි, දැන් තොපගෙ අධිමුක්ති දැක ඉතා ප්‍රසන්නයෙමි, තෙපි එකාන්තයෙන් බුදු වව, බුදු වැ මාගෙ විජිතයට වඩනෙ මැනැවැ"යි ආරාධනා කෙළෙ.

---

(65). විසාඛපුණ්ණමදිවසෙ යනු පඤ්චමහාස්වප්න දුටු වෙලායෙන් විහාතකාල ගෙන කීහු.

එහි <u>පඤ්චමහාස්වප්න</u> නම් කවර යත්?

එ රාත්‍රියැ මහාපුරුෂයහට මහපොළොව යහන් විය, හිමවත් පර්වතරාජ කන්වයින් විය, පූර්වසාගරයෙහි වාමහස්තය අවහිත විය, අපරසාගරයෙහි දක්ෂිණ හස්තය අවහිත විය,

දක්ෂිණසාගරයෙහි උභයපාදයො අවහිත වූහ, පළමුවන මෙ ස්වප්නය සම්‍යක් සම්බොධිසමධිගමයට පූර්වනිමිත්තයි.

"තිය්‍යක්" නම් තාණජාතියෙක් නාභියෙන් උද්ගත වැ ආකාශ දෙශයෙහි පැතිර සිටියෙ යැ. දෙවන මෙ ස්වප්නය ආය්‍යාෂ්ටඞ්ගිකමාර්ගප්‍රතිවෙධ කොට දිව්‍යමනුෂ්‍යනට ප්‍රකාශ කරන බවට පූර්වනිමිත්තයි.

කළුහිස්ඇති සුදු ක්‍රිමිකුලයො පයට නැඟී දණ දක්වා ප්‍රච්ඡාදනා කළහ. තුන්වන මෙ ස්වප්නය බොහො ගිහි මිනිසුන් මැ ප්‍රාණයෙන් සරණ යන බවට පූර්වනිමිත්තයි.

නානාවර්ණ ඇති ලිහිණියො සතර දෙනෙක් සතර දිශායෙන් අවුදු පාදමූලයෙහි නිපතිත වැ සර්වශ්වෙත වූහ. සතරවන මෙ ස්වප්නය චාතුර්වර්ණයන් සස්නෙහි පැවිදි වැ පිරිසුදු නිවන් පැමිණෙන බවට පූර්වනිමිත්තයි.

මහත් අශුචිපර්වතමස්තකයෙක්හි අනුපලිප්ත වැ සක්මන් කරන්නා දුටහ. පස්වන මෙ ස්වප්නය චතුර්විධප්‍රත්‍යයට ලාභී වැ එහි අනුපලිප්ත වන බවට පූර්වනිමිත්තයි.

එයින් වදාළහ:-

418. "තථාගතස්ස භික්ඛවෙ අරහතො සම්මා සම්බුද්ධස්ස පුබ්බෙව සම්බොධා අනභිසම්බුද්ධස්ස බොධිසත්තස්සෙව සතො පඤ්ච මහා සුපිනා පාතුරහෙසුං" යනාදි.

මෙයැ "පඤ්චමහාස්වප්න" නම්.

(66). උරුවෙලාය යන තන්හි මහත් වැලි රැසෙකින් එ ජන පදය "උරුවෙල්[1]" නම් වී - කිසෙයැ යත්?

---

[1] උරුවෙලාB

බුදුන් නො උපදනා කලෑ කුලපුත්‍රයෝ දසදහසක් දෙනෙ තාපසප්‍රව්‍රජ්‍යායෙහි පැවිදි වැ එපියෙස්හි වසනුවොත් එක්දවසක් සන්නිපතිත වැ "කායකර්‍ම වාක්කර්‍ම වූ කල පරහට ප්‍රකට යැ, මනඃකර්‍ම අප්‍රකට යැ. එබැවින් යමක්හට ත්‍රිවිධ විතර්කයන් කෙරෙන් අන්‍යතර විතර්කයෙක් උපන් නම් ඔවිහට අනෙක් චොදකයක්හු නැති වන බැවින් තෙමෙ මැ තමහට චොදනා කොට පත්‍රපුටයෙකින් වැලිපළහක් මෙතැන් හැර[2] ඔවිවයි, හෙ මැ ඔවිහට දණ්ඩකර්‍මයැ"සි ව්‍යවස්ථා කොළෝ. එතැන් පටන් ගෙන යමක්හට එවැනි විතර්කයෙක් උපන් නම් වැලිපළහක් එහි හැර ඔවි. ක්‍රමයෙන් හෙ මහත් වැලිරැස් විය. අපරකාලභාවීහි එහි වටා පවුරු බැඳ චෛත්‍ය ස්ථාන කොළෝ.

මෙයැ "උරුවෙල්[1]" නම්.

---

(67). සන්නිහිතබාලාන්ධකාරා හාසමානතනුසම්පදා ව යනාදි තන්හි ඇ ය "සන්නිහිතබාලාන්ධකාර" වුව හොත් "හාසචිත්තනුසම්පත්" නො වුව මැනැවැ. "හාසචිත්තනුසම්පත්" වුව හොත් "සන්නිහිතබාලාන්ධකාරා" නො වුව මැනැවැ. යම්කලෙක්හි අන්ධකාර ඇතිතැනැ දීප්ති නො වෙයි, දීප්ති ඇතිතැනැ අන්ධකාර නො වෙයි, අන්ධකාර හා දීප්ති හා දෙක එක්තැනෙක්හි නො විය හැකි බැවින් මෙ පරස්පර විරුද්ධයනුත්? එසෙ නො වෙයි. "බාල" ශබ්දයෙන් අභිනවභාවය මතු කියන්නාහු නො වෙති; කෙශයනුදු කියති; එබැවින් සන්නිහිතකෙශයෙන් අන්ධකාර ද් වුව දිලියෙන් තුනුසම්පතු ද් ඇති වූ. මෙයින් ඇය නවයොවනවිලාසයෙන් දිලියෙන සෙ කීහු.

---

[1] උරුවෙලාB [2] මෙතෙන ඇරB

දෙවන අලඞ්කාරයෙහි ඇය "පුණ්ඩරීකමුඛී" වුව "හරිණලොචන" නො වුව මැනැවැ. "හරිණලොචනා" වුව "පුණ්ඩරීකමුඛී" නො වුව මැනැවැ. යම්කලෙක්හි පුණ්ඩරීක මුඛයෙක්හි හරිණලොචනයක් නො වූ විරි බැවින් මෙ විරුද්ධ නු යත්? එසෙ නො වෙයි. "පුණ්ඩරීක" ශබ්දයෙන් දිවියන් මතු කියන්නාහු නො වෙති; පද්මයනුදු කියති. එබැවින් ප්‍රබුද්ධ පද්මයක් බඳු මුහුණ ඇති වුව, හරිණයන්ගෙ ලොචනබඳු ලොචන දු ඇති වූ. මෙයින් ඇය කාන්තිමත් මුඛ හා අභිනීල නයන ඇතිසෙ කීහු.

තුන්වන අලඞ්කාරයෙහි ඇය "බාලාතපප්‍රභාධර" වුවහොත් "කුමුදහාසිනී" නො වුව මැනැවැ. "කුමුදහාසිනී" වුව හොත් "බාලාතපප්‍රභාධර" නො වුව මැනැවැ. යම්කලෙක්හි කුමුදකුසුමයෝ සූයර්‍රශ්මියට විකශිතවන්නාහු නො වෙති; එබැවින් මෙ විරුද්ධ නු යත්? එසෙ නො වෙයි; "හාස" ශබ්දයෙන් කුසුමයන්ගෙ විකාශය මතු කියන්නාහු නො වෙති; සිනා ද් කියති. එබැවින් ළහිරුරස් බඳු ශරීරප්‍රභා ද ඇතිවුව කුමුදු මල් සෙයින් ධවල වූ සිනා ද් ඇති වූ.

සතරවන අලඞ්කාරයෙහි ඇය "සමුන්නත පයොධරා" වුවහොත් "මධුරහංසනාද නො වුව මැනැවැ. "මධුරහංසනාද වුවහොත් "සමුන්නතපයොධර" නො වුව මැනැවැ මධුරහංසනාද මෙසකාලයෙහි වන්නෙ නො වෙයි; එබැවින් මෙ විරුද්ධ නු යත්? එසෙ නො වෙයි. "පයොධර" ශබ්දයෙන් මෙඝයන් මතු කියන්නාහු නො වෙති; සතන ද් කියති. එබැවින් මධුරහංසනාද බඳු හඬ ඇති වුව සමුන්නතසතනයුගල ද් ඇති වූ.

පස්වන අලඞ්කාරයෙහි ඇය "කමලකොමලකර" වුවහොත් "පාටලිනිතම්බ" නො වුව මැනැවැ. "පාටලිනිතම්බා" වුව හොත් "කමලකොමලකර" නො වුව මැනැවැ. මෙවැනි මෙලෙක්

හා එවැනි කැකුළෙක් එක්තැනෙක එන්නෙ නො වෙයි. එබැවින් මෙ විරුදාඩ නු යත්? එසෙ නො වෙයි; කමලදල සෙයින් කොමල කරතල ඇත්ති යැ, පාටුලිලාතල සෙයින් විශාල ජඝන දෙශ ඇත්ති ය.

සවන අලඞ්කාරයෙහි ඇය "කරහොරු" වුව "විලම්බිත ගාමිනී" නො වුව මැනැවැ. "විලම්බිතගාමිනී" වුව "කරහොරු" නො වුව මැනැවැ. උභ්‍රයො එක්දවසැ පනස්යොදුන් සැට යොදුන් යෙති. එබැවින් ඇය "කරහොරු" වනුදු "විලම්බිත ගාමිනී" වනුදු පයපාවත සෙයින් විරුදාඩ නු යත්? එසෙ නො වෙයි. කරහයන්ගෙ ඌරු බදු අනුපූර්‍ව ඌරුයුගල ඇත්ති යැ, හංසයන්ගෙ ගමන් සෙයින් විලම්බිත ගති දු ඇත්ති.

මෙ "විරුදාලඞ්කාර" නම්.

---

(ඉප). කුසුමකුඩ්මධූමපුගන්ධි නීසු යන තන්හි "ධූම" ශබ්දය ගන්ධධූමයෙහි වැටෙයි. මෙයින් බැහැර "කොධො ධූමො භඤ්ඤති මොසවජ්ජං" යන තන්හි ක්‍රොධයෙහි වැටෙයි. "ඉච්ඡා ධූපා සිතා සදා" යන තන්හි තාෂ්ණායෙහි වැටෙයි. "අඤ්ඤතරො භික්ඛු භගවතො අවිදූරෙ ධූපායන්තො නිසින්නො හොති" යන තන්හි විතර්කයෙහි වැටෙයි. "රජො ච ධූමො ච මයා පකාසිතො" යන තන්හි පඤ්චාමගුණයෙහි වැටෙයි. "ධූමං කත්වා හොති" යන තන්හි ඛර්දෙශනායෙහි වැටෙයි. "ඛජ්ජො රථස්ස පඤ්ඤාණං ධූමො පඤ්ඤණමග්ගිනො" යන තන්හි ප්‍රකෘති ධූමයෙහි වැටෙයි.

---

(ඉඉ). කාමං සිද්ධඞ්මසිද්ධත්ථං කරොමි යන තන්හි "අසිද්ධත්ථං" යනු නඤ්සමාස යැ. එහි නඤ්හට අර්‍ථ දෙකෙක් වෙ, "ප්‍රසජ්‍ය

ප්‍රතිෂෙධ යැ, පයර්‍යුදාසය" යි. එහි යමෙක් "අසූර්‍ය්‍යම්පශ්‍යා රාජදාරාඃ" යන තන්හි සෙයින් උත්තරපදාර්‍ථයාගෙ සර්‍වර්‍ථාභාවය කෙරෙ ද හෙ ප්‍රසජ්‍යප්‍රතිෂෙධ ය. යමෙක් "අබ්‍රාහ්මණමානය" යන තන්හි සෙයින් උත්තර පදාර්‍ථයා පයර්‍යුදාස කොට තත්සදෘශ වස්තූහු කෙරෙහි කාර්‍ය්‍යප්‍රතිපාදනා කෙරෙ ද, හෙ පයර්‍යුදාසයි.

එයින් කීහ:-

419. "ප්‍රසජ්‍යප්‍රතිෂෙධස්‍ය ලක්ෂණං වස්තූනාස්තිතා
වස්තූතෝ'න්‍යත්‍ර යා වෘත්තිඃ පයර්‍යුදාසස්‍ය
ලක්ෂණම්" යි.

මෙ දෙඅර්‍ථයන් කෙරෙහි "අසිද්ධත්ථං" යනු ප්‍රසජ්‍ය ප්‍රතිෂෙධ වෙ.

කිසෙයැ යත්?

වශවර්‍ත්ති මාරයා තමා මහාපුරුෂයා මහභිනික්මන් කරන දවස් නුවරින් නික්මෙන තැනට ගොස් ආකාශයෙහි සිට "සිද්ධාත්ථය නො යා; අදින්[1] සප්තාහයෙකින් තට චක්‍රරත්නය ප්‍රාදුර්භූත වෙයි; සතරමහදිව එකරජ කරා" යි බැණ නො වැළැකියහි "ඔස මෙතැන් පටන්ගෙන ත්‍රිවිධවිතර්කයන් කෙරෙන් අන්‍යතර විතර්කයක් තා සිත උපන් දවස් හිස් සත්කඩක් කොට පළාපියමි" සහවුරුද්දක් දවස් ඡායා සෙ නො තොර වැ පියෙහි පියෙහි ඇක්ම ඇවිදුනෙ[2] මහාපුරුෂයා පධන්හි යොග කරන කල්හි තමා බොධියට මාර්‍ගාමාර්‍ග නො දන්නෙන් "මෙ අතිඝොර තපස් කෙරෙයි, කිසිදවසක් මාගෙ කාමවිෂය ඉක්ම යන වනැ" යි බියපත් වැ "තට මරණ ආසන්න යැ, හැරපියා තපස් නොකරා" යි බැණ නො වැළකියහි මහාපුරුෂයා බොධිමණ්ඩාරූඪවූ කල්හි "අද මෙ "බුදු වැ මිස මෙ අස්නෙන් නො නැගෙමි" යි

---

[1] අන්BCD [2] ඇවිදිනේB

ප්‍රතිඥා කොට හුන්නෙ යැ. මොහු සිද්ධාර්ථ නො වියදී බුද්ධත්වයට සවිටා භාවය කළ මැනැවැ" යි සැහැයුණු වන බැවින් "අසිද්ධත්ථං" යනු ප්‍රසජ්‍යප්‍රතිෂේධ වෙ.

---

(70). දසබලවතුවෙසාරජ්ජාදි යන තන්හි දශබලශබ්දය හට ද් වෛශාරද්‍යශබ්දයහට ද් වණීනා පත්තෝ සඞ්ඛ්‍යාතං යන තන්හි සිට කළ ව්‍යාඛ්‍යානයෙන් දතයුතු.

---

(71). එවමයං භගවතෝ සම්බන්ධිනි අරහතෝ සම්මාසම්බුද්ධස්ස යන තන්හි භගවත්ශබ්දයහට ද අර්හත්ශබ්දයහට ද සම්‍යක්සම්බුද්ධ ශබ්දයහට ද වණීනා එමැ තන්හි සිට කළ ව්‍යාඛ්‍යානයෙන් දතයුතු.

අභිසම්බෝධිකථා.

---

ආනන්දබෝධිකථා

(72). සමණපරික්ඛාරං දෙති යන තන්හි "පරිෂ්කාර" ශබ්දය "ගිලානපච්චයභෙසජ්ජපරික්ඛාරානං" යන තන්හි සෙයින් සම්භාරයෙහි වැටෙයි. මෙයින් බැහැර "සත්තහි නගරපරික්ඛාරෙහි සුපරික්ඛතං[1] හොති" යන තන්හි පරිවාරයෙහි වැටෙයි. "යෙවිමෙ පබ්බජිතෙ ජීවිතපරික්ඛාරා සමුදානෙතබ්බා" යන තන්හි කාරණයෙහි වැටෙයි. "රථෝ සීලපරික්ඛාරෝ ඤාණක්ඛෝ චක්කවීරියෝ" යන තන්හි අලඞ්කාරයෙහි වැටෙයි.

---

[1] සුපරිකිත්තංCD

(73). පඤ්චනෙත්තො යන තන්හි වර්ණනා පත්තො සබ්බඤ්ඤුතං යන තන්හි සිට කළ ව්‍යාඛ්‍යානයෙන් දතයුතු.

(74). සත්තසත්තාහානි වීතිනාමෙත්වා යන තන්හි ඔවුන් සත්සති ගෙවූ[1] පරිදි කිසෙයැ යත්?

යම්සෙ රාජ්‍යපදප්‍රාප්ත වූ රජෙක් තමාගෙ රත්නසාරයන් දක්නා සඳහා තත්තද්ගර්භයෙහි දොර විවර කරවා ස්වර්ණරජත මුත්තාමණී ආදි රත්නයන් නිරීක්ෂණ කෙරෙමින් ඇවිදි ද, එසෙයින්මැ බුදුහු එකුන්පනස් දවසක් තත්තද්ධර්මරත්නයන් ප්‍රත්‍ය වෙක්ෂණ කෙරෙමින් වුසුහු.

එයින් කීහ සඟිඅටුවායෙහි:-

420. "භගවා හි පඨමබොධියං එකුනපඤ්ඤාසදිව සබ්භන්තරෙ යථා නාම පත්තරජ්ජො රාජා අත්තනො විභවසාර දස්සනත්ථං තං තං ගබ්භං විවරාපෙත්වා සුවණ්ණරජතමුත්තා මණිආදීනි රතනානි පච්චවෙක්ඛන්තො විචරෙය්‍ය, එවමෙවං පඤ්චක්ඛන්ධ නිප්පදෙසෙකත්වා සම්මසන්තො පච්චවෙක්ඛන්තො විහාසි" යි.

---

(75). අධිගතො ඛො ම්‍යායං ධම්මො යන තන්හි ධර්ම ශබ්දය "දිට්ඨධම්මො පත්තධම්මො" යනාදි තන්හි සෙයින් මාර්ගඵල නිර්වාණයෙහි වැටෙයි. මෙයින් බැහැර "අධම්මං සාරථී කයිරා" යන තන්හි ව්‍යවහාරයෙහි වැටෙයි. "එවං ධම්මා තෙ බුද්ධා භගවන්තො අහෙසුං" යන තන්හි ස්වභාවයෙහි වැටෙයි. සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො

---

[1] සත්සතිය ගැළ වූ B

ඤාණමුඛෙ ආපාථං ආගච්ඡන්ති" යන තන්හි ඥෙයපථයෙහි වැටෙයි. "යස්සාතෙ චතුරෝ ධම්මා වානරින්ද යථා තව" යන තන්හි ප්‍රඥායෙහි වැටෙයි. "ධම්මා සුචිණ්ණා සුඛමා වහන්ති" යන තන්හි කුශලධර්මයෙහි වැටෙයි. "චත්තාරෝ පාරාජිකා ධම්මා" යන තන්හි ආපත්තියෑ වැටෙයි.

421. "නහි ධම්මෝ අධම්මෝ ච උභෝ සමවිපාකිනෝ
අධම්මෝ නිරයං නෙති ධම්මෝ පාපෙති සුග්ගතිං"

යන තන්හි ගුණධර්මයෙහි වැටෙයි. "ධම්මං වෝ භික්ඛවෙ දෙසෙස්සාමි ආදිකල්‍යාණං" යන තන්හි දෙශනාධර්මයෙහි වැටෙයි. "ඉධ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං" යනාදි තන්හි පර්‍යාප්ති ධර්මයෙහි වැටෙයි. "තස්මිං ඛෝ පන සමයෙ ධම්මා හොන්ති ඛන්ධා හොන්ති" යන තන්හි නිස්සත්ව ධර්මයෙහි ශූන්‍යතායෙහි වැටෙයි.

(76). භගවතෝ පුරතෝ පාතුභවිත්වා යන තන්හි එද, මහා බ්‍රහ්මයා බුදුන් පෙරට ප්‍රාදුර්භූත වූ පරිදි කිසෙයැ යත්? කූටාගාරයක් පමණ සලගලක් හැමයෙන් පාත බඹතලෙහි සිට වුහුට එක් රෑ එක් දවහලෙකින් අටසාළිස්දහසක් යොදුන් තැන් ගෙවමින් සාරමසෙකින් පොළොවට බස්සි. මෙයෙයින් අති දූර වූ සර්‍වාධස්තාද්බ්‍රහ්මතලයෙන් මත්තෙ බ්‍රහ්මලොකයෙහි සිට මහාබ්‍රහ්ම දිව්‍යබ්‍රහ්මගණනිකරපරිවාරයෙන් දික් කළ අතක් වක් නො කරනතුරු අවුදු බුදුන් පෙරට පහළ[1] වී.

එයින් කිහ:-

422. "සෙය්‍යථාපි නාම බලවා පුරිසෝ සම්මිඤ්ජිතං වා බාහං පසාරෙය්‍ය පසාරිතං වා බාහං සම්මිඤ්ජෙය්‍ය එව මෙවං බ්‍රහ්මලොකෙ අන්තරහිතෝ භගවතෝ පුරතෝ පාතුරහොසි" යි.

---

[1] පාළ A

(77). <u>අභබ්බපුග්ගලෙ</u> <u>පහාය</u> යන තන්හි අභව්‍යපුද්ගලයන් පී පරිදි කිසෙයැ යත්?

එක් සමයෙක්හි "කෙසි[1]" නම් අස්දම්සැරියෙක් බුදුන්කරා එළඹැ වැඳ එකත්පස් වැ හුන්නෙ යැ, බුදුහු "කෙසිය, තො ප්‍රසිද්ධ අශ්වදම්‍යසාරථිහි, අසුන් කෙතෙක්[2] ප්‍රකාරයෙකින් විනය කෙරෙහි?" යි වදාළො. "වහන්සෙ මම අශ්වයන් ශ්‍රක්ෂණයෙනුද් විනය කෙරෙමි, පරුෂයෙනුද් විනය කෙරෙමි, ශ්‍රක්ෂණපරුෂයෙනුද් විනය කෙරෙමි" යි කීය. "කෙසිය, තො මෙතුන් ප්‍රකාරයෙන් විනය නො වන අශ්වයනට කුමි කෙරෙහි?" යි වදාළහ. "ඔවුන් මරමි; මාගෙ ආචාර්‍ය කුලයට අපකීර්ත්ති නො වන සඳහා යැ. වහන්සෙද් අනුත්තර පුරුෂදම්‍යසාරථිදැ යැ, සත්වයන් කෙතෙක් ප්‍රකාරයෙකින් විනය කරනදැ දැ?" යි කීයැ. "කෙසිය, මම සත්වයන් ශ්‍රක්ෂණයෙනුද් විනය කෙරෙමි, පරුෂයෙනුද් විනය කෙරෙමි, ශ්‍රක්ෂණපරුෂයෙනුද් විනය කෙරෙමි" යි වදාළො.

එහි "ශ්‍රක්ෂණ නම්:- සුවරිත මෙසෙ යැ, සුවරිතඵල මෙසෙ යැ, ස්වර්ගමොක්ෂ මෙසෙ යැ, ස්වර්ගලොක මෙසෙ යැ, යන මෘදු දෙශනා යැ. "පරුෂ" නම්:-දුශ්චරිත මෙසෙ යැ, දුශ්චරිතඵල මෙසෙ යැ, අපායලොක මෙසෙයැ, යන කර්කශ දෙශනා යැ. "ශ්‍රක්ෂණපරුෂ" නම් මෙදෙකින් ව්‍යතිමිශ්‍ර දෙශනායි.

එයින් වදාළහ:-

423. "අහං ඛො කෙසි, පුරිසදම්මං සණ්ඡෙනපි විනෙමි, ඵරුසෙනපි විනෙමි, සණ්ඡඵරුසෙනපි විනෙමි" යනාදි.

---

[1] කෙසියCDEF [2] කිතෙක්A

එකල්හි අස්දමිසැරි "මෙතුන්ප්‍රකාරයෙන් විනය නො වන සත්නට කුමි කරනදැදැ?" යි කීය. "ඔවුන් මරමි කෙසිය" යි වදාළො. "වහන්සෙට පණිවා නො වටි නො?" යි කීය. "සැබැව කෙසිය මට පණිවා නො වටි යි අනෙකෙකැ. යමෙක් ෂොඩශාකාරයෙන් ආශයානුශයාදි බැලූ කලැ මෙතුනින් එක්තරා ප්‍රකාරයෙකිනු දු විනය නො වෙ නම් මා විසින් අනුශාස්‍ය නො වෙයි, හෙ ඔහට වධය" යි වදාළො. මෙසෙයින් අභව්‍යපුද්ගලයො බුදුන් විසින් පරිත්‍යක්ත වූහු.

---

(78). <u>උපකාදයො</u> <u>පරිතොසෙන්නො</u> යන තන්හි උපකාදීන් පරිතුෂ්ට කළ පරිදි කිසෙ යැ යත්?

එකල්හි ධම්සක් පවත්වන්නට ඉසිපතන් වඩනා බුදුහු "උපක" නම් දිගම්බරයක්හට වන වැඩ දැක නුබතෙලෙන් නො ගොස් පොළොතෙලෙන් වඩිත්. හෙ අතරමඟ ෂඩ්වර්ණ රශ්මි මාලායෙන් දිලියෙමින් වඩනා බුදුන් දැක පරිතුෂ්ට වැ බුදුනට "තාගේ ඉන්ද්‍රිය විප්‍රසන්න යැ, ජවිවර්ණ උද්දීප්ත යැ, තො කවරෙහි? කා උදෙසා පැවිදි විහි? තාගෙ ශාස්තා කවර? කාගෙ දහම් රුස්ව?" යි පිළිවිත්.

එසඳ බුදුහු තමන් සර්වක්ලෙශයන් විජය කොට ස්වයම්භූ ඥානයෙන් සර්වධර්මයන් පරිඥාන කළ පරිදි, යම් තැනෙක තමනට වැඩි කෙනකුන් හො තමන් හා සමකෙනකුන් නැති පරිදි, තමන් අනුත්තරසම්‍යක්සම්බුද්ධ පරිදි, ධම්සක් පවත්වන්නට කසී රජුන්ගෙ නුවරට යන පරිදි දක්වන්නට වදාළහ.

424. "සබ්බාභිභූ සබ්බවිදූහමස්මි
සබ්බෙසු ධම්මෙසු අනූපලිත්තො
සබ්බඤ්ජහො තණ්හක්ඛයෙ විමුත්තො
සයං අභිඤ්ඤාය කමුද්දිසෙය්‍යං

න මෙ ආවරියො අත්ථි සදිසො මෙ න විජ්ජති
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි මෙ පටිපුග්ගලො

අහං හි අරහා ලොකෙ අහං සත්ථා අනුත්තරො
එකො'ම්හි සම්මාසම්බුද්ධො සීතිභූතො'ස්මි නිබ්බුතො

ධම්මචක්කං පවත්තෙතුං ගච්ඡාමි කාසිනං පුරං
අන්ධභූතස්මිං ලොකස්මිං ආහඤ්ජං[1] අමතදුන්දුභිං" යි.

එයින් ඔහට වූ වැඩ කවර යත්? හෙ බුදුන්කෙරෙ පැහැද තො අනන්තජිනයෙහි යි හිස් සලා ගොස් වඩ්ගහාර ජනපදයෙහි වැදිදුවක වටා වසනුයෙ "සුභද්‍ර" නම් පුතකු ලද කල්හි උපන් නිර්වේදයකින් "මා සබඳ[2] අනන්තජිනයා කරා යෙමි" යි නික්ම මධ්‍ය දෙශයට ගොස් ජෙතවනයට වැද බුදුන් දැක පැවිදි වැ අනාගාමී වැ කප්දහසකට ආයු ඇති අවිහ තෙලෙහි උපද උපන් විගස රාත්වූ සත්දෙනා කෙරෙහි අන්තර්භූත වී.

එයින් කීහ:-

425. "අවිහං උපපන්නාසෙ විමුත්තා සත්ත භික්ඛවො
රාගදොසපරික්ඛීණා තිණ්ණා ලොකො විසත්තිකං.

---

[1] ආහඤ්ජුංCD [2] සබඳුD

උපකො ච්ලගණ්ඩො ච පුක්කුසාති ච තෙ තයො
හද්දියො ඛණ්ඩරෙවො[1] ච බාහුදන්ති ච පිඩ්ගියො
තෙ හිත්වා මානුසං දෙහං දිබ්බං යොගං
උපච්චගුං" යි

මෙහි "ආදි" ශබ්දයෙන් අතරමග දුටු මාගපක්ෂීන් හා දිව්‍ය මනුෂ්‍යයන් කියනු.

---

(79). ඉසිපතනං යන තන්හි එතැන් සාෂීන්ගෙ පතනයෙන් හා උත්පනයෙන් "ඉසිපතන" නම් වී. කිසෙයැ යත්?

කීයෙ මැ නො:-

426. "තස්මිං[2] කිර පදෙසෙ අනුප්පන්නෙ බුද්ධුප්පාදෙ පච්චෙකබුද්ධා ගන්ධමාදනපබ්බතෙ සත්තාහං නිරොධසමාපත්තියා විතිනාමෙත්වා නිරොධා වුට්ඨාය නාගලතාදන්තකට්ඨං ඛාදිත්වා අනොතත්තදහෙ මුඛං ධොවිත්වා[3] පත්තචීවරං ආදාය ආකාසෙන ආගන්ත්වා නිපතන්ති, තත්ථ චීවරං පාරුපිත්වා නගරෙ පිණ්ඩාය චරිත්වා කතහත්තකිච්චා ගමනකාලෙපි තතො යෙව උප්පතිත්වා ගච්ඡන්ති. ඉති ඉසයො එත්ථ නිපතන්ති උප්පතන්ති චාති තං ඨානං ඉසිපතනන්ති සඞ්ඛං ගතං මිගානං පන අභයත්ථාය දින්නත්තා මිගදායොති වුච්චති" යි.

---

(80). ධම්මචක්කං පවත්තෙන්තො යන තන්හි "ධර්මචක්‍ර" නම් ත්‍රිපරිවර්ත්ත ද්වාදශාකාරයෙන් සඞ්ගෘහිත චතුස්සත්‍යදෙශනායි.

---

[1] ඛණ්ඩදෙවාB [1] හද්දදෙවොG [2] යස්මිංCDE
[3] විත්වාලෙත්වාB

එහි "ත්‍රිපරිවර්තද්වාදශාකාර" නම් කවර යත්? චතුස්සත්‍යයෙහි "මෙ දුක්ඛ යැ, මෙ සමුදය යැ, මෙ නිරොධ යැ, මෙ මාර්ග්‍ය" යි උපදනා නුවණ "සත්‍යඥාන" නම් වෙයි; හෙ එක් පරිවර්තයෙකැ, ආකාර විසින් සතරෙක් වී. "දුඃඛය පරිඥෙය යැ, සමුදය ප්‍රහෙය යැ, නිරොධය සාක්ෂාත් කර්තව්‍ය යැ, මාර්ග්‍ය භාවිතව්‍ය ය" යි උපදනා නුවණ "කෘතඥාන" නම් වෙයි; හෙ එක් පරිවර්තයෙකැ, ආකාර විසින් සතරෙක් වී. "දුඃඛය පරිඥාත යැ, සමුදය ප්‍රහීණ යැ, නිරොධය සාක්ෂාත්කෘත යැ, මාර්ග්‍ය භාවිත ය" යි උපදනා නුවණ "කෘතඥාන" නම් වෙයි; හෙ එක් පරිවර්තයෙකැ, ආකාරවිසින් සතරෙක් වී.

එසින් වදළහ:-

427. "ඉදං දුක්ඛං අරියසච්චන්ති මෙ භික්ඛවෙ පුබ්බෙ අනනුස්සු තෙසු ධම්මෙසු චක්ඛුං උදපාදි, ඤාණං උදපාදි, පඤ්ඤා උදපාදි විජ්ජා උදපාදි, ආලොකො උදපාදි" යනාදි.

මෙයැ "ත්‍රිපරිවර්තද්වාදශාකාර" නම්.

---

(සැ). වෙනෙය්‍යජනකමලවනවිකාසං අකාසි යන තන්හි බුදුන් විනෙජන නමැති පියුම්වන පුබුදු වූ පරිදි කිසෙ යැ යත්? එදවස් මිනිසුන් කෙරෙන් කොණ්ඩඤ්ඤ මහතෙරහු සෝවාන් වූහ, දෙවියන් කෙරෙන් අටළොස්කෙළක් බඹහු රාත් වූහ. අසඞ්ඛ්‍යයක් දෙනා සෝවාන් සෙදගැමි අනගැමි වූහු.

එසින් කිහ සභිඅටුවාවෙහි:-

428. "මහාසමයසුත්තෙ ච අථො මඞ්ගලසුත්තකෙ
සමවිත්තෙ රාහුලොවාදෙ ධම්මචක්කෙ පරාභවෙ.
දෙවතාසමිති තත්ථ අජ්ඣභාසය්‍යා අනජ්ඣිකා
ධම්මාභිසමයො වෙත්ථ ගණනාතො අසංඛියො" යි.

---

(82). <u>උරුවෙලගාමිනං මහං පටිපජ්ජිත්වා</u> යන තන්හි බුදුන් උරුවෙලගාමි වූ මාඝීයට පිළිපන් පරිදි කිසෙ යැ යත්?

එවිහු[1] ඇසළපුණුපොහොයැ ඉසිපතන්හි ධම්සක් පවත්වා එහි මැ වංඝීපගම කොට පළමු පඤ්චවඝීයන් විනය කළහ. ඔවුන් කෙරෙහි කොණ්ඩිඤ්ඤ මහතෙරුන් අග්‍රධර්ම ප්‍රතිවෙධයට කල්ප ශතසහස්‍රයක් සම්භාර පිරූ පරිදි එතදග්ගපාඨ සංවණ්ණනායෙන් දන්නෙ යැ. පැසුව ඔවුන් "අග්ගඤ්ඤ පිළිගත් මහතෙරහ" යි දෙඅගසව්වන් මහාබ්‍රහ්මයා කෙරෙහි සෙයින් තමන් කෙරෙහි කරන බුහුමන් දැක අග්ගිඛන්ධයෙක්හි සෙයින් තමන් කෙරෙහි කරන අපත්‍රපා දැක ඔවිනට විසුවිහාර සඳහා බුදුන් වැඳ අවසර ගෙන සඳත්දහතළාපියෙයැ පසෙබුදුන් වසන රන්ලෙණෙක[2] වූසූ පරිදි, ඇතුන් දෙළොස් අවුරුද්දක් උපස්ථාන කළ පරිදි, පිරිනිවිකලැ රුවන්මුවා නවයොදුන් කූටාගාරයෙක්හි වඩා හිඳුවා දෙවිබඹුන් බඹලොව දක්වා නහා පිදූ පරිදි වඩිඝිසසංයුක්තයෙන් දන්නෙ යැ.

එක්බිති බරණැස "යස" නම් කුලපුත්‍රයක්හු තුන්සාකුයෙහි තුන්පහයැ පසඟතුරු ගත් වරඟනත් විසින් පරිවාර වැ වෙසෙමින් එක්තරා නිවේදයක් දැක ඉසිපතන් ගොස් බුදුන්කෙරෙ ධම් දෙසුන් අසා රහත් වැ එහිහික්ෂුභාවයෙන් පැවිදි වූ පරිදි ද්, එමැ නුවර සිටු දරුවන් සතරනෙකුදු නසිරට වැසි කුලපුත්‍රයන් පනස්දෙනකුදු රාත් වූ පරිදි ද් විනයෙහි කී නියාසෙයින් දන්නෙයැ. මෙසෙ නිපන් රාත්සඟුන් සැටදෙනා දනවුසැරිසරනුවට මෙහෙයා තමුහු උරුවෙලගාමි වූ මාඝීයට පිළිපන්හු.

(83). හද්දවග්ගියරාජකුමාරානං යන තන්හි වරජකුමරුන් "භද්‍රවඝී" නම් වූ පරිදි කිසෙ යැ යත්?

---

[1] ඔහු CDE [2] රන්ගල්ලෙණෙක CDE

ඔහු තුණ්ඩිල ජාතකයෙහි ධුතීතයෝ තිස්දෙන යැ, පැසුව තුණ්ඩිලොවාද අසා යාවජීවයෙන් පන්සිල් රකියහ. එයින් දැන් මෙ ජන්මයෙහි රූපයෙනු ද් විත්තයෙනු ද් "හළ" වූහු. ඔහු කොසොල්රටවැසි රජකුමරහ. කොසොල්රජ ඔවුනට එක්රටක් දින. ඔහු එරට වළඳ සහාය වැ වසනුවෝ යම් තැනකට යත් එක් වැ මිස නො යෙති. එයින් "වහී" වූහු. ඔහු "කපාසිය" නම් වූ වනය සරාසිරින් යහපත් වූ සෙ අසා වනක්රීඩාවට ගියාහු ඒ වනයෙහි වැඩහුන් බුදුන් දැක වැඳ හිඳ ධම්දෙසුන් අසා ලොකොත්තරපදප්රාප්ත වූහු.

---

(ප4). ජටිලානං අනෙකාජටා ච බහිජටා ච විජටෙත්වා යන තන්හි අනෙකප්රාතිහාර්යසහස්රයෙන් හා ධම්දෙශනායෙන් ජටිල සහස්රයන්ගෙ අන්තර්ජටා ද් බහිර්ජටා ද් විජටන විධ්වංසන කොළෝ.

කිසෙ යැ යත්?

එකල්හි බුදුහු "උරුවෙලකාශ්යප"නම් ජටිලයා වසන ආශ්රම පදයට එළැඹ සැඩ දරුණු වසඟොර නාගරාජයා විසින් අධිෂ්ඨිත අග්නිශාලාව ඉල්වාගෙනැ සවස තවුස්පන්සියන්[1] තමන් තමන් වසන පන්සලට්[2] වන් කල්හි අඳුරුබියෙන් අවුදු එකෙණෙහි සරණ ගිය රිවිරස් සෙසින් රස් වීරමින් වසඟොර නහි[3] විසින් රක්නා ලද ගිනිදෙවොලට මදුමත් ගඳගජක්හු වසන ගිරි ගහනයකට වදනා කෙශරසිංහයක්හු සෙයින් වැද නාරජහුගෙ සිරියහන් මත්තෙ තණ අතාටලා ඒ මත්තෙ පලක් බැඳ වැඩ හුන්හු.

එසඳ නාරජ බුදුන් දැක බුද්ධදර්ශන නමැති අරණී මථනයෙන් නැඟි අභිමාන නමැති ඉන්ධනයෙහි ඇවිළගෙන

---

[1]සියයන්B [1]සියයක්F [2]පන්සල්වලටCD [3]නසිDEF

දිලියෙන ක්‍රෝධ නමැති බලවත් ගිනින් දන හදවත් ඇති වැ "මෙ මුඩුමහණ මට පරිභව කොට තමාගෙ අස්නෙක්හි සෙයින් මාගෙ සිරියහන් මත්තෙ හුන්නෙ යැ. මම ඔහට කටයුතු දන්මි" යි ගිනියෙහි බහාලූ අලුත්පිදුරු දුම්සෙයින් දුමන්නෙ සියලු ගිනිහල දුමින් අතුරු නැති කොට පිය.

එකලැ බුදුහු "මෙ නාරජ තමාගෙ බල මැබල කොට සිතුයෙ යැ, දසබුදුබල වනාහි නො දන්නි. එබැවින් මුහුගෙ සිවියට හො සම් මස් නහර ඇටමුලට හො විනාශ නොකොට තෙජින් තෙජ[1] මැඩ පිව මැනවැ" යි තෙජකිසුණු සමවත් සම වැද බහලතර ධූමයක් මැවූහු.

එසද නාරජ පුටපාකයෙක්හි සෙ ගිදි නො සැහැදිලි නැංගෙ. එවිහු සිරිරින් නැඟි දිලියෙන ගිනිදලයො "මෙ මහ පැරක්මා විසින් මරහු වැන්නන් මැවූ ගිනිකද පවා නිරවසෙස්නෙන් නිවා පියනලද, කිසෙයින් මුහු දන්නට හැක්කම්හ?" යි සිතා බාගියවුන් සෙයින් බුදුන් කරා ළඟ නො වූහු.

බුදුහු ද තෙජොධාතුසමාපත්ති සමවැද කප්ගිනිගත් රන්මෙරක් සෙයින් දිලියෙන්නට වන්හු. දෙදෙනාගෙ තෙජසින් සියලු පන්සල යුගත්ගිනිකලබක් සෙයින් දිලියෙමිනු ද් බුදුන්ගෙ අනුභාවයෙන් නො දැ ය නාරජහුගෙ සියල්සිරුරු කඹුරු උදුනෙහි තුබූ ලොහො පිඩත් සෙයින් සන්තප්තවී.

එකල්හි නාරජ තමාගෙ විෂවෙගානලජ්වාලයෙන් නො පහාරනා ලද බුදුගුරුඑරජහු දැක බලවත් බියෙන් විගත[2] වූ තෙද ඇති වැ පැණේ[3] හකුළුවාගෙන හෙව සිතන්නෙ "තමාගෙ පමණ නො දැන්ම ඉතා කෂ්ට යැ, මම ගුරුඑරජක්හට පළඟක්හු සෙයින් මාගෙ බල නො බලා සම්ප්‍රදාලිතමාරබලඇති දශ බලයහට බල කටැටි වීමි. මකුළුහුයෙකින් මෙරගල් නැමියටියක්හු

---

[1] තෙදින් තෙද F [2] විහත G [3] පණේ G

වැනි වීමි. පිනැහැඹිළිදුලෙකින් හිමගල් නැමියටියක්හු වැනි වීමි. මුදුනෙන් පැහැරැ විදුරුගල් පැළියටියක්හු වැනි වීමි. වැළි මා වැනි තමා පමණ නො දන්නා බාලයක්හට මෙවැනි දුක් නො විය යුත්තෙ ද? දැන් මට අසම දඟබලයා මිස අනෙක් සරණෙක් ඇත්තෙ නො වෙ" යි සිතා සප්වෙස් හැරපියා මණිවිවෙසක් මවාගෙන බුදුරජහු සරණයුවළ වෙතට එළඹ තථාගත බල නමැති වජ්‍රායුධපහර ලදින් නඩ වැ හුණු මන් නමැති ගිරිකුළු ඇතියෙ දෙවිබඹඅසුරගුරුඵගණා විසින් වඳනාලද සරණතල වැඳ නැඟී මිහිතෙලෙහි එබූ යුවළ දණමඩුලු ඇති වැ ඉඳුනිල්මිණි කලසයෙක්හි රත්මහනෙල්දල පෙළක් සෙයින් මුදුනෙහි ඇඳිලි බැඳ නවපුබුදු පියුමක් බඳු බුදුවුවන් බලා "වහන්සෙ තොප නො හැඳින මා විසින් මහත් අපරාධයෙක් කරනලද. එයට මට ක්ෂමා කරනු මැනැවැ" යි කී.

එසඳ බුදුහු තුරවීරැවි පරයන මියුරු ගැඹුරු හඬින් "මැනැවැ තට ක්ෂමා කෙරෙමි. පුහුදුන් වන බැවින් කරනලද තා විසින් මෙ අපරාධ යැ" යි වදාළෝ.

එසඳ නාරජ මුහුගෙ ක්ෂාන්ති ඉතා විස්මය යැ. මෙසෙ සමථී වූ පරමෙඤ්චරභාව ඇති දු කලැ ඉතා තීව්‍ර වූ මාගෙ අපරාධයට ක්ෂමා කෙරෙයි, මා වැනි මානාභිමානයෙන් උදහා ගිය සිත් ඇති වැ කරනලද මහත් වරද ඇතියවිහු කෙරෙ ක්‍රෝධ නො කෙළෙ යැ. සෙස්සන් කෙරෙහි මෛත්‍රීභාවනා කිබඳුය හොත්" යි පැහැද "අද පටන් ගෙන දිවි පියමිනි දු තා සරණ නො පියමි" යි තුනුරුවන් සරණ ගියෙ.

බුදුහු උහු කෙරෙහි කුලුණු කොට උහුට පන්සිල් වදාළහ. නාරජු ද "ඉතා මැනැවැ වහන්සෙ" තොප මට අනුශාසනා කරව. වදාළ සෙයෙකින් පිළිපදිමි" යි සිල්සමාදන් වැ සුගතානු ශාසනා නමැති ගිරුරසින් විරලභාවයට ගිය මොහදුරු ඇති

කල්හි නුවණැසින් බලනුයෙ කාමයෙහි ආදීනව දැක "මා යටත්වූ තිරිසන්යොන ද සිට මාගෙ පමණ නො දැන්ම ඉසුරුමදයෙහි සිටියෙන් කැරුණෙ යැ. ඉතා කෂ්ට ය ඵෙශ්වර්‍යමදය" යි ගරහා "දැන් මෙ බුදුරජහු කරා එළඹ මාගෙ පමණ දත්මි. මුහු පෙරට මාණවකරූපයෙන් සිටිනෙ හරසර නො වෙ" යි බුදුන් කෙරෙ බුහුමනින් කුඩා නාරජරූපයක් නිර්මාණ කොට ගෙන බුදුන් පෙරට හොත්තෙ යැ.

එකල්හි බුදුහු උහු රජ්ජුකුණ්ඩලයක්සෙ නාගදන්තයෙහි ගන්වාලා සර්‍රාත්‍රියෙහි සමාපත්තිසුඛයෙන් දවස් යවූ.

උරුවෙලකාශ්‍යපාදි තාපසයො වනාහි බුදුන් ගිනිහලට වන් තැන් පටන් ගෙන "නාරද මහමහණහට කුමක් කෙරෙ හො?" යි සිතා නිදි නො ලබන්නාහු පන්සිල් දිලී ගිය කලැ "එවැනි යහපත් මහමහණ නාරජහු විසින් හළ කොට පියනලදැ" යි තමන් තමන්ගෙ පන්සලින් නික්මැ බලවත් සුළඟින් උදහනලද දුම්සිළු හා ගිනිසිළින් වැද වැලඳගත් ගිනිහල දැක එහි ඇතම් කෙනෙක් වතුරුගත් ගිනිදල බලා කප් නස්නා කල් අසම්ප්‍රාප්ත ද වුව කප් ගිනියයි සිතූහු. ඇතම්කෙනෙක් දෙහොඅතින් මුහුණු පියාලා රහැණි වැ සිටියො. ඇතම්කෙනෙක් කෙළෙන් අළ දියෙන් ගිනිසිළු නිවන්නට ආරම්භ කොළො.

ඔහු හැමදෙන මැ නොසන්හිඳිවියහැකි ගිනිදල බලා බුදුන්ගෙ රූපසම්පත් සිහිකොට රහැණි වැ ගිනිහල්වටා හිරු නැගෙන තැන් දක්වා සිටියො. එක්බිති විවර්‍ත කල්පයෙහි වස්නා සලිලධාරා නිපාතයෙන් සන්හිඳුවනලද යුගත්ගිනි සෙයින් ගිනිසිළු නිවී ගිය කල්හි සරාවලාකලබක් සෙයින් සුධාධවල වූ ගිනි දෙවොල දැක නොදැගිය සෙයට විස්මපත් වූහු.

එහි ඇතමිකෙනෙක් "මහමහණ මෙහි ඇත හො? නැත හො?"යි කීහ. තුබූවො "එ පිළිවිස දතමනා ද? අප නාරජහු වසගොර පරිදි නො දන්ව? හෙ බැල්මෙන් මැ භස්මීභූත කරන්නට නිස්සැ ඔහු ක්‍රොධයෙන් නිඃශ්වසිත වූ විෂ වෙගානලජ්වාල ඇති කලැ මහමහණ කුමට නො නැස්ණැ?"යි කීහු.

එසඳ බුදුහු සමවත්නෙන් නැඟී දලවුලත්ලෙන් නාරජහු ගෙන අත්ලෙ අවුදු තුබූ පයැ බහාලා සවනක් රස් වුහුටහ.

එයින් කීහ:-

429. "නීලා අථ ලොහිතිකා
මඤ්ජෙට්ඨා පිතිකා එළිකවණ්ණායො
අඩ්ගීරසස්ස කායෙ
අනෙකවණ්ණා අච්චියො හොන්ති"යි.

මෙසෙයින් සවනක් රස්හු විවර වැ ගිය පන්සල්දෙරින් නික්මැ "භවත් ජටිලයෙනි. 'නා රජහු විසින් බුදුගුරු එරජහු නටහ"යි නො සිතව, ඔහුගෙ වෙසෙස් බලව" යන්නවුන් සෙයින් ඔබින් ඔබ දිවෙති; ඔබින් මොබ දිවෙත්. එකල්හි තවුසො අසපු මහවිල්හි බුදුරජ නමැති හිරුහුගෙ රසින් පුබුදු වුවන්පියුම් ඇති වැ ලොමුදහගත් සිරිරුනෙන් නෙළුඹුදඩුසිරි උසුලමින් සොම්නසින් විසල්නුවන්මහනෙලින් බලනුවො තෙජ නමැති නිය පදුරෙන් මන් නමැති මතැත්කුඹු පළනුවට පන්වල් නමැති ගිරි ලෙනින් නික්මෙන බුදු නමැති කෙසරසිංහරාජයා දැක විස්මිත වැ ගුගුරා බුදුන් කරා එළඹැ මෙරපිරිවර වැ සිටි තරුවැළ සෙයින් බුදුන් පිරිවරා සිටියො.

එසඳ "උරුවෙල්කසුප්" නම් ඍෂි සවනක් රසින් දිලියෙන බුදුන් දැක පහන්සිතින් මෙවැනි පෙළහර නැති, එවැනි වසගොර නාරජ මහමහණහට කිසිදැයක් නො කටහිණැ"යි සිතී. එකලැ බුදුහු පය හොත් නහි ඇඟිල්ලෙන් ගෙන ඔසවා පෑ "කස්බ තා කියන වසගොර නාරද මා විසින් ගැඩහුලකු සෙයින් නිර්විෂ

කරනලදැ" යි වදළහ. හෙ "මෙසෙ වන්නෙ නො වෙයි මෙ මහමහණ සෘද්ධි ඇතියෙ යැ. අනෙක් නාරජරුවක් මවා පය බහාලා අප හදහව" යි කී.

එකල්හි නාරජ බුදුරජහුගෙ පයින් බැස හැම මනදොළ පුරනුවට සිත්මැණ වූ සරණතල හිස තබාගෙන "මෙවැනි සියුමැලි බුදුරජහු විසින් මා සඳහා හුණුවැලි මඩමින් මෙයට වඩනාලදැ"යි තමාකෙරෙ කළ කුලුණු සඳහන් කොට සියුම්රත්පලස්හූ බඳු දෙදිවිත් බුදුන්පතුල් පිස්මින් සිටියෙයි. ඒ විසමය දැක තවුසො බුදුන් කෙරෙ පැහැද පැවිදිවියටි වූහ. "උරුවෙල්කසුප්" නම් සෘෂිහි ඔවුන් පහන්බවි දැන "ඉදින් මම් මෙ භවත්හු සරණ ගියෙමි නම් මෙ හැම තවුසො මා පියා පැවිදි වෙති, එවට මාගෙ යසස් පිරිහෙයි. ඔය මොවුන් වඤ්චා කළ මැනවැ" යි සිතාගෙන "මහමහණ මහත් සෘද්ධි ඇත්තෙ යැ, මහත් ආනුභාව ඇත්තෙ යැ, මා සෙ නො රාත්මත්නැ" යි[1] කී. ඔහු මියෙන් ගුව මෙවැනි අවිඥා හා මුසුතෙපුල් බුදුරජහුගෙ කන්මහට වැද මහකුලුණු වසන ළෙහි නො සිටියහි පිටුගත්. බුදුන්ගෙ මෙ පෙළහරයෙන් පහන් "උරුවෙල්කසුප්" නම් සෘෂි ඒද, බුදුන් සතප්වා "මහමහණ, මෙහි මැ වසා; මම බත් දෙමි" යි බුදුන් පවරාගත.

බුදුන් කෙලෙස් නමැති රොගයෙන් පෙළෙනලද විනෙජන නමැති සුතනට දහම් නමැති අගදයෙන් පිළියම් කටටිවැ තවුසන් රැ දුවල් දක්නා සඳහා අසපුවට නුදුරු වනළැහැබෙක්හි වෙසෙමින් උපස්ථානයට ආ සතර වරම්මහරජහුද් සක්දෙවි රජහුද් මහබඹහුද් දැක්වූපරිදි; යාග කරන දවස් ඔහුගෙ අධ්‍යාශය දැන උතුරුකුරුදිවින් පිණ්ඩපාත ඇරැ අනුතත්විල්තෙරැ හිඳ වළඳ, එහි මැදිවාවිහාර කළ පරිදි; පාංශුකූලචීවරය උපන්දවස් ගත්‍රදත්ත පුෂ්කරිණීය ද් සලඅවුණුව ද් අවතත කුඹුක්[2]

---

[1] රාත්මත්හයි A  [1] රාත්මත්නැයි E  [2] කුඹුක් E

ශාඛාව ද් ශබ්දත්තගිලාතලය ද් දැක්වූ පරිදි; එක්බිති අමා මහදඹ අමාඅඹ අමාඇඹුලු අමාඅරට පරසතුමල් ඇර දැක්වූ පරිදි; ඉක්බිති පන්සියක් තවුසන් අග්නිපරිචර්‍යාවට පළන දැර "නො පැළෙවයි" ඉටා පන්සියක් පෙළහර දැක්වූ පරිදි; "පැළෙවයි" ඉටා පන්සියක් පෙළහර දැක්වූ පරිදි; "ගිනි නො දිලියෙවයි" ඉටා පන්සියක් පෙළහර දැක්වූ පරිදි; "දිලියෙවයි" ඉටා පන්සියක් පෙළහර දැක්වූ පරිදි; "ගිනි නො නිවෙවයි" ඉටා පන්සියක් පෙළහර දැක්වූ පරිදි; "නිවෙවයි" ඉටා පන්සියක් පෙළහර දැක්වූ පරිදි; පිනි බස්නා වේලෙහි දියෙහි ගැලි නැඟි පන්සියක් තවුස්නට අඟුරු මවා පෑ පන්සියක් පෙළහර දැක්වූ පරිදි; එපියෙස් මැඩගෙන යන මහවතුරෙහි හාත්පස්හි දිය පිළිමිණිබිත් සෙ සිටුවා මැද රජ මුසු බිමැ සක්මන් කළ පරිදි විනයෙහි කී නියාෙයන් දන්නෙ යැ.

මෙයැ "අනෙකප්‍රාතිහාර්‍යසහස්‍ර"නමි.

<u>ධම්දෙශනා</u> නමි කවර යත්?

මෙසෙ බුදුහු එහි තුන්මසක් වැස තුන්දහස් පන්සිය සොළොස් ප්‍රාතිහාර්‍යයක් දක්වා ජටිලසහස්‍රයන් විනය කොටැ එහි භික්ෂුභාවයෙන් පැවිදි දී ඔවුන් පිරිවරා උරුවෙලායෙන් නික්මැ "ගයා" නමි නිගමයකට එළැඹැ "ගයාශීර්‍ෂ" නමි ගිරිතලායෙහි වැඩහිඳ ඔවුන්ගෙ කෙලශජටාවන් විජටන විධ්වංසන කෙරෙමින් "ආදිත්තපර්‍යාය" සූත්‍ර[1] දෙසූහු.

මෙයැ "ධම්දෙශනා" නමි.

මෙසෙයින් බුදුහු අනෙකප්‍රාතිහාර්‍යසහස්‍රයෙන් හා ධම් දෙශනායෙන් ජටිලයන්ගෙ අන්තර්ජටා ද බහිර්ජටා ද විජටන විධ්වංසන කොළෝ.

---

[1] සූත්‍රCDE

(85). සිඛණ්ඩිමණ්ඩලා රද්ධනච්චං යන තන්හි එ වනය මයූරයන් විසින් ආරම්භ කරනලද නැටුම් ඇතිපරිදි කිසෙ යැ යත්?

ඔවුනට සුනිල් සාමඩුලු මැ නිල්වලා සෙ පැනෙයි; පලු දල මැ විදුලිය සෙ පැනෙයි; ගැළ බස්නා[1] කුසුම් මැ පොද වහරෙ සෙ පැනෙයි; බමර ගිගුම් මැ ගනගැජුම් සෙ දැනෙයි. මෙසෙයින් "එ වනය මයූරයන් විසින් ආරම්භ කරනලද නැටුම් ඇති" වී.

---

(86). රාජගහනගරං යන තන්හි "රජහහා" නම් කවර යත්?

"ඉසිගිලි" නම් "වෛපුල්‍ය" නම් "වෛභාර" නම් "පාණ්ඩව" නම් "ගෘධ්‍රකූට" නම් පඤ්චපර්වතරාජයන්ගෙ අභ්‍යන්තර වන බැවින් "රාජගෘහ" වෙමයැ. එම පඤ්චපර්වතරාජයන් විසින් අධිගෘහිත වන බැවින් "රාජගෘහ" වෙ ම යැ මන්ධාත්‍රාදි මහෙශාක්‍ය රාජයන්ගෙ ගෘහ වන බැවින් "රාජගෘහ" වෙ ම යැ. රජුන් විසින් පරිගෘහිත වන බැවින් "රාජගෘහ" වෙ ම යැ. රජගෙ හා සමාන ගෘහ එහි ගැහැවියනට ද වූ වන බැවින් "රාජගෘහ" වෙ මැයි.

එකල්හි එනුවර අෂ්ටාදශකොටියක් මනුෂ්‍යයනට ආවාස යැ. අශීතිසහස්‍රයක් නියමිගමින් පිරිවරන ලද්දෙ යැ. තුන්සියක් යොදුන් අඟු මගධ දෙරටින් අවුදු වදනා සම්පතට ද්වාර යැ. පසළොස්හැවිරිදි කලැ රජ වැ එක්විසිහැවිරිදි කලැ[2] සෝවාන් වැ සත්තිස් හවුරුද්දක් බුදුනට උපස්ථාන කළ බිම්බිසාර නරපතිහි විසින් අධිෂ්ඨිත යැ. පැසුළු ධම්සෙනෙවි සැරියුත් මහතෙරුන් විසින් එනුවර වටා වෙළුවනජීවකම්බ වනාදි අෂ්ටාදශ මහාවිහාරයන් ඇතුළු කොට තුන්යොදනක්

---

[1] වස්නා BEF [2] එක්තිස්ඇවිරිදිකලැ G

තන්හි සීමා බද්දෙයි[1]. හෙ බුදුන් දවස ද සක්විත්තන් දවසද නුවර වෙයි; සෙසුකල් සිස් වැ යක්‍ෂාධිෂ්ඨිත වැ ඔවුනට වසන්න වනයක් සෙයින් සිටී.

මෙයැ "රජගහා" නමී.

---

(ප'7). වෙළුවනාරාමං යන තන්හි "ආරාම" නම් කවරේ යත්? එහි ආරමණය අභිරමණය කරන්නෙන් "ආරාම" නම් වී.

එයින් කිහ:-

430. "ආරමන්ති එත්ථ පාණිනෝ විසෙසෙන වා පබ්බජිතාති ආරාමෝ, තස්ස පුප්ඵඵලාදිසොභාය වෙව නාතිදූර නාච්චාසන්නාදිපඤ්ච විධ සෙනාසනඩහසම්පත්තියා ච තතෝ තතෝ ආගම්ම රමන්ති අභිරමන්ති අනුක්කණ්ඨිතා හුත්වා නිසන්නිති අත්ථෝ; වුත්තප්පකාරාය වා සම්පත්තියා තත්ථ තත්ථ ගතෙපි අත්තනෝ අබ්භන්තරෙ යෙව ආනෙත්වා රමෙතීති ආරාමෝ" යි.

මෙයැ "ආරාම" නමී.

---

(ප8). සොපි ගන්ත්වා දසබලධම්මදෙසනං සුත්වා යන තන්හි ධර්ම දෙසුන් අසා රාත් වූ දසදහස්හු අවකුජ්ජපඤ්ඤ උජ්ඣඝ පඤ්ඤ පුථුපඤ්ඤ යන තුන්පුඟුලන් කෙරෙහි තුන්වන පුඟුලොයි. ඒ තුන්පුඟුලන්ගෙ විභාග කිසෙය[2] යත්? ඔවුන් කෙරෙහි අවකුජ්ජ පඤ්ඤයා අසන බණ කිඹිසිනි කොට තුබූ කළපත්ලෙහි ඔත් දිය සෙයින් ඔහු හෘදයට මැ නො වැද යෙ.

---

[1] බැන්දෙයිDE [2] කවරේDE

එයින් වදාළහ:-

431. "සෙය්‍යථාපි භික්ඛවෙ කුම්භො කික්කුජ්ජො තත්ථ උදකං ආසිත්තං විවට්ටති, නො සණ්ඨාති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති අභික්ඛණං භික්ඛූණං සන්තිකෙ ධම්මසවනාය. තස්ස භික්ඛූ ධම්මං දෙසෙන්ති ආදිකල්‍යාණං මජ්ඣෙකල්‍යාණං පරියොසානකල්‍යාණං, සාත්ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං බ්‍රහ්මචරියං පකාසෙන්ති. සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය නෙවාදිං මනසි කරොති, න මජ්ඣං මනසි කරොති, න පරියොසානං මනසි කරොති; වුට්ඨිතොපි තම්හා ආසනා තස්සා කථාය නෙවාදිං මනසි කරොති, න මජ්ඣං මනසි කරොති, න පරියොසානං මනසි කරොති අයං වුච්චති භික්ඛවෙ අවකුජ්ජපඤ්ඤො පුග්ගලො" යි.

උච්ඡඩගපඤ්ඤයා අසන බණ හිඟ එවගෙන නැඟී සිටිකලැ වැම්හ[1] යන කනදෑ සෙයින් යෙයි.

එයින් වදාළහ:-

432. "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසස්ස උච්ඡඩෙග නානාධජ්ජකානි ආකිණ්ණානි:- තිලා තණ්ඩුලා මොදකා බදරා. සො තම්හා ආසනා වුට්ඨහන්තො සතිසම්මොසා පකිරෙය්‍ය. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො පුග්ගලො ආරාමං ගන්තා හොති - පෙ - සො තස්මිං ආසනෙ නිසින්නො තස්සා කථාය ආදිම්පි මජ්ඣම්පි පරියොසා නම්පි මනසි කරොති. වුට්ඨිතොව ඛො තම්හා ආසනා තස්සා කථාය නෙවාදිං න මජ්ඣං න පරියොසානං මනසි කරොති. අයං වුච්චති භික්ඛවෙ උච්ඡඩග පඤ්ඤො පුග්ගලො" යි.

---

[1] වම්හDE

පුථුපඤ්ඤා අයන බණ උඩුකුරු කොට තුබූ කෙළෙහි ඔත් දිය සෙයින් සිටි; නො වැවිහෙයි.

එයින් වදාළහ:-

433. "සෙය්‍යථාපි භික්ඛවෙ කුම්භෝ උක්කුජ්ජෝ තත්‍ර උදකං ආසිත්තං සණ්ඨාති, නො විවට්ටති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චෝ පුග්ගලෝ ආරාමං ගන්ත්වා හොති - පෙ - සෝ තස්මිං අයනෙ නිසින්නෝ තස්ස කථාය ආදිම්පි මජ්ඣම්පි පරියොසානම්පි මනසි කරොති. වුට්ඨිතොපි තමෙව ආසනා තස්ස කථාය ආදිම්පි මජ්ඣම්පි පරියොසානම්පි මනසි කරොති. අයං වුච්චති භික්ඛවෙ පුථුපඤ්ඤ පුග්ගලෝ" යි.

---

(සෙ). දෙව තව පුත්තෝ යන තන්හි "දෙව" ශබ්දය "ඉමානි තෙ දෙව චතුරාසීති නගරසහස්සානි කුසාවතිරාජධානිපමුඛානි" යන තන්හි සෙයින් සංවෘතිදෙවයන් කෙරෙහි වැටෙයි. මෙයින් බැහැර "චාතුම්මහාරාජිකා දෙවා වණ්ණවන්තෝ සුඛබහුලා" යන තන්හි උපපත්ති දෙවයන් කෙරෙහි වැටෙයි. "තස්ස දෙවාති දෙවස්ස සාසනං සබ්බඤ්ඤිනෝ" යන තන්හි විශුද්ධිදෙවයන් කෙරෙහි වැටෙයි.

---

(ඉ0). නතෙ පුත්ත වංසෝ යන තන්හි පෙදෙන් පර "තෙ" ශබ්දය "කිත්තෙ වතං කල්පන බ්‍රහ්මචරියං" යන තන්හි සෙයින් සම්මාඅර්ථයෙහි වැටෙයි. මෙයින් බැහැර "න තෙ සුඛං පජානන්ති යෙ න පස්සන්ති නන්දනං" යන තන්හි ප්‍රථමාර්ථයෙහි වැටෙයි. "උපධී තෙ සමතික්කන්තා ආසවා තෙ පදාලිතා"

යන තන්හි කරණාර්ථයෙහි වැටෙයි. "නමො තෙ බුද්ධවීරත්ථු" යන තන්හි සම්ප්‍රදානාර්ථයෙහි වැටෙයි.

---

(๑1). <u>මහාපජාපතියා ගොතමියා</u> යන තන්හි ඇය "මහා ප්‍රජාපතී" නම් වූ පරිදි කිසෙ යෑ යත්? හෙ දෙවදහ නගරයෙහි "සුප්‍රබුද්ධ" නම් ශාක්‍යයන් වූව. මහාමායාදෙවීන් නහ. ඇයගෙ ලක්ෂණ බලා නෛමිත්තිකයෙ මහත් වූ උදාරතර වූ ප්‍රජාවන් ජනන ද පාලන ද කරන පරිදි කීහ. එසින් ඇය "මහාප්‍රජාපතී" නම් කළහ.

පැසුව සුදොවුන් මහරජාණෙ මහාමායාදෙවී මහාප්‍රජාපතී දෙබිහින්නන් "චත්‍රවර්ති වන පුතුන් ලැ බෙති" යි යනු අසා ගෙන්වා ගෙන මහත් යසස් දී තමන්ගෙ රජ්ජගහි වාස කැරැවූහු. පැසුව අප මහසත්හු තුසිපුරෙන් සැවැ මහාමායාදෙවීන් කුසැ පිළිසිඳගෙන උපන් සත්දවසින් දෙවී මිය තුසිපුර ගියහ. එකල්හි සුදොවුන් මහරජාණන් විසින් අගමෙහෙසුන් තන්හි තබනලද මහාප්‍රජාපතී ගොතමීහි[1] තමන් කුසින් උපන් මහාපුරුෂ ලක්ෂණොපෙත නන්ද කුමරහු කිරීමවුනට දී තුමූ තමන් තෙනෙන් මහසත්හු කිරී පොවා වැඩූහු.

මෙසෙයින් මහත් වූ ප්‍රජාවන් ජනන ද් පාලන ද් කරන්නෙන් "මහාප්‍රජාපතී" නම් වූ. "ගොතමී" යනු ගොත්‍රනාම යි.

---

(๑2). <u>බහූපාකාරං පරිදෙවිත්ථා</u> යන තන්හි ඇය පරිදෙවනා කරන පරිදි කිමස යෑ යත්?

---

[1] ගොතමීහිF

"තොප මහමිදිබිමන[1] ඇතියන් සිරිරින් සවනක් රස්හු වැහෙනු, සරණතලට මුවරදබර මහපියුම් පිපෙනු, මහපොළොවි ගුගුරනු, මහමුහුදු උතුරනු, මෙරමදුරු නටනු[2], නුබකුස් සසලනු, මුරුබෙර රවනු, රන්සුනු විසිරෙනු, මදමරු හමනු, සුරසෙමෙර විදුනා, දෙවිබඹනාකිඳුරුගුරුඑමුළු පැතිරෙනු, තියුගොස් ගත් ලියගී හිවෙනු[3], දෙවිසරසහස් නටනු, පුදවහරෙ වස්නා, මල් දම් ලළනු, අබරණ ඉස්නා, මිණිකිකිණි රවනු, දදදහස් කෙළනා, දසහස් වැජඹෙනා දුටු ජනයො ඇසුරු කළවුන් කිසෙ නම් නොපියනුවහ?" යනාදීන් පරිදෙවනා කළා.

---

(93). <u>වෙදනාපරිපීළිතා</u> යනුයෙන් සියල් සිරිරු සනහමින් ශතධොත වළඳනකලක් සෙයින් ශතපාකතෙල් ගල්වන කලක් සෙයින් ඝටසහස්‍රයෙකින් පරිදාහ නිවන කලක් සෙයින් "අහො සුඛං අහො සුඛං" යනු කියවමින්[4] උපදනා සුඛවෙදනා යැ, සියල් සිරිරු සන්තප්ත කෙරෙමින් තප්තඵාලප්‍රවෙශ කරන කලක් සෙයින් විලීනතාම්‍රලොහොදකයෙන් ආසික්ත කල් සෙයින් ශුෂ්ක තෘණවෘක්ෂ ඇති අරණ්‍යයෙහි ගිනි අවුළුවන කල් සෙයින් "අහො දුක්ඛං අහො දුක්ඛං" යනු කියවමින්[4] උපදනා දුඃඛවෙදනා යැ, සුඛදුඃඛදෙනාවන් සෙයින් උත්පත්තීන් අප්‍රකට වැ සුඛදුඃඛයන්ගෙ අපගමයෙහි සාතාසාතප්‍රතික්ෂෙප විසින් මැදහත් වැ අදුඃඛ වැ අසුඛ වැ උපදනා උපෙක්ෂාවෙදනා යැ, යන ත්‍රිවිධවෙදනාවන් මධ්‍යයෙහි වියොගනිදාන වූ කායික චෛතසික දුඃඛවෙදනායෙන් පීඩිත සෙ කීහු.

(94). <u>විරහදහනං</u> <u>නිබ්බාපෙත්වා</u> යන මෙයින් බුදුන් ඔවුන්ගෙ ශොකතානව කළ පරිදි දැක්වූහ. ඔව්හු වනාහි පැසුළු ජනවි

---

[1] මහමින්දිබිමන ABF
[2] නටවනු CD
[3] වනු B
[4] කියමින් BCD

කුලුණු[1] තෙරින් තෙරෙ පැවිදී වැ පිළිසැඹියාපත් රාත් වැ සවී ශොක සමුච්ඡේද කොට අභිඥායෙහි වීණීවඝිතා වැ හුනස්නෙහි හිඳ එකාවජීනයෙන් එකාසඬ්ඛ්‍ය ලක්ෂයක් කප් දක්නා හු මහාභිඥා ප්‍රාප්ත තෙරීවරුන් තෙරෙහි අග්‍රපදප්‍රාප්ත වූහු.

---

(95). පඤ්චකල්‍යාණොපෙතාය යන තන්හි "පඤ්චකල්‍යාණ නම් කවරේ යත්? කෙශකල්‍යාණ යැ, මාංසකල්‍යාණ යැ, අස්ථිකල්‍යාණයැ, ජවිකල්‍යාණ යැ, වයෝකල්‍යාණ යැ, යන මෙ යි.

එහි කෙශයෝ මොනරපිල්කලබක් සුදුසු වැ මුදු විහිද පිවාහු උකුලෙහි පැහැර නැවත ඇඟින්[2] නැමී උඩු බලා සිටිති - මෙ කෙශකල්‍යාණ යැ.

ඔඬයෝ බිම්බඵල[3] යෙසින් වණීසම්පන්නවැ යම වැ සුපිහිත වැ සිටිති - මෙ මාංසකල්‍යාණ යැ.

දන්තයෝ සුදු වැ සම වැ අවිවර වැ ශොභා තුබූ විදුරු පෙළක් යෙසින් සම කොට කැපූ සක්පතක් යෙසින් හෝ සොබිති - මෙ අස්ථි කල්‍යාණ යැ.

කැලියට යෙසු පැහැ හා නුමුසු වූ සිනිදු වූ මහනෙල් මල්දම් සුදුසු සිවිපැහැ වෙයි; හෙළිල්ලට එසෙයින් මැ කිණිහිරි මල්දම් සුදුසු සිවිපැහැ වෙයි - මෙ ජවිකල්‍යාණ යැ.

දරුවන් දසදෙනකු ලදු ද එකදරුවකු ලද්දියක යෙසින් නොනට යොවුන් ඇති වෙයි, එක්සියවිසිහැවිරිදි දු වුව සොළොස් හැවිරිදි වයස් වෙයි, - මෙ වයෝකල්‍යාණ යි.

මෙයැ "පඤ්චකල්‍යාණ" නම්.

---

[1] කැපුණු B [1] දන්විකලණ AF [2] ඇඟින් CDEF [3] බිම්බිවල EF

(96). <u>සවායං</u> <u>නන්දකුමාරො</u> යන තන්හි නන්ද කුමරහු පැවිදි කළ කලැ ජනවිකුලුණු[1] කුමක් කළා යැ යත්? මහාප්‍රජාපති ගොතමීන් කෙරෙහි පැවිජි වැ "බුදුන් රූපයෙහි දොස් දක්වති" යනු අසා බුදුන් කරා නො එළඹැ රූමෙදෙන් මත් වැ වසන්නි බුදුන්ගෙ ආඥායෙන් ගොස් බුදුන් දැක බුදුනට තල්වැටක් සලමින් සිටි බුදුන් විසින් නිර්මිත දිව්‍යකන්‍යාවක බඳු අභිරූපස්ත්‍රියක දැක ඇය නවයොවනයෙහි සිට ක්‍රමයෙන් වෘද්ධියට ගොස් ජරාක්‍රාන්ත වැ වෙවුලා වැටී හුණු[2]සෙ බලා සංවෙග ජනවා රහත් වැ ධ්‍යානා භිරත වැ ධ්‍යායිනින් කෙරෙහි අග්‍රපදප්‍රාප්ත වූ.

(97). <u>නයසහස්සපති මණ්ඩිතං</u> <u>සත්තහවාලඞ්ඝනියං</u> <u>සොතා</u> <u>පත්තිඵලං</u> යන තන්හි "නයසහස්‍ර" නම් කවර යත්?

434. "යස්මිං සමයෙ ලොතුත්තරං ඣානං භාවෙති නිය්‍යානිකං අපචයගාමිං දිට්ඨිගතානං පහානාය පඨමාය භූමියා පත්තියා, විවිච්චෙව කාමෙහි විවිච්ච අකුසලෙහි ධම්මෙහි සවිතක්කං සවිචාරං විවෙකජං පීතිසුඛං පඨමජ්ඣානං[3] උපසම්පජ්ජ විහරති දුක්ඛාපටිපදං දන්ධාභිඤ්ඤං, දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං, සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං, සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං. තස්මිං සමයෙ එස්සො හොති" - යනාදීන් දෙශිත වූ සුද්ධිකපටිපදයෙහි ධ්‍යානයන්ගෙ චතුෂ්කපඤ්චකවිසින් දෙනයෙක් වෙයි, චීතියද්ධ්‍යා නාදියෙහි ද් මෙතෙක්ම යැ.

"යස්මිං සමයෙ - පෙ - උපසම්පජ්ජ විහරති සුඤ්ඤතං. තස්මිං සමයෙ එස්සො හොති" යනාදීන් දෙශිත වූ සුද්ධික සුඤ්ඤතායෙහි දු චතුෂ්කපඤ්චක විසින් දෙනයෙක් වෙයි.

---

[1] කැලුණුB [1] දනවිකලණAF [2] හුණුවාCDE

[3] පඨමං ඣානංAB

"යස්මිං සමයෙ - පෙ - උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං, දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඤ්ඤතං, සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං සුඤ්ඤතං, සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං සුඤ්ඤතං. තස්මිං සමයෙ ඵස්සො හොති" - යනාදීන් දෙශිත වූ සුඤ්ඤතාපටිපදයෙහි ද් චතුෂ්කපඤ්චකවිසින් දෙනයෙක් වෙයි.

"යස්මිං සමයෙ - පෙ - උපසම්පජ්ජ විහරති අප්පණිහිතං තස්මිං සමයෙ ඵස්සො හොති" යනාදීන් දෙශිත වූ සුද්ධික අප්පණිහිතයෙහි ද් චතුෂ්කපඤ්චකවිසින් දෙනයෙක් වෙයි.

"යස්මිං සමයෙ - පෙ - උපසම්පජ්ජ විහරති දුක්ඛා පටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං, දුක්ඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පණිහිතං, සුඛාපටිපදං දන්ධාභිඤ්ඤං අප්පණිහිතං, සුඛාපටිපදං ඛිප්පාභිඤ්ඤං අප්පණිහිතං තස්මිං සමයෙ ඵස්සො හොති" යනාදීන් දෙශිත වූ අප්පණිහිතපටිපදයෙහි ද් චතුෂ්කපඤ්චකවිසින් දෙනයෙක් වෙයි.

මෙසෙයින් "සුද්ධිකපටිපදා යැ, සුද්ධිකසුඤ්ඤතා යැ, සුඤ්ඤතාපටිපදා යැ, සුද්ධිකඅප්පණිහිත යැ, අප්පණිහිතපටිපදා යැ" යන මෙ පස් කොටස්හි එකෙකි කොටසැ චතුෂ්ක පඤ්චක විසින් දෙ දෙ නය බැවින් ලොකොත්තරධ්‍යානයෙහි එව දසනයෙක් දක්වන ලද. එසෙයින් මැ.

"ලොකුත්තරං මග්ගං භාවෙති - ලොකුත්තරං සති පට්ඨානං - සම්මප්පධානං - ඉද්ධිපාදං ඉන්ද්‍රියං - බලං - බොජ්ඣඞ්ගං - සච්චං - සමථං - ධම්මං - ඛන්ධං - ආයතනං - ධාතුං - ආහාරං ඵස්සං - වෙදනං - සඤ්ඤං - චෙතනං - චිත්තං භාවෙති" යනාදි ක්‍රමයෙන් දෙශිත වූ මාර්ගාදීන් කෙරෙහිදූ චතුෂ්ක පඤ්චක විසින් දෙ දෙ නය වෙ.

කියෙ මෑ නො:-

436. "යථෙව ලොකම්හි විපස්සි ආදයො
සබ්බඤ්ඤුභාවං මුනයො ඉධාගතා
තථා අයං සක්‍යමුනීපි ආගතො
තථාගතො වුච්චති තෙන චක්ඛුමා" යි.

යම්සෙ පූර්වබුදුයෝ පශ්චිමභවයෙහි මවුකුසින් ප්‍රසූත වූ විගසෑ සප්තපදව්‍යතිහාර කොට උත්තරදිශාභිමුඛ වැ ගත වූහු ද. ඒ සෙයින් මෑ මෙ බුදුරජ ද ගත යෑ. එයින් "තථා ගතොති තථාගතො" යනු වී.

කියෙ මෑ නො:-

437. "මුහුත්තජාතොව ගවම්පති යථා
සමෙහි පාදෙහි වුසී වසුන්ධරං
සො වික්කමී සත්ත පදානි ගොතමො
සෙතඤ්ච ඡත්තං අනුධාරයුං මරූ.

ගන්ත්වාන සො සත්ත පදානි ගොතමො
දිසා විලොකෙසි සමා සමන්තතො
අට්ඨඞ්ගුපෙතං ගිරමඤ්ඤුදීරයි
සීහො යථා පබ්බතමුද්ධනිට්ඨිතො" යි.

නොහොත් - පූර්වබුදුයන් සෙයින් මෑ නෛෂ්ක්‍රම්‍යාදි කුශල ධර්මයෙන් කාමව්‍යාපාදාදි අකුශලධර්මයන් පහමින් ගොස් අග්‍රමාර්ගයෙන් සර්වක්ලෙශයන් උන්මූලන කොට ගත වී නුයි[1] තථාගත වෙ මෑයි.

---

[1]ගතවීනොයිCD

කියෙ මැ නො:-

438. "යථෙව ලොකම්හි විපස්සි ආදයො
සබ්බඤ්ඤු බුද්ධා අථියෙන සෙතුනා
පහාය පාපං කුසලං සිවං ගතා
ගතො තථායම්පි තතො තථාගතො" යි.

පාථිව්‍යාදි ධාතූන්ගෙ කාඨින්‍යාදි තථ අවිපරීත ලක්ෂණයනට ඥානගතින් ආගත වන බැවින් "තථ ලක්ඛණං ආගතොති තථාගතො" යනු වී.

කියෙ මැ නො:-

439. "අනත්තධම්මා නමනත්තලක්ඛණං
තථාසභාවං පථවිජඩියාගතො
යතො තතො සක්‍යපුත්තො මහාපඤ්ඤා
තථාගතො හොති අයං මහාමුනි" යි.

"ඉදං දුක්ඛන්ති මෙ භික්ඛවෙ තථමෙතං අවිතථමෙතං අනඤ්ඤථමෙතං" යන සූත්‍රයෙහි සෙයින් තථධර්මයයි කියනලද සතර ආර්‍යසත්‍යයන් යථොක්ත ක්‍රමයෙන් දත් වන බැවින් "තථ ධම්මෙ යථාවතො අභිසම්බුද්ධොති තථාගතො" යනු වී.

කියෙ මැ නො:-

440. "චත්තාරි සච්චානි තථානි නාථො
යථාවතො බුජ්ඣි මහෙසි යඤ්ඤා
තස්මා අයං බුද්ධබුද්ධො සයම්භූ
තථාගතො හොති දයානුවත්තී" යි.

අපර්‍යන්ත ලොකධාතුවැ අපරිමාණ සත්වයන්ගෙ චක්ෂුරාදි ෂඩිවිධද්වාරයට විෂය වූ රූපාදි ෂඩාලම්බනයන්ගෙ තථස්වභාව අවිපරිත කොට දුටු වන බැවින් "තථදස්සිතාය තථාගතො" යනු වී.

කියෙ මැ නො:-

441. "අනන්ත ලොකස්ස යමත්ථි දිට්ඨං
සුතං මුතඤ්චව තථෙව ඤාතං
සම්මාභිසම්බුද්ධමනෙන තම්පි
තථාගතො හොති තතො ච බුද්ධො" යි.

එයින් වදාළහ:-

442. "යං භික්ඛවෙ සදෙවකස්ස ලොකස්ස සමාරකස්ස සබ්‍රහ්මකස්ස සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය දිට්ඨං සුතං මුතං විඤ්ඤාතං පත්තං පරියෙසිතං අනුවිචරිතං මනසා, සම්මා තං තථාගතෙන අභිසම්බුද්ධං. තස්මා තථාගතොති වුච්චති" යි.

443. "යඤ්ච වුන්ද රත්තිං තථාගතො අනුත්තරං සම්මා සම්බොධිං අභිසම්බුජ්ඣති, යඤ්ච රත්තිං අනුපාදිසෙසාය නිබ්බාන ධාතුයා පරිනිබ්බායති, යං එතස්මිං අන්තරෙ භාසති ලපති නිද්දිසති; සබ්බන්තං තථෙව හොති නො අඤ්ඤථා. තස්මා තථාගතොති වුච්චති" යි වදාළ බැවින් බෝපලගනෙන් පිරිනිවන්හි[1] පහරවා හැමසඳ දූ පෙරළුම් මුදු එකාකාරයෙන් කී වන බැවින් "තථාවාදිතාය තථාගතො" යනු වී. නොහොත් අවිපරිත තෙපුල් ඇතිවන බැවින් "තථාවාදිතාය තථාගතො" යනු වී.[2]

---

[1] පිරිනිවන්ව [2] යනු වෙET

මෙ මෑ අර්ථයෙහි "ආගදනං ආගදෙ"[1] යි තෙපුල් ගෙන "තථා අවිපරීතො ආගදෙ අස්සාති තථාගදෙ" යි කියයුතුයෙහි නෙරුක්තිකවිධීන් දකාරයහට තකාර වන බැවින් "තථාගතො" යනු වේ. මෙ මෑ ලක්ෂණයෙන් පූර්වාර්ථයෙහි ද "තථෙව ගදතීති තථාගදෙ" යි කියයුතුයෙහි "තථාගතො" යනු වී. "ගද-ව්‍යක්තායාංවාචි" යන ධාතුයි.

කී සෙයින් මෑ කරන බැවින් කරන සෙයින් මෑ කියන බැවින් අන්‍යොන්‍යවිරෝධ නැති කායවාක්ප්‍රයොග ඇතියෙ යැ. එයින් "තථාවාදිතාය තථාගතො, තථාකාරිතාය තථාගතො" යනු වී.

වදාළෙ මෑ නො:-

444. "යථාවාදී භික්ඛවෙ තථාගතො තථාකාරී, යථාකාරී තථාවාදී. ඉති යථාවාදී තථාකාරී, යථාකාරී තථාවාදී; තස්මා තථාගතොති වුච්චති" යි.

445. "සදෙවකෙ භික්ඛවෙ ලොකෙ - පෙ - සදෙව මනුස්සාය තථාගතො අභිභූ අනභිභූතො අඤ්ඤදත්ථු දසො වසවත්ති; තස්මා තථාගතොති වුච්චති" යි වදාළ බැවින් සර්වඥ අභිභවන අගද සෙයින් සියලු පරවාදීන් තෙක් මැඩ සදෙවිමිනිස් ලොව අභිභවන අවිපරීත දෙශනාවිලාස හා පුණ්‍යරාශි ඇති වන බැවින් "අභිභවනට්ඨෙන තථාගතො" යනු වී.

මෙහි අභිභවනාර්ථයෙන් "අගදෙ විය අගදෙ" යි දෙශනා විලාස හා පුණ්‍යරාශි ගෙන "තථා අවිපරීතො අගදෙ අස්සාති තථාගදෙ" යි කියයුතුයෙහි නෙරුක්තික න්‍යායෙන් "තථාගතො" යනු වෙ.

මොහු යෑ "තථාගතයො" නමි.

---

[1] අගදනං අගදෙ CEF

(99). සමුජ්ජලිතනෙකභූමකවාරකොට්ඨිකං යන තන්හි දිළියෙන දෙරටු ඇතිපරිදි කිසෙ යැ යත්?

එක්සමයෙක්හි පරිව්‍රාජකයෙක් වාදයෙන් පඤ්චනවති පාෂණ්ඩ[1] මණ්ඩල දැනැ සැවැත්නුවර ගොස් "ශ්‍රමණගොතමයා හා වාද කෙරෙමි" යි යෙයි. එකල්හි එනුවර තීර්ථක ජනයො "අද මුළු දඹදිවි දිනූ පණ්ඩිතයා මහමහණහු මළුනය සෙ බලමිහ" යි ගියහ. ආර්‍ය්‍ය ජනයො "අද බුදුන්ගෙ ප්‍රතාප හා දෙශනාවිලාස බලමිහ" යි ගියො. මෙසෙ මහපිරිවරින් යන පරිව්‍රාජක දෙවිරමි දෙරටුව දැක "මෙ එ මහණහු වසන පහය වෙදැ?" යි කී යැ. ජනයො "පහය නො වෙයි දෙරටුවය" යි කීහු. "එ වෙහෙරෙහි දෙරටුව මෙසෙ කලැ ඔහු වසන පහය මැ කිවැන්නැ හො?යි" එවැනි තැනෙක්හි[2] වාසය කරනුවහුගෙ ප්‍රඥා කිසෙ යැ හො?" එවැනි මහණක්හු හා කෙනමි වාදකරනුවහ?" යි දෙරටව දැක්මෙන් මැ පැලැ ය. වෙහෙර වනාහි කියයුතු කිමැ?

---

(100). විහාරං කාරාපෙත්වා යන තන්හි එවෙහෙර කැරවූ පරිදි කිසෙ යැ යත්?

එසිටු උයන්බිමි විකිණී[3] ගෙන කොසොල්රජු කරා එළඹැ "මහරජ වෙහෙරක් කරවමි මට වඩුවන් දෙන්නෙය" යි කී යැ. රජ[4] නුවර බෙර පියවි කරවා "මාගෙ විජිතයෙහි ඇතිතාක් වඩුවන් අනේවඩුසිටුහු කීවක් කරන්නෙය" යි යෙදීය. සිටු වඩුවන් කැටිකරවාගෙන දැව ඇති තැන් පිළිවිත. වඩුවො දෙවතානුභාවයෙන් නුවරට පැළදෙසෙන්[5] සත්යොජනෙකින් මත්තෙහි භාගීරථී ගඞ්ගා පර්වත දෙඅතුරෙහි ශාලකල්‍යාණීරුක් හා මුසු එක්වියත් සතරඟුල් සඳුන්කඩක් ලක්ෂ[6] වටනා රත්සඳුන්

---

[1] පාෂාණ්ඩ all [2] තැනෙක B [3] විකිණීයෙ ABCD
[4] එරජු AF [5] පැළදෙසෙහි A [6] ලක්ෂයක් B

වනයක් ඇරැ දැක්වූහ. සිටු ච වනයෙන් දැව ගෙන්වා වෙහෙර කරවන්නෙ එහි මහාගන්ධකුටිය ගතරන්සඟළ තහා සතුරුවන්[1] මුවා කොට කැරවී ය. කොසම්බක[2] ගන්ධකුටිය දිවාවිහාර සඳහා රත්සඳුන් දැව හා සල්කලණ දැවයෙන් කරවා සචීරත්තයෙන් පරිකම් කැරවී ය. මහාධම්යභාව ද රත්සඳුන් සල්කලණ දැවයෙන් කරවා සචීරත්තයෙන් මාහැඟි පිරියම් කැරවී ය. කරෙරී ගන්ධ කුටිය වර්ෂාකාලයෙහි ශීතවිනෝදනය කරනු සඳහා හුදු සල්කලණ දැවයෙන් කැරවිය. සලළාගාර ගන්ධකුටිය කොසොල්රජු ගිම්තල්හි පරිදහ නිවනු සඳහා හුදු රත්සඳුන් දැවයෙන් කැරවී.

බුදුන් පැරැම්බිමිහි ලා සර්කාමානුභව කරන "මහාසුදස්සන්" නම් රජකලෙක්හි සතුරුවන්මුවා සත්පවුරෙකින් පිරිඛෙවි ලද සුවාසූදහසක් මහවෙසින් හා සුවාසූදහසක් කොවෙසින් සැදුම් ලද දෙලොස්යොදුන් කුසාවතීනුවරහි පොළොවි නිබිඳ[3] නැහි සුවාසූදහසක් රුවන්පහා පිරිවර ලද යොදුන් පමණ දිවපහාහි වුසුවන් දැන් පුන්පැරුම් වැ සවිකෙලෙස් පහා නිමල වැ ලොවැඩ සාහනුවනට වෙහෙරක් නිපන් පරිදි කෙනම් කියනුවහ?

---

(101). පුරවාසීහි පූජියමානෝ යන තන්හි පුරවාසින් විසින් පුදන ලද පරිදි කිසෙ යැ යත්?

එදා අනෙවඩු මහසිටුහු දෙවිනුවරක් සෙ නුවර සඳවා දෙවි පිරිස් බඳු මහපිරිස් පිරිවරා සියල්ලොව[4] දැදලුවා මල් මුවා දුම්මුවා ගඳමුවා ගඳෙවිමුවා කෙරෙමින් මෙන් බුදුන් පෙර මහට ගිය කල්හි නුවටහු සැවැත්නුවරට බැස "අද මෙයට කාලකණ්ණියෙක් වියි" තොප තොපගෙ ගෙහි වහා දොර පියාලා අගුළු ගන්වා මතුරු ජපව, දෙවියන් පුදව, දරුවන් රක්ව,

---

[1] සක්රුවන්AB [2] කොසඹCDEF
[3] නිවිදA කිමිදB [4] ලෙවිB

මුවහ තන්හි සැඟවෙව, සිහි වළවව" යෙමින් ඇවිදියෝ. එකල්හි බල් පුහුජුනෝ නුවටගණන් කී නියායෙන් සැඟවී හුන්හු.[1]

බුදුහු අවුද් නුවර අබියෙස්හි වැඩසිට නුවර වැසියන්ගෙ අදහස් දැන "මිනිස්හු බුදුනුභාව නොදන්ති, මා කැමති කල සක්වළඟලුදු ඔවුන් මුවහ කරන්නට නො හැක්ක, බිතක් දෙර කවුළු පුවරු නම් කිමෙක්දැ?" සි උණුලොම්ධයින් සුදු රශ්මිමාලාවක් වහුටහ. වරස් යට රසාල් දන්වා බැස උඩ භවඅග්[2] දක්වා නැඟී සියල් ලෙවිහි සිසිරස් මලිගියමල්දම් සරාවලා සෙයින් පැතිර ගියෙය.

එකල්හි[3] අහස්පොළොවී කිරිමුහුදුවතුරෙන් පිරිගියකල් වැනි වීය. එකල්හි සුනෙර සුගඳුරු ඈ පවිතයෝ සුදු වන බැවිනු ද් උස් වන බැවිනු ද් කිරිමුහුදුහි රළපෙළ පෙණපෙළ සෙයින් හෙබියහ. ඒ රශ්මිමාලා නුවරට වන්කල්හි එහි පවුරු කවුළු දෙර පුවරු ආදිහු නො පැනී ගියහ. මිනිස්හු අභ්‍යවකාශ යෙහි හුන්නන් වැනි වූහු. බුදුන් නෙ දැක්කැටි වැ අනෙක් අනෙක් දිශාවක් බලති; බැලූ බැලූ දෙසෙහි බුදුහු පැනෙති. එකල්හි මිනිස්හු "මෙ මහානුභාව පුරුෂයෙකැ, යම් යම් තැනකට අප ඇස් ගියෙ දෝ[4] එ එ තන්හි පැනෙයි, ඔහුගෙ දැක්ම වළකන්නට නො පිළිවනැ" සි බලනුවෝ මෙරමුදුනෙහි පිපි පරසතු රුකක් සෙයින් තරුවැළන් හොබනා නුබතලක් සෙයින් පිපි පියුම්ඇති වීලක් සෙයින් දිලියෙන පහන් ඇති පහන්රුකක් සෙයින් රුවන් රස්කඳුඹෙන් වොරජනා[5] මෙරක් සෙයින් ලක්ෂණානුව්‍යඤ්ජනයෙන් දිලියෙන සිරිරු ඇති බුදුන් ප්‍රසාදයෙන් බැලූහ, වැඳියහ. එක්බිති මල්දුම් ගත් අත් ඇතියාව ගොස් බුදුන් පිදූහු.

---

[1] උන්හු A [2] භවාග්‍ර (ස) CDEF [3] එක්බිති B
[4] ගියද AB [5] වොරොජනා B

(102). ජලමානනලක්ඛණෙඩ විය පඤ්ඤායන්තෙ යන තන්හි විනෙයජනයන් දිලියෙන ගිනිකඳු සෙයින් පැනෙන පරිදි කිසෙ යැ යත්?

යම්සෙ පර්වතපාදයෙක්හි වටා මහත් කෙතක් කොට එහි ගොයම් වපුට[1] ලියදි පෙළ පැල් නහා රැ ගිනි දල්වා මිනිස්හු හොත්හු ද, චතුරඞ්ගසමන්වාගත අන්ධකාර වී ද. එසඳ පර්වත මස්තකයෙහි සිට බලන ඇස්ඇති පුරුෂයක්හට කුඹුරු ද් නො ද පැනෙයි, ගොයම් නො ද පැනෙයි, පැල් නො ද පැනෙයි, මිනිස්හු නො ද පැනෙති, පැල්හි දිලියෙන ගිනි මැ පැනෙයි. එ සෙයින් මැ අනාවරණඥාන නමැති ගිරිශිඛරයෙහි සිට සත්ව ලොක බලන බුදුනට පින් නො කළ සත්හු එමැ කෙදුරාදි සෙයින් රැ වුහුටු ගර සෙයින් හො එකගෙහි දකුණු දණමඩල වෙත ද හුන බුදු ඇසට හමු නොවෙති. යම් කෙනෙක් පෙර බුදුන් සස්නෙහි දානශීලභාවනාදි විසින් උපචිත කුශලකර්ම ඇති වැ හිරු රසින් පුබුදිනා පියුම්වන සෙයින් අර්හත්ඵල ළඟෙන්නට තිසි වූහු ද ඔහු දුර ද සිටිය අඳුරෙහි දිලියෙන ගිනිකඳු සෙයින් හො හිමවිගල් සෙයින් හො පැනෙත්.

එයින් වදළහ:-

446. "දූරෙ සන්තො පකාසෙන්ති හිමවන්තොව පබ්බතෝ
අසන්තෙත්ථ න දිස්සන්ති රත්තිඛිත්තා යථා සරා" යි

---

(103). මනොනුකූලං ධම්මං දෙසෙන්තො යන තන්හි බුදුන්ගෙ දෙශනා ද්විවිධ වෙ. සංවෘතිදෙශනා යැ, පරමාර්ථදෙශනා ය යි.

එහි "පුද්ගල යැ සත්ව යැ ස්ත්රී යැ පුරුෂ යැ ක්ෂත්රිය යැ බ්රාහ්මණ යැ දෙව යැ මාර යැ" යන එවමාදි සංවෘතිදෙශනා යැ.

---

[1] වපොටCCD

"අනිත්‍ය යැ දුඃඛ යැ අනාත්ම යැ ස්කන්ධයන ධාතූන ආයතනයන" යන චවමාදි පරමාර්ථදෙශනායි.

එහි යම් කෙනෙක් සංවෘති විසින් දෙශනා අසා අර්හාවගම නොට විශෙෂාධිගම කෙරෙද්ද, ඔවුනට සංවෘතිදෙශනා දෙයත්. යම්කෙනෙක් පරමාර්ථ විසින් දෙශනා අසා අර්හාවගම නොට විශෙෂාධිගම කෙරෙද්ද, ඔවුනට පරමාර්ථදෙශනා දෙයත්.

අපි ව අටකාරණයෙකින් බුදුහු සංවෘතිදෙශනා දෙයත් මැයි; හිරීඔතප් දක්වනුසඳහා යැ, කර්මස්වකත්ව දක්වනු සඳහා යැ, පෘථක්පුරුෂකාර දක්වනු සඳහා යැ, ආනන්තර්‍ය දක්වනු සඳහායැ, බ්‍රහ්මවිහාර දක්වනු සඳහා යැ, පූර්වනිවාස දක්වනු සඳහා යැ, දක්ෂිණා විශුද්ධි දක්වනු සඳහා යැ, ලොකසංවෘති නොපියනු සඳහා ය යි.

එහි "ස්කන්ධයෝ ධාතූහු ආයතනයෝ හිරීඔතප් කෙරෙති" යි කී කලැ ජනයෝ නො දන්නි, සම්මූඩ වෙති, "මෙ කිම ස්කන්ධයන් ධාතූන් ආයතනයන් හිරීඔතප් කරනු නමැ?" යෙති. "ක්‍ෂත්‍රි හිරීඔතප් කෙරෙති, පුරුෂයෙක් ක්‍ෂත්‍රියයෙක් බ්‍රාහ්මණයෙක් දෙවයෙක් මාරයෙක් හිරීඔතප් කෙරෙයි" කී කලැ දන්නි, සම්මොහයට නොයෙති; ඒ හෙතුවින් බුදුහු හිරීඔතප් දක්වනු සඳහා සංවෘතිදෙශනා දෙයත්.

"ස්කන්ධයෝ කර්මස්වකයහ, ධාතූහු ආයතනයෝ කර්මස්වකයහ" යි කී කලැ එමැ නය යැ. ඒ හෙතුවින් බුදුහු කර්මස්වකත්ව දක්වනු සඳහා සංවෘතිදෙශනා දෙයත්.

"වෙළුවනාදි මහාවිහාරයෝ ස්කන්ධයන් විසින් කාරාපිතයහ, ධාතූන්විසින් ආයතනයන් විසින් කාරාපිතයහ" යි කී කලුදු ඒ මැනය යැ. ඒ හෙතුවින් බුදුහු පෘථක්පුරුෂකාර දක්වනු සඳහා සංවෘතිදෙශනා දෙයත්.

"ස්කන්ධයෝ මාතෘවධ කෙරෙති, පිතෘවධ කෙරෙති, ආර්ෂීවධ කෙරෙති, රුධිරොත්පාදකර්ම කෙරෙති, සඞ්ඝභෙදකර්ම කෙරෙති. ධාතූහු ආයතනයහ" යි කී කලැ එ මැ නය යැ. එ හෙතුවින් බුදුහු ආනන්තර්‍ය දක්වනු සඳහා සංවෘතිදෙශනා දෙසත්.

"ස්කන්ධයෝ මෛත්‍රී කෙරෙති, ධාතූහු ආයතනයෝ මෛත්‍රී කෙරෙති" යි කී කලැ එ මැ නය යැ. එ හෙතුවින් බුදුහු බ්‍රහ්මවිහාර දක්වනු සඳහා සංවෘතිදෙශනා දෙසත්.

"ස්කන්ධයෝ පූර්වනිවාසානුස්මරණ කෙරෙති, ධාතූහු ආයතනයෝ ස්මරණ කෙරෙති" යි කී කලැ එ මැ නය යැ. එ හෙතුවින් බුදුහු පූර්වනිවාස දක්වනු සඳහා සංවෘතිදෙශනා දෙසත්.

"ස්කන්ධයෝ දානප්‍රතිග්‍රහණ කෙරෙති, ධාතූහු ආයතනයෝ දානප්‍රතිග්‍රහණ කෙරෙති" යි කී කලු දු ජනයෝ නො දන්නී, සම්මොහයට යෙති, පරාඩ්මුඛ වෙති; මෙ කිම ස්කන්ධයන් ධාතූන් ආයතනයන් දානප්‍රතිග්‍රහණය කරනු නමැ?" යෙති. "පුද්ගලයෝ පිළිගන්නී; සිල්වත්හු ගුණවත්හු පිළිගන්නී" යි කී කලැ දන්නී; විමුඛ නො වෙති. එ හෙතුවින් බුදුහු දක්ෂිණාවිශුද්ධි දක්වනු සඳහා සංවෘතිදෙශනා දෙසත්.

ලොකසංවෘතිය බුදුහු නො පියති; ලොකසංඥායෙහි ලොක නිරුක්ති යැ ලොකාභිලාපයෙහි සිට දෙසති. එ හෙතුවින් බුදුහු ලොක සංවෘති නො පියනු සඳහා සංවෘතිදෙශනා දෙසත්.

මෙසෙ "සංවෘතිදෙශනා යැ, පරමාර්ථදෙශනාය" යි බුදුන්ගෙ දෙශනා ද්විවිධ වෙ.

---

(104). තණ්හාසඞ්ඛයං භික්ඛවෙතා යන තන්හි "තෘෂ්ණා" නම් කවර යත්? කාමතෘෂ්ණා යැ භවතෘෂ්ණා යැ විභව තෘෂ්ණා ය යි ත්‍රිවිධ වෙ.

එහි ප්‍රියඤාභාව වූ රූපශබ්දගන්ධරසස්ප්‍රෂ්ටව්‍යධර්මා ලම්බනයෙහි ප්‍රාර්ථනා වශයෙන් පවත්නා ලොභය "කාමතෘෂ්ණා" නම් වෙයි; එමෑ ෂඩාලම්බනයෙහි ශාශ්වතදෘෂ්ටිසම්ප්‍රයුක්ත වූ උපදනා තෘෂ්ණා ද් භවප්‍රාර්ථනාවශයෙන් පවත්නා තෘෂ්ණා ද් "භව තෘෂ්ණා" නම් වෙයි; එම ෂඩ්විධවිෂයයෙහි උපදනා උච්ඡේද දෘෂ්ටි සම්ප්‍රයුක්ත ලොභය "විභවතෘෂ්ණා" නම් වෙයි.

එහි කාමතෘෂ්ණා අතීතානාගතප්‍රත්‍යුත්පන්න රූපාදිෂඩා ලම්බනයෙහි පවත්නා වීසින් අෂ්ටාදශප්‍රභෙද වෙයි. එසෙයින්මෑ භවතෘෂ්ණා ද් අෂ්ටාදශප්‍රභෙද වෙයි. විභවතෘෂ්ණා ද් අෂ්ටාදශ ප්‍රභෙද වෙයි. තුන් අෂ්ටාදශය ගොස් සූපනයෙක් වෙයි. හෙ ආධ්‍යාත්මිකබහිර්ධා වශයෙන් ද්විධා භින්න වූයෙ විෂයභෙදයෙන් දෙසූපනයෙක් වෙයි. දෙසූපනය ගොස් අෂ්ටොත්තරශතයෙක් වෙයි.

මෙසෙ අෂ්ටොත්තරශතප්‍රභෙදයෙන් භින්න වූ තෘෂ්ණා යෑ "තෘෂ්ණා" නම්.

---

(105). ඤාණසන්තාසං ජනයන්තා යන තන්හි ඥානසන්ත්‍රාස ජනවනු කහට යෑ යත්? අනිත්‍යයෙහි නිත්‍යසංඥා ඇති දුඃඛයෙහි සුඛ සංඥා ඇති අනාත්මයෙහි ආත්මසංඥා ඇති අශුභයෙහි ශුභසංඥා ඇති සංඥාවිපර්‍යාස චිත්තවිපර්‍යාස දෘෂ්ටිවිපර්‍යාස සංසාරගාමී සත්වයනට යි.

එයින් වදළහ:-

447. "අනිච්චෙ නිච්චසඤ්ඤිනො දුක්ඛෙ ච සුඛසඤ්ඤිනො
අනත්තනි ච අත්තාති අසුභෙ සුභසඤ්ඤිනො
මිච්ඡාදිට්ඨිගතා සත්තා චිත්තචිත්තාවිසඤ්ඤිනො
තෙ යොගයුත්තා මාරස්ස අයොගක්ඛෙමිනෙ ජනා
සත්තා ගච්ඡන්ති සංසාරා ජාතිමරණගාමිනො" යි.

---

(106). සීහනාදං නදති යන තන්හි "සීංහනාද" නම් කවරේ යත්?

යම්සෙ සීංහතෙමෙහෙ "හනනතෝ ච සහනතෝ ච සීහෝ" යන න්‍යායයෙන් වාරණාදි උත්කෘෂ්ටසත්වයනට හනනයෙන් හා ශෘගාලාදි ලාමකසත්වයන්ගෙ අවඥාසහනයෙන් "සීංහ" නම් වෙ ද, එ සෙයින් මෑ බුදුහු විනෙයජනසන්තානගත ක්ලෙශයනට හනනයෙන් හා ලොකාවමානයාගෙ සහනයෙන් "සීංහ" නම් වෙති. සීංහයාගෙ නාද සීංහ නාද වෙ – නොහොත් සීංහයාගෙ නාද යම්සෙ සමානජාතිකයනට සොම්නස් හා හීන ජාතිකයනට සන්ත්‍රාස ජනක වෙ ද, එ සෙයින් මෑ බුදුන්ගෙ නාද අවිපරීත දර්ශන ඇති කල්‍යාණාධ්‍යාශය සත්වයනට සොම්නස් හා දෘෂ්ටිවිපර්යාසාසත්වයනට සන්ත්‍රාසජනක වෙ.

එසින් වදාළහ:-

448. "සීහෝ භික්ඛවෙ මිගරාජා සායන්හසමයං ආසයා නික්ඛමති, ආසයා නික්ඛමිත්වා විජම්භති, විජම්භිත්වා සමන්තා චතුද්දිසා අනුවිලොකෙති, සමන්තා චතුද්දිසා අනුවිලොකෙත්වා තික්ඛත්තුං සීහනාදං නදති, තික්ඛත්තුං සීහනාදං නදිත්වා ගොචරාය පක්කමති. යෙ ඛෝ පන භික්ඛවෙ තිරච්ඡානගතා පාණා සීහස්ස මිගරඤ්ඤො නදතෝ සද්දං සුණන්ති, යෙභුය්‍යෙන භයං සංවෙගං සන්තාසං ආපජ්ජන්ති. බිලං බිලාසයා පවිසන්ති, දකං දකාසයා පවිසන්ති, වනං වනාසයා පවිසන්ති, ආකාසං පක්ඛිනෝ හජන්ති. යෙපි තෙ භික්ඛවෙ රඤ්ඤො නාගා ගාමනිගමරාජධානීසු දළ්හෙහි වරත්තෙහි බන්ධනෙහි බද්ධා තෙපි තානි බන්ධනානි සඤ්ඡින්දිත්වා සම්පදාලෙත්වා හීතා මුත්තකරීසං වජමානා යෙනවා තෙන වා පලායන්ති. එවං මහිද්ධියෝ ඛෝ භික්ඛවෙ සීහෝ මිගරාජා තිරච්ඡානගතානං පාණානං එවං මහෙසක්ඛෝ එවං මහානුභාවෝ. එවමෙව ඛෝ භික්ඛවෙ යදා තථාගතෝ ලොකෙ උපපජ්ජති අරහං සම්මා සම්බුද්ධෝ විජ්ජාචරණසම්පන්නෝ සුගතෝ ලොකවිදූ අනුත්තරෝ පුරිසදම්මසාරථී සත්ථා දෙවමනුස්සානං බුද්ධෝ භගවා.

සො ධම්මං දෙසෙති. ඉති සක්කායො, ඉතිසක්කායසමුදයො, ඉති සක්කාය නිරොධො, ඉති සක්කායනිරොධගාමිනීපටිපදාති. යෙපි තෙ භික්ඛවෙ දෙවා දීඝායුකා වණ්ණවන්තො සුඛබහුලා උච්චෙසු විමානෙසු චිරට්ඨිතිකා තෙපි තථාගතස්ස ධම්මදෙසනං සුත්වා යෙභුය්‍යෙන භයං සංවෙගං සන්තාසං ආපජ්ජන්ති. අනිච්චාව[1] කිර භො මයං සමානා නිච්චම්හාති අමඤ්ඤිම්හ, අද්ධුවාව[1] කිර භො මයං සමානා ධුවම්හාති අමඤ්ඤිම්හ, අසස්සතා ව[1] කිර භො මයං සමානා සස්සතම්හාති අමඤ්ඤිම්හ; මයම්පි කිර භො අනිච්චා අද්ධුවා අසස්සතා සක්කායපරියාපන්නාති. එවං මහිද්ධියො ඛො භික්ඛවෙ තථාගතො සදෙවකස්ස ලොකස්ස එවං මහෙසක්ඛො එවං මහානුභාවො" යි.

මෙයැ "සිංහනාද" නම්.

(107). ධම්මං දෙසයමානො යන තන්හි ධම් දෙසන පරිදි කිසෙ යැ යත්?

බුදුහු සිවුපිරිස්මැද වැඩහිඳ බඹගොස්හඬ විහිද ධම් දෙසන්නාහු ඇතම්කලෙක පුද්ගලස්තව සඳහා ධම්දෙසුන් නො නිමවා හුනස්නෙන් නැඟී විහාරප්‍රවිෂ්ට වෙති. ඇතම්කලෙක ධම්මස්තව සඳහා ප්‍රවිෂ්ට වෙති.

එහි "පුද්ගලස්තව" සඳහා වඩනා බුදුහු "මා විසින් මෙ දෙශනා සඞ්ක්ෂෙපයෙන් දර්ශිත යැ, විස්තර විසින් අවිභක්ත යැ, ධම්මප්‍රතිග්‍රාහක භික්ෂුහු එ ආනන්දයා හො පුළුවුස්ති; කච්චායනයා හො පුළුවුස්ති; ඔහු මාගෙ නුවණ හා සසඳවා[2] විසජති; එකල්හි ධම්මප්‍රතිග්‍රාහකභික්ෂුහු අවුදු මා පුළුවුස්ති; මම් "ඔවුන් කී සෙ සුකථිත යැ, මසිදු කියත් එසෙමය" යි පුද්ගලයනට ස්තව කෙරෙමි. එසෙ වන්නා හා එහි භික්ෂුහු ඔවුන් කෙරෙ ගොරව කොට ඔවුන් කී නියායෙන් ත්‍රිවිධ ශික්ෂා පුරා සර්වදුඃඛක්ෂය කෙරෙති" යි සිතා වඩිති.

---

[1] වත CD [2] සංසන්දනුවා CDE

"ධර්මස්තව" සඳහා වඩනාහු "විහාරප්‍රවිෂ්ට වූ කලැ මෙම පර්ෂද හුන් ශාරද්වතී පුත්‍ර මාගෙ අභිප්‍රායානුරූප කොට ධර්ම දෙශනා කෙරෙයි; අප දෙදෙනාගෙ ඒකාධ්‍යාශයවශයෙන් පැවැති දෙශනා ගුරුදු වෙයි; ස්ථිර ද වෙයි; චතුරොඝ-නිස්තරණයට තොට වැ තුබූ නැවක් වැනි වෙයි; ස්වර්ගගමනයට රථයක් වැනි වෙයි. යම්සෙ රජක්හු "මෙනම් දැයක් කරනුවහට මෙනම් දැයක් දඩැ" යි පිරිස ඇණවා හුනස්නෙන් නැඟී ප්‍රාසාද රූඪ වූ කල්හි එ මැ පර්ෂද හුන් සෙනාපති රජුවිසින් තබනලද එ ආඥා පවත්වා ද එසෙයින් මැ මා විසින් නිඃක්ෂිප්ත දෙශනා මෙම පර්ෂද හුන් ශාරද්වතී පුත්‍ර ස්තව කොට දෙශනා කෙරෙයි. මෙසෙ අප දෙදෙනාගෙ මතීන් පැවැති දෙශනා බලවත්තර වෙයි. නහො මධ්‍යගත සූර්‍යයා සෙයින් උද්දීප්ත වෙ" යි සිතා වඩිත්.

මෙසෙ වඩනා බුදුහු හුනස්නෙහි මැ අන්තරහිත වැ චිත්ත ගතීන් වඩිත් - ඉදින් කායගතීන් වඩිත් නම් සියලු මහපිරිස් නැඟී බුදුන් පිරිවරා යෙති එක්යලක් බුන්[1] පර්ෂද්හුගෙ පුනස්සන්නිපාතය දුර්ශීට වෙයි; එ හෙතුවින් බුදුහු චිත්තගතීන් මැ වඩිත්. මෙසෙයින් බුදුහු ඇතම්කලෙක පුද්ගලස්තව සඳහා ධම්දෙසුන් නො නිමවා හුනස්නෙන් නැඟී විහාරප්‍රවිෂ්ට වෙති. ඇතම්කලෙක ධර්මස්තව සඳහා ප්‍රවිෂ්ට වෙති. ඇතම්කලෙක හුනස්නෙහි මැ හිඳ බඹලොස් හඬ විහිද ධම් දෙසත්.

(108). <u>කණ්හධම්මෙ පුග්ගලෙ</u> යන තන්හි පාපධර්ම පුද්ගලයො නම් කවරහ යත්? ඔහු ද්වවිධ වෙත්; පාපධර්ම යැ, පාපධර්මතරයයි.

එහි ප්‍රාණාතිපාතාදි දශඅකුශලකර්මපථයෙහි නියුක්ත වූයෙ පාපධර්ම යැ, තමා සෙ මැ සෙස්සනු දු ප්‍රාණාතිපාතාදියැ සමාදන් කරවනුයෙ පාපධර්මතර යි.

---

[1] බුදුන් All

එයින් වදාළහ:-

449. "කතමෝ ච භික්ඛවෙ පාපධම්මෝ? ඉධ භික්ඛවෙ එකච්චෝ පාණාතිපාති හොති, අදින්නාදායී හොති, කාමෙසු මිච්ඡාචාරී හොති, මුසාවාදී හොති, පිසුණාවාචෝ හොති, ඵරුසාවාචෝ හොති, සම්ඵප්පලාපී හොති, අභිජ්ඣාලු හොති, ව්‍යාපන්නචිත්තෝ හොති, මිච්ඡාදිට්ඨිකෝ හොති. අයං වුච්චති භික්ඛවෙ පාපධම්මෝ. කතමෝ ච භික්ඛවෙ පාපධම්මෙන පාපධම්මතරෝ? ඉධ භික්ඛවෙ එකච්චෝ අත්තනා ච පාණාතිපාති හොති පරඤ්ච පාණාතිපාතෙ සමාදපෙති, අත්තනා ච අදින්නාදායී හොති පරඤ්ච අදින්නාදානෙ සමාදපෙති, අත්තනා ච කාමෙසු මිච්ඡාචාරී හොති පරඤ්ච කාමෙසු මිච්ඡාචාරෙ සමාදපෙති, අත්තනා ච මුසාවාදී හොති පරඤ්ච මුසාවාදෙ සමාදපෙති, අත්තනා ච පිසුණාවාචෝ හොති පරඤ්ච පිසුණාය වාචාය සමාදපෙති, අත්තනා ච ඵරුසාවාචෝ හොති පරඤ්ච ඵරුසාය වාචාය සමාදපෙති, අත්තනා ච සම්ඵප්පලාපී හොති පරඤ්ච සම්ඵප්පලාපෙ සමාදපෙති, අත්තනා ච අභිජ්ඣාලු හොති පරඤ්ච අභිජ්ඣාය සමාදපෙති, අත්තනා ච ව්‍යාපන්නචිත්තෝ හොති පරඤ්ච ව්‍යාපාදෙ සමාදපෙති, අත්තනා ච මිච්ඡාදිට්ඨිකෝ හොති පරඤ්ච මිච්ඡාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ පාපධම්මෙන පාපධම්මතරෝ" යි.

---

(109). කල්‍යාණධම්මෙ පුග්ගලෙ යන තන්හි කල්‍යාණධර්මී පුද්ගලයෝ නම් කවරහ යත්? ඔහු අටිවිධ වෙත්. කල්‍යාණධර්මී යැ කල්‍යාණධර්මීතරය යි.

එහි ප්‍රාණාතිපාතාදීන් විරතවූයෙ කල්‍යාණධර්මී යැ. තමා සෙ මැ සෙස්සනු වූ ප්‍රාණාතිපාතාදීන් විරමණය කරවනුයෙ කල්‍යාණධර්මීතර යි.

එයින් වදළහ:-

450. "කතමෝ ච භික්ඛවෙ කල්‍යාණධම්මෝ? ඉධ භික්ඛවෙ එකච්චෝ පාණාතිපාතා පටිවිරතෝ හොති, අදින්නාදානා - පෙ - කාමෙසුමිච්ඡාචාරා - මුසාවාදා - පිසුණාය වාචාය - ඵරුසාය වාචාය - සම්ඵප්පලාපා පටිවිරතෝ හොති, අනභිජ්ඣාලු හොති, අබ්‍යාපන්නචිත්තෝ හොති, සම්මාදිට්ඨිකෝ හොති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණ ධම්මෝ. කතමෝ ච භික්ඛවෙ කල්‍යාණ ධම්මෙන කල්‍යාණ ධම්මෙතරෝ? ඉධ භික්ඛවෙ එකච්චෝ අත්තනාව පාණාතිපාතා පටිවිරතෝ හොති පරඤ්ච පාණාතිපාතා වෙරමණියා සමාදපෙති, අත්තනා ච අදින්නාදානං - පෙ - කාමෙසු මිච්ඡාචාරා මුසාවාදා - පිසුණාය වාචාය - ඵරුසාය වාචාය - සම්ඵප්පලාපා පටිවිරතෝ හොති පරඤ්ච සම්ඵප්පලාපා වෙරමණියා සමාදපෙති, අත්තනා ච අනභිජ්ඣාලු හොති පරඤ්ච අනභිජ්ඣාය සමාදපෙති, අත්තනා ච අබ්‍යාපන්නචිත්තෝ හොති පරඤ්ච අබ්‍යාපාදෙ සමාදපෙති, අත්තනා ච සම්මාදිට්ඨිකෝ හොති පරඤ්ච සම්මාදිට්ඨියා සමාදපෙති. අයං වුච්චති භික්ඛවෙ කල්‍යාණධම්මෙන කල්‍යාණධම්මතරෝ" යි.

---

(110). යෙ ච ඛත්තියපණ්ඩිතා යනාදි වාක්‍යයෙහි අභයරාජ කුමාර යැ, බොධිරාජ කුමාර යැ, ජයසෙනරාජ කුමාර යැ, භද්දිය ලිච්ඡවි යැ, මහාලී ලිච්ඡවි යැ, පායාසි රාජඤ්ඤ යැ, දණ්ඩපාණී ශාක්‍ය යැ, මාධුර නරපති යැ, අජාතශත්‍රු මහාරාජ යැ, උදයන මහාරාජ යැ, යන එවමාදි අනෙකසහස්‍ර ක්ෂත්‍රියපණ්ඩිතයෝ ද; වඩිකි බ්‍රාහ්මණ යැ, තාරුක්ඛ බ්‍රාහ්මණ යැ, පොක්ඛරසාති බ්‍රාහ්මණ යැ, ජානුස්සොණි බ්‍රාහ්මණ යැ, තොදෙය්‍ය බ්‍රාහ්මණ යැ, වෙරඤ්ජ බ්‍රාහ්මණ යැ, ධානඤ්ජානි යැ, වස්සකාර යැ, විසුකාරී[1] යැ වඩිහිසයැ,

---

[1] විසුකාරිකයැ

අස්සලායන යැ, දෙණ යැ, තිකණ්ණ යැ, සොණදණ්ඩ යැ, කණ්ඩරායනයැ, ආරාමදණ්ඩ යැ, දෙවහිත යැ, කූටදන්ත යැ, අග්ගිදත්ත යැ, සෙලයැ, සිඛාමොග්ගල්ලාන යැ, බ්‍රහ්මායු යැ, උදය යැ, උජ්ජය යැ, උදුම්බරි යැ, අක්ඛාසක භාරද්වාජ යැ, සුන්දරික භාරද්වාජ යැ, කසිභාරද්වාජ යැ, කාපටික මාණව යැ, අම්බට්ඨ මාණව යැ, වාසෙට්ඨ මාණව යැ, භාරද්වාජ මාණව යැ, උත්තර මාණව යැ, සුභ මාණව යැ, යන අනෙකසහස්‍ර බ්‍රාහ්මණපණ්ඩිතයෝ ද; උපාලි ගහපති යැ, පොතලිය ගහපති යැ, විසාඛ ගහපති යැ, දසම ගහපති යැ, සුදත්ත ගහපතියැ, සීහසෙන[1] ගහපති යැ, යන එවමාදි අනෙකසහස්‍ර ගෘහපති පණ්ඩිතයෝ ද; සාලෙය්‍යකයහ, වෙරඤ්ජකයහ, නගරවින්දෙය්‍යකයහ, තූණෙය්‍යකයහ, කෙසපුත්තියහ[2], කාලාමකයහ, යන එවමාදි අනෙකසහස්‍ර බ්‍රාහ්මණගෘහපතිපණ්ඩිතයෝ ද; සභිය පරිව්‍රාජක යැ, බාහිය පරිව්‍රාජක යැ, සරභ පරිව්‍රාජක යැ, පොට්ඨපාද පරිව්‍රාජකයැ නිග්‍රෝධ පරිව්‍රාජක යැ, ජන්ත පරිව්‍රාජක යැ, සුසීම යැ, සුභද්‍ර යැ, පිලෝතික යැ, පොතලිය යැ, කන්දරක යැ, මාගන්දිය යැ, කිංදුකයැ, සන්දක යැ, උග්ගහමාන යැ, භග්ගව ගොත්‍ර යැ, වච්ඡගොත්‍ර යැ, දීඝතපස්සී යැ, සුනක්ඛත්ත යැ, මාලුංක්‍යපුත්‍ර යැ, අන්නභාර යැ, වරධර යැ, සකුලුදායී යැ, වෙඛනස්[3] පරිව්‍රාජක යැ යන එවමාදි අනෙකසහස්‍ර ශ්‍රමණ පණ්ඩිතයෝ ද; මොවුන් කෙරෙන් පිටත් මහානුභාව යක්ෂ රාක්ෂස නාග ගරුඩගන්ධර්වාදිව්‍ය බ්‍රහ්මසහස්‍රයෝ ද; එවමාදි සියුම්නුවණ ඇති නොයෙක් වාදයෙහි දුනූ තත්ත්වඥාන හෙද කළ ක්ෂත්‍රියපණ්ඩිතාදීහු ගූඩප්‍රශ්නයන් අභිසංස්කාර කොට එකවරසිංහරාජයන්හූ ගන්නට අත් දික් කරනුවන් සෙයින්, ප්‍රභින්න-වරවාරණයන්හූ සොඬ පිරිමදනවුන් සෙයින්, උග්‍රතෙජස් ඇති ආශීවිෂයන්හූ ග්‍රීවායෙහි ගන්නවුන් සෙයින්, ප්‍රජ්වලිත අග්නිස්කන්ධයන් සිපගන්නවුන් සෙයින්, බුදුන් කරා එළැඹ පැන පිළිවිස බුදුන් විසින් සුනිශිත ශස්ත්‍රයෙන් කුමුදුනාළකලාප සෙයින් ප්‍රඥාශස්ත්‍රයෙන් ප්‍රශ්නයන් කඩා දිව්‍යාගදයෙන් සජීවයන් සෙයින් අභිභවනලදුවවිහු

---

[1] සීහසෙනාපතිCD [2] කෙශවාත්ථිකයහACD

[3] වෙමානCDE

දිලියෙන කෙසුරු සළා රැසින් වජඹනා ස්කන්ධ ඇති කෙශර සිංහරාජයන්හුගෙ සමීපයෙහි ජරත් ශෘගාලයන් වැනි වෙත්. ඔවුන් කෙරෙහි උපචිතකුශලසම්භාර ඇති සත්වයෝ පැහැද බුදුනට නමස්කාර කොට වැඳ සරණ යෙත්.

එයින් කිය ප්‍රශ්නව්‍යාකරණයෙන් ප්‍රමුදිත සභිය පරිව්‍රාජක:-

451. "නමෝ තෙ පුරිසාජඤ්ඤ නමෝ තෙ පුරිසුත්තම
සදෙවකස්මිං ලොකස්මිං නත්ථි තෙ පටිපුග්ගලෝ
පාදෙ වීර පසාරෙහි සභියෝ වන්දති සත්ථුනෝ" යි.

එයින් මෑ කිය ප්‍රශ්නව්‍යාකරණයෙන් පරිතුෂ්ට වාශිෂ්ඨ මාණව:-

452. "වන්දං යථා ඛයාතිතං පෙච්ච පඤ්ජලිකා ජනා
වන්දමානා නමස්සන්ති එවං ලොකස්මිං ගොතමං" යි.

එයින් මෑ කිය ප්‍රශ්නව්‍යාකරණයෙන් සුප්‍රීත පිඩ්ගියානි[1] බ්‍රාහ්මණ:-

453. "දිජෝ යථා කුඩ්ඩනකං පහාය
බහුඵලං කානනමාවසෙය්‍ය
එවම්පහං අප්පදසෙ පහාය
මහොදධිං හංසොරිවජ්ඣ පත්තො" යි.

මෙසෙ ප්‍රශ්නව්‍යාකරණයෙන්[2] ප්‍රසන්න වූ නොවක් තැනැ නොවක් වර නොවක් ක්ෂත්‍රියපණ්ඩිතාදිහුදු කිහු ම ය.

454. "අභික්කන්තං හෝ ගොතම, අභික්කන්තං හෝ ගොතම, සෙය්‍යථාපි හෝ ගොතම, නික්කුජ්ජිතං වා උක්කුජ්ජෙය්‍ය පටිච්ඡන්නං වා විවරෙය්‍ය මූළ්හස්ස වා මග්ගං ආචික්ඛෙය්‍ය

---

[1] පිඩ්ගියABEF [2] විසජ්ජිතයෙන්AB

අන්ධකාරෙ වා තෙලපජ්ජොතං ධාරෙය්‍ය චක්ඛුමන්තො රූපානි දක්ඛිත්‍ථීති. එවමෙවං භොතා ගොතමෙන අනෙකපරියායෙන ධම්මො පකාසිතො, වයං භවන්තං ගොතමං සරණං ගච්ඡාම ධම්මඤ්ච භික්ඛු සඞ්ඝඤ්ච" යි.

---

(111). යො ච කරුණා භගවති චොදිතහදයො යන වාක්‍යයෙන් දක්වනලද මිණිපහන්රසින් අලු රමණී දිවගබ් සුදුසු ගඳකිළියැ වාස පියා බුදුහු සළිලධරපටලජනිත බහලාන්ධකාරරාත්‍රියෙහි[1] හිමසමාකූල දෙශයෙහිද් බලවත් අනිලවිලුළිත දෙශයෙහි ද් සකණ්ටක දෙශයෙහි ද් ව්‍යාඝ්‍රනාගවිචරිත දෙශයෙහි ද් විෂමතල දෙශයෙහි ද් ගහනදෙශයෙහිද් මෙහැමදෙයින් යුක්ත දෙශයෙහිද් සත්ත්වනය කෙරෙමින් සුවයෙන් වෙසෙත්.

කියෙ මැ නො ගොමඝ ශිංශපා වනයෙහි පරණලා[2] පිට වැඩ හුන් බුදුන් දැක අළවිරජකුමරහු විසින්:-

455. "සීතා හන්ත හෙමන්තිකා රත්ති, අන්තරට්ඨකො හිමපාත සමයො, ඛරා ගොකණ්ටකහත්ථා භූමී, තනුකො පණ්ණසන්ථරො, විරලානි රුක්ඛස්ස පත්තානි, සීතානි කාසායානි වත්ථානි; සීතො ච වෙරම්භවාතො වායති. අථ ච පන භගවා එවමාහ: එවං කුමාර, සුඛමයසිත්ථං යෙ ච පන ලොකෙ සුඛං සෙන්ති අහං තෙසං අඤ්ඤතරො" යි.

ඔවිහු තමන් බොසත්කල්හි ද් පරවැඩ නැත දිව්‍යලොක යෙහි ද් නො සිටිති.

එයින් කිහ:-

456. "බොධිසත්තො දිසාසුකදෙවලොකෙ නිබ්බත්තො තත්ථ පාරමියො න සක්කා පූරෙතුන්ති අකාමා නිම්මීලෙත්වා

---

[1] රාත්‍රියCD [2] පරඩලාCDE

අධිමුත්තිකාලකිරියං නාම කත්වා මනුස්සලොකෙ නිබ්බත්තති. අයං කාලකිරියා අඤ්ඤෙසං න හොති" යි.

ඔව්හු[1] පරවැඩ ඇත අසිපත්‍රවනයෙහිද් වසත් නන්දන වනයෙහි සෙයින් වෙසෙති; පරවැඩ නැත නන්දනවනයෙහි ද් වසත් අසිතපත්‍ර වනයෙහි සෙයින් වෙසෙත්.

එයින් කිහ:-

457. "පරහිතකරණාය බද්ධකක්ෂ්‍යා-
ස්සුඛමසිපත්‍රවනෙ වසන්ති[2] සන්තඃ
න පුනරමරසුන්දරීසභායාඃ
ක්ෂණමපි නන්දනකානනෙ රමන්තෙ" යි.

මෙසෙ බෝසත්කල්හි පරවැඩ නැති තන්හි නොවසනුවො දැන් පරවැඩ දුටුකලැ රමණී දිවගබ් සුදුසු ගඳකිළියැ කිසෙ වසනුවහ?

---

(112). <u>තණ්හාගොදුවරි</u> <u>පවාහතො</u> <u>උත්තාරෙත්වා</u> යන තන්හි ඔවුන් තෘෂ්ණා නමැති නදීස්‍රොතයින් සතුන් නඟන පරිදි කිසෙයැ යත්?

වදුළෙ මැ නො:-

458. "සෙය්‍යථාපි භික්ඛවෙ පුරිසො නදියා සොතෙන වුය්හති[3] පියරූපසාතරූපෙන. තත්ථ චක්ඛුමා පුරිසො තීරෙ ඨිතො එවං වදෙය්‍ය, යථා ච ඛො ත්වං අම්හො පුරිස නදියා සොතෙන වුය්හසි පියරූපසාතරූපෙන, අත්ථි චෙත්ථ හෙට්ඨා රහදෙ සඨාමි සාවට්ටො සගහො සරක්ඛසො යං ත්වං අම්හො පුරිස පාපුණිත්වා මරණං වා නිගච්ඡසි මරණමත්තං වා දුක්ඛන්ති.

---

[1] එව්හුB [2] රමන්තිA [3] උපවහෙය්‍යA

අථ ඛෝ යො භික්ඛවෙ පුරිසො තඤ්ඤ පුරිසඤ්ඤ සුත්වා හත්ථෙහි ච පාදෙහි ච පටිසොතං වායමෙය්‍ය. උපමා ඛෝ මෙ අයං භික්ඛවෙ කතා අත්ථස්ස විඤ්ඤාපනාය. අයඤ්හෙත්ථ අත්ථෝ:- නදියා සොතොති ඛෝ භික්ඛවෙ තණ්හායෙතං අධිවචනං, පියරූප සාතරූපන්ති ඛෝ භික්ඛවෙ ඡන්නෙතං අජ්ඣත්තිකානං ආයතනානං අධිවචනං, හෙට්ඨා රහදොති ඛෝ භික්ඛවෙ පඤ්චන්නෙතං ඔරම්භාගියානං සංයොජනානං අධිවචනං, උම්මීති ඛෝ භික්ඛවෙ කොධූපායා සෙස්සතං අධිවචනං, ආවට්ටොති ඛෝ භික්ඛවෙ පඤ්චන්නෙතං කාමගුණානං අධිවචනං, ගහරක්ඛසොති ඛෝ භික්ඛවෙ මාතුගාමස්සෙතං අධිවචනං, පටිසොතන්ති ඛෝ භික්ඛවෙ නෙක්ඛම්මස්සෙතං අධිවචනං, හත්ථෙහි ච පාදෙහි ච වායාමොති ඛෝ භික්ඛවෙ වීරියාරම්භස්සෙතං අධිවචනං, චක්ඛුමා පුරිසො තීරෙ ඨිතොති ඛෝ භික්ඛවෙ තථාගතස්සෙතං අධිවචනං අරහතො සම්මාසම්බුද්ධස්ස" යි.

(113). ධම්මරතනවස්සං නිරන්තරං වස්සාපෙත්වා යන තන්හි දෙශනාධර්මලක්ෂණ රත්නවර්ෂයෙන්[1] ලැබියයුතු සද්ධර්මධනලක්ෂණ ලෞකිකලෝකොත්තර ධනයන් කෙරෙහි ලෞකිකධන කවරේ යත්? ශ්‍රද්ධාදි පඤ්චධන යි.

වදාළේ මෑ නෝ:-

459. "පඤ්චමානි භික්ඛවෙ ධනානි. කතමානි පඤ්ච? සද්ධාධනං සීලධනං සුතධනං චාගධනං පඤ්ඤාධනං. කතමඤ්ච භික්ඛවෙ සද්ධාධනං? ඉධ භික්ඛවෙ අරියසාවකො සද්ධො හොති සද්දහති තථාගතස්ස බොධිං: ඉතිපි සො භගවා - පෙ - භගවාති. ඉදං වුච්චති භික්ඛවෙ සද්ධාධනං. කතමඤ්ච භික්ඛවෙ සීලධන? ඉධ භික්ඛවෙ අරියසාවකො පාණාතිපාතා පටිවිරතො හොති - පෙ - සුරාමෙරයමජ්ජපමාදට්ඨානා

---

[1] වර්ෂයෙන් EF

පටිවිරතො හොති. ඉදං වුච්චති භික්ඛවෙ සීලධනං. කතමඤ්ච භික්ඛවෙ සුතධනං ඉධ භික්ඛවෙ අරියසාවකො බහුස්සුතො හොති - පෙ - දිට්ඨියා සුප්පටිවිද්ධා. ඉදං වුච්චති භික්ඛවෙ සුතධනං. කතමඤ්ච භික්ඛවෙ චාගධනං? ඉධ භික්ඛවෙ අරියසාවකො විගතමලමච්ඡෙරෙන චෙතසා අගාරං අජ්ඣාවසති පෙ - දානසංවිභාගරතො. ඉදං වුච්චති භික්ඛවෙ චාගධනං. කතමඤ්ච භික්ඛවෙ පඤ්ඤාධනං? ඉධ භික්ඛවෙ අරියසාවකො පඤ්ඤවා හොති උදයත්ථගාමිනියා පඤ්ඤාය සමන්නාගතො අරියාය නිබ්බෙධිකාය සම්මා දුක්ඛක්ඛයගාමිනියා. ඉදං වුච්චති භික්ඛවෙ පඤ්ඤාධනං ඉමානි ඛො භික්ඛවෙ පඤ්චධනානි" යි.

මෙය පඤ්චධන නම්; හිරිඔතප් හා සමඟ සප්තධන වේ[1].

හෙ ද වදාළෙ මැ නො? :-

460. "සද්ධාදනං සීලධනං හිරිඔත්තප්පියං ධනං
සුතධනං ච චාගො ච පඤ්ඤා වෙ සත්තමං ධනං

යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්ස වා
අදලිද්දෙති තං ආහු අමොඝං තස්ස ජීවිතං" යි.

---

(114). <u>දීපඞ්කරමහෙසීනො</u> යන තන්හි "මහෙසී" නම් කවර යත්?

කියෙ මැ නො? :-

461. "මහෙසීති භගවා මහන්තං සීලක්ඛන්ධං එසි ගවෙසි පරියෙ සීති මහෙසී. මහන්තං සමාධික්ඛන්ධං - පෙ - මහන්තං පඤ්ඤාක්ඛන්ධං, මහන්තං විමුත්තික්ඛන්ධං, මහන්තං විමුත්ති-

---

[1] මෙ පඤ්චධන හිරිඔතප් හා සමඟ සප්තධන නම් වෙ

ඤාණදස්සනකඛන්ධං එසි ගවෙසි පරියෙසීති මහෙසි. මහතෝ කායස්ස පදාලනං මහතෝ විපල්ලාසස්ස භෙදනං මහතෝ දිට්ඨි සඞ්ඛාටස්ස විනිවෙඨනං මහතෝ මානද්ධජස්ස පපාතනං මහතෝ අභිසඞ්ඛාරස්ස වූපසමං මහතෝ ඔඝස්ස නිත්ථරණං මහතෝ භාරස්ස නික්ඛෙපනං මහතෝ සංසාරවට්ටස්සුපච්ඡෙදනං මහතෝ සන්තා පස්ස නිබ්බාපනං මහතෝ පරිළාහස්ස පටිප්පස්සද්ධිං මහතෝ ධම්මද්ධජස්ස උස්සාපනං එසි ගවෙසි පරියෙසීති මහෙසි. මහන්තෙ සතිපට්ඨානෙ මහන්තෙ සම්මප්පධානෙ මහන්තෙ ඉද්ධිපාදෙ මහන්තානි ඉන්ද්‍රියානි මහන්තානි බලානි මහන්තෙ බොජ්ඣඞ්ගෙ මහන්තං අරියං අට්ඨඞ්ගිකං මග්ගං මහන්තං පරමත්ථං නිබ්බානං එසි ගවෙසි පරියෙසීති මහෙසි - මහෙසක්ඛෙහි වා සත්ථෙහි එසිතෝ ගවෙසිතෝ පරියෙසිතෝ කහං බුද්ධෝ කහං භගවා කහං දෙව දෙවෝ කහං නරාසභෝති මහෙසි - එවං භගවා මහෙසි" යි.

මෙයෑ "මහෙසි" නම්.

---

(115). අපරිමාණානං කුලපුත්තානං යන තන්හි "කුලපුත්තයෝ" නම් කවරහ? යත්:-

මහු ද්වේධ වෙත්: ජාතිකුලපුත්තයහ, ආචාරකුලපුත්තයහ යි.

එහි "තෙන ඛෝ පන සමයෙන රට්ඨපාලෝ කුලපුත්තෝ තස්මිංයෙව ථූලකොට්ඨිතෙ අග්ගකුලිකස්ස පුත්තෝ" යනාදි ක්‍රමයෙන් ආයාත වූ උත්තමකුලප්‍රසූතයෝ "ජාතිකුලපුත්ත" නම් වෙති. "යෙ තෙ කුලපුත්තා සද්ධාය අගාරස්මා අනගාරියං පබ්බජිතා" යනාදි ක්‍රමයෙන් ආයාත යත්තත්කුලප්‍රසූත ද් වුව ආචාරසම්පන්නයෝ "ආචාරකුලපුත්ත" නම් වෙත්.

මොහු යෑ "කුලපුත්තයෝ" නම්.

---

(116). <u>භවසාගරපාරගො</u> යන තන්හි ඔවුන් සසර සයුරෙහි පරතෙරට ගිය පරිදි කිසෙ යැ ? යත්:-

එක්සමයෙක්හි බුදුහු කොසොල්ජනවියෙහි සැරිසරන්නාහු ද්‍රොණබමුණහට වන වැඩ දැක මඟැ පදලස් දක්වා ගොස් එක් රුක්මුලෙක්හි වැඩහුන්හ. එදවස් ද්‍රොණබමුණු සියක් වටනා වස්ත්‍රයක් හැඳ පන්සියක් වටනා වස්ත්‍රයක් එකස් කොට බහාලා ආමුක්තයඥසූත්‍ර වැ රත්වරවහන් නැඟී පන්සියක් මණෙව්වන් පිරිවරා එම මාර්ගයට ප්‍රතිපන්න වූයෙ පදලස් දැක පදානුපදික වැ ගොස් රුක්මුල්හි වැඩහුන් බුදුන් දැක රූපදර්ශනයෙන් විස්මිත වැ "මෙ අනාගතයෙහි මහෙශාක්‍ය එක් දෙවරාජයෙක් වන්නෙවෙයි" අනාගතවශයෙන් ප්‍රශ්න කරනුයෙ "භවත් දෙවි වෙයි හො ?" යි පිළිවිත. බුදුහු "දෙවි නො වෙමි" යි වදාළහ. "ගන්ධර්[1] වෙයි හො ?" යි පිළිවිත. "ගන්ධර්ව නො වෙමි" යි වදාළහ. "යක්ෂ වෙයි හො ?" යි පිළිවිත. "යක්ෂ නො වෙමි" යි වදාළහ. "මනුෂ්‍ය වෙයි හො ?" යි පිළිවිත. "මනුෂ්‍ය නො වෙමි" යි වදාළො.

එසඳ බමුණු "දෙවි වෙහි ? කීයෙන් දෙවි නො වෙමි යෙහි; ගන්ධර්ව වෙහි ? කීයෙන් ගන්ධර්ව නො වෙමි යෙහි ; යක්ෂ වෙහි ? කීයෙන් යක්ෂ නො වෙමි යෙහි; මනුෂ්‍ය වෙහි ? කීයෙන් මනුෂ්‍ය නො වෙමි යෙහි; ඔස භවත් කුමක් වෙයි හො ?" යි පිළිවිත්.

එකලැ බුදුහු "යම් ආශ්‍රවකෙනකුන් අප්‍රහීණයෙන් දෙවි වෙමි නම් එ ආශ්‍රවයො මට ප්‍රහීණයහ. ගන්ධර්ව වෙමි නම් යක්ෂ වෙමි නම් මනුෂ්‍ය වෙමි නම් අ ආශ්‍රවයො මට ප්‍රහීණයහ. යම්සෙ උත්පල වනාහි උදකයෙහි උපද උදකයෙහි වැඩැ උදකයෙන් රියන් පමණ තැන් නැඟී විල් හොබවමින් බමරගණා

---

[1] ගාන්ධර්වෙ

තුස්වමින් උදක හා අනුපලිත්ත වැ සිටී ද. එයෙයින් මැ මම ලොකයෙහි උපද ලොකයෙහි වැඩ ලොකයෙන් නැඟී ලොක ධර්‍ම හා අනුපලිත්ත වැ වෙසෙමි, මා බුදුහයි දනුව[1] බමුණ" යි වදාළෝ.

462. "යෙසං ඛෝ අහං බ්‍රාහ්මණ ආසවානං අප්පහිනත්තා දෙවෝ හවෙය්‍යං තෙ මෙ ආසවා පහීනා උච්ඡින්නමූලා තාලාවත්ථුකතා අනභාවකතා ආයතිං අනුප්පාදධම්මා; යෙසං ඛෝ අහං බ්‍රහ්මණ ආසවානං අප්පහිනත්තා ගන්ධබ්බෝ හවෙය්‍යං යක්ඛෝ හවෙය්‍යං මනුස්සෝ හවෙය්‍යං තෙ මෙ ආසවා පහීනා - පෙ - ආයතිං අනුප්පාදධම්මා. සෙය්‍යථාපි බ්‍රාහ්මණ උප්පලං වා පදුමං වා පුණ්ඩරීකං වා උදකෙ ජාතං උදකෙ සංවඩ්ඪං උදකා අච්චුග්ගම්ම තිට්ඨති අනුපලිත්තං උදකෙන. එවමෙව ඛෝ අහං බ්‍රාහ්මණ ලොකෙ ජාතෝ ලොකෙ සංවඩ්ඪෝ ලොකං අභිභුය්‍ය විහරාමි අනුපලිත්තෝ. ලොකෙන බුද්ධොති මං බ්‍රාහ්මණ ධාරෙහි" යි.

එසඳ බමුණු අනගැමි[2] වැ දෙළොස්දහසක් පදයෙන් බුදුන්ගෙ ගුණ වනා "ලොණඵලීනා" නම් ගීනාවක් කෙළෙ. පැසුව් බුදුන් පිරිනිවි කලැ දඹදිවිතලෙහි උපන් මහත් කලහයක් සන්හිඳුවා දෙවිමිනිස්නට ධාතු බෙදා දින්.

මෙසෙ බුදුනට පුනර්භවොත්පත්ති නැති වන බැවින් සසර සයුරෙහි පරතෙරට ගියා නම් වෙත්.

(117). ලොකාලොකකරෝ යන තන්හි බුදුන් ලොකයා එකා ලොක කරන පරිදි කිසෙ යැ යත්?

---

[1] දනEE [1] දැනF [2] අනාගාමීC

ඔවිහු හෙයොපාදෙයතත්වසම්මූඪලොකයහට තත්තත් ප්‍රකාශන වශයෙන් ඥානාලොක උපයා මොහාන්ධකාර දුරු කෙරෙත්. එයින් බුදුහු "ලොකාලොකකර" නම් වූහු.

වදාළෙ මැ නො:-

463. "එකපුග්ගලස්ස භික්ඛවෙ පාතුභාවො[1] මහතො වක්ඛුස්ස පාතුභාවො හොති, මහතො ආලොකස්ස, මහතො ඔභාසස්ස, ඡන්නං අනුත්තරියානං පාතුභාවො හොති, චතුන්නං පටිසම්භිදානං සච්ඡිකිරියා හොති, අනෙකධාතුපටිවෙධො හොති, නානාධාතුපටිවෙධො හොති, විජ්ජාවිමුත්ති ඵලසච්ඡිකිරියා හොති, සොතාපත්ති ඵල, සකදාගාමිඵල, අනාගාමිඵල, අරහත්තඵල සච්ඡිකිරියා හොති. කතමස්ස එකපුග්ගලස්ස? තථාගතස්ස අරහතො සම්මා සම්බුද්ධස්ස" යි.

---

(118). අත්තදානපරිදීපනං තිත්ථියපරිමද්දනං යමක පාටිහාරියං දස්සෙන්තො යන තන්හි තීථිකමථන වූ කලැ ශ්‍රාවකයනුද් කටහැකි නො? යත්:-

බුදුන්ගෙ ප්‍රතික්ෂෙපයෙන් ශ්‍රාවකයො නිවෘත්ත වූහු.

කිසෙ යැ යත්?

තීථිකයන් "සෘද්ධිප්‍රාතිහාර්‍ය දක්වමිහ" යි ලක්ෂයක් ධන විසඳ කිහිරිටැඹ හිඳුවා නිල්මහනෙල්මලින්[2] සොයා මහත් මඩුවක් කරවා ගෙන හුන් කල්හි කොසොල්රජු බුදුන් කරා ගොස් "මම් වහන්සෙට මඩුවක් කරවමි" දැන්වූයෙන් "මහරජ

---

[1] පාතුභාවා G [2] නිල්මහනෙලින් CDEF

මට මඩුවක් කරන කෙනෙක් ඇති" වදාළ කල්හි "මා විනා අනෙක් කවරහ[1] වහන්සෙට මඩුවක් කරන්නට නිස්සහ?" යි කියෙන් "සක්දෙවි රජ යැ මහරජ" යි වදාළ කල්හි "ප්‍රාතිහාර්‍ය්‍ය කොයි වෙයි හෝ?" යි පුවවූත්තෙන් "ගඬුම්බරුක්මූල්හියැ" යි වදාළ කල්හි එපවත් අසා තීර්ථකයන් යොජනෙකින් ඇතුළත අඹ රුක් උපුරුවා පී කල්හි ඇසළපුණුපොහොදවස් පෙරවරු න්වර වදනා බුදුන් දැක "ගඬු" නම් උයන්පල්ලා මහරජහට පඩුරු ගෙන යන අඹවිලය බුදුනට එළවූ කල්හි බුදුන් නුවර දෙර වැඩ හිඳ අඹරස වළඳා අඹඇටය බහු ලවා රොපණය කරවා අත් දෙව දිය ඔත් කල්හි එවිගස අඩිකුරයක් නික්ම උස පනස්හත් කඳ ඇති වැ පනස්පනස්හත් පඤ්චමහාශාඛා ඇති වැ පුෂ්පඵල පල්ලවාලඞ්කෘත වැ ගඬුම්බරුක් නිපන් කල්හි රජු යොධයන් යවා අඹරුකට අරක් දෙවූ කල්හි පසුව වඩනා සඟුන් අඹරසයෙන් අහරකිස සාහමින් බුදුන් අනුව ගිය කල්හි නාගර ජනයන් අඹ රසයෙන් තෘප්ත වැ ගොස් ඉඳුල් අඹ ඇටින් "ගඬුම්බ නම් මෙයැ" යි තීර්ථකයන් සැපූ කල්හි සක්දෙවි රජහුගේ යජමෙන්[2] වලාහකදෙවිපුත්‍රයා වාතමණ්ඩලයක් මවා තීර්ථකයන්ගෙ මඩුව උපුරා උත්කාරභූමියට දමා පී කල්හි හිරුදෙවිපිත්හු උෂ්ණරශ්මීහි විහිද තීර්ථකයන් පචනය කළ කල්හි වැළිද් වලාහකයා වාත මණ්ඩලයෙන් රජසළා නහා තීර්ථකයන්ගෙ ප්‍රක්ෂරත් ශරීරයෙහි ප්‍රක්ෂිප කළ කල්හි වැළිදු මහත් මහත් පොදු විහිද ඔවුන්ගෙ වල්මීකනිකරයක් බඳු ශරීරයෙහි අවපාත කොට කබරගොගණා කාර දැක්වූ කල්හි තීර්ථකයන් අන්සරණ නැති වැ අභිමුඛාභිමුඛ ඥානයෙන් සිංහගර්ජනා දුටු මෘගගණයන් සෙයින් පැලෑ කල්හි පූරණකාශ්‍යපයා කර වැලි කළයක් බැඳ දියෙහි ගැලි මිය අවීචියට වන් කල්හි සක්දෙවි රජහු විසින් මවනලද දෙලොස්යොදුන් රුවන්මඩුයෙහි යොදුන් පමණ රුවන්පලඟ මතුයෙහි තුන්යොදුන් පමණ සේසත් යට වැඩහිඳ "මෙ සාඤ්ප්‍රාතිහාර්‍ය්‍ය දැක්වුවමනා වෙලායැ" යි රුවන්මඩුයෙන් නික්ම අක්දෙරියෙහි වැඩසිටි කල්හි

---

[1] කවරෙක්A [2] යෙජමෙන්CDEF

"ප්‍රාතිහාර්‍ය බලමිහ" යි රැස්වූ අයමිත්තෙහි සූවිසියොදුන් වටා දෙසැත්තෑයොදුන් මහපිරිස්මැද එනුවර "ඝරණී" නම් අනගැමි එක් උපාසිකාවක් අවුදි බුදුන් වැඳ මුදුනෙහි ඇඳිලි බැඳ සිට "මා වැනි දුවක ඇති බැවින් වහන්සෙ සුවයෙන් වැඩහිඳිනෙ යැ, මම් ප්‍රාතිහාර්‍ය කෙරෙමි" යි කී කල්හි එපිරිසැ ඇයගෙ ගුණප්‍රකාශ කටයි බුදුන් විසින් "ඝරණියා තී ප්‍රාතිහාර්‍ය කරන පරිදි කිසෙ යැ?"යි වදළ කල්හි "සක්වළගබ දියෙන් පුරා එකවිලක් කොට මවා මම උදකඝකුණියක සෙයින් කිමිද පැදුමිසක්වළ මුවවිට ද පැනෙමි, පැළසක්වළ මුවවිට ද පැනෙමි, උතුරුසක්වළ මුවවිට ද පැනෙමි, දකුණුසක්වළ මුවවිට ද පැනෙමි, සක්වළ මධ්‍යයෙහි ද පැනෙමි, මාගෙ සෘද්ධි ප්‍රාතිහාර්‍ය දැක ගිහිගෙහි සිටි එක් උපාසිකාවකගෙ ආනුභාව මෙසෙ වත් බුද්ධානුභාව මැ කිසෙ යැ හො?" යි තීර්ථකයෝ නොපවහන්සෙ නො දැක මැ පලායෙති" යි එපිරිසැ සිංහනාද කළා.

එකල්හි බුදුහු "ඝරණිය, තී මෙබඳු සෘද්ධි ප්‍රාතිහාර්‍ය දක්වන්නට සමර්ථ බව දන්මි. මෙ පූජා පුටය[1] කී සඳහා බැඳ්දෙ නො වෙ" යි ප්‍රතික්ෂෙප කළෝ.

එසෙයින් මැ අනාගාමී[2] සුළුනෙවඩු මහසිටු "වහන්සෙ, මම් දෙළොස්යොදුන් බඹවෙසක් මවාගෙන මෙ පිරිස්මැද මහාමෙඝ ගජීනා සෙයින් බ්‍රහ්මස්වලනා කොට තීර්ථකයන් ප්‍රලය කෙරෙමි" යි කියා. පිළිසැඹියාපත් සත්හැවිරිදි "වීරා" නම් හෙරණෑණී[3] තෙනෙක් "වහන්සෙ, මම් මෙරගල් සත්වළගල් හිමගල් ඇර තබා හංසියක සෙයින් එයිනෙයින් නික්මැ නො පැහැර යෙමි" යි කිහ. සත්හැවිරිදි "චුන්දා" නම් ක්ෂීණාශ්‍රව හෙරණපැවිජිකෙනෙක් "වහන්සෙ, මම් ජම්බුද්වීපයට ධජයක්

---

[1] පටයCDE [2] අනගැමිG [3] හෙරණීABC

බඳු මහාජම්බුවාක්ෂයාගෙ ස්කන්ධයෙහි ගෙන සලා මහදඹ ඇරැ මෙ පිරිස්වැසියන් වළඳවමි, පරසතුමල් ඇරැ පළඳවමි" යි කීහ. උපුල්වන්තෙරිහි "වහන්සෙ, මම් සතිස්යොදුන් පිරිස් පිරිවරා චක්‍රවර්ත්ති විලාසයෙන් අවුදු තොප වහන්සෙ පා වඳිමි" යි කීහ. මහමුගලන්තෙරහු "වහන්ස, මම් මෙරුපර්වතරාජ දත් අතුරෙහි තබාගෙන උඳැටක් සෙයින් කමි" යි කීහු ම ය. "මෙ මහපොළොව කළාලක් සෙ හකුළුවාගෙන ඇඟිලි අතුරෙහි තබමි" යි කීහු ම ය. මෙ මහපොළොව කුඹල් සකක් සෙ පෙරළා මහජනා පොළොවි ඔජස් වළඳවමි" යි කීහු ම ය. "වමි අත්ලෙහි මහපොළොවි තබා සත්වයන් අනික් ද්වීපයෙක සිටුවමි" යි කීහු ම ය. "මෙරගල් සත්දඬු කොට මහපොළොවි නඟා ඒ මත්තෙ තබා සතක් සෙ අතෙකින් ගෙන ආකාශයෙහි සක්මන් කෙරෙමි" යි කීහු ම ය.

එකල්හි බුදුහු "තොප මෙබඳු සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දක්වන්නට සමර්ථබවි දන්මි. මෙ මල්මුළ තොප සඳහා බද්දෙ නො වෙ" යි ශ්‍රාවකයන්ගෙ සෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය ප්‍රතික්ෂෙප කළහ.

මෙසෙ බුදුන්ගෙ ප්‍රතික්ෂෙපයෙන් ශ්‍රාවකයො නිවාත්ත වූහු.

---

(119). ලොමකූපලොමකූපතො අග්ගික්ඛන්ධං ලොමකූප ලොමකූපතො උදකධාරං පවත්තයමානො යන තන්හි අග්නි ස්කන්ධය හා උදකධාරා පවත්වන පරිදි කිසෙ යැ යත්?

අග්නිස්කන්ධ උදකධාරා හා අසම්මිශ්‍රව පවත්ති. උදක ධාරා අග්නිස්කන්ධ හා අසම්මිශ්‍ර වැ පවත්ති විචිත්‍ර අග්නිස්කන්ධ හා උදකධාරා බඹලො දක්වා නැඟි බවඅග්[1] මැඩ සළා දී

---

[1] අක්ෂ්ය

බැස සක්වළගල් මුදුනෙහි පැහැර පොළොවිතෙලෙහි මැ ගැසී දසදිසා පහයමින් වැටී.

---

(120). ජඞ්ඝාරංසියෝ විස්සජ්ජන්තෝ යන තන්හි සවනත් රස් විහිදිනා පරිදි කිසෙ යැ යත්?

සවනත් ගන බුදුරස්හු රන්කෙළෙන් රුවන්රසධාරා සෙයින් තික්ම බඹලොව දක්වා නැඟි බවඅග්[1] මැඩ සළා දී බැස සක්වළ ගල් මුදුනෙහි පැහැර පොළොවිතෙලෙහි ගැසී දසදිසා පහයමින් වැටිත්.

---

(121). ධම්මඤ්ච දෙසෙන්තෝ යන තන්හි ධම් දෙසන පරිදි කිසෙ යැ යත්?

එදවස් බුදුහු රුවන්සක්මන්හි සක්මන් කෙරෙමින් සිට යමාමහපෙළහර කරනුවො අතුරතුරෙහි මහාජනයහට ධම් දෙසත්. දෙසන්නාහු ජනයන් නිරුපද්‍රවාස නො කොට ආශ්වාසවාර දෙත්. එකෙණහි මැ මහාජනයෝ සාධුකාර පවත්වත්. ඔවුන් සාධුකාර පවත්වන කලැ බුදුහු එසා මහපිරිස් වැසියන්ගෙ සිත් හසර බලන්නාහු එකක් එකක්හුගෙ සිත්හසර සොළොස් සොළොස් ආකාරයෙකින් බලත්. යමෙක් යමෙක් යම් යම් ධම්යෙක්හිදු යම් යම් පෙළහරෙක්හිදු පහදනෙ වී නම් ඔවුනොවුන්ගෙ අධ්‍යාශය වශයෙන් මනොනුකූලකොට ධම් දෙශනා කෙරෙති, ප්‍රාතිහාර්‍ය දු කෙරෙත්. මෙසෙ ධම් දෙසන කලැ පෙළහර පානා කලැ මහාධම්මිහිසමය වී.

---

[1] අක්ACD

(122). එකොපි හුත්වා බහුධා හොති යන තන්හි ඔවුන් එකලා සම්‍යක් සම්බුද්ධයන් බොහො වැ මැවෙන පරිදි කිසෙ යැ යත්?

තුමුහු හුදකලා වූවාහු බොහොදෙනා මැවියටි කලැ පාදකධ්‍යාන සමවැද නැඟි සියක් හො දහසක් හො සුවහසක් හො කෙළසුවහසක් හො බුදුන් ආවජිනා කෙරෙත්. ආවජිනා කොට බොහො වෙමි"යි අභිඥායෙන් ඉටත්. බොහො වන්නාහු ද එකවට බොහො වූවාහු නො වෙත්. පළමු දෙබුදුකෙනෙක් වූහ. අනෙක් වට සතරදෙනෙක් වූහ. අනෙක් වට අටදෙනෙක් වූහ. අනෙක්වට සොළොස්දෙනෙක් වූහ, අනෙක්වට සිය වූහ, දහස් වූහ, සුවහස් වූහ, අනෙසුවහස් වූහු. ඔවුන් පුවවුත් පැන බුදුහු විසඳ ධර්ම දෙසත්.

එයින් කිහ:-

464. "ධම්මං උදාහරති තත්‍ර ජිනො සදාවි
හියෝ හි සාදයති ඣානසුඛෙන චිත්තං
පඤ්ඤං විසජ්ජයති නිම්මිතබුද්ධ පුට්ඨො
තුණ්හි සයං භවති භාසති නිම්මිතොව"යි.

බුදුහු චින්තාමාණික්‍යයක් සෙයින් මහජනා සිත් තුමූ පරිද්දෙන් අනෙදහස් ලොමකූපයෙන් අනෙසුවහස් ඔනිකඳ දියකඳ පවත්වමින් අහස්හි පුප්නා රුවන්පියුම්කෙමියෙහි ඇත්මෙමින් සත්මන් කෙරෙති. නිර්මිත බුදුහුදු එසෙයින් මැ සවනත් රස් වීරමින් දිලියෙමින් සමහරහු රුවන්පියුම්කෙමියෙහි වැඩසිටිති. සමහරහු රුවන්පියුම්කෙමියෙහි පලක් බැඳ වැඩ හිඳිති. සමහරහු රුවන් පියුම්ගැබ වැඩ හොවිත්. බුදුහු අහස විසිතුරු සතුරුවන් පහා මවා සවනත් රස් විහිදුවමින් සිටිති. නිර්මිත බුදුහු දු එසෙයින් මැ සවනත් රස් විහිදුවමින්

සමහරහු සක්මන් කෙරෙති; සමහරහු හිඳුති; සමහරහු හොවිත්. බුදුහු අහස විසිතුරු සතුරුවන් මඩු මවා සරස් කජඹෙන් වොරජමින් රුවන්පලඟ මත්තෙ වැඩහිඳිති. නිර්මිත බුදුහු ද එසෙයින් මැ සවනක් රස් විහිදුවමින් සමහරහු සරස් කජඹෙන් වොරජමින් සමහරහු සක්මන් කෙරෙති, සමහරහු සිටිති, සමහරහු හොවිත්. බුදුහු අහස රුවන් කූටාගාර මවා සවනක් රසින් දිලියෙමින් රුවන් යහන්හි වැඩ හොවිති. නිර්මිත බුදුහු ද එසෙයින් මැ සවනක් රසින් දිලියෙමින් සමහරහු සක්මන් කෙරෙති, සමහරහු සිටුති, සමහරහු හිඳුත්.

මෙසෙ රුවන්සක්මන්හිද අහස්හිද ගඬමඬ ශාඛායෙහිද අනෙසුවහස් බුදුත් මවා යමාමහපෙළහර කෙරෙත්.

එසින් කිහ පිළිසැඹියායෙහි:-

465. "භගවා වඩකමති, නිම්මිතො තිට්ඨති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති. භගවා තිට්ඨති, නිම්මිතො වඩකමති වා නිසීදති වා සෙය්‍යං වා කප්පෙති. භගවා නිසීදති, නිම්මිතො වඩකමති වා තිට්ඨති වා සෙය්‍යං වා කප්පෙති. භගවා සෙය්‍යං කප්පෙති නිම්මිතො වඩකමති වා තිට්ඨති වා නිසීදති වා" යි.

මෙසෙ යමාමහපෙළහර කරන නිර්මිත බුදුන්ගෙ ශරීරයෙන් නිඟිත වූ නානාවිරාගරුවිරරශ්මින් ගැවසිගත් සකල ගගනතලය නානාප්‍රකාර රත්නාභරණයෙන් මෙන් දිලියෙය.

එසින් කිහ:-

466. "නානාවිරාගරුවිරාහි මනොරමාහි
රංසීහි නිම්මිතසරීරවිනිග්ගතාහි
සබ්බං නභං සමවනද්ධතලං අහොසි
නානප්පකාරරතනාභරණුජ්ජලංව" යි.

---

හිඳිතිEF කඳඹෙන්F සිටිතිEF

මෙසෙ එක්සම්‍යක්සම්බුද්ධයෝ අනෙකසම්‍යක්සම්බුද්ධයන් වැ මැවෙත්.

---

(123). <u>බහුධාපි</u> <u>ගුත්වා</u> <u>එකො</u> <u>හොති</u> යන තන්හි ඔවුන් බොහොවැ මැවුණවුන් එක්සම්‍යක්සම්බුද්ධයක් වන පරිදි කිසෙ යැ යත්?

තුමුහු බොහො සම්‍යක්සම්බුද්ධ වැ නිර්මිත වූවාහු එක් සම්‍යක් සම්බුද්ධ කෙනෙකුන් ආවර්ජනා කෙරෙත්. ආවර්ජනා කොට "එක් සම්‍යක් සම්බුද්ධ යෙක් වෙමි" යි ඉටත්. ඔහු එක්සම්‍යක් සම්බුද්ධ කෙනෙක් වෙත්. මෙසෙයින් එකවට එකීභාවයට යෙත් ම යැ. ක්‍රමයෙන් එකීභූත වෙත් මැයි.

---

(124). <u>සෙය්‍යථාපි</u> <u>ආකාසෙ</u> යන තන්හි අහස්හි සෙයින් යන පරිදි කිසෙ යැ යත්?

බුදුහු ආකාශකෘත්ස්නසමාපත්ති සමවැද කුඩ්‍යාදීන් ආවර්ජනා කෙරෙත්. ආවර්ජනා කොට "ආකාශ වෙව" යි නුවණින් ඉටත්. හෙ ආකාශ වෙ. යම්සෙ සාද්ධි නැති මිනිස්හු කිසිවෙකින් අනාවෘත අපරිච්ඡිප්ත තැනැ නො පැහැර යෙද්ද, එසෙයින් මැ ඔහු කුඩ්‍යාදීන්ගෙ පාරයට නො පැහැර ආකාශයෙන් යනුවන් සෙයින් යෙත්.

---

(125). <u>සෙය්‍යථාපි</u> <u>උදකෙ</u> යන තන්හි දියෙහි සෙයින් ගැලෙන පරිදි කිසෙ යැ යත්?

බුදුහු අප්කෘත්ස්නසමාපත්ති සමවැද පොළොව ආවර්ජනා කෙරෙත්. ආවර්ජනා කොට "දිය වෙව" යි නුවණින් ඉටත්. හෙ දිය වෙ. යම්සෙ සෘද්ධි නැති මිනිස්හු දියෙහි උන්මජ්ජනනිමජ්ජන කෙරෙත් ද, එසෙයින් මැ ඔහු දියෙහි උන්මජ්ජනනිමජ්ජන කරනු වන් සෙයින් පොළොවැ උන්මජ්ජනනිමජ්ජන කෙරෙත්.

---

(126). සෙය්‍යථාපි පඨවියං යන තන්හි පොළොවැ සෙයින් මැ දියෙහි යන පරිදි කිසෙ යැ යත්?

පෘථිවීකෘත්ස්නසමාපත්ති සමවැද දිය ආවර්ජනා කෙරෙත්. ආවර්ජනා කොට "පොළොවි වෙව" යි නුවණින් ඉටත්. හෙ පොළොවි වෙ. යම්සෙ සෘද්ධි නැති මනුෂ්‍යයො අභිද්‍යමාන වූ පොළොවැ ගෙන යෙද්ද එසෙයින් මැ ඔහු පොළොවැ යනුවන් සෙයින් අභිද්‍යමාන වූ දියෙහි ගෙන යෙත්.

---

(127). සෙය්‍යථාපි පක්ඛී සකුණො යන තන්හි පක්ෂිශකුනින් සෙයින් ආකාශයෙහි වඩිත්‍රමණ කරන පරිදි කිසෙ යැ යත්?

ඔහු පෘථිවීකෘත්ස්නසමාපත්ති සමවැද ආකාශ ආවර්ජනා කෙරෙත්. ආවර්ජනා කොට "පොළොවි වෙව" යි නුවණින් ඉටත්. හෙ පොළොවි වෙ. යම්සෙ සෘද්ධි නැති මිනිස්හු පොළොවැ යෙත් ද සිටිත් ද හිඳිත් ද හොවිත් ද, එසෙයින් මැ ඔහු පක්ෂිශකුනින් සෙයින් අන්තරීක්ෂයෙහි සක්මන් කෙරෙති, සිටුති[1], හිඳුති[2], හොවිත්.

---

(128). පාණිනා පරිමසති පරිමජ්ජති යන තන්හි අත්ලෙන් හිරසඳ පිරිමදනා පරිදි කිසෙ යැ යත්?

---

[1] සිටුතිEF [2] හිඳුතිEF

ඔහු හුන්නාහු එවි හොත්තාහු එවි චන්ද්‍රසූර්‍ය්‍යයන් ආවර්ජනා කෙරෙත්. ආවර්ජනා කොට "අත්පස් වූවන් වැනි වෙත්ව" යි න්වණින් ඉටත්. ඔහු අත්පස් වෙත්. යම්සෙ සෘද්ධි නැති මිනිස්හු අත්පසැ කිසි කවර රූපයක් අතින් පිරිමදිත් ද, එසෙයින් මැ ඔහු හුන්නාහු එවි හොත්තාහු එවි චන්ද්‍රසූර්‍ය්‍යයන් කරතලයෙන් ආමර්ශ පරාමර්ශ පරිමාර්ජන[1] කෙරෙත්.

එසින් කිහ:-

467. "හුත්වාන එස බහුධා පුන හොති එකො
එසො රවිං චුසති ගණ්ඝති එස චන්දං,
හුත්වා තිරො භවති ආවි පුනොපි සත්ථා
එසො ඵලෙ විය ජලෙ'පි සුඛම්පයාති.

භූමිං ජලං විය විගාහති එස තං තං
ඉරියාපථං රවිපථෙ භගවා කරොති,
එවං සුරාසුරනරෙ පරිතොසයන්තො
යම්පාටිහෙර[3]මකරි බහුධා මුනින්දෙ" යි.

---

(129). <u>යාව</u> <u>බ්‍රහ්මලොකාපි</u> <u>කායෙන</u> <u>වසං</u> <u>වන්තෙති</u> යන තන්හි

යාවත් බඹලෙව්හි දක්වා ශරීරයෙන් තමන් විසිය පවත්වන පරිදි කිසෙ සැ යත්?

ඔහු බඹලෙව් යාටි[2] වූහු නම් දුරුදු වුව "වැළැත් වෙව" යි ඉටති; හෙ වැළැත් වෙ. වැළැත් ද වුව "දුරු වෙව" යි ඉටති. හෙ දුරු වෙ. බොහො ද වුව "මඳ වෙව" යි ඉටති. හෙ මඳ වෙ මඳ ද වුව "බොහො වෙව" යි ඉටති. හෙ බොහො වෙ.

---

[1] පරිමර්ජන EF [3] සම්පාටිහිර B [2] යායටි B

ඉදින් දෘශ්‍යමානශරීරයෙන් බඹලෙවි යාටි වූහු නම් කායවශයෙන් චිත්තපරිණාමනා කොට ඉටා දෘශ්‍යමානශරීරයෙන් යෙති. අදෘශ්‍යමානශරීරයෙන් යාටිවූහු නම් චිත්තවශයෙන් කායපරිණාමනා කොට අදෘශ්‍යමානශරීරයෙන් යෙති. ගොස් බ්‍රහ්මලොකයෙහි සිට මනොමයරූපනිර්මාණ කොට සෘද්ධිප්‍රාතිහාර්‍ය දක්වත්.

සිඛීසම්මාසම්බුදුන්ගෙ "අභිභූ" නම් මහතෙරකෙනෙක් බඹලොව සිට දහසක් සක්වළ වැසියනට ධර්ම දෙසූහු කියෙ යැ යත්?

කියෙ මැ නො
අරුණවතියසුත් දෙසන බුදුන් විසින්:-

468. "සිඛීස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස අභිභූ නාම සාවකො බ්‍රහ්මලොකෙ ඨිතො සහස්සිලොකධාතුං සරෙන විඤ්ඤා පෙසි. දිස්සමානෙනපි කායෙන ධම්මං දෙසෙසි, අදිස්සමානෙනපි කායෙන ධම්මං දෙසෙසි, දිස්සමානෙනපි හෙට්ඨිමෙන උපඩ්ඩ කායෙන අදිස්සමානෙනපි උපරිමෙන උපඩ්ඩ කායෙන ධම්මං දෙසෙසි. දිස්සමානෙනපි උපරිමෙන උපඩ්ඩ කායෙන අදිස්සමානෙනපි හෙට්ඨිමෙන උපඩ්ඩ කායෙන ධම්මං දෙසෙසි. සො ප්‍රකති වණ්ණං විජහිත්වා කුමාරවණ්ණං වා දස්සෙති. නාගවණ්ණං වා දස්සෙති, සුපණ්ණවණ්ණං වා දස්සෙති, යක්ඛවණ්ණං වා දස්සෙති, අසුර වණ්ණං වා දස්සෙති, ඉන්දවණ්ණං වා දස්සෙති, දෙවවණ්ණං වා දස්සෙති, බ්‍රහ්මවණ්ණං වා දස්සෙති, සමුද්දවණ්ණං වා දස්සෙති, පබ්බතවණ්ණං වා දස්සෙති, වනවණ්ණං වා දස්සෙති, සීහවණ්ණං වා දස්සෙති, ව්‍යග්ඝවණ්ණං වා දස්සෙති, හත්ථිම්පි දස්සෙති, අස්සම්පි දස්සෙති, රථම්පි දස්සෙති, පත්තිම්පි දස්සෙති, විවිධම්පි සෙනාබ්‍යුහං දස්සෙති" යි.

ශ්‍රාවකයන් මෙසෙ වත් සම්‍යක් සම්බුද්ධයන් කෙරෙහි මැ කවර කථා යැ?

එයින් වදාළහ:-

469. "එකපුග්ගලො භික්ඛවෙ ලොකෙ උප්පජ්ජමානො උප්පජ්ජති අච්ඡරිය මනුස්සො. කතමො එකපුග්ගලො ? තථාගතො අරහං සම්මාසම්බුද්ධො"යි.

---

(130). තතො අට්ඨසට්ඨියොජනසහස්සාධිකයොජනසත සහස්සුග්ගතරතනමෙරුමත්ථකෙ යනාදි වාක්‍යයෙහි සානුක්තාර්ථ ප්‍රමෙය කවර යත් ?

බුදුහු යමකප්‍රාතිහාර්‍ය දක්වා විසිකෙළක් දෙනා අධිගම කරවා අතීතාංශඥානයෙන් බලන්නාහු පූර්වබුද්ධයන් යමකප්‍රාතිහාර්‍ය දක්වා තව්තිසාදෙව්නුවර වස්එළඹැ මවුපාමොක් දෙව්යනට විජමි දෙසූ සෙ දැක එසෙයින් මැ විජමි[1] දෙසන්නට වඩනාහු පිරිස්වැස්සන් සුළුනෙවඩු මහසිටුහට සමු[2] කොට ඔවුන් ළ අස් වසන්නට මහමුගලන් මහතෙරනට සමු කොට තමන් මැවූ නොයෙක්සුවහස් බුදුන් කෙරෙන් එක්කෙනකුනු දු නො සිටුවා අවරන්පත් හිරසඳ සෙයින් අන්තරහිත වූහු.

එකෙණෙහි විසිතුරු පෙළහර ද බුදුනු දු නුදුටු ජනයො දළ සෝනෙලෙන් වැහැසැ වලපිත්. ඔවුන් කෙරෙහි[3] ඇතමි කෙනෙක් "ඔස බුදුහු කෙලෙස්කුළු හො සිත්කුළු හො යුගඳුරු ගල් හො මඳුරුගල් හො වැඩියාහු වෙති, අප ඇස් ලදුයෙහි එල විඳුවා" යයි වලපිත්.

එයින් කීහ:-

470 "ගතොනු චිත්තකූටං වා කෙලාසං වා යුගන්ධරං
න නො දක්ඛෙම සම්බුද්ධං ලොකජෙට්ඨං නරාසභං"යි.

ඇතමිකෙනෙක් "බුදුහු විවොකාභිරතයහ. මෙසා පිරිසැ උකටලී වැ අප පියා අනෙක් රටක් ගියාහු වෙති"යි වලපිත්.

එයින් කීහ:-

471 "පවිවෙකරතො ධීරො නයිමං ලොකං පුනෙහිති
න නො දක්ඛෙම සම්බුද්ධං ලොකජෙට්ඨං නරාසභං"යි.

---

[1] බිජමිB [2] හමුCD [3] කෙරෙන්CD

මෙසෙ නොයෙක් සෙ වැහැසැ ඇතමිහු "ප්‍රාතිහාර්‍ය්‍ය හො නො කටයුත්තෙ ය, අප ශොකාවර්‍ත්‍යයෙහි හො නොගැලිය යුත්තෙ ය" යි බුදුනට මැසෙති. ඇතමිහු අනිත්‍යතායෙන් කම්පිත වැ වෙවුලත්. ඔවුන් කෙරෙහි ධීරපුරුෂයො අනුරුදු මහතෙරුන් කරා එළැඹැ "බුදුහු කොයට වැඩියහ?" යි පුළුවුත්හු. මහතෙරහු විජමි දෙසන්නට දෙවිලොව වැඩිපරිදි කිහ.

එ අසා ඇතමිකෙනෙක් වලප්මින් වහස්මින් තමන් තමන්ගෙ වාසස්ථානයට ගියහ. ඇතමිකෙනෙක් "සරණවත් මැනැ ම ය, මරණවත් මැනැ ම ය, බුදුන් දැක මිස නො යමිහ" යි සතිස් යොජනක් තන්හි කඳවුරු බැන්දහු. ඔවුන් අභ්‍යවකාශයෙහි පොළොවි පිටු යහන් කොට වසනුවනට සිහිල්හුණුමැසිමදුරු පිරිපත් නො ද විය. සිරිරුකිස කරන කලැ පොළොවි විවර විය. හැම තන්හි මැ පිරිසුදු පොළොවිතල වී.

සුළනෙවඩු මහසිටු ඔවුන් නැවති පරිදි අසා බුදුන් වදාළ දැ සඳහන් කොට එ ශ්‍රද්ධාසම්පන්න වීරපුරුෂයන් කරා එළැඹැ ඔවුන් රිසි හැදින සිනිඳු මියුරු බොජුන් හා ගඳමල්බුලත් හා පිළි නිරන්තරයෙන් එකදවසක් සෙ පැවැත්විය. මහමුගලන් මහතෙරහු ඔවුන්[1] අස්වසා ධමි දෙසූහු.

බුදුහු අන්තරහිත වූවාහු දකුණුපා නඟා යුගඳුරු මුදුනෙහි තුබූහ. වම්පා නඟා මෙරමුදුනෙහි තුබූහ. මෙසෙ සැවැත්මෙර තුරෙහි තුන්පියවරෙක් වී. බුදුන් හසුන් කන් විදහා ඇක්මුණහ යි නො සිතුව මැනැව. ඔවුන් පළමු පය නඟන විගස සුවාසූදහසක් යොදුන් යුගඳුරුගල් නැමී දකුණුපය පිළිගත. දෙවන පය නඟන විගස එක්සුවහස් අටසැටදහස් යොදුන් සුනෙරගිරි රජ නැමී වමි පය පිළිගත.

එකල්හි සක්දෙව්රජ නොයෙක් මිණිරසින් දිලියෙන කැරැලි අගින් දහසක් යොදුන් විජයත් මහපා ඇති නවසියක්

---

[1] ඔවුන්ළ

යොදුන් සුධම්දෙවිසභා ඈ නොයෙක් දිවවිමන් ඇති පළල සැටයොදුන් සුදසුන්මහවේ ඈ නොඑක් වීටිඇති දිවකුසුම් බරෙන් වොරජනා නඳුන්උයන් ඈ නොඑක් උයන් ඇති දිවපියුම් රොනින් සුවඳ වූ සිත්පොකුණු ඈ නොයෙක් පොකුණු ඇති දසයොදුන්දහස් අයම්විතර ඇති දහසක් රුවන්දෙරටුයෙන් දිලියෙන තව්තිසා දෙව්නුවර පනස්යොදුන් ස්කන්ධයෙන් හා පනස් පනස් යොදුන් පඤ්චමහාශාඛාවෙන් විභූෂිත වූ තුන්සියක් යොදුන් ශාඛාමණ්ඩල ඇති පනස්යොදුනක් තන්හි පැතිරෙන පුෂ්ප ප්‍රභායෙන් භාසුර වූ සියක්යොදුන් තන්හි පැතිරෙන පුෂ්ප ගන්ධයෙන් සුගන්ධිත වූ සර්ව පාරිචූල්ල වූ පරසතුරුක්මුල්හි උසායෙහි පසළොස්යොදුන් පළල පනස්යොදුන් දිග සැට යොදුන් බඳුවදකුසුම්දල සෙයින් රත් වූ හපුප්තෙලි සෙයින් මෙළෙක් වූ මනො'කූල සෘතු දෙනු වූ පඬුඇඹුල්සල අස්න පෙරට වැඩ සිටි බුදුන් දැක "බුදුහු දෙවියනට වැඩ සඳහා පඬුඇඹුල්සල අස්නෙහි වස් වෙසෙති, බුදුන් එහි වලඳගත් තැනින් මත්තෙ හෙ දැකැට වෙයි; එයින් දෙව්ලොවැසියනට මහත් වැඩ වෙයි; බුදුහු කුඩාහ අස්න මහත එයට සුහු[1] නො වෙති" යි සිති.

බුදුහු ඔහු අදහස් දැන සඟළසිවුර විදහා වුහුටහ. එයින් සල අස්න වැසිණ. එදැක සක්දෙව්රජ "සඟළසිවුර සෙයින් බුදුන් හා ශිලාතලයට සුහු නුවුව මැනැවැ" යි සිති. බුදුහු ඔහු අදහස් දැන එසා මහත් අස්නැ කුරුපුටුවෙක්හි හිඳිනා මහාපාංශුකූලිකයක්හු සෙයින් දෙහොදණින්[2] ඇතුළු කොට අස්න වසා යුගඳුරු මුදුනෙහි සරාහිරක් සෙයින් දිලියෙමින් වැඩහුන්හු.

එසඳ සක්දෙව්රජ බුදුන්ගෙ අනෙකසෘද්ධිප්‍රාතිහාර්‍ය්‍ය දැක ද තමා මෙවැනි දෙයක් සිතනු ප්‍රමාදයෙන් කැරුණෙය" යි

---

[1] සුදුසුE [2] දෙහොදණCDE

වේශ්‍යයී මද[1] ගරහමින් නළුගණා පිරිවරා අවුදු බුදුන් වැද එකත්පස් වැ හිනි. මවුදෙව්පුතණුවො සහපිරිවරින් තුසි[2] පුරයෙන් අවුදු බුදුන් වැද එකත්පස්ව හුන්හු දසදහසක් සක්වළ දෙව්බඹහු අවුදු සියුම් අත්බැව් මවාගෙන සක්වළගැබ පිරි හුන්හ.

එකල්හි බුදුහු දෙව්බඹපිරිස්මැද සුරලොව් බබුළුවමින් හිඳ මවුදෙව්පුතණුවන් ප්‍රධානකොට තුන්මසක් දවස් නිරන්තරයෙන් ආකාශගඞ්ගාප්‍රවාහ සෙයින් සප්තප්‍රකරණ අභිධර්මදෙශනා කරන්නාහු භික්ෂාචාරවෙලායෙහි "මා එනතාක් මොහු මෙතෙක් දහම් දෙසත්ව" යි නිර්මිත බුදුන් මවා දෙවියන් නො දන්නා පරිද්දෙන් අනුතත්විල් එළැඹැ නාලියදැව්වූ වළඳ උතුරුකුරු දිවින් අහර ගෙන මහසල්මළුයෙහි හිඳ වළඳ උපස්ථානයට ගිය ධම් සෙනෙවි සැරියුත් මහතෙරනට "අද මම් දෙවියනට මෙතෙක් ධම් දෙසීම්, නිර්මිත බුදුහු මෙතෙක් ධම් දෙසූහ" යි නයවිසින් වදරා යමාමහපෙළහරයෙහි පැහැද පැවිදි වූ පන් සියක් කුලපුත්‍රයනට ප්‍රතිපාදනා කරනු කොට දෙව්ලොව් ගොස් නිර්මිත බුදුන්ගෙ දෙශනාසන්ධිය ගෙන ඔවුන් අන්තරහිත කොට වැඩ හිඳ විජම් දෙසත්.

එකල්හි වප පුණුපොහොයට සත්දවසක් ඇති කලැ සතිස් යොදුන්පිරිස්වැසියො මහමුගලන් මහතෙරුන් කරා එළැඹැ "බුදුන් වඩනා දවස නියම දන්නෙ මැනැවැ" යූහු. එසඳ මහතෙරහු "පිරිස් වැසියො මා දකිත්වයි" ඉටා පොළොව් කිම්ද අහස්හි ජවගත් ගුරුළුරජක්හු සෙයින් ඇසැස්හි දිස්මින් බුදුන් කරා වැඩියහ. පිරිස්වැසියො මහතෙරුන් පොළොව් කිම්ද මහදිවි කොදිවි ගෙවා වඩනා කල ද සත්මුහුදු සත්කුලපවි ඉක්මැ වඩනා කල ද දක්නාහු ඔවුන් මෙරගල්පයත් පැමිණැ

---

[1] පද ABEF [2] තුෂිත CDE

දෑරගමිනී රූවතෙක්හි ඇවිණූ[1] රත්පලස්හුයක් සෙයින් පෙනෙනුවන් මිණිබිත්තුසෙක්හි නිල්මහනෙල්විලස් දක්වමින් රූවන්සුනෙර මැදින් නැඟෙනුවන් දක්නාහු "එක් යොජනක් නැංගහ, දෙයොජනක් නැංගහ, දහසක්යොදුන් නැංගහ, සුවහසක් යොදුන් නැංගහ" යි බලනුවෝ මුදුනෙන් බුදුන් පා නහමින් නැඟි වැඳ සිටියන් දැක දෙවිනුවර දූ දෙවිපිරිසු දූ බුදුහු දූ දැක තුෂ්ටරවයෙන් ගුගුළෝ.

එසඳ මහමුගලන් මහතෙරහු "පිරිස්වැසියෝ වහන්සෙ දැක මිස නො යමිහයි හුන්හ. කවරකලයැ හෝ මිනිස්ලොව් වඩනෙ?" යයි පුවවූත්හු. බුදුහු "තා මහලූ බෑ සැරියුත් කොහිදැ?" යි පිළිවිය "සකස්නුවරැ එස්වූසූහ" යි කීයෙන් "අදින්[2] සත්දවසෙකින් වප පුණුපොහොයැ සකස්නුවරදෙර බස්මි. මා දැක්කැටියන් එයට එන්නෙය" යි වදලෝ.

මහතෙරහු ව මෑ නියායෙන් බැස පොළොව් කිමිද ගොස් පිරිස්වැසියනට එපවත් සැලකළහ. පිරිස්වැසියෝ වප පුණුපොහෝ දවස් පෙහෙවැ ගෙදෙර වෙහෙරක බණ අසන්නට යනුවන් සෙයින් සැවැත්නුවරින් සකස්නුවර තිස්යොජනක් තැන් අතුරෙහි එක්පියවරින් ගියෝ. එදවස් බුදුහු අසූකෙළක් දෙවී බඹුන් අධිගම කරවා ධම්දෙසුන් සමහර කොළෝ.

---

(131). සමපණ්ණාසමුව්‍යහාහි මුව්‍යිත්ථා යන තන්හි "සම පඤ්ඤාශන්මූර්ව්‍යහා" නම් කවරැ යත්?

හෙ දිව්‍යලොකයෙහි නියත වූ වීණාවාදික විධි ගෙන කීයෙ යැ. මනුෂ්‍යලොකයෙහි වූ කලැ එක්විසි මූර්ව්‍යහා යි.

---

[1] ඇවුණූ CDEF [2] අන් CDEF

එයින් කිහ:-

472. "සත්ත සරා තයෝ ගාමා මූර්ඡනා චතුවීසති.
ඨානාතෙකූනපඤ්ඤාස[1] ඉච්චෙතෙ සරමණ්ඩලං" යි.

එහි "ෂඩ්ජ යැ ඍෂභ යැ ගාන්ධාර යැ මධ්‍යම යැ පඤ්චම යැ ධෛවත යැ නිෂාද යැ" යන මෙවිහු සප්ත ස්වරයහ "ෂඩ්ජග්‍රාම යැ මධ්‍යමග්‍රාම යැ සාධාරණග්‍රාම[2] යැ" යන තුන් ග්‍රාමයෙහි ස්වර සමූයහ යන අර්ථයි. මනුෂ්‍යලොකයෙහි වාදන විධීන් එකෙකි ස්වරයන්ගෙ තුන් තුන් මූර්ඡනා බැවින් එක්විසි මූර්ඡනාවොයි. එකෙකි ස්වරයන්ගෙ සත් සත් ස්ථානභෙදයහ යන යම් හෙතුවෙකින් ස්වරයන්ගෙ මන්ද්‍රාකාරව්‍යවස්ථාවෙ ද එවිහු එකුන්පනස් ස්ථාන විශෙෂයොයි. ශ්‍රැතිහි තුන්දෙන යැ දෙදෙන යැ සතරදෙන යැ සතරදෙන යැ තුන්දෙනයැ දෙදෙන යැ සතරදෙනය යි ද්වාවිංශති ශ්‍රැතිභෙදයෝ ඊප්සිතයොයි.

පන්සිකාදෙවිපුත් වනාහි එකෙකි ස්වරයට සත් සත් මූර්ඡනා වහ අන්‍යස්වරයට එක් මූර්ඡනායෙකැයි සමපඤ්ඤාශත් මූර්ඡනාවට යොග්‍යභාවයෙන් වීණාව සැදී.

(132). බුද්ධුපට්ඨාකානං භික්ඛූනං අග්ගා යන තන්හි අග්‍ර ශබ්දය "යාවතා භික්ඛවෙ සත්තා අපදා වා දිපදා වා චතුප්පදා වා බහුප්පදා වා තථාගතො තෙසං අග්ගමක්ඛායති" යන තන්හි සෙයින් ශ්‍රෙෂ්ඨයෙහි වැටෙයි. මෙයින් බැහැර "අජ්ජතග්ගෙ සම්ම දොවාරික ආවරාමි ද්වාරං නිගණ්ඨානං නිගණ්ඨිනං" යන තන්හි ආදියැ වැටෙයි. "තෙනෙව අඩ්ඪුලග්ගෙන තං අඩ්ඪුලග්ගං පරාමසෙය්‍ය" යන තන්හි ද "උච්චග්ගං වෙළග්ගං" යන තන්හි ද

---

[1] ඨානා චතුනපඤ්ඤාසCD [2] Sosata in his Sinhalese paraphrase of Kavsilumina (p. 95) corrects this — ගාන්ධාර to be

කොටියෙහි වැටෙයි. "අනුජානාමි භික්ඛවෙ අම්බිලග්ගං වා මධුරග්ගං වා තිත්තකග්ගං වා විහාරග්ගෙන වා පරිවෙණග්ගෙන වා භාජෙතුං" යන තන්හි කොටස්හි වැටෙයි.

---

(133). සාවත්ථියං අනාථපිණ්ඩිකවිසාඛාදිපඤ්චකොටිමත්තා යනාදි තන්හි ඔව්හු මහබෝ පිහිටුවන තැනට සව්බරණින් සැදී ගදමල් ගෙන ගොස් රැස්වූහ. ඔවුන් කෙරෙහි විශාඛා මෙහෙල පළඳනායෙන් සවිසැජ වූ.

මෙහෙලපළඳනා නම් කවර යත්? එපළඳනෙහි බදරුවන් සතරනැළියෙක් විදුරු, එකොළොස්නැළියෙක් මුතු, දෙවිසිනැළියෙක් පබළු, තෙතිස්නැළියෙක් මැණිකැ. සතුරුවනින් නිමියෙ යැ. රිදීහුයින් ඇවුණුයෙයැ. හිස ගන්වාලූයෙ පිටුපා දක්වා බැස සිටී. එපළඳනෙහි එක් මොනරකු කෙළෙ යැ. ඔහු දකුණු පියායෙහි රත්රන්මුවා පන්සියක් පතැ, වම්පියායෙහි පන්සියක් පතැ, තුඩ පබළුමුවා යැ, ඇස් මිණිමුවා යැ, පත්නළ ද පා ද රිදීමුවා යැ, ඇය මුදුනෙහි ගල්මුදුනෙහි සිට නටන මොනරක්හු සෙ පැනෙයි. පත්නළදහස්හි හඬ දිවගදෙව්හඬ සෙයින් පවත්ති. පළඳනා නවකෙළක් වටී. විශාඛාවට එ පළඳනාව පෙරබුදුන්ගෙ සස්නෙහි සඟනට සිවුරුපිළි හූ හිදිකටුදුන් පින්කමින් නිපන්නෙයි.

---

(134). සා මෙ දෙසනා පරිනිබ්බුතස්සාපි පඤ්චවස්ස සහස්සානි සත්තානං අමතමහානිබ්බානසම්පාපිකා භවිස්සති යන තන්හි බුදුන්ගෙ දෙශනා ඔවුන් පිරිනිවි කල ද පස්වාදහස් සත්නට අමාමහනිවන් සාධා දෙන පරිදි කිසෙ යැ යත්?

බුදුන් මැදුම්සඟියැ ජජක්කසූත දෙසූ කලැ සඟහු සැට දෙනෙක් රාත් වූහ. එ මැ සුත සැරියුත්මහතෙරුන් දෙසූ කලැ සැට දෙනෙක් මැ රාත් වූහ. මහමුගලන් මහතෙරුන් දෙසූ කලැ සැටදෙනෙක් මැ රාත් වූහ. මෙ මැ නියායෙන් මහසුප්මහතෙරුන් අනුරුත් මහතෙරුන් ඈ අසූමහසව්වන් දෙසූ කලැ සැට සැටදෙන රාත් වූහ. බුදුන් පිරිනිවි කලැ ලක්දිව මලියදෙව[1] නම් මහතෙරුන් ලෝවාමහාපායැ යටමාලෙහි හිඳ දෙසූකලැ සැට දෙනෙක් මැ රාත් වූහ. මහමඩියෙ හිඳ දෙසූ කලැ සැට දෙනෙක් මැ රාත් වූහ. මහ වෙහෙරින් නික්ම ගොස් සෑගිරියැ හිඳ දෙසූ කලැ සැටදෙනෙක්මැ රාත් වූහ. මෙසෙ මලියදෙව්[1] මහතෙරුන් හැවක්[2] වෙහෙර හිඳ දෙසූ කල ද කුදුලා වෙහෙර හිඳ දෙසූ කල ද මුත්ගලු[3] වෙහෙර හිඳ දෙසූ කල ද සෑපවියෙහි හිඳ දෙසූ කල ද, පැදුම්ගෙහි හිඳ දෙසූ කල ද, දිගාවෙහෙර හිඳ දෙසූ කල ද, ළදුරා වෙහෙර හිඳ දෙසූ කල ද, දෙමටමල් වෙහෙර හිඳ දෙසූ කල ද, එයින් ගොස් සිතුල්පව් වෙහෙර හිඳ සැටවස් තෙරුන් සැටදෙනහට දෙසූකල ද, එයින් ගොස් තිස්මහවෙහෙර හිඳ දෙසූ කල ද, නාතිස්වෙහෙර හිඳ දෙසූ කල ද ගලගස්ගම්හි හිඳ දෙසූ කල ද, එයින් කැලණී ගොස් සාදවස් මහපහයැ යටමාලෙහි හිඳ දෙසූ කල ද, පොහො දවස් උඩුමාලෙහි හිඳ දෙසූ කල ද, සඟහු සැට සැට දෙන රාත් වූහ.

මෙඈ සැටතැනෙක්හි හිඳ මලියදෙව්[1] මහතෙරුන් මෙසුත දෙසූ කලැ මෙසෙ සැටසැටදෙන රාත් වූහ. තෙවලා සුළුනා මහතෙරුන් ඇඹුල්හැලු[4] වෙහෙර හිඳ මෙසුත දෙසන දවස් මිනිස් පිරිස් ගව්වක් තන්හි විය. දෙව්පිරිස් යොජනක්

---

[1] මලයදෙව BCEF [2] හැවක් A [2] හවක් B [2] සැවක් E [2] සැවක් F
[3] වුතගලු AF [3] මුතගලු B [4] ඇඹුල්හලු A [4] ඇඹුලගලු BF

තන්හි වී. යුත දෙසූ අවසන්හි යහපු දහසක් දෙන රාත් වූහු. දෙවියන් කෙරෙහි වූකලැ එකෙකි දෙයෙන් එකෙකි දෙන ම පුහුදුන් වූහු. මෙසෙ බුදුන්ගෙ දෙගනා ඔවුන් පිරිනිවී කල දැ සත්නට අමා මහතිවන් සාධා.

---

(135). සකපරහිතසමත්ථා යන තන්හි ඔවුන් සඞහිතපරහිතයෙහි සමථී පරිදි කිසෙ යැ යත්?

තුමූහු සීලසමාධි ප්‍රඥා විමුක්ති ඥානදර්ශනයෙන් සම්පන්නයහ. සෙස්සනු දූ සීලසමාධිප්‍රඥාවිමුක්තිඥාන දර්ශනයම්පත සමාදන් කරවත්.

එසින් වදළහ:-

473. "පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය ච. කතමෙහි පඤ්චහි? ඉධ භික්ඛවෙ භික්ඛු අත්තනා ච සීලසම්පන්නො හොති, පරඤ්ච සීලසම්පදාය සමාදපෙති. අත්තනා ච සමාධිසම්පන්නො හොති, පරඤ්ච සමාධිසම්පදාය සමාදපෙති. අත්තනා ච පඤ්ඤාසම්පන්නො හොති, පරඤ්ච පඤ්ඤාසම්පදාය සමාදපෙති. අත්තනා ච විමුත්තිසම්පන්නො හොති, පරඤ්ච විමුත්තිසම්පදාය සමාදපෙති. අත්තනා ච විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති, පරඤ්ච විමුත්තිඤාණදස්සනසම්පදාය සමාදපෙති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු අත්තහිතාය ච පටිපන්නො හොති පරහිතාය ච" යි.

---

(136). සමණගනා යන තන්හි "ශ්‍රමණයෝ" නම් කවරහ යත්?

ඔහු ශ්‍රමණාවලයහ, ශ්‍රමණපුණ්ඩරීකයහ, ශ්‍රමණපද්මයහ, ශ්‍රමණසුකුමාරයහ යි සතරදෙනෙක් වෙත්.

වහි ශ්‍රමණාවලයෝ" නම් යොවාන්හ. "ශ්‍රමණපුණ්ඩරීකයෝ" නම් සෙදගැමියහ. "ශ්‍රමණපද්මයෝ" නම් අනගැමියහ. "ශ්‍රමණ සුකුමාරයෝ" නම් ක්ෂීණාශ්‍රවයෝයි.

එයින් වදාළහ:-

474. "චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තෝ සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරෝ? සමණාවලෝ සමණ පුණ්ඩරීකෝ, සමණපදුමෝ, සමණෙසු සමණසුඛුමාලෝ. කථඤ්ච භික්ඛවෙ පුග්ගලෝ සමණාවලෝ[1] හොති? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා සොතාපන්නෝ හොති, අවිනිපාත ධම්මෝ, නියතෝ සම්බොධිපරායනෝ. එවං ඛෝ භික්ඛවෙ පුග්ගලෝ සමණාවලෝ[1] හොති. කථඤ්ච භික්ඛවෙ පුග්ගලෝ සමණපුණ්ඩරීකෝ හොති? ඉධ භික්ඛවෙ භික්ඛු තිණ්ණං සංයොජනානං පරික්ඛයා රාගදොසමොහානං තනුත්තා සකදාගාමී හොති, සකිදෙව ඉමං ලොකං ආගන්ත්වා දුක්ඛස්සන්තං කරොති. එවං ඛෝ භික්ඛවෙ පුග්ගලෝ සමණපුණ්ඩරීකෝ හොති. කතඤ්ච භික්ඛවෙ පුග්ගලෝ සමණපදුමෝ හොති? ඉධ භික්ඛවෙ භික්ඛු පඤ්චන්නං ඔරම්භාගියානං සංයොජනානං පරික්ඛයා ඔපපාතිකෝ හොති, තත්ථ පරිනිබ්බායී අනාවත්තිධම්මෝ තස්මා ලොකා. එවං ඛෝ භික්ඛවෙ පුග්ගලෝ සමණපදුමෝ හොති. කථඤ්ච භික්ඛවෙ පුග්ගලෝ සමණෙසු සමණසුඛුමාලෝ හොති? ඉධ භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උපසම්පජ්ජ විහරති. එවං ඛෝ භික්ඛවෙ පුග්ගලෝ සමණෙසු සමණසුඛුමාලෝ හොති" යි.

(137). අජිවජා යන තන්හි ඔවුන්ගෙ අල්පවජතායෙන් මෑ මෙහි නො දක්වනලදැ ධූතාඩගසමාදාන ද සඩගෘහීත වෙ. එබැවින්

---

[1] සමණමවලෝ PF

යමෙක් මහෙච්ඡ වී නම් හෙ ධුතාඞ්ගසමාදාන කළ ද අහිකුණපාදි ප්‍රක්ෂිප්ත කාංස්‍යපාත්‍ර සෙයින් සර්ජනයන් විසින් ජුගුප්සනීය වෙ.

එයින් වදාළහ ධම්සෙනෙවි සැරියුත්මහතෙරහු:-

475. "සෙය්‍යථාපි ආවුසො කංසපාති ආභතා ආපණා වා කම්මාර කුලා වා පරිසුද්ධා පරියොදාතා, තමෙනං සාමිකා අහිකුණපං වා කුක්කුරකුණපං වා මනුස්සකුණපං වා රවයිත්වා අඤ්ඤිස්සා කංසපාතියා පටිකුජ්ජිත්වා අන්තරාපණං පටිපජ්ජෙය්‍යුං. තමෙනං ජනො දිස්වා එවං වදෙය්‍ය: අම්හො කිමෙවිදං හරියති ජඤ්ඤ ජඤ්ඤං වියාති? තමෙනං උට්ඨහිත්වා අවාපුරිත්වා ඔලොකෙය්‍ය, තස්ස සහ දස්සනෙන අමනාපතා ච සණ්ඨහෙය්‍ය, පටික්කූලතා ච සණ්ඨහෙය්‍ය, ජෙගුච්ඡතා ච සණ්ඨහෙය්‍ය, ජිගච්ඡිතානම්පි න හොත්තුකම්‍යතා අස්ස, පගෙව සුහිතානං එව මෙව ඛො ආවුසො යස්ස කස්සවි භික්ඛුනො ඉමෙ පාපකා අකුසලා ඉච්ඡාවචරා අප්පහීනා දිස්සන්ති වෙව සූයන්ති ච. කිඤ්චාපි සො හොති ආරඤ්ඤකො, පන්තසෙනාසනො, පිණ්ඩපාතිකො, සපදානචාරී, පංසුකූලිකො, ලූඛචීවරධරො; අථ ඛො නං සබ්‍රහ්මචාරී නෙව[1] සක්කරොන්ති න ගරුකරොන්ති න මානෙන්ති න පූජෙන්ති"යි.

යම්කෙනෙක් අල්පෙච්ඡ වැ ධුතාඞ්ගසමාදාන කොළො ද ඔහු අනෙකසූපව්‍යඤ්ජන සම්පන්නශාලිභොජනප්‍රක්ෂිප්ත කාංස්‍යපාත්‍රයක් සෙයින් සර්ජනයන් විසින් ප්‍රාර්ථනීය වෙත්.

එයින් වදාළහ:-

476. "සෙය්‍යථාපි ආවුසො කංසපාති ආභතා ආපණා වා කම්මාර කුලා වා පරිශුද්ධා පරියොදාතා, තමෙනං සාමිකා සාලිනං ඔදනං විවිතකාළකං අනෙකසූපං අනෙක ව්‍යඤ්ජනං රවයිත්වා අඤ්ඤිස්සා කංසපාතියා පටිකුජ්ජිත්වා අන්තරාපණං පටිපජ්ජෙය්‍යුං. තමෙනං ජනො දිස්වා එවං

---

[1] නවෙව AB

වදෙය්‍ය: අමෙහා කිමෙවිදං හරියති ජඤ්ඤ ජඤ්ඤං වියාති, තමෙනං උට්ඨහිත්වා අවාපුරිත්වා ඔලොකෙය්‍ය, තස්‍ස සහදස්සනෙන මනාපතා ච සණ්ඨහෙය්‍ය, අප්පටික්කූලතා ච සණ්ඨහෙය්‍ය, අජෙගුච්ඡතා ච සණ්ඨහෙය්‍ය, සුහිතානම්පි හොන්තූ කම්‍යතා අස්‍ස, පගෙව ජිගච්ඡිතානං. එවමෙව ඛො ආවුසො යස්‍ස කස්‍සචි භික්ඛුනෙ ඉමෙ පාපකං අකුසලා ඉච්ඡාවචරා පහිනා දිස්සන්තිවෙව සූයන්ති ච. කිඤ්චාපි සො ගාමන්තවිහාරී, නෙමන්තනිකො, ගහපතිචීවරධරෝ. අථ ඛො නං සබ්‍රහ්මචාරී සක්කරොන්ති ගරුකරොන්ති මානෙන්ති පූජෙන්ති" යි.

(138). සන්තුට්ඨා යන තන්හි "සන්තොෂ" නම් කවර යත්?

ගිය දෑය ගොක නැති; එන දෑය ප්‍රාර්ථනා නැති; වර්තමානයෙහි ලද රූක්ෂප්‍රණීත වූ චීවරාදිප්‍රත්‍යයෙහි තොගිජු වැ පරිභොග කරන බැවින් චතුර්විධසන්තොෂයෙන් සන්තුෂ්ටයෝ.

එසින් වදළහ:-

477. "ඉධ භික්ඛවෙ භික්ඛු සන්තුට්ඨා හොති ඉතරීතරෙන චීවරෙන, ඉතරීතරචීවරසන්තුට්ඨියා ච වණ්ණවාදී, න ච චීවර හෙතු අනෙසනං අප්පතිරූපං ආපජ්ජති, අලද්ධා ච චීවරං න පරිතස්සති, ලද්ධාපි චීවරං අගථිතො අමුච්ඡිතො අනජ්ඣාපන්නා ආදීනවදස්සාවී නිස්සරණපඤ්ඤා පරිභුඤ්ජති" යනාදීන් සතර ආර්‍යවංශ.

(139). පවිවිත්තා යන තන්හි "පවිවෙක" නම්: කායවිවෙක යැ, චිත්තවිවෙක යැ, උපධිවිවෙකය" යි ත්‍රිවිධ වෙ.

එහි කාමයෙන් කෙරෙන් ව්‍යපකෘෂ්ටකායතායෙන් එකී භාවය කායවිවෙක යැ, ප්‍රථමධ්‍යානාදි අෂ්ටසමාපත්තීන් නීවරණාදීන් කෙරෙන් විවික්තතා චිත්තවිවෙක යැ, නිර්වාණය උපධිවිවෙක යි.

එහි කායවිවෙකය ගණසඩ්ගණිකාවිනොදනය කෙරෙයි; චිත්තවිවෙකය ක්ලේශසඩ්ගණිකාවිනොදනය කෙරෙයි; උපධිවිවෙකය සංස්කාරසඩ්ගණිකාවිනොදනය කෙරෙ. කායවිවෙකය චිත්තවිවෙකයට ප්‍රත්‍යය වෙයි; චිත්තවිවෙකය උපධිවිවෙකයට ප්‍රත්‍යය වෙ.

එසින් කීහ:-

478. "කායවිවෙකෝ ව්‍යපකට්ඨකායානං නෙක්ඛම්මාභිරතානං; චිත්තවිවෙකෝ ව පරිසුද්ධචිත්තානං පරමවොදානප්පත්තානං; උපධිවිවෙකෝ ව නිරූපධීනං පුග්ගලානං විසඩ්ඛාරගතානං" යි.

---

(140). පාපගරහිනෝ යන තන්හි පාපශබ්දයෙන් දක්වන ලද පාපපුද්ගලයෝ නම් කවරහ යත්? ශවාලාතොපමයන් හා කුහකයන් හා දුශ්ශීලයොයි.

"එහි ශවාලාතොපමයෝ" නම් කවරහ යත්?

වදුළෙ මැ නෝ:-

479. "සෙය්‍යථාපි භික්ඛවෙ ශවාලාතං උභතෝ පදිත්තං මජ්ඣෙ ගූථගතං නෙව නෙව ගාමෙ කට්ඨත්ථං වරති, න අරඤ්ඤෙ කට්ඨත්ථං වරති. තථූපමාහං භික්ඛවෙ ඉමං පුග්ගලං වදාමි ගිහීභොගා ච පරිහීනෝ, සාමඤ්ඤඤ්ච න පරිපූරෙති" යි.

කුහකයෝ නම් කවරහ යත්?

හෙ වදුළෙ මැ නෝ:-

480. "යෙ තෙ භික්ඛවෙ භික්ඛූ කුහා ථද්ධා ලපා සිඛී උන්නළා අසමාහිතා. න මෙ තෙ භික්ඛවෙ භික්ඛූ මාමකා,

අපාගතා වතෙ භික්ඛවෙ භික්ඛූ ඉමස්මා ධම්මවිනයා, න වතෙ ඉමස්මිං ධම්මවිනයෙ වුද්ධිං විරූළ්හිං වෙපුල්ලං ආපජ්ජන්ති" යි.

"දුශ්ශීලයෝ" නම් කවරහ යත්?

කියෙ මෑ නෝ:-

481. "දුශ්ශීලා කිඤ්චාපි ආරොහපරිණාහසම්පන්නා විසෙසවණ්ණ ධරා පට්ටදුකූලාදිමට්ඨවීවරධරා ගහිතමණිවණ්ණපත්තා පවිමුක්ත සුන්දරපරික්ඛාරා සීලගුණාදියාරවිරහිතත්තා චිත්ත කම්මාලඞ්කත ගුවඝටා විය සීහවම්මපාරුතගද්‍රහා[1] විය සුගන්ධ රත්තසාලිපටිභාග තප්පලාපා විය සිම්බලිරුක්ඛාදයෝ විය අන්තෝ නිස්සාරා දුස්සීල්‍ය ගුථ පූරණා සමණගද්‍රහා සමණපලාපා අන්තෝපූති සතත නිස්සන්දන මෙදකථාලිකා විය නිරන්තරනිස්සන්දනක්ලෙස කසම්බූජාතා සමණකාරණ්ඩා සකලලොකස්ස කුසලභණ්ඩතෙවන කම්මාවොරා පටිච්ඡන්න සඞ්ගොක්ඛමඞ්ගා විසොධිත අපායමඞ්ගා නිරයග්ගි අලාතභූතා වෙය්‍යාවච්චරහිතා සම්බුද්ධපතිකුට්ඨා නිච්චුබ්බිග්ගහදයා අග්ගික්ඛන්ධූපමසුත්තෙ වුත්තදුක්ඛ පටිග්ගාහකා කාරුණිකජනානං කරුණාය වත්ථුභූතා පාපාතාම" යි.

මෙබඳු පාපපුද්ගලයන් ඔහු තමන් පාපගර්හී වන බැවින් මහමුහුදු කුණු සෙයින් සත්තෙහි නො සිටිය දෙත්.

එයින් වදළහ:-

482. "සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දෙ න තෙන කුණපෙන සංවසති යං හොති මහාසමුද්දෙ මතං කුණපං, තං ඛිප්පංයෙව තීරං වාහෙති ථලං උස්සාදෙති. එවමෙව ඛො භික්ඛවෙ යො යො පුග්ගලෝ දුස්සීලෝ පාපධම්මෝ අසුචිසංකස්සර

---

[1] හදදහාCDEF

සමාචාරෝ පටිජානකම්මන්තා අස්සමණෝ සමණපටිඤ්ඤූ අබ්‍රහ්මචාරී බ්‍රහ්මචාරිපටිඤ්ඤූ අන්තෝපූති අවස්සුතෝ කසම්බුජාතෝ. න තෙන සඞ්ඝෝ සංවසති, ඛිප්පමෙව නං සන්නිපතිත්වා උක්ඛිපති. කිඤ්චාපි සෝ හෝති මංජුඤ්ච භික්ඛු සඞ්ඝස්ස නිසින්නෝ, අථ ඛෝ සෝ ආරකාව සඞ්ඝමජ්ඣා, සඞ්ඝෝ ච තෙන" යි.

---

(141). ආරද්ධවීරිය යන තන්හි වීරිය නම් කවර යත්?

නො උපන් අකුශලධර්මයන්ගෙ අනුත්පාද සඳහා, උපන් අකුශලධර්මයන්ගෙ ප්‍රහාණ සඳහා, නො උපන් කුශලධර්මයන්ගෙ උත්පාද සඳහා, උපන් කුශලධර්මයන්ගෙ පාරිපූර්‍යී සඳහා කරන ව්‍යායාමයි.

එයින් වදාළහ:-

483. "චත්තාරිමානි භික්ඛවෙ සම්මප්පධානානි: කතමානි චත්තාරි? ඉධ භික්ඛවෙභික්ඛු අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං අනුප්පාදය ඡන්දං ජනෙති වායමති වීරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති, උප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය - පෙ -, අනුප්පන්නානං කුසලානං ධම්මානං උප්පාදය, උප්පන්නානං කුසලානං ධම්මානං ඨිතියා අසම්මොසාය භිය්‍යෝ භාවාය වෙපුල්ලාය භාවනාය පාරිපූරියා ඡන්දං ජනෙති වායමති වීරියං ආරභති චිත්තං පග්ගණ්හාති පදහති. ඉමානි ඛෝ භික්ඛවෙ චත්තාරි සම්මප්පධානානි" යි.

---

(142). සීලසම්පන්නා යන තන්හි "ශීල" නම් කවර යත්?

484. "නව කොටිසහස්සානි අසීතිං සතකොටියො
පඤ්ඤාසං සතසහස්සානි ජත්තිංසා ච පුනාපරෙ" -

යනාදි ක්‍රමයෙන් දක්වනලද නවදහස් එක්සිය අසූකෙළ පනස්ලක්ෂ සතිස් ශික්ෂායෙකින් සමුපෙත වූ ප්‍රාතිමොක්ෂසංවර ශීල යැ; "ඉධ භික්ඛවෙභික්ඛු චක්ඛුනා රූපං දිස්වා න නිමිත්තග්ගාහී හොති" යනාදි ක්‍රමයෙන් දක්වනලද ඉන්ද්‍රියසංවරශීල යැ; එකවිංශතිඅන්වෙෂණයෙන්[1] විප්‍රමුක්ත වූ ආජීවපාරිශුද්ධිශීල යැ; අෂ්ටාඞ්ගසමුපෙත ප්‍රත්‍යවෙක්ෂායෙන් සම්ප්‍රයුක්ත වූ ප්‍රත්‍යය සන්නිශ්ශ්‍රිතශීල යැ. මෙසෙ චතුර්විධශීලයෙන් සම්පන්න වූ ඔවිහු වෙලළ නො පනන මුහුදු සෙයින් ජීවිත සඳහා ද ශික්ෂාපද ව්‍යතික්‍රම නො කෙරෙත්.

එයින් වදාළහ:-

485. "සෙය්‍යථාපි භික්ඛවෙ මහාසමුද්දො ඨිතධම්මො වෙලං නාති වත්තති. එවමෙව ඛො භික්ඛවෙ යං මයා සාවකානං සික්ඛාපදං පඤ්ඤත්තං තං මම සාවකා ජීවිතහෙතුපි නාතික්කමන්ති" යි.

(143). පඤ්ඤාසම්පන්නා යන තන්හි "සත්පුරුෂසංසෙවාදි සතරධර්මයෙන් සිද්ධ වූ ෂොඩශවිධ ප්‍රඥායෙන් පරිපූර්ණයහ" යූ සෙ යි.

එහි සත්පුරුෂසංසෙවාදි සතර ධර්මයන්ගෙ ෂොඩශවිධ ප්‍රඥාවට කාරණ වන පරිදි කිසෙ යැ යත්?

වදාළෙ මැ නො:-

486. චත්තාරොමෙ භික්ඛවෙ ධම්මා භාවිතා බහුලීකතා පඤ්ඤා පටිලාභාය සංවත්තන්ති, පඤ්ඤාවුද්ධියා සංවත්තන්ති,

[1] අනෙෂණයෙන් G

පඤ්ඤාවෙපුල්ලාය සංවත්තන්ති, මහාපඤ්ඤතාය සංවත්තන්ති, පුථුපඤ්ඤතාය සංවත්තන්ති, විපුලපඤ්ඤතාය සංවත්තන්ති, ගම්භීර පඤ්ඤතාය සංවත්තන්ති, අසාමන්තපඤ්ඤතාය සංවත්තන්ති, භූරිපඤ්ඤතාය සංවත්තන්ති, පඤ්ඤාබහුලතාය[1] සංවත්තන්ති, සීඝපඤ්ඤතාය සංවත්තන්ති, ලහුපඤ්ඤතාය සංවත්තන්ති, හාසුපඤ්ඤතාය සංවත්තන්ති, ජවනපඤ්ඤතාය සංවත්තන්ති, තික්ඛපඤ්ඤතාය සංවත්තන්ති, නිබ්බේධිකපඤ්ඤතාය සංවත්තන්ති. කතමෙ චත්තාරෝ ? සප්පුරිස සංසෙවෝ, සද්ධම්මසවනං, යොනිසෝ මනසිකාරෝ, ධම්මානුධම්මපටිපත්ති" යි.

---

(144). <u>විමුත්තිසමප්පත්තා</u> යන තන්හි විමුක්ති නම් "තදඞ්ග විමුක්ති යැ, විෂ්කම්භනවිමුක්ති යැ, සමුච්ඡේදවිමුක්ති යැ, ප්‍රතිප්‍රශ්‍රබ්ධි විමුක්ති යැ, නිස්සරණ විමුක්තිය" යි පඤ්චවිධ වෙ.

මෙහි අනිත්‍යානුදර්ශනාදි සප්ත අනුදර්ශනාවෝ තමන් තමන් විසින් එයට එයට ප්‍රත්‍යනීකාඞ්ගවශයෙන් පරිත්‍යක්ත නිත්‍යසඤ්ඤාදීන් කෙරෙන් විමුක්ත වන බැවින් "තදඞ්ගවිමුක්ති" නම් වෙත්.

අෂ්ටසමාපත්තීහි තමන් තමන් විසින් විෂ්කම්භිත නිවරණාදීන් කෙරෙන් විමුක්ත වන බැවින් "විෂ්කම්භනවිමුක්ති" නම් වෙත්.

සතර ආර්‍යමාර්ගයෝ තමන් තමන් විසින් සමුච්ඡින්න කෙළශයන් කෙරෙන් විමුක්ත වන බැවින් "සමුච්ඡේදවිමුක්ති" නම් වෙත්.

---

[1] බාහුල්ලායG

සතර ශ්‍රාමණ්‍යඵලයෝ මාහිංනුභාවයෙන් කෙලෙසයන්ගෙ ප්‍රතිප්‍රශ්‍රබ්ධ්‍යතයෙහි උපන් වන බැවින් "ප්‍රතිප්‍රශ්‍රබ්ධිවිමුක්ති" නම් වෙත්.

නිර්‍වාණය සර්‍වකෙලෙසයන් තෙරෙන් නිස්සෘත වන බැවින් අප ගත වන බැවින් දුරස්ථ වන බැවින් "නිස්සරණවිමුක්ති" නම් වෙ.

මෙසෙ ශීලසම්පත් ආදි පස් ධර්‍මයෙන් පරිපූර්‍ණ වන බැවින් ඔහු හැමදෙන මැ අනුත්තරපුණ්‍යක්ෂෙත්‍රයෝ.

එයින් වදාළහ:-

487. පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො භික්ඛු ආහුනෙය්‍යො හොති පාහුනෙය්‍යො දක්ඛිණෙය්‍යො අඤ්ජලි කරණීයො අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස. කතමෙහි පඤ්චහි ? ඉධ භික්ඛවෙ භික්ඛු සීලසම්පන්නො හොති, සමාධි සම්පන්නො හොති, පඤ්ඤසම්පන්නො හොති, විමුත්තිසම්පන්නො හොති, විමුත්තිඤාණදස්සනසම්පන්නො හොති. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො භික්ඛු - පෙ - අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලොකස්ස" යි.

---

(145). සබ්බඤ්ඤූපවාරණං පවාරෙසි යනු "ශ්‍රාවකප්‍රත්‍යෙක බුද්ධයන් හා අසාධාරණ වූ සර්‍වඥප්‍රවාරණයෙන් පැවරූහ" යූ ඉස යි.

ශ්‍රාවකප්‍රත්‍යෙකබුද්ධයෝ ප්‍රශ්නයට කාලාවකාශ වූවාහු "අසා දැන්මහ[1]" යෙති. බුදුහු වූ කල "රිසියුණු දැයක් පුළුවුස්නෙ යැ" යෙත්.

---

[1] දැනුම්මහ

මෙ විසඳය නො වෙයි; ඔවිහු සමාරභූමියෑ සිටි කල මැ සරභඞ්ගජාතකයෙහි ශක්‍රාදීන් සඳහා ඍෂීන් විසින් ආරාධ්‍ය වූවාහු.

488. "කතාවකාසා පුච්ඡන්තු හොත්තෝ
යං කිඤ්චි පඤ්හං මනසාභිපත්ථිතං
අහං හි තං තං වෝ ව්‍යාකරිස්සං
ඤත්වා සයං ලොකමිමං පරඤ්ච" යි -

සර්‍වඥප්‍රවාරණයෙන් පැවරූහ.

සමාවජාතකයෙහි "සුවීරත" නම් බමුණා මුව දඹදිව තුන්යලක් ඇවිද පැන කියන කෙනකුන් නො දැක තමන් කරා අවුදු පැන පුළුවුස්නට අවකාශ කැරවූ කල්හි සත්හැවිරිදිවයසැ වැලිවෙයෑ පස්කෙළි කෙළිමින් සිටියාහු අතුරෑවෙය මැ පලග් බැඳ හිඳ:-

489. "තඤ්ච තෙ අහමක්ඛිස්සං යථාපි කුසලෝ තථා
රාජා ව ඛෝ නං ජානාති යදි කාහති වා නවා" යි.

සර්‍වඥප්‍රවාරණයෙන් පැවරූහු මැ යි.

---

(146). දන්තපුරෙ රාජා හුත්වා යන තන්හි ඔහු දන්තපුරයෙහි රජ වූ පරිදි කිසෙ යෑ යත්?

මොහු මුත්නා කලිඟුරජු දවසැ ඔහු දරුවන් දෙදෙනාගෙ ලක්ෂණ බලන නෛමිත්තිකයෝ පියා ඇවැමෙන් මහකලිඟුකුමරහු චතුවර රජ වන පරිදි කීහ. සුචකලිඟු කුමරහු තාපසවෙසධර වැ ජීවිකා කරන සෙ ඔහු පුතකු වත්‍රවතී වන සෙ කීහු.

---

[1] පස් කෙළිමින් BEF

එක්බිසි දෙටපිත් පියා ඇවෑමෙන් රජ වීය. කුඩා පිත් යුව රජ වී. එකල්හි සුවකළිඳු කුමර "මපිතෙක් සක්විති වෙලෑ" යි පුතු නිසා උපන් අභිමානයෙන් ගවීත වැ වැටෙයි. රජ ව නො වින්දහි "එවිහු ගන්ව" යි යෙදී. එකෙණෙහි වරයෙක් ගොස් "රජ තා ගන්නට යෙදී යැ. තා දිවි[1] රැකෙන තෙනකට පලා යා" යි කී.

එකල්හි සුවකළිඳු කුමර තමාගෙ හස්මුදුදු[2] සිහින් පලසුදු කඟරුවන ද තමහට වැඩ පසස්නා ඇමැත්තක්හට පෑ "මෙසලකුණෙන් මපුතු ආ කලැ ඔවිහට රජය දෙව" යි කියා නුවරින් නික්ම ගමී නියම්ගම් ජනවි මලමඩුලු ගෙවා ගොස් හිමවත් අබියෙසට වැද නිල්අඹරෙහි[3] උල්කාපාත සෙයින් මතැත්යුග්හි දළ ගැහැටමෙන් නිල්වන අතුරෙන් පලන ගිනිදල බලමින්, මරාසල වටහි සිඳී වගුළ පියුම්රාමිණිරූ සෙයින් නවසදලපෙළෙවැ[4] මත් මුවරජුන් නියපදුරෙන් පැවැ මතැත්කුඹින් මුත් මුතුකැල දක්මින්, මේඝබිහි විදුලිය සෙයින් අහසින් ගොස් වන අතුරට වදනා සිදඹුවන් සියො සහකග සිදුබළන් නහමමින්, බමරපිය රැවින් හොඬනා සුපිපි තරුවනයන් බලමින්, සඳකැන් ගඟුල් ලාල් කෙළැ කොළොඹිව වැද මුවරඳ රොන් තවරගෙන දවන රවන බමන බමරවැළ අලළමින් බට හිමවිපවන් පහස් ලැබෙමින් ගොස් සොමි සිහිල් සිනිඳු පහන් දිය ඇති හොයක් වෙතැ රමණීපියෙසෙක්හි අසපුවක් කොට ගෙන තවුස්පැවිදු වැ විසී.

මදුරට ද යාගලනුවර මදුරජු දුවක් උපන. නෛමිත්තික යො ඇය ද ගෙ ලක්ෂණ බලා "මො තාපස වැ ජීවිකා කෙරෙයි. මැය පිතෙක් වූ කලැ චක්‍රවර්ති වෙයි" කිහු. මුව්දඹදිවිහි රජහු එපවත් අසා උනුන් යතාගතැටි වැ එකපැහැර අවුදු නුවර පිහිත කොට වටාගත්හු.

---

[1] දිවිකූ E
[2] හස්මුන්දG
[3] නිල්අඹුරෙBCL
[4] නවසජලපෙළ වැAEF

එකල්හි මදුරජ "ඉඳින් මම් මදුව මොවුන් කෙරෙන් එකක් හට දිනිමි නම් සෙසු[1] රජහු දහති; මදුව රැක්ක මැනැවැ" යි සිතා දුව ද බිසොව ද හැරගෙන එක්තරාවෙසෙකින් නික්ම පලාගොස් වනයට වැද සුචකළිඳු කුමරහට නුදුරුතන්හි උඩුහොයෑ අසපුවක් කොටගෙන පැවිදි වෑ විසී.

මෙසෙ පැවිදිරජු හා බිසොව හා දෙදෙන දුව අසපුවෙහි හිඳුවා වනයට ගොස් වලාවල්[2] ඇර ඇර කා වැටෙත්.

එකල්හි යුවරජසිරිවියෝ මහගිමින් කලකුළු සුචකළිඳු කුමරහු සහගමින් මෙන් වහරෙ කලෙක් සම්ප්‍රාප්ත වී.

එකල්හි කල්වියෝ සුචකළිඳු කුමර මරාසලවටෑහි සිඳි වගුළ පබවවෑළරූ බඳු නවසඳල ගැවැසි මිහිපිටුහි සරන රතිඳුගොවී කැල දැක, ගනකල් නමැති පියා ලළවන විදුලිය නමැති රන්දමට ලියනගලාලිය නමැති අඟනන් දිඟුකළ රතත් සෙයින් පිපි ලියනගලාමල් දැක, දිග්නමැති අඟනන් නිල්වලා නමැති මුහුළස්හි පළන් විසිතුරුමල්දම් සෙයින් තෙවිනා දෙවිදුනු බලා, ලියනගලාලියනමැති අඟනන් කුසුම් නමැති රතකින් ගත් මුත්හර බඳු මලින් ගලන දියදහර බලා; විදුලිය මැ රන්දම් ඇති කොකවැළ මැ දළ ඇති ගලන දියදහර මැ මදපොද ඇති ඇත් බඳින් බජන නිල්වලාකුළු නහමා, ගල්පයත්හි මත් ගඳගජන් හා සැහැසෙමින් මෙත් ගල්හිසට බට ජලලඹ නිල්මේකුළුහි ගජ ගැහුම් බඳු ගනගැහුම් අසා, හමුව සිහිල් උතුරුනලපහස් ලදිනුදු අස්වස් නො ලදී.

එකල්හි පුරුදු රිවිකල්හු කල්දස්නෙන් වනපත් දසවමියන් වලාවරලසින් ඉසපියන ගනපොදපතර මැ මිසිඳුවර විලසින් සැඳි, ගනගැහුමෙන් විසිර ගිය මත්බලාපෙළ මැ එම වන සෝකල්

---

[1] තෙසුG [2] පලපිලිG

පියමින් විහිය නොහී ඉසපියන දළලෙළපඬෙරහරසිරින් හොබනා, ඔවුන් මැ සතු මියෙනුඩුහුරු නලහවිවක් උසුලමින් පුල්නිකොළොඹිහි මඳ මඳ සැලෙමින්[1] මමන පවනසින් කල් වහරේකල් වවිහට අකල් වී.

දසනුදස සැඟ වූ නිල්වදුල් හා සමඟ කල්වියෝ සුවකලිඳු කුමරහට වනසෝකල් බොල් විය. වලානල හා සමඟ මියෙනුඩුහුරු නල මිමිය.[2] විදුලිය හා සමඟ මන වෙවුලිය. වැසිදහරා හා සමඟ කඳුවැදහරා වැහිණ. දිගත්හි දිවගත් මත්බලාපෙළ මැ කිරිවලා සෙ පැනිණ. ජලඔකලබින් වැදිලිගත් තැන් මැ දිවයුරු තෙදින් දමිතැන් සෙ පැනිණ. කොළොඹවන හිසින් මමන මුවරඳරොන් මැ රජකඳ සෙ පැනිණ. බමර බර[3] පුල් ලෙළ ලියනඟලා මැ දසනුදෙසෙහි සහදුම් ළැවිදල සෙ පැනිණ. වලානෙලෙන් මමන සිහිලැල් පොද මැ කුරුරස් ගොර මිරිඟුදල සෙ පැනිණ. හෙ ඔවිහට සිහිලස් ඉදන වහරෙයෙක් නොවිය; සතැවුලි කරන මහගිමෙක් වී.

මෙසෙ කල්වියෝ වැ වනවන් රජකුමරහූ එකලා වැදිරිය බැල ලා වහරේකල් ගෙවූ කල්හි සරාසිරින් මුවලෝ ආහපත්[4] වී. එකල්හි සරාසඳරසින් දිලියෙන මුවලෝ දැක මිණිදැදිරි පත්පෙළින් ගඳ වහන කුමුදුවන දැකැ, යහඟුම් මිණිදැල්පෙළ බඳු බමර වැළන් හොබනා වනවිල් දැකැ, තුරු පියන් වෙළෙප් ම හදන්හි[5] හෙව බිඟුපියරැවින් ගයන මලිඟිය ලියන් දැක, කල්වියෝ සුවකලිඳු කුමරහූ ආහපත් වූ කල්හි වයත්සිරින් මුවලෝ සවිසැජ වී.

එක්බිති නන්කුසුම්රෙජෙන් ලොවි තවරමින් කෙවුලන් කුල්වමින් මත්මොහරගනා පිලඹරා කෙනා ගන්වමින් වෙහෙල් මියුල්ගණා මනදෙළ පුරමින් ගඳගජන් මදකරවමින් මල්පල්ලෙන්

---

[1] සැලසෙමින් BEF [2] බිමිය AB [3] බැර ABEF
[4] යහපත් G [5] වෙළෙප්මැ හදන්හි G

සාමඩුලු සඳමින් බමරකැල ගුමිගන්වමින් වනවිල්හි තිසර උරගසින් බුන් රළසැකින් පුල්මහනෙල් ගලවමින් පියුමී තඹුරු වෙනෙහි රොන් උදහවමින් සපුසළලසල්වෙනෙහි බිඟුමුමන ගන්වමින් වියොජනන් සියෝ කෙරෙමින් සියොජනන් මනදෙළ පුරමින් කෙළිදෙළෙහි උමතු නවයෝනන්[1] වන යා කරවමින් නැඟි වයත් කල්හි මදුරජහුදු මවුපියන් වලාවලයට්[2] වනයා කළ කල්හි නන්විසිතුරු කුසුම් ගෙන මල්සුඹුවවක් කොට පැළැඳගෙන අසපුයෙන්[3] නික්ම සිවිපැහැයෙන් වනඅතුරු හොබවමින් පුල්ලෙළලියවම්යන් බිඟුපියරැවීන් බැණැ කුසුම් අසුරෙන් ඕනා මුවරඳ රොන්තවර ලැබෙමින් මඳ සුසුම්ගඳින් එවෙනෙහි බමර කැල බමවමින් ගොස් හොවැළයෙහි හිණුපෙළක් සෙ තුබූ මල් පල්ලෙන් සුසන් බමරගඳෙවී නොමුත් අඹරුකකට නැඟී කෙළෑ[4] පළන් මල්සුඹුවව දියෙහි පියා යෙයි. එක්දවසක් ඇය දියෙහි පියූ මල් සුඹුවව යටහොය නහා නැහෙන සුවකලිතු කුමරහු හිසැ ගොස් තුබූයෙ යි.

එකල්හි වනවන් යුවරජ මල්සුඹුවව දැකැ "මෙ නවයොනෙහි සිටි ළදැරියක අත්තමැ" යි වසත්නලපහස් ලද නහඹ ගඳගජක්හු සෙ හඹියෙන් උතුකී වැ "ගොස් බැලුව මැනැවැ" යි උඩුගඟට යනුයෙ කොමළ සුරත් පලුදෙලෙහි දිවි ලලා පියන් පියන්ගෙ පියබඳහි ඉසුරු විඳ කෙළනා වෙහෙල් මියුල්ගණා නහමමින්, ලෙළ ලියගළහොයළහි මොනරකිළින් මැඳ කෙකාරවින් ගහා නටන මත්මොනරගණා බලමින්, බමර ගිඟුමෙන් ගුමිගත් සුපුල් ලියළැහැබට වඳිමින්[5] විසිතුරු කෙසුරුමල්දෙලෙන් ගැවැසිගත් සුදු සිනිදු මෙළෙක් වැලිපිටු මඩිමින්, හාවභාවයෙන් ලළිත වරඟනන් බඳු නිරුපුල්රුක්හි සුපුල්මල් නහමමින්, සඳුන්පලු ලෙළ වූ සල්සලළ මල්රොන්මුඩු දිවගඳබර[6] මදුරාරජඉදුහු දිවකිඹුරු වෙණරැව්බඳු සහගුම්

---

[1] වනයෝනන්CDEF [2] පලපිලියටG [3] අසපියෙන්CDEF
[4] ගෙළF [5] වදමින්ABF [6] දිවගඳබමරAll

බමරකැල අල්ලමින් බැස තුනුවඟ ළඟ වැ යහදෙන හිමවිපවන් පහස් ලැබෙමින් ගොස් රජකුමරිය අඹරුක්හි හිඳ මියුරුසරයෙන් කියන ගී අසා රුක්මුලට එළැඹැ නිල්වලාගැබිහි විදුලියහවියෙන් සුනිල්දළ ගැබිහි දිස්නා දැරිය දැක ලොමුදෙහෙන් උදම් වී.

එවිහු සුනිල් යුවළනුවන්බිඳුහු ඇය වුවන්පියුම් දැකැ ඇසිපිය ස්යා පහරා යහදසුන් මී බොත්. එකල්හි සුවකලිඳු කුමර "මොා දෙවි අසරක හොා ? නා කිනුරු[1] ගදඹ සිදඹුවක හොා" ? යන සිතින් "සොඳුර තොා කවරහි ?"යි[2] පිළිවිත්. එසඳ රජකුමරි බමර පියරැවිබඳු සිනිඳු මියුරු තෙපුලෙන් "මිනිසක් මු හිමි" යූ. එ අසා යුවරජ "සපුපැහැසිවිය තී අඹුන්මිනිසක බැවින් ගසින් බස" වී.

මෙසෙ නොයෙක් සෙ බැණැ ගසින් බහා නොගත හී "කියහ සොඳුර මහබඹතෙමෙහෙ සඳින් සොමි ගෙනැ රන් ගලින් පහන් පැහැ උකහාගෙනැ වනවිලින් මත්හස්යුවළක් ගෙනැ තුන්රත් පියුමක් ඇරැ එයින් එකක් තබා දෙකක් හිරාගෙන සිනිඳු සුනිල් ම්හනෙල්මල් දෙකක් ගෙනැ ළහොපල්ලෙහි මෙළෙකක් ගෙනැ ළහෙල්මැල්ලෙහි සිහිලස් ගෙනැ සැහැසී හනා වතා බමරබර පුල් ලෙළ ලියෙක්හි එව තී මවමින් ළය කිසෙ ගල කෙළෙ හොා ?"යි කී.

එසඳ රජකුමරි "හිමි මමී කැතදුවක් මූ එයින් මා නොා බස්නා සේය"යි කියා "එසෙ හොත් මම ද කැතකුමරෙක්මී"යි කියෙන් "හිමි තෙපුලෙන් මතු ක්ෂත්‍රිය වන්නාහු නොා වෙති; තොප ක්ෂත්‍රිය වූවහොත් ක්ෂත්‍රිය මායා කියව"යි බැණැ එවිහු ක්ෂත්‍රිය මායා කී කල්හි තොමොහොා ද එවිහට ක්ෂත්‍රියමායා කියා අඹරුකින් බැස ළඟ වූ.

---

[1] කිදුරුAB [2] කවරහයිEF

එකල්හි රජකුමර බුලත්ලියවැලඳි පුවක්තුරුපෙතින් හා තකුල්කපුරුවනරැජින් හොබනා සහබමර ලියගෙකක්[1] දැක රජ දුවට "මෙහි හාත්පස්හි බමරගඳෙවී පැවැතියෙ යැ: මුවරඳරොත් තවරගත් බමරඅඟනන් හා සමග රිසියෙ මල් මී බොන බමරහු අවන්සුව විඳිනවුන් මැනියවිහ. එයට යමිහ" යි ඇය තමන් වන වදුලට නො යාදී රහත්පල්ලෙහි ගෙනැ ලියගෙට වැද පලුදල යහන් එළැඹ වලානලපහසින් පුබුදු නොළඹවනයක් සෙයින් ඇය ප්‍රබෝධ කෙළෙ.

එක්බිහි එරජකුමර ඇය සිහිවූ පහන් පැහැ මැ සම වැ මමන සිලිල් ඇති, තුක්කැලැකි මැ කරගවැළ ඇති, නැඹමඩුලු මැ සළා වැටුම් ඇති, සොඳුවුවන් මැ නවපුබුදු පියුම් ඇති, ඉඳුනිල්මිණි කැල්මෙන් උදුලන දිගු පුවල් නෙත් මැ නිල්මහනෙල් ඇති, මෙලෙක් අත් මැ පොකුරුඇලි ඇති, ලළන සුනිල් කියුඹුවැළවරලු මැ බිඟුපෙළ ඇති, ඉහිල්වසන් රසන්වැළ මැ හුන් මිදෙල්කුසුම් රිණී ඇති, නැහැ අලුත් අහරා මැ පියුම් රජතවර ඇති, තනන තනමඩුලු මැ වජඹනා මත්හස්රජුන් ඇති, විළිබර සිතා මැ පුප්නා කුමුදු ඇති, මුවතඹරෙන් ගලන වජන් මැ මිබිඳු ඇති, කල්තුනුවිල්හි ගැලී වියොමහගිමි නිවා ඇයගෙ අභිනව අවිදඟ සනාරෙසෙන් අඳ වැ[2] අඹුරුපලුමල් මිබිඳුසියො නලපහස් ලද රන්ලියක් බඳු සහවෙවුලුමි ලොමුදහ ගත් අහ[3] තඹලවන් කඳුව උතුළ නුවන් සොසුව සොමි වුවන් බලා සඳුන්පලුදෙලෙන් විඳෑ මිහිරාල් වසා පැන් පොවා සරත් සහා විනොයා සඳකත්මිණි ගඟුලෙහි නහවා සිදුවරපෙතක් හොත් සෙ ගොස් සුපිපි ලියගෙකෙක්හි සිට ඇය අසපුවට නහා යවී.

හොමවුපියන් ආකලෑ "කලිඟුරජහු පිත් යුවරජ සුව කලිඟු කුමර තමා බෑ මහකලිඟුරජහුගෙ උදහසින් අවුදු වනයෙහි

---

[1] ලියගෙයක් CDEF [2] අඳ වැ CDEF [3] ඇහ G

වසනුයෙ මා හොවැළයෙහි දැක මා හා අවුදු දැන් මුඛ දෙදෙනා දැක්කැටි වැ සිටියෙයැ" යූ. එකල්හි මදුරජු හා බිසොව හා දෙදෙන එවිහු ගෙන්වා ගෙනැ හැමපවත් පිළිවිසැ තමන් හා සමානබවි දැනැ ඇය ඔවිහට මැ දුන්හු.

එසින් කිහ:-

490. "අවීසාදන්‍යසමාදපි
මධ්‍යාදපි ජලනිධෙර්දිගෝ' පාන්තාත්
ආනීය ඝටිති ඝටයති
විධිරභිමතමභිලූඛිතඃ" යි.

මෙසෙ විධිවශයෙන් සුවකලිඟු කුමරහු හා මදුරජුදුව හා දෙදෙනා එක්වැ ප්‍රියසංවාසයෙන් වැටෙනකල්හි එරජදූ ගබි ගෙනැ දසමස්ඇවැමෙන් පින්ඇති මහපුරිස්ලකුණෙන් දිස්නා සිරිරූ ඇති පුත්රුවනක්[1] ලදූ. එවිහු මුත්නා කලිඟුරජු නමි තබා සතරදෙන මහත් හරසිරින් වඩත්.

එකල්හි කලිඟුකුමර තමා සුනිල් සිනිදූ සියුම් වරලින් හොබනා වට හිසින් තමල්ලිය නිල්මිණි නිල්මහනෙල් නිල්වලා පැහැ මඩිමින්,[2] බැමයෙන් දෙවිදුනු: නුවනින් නිල්මහනෙල්, මියෙන් තඹුරූ, දසනින් සිදුවරකුසුමි පරයමින්; ගතරන්පටක් බඳූ සොමි නළල් මැදහි එබූ නිල්තලාටිකින් වනදෙවියන් නුවත් මන අදමින්; මව තනන තන මැ රන්ගල්කුළුහි එබූ මියෙන් කිරිපැනුරා බොත් සහදප් කෙසුරුවෙස් පාමින්; පියා පුවල් උරසයුරෙහි රන් සුනෙරසිරින් වොරජමින්; සැලූ දඹින් හා මැරූ කකුළුකුඹු රෙහෙරුයෙන් දෙමුත්තන් සොමිනස් මහවිල්හි ගලා නිඩුහුරූ[3] කෙරෙමින්; තඹුරූ ගැබිහි බමරපියරැව් බඳූ කල් බොළඳ තෙපුලෙන් ලෙවන් කන් ගන්මින්; සම මෙළෙක් වැලිතල මැ විල් පිටුහි පතුල් තඹුරූ අකුරූ නො තබා මිණිමුස්වමින්; තවර මැ රජගත් කල්බඳින්

---

[1] රූවනක්හු CDLF [2] මඩමින් [3] නිඩුරූහුරූ CDLF

මදමත්ගඳැත්වෙස් පියහට පාමින්; මොනර කිනුරු කෙවිලි මුවගණා හා කෙළිමින්; පියා යුවරජහු හා මුත්තා මහරජහු කෙරෙන් මහගත් උගන්මින්; ඔවුන් කෙරෙ හැමසිප්හි නිපතට පැමිණෙමින්; මහත් ගඳගජන් අත්හි ගෙනැ බහා හොවමින්; සුරකිනුරු නාගදඹසිඳුවන් නුවන්මන වුලුඹුමින් වැඩැවිය පත්.

එක්බිති එවිහු පියෙ නක්ෂත්‍රයොගයක් දැකැ තමා බැ රජහු මළබවී දැන පුතු කැඳවා වැළැත හිඳුවා "පුතැ වනයෙහි නො වසා, තා මහලුපියෙ මහකලිඟුරජ මෙළෙ, තො දන්ත පුරයට ගොස් කුලසතු රජය ගනැ" යි තමා අළ හස්මුන්ද ද පලස ද කඩුව ද දක්වා දී "පුතැ, දන්තපුරයෙහි අසුවල් වෙයැ අපට වැඩ සරන ඇමැතියෙක් ඇති, ඔහුගේ ගෙහි යහන්මැද බැස මෙ තුන් සලකුණු පැ මා පුත්බව කියා. හෙ තා රජයෙහි පිහිටුවයි" පුත්හට සමු දින්.

එසඳ කලිඟුකුමර මවුපියනුදු මුත්තනු දු වැඳ පැදකුණු කොට පිත්මුවා ඉදුහයෙන් අහසින් ගොස් දන්තපුරයෙහි ඇමැත්තාගෙ ගෙහි යහන්මැද බැස සිටියෙ යි. එකල්හි ඇමැති කලිඟුරජකුමරහු දැක "විද්‍යාධරයෙක හො ? දිව්‍ය ගන්ධර්වයෙක හො ?" යි යන සිතින් "තො කවරෙහි ?" යි පිළිවිස. "මම් සුචකලිඟුයුවරජහු පිත් කලිඟු කුමර නමි" යි හස්මුන්ද ද පලස ද කගරුවන ද පෑ කල්හි මහමන්ත්‍රහු දුටු මහදිලිදක්හු සෙයින් මහසොම්නසින් පිනා එපුරෙහි මහඇමතියනට කී.

එකල්හි ඇමතියො අවුදැ කලිඟුකුමරහු දැකැ සොම්නස්වැ එනුවර දෙවිපුරයක් සෙයින් සඳ එවිහු මඟුල්පෙරහරින් නහවා සුදුතවර ගන්වා සේදුහුල් හඳවා දළමුත්හර පළඳවා කඩා මල් කඩින් මුහුළස් හොබවා පළහෙළදළයහන්හි හිඳුවා දුහුල්වියන් බැඳ පළසුදුමලොළඹු දී වැටසිරි පහයා මඟුල්අවුස් වඩා පහ නෙවැහු.

---

අලුයෙහි කුමරහු මඟුල්හි පළ තුරන් දුරු වූ නිදිමෙදෙන් මත් වැ සඳපහන්ලකුළු වුවන් පුප්වමින් යහන්තෙලෙන් නැගි සඳ; සුපුල් කොළතුරෙහි ලැගි මත්කෙවුලන් "මඟුල් පෙරහර යුත් ජනා ජනා එන්නෙ ල" යන වජනක් මෙන් හඬ නැඟූ සඳ; කුමුදෙරෙහි මුවරඳරොන්රජතැවරු බමරකැල මඟුල්කඩා මල්දමැ වතුළ සඳ; මඟුල්පෙරහරබඳ නන්ජනා මඟුල්මඩු පුවටු[1] සඳ; මඟුල්මහඇමැතියො කුමරු සවිබරණින් සදා මඟුල්මඩු වඩා සතුරුවන් රැස්හි සිටුවා තෙසකින් බිසෙවි දී "තුන්කල්හි මෙවැනි සැණයෙක් නො වූ වීරිය" යවා මඟුල් කොට ඓරාවණා රූඩ වැ දෙවිපිරිස් පිරිවරා සුදසුන් මහවෙයින් ගොස් විජයත් මහපා වන් දෙවිරජහුගෙ හවියෙන් ඇත්කඳ හිඳුවා නුවර පිරිවරා රජගෙට වැඩූහු.

මෙසෙයින් කලිඟුකුමර දන්තපුරයෙහි රජ වී.

---

(147). <u>දසවක්කවට්ටිවත්තානි</u> යන තන්හි දසසක්විටිවත් නම් කවර යත්?

එරජ දශකුශලකර්මපථධර්මසමාදාන කොට එ නිසා එයට සත්කාර ගරුකාර[2] නමස්කාර කොට වසනුයෙ අන්තොජන සඞ්ඛ්‍යාත පුත්‍රදාරාදීන් ශීලසංවරයෙහි පිහිටුවයි, ගන්ධමාලාදීන් සඞ්ග්‍රහද කෙරෙයි, ගුප්තිවෙශ්මසම්පා දනාදීන් පරිරක්ෂා ද කෙරෙයි යනු එකෙකැ. (1)

අභිෂික්ත ක්ෂත්‍රියයනට එසෙයින් මැ රක්ෂාවරණගුප්ති සංවිධාන කෙරෙයි හද්‍රතුරඩගදානාදීන් සඞ්ග්‍රහ ද කෙරෙයි යනු එකෙකැ. (2)

---

[1] පුවුටු AB [2] ගුරුකාර CD

අනභිෂික්තයනට එ මැ නියායෙන් රක්ෂාසංවිධාන කෙරෙයි, යථානුරූප යානවාහනදානයෙන් පරිතුෂ්ට ද කෙරෙයි යනු එකෙකැ. (3)

බලකාය රක්ෂාසංවිධාන කෙරෙයි කාලාතික්‍රමණ නොකොට භක්තවෙතනදානාදීන් සන්තුෂ්ට ද කෙරෙයි යනු එකෙකැ. (4)

බමුණනට අන්නපානවස්ත්‍රාදි දෙයධර්මදානයෙන් හා ගොවීන්ට භක්තබීජලාඩගල[1] බලිවර්දාදිසම්පාදනයෙන් සඩග්‍රහ ද කෙරෙයි, ඔවිනට රක්ෂාසංවිධාන ද කෙරෙයි යනු එකෙකැ. (5)

නිගමවාසීන්ට හා ජනපදවාසීන්ට භක්තබීජාදීන් මැ සඩග්‍රහ කෙරෙයි රක්ෂාසංවිධාන ද කෙරෙයි යනු එකෙකැ. (6)

ශමිතපාප වූ බහිෂ්කෘතපාප වූ ශ්‍රමණබ්‍රාහ්මණයන්ට රක්ෂා සංවිධානද කෙරෙයි, ශ්‍රමණපරිෂ්කාරාදිසම්පාදනයෙන් සඩග්‍රහ ද කෙරෙයි යනු එකෙකැ. (7)

මෘගයන් හා පක්ෂීන්ට රක්ෂාසංවිධානද කෙරෙයි, අභය දානයෙන් ආශ්වාස ද ජනවයි යනු එකෙක. (8)

අධර්මයෙන් කරන තාක් දෑ නිෂෙධ කෙරෙයි යනු එකෙකැ. (9)

ධන නැත්තනට ධන දෙයි යනු එකෙකැ. (10)

මෙසෙයින් එරජ අන්තෝජනාදීන් කෙරෙහි යථානුරූප සඩග්‍රහ ද රක්ෂාවරණගුප්ති දු සංවිධාන කරනුයෙ දශකුශලකර්ම පථධර්මයෙන් ආඥාචක්‍රය පවත්වා.

---

[1] නඩගල CDEF

එයින් වදළහ:-

491. "ඉධ භික්ඛු රාජා චක්කවත්ති ධම්මිකෝ ධම්මරාජා ධම්මංයෙව නිස්සාය ධම්මං සක්කරොන්තෝ ධම්මං ගරුකරොන්තෝ ධම්මං අපචායමානෝ ධම්මද්ධජෝ ධම්මකෙතු ධම්මාධිපතෙය්‍යෝ ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති අන්තෝජනස්මිං, පුන ච පරං භික්ඛු රාජා චක්කවත්ති - පෙ - ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහති ඛත්තියෙසු අනුයුත්තෙසු - බලකායස්මිං - බ්‍රාහ්මණ ගහපතිකෙසු නෙගමජානපදෙසු - සමණබ්‍රාහ්මණෙසු - මිගපක්ඛීසු. ස ඛෝ සෝ භික්ඛු රාජා චක්කවත්ති - පෙ - ධම්මිකං රක්ඛාවරණ ගුත්තිං සංවිදහිත්වා අන්තෝජනස්මිං - ඛත්තියෙසු අනුයුත්තෙසු - බලකායස්මිං - බ්‍රාහ්මණගහපතිකෙසු - නෙගමජානපදෙසු - සමණබ්‍රාහ්මණෙසු - මිගපක්ඛීසු ධම්මිකං රක්ඛාවරණගුත්තිං සංවිදහිත්වා ධම්මෙනෙව චක්කං වත්තෙති. නං හොති චක්කං අප්පතිවත්තියං කෙනචි මනුස්සභූතෙන පච්චත්තිකෙන පාණිනා" යි.

මෙයැ "දස සක්විටිවත්" නම්.

---

(148). උපොසථදිවසෙ යන තන්හි "උපොසථ" ශබ්දය "න භික්ඛවෙ තදහුපොසථෙ සභික්ඛුකා ආවාසා" යනාදි තන්හි යෙයින් උපවසිතව්‍යදිවසයෙහි වැටෙයි. මෙයින් බැහැර "ආයාමාවුසෝ කප්පින උපොසථං ගමිස්සාම" යන තන්හි ප්‍රාතිමොක්ෂෝද්දෙශයෙහි වැටෙයි. "එවං අට්ඨඞ්ගසමන්නාගතො ඛෝ විසාඛෙ උපොසථෝ උපවුත්ථෝ" යන තන්හි ශීලයෙහි වැටෙයි. "බුද්ධස්ස වෙ සදෘ චිග්ගු බුද්ධසුපොසථෝ සදෘ" යන තන්හි උපවාසයෙහි වැටෙයි. "උපොසථෝ නාගරාජා" යන තන්හි ප්‍රඥප්තියැ වැටෙ.

---

(149). පඤ්චඞ්ගිකස්ස තූරියස්ස විය යන තන්හි "පඤ්චඞ්ගික තූරිය" නම් කවරේ යත්? ආතත යෑ විතත යෑ ආතතවිතත යෑ ඝන යෑ සුෂිර යෑ යන මෙයි.

මෙහි "ආතත" නම් එකතලතූරියි යෑ. "විතත" නම් උභයතල තූරියි යෑ. "ආතතවිතත" නම් සර්වප්‍රකාරාවනද්ධතූරියියෑ. "සුෂිර" නම් වංශශඞ්ඛකාහලාදි යෑ. "ඝන" නම් ලොහමය තාලාදිය යි.

මෙයෑ "පඤ්චඞ්ගිකතූරියි" නම්.

---

(150). ඉමස්ස වචනං යදි වා සච්චං යදි වා අලිකං යන සන්හි වා ශබ්දය "කෙ වා ඉමෙ කස්ස වා" යන තන්හි සෙයින් සංශයෙහි වැටෙයි. මෙයින් බැහැර "පණ්ඩිතෝ වාපි තෙන සෝ" යන තන්හි උපමායෙහි වැටෙයි. "තං වාපි ධීරා මුනිං වෙදයන්ති" යන තන්හි සමුච්චයෙහි වැටෙයි. "අයං වා ඉමෙසං සමණ බ්‍රාහ්මණානං සබ්බබාලො සබ්බමූළ්හා" යන තන්හි ව්‍යවසර්ගයෙහි වැටෙයි. "න වායං කුමාරෝ මත්තමඤ්ඤාසි" යන තන්හි ප්‍රමාණයෙහි වැටෙයි. "යෙහි කෙ චි සමණා වා බ්‍රාහ්මණා වා" යන තන්හි විකල්පයෙහි වැටෙයි.

---

(151). චත්තාරි සච්චානි යන තන්හි සතර සත්‍යයෝ නම් කවරහ යත්? දුඃඛසත්‍ය යෑ, සමුදයසත්‍ය යෑ, නිරොධසත්‍ය යෑ, මාර්ගසත්‍යය යි.

මෙහි දුශ්ශබ්දය කුත්සිතාර්ථයෙහි වැටෙයි. ඛශබ්දය තුච්ඡාර්ථයෙහි වැටෙයි. පළමුවන සත්‍යය කුත්සිත යෑ අනෙකොපද්‍රවාධිෂ්ඨාන වන බැවින් තුච්ඡ යෑ. මෙසෙ කුත්සිත වන බැවින් තුච්ඡ වන බැවින් දුඃඛ වේ.

"සං" යනු සංයොගයෙහි වැටෙයි. "උත්" සහු උත්පත්තියෙහි වැටෙයි. අයශබ්ද කාරණයෙහි වැටෙයි. මෙසෙ දෙවන සත්‍යය සංයොග ඇති කලැ දුඃඛයාගෙ උත්පත්තියට කාරණ වන බැවින් සමුදය වෙ.

"නි" ශබ්ද අභාවයෙහි වැටෙයි. "රොධ" ශබ්ද වාරකයෙහි වැටෙයි. මෙසෙ සංසාර වාරකසඞ්ඛ්‍යාත වූ දුඃඛරොධස්ගෙ අභාවය නිරොධ වෙයි. දුඃඛනිරොධයට පමුණුවන ප්‍රතිපත් ආලම්බනවිසින් තදභිමුඛීභූත වන බැවින් මාඟී වෙ.

මෙහි භවසුඛාස්වාදග්‍රථිතසත්ත්වයනට සංවෙග ජනවනු සදහා පළමු දුඃඛසත්‍ය දෙශිත යැ. ඒ දුඃඛයට[1] හෙතු දක්වනු සදහා තදනන්තර තොට සමුදයසත්‍ය දෙශිත යැ. වක්ඛිති සහෙතුක දුඃඛයෙන් අභිභූත වන බැවින් සංවිග්නමාන සයනට නිඃසරණ දර්‍ශනයෙන් ආශ්වාස ජනවනු සදහා නිරොධ සත්‍ය දෙශිත යැ. වක්ඛිති නිරොධාධිගම සදහා නිරොධ සම්ප්‍රාපක මාඟීසත්‍ය දෙශිත යි.

භාරයක් සෙයින් දුඃඛසත්‍ය දුඃඛවත්‍ය යැ. භාරා දානයක් සෙයින් සමුදයසත්‍ය දුඃඛවත්‍ය යැ. භාරනිඃක්ෂෙපණයක් සෙයින් නිරොධසත්‍ය දුඃඛවත්‍ය යැ. භාරනිඃක්ෂෙපණොපාය සෙයින් මාඟීසත්‍ය දුඃඛවත්‍ය යි.

මෙහි ආර්‍යසත්‍යදෙශනාකරන බුදුන් විසින් "ජාතිපි දුක්ඛා, ජරාපි දුක්ඛා, ව්‍යාධිපි දුක්ඛා, මරණම්පි දුක්ඛං, සොකපරිදෙව දුක්ඛදොමනස්සුපායාසාපි දුක්ඛා, අප්පියෙහි සම්පයොගොපි දුක්ඛා, පියෙහි විප්පයොගොපි දුක්ඛා යම්පිච්ඡං න ලභති තම්පි දුක්ඛං සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා" යි දුඃඛනිඃස්සිතගෙහි ආදගධම්මයෝ භාෂිතයහ.

---

[1] දුඃඛසත්‍යසට BCDEF

"යායං තණ්හා පොනොභවිකා නන්දිරාගසහගතා තත්‍රතත්‍රාභි නන්දිනි සෙය්‍යථිදං ? කාමතණ්හා භවතණ්හා විභව තණ්හා" යි සමුදය නිර්දේශයෙහි ත්‍රිවිධතෘෂ්ණාවො භාෂිතයහ.

"යො තස්සායෙව තණ්හාය අසෙසවිරාගනිරොධො චාගො පටිනිස්සග්ගො මුත්ති අනාලයො" යි මෙසෙ නිරොධ නිර්දේශයෙහි අර්ථවිසින් එකම නිර්වාණ භාෂිත යැ.

"අයමෙව අරියො අට්ඨඞ්ගිකො මග්ගො. සෙය්‍යථිදං ? සම්මා දිට්ඨි සම්මාසඞ්කප්පො සම්මාවාචා සම්මාකම්මන්තො සම්මා ආජීවො සම්මාවායාමො සම්මාසති සම්මාසමාධි" යි මාර්ගනිර්දේශ යෙහි අෂ්ටධර්මයො භාෂිතයො යි.

මෙහි විභාගවිසින් නිර්වචනවිසින් ලක්ෂණාදිප්‍රභෙදවිසින් අර්ථවිසින් ක්‍රමවිසින් උපමාවිසින් ජාත්‍යාදීන්ගෙ නිශ්චය විසින් අර්ථොද්ධාර විසින් අනූනාධිකවිසින් ආර්‍යසත්‍යයන් කෙරෙහි යම් ඥානයෙක් ඇද්ද. එ ඥානයාගෙ කෘත්‍යවිසින් අන්තර්ගතයන්ගෙ ප්‍රභෙදවිසින් චතුෂ්කවිසින් එකවිධාදි නයවිසින් සභාගවිසභාග විසින් විනිශ්චය අභිධර්මපිටකයෙහි සත්‍යවිභඞ්ගසංවර්ණනායෙහි කීපරිද්දෙන් දන්නෙ යැ.

(152). <u>දෙසනාමතරසං පායෙත්වා</u> යන තන්හි බුදුන් විසින් දෙසුන්[1] අමාරස වැළඳවූ දිව්‍යමනුෂ්‍යසහස්‍රයො කුමක් කෙරෙහි යත් ? අනුක්‍රමයෙන් පිරිනිවෙත්. කිසෙ යැ යත් ? සෝවාන් සෙද ගැමි අනගැමි වූ මනුෂ්‍යයො ගිහිගෙයි සිටියටි වූහු නම් සිටිති, නො සිටියටි වූහු නම් පැවිදි වෙත්.

රාත් වූවාහු වූ කලැ ගිහිමිනිස් වෙස් ඔවුන්ගෙ උත්තම ගුණ ධරන්නට අසමර්ථ වන බැවින් යසකුලපුත්‍රාදීන් සෙයින් එදවස් මැ පැවිදි හෝ වෙති, සන්තතිමහාමාත්‍යාදීන් සෙයින් පරිනිර්වාණ හො කෙරෙත්.

---

[1] දෙසුන්

දෙවියන් කෙරෙහි වූ කලැ රාත් වූ බුමුදෙවියො සිටිති. කරුණු කිම යත්? ඔවුනට නිලියනස්ථාන ඇති. සදෙවිලො වැසියො සෝවාන් සෙදගැමි වැ සිටිති. අනගැමි වැ රාත් වැ නො සිටිත්. කරුණු කිම යත්? හෙ ලළිතජනයනට ආවාස යැ. එහි ඔවුනට විවෙකාර්ස්ථාන[1] නැති. එයින් එහි රාත් වූවාහු එදවස් පිරිනිවෙති. අනගැමි වූවාහු සැව ගොස් ශුද්ධාවාසයෙහි උපදිති. බඹලොව වූ කලැ සතර ආයර්‍යයෝ මැ සිටිත්.

එහි ශුද්ධාවාස පස්තලය අනාගාමීනට නියත යැ. අනගැමිහු සෙසු රූතෙලෙහි ද් අරූතෙලෙහි ද් නො උපදනා බැවින් ශුද්ධාවාසයට නියතයො යි. එබැවින් ශුද්ධාවාසය හැම කලැ වන්නෙ නො වෙයි; අනාගාමීන් ඇතිකල මැ ඇති වෙයි, නැතිකලැ නැති වෙයි. අනාගාමීන් හැමදෙනා රහත් වැ පිරිනිවි කලැ සොළොස් දහසක් කපින් මත්තෙ කප්ලක්ෂයකු දු අසඞ්ඛ්‍යයකුදු බුද්ධශූන්‍ය වූ කාලයෙහි එහි උපදනො නැති. බුදුන් උපන්කල මැ උපදිති. එබැවින් ශුද්ධාවාසය සද්ධර්මවර චක්‍රවර්ත්තිහිගෙ කඳවුරක් බඳු වී.

සෝවානුන් කෙරෙහි විශාඛාව හා අනෙවඩුමහසිටු හා සක්දෙවිරජු හා මෙතුන්දෙනහට භවනිකාන්ති බලවත් විසින් ඔහු දෙවිලොවැ අනුක්‍රමයෙන් ඉපද එහි දු තත්තද්දිව්‍ය ලොකයෙහි ආ පමණින් සිට දිව්‍යසුඛ අනුභවකොට පරනිර්මිතදෙවලොකයෙහි සිට ධ්‍යාන උපයා බ්‍රහ්මලොකයෙහි අනුක්‍රමයෙන් ඉපද එහි දු තත්තද්බ්‍රහ්මලොකයෙහි ආ පමණින් සිට උදාරතර ප්‍රීතිසුඛ අනුභව කොට ශුභකෘත්ස්නතලයෙහි සිට මාර්ගභාවනා කොට අනාගාමි වැ ශුද්ධාවාසයෙහි අනුක්‍රමයෙන් ඉපද එහි දු තත්තත්තලයෙහි ආ පමණින් සිට සමාපත්තිසුඛ අනුභව කොට අකනිෂ්ඨතලයෙහි සිට රහත් වැ පිරිනිවෙත්.

ආනන්දබොධිකථා

---

[1] විවෙකස්ථාන CUEF

දසබලපරිනිබ්බාන කථා

(153). මහාසාවකෙහි පරිවුතෝ යන තන්හි "මහාශ්‍රාවකයෝ" නම් කවරහ යත්?

කප්ලක්ෂයක් පිරූ පැරැමි ඇති, බුදුරජහු විසින් වදුරන ලද තනතුරු ඇති, පන්සිය පන්සිය භික්ෂුපරිවාර ඇති අශීතිමහා ශ්‍රාවකයෝ යි.

කියෙ මැ නෝ:-

492. "කොණ්ඩඤ්ඤෝ භද්දියෝ වප්පෝ මහානාමෝ ච අස්සජී
උපතිස්සෝ කොළිතෝ පුණ්ණෝ අනුරුද්ධෝ ච කස්සපෝ.

භද්දියෝ භිම්බිලෝ චුන්දෝ නන්දෝ ආනන්ද රාහුලෝ
උපසේනෝ නාලකෝ දබ්බෝ සෝණෝ සීවලි සොභිතෝ.

සුනාපරන්තකෝ පුණ්ණෝ රෙවතෝ පුන රෙවතෝ
කුමාරකස්සපෝ රාධෝ වඩ්ඪිසෝසෝභිතෝ භගූ.

සෙලූදායි ච භද්දාලි භද්දියෝ ච ලකුණ්ඩකෝ
තෝදෙය්‍ය කප්පෝ දුභයෝ ජතුකණ්ණි ච පෙසලෝ[1]

පූණකෝ ධෝතකෝ නන්දෝ උපසීවෝ ච හෙමකෝ
මෝඝරාජා ජිතෝ තිස්සෝ මෙත්තගූ පිඞ්ගියෝ ඉසි.

---

[1] පෝසලෝ B

මෙඝියො කොඩිතො ජන්නො උපවාණො ච භද්දජි
කප්පිනකො මහාකප්පි රට්ඨපාලො ච වක්කලි.

සාගතො ලක්ඛණො චාපි භාරද්වාජො ගවම්පති
යසො පුණ්ණජි කච්චානො පන්ථකො චූල්ලපන්ථකො.

පිලින්දිවච්ඡො කුණ්ඩධානො බක්කුලො නදිකස්සපො
භද්‍රාවුධො අඞ්ගුලිමාලො කස්සපො ගයකස්සපො.

අවෙලකස්සපො ධීරො සක්‍යපුත්තො විසාරදො
උරුවෙලකස්සපො ථෙරො සුභූති සහියොපි ච" සි.

මොවුන් සෙයින් මැ බුදුහු කප්ලක්ෂයක් පැරුම් පුරා ආ "සකුලුදායි" පරිව්‍රාජකයන්ගෙ "මොරනිවාප" නම් ආරාමයට එළැඹැ දෙවරෙක දෙසුතක් දෙසූහ. ඔහු බුදුන් කෙරෙහි පැහැද සරණ ගොස් පැවිජි ඇරවූහ. ඔවුන් කසුප්සම්මාසම්බුදුන් දවසැ ගිහිවියට් පැවිජි කෙනකුන්ගෙ පාසිවුරෙහි ආශායෙන් ගිහිගෙහි ගුණ කී පැවින් පිරිස් වැස්සො[1] ඔවුන් පැවිජි නො විය දුන්හ. බුදුහු මෛත්‍රීවිහාරීන් කෙරෙහි අගතනතුරු ඔවුන් සඳහා සෙස්සනට නො වදාළහ. ඔහු ධම්සෝ රජු දවසැ "අග්ගගුප්ත" නම් මෛත්‍රීවිහාරී මහතෙර කෙනෙක් වූහු. මොවුන් විනා බුදුහු යථොක්ත මහාශ්‍රාවකයන් විසින් පිරිවරන ලදහු.

---

(154). <u>චාරිකං</u> <u>චරන්තො</u> යන තන්හි බුදුන් සැරිසරන පරිදි කිසෙයැ යත්?

ඔව්හු වප පුණුපොහොදවස් පවරා පැළවි දවස් මහා භික්ෂු සඞ්ඝපරිවාර වැ නික්මුණුහු නම් නවසියක් යොදුන් මහා මණ්ඩලයෙහි සැරි සරා නවමසින් වඩිත්.

---

[1] පිරිස්වැසියො EF

යමිකලෙක්හි තරුණ විදර්ශිකාදි භික්ෂූන් සඳහා ප්‍රවාරණා සඞ්ග්‍රහ කොට හිඳ පුණුපොහොදවස් පටන් නික්මුණුහු නම් සසියක් යොදුන් මධ්‍යමණ්ඩලයෙහි සැරිසරා අටමසින් වඩිත්.

යමිකලෙක්හි උදුවප අවපැළවි දවස් නික්මුණුහු නම් තුන්සියක් යොදුන් අන්ත්‍යමණ්ඩලයෙහි සැරිසරා සත්මසින් වඩිත්.

මෙසෙ සැරිසරන බුදුන් ඇකුත් තැනැ පියවර පැනෙ ද නො පැනෙ ද යත්? නො පැනෙ. කුමට නො පැනෙයි යත්? සියුම්සිවි වන බැවින් නො ද පැනෙයි; මහා බල වන බැවින් නො ද පැනෙයි; මහාජනානුග්‍රහයෙන් නො ද පැනෙයි.

එහි සියුම්සිවි වන බැවින් නො පැනෙන පරිදි කිසෙ යැ යත්? බුදුන්ගෙ සිවි සියුම් වන බැවින් ඇකුත් තැන් පුදුන්පෙදෙ තුබූ තැන් සෙයින් පියවර නො පැනෙ. මහාබල වන බැවින් නො පැනෙන පරිදි කිසෙ යැ යත්? යම්සෙ මහබලවත් වාතජව ඇති සෙන්ධවයන්හු පඤ්චපත්‍රශතයන්හි ආක්‍රාන්තමාත්‍රයෙන් මැවෙ ද, එසෙයින් මැ මහත්බල වන බැවින් බුදුන් විසින් ආක්‍රාන්ත ස්ථාන ආක්‍රාන්තමාත්‍ර මැ වෙයි; එහි පියවර නො පැනෙ. මහාජනානුග්‍රහයෙන් නො පැනෙන පරිදි කිසෙ යැ යත්? බුදුන්ගෙ අනුපද වැ මහාජනයෝ යෙති, ඔවුන් බුදුන්ගෙ පියවර දැක මඩනට අසමර්ථයන්ගෙ ගමන විච්ඡෙද වෙයි, එසින් ආක්‍රාන්ත ස්ථානයෙහි පියවරදු වී නම් ඉහ අන්තරහිත වෙ. බුදුහු යමක්හට පදවෙත්‍ය දැක්වියටි වූහු නම් ඔහු අරහයා "අසුවල් දකිවයි" අධිෂ්ඨාන කෙරෙත්.

---

(155). සමන්තා යොජනසතං එකකොලාහලං කාරාපෙන්තා යන තන්හි හාත්පස්හි සියක්යොදුන් තැන් එකකොලාහල වන පරිදි කිසෙ යැ යත්?

යම්සෙ සර්‍වදිශාභාගයෙහි යමක යමක වූ මහාමෙඝයෝ නැඟී මහොඝයත් පවත්වද්ද, එසෙයින් මැ සතර අසඞ්ඛ්‍ය ලක්‍ෂයක් කප් නිරන්තරයෙන් පිරූ දානාදි දශපාරමිතාවෝ එක අත්බැවැ පල දෙමිහයි සම්පිණ්ඩිතයත් සෙයින් ලාභසත්කාර මහොඝවැ පැවැත්වූහු. කිසෙ යැ යත්? යම් මඩුල්ලෙක දැ සැරි සරන කලැ තුබූ දෙමඩුල්ලෙහි මහාජනයෝ තමන් තමන්ගෙ දෙගයට හමුවූ කල්හි තත්තද්දිශායෙන් අන්නපාන වස්ත්‍ර ගන්ධමාලාදි ගෙන ක්‍ෂත්‍රිය බ්‍රාහ්මණාදීහු "කහං බුද්ධෝ කහං භගවා කහං දෙව දෙවෝ" යනාදීන් බුද්ධපර්‍යේෂණ කෙරෙති. ශකට ශතයෙනු දූ ප්‍රත්‍යය ඇරැ අවකාශ නො ලදින් හාත්පසැ ගවු පමණ තන්හිදූ ශකටධුරයෙන් ශකටධුරයෙහි පැහැර සිටුවත්. බුදුනට සෙයින් සඟනට ද් මහත් ලාභසත්කාර උපන්.

එයින් වදාළහ ධර්‍ම සඞ්ග්‍රාහක ස්ථවිරයෝ:-

493. "තෙන ඛෝ පන සමයෙන භගවා සක්කතෝ හොති ගරු කතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ ලාභී චීවර පිණ්ඩපාතසෙනාසනගිලානපච්චය භෙසජ්ජපරික්ඛාරානං, භික්ඛු සඞ්ඝොපි ඛෝ සක්කතෝ හොති ගරුකතෝ මානිතෝ පූජිතෝ අපචිතෝ ලාභී චීවර පිණ්ඩපාත සෙනාසන ගිලානපච්චය භෙසජ්ජ පරික්ඛාරානං" යි.

මෙසෙ බුදුන් සෙයින් සඟහු ලාභයෙහි ද් යසයෙහි ද් අග්‍රප්‍රාප්ත වූහු.

එයින් වදාළහ බුදුහු:-

494. "යාවතා ඛෝ ආනන්ද එතරහි සඞ්ඝා වා ගණා වා ලොකෙ උප්පන්නා නාහං ආනන්ද අඤ්ඤං එකසඞ්ඝම්පි සමනුපස්සාමි එවං ලාභග්ග යසග්ගප්පත්තං යථරිව භික්ඛුසඞ්ඝං" යි.

මෙසෙ බුදුනටද් සඟනටද් උපන් ලාභසත්කාර එක් වැ දෙමහනදී කෙනකුන්ගෙ උදකොඝයන් සෙයින් අප්‍රමෙය වී. මෙසෙයින් ලාභයෙහි දු යසසෙහි දු අග්‍රප්‍රාප්ත වූ බුදුන් සඟුන් ගිය ගිය දසට බ්‍රාහ්මණගෘහපතීහු දු ග්‍රාමනිගම ජනපදවාසීහු දු අනුගත වෙත්.

එයින් වදාළහ නාගිත මහතෙරහු බුදුනට:-

495. "සෙය්‍යථාපි භන්තෙ ඵුල්ලඵුසිතකෙ දෙවෙ වස්සන්තෙ යථා නින්නං උදකානි පවත්තන්ති, එවමෙව ඛො භන්තෙ යෙන යෙ නෙව දානි භගවා ගමිස්සති තන්නින්නා භවිස්සන්ති බ්‍රාහ්මණගහපතිකා නෙගමා වෙව ජානපදා ච. තං කිස්ස හෙතු? තථාහි භන්තෙ භගවතො සීලපඤ්ඤාණං" යි.

මෙසෙ යැ එකකොලාහල වන පරිදි.

---

(156). <u>සච්චපානං</u> <u>පායෙන්තො</u> යන තන්හි සච්ච ශබ්දය "ඉදං දුක්ඛං අරියසච්චන්ති මෙ භික්ඛවෙ" යන තන්හි සෙයින් පරමාර්ථ සත්‍යයෙහි වැටෙයි. මෙයින් බැහැර "සච්චං භණෙන කුජ්ඣෙය්‍ය" යන තන්හි වාක්සත්‍යයෙහි වැටෙයි. "සච්චො බ්‍රාහ්මණො, සච්චො ඛත්තියො" යන තන්හි සංවෘතිසත්‍යයෙහි වැටෙයි. "ඉදමෙව සච්චං මොඝමඤ්ඤං" යන තන්හි දෘෂ්ටි සත්‍යයෙහි වැටෙයි.

---

(157). <u>රූපප්පසන්තානං</u> <u>රූපප්පමාණානං</u> යනාදි තන්හි රූප ප්‍රසන්නාදි පුද්ගලයන්ගෙ විභාග කවර යත්? ඔහු සතරදෙනෙක් වෙත්.

කිසෙයැ යත්?

ලොකයෙහි ඇතම් කෙනෙක් රූප ප්‍රමාණ වෙති. ඇතම් කෙනෙක් ඝොෂ ප්‍රමාණ වෙති. ඇතම් කෙනෙක් රූක්ෂ ප්‍රමාණ වෙති. ඇතම් කෙනෙක් ධම්ම ප්‍රමාණ වෙත්.

එහි රූපය පමණ කොට ගෙන ප්‍රසන්නයෝ "රූප ප්‍රමාණ" නම් වෙති. ඝොෂය පමණ කොට ගෙන ප්‍රසන්නයෝ "ඝොෂ ප්‍රමාණ නම් වෙති. රූක්ෂ ප්‍රතිඝත් පමණ කොට ගෙන ප්‍රසන්නයෝ "රූක්ෂ ප්‍රමාණ" නම් වෙති. ධම්මය පමණ කොට ගෙන ප්‍රසන්නයෝ "ධම්ම ප්‍රමාණ" නම් වෙත්.

එයින් වදාළහ:-

496. "චත්තාරොමෙ භික්ඛවෙ පුග්ගලා සන්තො සංවිජ්ජමානා ලොකස්මිං. කතමෙ චත්තාරො? රූපප්පමාණෝ රූපප්පසන්නො, ඝොසප්පමාණෝ ඝොසප්පසන්නො, ලූඛප්පමාණෝ ලූඛප්පසන්නො, ධම්මප්පමාණෝ ධම්මප්පසන්නෝ" යි.

සවීසතඩයන් තුන්කොටසක් කළ කලැ දෙකොටසෙක් රූප ප්‍රමාණ වෙයි; එක්කොටසක් රූප ප්‍රමාණ නො වෙයි. පස් කොටසක් කළ කලැ සතර කොටසෙක් ඝොෂ ප්‍රමාණ වෙයි; එක්කොටසෙක් ඝොෂ ප්‍රමාණ නො වෙයි. දසකොටසක් කළ කලැ නව කොටසෙක් රූක්ෂ ප්‍රමාණ වෙයි; එක්කොටසෙක් රූක්ෂ ප්‍රමාණ නො වෙයි. ලක්ෂයක් කොටස් කළ කලැ එක් කොටසෙක් ධම්ම ප්‍රමාණ වෙයි; සෙස්සෝ ධම්ම ප්‍රමාණ නො වෙත්. මෙසෙ චතුෂ් ප්‍රමාණ ලොකසන්නිවාසයෙහි බුදුන් දැක නො පහදනෝ නම් නැත්.

---

(158). චතුවීසති අසඞ්ඛෙය්‍ය දෙවමනුස්ස භවකත්තා රතෝ පතාරෙත්වා යන තන්හි "චතුවීසති අසඞ්ඛෙය්‍ය" යනු

එකින් දෙකින් තුනින් සතරින් පසින් සියෙන් පන්සියෙන් දහසින් සුවහසින් කෙළසුවහසින් අධිගම කළවුන් හැර අසඞ්ඛ්‍ය අසඞ්ඛ්‍ය බැවින් සූවිසිස්ථානයෙක්හි අධිගම කළ දෙවිමිනිසුන් ගෙන කියූහු.

කිසෙ යැයත්?

සුමන මාලාකාර සමාගමයෙහි ද්, ධනපාල සමාගමයෙහිද් ගරහදින්න සමාගමයෙහි ද්, ආනන්දසෙඩි සමාගමයෙහි ද්, ජම්බු කාජීවක[1] සමාගමයෙහි ද්, පාචිකපුත්ත සමාගමයෙහි ද්, ආළවක සමාගමයෙහි ද්, බ්‍රහ්මයාග සමාගමයෙහි ද්, සරභ පරිව්‍රාජක සමාගමයෙහි ද්, චීරකපත්ත නාගරාජ සමාගමයෙහිද් කොළිය මහාමච්ච සමාගමයෙහි ද්, උග්ගසෙනසෙඩිපුත්ත සමාගමයෙහි ද්, මණ්ඩුක දෙවපුත්ත සමාගමයෙහි ද්, මට්ටකුණ්ඩලි දෙවපුත්ත සමාගමයෙහි ද්, සුලසා නගරසොභිනී සමාගමයෙහිද්, සිරිමා නගරසොභිනී සමාගමයෙහි ද්, පෙසකාරධීතු සමාගම යෙහි ද්, උග්ගපුරයෙහි චූළසුභද්‍ද සමාගමයෙහි ද්, සාකෙත පුරයෙහි බුදුන් කෙරෙ සුතප්‍රෙම කළ බමුණාගෙ ආළාහනයට පිඩු වූ ජනයන්ගෙ සමාගමයෙහි ද්, සුනාපරන්තක ජනපදයෙහි වෙණෙදගමි[2] වැසි ජනයන්ගෙ සමාගමයෙහි ද්, "සබ්බදානං ධම්මදානං ජිනාති" යන ධම්දෙස්නට පිඩු වූ දෙවියන්ගෙ සමාගමයෙහි ද්, රජගහා නුවර සත්දවසක් තිරොකුඩ්ඩපේවත් දෙසන කල ද, විසාලා නුවර සත් දවසක් රුවන්සුත් දෙසන කල ද්, සුවාසූදහසක් සුවාසූදහසක් බැගින්[3] අධිගම කළ ජනයන් හැර මෙයට උනුව ද ඉතිරිව ද අධිගම කළ ජනයන් හැර ධම්සක් පවතුන්[4] සූත්‍රය, මහාසමය සූත්‍රය, මහාමඞ්ගල සූත්‍රය, පරාභව සූත්‍රය, චූළරාහුලොවාද සූත්‍රය, සමචිත්තපරියාය සූත්‍රය, බුද්ධවංශ දෙශනාය යන එවමාදි ධම්දෙස්නෙන් සූවිසි ස්ථානයෙක්හි අසඞ්ඛ්‍ය අසඞ්ඛ්‍ය බැවින් අධිගම කළ දෙවිමිනිස්හු ම යැ සූවිසි අසඞ්ඛ්‍ය නම් වූවාහු.

---

[1] ජම්බුකාජීවE [2] වෙළදගමිAL [3] බැවින්AB [4] පැවතුමිG

(159). අන්තරෙ යමකසාලානං යන තන්හි "අන්තර" ශබ්දය "අන්තරා ච බොධිං අන්තරා ච ගයං" යන තන්හි සෙයින් යමකශාලයන්ගෙ මධ්‍යයෙහි වැටෙයි. මෙයින් බැහැරැ:-

497. "නදීතීරෙසු පන්ථානෙ සභාසු රථියාසු ච
ජනා සඩ්ගම්ම මන්තෙන්ති මඤ්ඤ තඤ්ඤ කිමන්තරං"

යන තන්හි කාරණයෙහි වැටෙයි. "අද්දසා ඛො මං භන්තෙ අඤ්ඤතරා ඉත්ථී විජ්ජන්තරිකාය භාජනං ධොවන්ති" යන තන්හි ක්ෂණයෙහි වැටෙයි. "යස්සන්තරතො න සන්ති කොපා" යන තන්හි චිත්තයෙහි වැටෙයි.

එතැන් සැදැහැති කුලපුත්‍රයන් විසින් දැක්ක යුතු සතර ස්ථානයෙන් එකෙක්. කිසෙ යැ යත්?

වදාළෙ මැ නො:-

498. "චත්තාරිමානි භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයානි සංවෙජනීයානි ඨානානි. කතමානි චත්තාරි? ඉධ තථාගතො ජාතොති භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං; ඉධ තථාගතො අනුත්තරං සම්මාසම්බොධිං අභිසම්බුද්ධොති භික්ඛවෙ - පෙ - ඉධ තථාගතො අනුත්තරං ධම්මචක්කං පවත්තෙසීති භික්ඛවෙ - පෙ - ඉධ තථාගතො අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බුතොති භික්ඛවෙ සද්ධස්ස කුලපුත්තස්ස දස්සනීයං සංවෙජනීයං ඨානං" යි.

---

(160). අනුපාදිසෙසාය නිබ්බානධාතුයා පරිනිබ්බායි යන තන්හි නිබ්බානධාතු ද්විවිධ වෙ, සොපධිශෙෂ යැ. නිරුපධිශෙෂය යි.

එහි මාර්ගඥානොෂධරස විශෙෂ සමාස්වාදනයෙන් මානසික ක්ලෙශරොගව්‍යුපශමය "සොපධිශෙෂ නිර්වාණධාතු" නම් වෙයි. පුනර්නෙමාපවිතකුශලාකුශල කර්මානුබද්ධ ජාත්‍යාදි දුඃඛප්‍රබන්ධයාගෙ පුනර්භවයෙහි අප්‍රවෘත්තිය[1] "නිරුපධිශෙෂ නිර්වාණධාතු" නම් වෙ.

එයින් වදාළහ:-

494. "ද්වෙමා භික්ඛවෙ නිබ්බානධාතුයො. කතමා ද්වෙ? සඋපාදිසෙසා ච නිබ්බානධාතු, අනුපාදිසෙසා ච නිබ්බානධාතු. කතමා ච භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු? ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණාසවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො, තස්ස තිට්ඨන්තෙව පඤ්චින්ද්‍රියානි යෙසං අවිඝාතත්තා මනාපාමනාපං පච්චනුහොති, සුඛදුක්ඛං පටිසංවෙදියති. තස්සයො රාගක්ඛයො දොසක්ඛයො මොහක්ඛයො. අයං වුච්චති භික්ඛවෙ සඋපාදිසෙසා නිබ්බානධාතු. කතමා ච භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බානධාතු? ඉධ භික්ඛවෙ භික්ඛු අරහං හොති ඛීණා සවො වුසිතවා කතකරණීයො ඔහිතභාරො අනුප්පත්තසදත්ථො පරික්ඛීණභවසඤ්ඤොජනො සම්මදඤ්ඤා විමුත්තො, තස්ස ඉධෙව සබ්බවෙදයිතානි අනභිනන්දිතානි සීති භවිස්සන්ති. අයං වුච්චති භික්ඛවෙ අනුපාදිසෙසා නිබ්බානධාතු. ඉමා ඛො භික්ඛවෙ ද්වෙ නිබ්බානධාතුයො" යි.

මෙ සැ ද්විවිධ නිර්වාණධාතු නම්.

---

(161). මුනින්දෙ යන තන්හි "මොන" යයි නුවණ කියති; එ නුවණින් යුක්ත වන බැවින් බුදුහුද් "මුනි" නම් වෙත්.

---

[1] අප්‍රතිවෘත්තිය DEF

එසින් කිහ:-

500. "මුනිති මොනං වුච්චති ඤාණං, යා පඤ්ඤා පජානනා විචයෝ පවිචයෝ ධම්මවිචයෝ සල්ලක්ඛණා උපලක්ඛණා පච්චුපලක්ඛණා පණ්ඩිච්චං කොසල්ලං නෙපුඤ්ඤං වෙභව්‍යා චින්තා උපපරික්ඛා භූරි මෙධා පරිණායිකා විපස්සනා සම්පජඤ්ඤං පතොදෙ පඤ්ඤා පඤ්ඤින්ද්‍රියං පඤ්ඤාබලං පඤ්ඤාසත්ථං පඤ්ඤාපාසාදෙ පඤ්ඤා ආලොකෝ පඤ්ඤාඔභාසෝ පඤ්ඤාපජ්ජොතෝ පඤ්ඤාරතනං අමොහෝ ධම්මවිචයෝ සම්මාදිට්ඨි, ඉමිනා ඤාණෙන සමන්නාගතෝ භගවා මුනි මොනප්පත්තෝ"ති.

නොහොත් කායමොනෙය යැ, වාඩීමොනෙය යැ, මනෝ මොනෙය යැ යන ත්‍රිවිධ මොනෙය ධර්මයෙන් යුක්ත වූ මුනිහි සඳහෙක් වෙත්. එහු කවරහ යත්?

කියෙ මැ නෝ:-

501. "ඉමෙහි මොනෙය්‍යෙහි ධම්මෙහි සමන්නාගතා ජ මුනිනෝ. අගාරමුනිනෝ අනගාරමුනිනෝ සෙඛමුනිනෝ අසෙඛමුනිනෝ පච්චෙකමුනිනෝ මුනිමුනිනෝ. කතමෙ අගාර මුනිනෝ? යෙ තෙ අගාරිකා දිට්ඨපදා විඤ්ඤාතසාසනා, ඉමෙ අගාරමුනිනෝ. කතමෙ අනගාරමුනිනෝ? යෙ තෙ පබ්බජිතා දිට්ඨපදා විඤ්ඤාතසාසනා, ඉමෙ අනගාරමුනිනෝ. සත්ත සෙඛා සෙඛමුනිනෝ. අරහන්තෝ අසෙඛමුනිනෝ. පච්චෙකබුද්ධා පච්චෙකමුනිනෝ. මුනිමුනිනෝ වුච්චන්ති තථාගතා අරහන්තෝ සම්මාසම්බුද්ධා"ති.

මෙසෙයින් ත්‍රිවිධ මුනීන් කෙරෙහි "මුනිමුනි" නම් ලද බුදුහු තුමුහු මුනිනට ප්‍රධාන වන බැවින් "මුනීන්ද්‍ර" නම් වෙත්.

දසබලපරිනිබ්බාන කථා.

---

පඨමසංගීති කථා

(162). සුභද්දෙන බුඩ්ඩපබ්බජිතෙන යනාදි තන්හි බුදුන් පිරිනිවනැ වළපන්නා සඟනට "අලං ආවුසො මා සොචිත්ථ" යනාදි කුමට කියූහ යත්? තමන් සුවවවන්නට නිසි සුගාහිතග්‍රාහි වන්නට ප්‍රදක්ෂිණග්‍රාහි වන්නට ධම්මකථික වන්නට විනයධර වන්නට නිසි කාරණ නැත්තෙන් කියත්.

වදුලෙ මැ තො:-

502. "පඤ්චහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො දුප්පසහො බුඩ්ඩපබ්බජිතො. කතමෙහි පඤ්චහි? දුප්පසහො භික්ඛවෙ බුඩ්ඩපබ්බජිතො සුවචො, දුප්පසහො සුගාහිතගාහි, දුප්පසහො පදකිණගාහි, දුප්පසහො ධම්මකථිකො, දුප්පසහො විනයධරො. ඉමෙහි ඛො භික්ඛවෙ පඤ්චහි ධම්මෙහි සමන්නාගතො දුප්පසහො බුඩ්ඩපබ්බජිතො" යි.

---

(163). වෙරො භික්ඛු උච්චිනතුහි වුත්තො යන තන්හි "වුත්තො" යනු "වුත්තං ඛො පනෙතං භගවතා ධම්මදුයාදා මෙ භික්ඛවෙ භවථ මා ආමිසදුයාදා" යන තන්හි සෙයින් විපූර්‍ව වැ කථනයෙහි වැටෙයි. මෙයින් බැහැර "යෙසමිදං වතරහි පොරාණං මන්තපදං ගීතං පවුත්තංසමිහිතං" යන තන්හි ප්‍රවචනභාවයෙන් ප්‍රවර්‍තිත ග්‍රන්ථයෙහි වැටෙයි. ලොකයෙහි වූ කලැ "වුත්තො ගණො වුත්තො පරායණො" යන තන්හි අධ්‍යයනයෙහි වැටෙයි. මෙ තුන වචිහිගෙ ප්‍රයොගයි. "වචි" නම් "වච = පරිභාෂණෙ" යන ධාතු යි. "ඛෙත්තෙ වුත්තං විරුහති" යන තන්හි වපනයෙහි වැටෙයි. "නො ච ඛො පටිවුත්තං" යන තන්හි අඩ්ඩදන්තකාදින් වාපසමීකරණයෙහි වැටෙයි. "කාපටවො මාණවො දහරො වුත්තසිරො" යන තන්හි ඡෙදාපහරණයෙහි වැටෙයි. මෙ තුන වපිහිගෙ ප්‍රරොග යි. "වපි නම් නම් "ඩු වප් = බීජතන්තුසන්තානෙ"

යන ධාතුයි. "පන්නලෝමෝ පදරවුත්තෝ මිගගූතෙන චෙතසා විහරති" යන තන්හි ජීවිත වාත්තියෑ වැටෙයි. "සෙය්‍යථාපි නාම පඬුපලාසෝ බන්ධනා පවුත්තෝ අභබ්බෝ හරිතත්තාය" යන තන්හි බන්ධනයෙන් ප්‍රමුක්තභාවයෙහි වැටෙයි. මෙදෙක වාත්තිහිගෙ ප්‍රයොගයි. "වාත්ති" නම් "වාතූ = වත්තනෙ" යන ධාතුයි.

---

(164). අභබ්බෝ අගතිං ගන්තුං යන තන්හි "අගති" නම් ජන්‍ද යෑ, ද්වේෂ යෑ, භය යෑ, මොහ යෑ යන මේ සතර යි. යමෙක් අගතියට යෙ නම් ඔහුගෙ යශස් පසඩමය සඳ සෙයින් පිරිහෙයි.

එයින් වදාළහ:-

503. "ජන්‍දූ දෙසා භයා මොහා යෝ ධම්මං අතිවත්තති
නිහීයති තස්‍ස යසෝ කාළපක්ඛෙව චන්දිමා" යි.

යමෙක් අගතියට නො යෙ නම් ඔහුගෙ යශස් පෙරඩමය සඳ සෙයින් පිරෙයි.

එයින් වදාළහ:-

504. "ජන්‍දූ දෙසා භයා මොහා යෝ ධම්මං නාතිවත්තති
ආපූරති තස්‍ස යසෝ සුක්කපක්ඛෙව චන්දිමා" යි.

---

(165). රොදමානං මහාජනං යන තන්හි ජනයන් වහස්නා පරිදි කිසෙ යෑ යත්?

"වහන්සෙ තෙප් ඔවුන් හස්රජ කල්හි සුළුසෙනෙවි වැ නො බැඳි බද්ද ව. ඔහූ තොප තසුප්හල්හි රුවන්මුව වැ

බද්දහ. තෙප් ඔවුන් සපෙනාරජ කල්හි උක්සෙන් රජ වැ දැඟින් මිදුවා ව. ඔහු තොප දුගිබමුණු කල්හි රුක්දෙවි වැ දිළිඳු දැඟින් මිදුවාහ. තෙප් ඔවුන් කිවි රජ කල්හි සාමුව වැ මරණින් මිදුවා ව. ඔහු තොප කසීරජ කල්හි සරබමුව වැ මරණින් මිදුවාහ. තෙප් ඔවුන් සැඩල්[1] දරු කල්හි කසීරජ වැ රජය දුන්නා ව. ඔහු තොප ගැහැ වී දරු කල්හි කසීරජ වැ අඩරජය දුන්නාහ. තෙප් ඔවුන් කුකුරු කල්හි, කාරජ කල්හි, සුවන්මොනර කල්හි, රුරුමුව කල්හි, හස්රජ කල්හි, ජවන් හස්රජ කල්හි රජයෙන් පිදුවා ව, මාපුසුඇත්රජ කල්හි[2] පිළිබිඹු පුදකළා ව. වපුරු කල්හි ගිඛා පුදකළා ව. සක්විති වැ බොමඩ පුදකළා ව. ඔවුන් වලුකුළු[3] කල්හි බැදූ වැද්දහට රුවන් ඇරැ දී නො විහිදුනෙන් එක් වැ මරණට එළඹියා ව. උකුස්පිළා කල්හි වියො නො ව ගෙලෙන් ගල නො දුරු කොට වුසුවා ව. දැන් ඔවුන් පියා කෙසෙ ආව?" යි ඇතමිහු මහ තෙරුන් පාපිට හිස් තබා වලප්ති. ඇතමිහු දක්මින් මැ බිම වැටී හි නුවනු තුළ සෝකදුළෙන් ළඟසි වහසිත්.

එයින් වදාළහ:-

505. "එකපුග්ගලස්ස ගික්ඛවෙ කාලකිරියා බහුනො ජනස්ස අනුතප්පා හොති. කතමස්ස එකපුග්ගලස්ස? තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස" යි.

---

(166). ජාතිසතසහස්සෙසු යන තන්හි "ජාති" ශබ්දය "එකම්පි ජාතිං" යන තන්හි සෙයින් භවයෙහි වැටෙයි. මෙයින් බැහැර "ජාති ද්වීහි ඛන්ධෙහි සඞ්ගහිතා" යන තන්හි සංස්කෘතලක්ෂණයෙහි වැටෙයි. "නිගණ්ඨා නාම සමණජාති" යන තන්හි නිකායෙහි

---

[1] සැඩොල් AB [2] මාපුසුඇත්කල්හි BDEF [2] මාවුසුඇත්කල්හි AB
[3] වලිකුළි A [3] වලිකුළු B

වැටෙයි. "යං මාතුකුච්ඡිස්මිං පඨමං චිත්තං උප්පන්නං පඨමං විඤ්ඤාණං පාතුභූතං තදුපාදාය සා වස්ස ජාති" යන තන්හි ප්‍රති සන්ධි යැ වැටෙයි. "අක්ඛිත්තො අනුපක්කුට්ඨො ජාතිවාදෙන" යන තන්හි කුලයෙහි වැටෙයි. "සම්පති ජාතො ආනන්ද බොධිසත්තො" යන තන්හි ප්‍රසූතියැ වැටෙයි.

---

(167). <u>සීහසෙය්‍යං</u> <u>කප්පනකාලො</u> යන තන්හි "සිංහශය්‍යා" නම් කවර යත්?

"ශය්‍යා චතුර්විධ වෙ. ප්‍රෙතශය්‍යා යැ, කාමභොගි ශය්‍යා යැ, සිංහ ශය්‍යා යැ, තථාගතශය්‍යා ය යි.

එහි "ප්‍රෙතශය්‍යා" නම් කවර යත්? ප්‍රෙතයො මාංස රුධිර විරහිත අස්ථිචර්මමාත්‍රයෙන් සඞ්ඝටිත ශරීරඇති වන බැවින් පාර්ශ්වයෙන් ශයනය කරන්නට අසමර්ථයෙන් උත්තානව මැ හොවිත්. මෙ "ප්‍රෙතශය්‍යා" නම්.

"කාමභොගිශය්‍යා" නම් කවර යත්? කාමභොගි ජනයො භූයොභාවයෙන් වාමපාර්ශ්වයෙන් මැ හොවිත්.

"සිංහශය්‍යා" නම් කවර යත්? මෘගරාජතෙමෙහෙ වාලධිය කළවෙ අතුරෙහි ප්‍රක්ෂෙප කොට හස්තපාදාදීන් තුබූ සෙ තබාලා පූර්වපාදමස්තකයෙහි හිස තබාගෙන දක්ෂිණපාර්ශ්වයෙන් ශයනය කෙරෙයි. ශයනය කොට දෙවර ද් නිදා උත්ත්‍රස්ත්‍ර නො වැ ප්‍රබුද්ධ වෙයි, ප්‍රබුද්ධ වැ හිස ඔසවා පූර්වපාදාදීන් තුබූ සෙ බලා පහ වැ තුබූ අඟක්[1] ඇත "තාගෙ ජාතියට ද් ශූරභාවයට ද් උචිත නොවෙ"යි දෙමිනස් වැ ගොචරයට නො ගොස් එහි මැ හොවී. තුබූ සෙ තුබුව සතුටු වැ නැගී විජෘම්භණ කොට කෙසුරු පොළා[2] තුන්යළක් සිංහනාද කොට ගොචරයට යෙ.

---

[1] ඇඟක් CDE [2] සළා A

"තථාගතසයනා" නම් කවර යත්? හෙ චතුර්ධ්‍යානසයනායි.

එයින් වදාළහ:-

506. "චතසෝ ඉමා භික්ඛවෙ සෙය්‍යා. කතමා චතසෝ? පෙතසෙය්‍යා, කාමභොගිසෙය්‍යා, සිහසෙය්‍යා, තථාගතසෙය්‍යා" යනාදීන්.

මෙසෙයින් චතුර්ධසයනාවන් කෙරෙහි බුදුන් සිංහ රාජයන්හු සෙයින් දක්ෂිණපාර්ශ්වයෙන් සතිසම්ප්‍රජාන ඇති වැ කරන සයනා "සිංහසයනා" නමී.

---

(1ඉ). තිත්ථියවාදපරිමොචනත්ථං යන තන්හි "තිත්ථිකයෝ" නම් කවරහ යත්? තීර්ථකරයන්ගෙ ලබ්ධි ගෙන පැවිදි වූවාහුයි.

කිසෙ යැ යත්?

තිත්ථි යැ, තිත්ථිකසයහ, තිත්ථිකයහ, තිත්ථිකශ්‍රාවකය හයි සතරෙක් වෙ. එහි "තිත්ථි" නම් දෙසැටදිටුහ හා එහි සඩ්ගහයට යන මිථ්‍යාග්‍රාහ යැ. එහි සත්වයෝ තරණ පුවත උන්මජ්ජන නිමජ්ජන කෙරෙති; එයින් හෙ "තිත්ථි" නම් වෙ. ච දෘෂ්ටිනට උත්පාදකයෝ "තිත්ථිකර" නම් වෙත්. ඔවුන්ගෙ ලබ්ධි ගෙනැ පැවිදි වූවාහු "තිත්ථික" නම් වෙත්. ඔවිනට ප්‍රත්‍යයදායකයෝ "තිත්ථිකශ්‍රාවක" නම් වෙත්.

යම්සෙ නුවණ නැති ගොපල්ලො අනෙකසහස්‍රගොගණයන් ගඩා නදියට නො තොවින් බහා මුහුදුබත් කොළොදැ, එසෙයින් මෑ තිත්ථිකයෝ සත්වයන් නො තොවින් බහා අපායගාමී කෙරෙත්.

එයින් වදාළහ:-

507. "තෙසං යෙ සොතබ්බං සද්දහාතබ්බං මඤ්ඤිස්සන්ති තෙසං තං භවිස්සති දීඝරත්තං අහිතාය දුක්ඛාය" යි.

මෙසෙයින් තිර්ථකරයන්ගෙ ලබ්ධි ගෙනැ පැවිජ්වූවාහුය "තිර්ථකයො" නම්.

---

(169). <u>වෙභාරපබ්බතපස්සෙ</u> යනු "තපොද" නම් ග්‍රදයට නො දුරු තැන් ගෙන කිහු.

එහි "තපොද" නම් ග්‍රදය වූ පරිදි කිසෙ යැ යත්?

එ පර්වතයාගෙ අධොදෙශයෙහි භූමිස්ථ නාගයනට පන්සියක් යොදුන් නාගභවනයෙක් විය. දිව්‍යපුරසදෘශ යැ. මණිමය භූමිතලයෙන් හා උද්‍යානවිමානයෙන් විභූෂිත යැ. එහි නාගයන් කෙළනා තන්හි මහත් ග්‍රදයෙක් විය. එයින් "තපොදා" නම් නදියක් නිර්ගත වූ. හො කුමට "තපොදා" නම් වුව යත්? රජගහානුවර වටා මහත් ප්‍රෙතලොක යැ, එහි දෙලොහොකුඹු නිර අතුරෙකින් එ නදිය ආගත යැ, එයින් එහි දිය ස්වර්ත විය; උෂ්ණ විය. මෙසෙයින් එ නදි තප්ත වූ උදක ඇති වන බැවින් "තපොදා" නම් වූ.

එයින් වදාළහ:-

508. "යතො'යං භික්ඛවෙ තපොදා සන්දති සො දහො අච්ඡොදකො සාතොදකො සීතොදකො සෙතකො සුපතිත්ථො රමණීයො පහූතමච්ඡකච්ඡපො වක්කමත්තානි ච පදුමානි පුප්ඵන්ති, අපිචායං තපොදා ද්වින්නං මහානිරයානං අන්තරිකාය ආගච්ඡති. තෙනායං තපොදා කඩිතා සන්දති"යි.

එ හොය දියෙන් එහි මහත් ග්‍රදයෙක් ජාත විය. හෙ ය "තපොදග්‍රද" නම්.

පඨමසඩ්ගිතිකථා.

---

දුතියසංගීතිකථා.

(170). <u>වජ්ජීනං පටිබාහනත්ථාය</u> යන තන්හි වජ්ජීහි නමි කවරහ යත්? විශාලා නුවර ලිච්ඡවිවංශසම්භූත රජුරුවොයි. එහි "විශාලා" නමි කිසෙ හූය යත්?

කියෙ මැ නො:-

509. "තෙන ඛො පන සමයෙන වෙසාලී ඉද්ධා වෙව හොති ඵීතා ව, බහුජනා ආකිණ්ණමනුස්සා ව, සත්ත ව පාසාදා සහස්සානි සත්ත ව පාසාදසතානි සත්ත ව පාසාදා, සත්ත ව කූටාගාර සහස්සානි සත්තව කූටාගාරසතානි සත්තව කූටාගාරා නි, සත්ත ව ආරාම සහස්සානි සත්ත ව ආරාමසතානි සත්ත ව ආරාමා, සත්ත ව පොක්ඛරණීසහස්සා නි සත්ත ව පොක්ඛරණීසතානි සත්ත ව පොක්ඛරණියො" යි.

මෙසෙයින් දෙවිනුවරක් බඳු වනුවර තවතිසා වැසි දෙවියන් බඳු සත්දහස් සත්සිය සත්රජෙක් විය. සත්දහස් සත්සිය සත් යුවරජෙක් විය. සත්දහස් සත්සිය සත් සෙනාධිපතියෙක් විය. සත්දහස් සත්සිය සත් භාණ්ඩාගාරිකයෙක් වී.

ඔවුන් තවතිසාවැසිදෙවියන් වැනි පරිදි කිසෙ සැ යත්? බුදුන් දහවි සැරිසරමින් කොටිග්‍රාමයට වැඩි කල්හි ඔවුන් කෙරෙන් පන්සියක් ලිච්ඡවීහි වෙෂවිලාසධර වැ රථ නැඟී බුදුන් දක්නට යෙත්.

කියෙ මැ නො:-

510. "අප්පෙකච්චෙ ලිච්ඡවී නිලා හොන්ති නිලවණ්ණා නිලවත්ථා නිලාලඞ්කාරා, අප්පෙකච්චෙ ලිච්ඡවී පිතා හොන්ති පිතවණ්ණා පිතවත්ථා පිතාලඞ්කාරා, අප්පෙකච්චෙ ලිච්ඡවී ලොහිතකා හොන්ති ලොහිතකවණ්ණා ලොහිතකවත්ථා ලොහිතකා ලඞ්කාරා, අප්පෙකච්චෙලිච්ඡවී ඔදාතා හොන්ති ඔදාතවණ්ණා ඔදාතවත්ථා ඔදාතාලඞ්කාරා" යි.

මෙසෙයින් එන ලිච්ඡවී රජපිරිස් දැක බුදුහු "මහණෙනි යම් කෙනකුන් විසින් තව්තිසා වැසි දෙවියෝ පූර්වයෙහි නොදක්නා ලද්දාහු ද, දැන් මෙ ලිච්ඡවී රජපිරිස් බලනු මැනැවැ" යි වදාළෝ.

511. "යෙහි කෙහිචි භික්ඛවෙ භික්ඛූහි දෙවා තාවතිංසා අදිට්ඨ පුබ්බා, ඔලොකෙථ භික්ඛවෙ ලිච්ඡවීපරිසං, අපලොකෙථ භික්ඛවෙ ලිච්ඡවීපරිසං, උපසංහරථ භික්ඛවෙ ලිච්ඡවීපරිසං තාවතිංසපරිසං" යි.

මොහු යැ "වජ්ජීහි" නම්.

(171). ගොතමතිත්ථාවිදූරෙ යන තන්හි එතැට "ගොතම තීර්ථ" නම් කුමට වියැ යත්?

බුදුහු එක්සමයෙක්හි අඩතෙළෙස්යල්සියක් සඟුන් පිරිවරා පාටලිග්‍රාමයට එළැඹැ එහි නුවර පිහිටුවන්නට ගිය මගධමහා මාත්‍යයන් විසින් සත්කාරපූජා වැ අනුමොදනා කොට හුන්නෙන් නැඟී වැඩියෝ. එකල්හි ඔහු "අද ශ්‍රමණගොතම යම් දොර යෙකින් ගියෙ ද එදොර ගොතමදොර" නම් වුව මැනැවැ. යම් තොටෙකින් ගඩාගඟින් උත්තීර්ණ වී ද එතොට "ගොතමතීර්ථ" නම් වුව මැනැවැ" යි බුදුන් පස් පස් ගියෝ. එසඳ බුදුහු එගම යම්දොරෙකින් වැඩියෝ ද, හෙ එනුවර "ගොතමදොර" නම් විය. සම්තොටෙකින් ගඩාගඟින් තරණ කළෝ ද, එතොට එගහැ "ගොතමතීර්ථ" නම් වී.

---

(172). <u>උත්තමං නගරං මාපෙත්වා</u> යන තන්හි එනුවර උත්තම වන පරිදි එදවස් පාටලිග්‍රාමයට වැඩි බුදුන් විසින් මැ භාෂිත යි.

512. "ඉධාහං ආනන්ද රත්තියා පච්චූසසමයං පච්චුට්ඨාය අද්දසං දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සම්බහුලා දෙවතායෝ පාටලිගාමෙ වත්ථූනි පරිග්ගණ්හන්තියෝ;

යස්මිං පදෙසෙ මහෙසක්ඛා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මහෙසක්ඛානං තත්ථ රාජූනං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ මජ්ඣිමා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, මජ්ඣිමානං තත්ථ රාජූනං රාජමහා මත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යස්මිං පදෙසෙ නීචා දෙවතා වත්ථූනි පරිගණ්හන්ති, නීචානං තත්ථ රාජූනං රාජමහාමත්තානං චිත්තානි නමන්ති නිවෙසනානි මාපෙතුං. යාවතා ආනන්ද අරියං ආයතනං යාවතා වණිප්පථො ඉදං අග්ගනගරං භවිස්සති පාටලිපුත්තං පුටභෙදනං" යි.

මෙසෙ එනුවර මුළුදඹදිවට අග්‍රවන බැවින් උත්තම නම්.

---

(173). දසවත්ථූනි දිපෙන්ති යන තන්හි "දශවස්තු" නම් කවරසත්?

හඟැ එව ගෙනැ තමා පරිහරණ කළ ලූණු යවිකැලිවත් හා මුසු කොට වළඳත් වටී, සන්නිධි[1] නො වෙයි; යනු එකෙකැ. යවි කැලිවත් පස්වරැ දෙඅඟුල් දක්වා වළඳත් වටී, යනු එකෙකැ. පැවැරිබොජුන් අයිරිත් කැප නො කළ ද හොත් ගමතුරෙහි වළඳත් වටී, යනු එකෙකැ. මහසිමින් ඇතුළත නන් නන් ආවාස යෙහි වෙන් වෙන් වැ පොහො පවුරුණු ඈ කරත් වටී, යනු එකෙකැ. ඇතුළුසිමැ සිටියන් රිසි නො ගෙනැ වග වැ පොහො පවුරුණු ඈ කොටින් පැසුළු රිසි ගනුත් වටී, යනු එකෙකැ. වදැජුරන් කළ කැප අයප වත් ඔවුන් කළ පමණින් තමා කරත් වටී, යනු එකෙකැ. පැවැරිවූවාහු අමත්දිහි අයිරිත් කැප නො කොට වළඳත් වටී, යනු එකෙකැ. නො ළා නූ මුහුකළ මිණිමොර රුවර රහ බොත් වටී, යනු එකෙකැ දහ නො ළා නිසජුන් සිවුරු වටී, යනු එකෙකැ. රන් රිදී මසු කහවණු ඈ අයප වත් වටී යනු එකෙකැ.

---

[1] පස සන්නිධි BCDE

එයින් කීහ:-

513. "කප්පති සිඞ්ගිලොණකප්පො - කප්පති ඉවඞ්ගුල කප්පො - කප්පති ගාමන්තරකප්පො - කප්පති ආවාසකප්පො - කප්පති අනුමති කප්පො - කප්පති ආචිණ්ණකප්පො - කප්පති අමථිත කප්පො - කප්පති ජලොගි[1] පාතුං - කප්පති අදසකං නිසීදනං - කප්පති ජාතරූපරජතං"සි.

මෙ යැ "දශවස්තු" නම්.

---

(174). සබ්බං සාසනමලං සොධෙත්වා යන තන්හි "සබ්බ" ශබ්දය "සබ්බෙ ධම්මා සබ්බාකාරෙන බුද්ධස්ස භගවතො ඤාණ මුඛෙ ආපාථං ආගච්ඡන්ති" යන තන්හි සෙයින් සර්වසර්වයෙහි වැටෙයි. මෙයින් බැහැර "සබ්බෙසං වො සාරිපුත්තා සුභාසිතං පරියායෙන" යන තන්හි ප්‍රදෙශසර්වයෙහි වැටෙයි. "සබ්බං වො භික්ඛවෙ දෙසිස්සාමි චක්ඛුඤ්චව රූපඤ්ච - පෙ - මනො වෙව ධම්මා ච" යන තන්හි ආයතනසර්වයෙහි වැටෙයි. "සබ්බං සබ්බතො සඤ්ජානාති" යන තන්හි සත්කායසර්වයෙහි වැටෙයි.

---

(175). දසසහස්සමත්තා පාපභික්ඛු මහාසඞ්ඝිකං නාම ආචරිය වාදං අකංසු යනාදි තන්හි නිකායාන්තරප්‍රසව කළ පාපභික්ෂුහු තුන්ඇඟින්[2] යුත් මහාචොරයන් වැන්නො.

කිසෙ යැ යත්?

මහසොරතෙමෙහෙ විෂමනිශ්ශ්‍රිත වෙයි; ගහනනිශ්ශ්‍රිත වෙයි; බලවන්නිශ්ශ්‍රිත වෙයි. එහි විෂම වූ නදිවිදුර්ගාදි දුර්ගයන් ආශ්‍රය කරනුයෙ "විෂමනිශ්ශ්‍රිත" නම් වෙයි. තාණගහන වෘක්ෂ ගහනාදි ගහනයන් ආශ්‍රය කරනුයෙ "ගහනනිශ්ශ්‍රිත" නම් වෙයි. බලවත් රාජරාජමහාමාත්‍යාදීන් ආශ්‍රය කරනුයෙ "බලවන්නිඃශ්‍රිත" නම් වෙයි. මෙතුන් අඟින් යුත් මහසොරහු නො කරන සොරකම් නැත්.

---

[1] ජලොගා [2] අඟින්

එසින් වදළහ.-

514. "තීහි භික්ඛවෙඅඩෙහි සමන්නාගතෝ මහා චොරෝ සන්ධිම්පි ඡින්දති නිල්ලෝපම්පි හරති එකාගාරිකම්පි කරොති පරිපන්ථෙපි තිට්ඨති" යනාදි.

එසෙයින් මෑ පාපභික්ෂු ද් විෂමනිශ්‍රිත වෙයි; ගහන නිශ්‍රිත වෙයි; බලවන්නිශ්‍රිත වෙයි. එහි විෂම වූ කායකර්‍ම වාක්කර්‍ම මනෝකර්‍මයෙන් සමූපෙත වූයෙ "විෂමනිශ්‍රිත" නම් වෙයි. ලබ්ධි ගහන නිපතිත වූයෙ "ගහනනිශ්‍රිත" නම් වෙයි. රාජරාජමහාමාත්‍යාදි බලවත් ජනයන් නිසා ප්‍රියශීලභික්ෂූනට පීඩා කරනුයෙ "බලවන්නිශ්‍රිත" නම් වෙයි. ඔහු විසින් නො කටහැකි පවී නම් නැත්.

එසින් වදළහ:-

515. "තීහි භික්ඛවෙ අඩෙහි සමන්නාගතෝ පාප භික්ඛූ ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජෝ ච හොති සානුවජ්ජෝ විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති" යනාදි.

ඔවුන් කෙරෙහි ප්‍රසාද කරත් දෙස් නැති හො යත්? දෙස් ඇති. කිසෙ යැ යත්? යම් බාලයෙක් නො විචාරා ගුණ නැතියවුන්ගෙ ගුණ කියා ද, ගුණ ඇතියවුන්ගෙ අයුණු කියා ද, නො පහදමනා තන්හි පහදි ද, පහදමනා තන්හි නො පහදි ද; හෙ පාපභාග් වෙ.

එසින් වදළහ:-

516. "චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතෝ බාලෝ අබ්‍යත්තෝ අසප්පුරිසෝ ඛතං උපහතං අත්තානං පරිහරති, සාවජ්ජෝ ච හොති සානුවජ්ජෝ විඤ්ඤූනං, බහුඤ්ච අපුඤ්ඤං පසවති. කතමෙහි චතූහි? අනනුවිච්ච අපරියොගාහෙත්වා අවණ්ණාරහස්ස වණ්ණං භාසති, වණ්ණාරහස්ස අවණ්ණං භාසති, අප්පසාදනියෙ ඨානෙ පසාදං උපදංසෙති, පසාදනියෙ

ඨානෙ අප්පසාදං උපදංසෙති. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො බාලො - පෙ - බහුඤ්ච අපුඤ්ඤං පසවති" යි.

යම් පණ්ඩිතපුරුෂයෙක් විචාරා ගුණ නැතියවුන්ගෙ ගුණ නො කියා ද, ගුණ ඇතියවුන්ගෙ ගුණ කියා ද, නො පහදමනා තන්හි නො පහදී ද, පහදමනා තන්හි පහදී ද, හෙ පුණ්‍යභාග් වෙ.

එයින් වදාළහ:-

517. "චතූහි භික්ඛවෙ ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො බ්‍යත්තො සප්පුරිසො අක්ඛතං අනුපහතං අත්තානං පරිහරති, අනවජ්ජා ච හොති අනනුවජ්ජා විඤ්ඤූනං, බහුඤ්ච පුඤ්ඤං පසවති. කතමෙහි චතූහි? අනුවිච්ච පරිසොගාහෙත්වා අවණ්ණාරහස්ස අවණ්ණං භාසති, වණ්ණාරහස්ස වණ්ණං භාසති, අප්පසාදනීයෙ ඨානෙ අප්පසාදං උපදංසෙති, පසාදනීයෙ ඨානෙ පසාදං උපදංසෙති. ඉමෙහි ඛො භික්ඛවෙ චතූහි ධම්මෙහි සමන්නාගතො පණ්ඩිතො - පෙ - බහුඤ්ච පුඤ්ඤං පසවති" යි.

දුතියසඩ්ගිති කථා.

---

තතියසංගිති කථා.

(178). සපරිසො සරණසීලෙසු පතිට්ඨාය යන් තන්හි ඔහුගෙ පරිජනයන් සරණසිලෑ පිහිටන්නට හෙතු කවර යත්? යම්සෙ හිමවත්පර්වතරාජයා නිසා මහත් වූ වෘක්ෂශාඛාවෝ ක්ෂුද්‍රශාඛා පලාශයෙන් හා චක්‍රප්‍රපටිකයෙන් හා වල්ගුසාරයෙන් වඩිත් ද, එසෙයින් මෑ ශ්‍රද්ධා ඇති කුලපතිහි නිසා ඔහුගෙ පරිජනයෝ ශ්‍රද්ධායෙන් හා ශීලයෙන් හා ප්‍රඥායෙන් වඩිත්.

එයින් වදළහ:-

518. "හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලා තීහි වඩ්ඩීහි වඩ්ඪන්ති. කතමාහි තීහි? සාඛාපත්ත පලාසෙන වඩ්ඪන්ති, තචපපටිකාය වඩ්ඪන්ති, වෙල්ලුයාරෙන වඩ්ඪන්ති. හිමවන්තං භික්ඛවෙ පබ්බතරාජං නිස්සාය මහාසාලං ඉමාහි තීහි වඩ්ඩීහි වඩ්ඪන්ති. එවමෙව ඛො භික්ඛවෙ සඤ්ඤං කුලපතිං නිස්සාය අඤ්ඤා ජනා තීහි වඩ්ඩීහි වඩ්ඪති. කතමාහි තීහි? සද්ධාය වඩ්ඪති, සීලෙන වඩ්ඪති, පඤ්ඤාය වඩ්ඪති. සඤ්ඤං භික්ඛවෙ කුලපතිං නිස්සාය අඤ්ඤා ජනා ඉමාහි තීහි වඩ්ඩීහි වඩ්ඪති"යි.

---

(177). නිග්‍රෝධත්‍රෙරස්ස දෙවසිකං සතසහස්සං යන තන්හි නිග්‍රෝධමහතෙරුනට දවස්පතා ලක්ෂයක් ධන විසඳමි කරන පරිදි කියෙ යැ යත්?

වරජ උදය මැ තුන්සිවුරු හත්තිසකඩයෙහි කඩා පන්සියක් අමුණු ගඳ හා පන්සියක් සුවඳමල් හා සමහ ඔවුනට දී යවයි. දවලු ද් එසෙ මැ දී යවයි. සවස ද් එසෙ මැ දී යවයි. තුන් වේලෙහි සව පෙරළන්නෙ "අප මහතෙරුනට සිවුරු දී යවුයෙ දැ" යි පිළිවිසැ බලා සව පෙරළයි. මහ තෙරහු දු තුන්වේලෙ අළ සිවුරු සම්ප්‍රාප්ත සබ්‍රහ්මචාරීනට දෙති. එකල්හි දඹදිව සහනට බොහොසෙ නිග්‍රෝධමහ තෙරුන්ගෙ සිවුරු වියැ. ඔවුන් මැගේ[1] පිණ්ඩපාතාදි ප්‍රත්‍යය දු වී.

(178). නිස්සා නාම මහාබ්‍රහ්මා යන තන්හි "බ්‍රහ්ම" ශබ්දය "සහස්සා බ්‍රහ්මා" යනාදි තන්හි සෙයින් මහාබ්‍රහ්මයා කෙරෙහි වැටෙයි. මෙයින් බැහැර "බ්‍රහ්මාති භික්ඛවෙ තථාගතස්සෙතං අධිවචනං" යන තන්හි බුදුන් කෙරෙහි වැටෙයි. "අනාසවො

---

[1] ඔවුන්ගෙම G

සබ්බදුක්ඛ ප්පහීනො සව්වව්හයො බ්‍රහ්ම උපාසිතො මෙ" යන තන්හි බ්‍රාහ්මණයන් කෙරෙහි වැටෙයි. "බ්‍රහ්මාති මාතාපිතරො පුබ්බාචරියාති වුච්චරෙ" යන තන්හි මවුපියන් කෙරෙහි වැටෙයි. "බ්‍රහ්මචක්කං පවත්තෙති" යන තන්හි ශ්‍රෙෂ්ඨයෙහි වැටෙයි.

---

(179). න මයං සහ තිත්ථියෙහි උපොසථං කරොම යනාදි තන්හි තීර්ථකයන් කෙරෙහි ශ්‍රමණයන් නැත්තෙන් තමන් හිස් සිදුතු ද් ඔවුන් හා පොහො නො කොළො.

ඔවුන් කෙරෙහි ශ්‍රමණයන් නැති පරිදි කිසෙ යැ යත්? යම්සෙ සුරක්ත හස්තපාද ඇති භාසුරකෙශරසටා ඇති සිංහමාග රාජ සොහොන හො කසළගොඩ වසන්නෙ නො වෙයි; තුන් දහසක් යොදුන් හිමව්වනයට වැද මිණිගුහායෙහි මැ වෙසෙ. යම්සෙ සදැත් ඇත්රජ කාලාවකහස්තිකුලාදි නවකුලෙහි උපදනෙ නො වෙයි; සදැත්කුලයෙහි මැ උපදි. යම්සෙ වලාහස් අස් රජ ගද්‍රහකුලයෙහි හො උෂ්ට්‍රකුලයෙහි උපදනෙ නො වෙයි; සින්ධුනදීතීරයෙහි සෛන්ධව කුලයෙහි මැ උපදි. යම්සෙ යෙළ සියක්යොදුන් ගුරුළු රජ ගම්දොර එඩරුවන ආදියැ වසන්නෙ නො වෙයි; මහමුහුදට වැද හිඹුල්දහත්ළාවනයෙහි මැ වෙසෙ. යම්සෙ දියරට හස්රජ ගම්දොර ගවරවළ ආදියැ වසන්නෙ නො වෙයි; අනූදහසක් හසුන් පිරිවරා චිත්‍රකූට පර්වතයෙහි මැ වෙසෙ. යම්සෙ චතුර්ද්වීපෙශ්වර චක්‍රවර්ත්ති රජ නිවකුලයෙහි උපදනෙ නො වෙයි; අසම්භින්න වූ ජාතිඇති ක්ෂත්‍රියකුලයෙහි මැ උපදි. එසෙයින් මැ ශ්‍රමණයො අන්‍ය තීර්ථකයන් කෙරෙහි උපදනාහු නො වෙති. ආර්‍ය්‍යමාර්ගපරිෂ්කෘත බුද්ධශාසනයෙහි මැ උපදිත්.

එයින් වදාළහ:-

519. "ඉධෙව භික්ඛවෙ සමණො ඉධ දුතියො සමණො ඉධ තතියො සමණො ඉධ චතුත්ථො සමණො, සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ"යි.

---

(180). <u>කම්මං විභජිත්වා</u> යනු "කර්මවිභාග කොටිනැ" යූ සෙ යි.

එහි කර්මවිභාග නම් කවර යත්?

සොත්‍රාන්තිකපර්‍යායෙන් කර්ම එකොළොසෙක් වෙයි. දෘෂ්ටධර්මවෙද්‍යකර්ම යැ, උපපද්‍යවෙද්‍යකර්ම යැ, අපරාපර්‍ය්‍ය වෙද්‍යකර්ම යැ, යද්ගරුක[1] යැ, යද්බහුල යැ, යදුසන්න යැ, කෘතත්වාත්කර්ම යැ, ජනක යැ, උපස්තම්භක යැ, උපපීඩක යැ, උපඝාතකය යි.

එහි එකජවනවීටියැ සප්තචිත්තයන් කෙරෙහි කුසල් වුව මැනැවැ, අකුසල් වුව මැනැවැ, පළමුජවන්සිත් "දෘෂ්ටධර්මවෙද්‍ය කර්ම" නම් වෙයි. හෙ මෙ මැ අත්බැවැ විපාක දෙයි. කුසල් කාකවළිය සිටුහට සෙයින් පුණුසිටුහට[2] සෙයින් විපාක දෙයි. අකුසල් නන්දයක්ෂයහට නන්දමාණවකයහට නන්දගොඝාතකයහට කොකාලිකයහට සුප්‍රබුද්ධශාක්‍යයහට දෙවදත්තයහට සිත්මණෙ වියහට සෙයින් විපාක දෙයි. මෙ මැ අත්බැවැ විපාක දෙන්නට අසමර්ථ වීනම් "අභූත්කර්ම" නම් වෙයි, අවිපාකභාවයට පැමිණෙයි. එ කර්මය මෘගව්‍යාධොපමායෙන් දතයුතු වෙ. යම්සෙ මුවවැද්දු විසින් මෘගයා දැක ධනුෂ[3] ඇද වුහුටු[4] ශරය ඉදින් නො වැරැද්දෙ වී නම් එ මෘග එතැන මැ හෙයි. එකල්හි මුවවැදි සම ලොහොලා කඩ කඩ කොට සිඳ මස් ගෙන පුත්‍රදාරයන් සන්තුෂ්ට කෙරෙමින් යෙයි. ඉදින් වැරැද්දෙ වී නම් මෘග පලා ගොස් වටාලා එදස නො බලයි. මෙයිද් එසෙයින් මැ දතයුතු වෙ.

ශරය නො වැරද මෘගයා විදිකල් වැන්නැ දෘෂ්ටධර්ම වෙද්‍යකර්මයාගෙ විපාකවාරප්‍රතිලාභය, ශරය වැරදිකල් වැන්නැ අවිපාකභාවය.

---

[1] ගුරුක DEF [2] පුණ්සිටිහටCE

[3] ධනුEF [4] වුහුටිE

සත්වන ජවන්සිත් "උපපද්‍යවෙදකම්" නම් වෙයි. හෙ අනන්තර ආත්මභාවයෙහි විපාක දෙයි. හෙ මෑ කුශල පක්ෂයෙහි අෂ්ටසමාපත්ති විසින් අකුශලපක්ෂයෙහි පඤ්චානන්තර්‍ය කර්ම විසින් දතයුතු වෙ. එහි අෂ්ටසමාපත්තිලාභී එක් සමාපත්ති යෙකින් බ්‍රහ්මලොකයෙහි උපද්දි. පස් ආනන්තර්‍යකර්ම කෙළෙ එක් කර්මයෙකින් නරකයෙහි උපද්දි. සෙසු සමාපත්තිහු ද කර්මයෝ ද "අහුත්කර්ම" නම් වෙති, අවිපාකභාවයට පැමිණෙත්, මෙ අර්ථය ද පූර්‍වොක්ත උපමායෙන් දතයුතු වෙ.

ඒ දෙදෙනා අතුරෙහි පස්වන්සිත් "අපරාපර්‍යවේදනීය කර්ම නම් වෙයි; අනාගතයෙහි යම් කලෙකැ අවකාශ ලද නම් එකලැ විපාක දෙයි. සංසාරප්‍රවෘත්තිය ඇති තාක් කලැ "අහුත් කර්ම" නම් නො වෙයි. ඒ කර්ම සාරමෙයව්‍යාධොපමායෙන් දතයුතු වෙ. යම්සෙ සුනඛව්‍යාධයා විසින් මෘගයා දැක විහිද්නාලද[1] සුනඛ මෘගයා ලුහුබැඳ යම්තැනෙක්හි ප්‍රාප්ත වෙ ද එතැන්හි සිට ඩෙහෙයි. එසෙයින් මෑ මෙ කර්මය යම් තැනෙක්හි අවකාශ ලද ද එතැන්හි විපාක දෙයි. එයින් මුක්තසත්වයෙක් නම් නැත්.

කුශලාකුශලයන් කෙරෙහි ගුරු අගුරු[2] දෙදෙනා ඇතිකලැ යමෙක් ගුරු ද හෙ "යද්ගරුක" නම් වෙයි. හෙ මෑ කුශලපක්ෂයෙහි මහත්ගතකර්ම යැ. අකුශලපක්ෂයෙහි පඤ්චානන්තර්‍යකර්ම යැ. ඒ ඇති කලැ සෙසු කුසල්හු හෝ අකුසල්හු හෝ විපාක දෙන්නට අසමර්ථ සහ. ඒ දෙකර්ම මෑ පිළිසඳ දෙයි. යම්සෙ උදැක් පමණ හකුරෙක් හෝ යගුළියෙක් හෝ දියවිලෙක ප්‍රක්ෂිප්තවූයෙ දියපිට ඉපිලෙන්නට අසමර්ථ යැ, යටට බස්සි. එසෙයින් මෑ කුසල්හි ද් අකුසල්හිද් යමෙක් ගුරු වී නම් හෙ මෑ ගෙනැ යෙයි.

---

[1] විහිදුනාලද CDEF [2] ගරු අගරු BD

කුශලාකුශලයන් කෙරෙහි යමෙක් බහුල වී ද හෙ "යද්බහුල නම් වෙයි. හෙ දිසීරාත්‍රයෙහි ලබ්ධාසෙවනවියින් දතයුතු වෙ. නොහොත් යමෙක් බලවත් කුශලකර්මයෙහි සොමනස් කෙරෙ ද, අකුශලකර්මයෙහි යන්තාප කෙරෙ ද, මෙ ද "යද්බහුල" නම් වෙ. හෙ මෑ යම්සෙ මල්ලයන් දෙදෙනක්හු යුද්ධභූමියට අවතීර්ණ වූ කල්හි යමෙක් බලවත් වී නම් හෙ ඉතරයා පැහැර හෙළා යෙයි. එසෙයින් මෑ ඉතර දුර්වලකර්මයා මැඩ යමෙක් ආසෙවනවශයෙන් හෝ බහුල වෙ ද, සන්තාපවශයෙන් බලවත් වෙ ද, හෙ විපාක දෙයි.

කුශලාකුශලයන් කෙරෙහි යම් කර්මයෙක් ආසන්නමරණ ඇති සත්ව ස්මරණ කරන්නට හිසි වී ද හෙ "යදාසන්න" නම් වෙයි. හෙ මෑ යම්සෙ ගොඝාතපරිපූර්ණ වූ ව්‍රජයෙහි දොර විවර කළ කලැ පරභාගයෙහි බලවත් බලවත් ගොගණයන් ඇති දූ කලැ යමෙක් ව්‍රජද්වාරයට ආසන්න වී ද, යටත්පිරිසෙයින් දුර්වල මහලු ගොනෙකු ද් වී නම් හෙ මැ පළමු වැ නික්මෙයි. එසෙයින් මෑ සෙසු කුශලාකුශලයන් ඇති දූ කලැ මරණකාලයට ආසන්න වන බැවින් හෙ මැ විපාක දෙයි.

මෙතුන්කර්මයෙන් මුක්ත වූ අඥානවශයෙන් කරන ලද කර්මය "කෘතත්වාත්කර්ම" නම් වෙ. හෙ යම්සේ උන්මත්තකයා විසින් ක්ෂිපතකාණ්ඩය යම් යම් තැනකට යෙ ද, එසෙයින් මෑ ඔවුන්ගෙ අභාවයෙහි යම් යම් තැනෙක්හි විපාක දෙයි.

"ජනක" නම් එක්ප්‍රතිසන්ධියක් දී ප්‍රවෘත්ති නො දෙයි. ප්‍රවෘත්ති යෑ අනෙක් කර්මයෙක් විපාක දෙයි. යම්සෙ මවු ජනවා ද කිරිමවු පිළිජඟි ද, එසෙයින් මෑ පිළිසඳ දෙන ජනක කර්ම මව වැන්නෑ; ප්‍රවෘත්ති යෑ සම්ප්‍රාප්ත කර්ම කිරිමව වැනි[1].

"උපස්ථම්භක" නම් කුසල්හි ද් අකුසල්හි ද් ලැබෙයි. ඇතමෙක් කුශල් කොට සුගතිභවයෙහි උපද්දි. හෙ එහි සිට පුන පුනා කුසල් කොට ඒ කර්මයා වශල් කොට අනෙකවර්

---

[1] වැන්නිCLEF

ශතසහස්‍රයෙහි සුගති භවයෙහි ම ඇවිද්දි. ඇතමෙක් අකුසල් කොට දුර්ගතිභවයෙහි උපද්දි. හෙ එහි සිට පුනපුනා අකුසල් කොට එ කර්‍මයා වහල්කොට බොහෝ වර්‍ෂශතසහස්‍රයෙහි දුර්ගති භවයෙහි ඇවිද්දි.

අනෙක් තැනෙකු දු ඇත්. "ජනක" නම් කුසල දු වෙයි අකුසල දු වෙ. හෙ ප්‍රතිසන්ධිය ද ප්‍රවෘත්තිය ද රූපාරූපවිපාක ස්කන්ධයන් උපදවයි. "උපස්තම්භක" වූ කල්‍ය විපාක දෙන්නට අසමර්‍ථ යැ, අනෙක් කර්‍මයෙකින් පිළිසඳ දුන් කල්‍ය විපාක දුන් කල්‍ය උපදනා සුඛදුඃඛයට වහල් වෙයි දීර්‍ඝකාලයෙහි පවත්වා.

"උපපීඩක" නම් අනෙක් කර්‍මයෙකින් පිළිසඳ දුන් කල්‍ය විපාක දුන් කල්‍ය උපන් සුඛදුඃඛයට පීඩා කෙරෙයි, බාධා කෙරෙයි, දීර්‍ඝ කාලයෙහි නො පැවැත්ත දෙයි. කිසෙ සැ යත්? කුශලකර්‍මයා විවස්තා කල්‍ය අකුශලකර්‍ම උපපීඩක වැ උහු විපාක නො දිය දෙයි. අකුශලකර්‍මයා විවස්තා කල්‍ය කුශලකර්‍ම උපපීඩක වැ උහු ද් විපාක නො දිය දෙ. යම්සෙ වඩනා රුකක් හෝ ගසක් හෝ ලියයක් හෝ කිසි කවරයෙක්[1] දැඩුයෙකින් හෝ සැතෙකින් හෝ පැහැර සිඳ හෝ පියයි, බිඳ හෝ පියයි. එකල්හි එ රුක හෝ ගස හෝ ලිය හෝ වඩනට අසමර්‍ථ වෙයි. එසෙයින් ම කුසල් විවස්තෙ අකුසලින් උපපීඩිත වැ අකුසල් විවස්තෙ කුසලින් උපපීඩිත වැ විපාක දෙන්නට අසමර්‍ථ වෙ. එහි සුනක්ඛත්තයාගෙ අකුශලකර්‍මය කුශලකර්‍මයට උපපීඩක විය. වොරක්ඛත්තයාගෙ කුශලකර්‍මය අකුශලකර්‍මයට උපපීඩක වී.

"උපඝාතක" වනාහි තමා විසින් කුශලඃඛභාවය ද අකුශල ඃඛභාවය ද ඇතිසෙ අනෙක් දුර්‍වලකර්‍මයක්හට උපඝාත කොට ඔහුගෙ විපාකය පිළිබහා තමාගෙ විපාකයට අවකාශ කෙරෙයි. මෙසෙ කර්‍මයා විසින් අවකාශ කළ කල්‍ය ඒ විපාකය

---

[1] කවුරුයෙක් EF

උත්පත්ත නම් වෙයි. "උපවෙජ්ජක"යැ, යනු දූ ඔවිහට මැ නම්. මෙ එහි නයයි. කුශලකර්මයා විවස්තා කළැ එක් අකුශල කර්මයෙක් උත්පත්ත වැ එ කර්මයා උපදින්න කෙරෙයි. අකුශල කර්මයා විවස්තා කළැ එක් කුශලකර්මයෙක් උත්පත්ත වැ එ කර්මයා උපදින්න කෙරෙයි. මෙ "උපවෙජ්ජක" නම් වෙයි. එහි අජාත ශත්‍රුහුගෙ ආනන්තර්‍යකර්මය කුශලවෙජ්ජක විය. අඩුලිමාලයන්ගෙ ශීලසමාදානාදි කුශලකර්මය අකුශලවෙජ්ජක වී.

මෙසෙ සොත්‍රාන්තිකපර්‍යායෙන් එකාදශකර්මයෝ විභක්තයහ. අභිධර්මපර්‍යායෙන් වනාහි කර්ම ෂොඩශවිධ වෙ.

කිසෙ යැ යත්?

ඇතම් පාපක වූ කර්මසමාදානයෝ ගතිසම්පත්තීන් බාධිතවැ විපාක නො දෙන්නෝ ඇති, ඇතම් පාපක වූ කර්මසමාදානයෝ උපධිසම්පත්තීන් බාධිත වැ විපාක නො දෙන්නෝ ඇති, ඇතම් පාපක වූ කර්මසමාදානයෝ කාලසම්පත්තීන් බාධිත වැ විපාක නො දෙන්නෝ ඇති, ඇතම් පාපක වූ කර්මසමාදානයෝ ප්‍රයෝග සම්පත්තීන් බාධිත වැ විපාක නො දෙන්නෝ ඇති, ඇතම් පාපක වූ කර්මසමාදානයෝ ගතිවිපත්ති පිණිසැ විපාක දෙන්නෝ ඇති, උපධිවිපත්ති, කාලවිපත්ති, ප්‍රයෝගවිපත්ති පිණිසැ විපාක දෙන්නෝ ඇති.

ඇතම් කල්‍යාණ වූ කර්මසමාදානයෝ ගතිවිපත්තීන් බාධිතවැ විපාක නො දෙන්නෝ ඇති, උපධිවිපත්තීන්, කාලවිපත්තීන්, ප්‍රයෝගවිපත්තීන් බාධිත වැ විපාක නො දෙන්නෝ ඇති. ඇතම් කල්‍යාණ වූ කර්මසමාදානයෝ ගතිසම්පත් පිණිසැ විපාක දෙන්නෝ ඇති, උපධිසම්පත්, කාලසම්පත්, ප්‍රයෝගසම්පත් පිණිසැ විපාක දෙන්නෝ ඇති.

කිසෙ යැ යත්?

අනිෂ්ටාලම්බනානුභවයට නිසි පාපකර්මයා ඇතිකල මැ සුගතිභවයෙහි උපදී ද, එවිහුගෙ ඒ පාපකර්මය ගතිසම්පත්තීන් බාධිත වැ විපාක නො දෙනු නම් වෙ. යමෙක් පාපකර්මයෙන් දුසියක හො කර්මකාරියක හො කුස ඉපද උපධිසම්පන්නවැ ආත්මභාව සමෘද්ධියැ සිටී ද, එකලැ ස්වාමීහු ඔහුගෙ රූප සම්පත් දැක "මෙ ක්ලිෂ්ටකර්මයට නො නිස්සැ" යි සිතා තමනට ද පුතක්හු සෙයින් එවිහු භාණ්ඩාගාරිකාදි ස්ථානයෙහි තබා සර්ව සම්පත්තීන් යොදා පරිහරණ කෙරෙති. මෙබඳු සත්වයාගෙ විද්‍යාමාන වූ පාපකර්මය උපධිසම්පත්තීන් බාධිත වැ විපාක නො දෙනු නම් වෙ. යමෙක් ප්‍රථමකල්පයෙහි මනුෂ්‍යයන් කෙරෙහි හො සුලභාන්නපානකාලයෙහි හො උපදී ද, එවිහුගෙ විද්‍යමානවූ පාපකර්මය කාලසම්පත්තීන් බාධිත වැ විපාක නො දෙනු නම් වෙ. යමෙක් සම්‍යක් ප්‍රයොග නිසා ජීවනය කෙරෙයි. උපසඞ්ක්‍රමණයට නිසිකල්හි උපසඞ්ක්‍රමණය කෙරෙයි; ප්‍රතික්‍රමණයට නිසි කල්හි ප්‍රතික්‍රමණය කෙරෙයි; පලායනාර්ථකාලයෙහි පලා යෙයි; ලක්ව දානයට නිසි කාලයෙහි අත්ලස් දෙයි; චොරකර්මයට නිසි කාලයෙහි සොරකම් කෙරෙයි; මෙබඳු සත්වයාගෙ විද්‍යමාන වූ පාපකර්මය ප්‍රයොග සම්පත්තීන් බාධිත වැ විපාක නො දෙනු නම් වෙ.

දුර්ගතිභවයෙහි උපන් සත්වයාගෙ පාපකර්මය ගතිවිපත්ති පිණිසැ විපාක දෙනු නම් වෙ. යමෙක් දුසියක හො කර්මකාරියක හො කුසැ උපද දුර්වර්ණ වැ දුස්සංස්ථාන වැ "යක්ෂයෙක හො?" යන විමති උපදවා ද, හෙ ඉදින් පුරුෂයෙක් වී නම් "මෙ අනෙක් කර්මයකට නො නිස්සැ" යි ඇත්අස්ආදීන් හො රක්වති, තෘණකෘෂ්ඨාදීන් හො ගෙන්වති, කෙළමලා හො ගන්වති. ඉදින් ස්ත්‍රියක් වූ නම් ඇත් අස් ආදීනට භක්තමාෂාදීන් හො පිසවති, කසළ හො හරවති, සෙසු ජුගුප්සිතකර්ම හො කරවති, මෙබඳු සත්වයාගෙ පාපකර්මය උපධිවිපත්ති පිණිසැ විපාක දෙනු නම් වෙ.

යමෙක් දුර්භික්ෂකාලයෙහි හෝ පරිහීණසම්පත් ඇති කාලයෙහි හෝ අන්තරිකල්පයෙහි මනුෂ්‍යයන් කෙරෙහි හෝ උපදී ද, ඔහුගෙ පාපකර්මය කාලවිපත්ති පිණිසැ විපාක දෙනු නම් වේ. යමෙක් ප්‍රයෝගය සම්පාදනය කරන සෙ නො දනී ද. උපසඞ්ක්‍රමණයට නිසි කල්හි උපසඞ්ක්‍රමණ කරන සෙ නො දනී ද - පෙ - වොරකර්මයට නිසි කල්හි වොරකම් කරන සෙ නො දනී ද, ඔහුගෙ පාපකර්මය ප්‍රයොග විපත්ති පිණිසැ විපාක දෙනු නම් වේ.

යමෙක් ඉෂ්ටාලම්බනානුභවයට නිසි කර්මයා ඇතිකල මැ ගොස් දුර්ගතිභවයෙහි උපදී ද, ඔහුගෙ පුණ්‍යකර්මය ගතිවිපත්තින් බාධිත වැ විපාක නො දෙනු නම් වේ. යමෙක් පුණ්‍යානුභාවයෙන් රාජරාජමහාමාත්‍යාදීන්ගේ ගෙහි උපද කණ හෝ වෙයි, කොරහත් හෝ වෙයි, කොරපා හෝ වෙයි, පක්ෂහත හෝ වෙයි, ඔවිහට යුවරාජසෙනාපති භාණ්ඩාගාරිකස්ථානාදීහු අනුචිතයහ යි නො දනිති. මෙසෙයින් ඔවිහට ඒ පුණ්‍යකර්මය උපධිවිපත්තින් බාධිත වැ විපාක නො දෙනු නම් වේ. යමෙක් දුර්භික්ෂ කාලයෙහි හෝ පරිහීණසම්පත් ඇති කාලයෙහි හෝ අන්තරිකල්පයන් කෙරෙහි හෝ උපදී ද, ඔහුගෙ කල්‍යාණකර්මය කාල විපත්තින් බාධිත වැ විපාක නො දෙනු නම් වේ. යමෙක් යට කී පරිද්දෙන් ප්‍රයෝගසම්පාදනය කරන සෙ නො දනී ද, ඔහුගෙ කල්‍යාණකර්මය ප්‍රයෝග විපත්තින් බාධිත වැ විපාක නො දෙනු නම් වේ.

කල්‍යාණකර්මයෙන් සුගතිභවයෙහි උපන් සත්වයහට ඒ පුණ්‍යකර්මය ගතිසම්පත් පිණිසැ විපාක දෙනු නම් වේ. රාජ රාජමහාමාත්‍යාදීන්ගේ කුලයෙහි ඉපද උපධිසම්පතට ප්‍රාප්ත වැ ආත්ම භාවසමෘද්ධියැ සිටියාහුගෙ දෙවිනුවරැ නැඟ රුවන් තොරණක් බඳු ආත්මභාවය දැක මොවිහට යුවරාජ සෙනාපති

භාණ්ඩාගාරික ස්ථානාදිහූ මෑ නිස්සයහ යි තරුණවහාට ඇති යවිහට මෑ ස්ථානාන්තරයන් දෙති; මෙබඳු සත්වයාගෙ කල්‍යාණ කර්මය උපධි සම්පත් පිණිසැ විපාක දෙනු නම් වෙ. යමෙක් ප්‍රථමකල්පිකයන් කෙරෙහි හෝ සුලභාන්නපානකාලයෙහි හෝ උපදී ද, ඔහුගෙ කල්‍යාණ කර්මය කාලසම්පත් පිණිසැ විපාකදෙනු නම් වෙ. යමෙක් උක්තක්‍රමයෙන් ප්‍රයොගසම්පාදනය කරන යෙදුනී ද, ඔහුගෙ ච කල්‍යාණකර්මය ප්‍රයොගසම්පත් පිණිසැ විපාක දෙනු නම් වෙ.

මෙසෙ අභිධර්මපර්‍යායෙන් ෂෝඩශකර්මයෝ මෑ විභක්තයහ.

ප්‍රතිසංවිත්මාර්ගපර්‍යායෙන් අනෙක් ද්වාදශකර්මකෙනෙක් විභක්ත වෙත්. ඔහු කවරහ යත්?

"අහුත්කර්‍ම යැ අහුත්කර්‍මවිපාක යැ අහුත්කර්‍ම යැ නාහුත්කර්‍ම විපාක යැ, අහුත්කර්‍ම යැ අස්තිකර්‍ම විපාක යැ, අහුත්කර්‍ම යැ නාස්ති කර්‍මවිපාක යැ. අහුත්කර්‍ම යැ, භවිෂ්‍යත් කර්‍මවිපාක යැ, අහුත්කර්‍ම යැ න භවිෂ්‍යත් කර්‍මවිපාක යැ, අස්තිකර්‍ම යැ අස්තිකර්‍ම විපාක යැ, අස්තිකර්‍ම යැ නාස්තිකර්‍ම විපාක යැ, අස්තිකර්‍ම යැ භවිෂ්‍යත්කර්‍ම විපාක යැ, අස්තිකර්‍ම යැ න භවිෂ්‍යත්කර්‍මවිපාක යැ, භවිෂ්‍යත්කර්‍ම යැ භවිෂ්‍යත් කර්‍මවිපාක යැ, භවිෂ්‍යත්කර්‍ම යැ න භවිෂ්‍යත්කර්‍මවිපාක යැ" යන මෙවිහු සි.

එහි යම් කර්‍මයෙක් අතීතයෙහි වෘත්ත වූයෙ අතීතයෙහි මෑ විපාකවාර ලදින් ප්‍රතිසන්ධිප්‍රවෘත්ති විපාක දි නිමි ද, හෙ "අහුත් කර්‍මයැ අහුත්කර්‍මවිපාකයැ" යි කියනලදි.

යමෙක් වනාහි විපාකවාර නො ලද්දෙත් ප්‍රතිසන්ධි ප්‍රවෘත්ති විපාක නො දින් ද, හෙ "අහුත්කර්‍ම යැ නාහුත්කර්‍ම විපාක යැ" යි කියනලදි.

යමෙක් වනාහි අතීතයෙහි වෘහිත වූයෙ දැන් විපාක දෙමින් සිටියෙ ද, හෙ "අභූත්කර්ම යැ අස්තිකර්මවිපාක යැ" යි කියනු ලැබෙයි. එසෙ නො වනුයෙක් "අභූත්කර්ම යැ නාස්ති කර්ම විපාක යැ" යි කියනු ලැබෙයි.

යමෙක් අතීතයෙහි වෘහිත වූයෙ අනාගතයෙහි විපාක වාර ලදින් ප්‍රතිසන්ධිප්‍රවෘත්ති විපාක දෙ ද, හෙ "අභූත්කර්ම යැ භවිෂ්‍යත් කර්මවිපාක යැ" යි කියනු ලැබෙයි. එසෙ නොවනුයෙක් "අභූත්කර්ම යැ න භවිෂ්‍යත්කර්මවිපාක යැ" යි කියනු ලැබෙයි.

යමෙක් දැන් වෘහිත වූයෙ දැන් මැ විපාකවාර ලද ද, හෙ "අස්තිකර්මයැ අස්තිකර්මවිපාක යැ" යි කියනලද එසෙ නො වනුයෙක් අස්තිකර්මයැ නාස්තිකර්මවිපාක යැ" යි කියන ලද.

යමෙක් වනාහි දැන් වෘහිත වූයෙ අනාගතයෙහි මැ විපාක වාර ලැබෙ ද, හෙ "අස්තිකර්මයැ භවිෂ්‍යත්කර්ම විපාක යැ" යි කියන ලදැ. එසෙ නො වනුයෙක් "අස්තිකර්මයැ න භවිෂ්‍යත් කර්මවිපාක යැ" යි කියනලද.

යමෙක් අනාගතයෙහි වෘහිත වෙ ද, අනාගතයෙහි මැ විපාක වාර ලැබෙ ද, හෙ "භවිෂ්‍යත්කර්ම යැ භවිෂ්‍යත්කර්ම විපාක යැ" යි කියනලද. එසෙ නො වනුයෙක් "භවිෂ්‍යත් කර්ම යැ න භවිෂ්‍යත් කර්මවිපාක යැ" යි කියනලද.

මෙසෙ ප්‍රතිසංවින්මාර්ගපර්‍යායෙන් දවාදශකර්මයො විභක්තයො.

මෙසෙයින් මෙ දොළොස් කර්මයො ද, පළමු කී සොළොස් කර්මයො ද සොත්‍රාන්තිකපර්‍යායෙන් දක්වනලද එකා දශකර්මයෙහි මැ ඇතුළත් වෙති. ඔහු දු "දෘෂ්ටධර්මවෙද්‍ය උපපද්‍යවෙද්‍ය අපරාපර්‍යවෙද්‍ය" යයි කියනලද තුන්කර්මයෙහි මැ ඇතුළත් වෙත්.

මෙ යැ "කර්මවිභාග" නම්.

---

(181). රාජානං සමයං උග්ගණ්හා පෙසි යන තන්හි රජු සර්ව සමය උගැන්වූ පරිදි කිසෙ යැ යත්?

අප බුදුන් සාරාසකි[1] කප්සුවහස් මතුයෙහි සුමෙධ නම් තාපසයක් වැ දිවකුරු බුදුන් හමු වැ අත්පත්[2] නිවන් පියා භවදුර්ගයට වැද පැරුම් පුරා තුසීපුර පැමිණ දසදහස් ලොඩාහි දෙවිබඹුන්ගෙ අයජමෙන් කිඹුල්වත්හි උපද බෝමඩහි නිපැද ඉසිපතන්හි ධම්සක් පවත්වා සතුන් සසරසයුරෙන් නගමින් සසර කතර තරවමින් සසරමලින් මුදවමින්[3] විනෙකුමුදුවන පුබුදුවමින් දහම් අමාවහරෙ වස්වමින් පන්සාලිස් අවුරුද්දක් සිට සුවාසූ දහසක් ධම්කඳ දෙසන බුදුන් විසින් ලොකයෙහි සද්ධර්ම ප්‍රතිරූපක උපදනා සෙ දැක මහසුප් මහතෙරනට සද්ධර්ම ප්‍රතිරූපක[4] සුත් දෙසූ පරිදි දැක්වූහ. දහම් පරීක්ෂා කොට ගතමනා පරිදි දක්වමින් සඟනට මහාප්‍රදෙශ සුත් දෙසූ පරිදි දැක්වූහ. අනාගතයෙහි සස්නට[5] වන පස් භයක් දැකැ අනාගත භය සුත් දෙසූ පරිදි දැක්වූහ. බුදුන් සූවිසි අසඞ්ඛ්‍යයක් දෙවි මිනිසුන් අමාමහනිවන් පමුණුවා යමසල්[6] උයන්හි පිරිනිවි කළැ සමක්ෂ ශ්‍රාවකයන් පන්සියක් දෙනා සර්වඥතාඥාන නමැති රුවන් ආරෙහි උපන් දහම්රුවන් ගෙන රුවන්දමක් සෙයින් ගොතා ස්ථාවිරියනිකාය[7] නමැති රත්නමඤ්ජුෂායෙහි නිධාන කළ පරිදි දැක්වූහ. එක්බිති මහා සාඞ්ගිකාදි සප්තදශනිකායවාසී බුදු සතුරන් තත්තත්සූත්‍රපදයෙහි අයොනිශොමනස්කාරයෙන් අර්ථ වරදවා ගෙන අනෙකප්‍රකාර දුර්ලබ්ධි උද්භාවනා කළ පරිදි දැක්වූහ. පසු වැ හෛමවතාදි නවනිකායවාසී භික්ෂුප්‍රතිරූපක තීර්ත්‍රිකයන් ස්වදර්ශනානුප්‍රවෙශයෙන් ශාස්තෘශාසනය බිඳ සද්ධර්ම ප්‍රතිරූපක කොට වර්ණපිටකාදි ගත් කරන සෙ දැක්වූහ. මෙ හැමයට ප්‍රභවරූපයෙන් සිටි ස්ථාවිරියනිකාය පූර්ණ චන්ද්‍ර

---

[1] සාරාසංඛ්‍ය ACD [2] අතටපත් AC [3] මුදමින් A
[4] "ක" ab. in BCDEF [5] සත්නට A
[6] යමහල් A [7] ස්ථාවරියනිකා D

මණ්ඩලයක් සෙයින් නිකායාන්තර ලබ්ධි නමැති අග්‍රමහිකාධූම-රජොරාහු විසින් අනුපක්ලිෂ්ටවැ අමාරස් වීරමින් ජන කුමුදුවන පුබුදුවමින් සියල්ලෙවි සහසමින් පවත්නා පරිදි දැක්වූහ.

මෙ යැ චිරජහු උගැන්වූ සච්සමය නම්.

---

(182). සස්සතවාදිනො සස්සතවාදිති ආහංසු යනාදි විසින් දක්වනලද වාෂඤ්ඤ්‍ඨි නම් කවරේ යත්?

චතුර්විධ ශාශ්වතවාද යැ, චතුර්විධ එකත්‍යශාශ්වත වාද යැ, චතුර්විධ අන්ත්‍යානන්ත්‍යකවාද යැ, චතුර්විධ අමරා වික්ෂේපික වාද යැ,

අවිධ අධීත්‍යසමුත්පන්නිකවාද යැ, ෂොඩශප්‍රකාර සංඥිවාද යැ, අෂ්ටප්‍රකාර අසඥිවාද යැ, අෂ්ටප්‍රකාර නෛවසංඥි නාසඥිවාද යැ, සප්තප්‍රකාර උච්ඡෙදවාද යැ, පඤ්චප්‍රකාර දෘෂ්ට ධර්ම නිර්වාණවාද යි.

මෙහි ශාශ්වතවාදගත චාතුර්විධ්‍යවිභාගවිත්‍ය යෙහි, ධ්‍යාන සමාපත්තියෙහි වශිතාතිශය සමාසාදිත පූර්වනිවාසානු ස්මෘතිඥානයෙන් එකකල්‍පාවධික පූර්වෝෂිත ජන්ම පරම්පරා සමරණ ප්‍රවණ වැ චිත්තචෛත්තගත ක්ෂණභඞ්ගාදර්ශනයෙන් "ආත්ම නිත්‍යය" යි දෘෂ්ට්‍යභිනිවිෂ්ට එකෙක, පූර්වෝක්තප්‍රකාරයෙන් දශ මහාකල්‍පසමරණෝද්භූත මිථ්‍යාවිකල්‍පග්‍රාහි එකෙක, චත්වාරිංශත් සඞ්ඛ්‍ය මහා කල්‍පසමරණ වශයෙන් සමුපජාත මිථ්‍යාග්‍රාහග්‍රස්ත එකෙක, තුෂ්ණීතාර්කික දෘෂ්ටිගතික එකෙකැයි මෙසෙ කෙවල ශාශ්වතිකයෝ චතුර්විධ වෙත්.

ඒකත්‍යශාශ්වතික හෙදවින්තායෙහි, විවර්තකල්පයෙහි උපරිතන බ්‍රහ්මලොකයෙන් ප්‍රච්‍යුත වැ අධස්තාත් ශුන්‍යබ්‍රහ්මවිමාන යෙහි ප්‍රාදුර්භූත වැ දීර්ඝකාලයෙහි ඒකාකිවාසයෙන් සඤ්ජා තොත්ත වැ ආත්මද්විතීය සත්ත්වොත්පත්ත්‍යභිලාෂ සමනන්තර කාක තාලීයන්‍යායයෙන් සමවතීර්ණ අපරසත්වයා කෙරෙහි ආත්ම නිර්මිතත්ව පරිකල්ප වශයෙන් "අහං නිත්‍යො'ස්මි, අපරො'යම නිත්‍යඃ" යි ඒකත්‍යශාශ්වතග්‍රාහග්‍රස්ත ප්‍රථම යැ; ක්‍රීඩාප්‍රදූෂක දෙව නිකායයෙන් ප්‍රච්‍යුත වැ මනුෂ්‍යභාවප්‍රාප්ත වැ පූර්වජන්මානුස්මරණයෙන් ස්වයමනිත්‍යභාව විභාවනා කොට අවශිෂ්ට දීර්ඝායුෂ්ක දිව්‍යයන් නිත්‍ය කොට දැකැ පුනරෙකත්‍යශාශ්වතික දෘෂ්ට්‍යභිනිවිෂ්ට ද්විතීයයැ; මනඃප්‍රදූෂක දෙවනිකායයෙන් ප්‍රච්‍යුත වැ පූර්වොක්ත ක්‍රමයෙන් දෘෂ්ටිගතික තෘතීය යැ; පූර්වජන්මස්මරණාදී රහිත වැ ස්වපරිකල්ප මාත්‍රශරණ වැ චක්ෂුශ් ශ්‍රොත්‍රාදිරූප වූ ආත්ම අනිත්‍ය යැ; තදන්‍ය ආත්ම නිත්‍ය යැයි විපර්‍යස්තමතික ශුෂ්කතාර්කික චතුර්ථ යැයි මෙසෙ ඒකත්‍යශාශ්වතික දෘෂ්ටි චතුර්ධ වෙ.

අන්තානන්තික විභාගයෙහි, සකලවක්‍රවාලවලයාවධි සංවර්ධිත කාත්ස්නමණ්ඩලයෙහි ප්‍රතිලබ්ධධ්‍යාන වැ තත්‍රාර්පිත චිත්තවෛත්තයන් මැ ආත්මත්වයෙන් පරිකල්ප[1] ආත්ම අනන්ත යයි විප්‍රතිපන්න දුර්මතික එකෙකැ; තිර්‍යක්සංවර්ද්ධිත කාත්ස්න මණ්ඩලයෙහි ප්‍රතිලබ්ධධ්‍යාන වැ ආත්මගත අන්තානන්තොභයාංශ පරමාර්ශ රූපයෙන් මිථ්‍යාභිනිවෙශපරවශ එකෙකැ; අවර්ධිත කාත්ස්න මණ්ඩලයෙහි ප්‍රතිලබ්ධසමාධි වශයෙන් ආත්මගත අන්ත වත්තා[2] ප්‍රකල්පනයෙන් කුමාර්ගාවතීර්ණ එකෙකැ; කෙවල පරිකල්ප මාත්‍රයෙන් අන්තානන්තොභයාංශ රහිත අත්මදෘෂ්ටි පූර්වක ශාශ්වතත්ව ග්‍රාහී එකෙකැයි මෙසෙ අන්තානන්ති කශාශ්වතිකදෘෂ්ටිදූ චතුර්විධ වෙ.

---

[1] පරිකල්පනා A [1] පරිකල්පා CEF [2] අනන්තවත්තා BD

අමරාවික්ෂේපිකශාශ්වතික ප්‍රභෙදවින්තායෙහි, සවදර්ශන ප්‍රතිෂ්ඨාවිරහයෙන් ප්‍රශ්නව්‍යාකරණයෙහි අසමර්ථ වැ මෘෂාවාද භීතීන් පාදප්‍රසාරණා කොට අසත්පර්ථප්‍රස්කන්න එකෙකැ; ජන්දුද්‍යූපාදාන නිමිත්ත අන්තරාය භීතීන් වාග්වික්ෂේපාපන්න ද්විතිය යැ; පණ්ඩිත ජන පර්‍යනුයොගභීතීන් අමරාවික්ෂේප පක්ෂනිඃක්ෂිප්ත තෘතිය යැ; මන්දමතිකත්වයෙන් ප්‍රශ්නව්‍යාකරණක්ෂම නො වැ කුමාර්ගා වතීර්ණ චතුර්ථ ය යි මෙසෙ අමරාවික්ෂේපික ලක්ෂණ දෘෂ්ටිදූ චතුර්විධ වෙ.

අධිත්‍යසමුත්පන්තික ශාශ්වතික ප්‍රකාරයෙහි, අසංඥභවයෙන් ප්‍රව්‍යුත වැ මානුෂකායප්‍රාප්ත වැ පූර්වනිවාසානුස්මෘතිඥානයෙන් පඤ්චශතකල්පව්‍යවහිත පූර්වභවස්කන්ධ සන්දර්ශනයෙහි අශක්ත වැ "අහමිදානිමි පූර්වොත්පන්නඃ, තස්මාත් සර්වමිදං ජගද් යදෘච්ඡ කමි" යි විපර්‍යාසග්‍රාහී එකෙකැ; ගගනොදර කුහරනිපතන් මත්ස්‍යාදිපදාර්ථ සන්දර්ශනයෙන් "සමස්ත වස්තුග්‍රාම මැ ආකස්මිකය" යි විපර්‍යාසාභිනිවිෂ්ට එකෙකැ යි මෙසෙ අධිත්‍යසමුත්පන්තිකවාද ද්විප්‍රකාර වෙ.

ෂොඩශ සංඥිවාදවිභාග පරිග්‍රහ කරන වර්ග, රූපධ්‍යාන මාත්‍රලාභී වැ ධ්‍යානාලම්බන භාවනායෙන් ව්‍යවස්ථිත කෘත්ස්න මණ්ඩල රූපයා ආත්ම යයි ගෙනැ තද්විෂය ධ්‍යානසංඥා මැ සංඥා ය යි පරිකල්ප්‍ය "මරණින් ඌර්ධ්වයෙහි ආත්ම රූපී දූ වෙයි, සංඥී දූ වෙ" යි දෘෂ්ටිගතික එකෙකැ; ආරූප්‍යධ්‍යාන ලාභී වැ අරූපසමාපත්තියට ආලම්බන ආත්මත්වයෙන් පරිග්‍රහ කොට "ආත්ම සංඥී දූ වෙයි, අරූපී දූ වෙ" යි දෘෂ්ට්‍යභිනි විෂ්ට එකෙකැ; රූපාරූපසමාපත්තිලාභී වැ තදුභයපරාමර්ශ වශයෙන් "ආත්ම සංඥී දූ වෙයි, රූප්‍යරූපීදූ වෙ" යි විපර්‍යස්ත දෘෂ්ටික එකෙකැ; රූප්‍යරූපිස්වභාවද්වය රහිත වැ "එකාන්ත සංඥී වෙයි ආත්ම" යයි විප්‍රතිපන්න ශුෂ්කතාර්කික එකෙකැ;

"අන්තවා අත්තා හොති අරොගො පරම්මරණා සඤ්ඤිතිපි නං පඤ්ඤාපෙන්ති, අනන්තවා අත්තා හොති - පෙ - අන්තවා ච අනන්තවා ච අත්තා හොති - පෙ - නෙවන්තවා නානන්තවා අත්තා හොති අරොගො පරම්මරණා, සඤ්ඤිතිපි නං පඤ්ඤාපෙන්ති" යනාදි ක්‍රමයෙන් දර්ශිත අන්තානන්තික සංඥිවාද චතුෂ්කය යි මෙසෙ සංඥාගතවිභාග රහිත සංඥිවාද අෂ්ටවිධ වෙ.

ධ්‍යානසමාපත්තිසමාපන්න අවස්ථා වශයෙන් "ආත්ම ඒකත්ව සංඥි ය" යි පරාවෘත්තදෘෂ්ටික ඒකෙකැ, අසමාපන්න අවස්ථා ගෙනැ "නානාත්ව සංඥි යැ ආත්ම ය" යි දෘෂ්ටිගතික ඒකෙකැ, අවර්ද්ධිතා ලම්බනයෙහි ප්‍රතිලබ්ධධ්‍යාන වශයෙන් ආත්ම පරිත්ත සංඥි ය" යි කුදෘෂ්ටිපතික ඒකෙකැ, වර්ද්ධිතාලම්බන විෂයධ්‍යාන ප්‍රතිලම්බනයෙන් "ආත්ම අප්‍රමාණ සංඥි ය" යි දෘෂ්ටි පතිත ඒකෙකැ, ත්‍රිකචතුෂ්ක ධ්‍යාන භූමියැ සත්වනිර්වෘත්තිසන්දර්ශනයෙන් "ආත්ම ඒකාන්ත සුඛිත ය" යි ප්‍රවෘත්ත ඒකියවාද යැ, බහුදුඃඛාලය නිරයාන්තඃපාති සත්ව සන්දර්ශනයෙන් "ආත්ම ඒකාන්තදුඃඛිතය" යි ප්‍රතිපන්න වාද ද, මනුෂ්‍යාත්මභාව නිර්වෘත්තිදර්ශනයෙන් "සුඛීදුක්ඛී අත්තා හොති අරොගො පරම්මරණා" යි ප්‍රවෘත්ත ව්‍යතිමිශ්‍රවාදද, වෘහත්ඵලාදි බ්‍රහ්ම ලොකයෙහි සත්වනිර්වෘත්ති දර්ශනයෙන් "අදුක්ඛා සුඛසමඞ්ගි යැ ආත්මය" යි ප්‍රවෘත්තවාද ය යි මෙසෙ සංඥා නානාත්ව වෙදනා නානාත්ව වශයෙන් අෂ්ටප්‍රකාරවාද හා පූර්වොක්ත සංඥිවාදෘෂ්ටකය මිශ්‍ර කළ කලැ සංඥිවාද හැම ෂොඩශවිධ වෙ.

"රූපී අත්තා හොති අරොගො පරම්මරණා අසඤ්ඤිතිපි නං පඤ්ඤාපෙන්ති" යනාදි ක්‍රමයෙන් දර්ශිත අෂ්ටප්‍රකාර අසංඥි වාද ද, සංඥිවාදයෙහි ආදිචතුෂ්කද්වයානුසාරයෙන් සංඥි වාදස්ථානයෙහි අසංඥිපදමාත්‍රප්‍රක්ෂෙපලක්ෂණ විශෙෂ විනා බොද්ධුංශක්‍ය වී නො යි පෘථගවිභක්ත යි.

නෛවසංඥිනාසංඥිවාද ප්‍රපඤ්ච විභාගයෙහි "රූපී අත්තා හොති අරොගො පරම්මරණා නෙවසඤ්ඤිනාසඤ්ඤිතිපි නං පඤ්ඤාපෙන්ති" යනාදි ප්‍රකාරයෙන් ප්‍රවෘත්ත අෂ්ටප්‍රකාර වාද ප්‍රපඤ්චය නෛවසංඥිනාසඥි පදමාත්‍රප්‍රක්ෂෙප විනා පූර්වොක්ත සංඥිවාදෂ්ටකය හා නිර්විශෙෂ යි.

උච්ඡෙදවාදගත ප්‍රභෙදචින්තායෙහි, "මනුෂ්‍යාත්මභාවයෙන් ආත්ම උච්ඡින්නවෙ" යි විපර්යස්තමතික එකෙකැ, තද්වාදප්‍රතිෂෙධ කොට දිව්‍යභාවප්‍රාප්ත වැ කාමාවචර වැ කබලීකාරාහාරභක්ෂ වැ "දිව්‍යාත්මභාවයෙන් ආත්ම උච්ඡින්න වෙ" යි අභිනිවිෂ්ට එකෙකැ, තත්ප්‍රතික්ෂෙප කොට රූපීභවප්‍රාප්ත[1] වැ මනොමය වැ සර්වාඞ්ග ප්‍රත්‍යඞ්ගසම්පන්න වැ අභිනෙන්ද්‍රිය වැ "රූපභවයෙන් ආත්ම උච්ඡින්න වෙ" යි විප්‍රතිපන්න එකෙකැ, එතද්වාද නිරාකරණකොට "චතුර්විධ ආරූප්‍ය භවයෙන් ආත්මොච්ඡෙදවාද" ප්‍රත්‍යෙකපරිග්‍රහ වශයෙන් චතුර්විධය යි මෙසෙ උච්ඡෙදවාද සප්තප්‍රකාර වෙ.

දෘෂ්ටධර්මනිර්වාණවාද ප්‍රභෙදවිමර්ශයෙහි, පරිපූර්ණ පඤ්ච කාමගුණ පරිභොගමාත්‍රයෙන් දෘෂ්ටධර්මනිර්වාණවාදී" එකෙකැ, "ප්‍රථමධ්‍යාන සුඛප්‍රතිලබ්ධයෙන්[2] පරමදෘෂ්ටධර්මනිර්වාණවාදී" එකෙකැ, එසෙ මැ "ද්විතීයාදිධ්‍යානව්‍යාප්ති මාත්‍රයෙන් නිර්වාණ සාක්ෂාත් කරණාභිධායි" කුදෘෂ්ටිකත්‍රිකයයි මෙසෙ දෘෂ්ටධර්ම නිර්වාණවාද පඤ්චප්‍රකාර වෙ.

මෙහි ශාශ්වතවාද, ඒකත්‍යශාශ්වතවාද, අන්තානන්තික, අමරාවික්ෂෙපික, අධිත්‍යසමුත්පන්නික, වාදනාමයෙන් ආයාත අෂ්ටාදශ දර්ශනය පූර්වභවාශ්‍රය කොට ප්‍රවෘත්ත වන බැවින් "පූර්වාන්තකල්පික දෘෂ්ටි" නම් වේ. සංඥී, අසංඥී, නෛව සංඥී නාසංඥී, උච්ඡෙද, දෘෂ්ටධර්ම නිර්වාණ, වාද නාමයෙන් දර්ශිත චතුශ්චත්වාරිංශද්දර්ශනය ආගාමිභවාපෙක්ෂායෙන් ප්‍රවෘත්ත විපරීතාභිනිවෙශරූප වන බැවින් "අපරාන්තකල්පික දෘෂ්ටි" නම් වේ.

---

[1] රූපභවප්‍රාප්ත CDEF [2] ප්‍රතිලබ්ධියෙන් G

මෙසෙ අන්තද්වයාන්තඃපාති දෘෂ්ටිප්‍රපඤ්ච සංකල්පනා වශයෙන් පරිග්‍රහයෙහි දෘෂ්ටිස්වරූප ද්වාෂෂ්ටිවිධ වෙ. මෙහි පස්පනසෙක් ශාශ්වතපක්ෂනිඃක්ෂිප්ත යැ, සතෙක් උච්ඡෙදපක්ෂ නිඃක්ෂිප්තයි.

මෙ යැ "ද්වාෂෂ්ටිදෘෂ්ටි" නම්.

---

(183). <u>උප්පබ්බාජෙත්වා</u> යන තන්හි ඔවුන් ගිහි කැර වූ පරිදි කිසෙ යැ යත්? යම්කලෙක්හි සොරහු බලවත් වූහු නම් රජහු දුර්ලභ වෙති; එකල්හි රජහට ද බ්‍රාහ්මණ ගෘහපතිකයනට ද සුව නො වෙයි. එසෙයින් මැ යම් කලෙක්හි පාප භික්ෂූහු බලවත් වූහු නම් පෙශල භික්ෂූහු දුර්ලභ වෙති; එකල්හි බොහො දිව්‍ය මනුෂ්‍යයනට අවාසු වෙ.

එයින් වදාළහ:-

520. "යස්මිං භික්ඛවෙ සමයෙ චොරා බලවන්තො[1] හොන්ති, රාජානො තස්මිං සමයෙ දුබ්බලා හොන්ති" යනාදීන්.

යම්කලෙක්හි රජහු බලවත් වූහු නම් සොරහු දුර්ලභ වෙති; එකල්හි රජහට ද බ්‍රාහ්මණ ගෘහපතිකයනට ද වාසු වෙයි. එසෙයින් මැ යම් කලෙක්හි පෙශලභික්ෂූහු බලවත් වූහු නම් පාප භික්ෂූහු දුර්ලභ වෙති, එකල්හි බොහො දිව්‍යමනුෂ්‍යයනට සුව වෙ.

එයින් වදාළහ:-

521. "යස්මිං භික්ඛවෙ සමයෙ රාජානො බලවන්තො හොන්ති චොරො තස්මිං සමයෙ දුබ්බලා හොන්ති" යනාදීන්.

---

[1] බාලවන්තා

මෙසෙ එකල්හි පෙගලභික්ෂූන් බලවත් වන බැවින් පාප භික්ෂූන් ගිහි කැරවූහු.

තතියසඞ්ගිති කථා

---

ලඞ්කාවතරණකථා

(184). මජ්ඣන්ති කත්ථෙරං යන තන්හි රූක්ෂවීවරධර මහ තෙරුන් කීහු.

කිසෙ යැ යත්?

ඔහු ධම්සො රජහුගෙ වෙහෙර මහන් දවස්[1] එසමාගමයෙහි අසූකෙළක් සඟනට සඟ[2]තෙරහ. ඔවුන්ගෙ සිවුරු රූක්ෂතම සෙ දැකැ රකවලැ සිටි පුරුෂයො නො හැඳින නො වැද්ද දුන්හු. මහතෙරහු "මා වැනි මහාක්ෂීණ - ශ්‍රවයක්හු යජහට සඞ්ග්‍රහ නො කරත් අනෙක් කෙනම් කරනුවහ" යි පොළො කිම්ද ගොස් රජු පළමු දෙන පිඩු පිළිගත්හු.

---

(185). සොතාපත්තිඵලං පාපෙත්වා යන තන්හි ඔවුන් බුදුහු මැ සෝවාන් කළා වෙත්.

කිසෙ යැ යත්?

යම්සෙ රජු විසින් ප්‍රත්‍යන්තජනපදයට ප්‍රෙරිත ලෙඛය එහි මනුෂ්‍යයො කියවන සෙ නො දන්නාහු යමෙක් කියවන සෙ දනී ද ඔහු ලවා කියවා එ අර්ථය අසා "රජුගෙ ආඥාය" යි

---

[1] වෙහෙරමහදවස්BEF [1] මහදන්දවස්D [2] හඟBCDEF

ආදරයෙන් කීතාක් දෑ කෙරෙති. ලෙඛවාචක වූ කලෑ "කියවන සෙ යහපතැ" යි යන ප්‍රශංසාමාත්‍ර මැ ලැබෙයි. එසෙයින් මැ ශාරිපුත්‍ර ප්‍රභෘති ධර්මකථිකයෝ කිසි සෙ දා ධර්මදෙශනා කෙරෙත් නම් ලිපත් කියවනුවන් වැනි වෙති. ධර්මදෙශනා වූ කලෑ බුදුන් ගැත්තෙ යැ රජුගෙ ආඥා සෙයින්. යම් කෙනෙක් එ අයා අභිසමය ප්‍රාප්ත වෙද් දා ඔවුන් බුදුහු මැ උද්ධරණ කළා වෙති. ධර්මකථිකයෝ වූ කලෑ "කියන සෙ යහපතැ" යන ප්‍රශංසාමාත්‍ර මැ ලැබෙත්.

---

(188). සත්තතිසහස්සමනුස්සා පබ්බාජෙත්වා යන තන්හි පැවිදි වූ සැත්තෑදහස්හු අධුනාගතවධූසමාන චෙතසින් වුසූහු. කිසෙ යැ යත්?

වදාළෙ මැ නොඃ-

522. "සෙය්‍යථාපි භික්ඛවෙ වධූකා යඤ්ඤදෙව රත්තිං වා දිවසං වා ආනීතා හොති, තාවදෙවස්ස තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති සස්සුයාපි සසුරෙපි සාමිකෙපි අන්තමසො දාසකම්මකර පොරිසෙසු; සා අපරෙන සමයෙන සංවාසමන්වාය විස්සාසමන්වාය සස්සුම්පි සසුරම්පි සාමිකම්පි එවමාහ, අපෙථ කිං පන තුම්හෙ ජානාථාති. එවමෙව ඛො භික්ඛවෙ ඉධෙකච්චො භික්ඛු යඤ්ඤදෙව රත්තිං වා දිවසං වා අගාරස්මා අනගාරියං පබ්බජිතා හොති, තාවදෙවස්ස තිබ්බං හිරොත්තප්පං පච්චුපට්ඨිතං හොති භික්ඛුසු භික්ඛුනීසු උපාසකෙසු උපාසිකාසු අන්තමසො ආරාමික සමණුද්දෙසෙසු; සො අපරෙන සමයෙන සංවාසමන්වාය ආචරියම්පි උපජ්ඣායම්පි එවමාහ, අපෙථ කිං පන තුම්හෙ ජානාථාති; තස්මාතිහ භික්ඛවෙ එවං සික්ඛිතබ්බං අධුනාගතවධූකාසමෙන චෙතසා විහරිස්සාමාති. එවං හි වො භික්ඛවෙ සික්ඛිතබ්බං" යි.

ලඛ්ඛාවතරණකථා.

නගරපවෙසනකථා

(187). තෙවිජ්ජා යන තන්හි "ත්‍රිවිද්‍යා" නම් කවරේ යත්?

වදාළේ මෙසේ:-

523. "ඉධ භික්ඛවෙ භික්ඛු අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. සෙය්‍යථිදං? එකම්පි ජාතිං දෙපි ජාතියෝ තිස්සොපි ජාතියෝ චතස්සොපි ජාතියෝ පඤ්චපි ජාතියෝ දසපි ජාතියෝ වීසම්පි ජාතියෝ තිංසම්පි ජාතියෝ චත්තාරීසම්පි ජාතියෝ පඤ්ඤාසම්පි ජාතියෝ ජාතිසතම්පි ජාතිසහස්සම්පි ජාතිසතසහස්සම්පි අනෙකෙපි සංවට්ටකප්පෙ අනෙකෙපි විවට්ටකප්පෙ අනෙකෙපි සංවට්ටවිවට්ටකප්පෙ අමුත්‍රාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛ පටිසංවෙදී එවමායුපරියන්තෝ. සෝ තතෝ චුතෝ අමුත්‍ර උපපාදිං, තත්‍රාපාසිං එවං නාමෝ එවං ගොත්තෝ එවං වණ්ණෝ එවමාහාරෝ එවං සුඛදුක්ඛ පටිසංවෙදී එවමායු පරියන්තෝ. සෝ තතෝ චුතෝ ඉධූපපන්නොති. ඉති සාකාරං සඋද්දෙසං අනෙකවිහිතං පුබ්බෙනිවාසං අනුස්සරති. අයමස්ස පඨමා විජ්ජා අධිගතා හොති අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා තමෝ විහතෝ ආලොකෝ උප්පන්නෝ යථා තං අප්පමත්තස්ස ආතාපිනෝ පහිතත්තස්ස විහරතෝ. පුන ච පරං භික්ඛවෙ භික්ඛු දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්තමානුසකෙන සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති ඉමෙ වත භොන්තෝ සත්තා කායදුච්චරිතෙනසමන්නාගතා වචී දුච්චරිතෙන සමන්නාගතා මනොදුච්චරිතෙනසමන්නාගතා අරියානං උපවාදකා මිච්ඡාදිට්ඨිකා මිච්ඡාදිට්ඨිකම්මසමාදානා, තෙ කායස්ස

හෙදා පරම්මරණා අපායං දුග්ගතිං විනිපාතං නිරයං උපපන්නා;
ඉමෙ වා පන හොන්ති සත්තා කායසුවරිතෙන සමන්නාගතා
වචීසුවරිතෙන සමන්නාගතා මනොසුවරිතෙන සමන්නාගතා
අරියානං අනුපවාදකා සම්මාදිට්ඨිකා සම්මාදිට්ඨිකම්ම සමාදානා,
තෙ කායස්ස හෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උප
පන්නාති. ඉති දිබ්බෙන චක්ඛුනා විසුද්ධෙන අතික්කන්ත මානුසකෙන
සත්තෙ පස්සති චවමානෙ උපපජ්ජමානෙ හීනෙ පණීතෙ සුවණ්ණෙ
දුබ්බණ්ණෙ සුගතෙ දුග්ගතෙ යථාකම්මූපගෙ සත්තෙ පජානාති.
අයමස්ස දුතියා විජ්ජා අධිගතා හොති අවිජ්ජා විහතා විජ්ජා
උප්පන්නා තමො විහතො ආලොකො උප්පන්නො යථා තං
අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස විහරතො. පුන ච පරං
භික්ඛවෙ භික්ඛු ආසවානං ඛයා අනාසවං චෙතොවිමුත්තිං
පඤ්ඤාවිමුත්තිං දිට්ඨෙ ව ධම්මෙ සයං අභිඤ්ඤා සච්ඡිකත්වා උප
සම්පජ්ජ විහරති. අයමස්ස තතියා විජ්ජා අධිගතා හොති
අවිජ්ජා විහතා විජ්ජා උප්පන්නා තමො විහතො ආලොකො
උප්පන්නො යථා තං අප්පමත්තස්ස ආතාපිනො පහිතත්තස්ස
විහරතො" යි.

මෙ සැ "ත්‍රිවිද්‍යා" නම්.

---

(1පළ). සුපඤ්ඤත්තෙ උත්තමාසනෙ යන තන්හි සුප්‍රඥප්ත ආසන නම් උසසුන් මහසුන් හැර පැන්වූ අස්හි.

එහි "උසසුන්" නම් වඩුරියනිහ් දික්පා ඇති හැඳි. "මහසුන්" නම් වළග්රෑ ගැන්වූ පා ඇති පර්‍යඞ්ක යැ, සතරතුලෙන් දික් ලොම් ඇති කොදු දැ එවලොමින් සිත්තම් කොට වී අස්නැ, එවලොම්වූවා සුදුපුප් අතුරු යැ, රත්පුප් අතුරු යැ, පුලුන්ඔත්

තිල්ලැ සිහරු වගරු නහා වී එවලොම්මුවා අතුරු යැ, එව ලොම්මුවා එක්පිටලොම් ඇති අතුරු යැ, දෙපිටඩලාම් ඇති අතුරුයැ, රන්කොසුම් කළ තිහිරිමුවා පසතරණ යැ, රන් හා මුසු කොට කැටි තිහිරිහුයින් වී පසතරණ යැ, මාගමුන් සොළොස් දෙනකු සිට නටන්නට තිසි එවලොම්මුවා අවන්මහ අතුරු යැ, ඇත්පිට අස්පිට රථයෙහි අතුරන අතුරු යැ, අඳුන්දිවිසමින් කළ අතුරු යැ, කේල්මුවසමින් කළ අතුරු ය, හිස්දෙර පාමුල රත්කන් වසින් ඇති උඩ රත්වියන් බඳ අස්නි.

වදුලෙ මැ නො:-

524. "ආසන්දිං පල්ලඞ්කං ගොනකං චිත්තකං පටිකං පටලිකං තූලිකංවිකතිකං උද්ධලෝමීං එකන්තලෝමීං කට්ඨිස්සං කොසෙය්‍යං කුත්තකං හත්ථත්ථරං අස්සත්ථරං රථත්ථරං අජිනපාවෙණීං කාදලිමිගපවරපච්චත්ථරණං සඋත්තරච්ඡදං උභතො ලොහිතකූපධානං" යි.

---

(189). දීපසිඛා විය හායමානා යන තන්හි ඇය ප්‍රදීපශිඛාවක් සෙයින් දිලිහෙන්නට හෙතු කවර යත්?

යම්සෙ අවතුර චිත්‍රකාරයා විසින් සමුත්ථාපිත රූප විරූප වෙ ද, එසෙයින් මැ ඇතම්කෙනෙක් පින්කම් කරන්නාහු ඥාන විප්‍රයුක්ත සිතින් කෙරෙති. එ කම්මතෙමෙහෙ රූපයා උප යන්තෙ චක්ඛුරාදින්ගෙ සම්පත් නො දී දුර්වර්ණ කෙරෙයි, දුස්සංස්ථාන කෙරෙයි. මවුපියනට ද පවා අප්‍රිය රූප සමුත්ථාපන කෙරෙයි. යම්සෙ චතුර චිත්‍රකාරයා විසින් සමුත්ථාපිත රූප සුරූප වෙ ද, එසෙයින් මැ ඇතම් කෙනෙක් පින්කම්

කරන්නාහු ඥාන සම්ප්‍රයුක්ත සිතින් කෙරෙති. ච කම්මතෙමෙහෙ රූපයා උපයන්නෙ චක්ඛුරාදින්ගෙ සම්පත්ති සුන්දර වූ වනී සංඝාත ඇති කොට රූපයා උපයයි. මෙ හෙතුවෙන් හෝ ප්‍රදීපශිඛාවක් සෙයින් දිලියෙනු වූ.

---

(190). ජනසහස්සං සොතාපත්තිඵලෙ පතිට්ඨාපෙසි යනු "මහ පොළොවැ පස්සෙයින් පැහූ දුක් ඇති සෝවාන්පලෙහි පිහිටුවූහ" යි සෙ යි.

කිසෙ යැ යත්?

එක්සමයෙක්හි බුදුහු නියඇඟින්[1] පස්බුදක් නහා ගෙන සිට "මහණෙනි මෙ මා නියඅඟැ තුබූ පස්බුදු බොහෝ දැ? මහපොළොවැ පස් බොහෝදැ" යි වදළොා. එකල්හි සහහු "වහන්සෙ නියඅඟැ තුබූ පස්බුදු මහපොළොවැ පස් පිණිස සියක් වන කලාවට ඳ නොයෙයි; දහසක් වන කලාවට ද නොයෙයි; සුවහසක් වන කලාවට ද නොයෙයි" කිහු. එසෙයින් මැ මහණෙනි ශ්‍රොතඅාපන්නයා පුවහාපී දුක් මහ පොළොවැ පස් වැන්න. තුබූ දුක් මෙ මා නිය අඟැ තුබූ පස්බුදු වැන්නැ" යි වදරා උත්තරයෙහි "එවං මහිද්ධියෙ ඛොභික්ඛවෙ ධම්මාභි සමයො, එවං මහිද්ධියෙ ධම්මචක්ඛුපටිලාභො" යි සිංහනාද කොළොා.

නගරප්පවෙසනකථා.

---

[1] අඟින්AEF

## මහාවිහාරපටිග්ගහණකථා

(191). <u>රතනමාලිකචෙතියො නාම අසදිසො මහාථූපො භවිස්සති</u> යන තන්හි ඒ දඹබ අසදෘශ වන පරිදි කිසෙ යැ යත්?

ඉදුනිල්මිණිබිමිහි පිහිටුවූ[1] අටළොස්හත් රිදිකඳින් හා රන්රිදිපබළුවෙරළුමිණිසාමඩලෙන් වොරජනා මහාබොරුක් ඇතියෙ යැ, හාත්පස ළඳන මිණිකිකිණිදැලින් හා සතරකන වලෙන නවසුවහස් අගනා මුතුකලබින් හා රුවන්මුවා මල්දම් පියුම්දම් හිරසඳතරුදඳපෙළින් සැදුමිලද සෙල්විසන් ඇතියෙයැ. රුවන් බඳ වෙදිකායෙන් හා මහමුතුපතරින් හා රන්රිදිමිණි කලසයෙන් හා පිටිවරතලද මහබොරුක්මුල්හි වටා සොළොස් දිශායෙහි කෙළඟනා[2] සොළොස් රුවන්පලග ඇතියෙ යැ, පලග මතුයෙහි මාරබල විධ්වංසන කොට දෙවිබඹපුද ලැබෙමින් හුන් බුදුන් බඳු රුවන්මුවා සොළොස් බුදුපිළිම ඇතියෙ යැ, මෙ සොළොස්දෙනා වැඩහුන් දිශා ද් අභිමුඛදෙස ද් මල්පිය වසායෙන් පිටත සිට සොළොස්දෙනා වඳනට සතර මහ දිශායෙහි ද් සතරකන ද් අට අනුදිශායෙහි ද් එබූ සොළොස් පාදපීඨිකායෙන් දතයුත්තෙ යැ, විසිතුරු සතුරුවඳින් සැදූ කෙළඟනා රිදියහන්[3] ඇතියෙ යැ, හාත්පස්හි මහබොමඩ පටන්ගෙන මහපිරිනිවන් දක්වා රුවන්මුවා කොට දක්වනලද බුදුවරිත ඇතියෙ යැ.

ඉක්බිති විවරණපත්ලෙහි[4] පටන්ගෙන මහබොමඩ දක්වා රුවන්මුවා කොට දක්වනලද බොධිසත්වවරිත ඇතියෙ යැ, නොයෙක් පඬුරුයැ නන්විසිතුරු පුදගෙන සිටි රුවන්මුවා

---

[1] පිහිටි BD
[2] කෙළග්නා B
[3] රිදිපියවසායෙන් C
[4] වියරණපත්තෙහි AB

දෙවිබඹපිරිස් ඇතියෙ යැ, වටා කඩු ගෙන බමන සන්ධියුත් රුවන්මුවා දෙවිපුතුන් ඇතියෙ යැ, සතරදිශායෙහි පිළිමිණි ඇගැ මුදුනෙහි දිලියෙන සතරමහමිණි ඇතියෙ යැ, සතරකන රස් විහිදුනා සත්රුවන්රැස් ඇතියෙ යැ, වටා නන්රුවනින් ගැවැසි ගත් විසිතුරු සැදි මහසනු ඇතියෙ යැ.

දුගැබිසැදමට බදුවදකුසුම්දල පරයන මෙවඩුපහණ බිතහි පැහැසු විදුලිය වන් දෙවිකුමරියන් ඇතියෙ යැ, නො වියළෙන ගඳකලල් ඇතියෙ යැ, නො මලන මල් ඇතියෙ යැ, නො නිවෙන පහන් ඇතියෙ යැ.

එහි දුටුගැමුණු මහරජහු ධාතුනිධාන කරන දවස් දකරඩුව මැ එරජහු මුදුනෙන් අහස සත්තලක් පමණ තැනට නැංග. එයින් නික්ම එ දු බුදුවිලස්නෙන් අහස්හි සිට යමාමහ පෙළහර දක්වා සවනක් රස් විහිද සියල්ලො එකලු කොට අනෙකෙළසුවහස් දෙවිමිනිසුන් මඟපල පමුණුවා බුදුවෙස් හැර දකරඩුව පිවිස අහසින් බැස රජමුදුනෙහි පිහිටි ය. රජ දකරඩුව ගෙන තුන්යලක් පැදකුණු කොට සදු තුබූ රිදියහනට එළඹැ රුවන් පලග මත්තෙ වඩා තබා පියන් උගුළුවා සිට "ඉදින් මෙ ධාතුහු පස්වාදහසක් මරසුවහසුනු දු විසින් නො පහකරන ලදුව සත්නට මනමිණි සෙ සවර්ශාපවර්ශ සාධමින් සිටිත් නම් මෙ යහන්හි මහපිරිනිවන්හි මෙන් වැඩ හොවිත්ව" යි සිතී ය. ධාතුහු බුදුවෙස් ගෙන නුගපල වැනි සුගත්මහපවුල් හැඳ පෙරවැ විදුලිය වැනි කහබහන්[1] බැඳ දෙතිස් වර ලකුණෙන් සැදී අසූඅනුව්‍යඤ්ජනයෙන් වොරජමින් සවනක් රසින් දිලියෙමින් කෙළ'ගනා[2] රිදී යහන්හි උතුරුදෙස්හි හිස්වඩා තබා දකුණුදෙසෙහි පා වඩා තබා දක්ෂිණපාර්ශවයෙන් වැඩ හොත්හු.

---

[1] කාබාන්BEF [1] කහබාන්CD [2] කෙළග්නාBC

මෙසෙ පන්සාලිස් හවුරුදු සිට අර්ථක්‍රියා කොට සතප්නට වැඩහොත් බුදුන් බඳු ධාතුශරීරයෙන් පවිත්‍ර වන බැවින් එ දැගබි අසදෘශ විය. ධාතුගර්භය රත්නමාලාලඩ්කෘත වන බැවින් රුවන්මැලි නම් වී.

---

(192). ඵුතිමඞ්ගලගීතෙනි යන තන්හි ස්තුතීන් යුත් මඞ්ගල ගීත නම් රත්නත්‍රයට ද රජහට ද ස්තුති විසින් ප්‍රවෘත්ත ගීත යැ; දැන් වැටෙන මඞ්ගලගීත නො වෙ. මෙ කවරකලැ වූයෙ යැ යත්?

රුවන්මැලිමහසෑයෙහි ද නිදුන් කරන දවස් සොණුත්තර හෙරණපාණො පොළොවැ කිම්ද නාවිමින් වැද ධාතු හැරගෙන අවුදු පුදපිරිවෙනින් නැඟි "කිමැ?" යි පුළුවුත් සඟනට "ද යි මා ළෙ" යි කීහ. එහි "මාළෙ" යනු "මා අළියෙ යැ" යූ සෙ යි. එක්බිති දෙවිමිනිස්හු ගෙන නැඟි දකරඬුව දැක "ද නැ ඟෙ" යි තුෂ්ටරවයෙන් ගුගුළහ. අකනිටාබඹලොව දක්වා එකනින්නාද විය. එක්බිති නාගයො අවුදු නාගලු[1] ළිඳින් නැඟි "ඉන් සෙ ඉන් සෙ" යි ගුගුළහ. ගෙ "ඉන් ශෙෂයක් දෙන්නෙ යැ" යූ සෙ යි. එක්බිති හෙරණපාණො රැස්වූ දෙවිමිනිස්නට "ද පුද යි මාළෙ" යි කීහ. ගෙ "ද පුදව මා අළියෙ යැ" යූ සෙයි.

එතැන් පටන්ගෙන "ද යි මාළෙ" යන පළමු උද්ගත වචනය පුරුෂයනට මඞ්ගල වචන විය. "ද නැ ඟෙ" යන දෙවනු වැ උද්ගත වචනය ස්ත්‍රීනට මඞ්ගල වචන විය. "ඉන් සෙ ඉන් සෙ" යන තුන්වනු වැ උද්ගත වචනය ස්ත්‍රීපුරුෂදෙදෙනා හට මඞ්ගල වචන විය. "ද පුද යි[2] මාළෙ" යන වචනය ධාතු රූපයන් වටා නඟා වඳවන මඟුල්දරුවනට මඞ්ගල වචන වී.

---

[1] නාහලු D [2] ද පුදවු ABD

(193) <u>යාව</u> <u>සාසනන්තරධානා</u> යන තන්හි <u>ශාසනාන්තර්ධාන</u> නම් කවර යත්? අධිගම අන්තර්ධාන යැ, ප්‍රතිපත්ති අන්තර්ධාන යැ, පර්‍යාප්ති අන්තර්ධානයැ, ලිඞ්ග අන්තර්ධාන යැ, ධාතු අන්තර්ධාන යැ, යන මෙපසැ ආදි තුන් අන්තර්ධාන යි.

මෙහි අධිගම නම් සතරමාර්ග යැ, සතරඵල යැ, සතර ප්‍රතිසංවිත් යැ, ෂඩ්භිඥා යැ, ත්‍රිවිද්‍යා යි හෙ පිරිහෙනුයෙ ප්‍රතිසංවිත පටන්ගෙන පිරිහෙයි. බුදුන් පිරිනිවනින් වා දහසෙකමැ ප්‍රතිසංවිත් නිපයන්නට සමර්ථ වෙති. එයින් උත්තරයෙහි ෂඩ්භිඥා නිපයති. එයින් උත්තරයෙහි ත්‍රිවිද්‍යා නිපයති. කල්යත් යත් එයිත් නිපයන්නට අසමර්ථවූවාහු ශුෂ්කවිදර්ශක වෙති. මෙසෙ අනුක්‍රමයෙන් අනගැමි වෙති, සෙදගැමි වෙති, සෝවාන් වෙති. මොවුන් ඇති කලැ අධිගම අන්තර්හිත නම් නො වෙ. පශ්චිම සෝවාන්හුගෙ ජීවිතක්ෂයෙන් අධිගමය අන්තර්හිත නම් වෙ.

මෙ අධිගම අන්තර්ධාන යැ.

ප්‍රතිපත්ති අන්තර්ධාන නම් ධ්‍යානවිදර්ශනාමාර්ගඵල නිපයන්නට අසමර්ථවූවාහු සිවුපිරිසුදු සිල් ම රක්ති. කල් යත් යත් "සිල් මැ පරිපූර්ණ කොට රක්මහ[1] වීර්‍යය ද කරමිහ, මාර්ගඵල පසක් කරන්නට අසමර්ථයමිහ, දැන් ආර්‍යධර්මම ප්‍රතිවෙධ නැති" වැර විහිදැ කොසීද්‍යබහුල වැ ඔවුනොවුනට චොදනා කාරණා නො කොට කොකෘත්‍ය නැති වැ වැ ටෙති. එතැන පටන් ගෙන කුදන්කුදු ශික්ෂාපද මර්දනය කෙරෙති. කල් යත් යත් ප්‍රායශ්චිත්තස්ථූලාත්‍යයට[2] අවජති. එක්බිති ගරුකාපත්ති අවජති. පාරාජිකා මැ රක්ෂා කොට සිටිති. සතරපරිජි මතු රක්නා භික්ෂූන් ඇතිකලැ ප්‍රතිපත්ති අන්තර්හිත නම් නො වෙයි. පශ්චිම භික්ෂුහුගෙ ශීලභෙදයෙන් හො ජීවිතක්ෂයෙන් හො අන්තර්හිත නම් වෙ.

---

[1] රකුමිහ D

[2] ප්‍රායශ්චිත්තස්ථූලාත්‍යයට B E

මෙ ප්‍රතිපත්ති අන්තර්ධාන යැ.

පර්‍යාප්ති නම් ත්‍රිපිටක බුද්ධවචනයෙහි පාඨ හා අර්ථ කථා යමිකෙනෙක් කලැ වැටෙ ද, එකෙනෙක් කල් පර්‍යාප්ති පරිපූර්‍ණ නම් වෙයි. කල් යත් යත් කලියුගයෙහි රජහු අධාර්මික වෙති. ඔවුන් අධාර්මික වූ කලැ රාජාමාත්‍යාදීහු අධාර්මික වෙති. ඔවුන් බලා රටවැස්සො ද ජනවිවැස්සො ද අධාර්මික වෙති. ඔවුන්ගෙ අධාර්මිකතායෙන් දෙව සම්‍යග්වර්‍ෂණ නො කෙරෙයි. සම්‍යග්වර්‍ෂණ නො කරන්නා හා ශස්‍යයෝ සම්පන්න නො වෙති. ශස්‍යයන් අසම්පන්න වන්නා හා ප්‍රත්‍යයදායකයෝ භික්ෂූ සඞ්ඝයා හට ප්‍රත්‍යය දෙනයට අසමර්‍ථ වෙති. භික්ෂූහු ප්‍රත්‍යයෙන් කෘෂ්ණ වූවාහු පර්‍යාප්ති ධරන්නට අසමර්‍ථ වෙති. කල් යත් යත් පර්‍යාප්ති පිරිහෙයි; අර්‍ථවිසින් ධරන්නට අසමර්‍ථ වූවාහු පාඨවිසින් මැ ධරති. කල් යත් යත් සියලු පාඨයන් ධරන්නට අසමර්‍ථ වෙති. පළමු අභිධර්‍මපිටකය මෙකෙනෙක් පටන්ගෙන පිරිහෙයි. පිරිහෙන්නෙ ප්‍රස්ථානප්‍රකරණයෙහි පටන්ගෙන යාවත් ධර්‍මසඞ්ග්‍රහ ප්‍රකරණ දක්වා අනුක්‍රමයෙන් සප්තප්‍රකරණ පිරිහෙයි. මෙසෙ අභිධර්‍මපිටකය පිරිහුණු කලැ මෙකෙනෙක් පටන්ගෙන සූත්‍රපිටකය පිරිහෙයි. හෙ පිරිහෙන්නෙ අඞ්ගුත්තරනිකායෙහි එකාදශ නිපාතයෙහි පටන්ගෙන එකකනිපාත දක්වා අනුක්‍රමයෙන් පිරිහෙයි. මෙසෙ අඞ්ගුත්තරනිකාය පිරිහුණු කලැ මෙකෙනෙක් පටන්ගෙන සංයුක්තනිකාය පිරිහෙයි. පිරිහෙන්නෙ චක්‍රපෙයාලයෙහි පටන්ගෙන යාවත් ඔඝතරණ දක්වා පිරිහෙයි. මෙසෙ සංයුක්තනිකාය පිරිහුණු කලැ මෙකෙනෙක් පටන්ගෙන මධ්‍යම නිකාය පිරිහෙයි. පිරිහෙන්නෙ ඉන්ද්‍රියභාවනායෙහි පටන් ගෙන යාවත් මූලපර්‍යාය දක්වා පිරිහෙයි. මෙසෙ මධ්‍යම

නිකාය පිරිහුණු කලැ මඤ්ඤකයෙහි පටන්ගෙන දීඝනිකාය පිරිහෙයි. පිරිහෙන්නෙ දඝොත්තරසූත්‍රයෙහි පටන්ගෙන යාවත් බ්‍රහ්මජාල දක්වා පිරිහෙයි. දීඝනිකාය පිරිහුණු කලැ සූත්‍රපිටකය පිරිහුණුට නම් වෙ.

මෙසෙ පිටකත්‍රය පිරිහුණු කලැ විනයපිටකය හා ජාතක මැ ලා ධරත්. එහි විනයපිටකය ලජ්ජිහු මැ ධරති, ලාභ කාමයො ජාතක මැ ධරත්. එවිහු තල් යත් යත් ජාතක ධරන්නට අසමර්ථ වෙති. එහි පළමු විශ්වන්තර ජාතකය පිරිහෙයි; එක්බිති ප්‍රතිලොම ක්‍රමයෙන් අපණ්ණකජාතකය දක්වා පිරිහෙයි. විනය පිටකය ද තල් යත් යත් මඤ්ඤකයෙහි පටන්ගෙන පිරිහෙයි. පිරිහෙන්නෙ පරිවාරයෙහි පටන්ගෙන භික්ෂු විභඞ්ග දක්වා අනු ක්‍රමයෙන් පිරිහී මාතෘකායෙහි සිටී. මාතෘකා පිරිහී නිදානොද්දෙශමාත්‍රයෙහි සිටී. නිදානොද්දෙශය පිරිහුණු කලැ විනය පිටකය අන්තර්හිත නම් වෙ.

යම්තාක් කල්හි ජරිහුන් මිනිසුන් කෙරෙහි චතුෂ්පදී ගාථායෙක් වැටෙ ද, එතාක්කල් පර්‍යාප්ති අන්තර්හිත නම් නො වෙ. යම් කලෙක සැදැහැති පහත් රජෙක් බණ ඇසියටි වැ ඇත්කඳ රන්සුමුගෙන දහස්පියලිඟැටක් තබවා "බුදුන් වදාළ සිවුපැදිගයක්[1] දන්නෙක් මෙ දහස ගනිව" යි නුවර බෙර පියටි කරවා ගන්නක්හු නො ලදින් "එක්වරෙක බෙර හැසිරවූ කලැ අසන්නො වෙත් ම යැ, නො අසන්නො වෙත් ම ය" යි තුන්වෙලෙ බෙර හසුරුවා ද, රාජපුරුෂයෝ තුන් යලක් නුවර බෙර පවත්වා ගන්නක්හු නො ලදින් දහස්පියලි ඟැට වටාලා රජකුලයට ම ඇරැ දෙත් ද, එකල්හි පර්‍යාප්ති අන්තර්හිත නම් වෙ.

මෙ පර්‍යාප්ති අන්තර්ධාන යැ.

---

[1] සිවුපදයක්

ලිඞ්ගාන්තර්ධාන නම්: කල් යත් යත් භික්ෂූන්ගෙ චීවර ග්‍රහණ පාත්‍රග්‍රහණ ආකුඤ්චන ප්‍රසාරණ ආලොකන විලොකන ප්‍රාසාදික නො වෙයි. නිගණ්ඨීන් ගත් අලාබු පාත්‍ර සෙයින් භික්ෂූහු පාත්‍රයන් අග්‍රබාහුයෙන් ගෙන ඇවිදුති. කල් යත් යත් අග්‍රබාහුයෙන් බහා අතින් හො සහල්ලෙන් හො එල්වා ගෙන ඇවිදිත්. සිවුරු ද් රජන්සරුප් නො කොට ඔට්ඨට්ඨි වණ්ණ කොට රදාගෙන ඇවිදිත්. කල් යත් යත් රජනු ද් නො වෙයි; දහ සිඳ ඔවැටි විඳ කැප කොට වැලඳගන්ති. කල් යත් යත් ඔවැටි විදුති. කැප නො කෙරෙත්. කල් යත් යත් දෙක මැ නො කොට දහ සිඳ පරිව්‍රාජකයන් සෙ ඇවිදිති. කල් යත් යත් කුඩා කහකඩක් අත හො කර හො කෙහෙසෙහි[1] හො බැඳ ගෙන දරභරණ කරන්නාහු සැහැ වපුට ජීවිකා කල්පනා කොට ඇවිදිත්. එකල්හි දක්ෂිණා දෙන ජනයො සඟුන් උදෙසා ඔවුනට මැ දෙත්. මෙ සඳහා ය බුදුන් වදාළෙ –

525. "භවිස්සන්ති ඛො පනානන්ද අනාගතමද්ධානං ගොත්‍රභූනො කාසාවකණ්ඨා දුස්සීලා පාපධම්මා, තෙසු දුස්සීලෙසු සඞ්ඝං උද්දිස්ස දානං දස්සන්ති, තදුපහං ආනන්ද සඞ්ඝගතං දක්ඛිණං අසඞ්ඛෙය්‍යං අප්පමෙය්‍යං වදාමි" යි.

එක්බිති කල් යත් යත් නානාවිධ කර්ම කරන්නාහු "මෙ ප්‍රපඤ්ච යැ, මෙයින් අපට කිමැ?" යි කහකඩ සිඳ වල දමා පියති. එකල්හි ලිඞ්ගය අන්තර්හිත නම් වෙ.

---

[1] කෙසෙයෙහි EF

යවනදෙශවාසීන්ගෙ නෙපථ්‍යය කසුප්සම්මා සම්බුදුන් සස්නෙහි කෙළවරහි මිනිසුන් කෙරෙන් ආයෙ සි.

මෙ ලිඛාභාතඛ්‍ඛාන යැ.

ධාතුඅන්තඛ්‍ඛාන නම්: ච එ තන්හි සත්කාරසම්මාන නො ලබන ධාතුහු බුදුන්ගෙ අධිෂ්ඨාන බලයෙන් සත්කාරසම්මාන ලබන තැනට වඩති. කල් යත් යත් හැමතන්හි සත්කාරසම්මාන නො වෙ. එකල්හි මෙලක්දිව ධාතුහු රස් ව රුවන්දගබට වඩති, රුවන්දගබින් නාදිව රාජායතනචෛත්‍යයට වඩති. එයින් මහ බොමඩට වඩති. නාලොවිනුදු දෙවිලොවිනුදු බඹලොවිනු දු ධාතුහු මහබොමඩට වඩති. සමීපයක් පමණ ධාතුයෙකු දු නො තැන නො නස්සි. සවීධාතුහු මහා බොධි පය්‍යඞ්කයෙහි රාශිගත වූවාහු බුදුවෙස් ගන දෙතිස්මහ පුරිස්ලකුණෙන් අසූඅනුව්‍යඤ්ජනයෙන් ව්‍යාමප්‍රභායෙන් පරිපූර්ණ වැ බොමඩ පලක් බැඳ වැඩහුන් බුදුන්ගෙ ශරීරගොභා දක්වා යමාමහපෙළහරයෙහි යෙයින් ප්‍රාතිහාය්‍ය කොට සවනක් රස් විහිද දසදහස් ලොධාගි පතුරුවති. එතනට යන මිනිස්හු නැති. දසදහසක් සක්වළ දෙවිබඹහු රස් වැ "අද බුදුහු පිරිනිවෙති. මෙ අපගෙ පශ්චිම දර්ශන යැ, මෙතන පටන් ගෙන මුළුලොව අන්ධකාර වෙ" යි බුදුන් පිරිනිවි දවසට වඩා මහත් කාරුණ්‍යයෙන් වහැත්ති. අනාගාමීන් හා ක්ෂීණාශ්‍රවයන් මිස අවශිෂ්ටයෝ සඞභාවයෙන් සිටිනට අසමර්ථයෝ සි.

ධාතුශරීරයෙන් තෙජොධාතු උද්ගත වැ යාවත් බ්‍රහ්ම ලොක දක්වා නැ ගෙයි. සම්පයක් පමණ ධාතුයෙකු දු ඇති කලැ එකාකාරයෙන් සිට දිලියෙයි. ධාතුන් හැම පර්‍යවසානයට ගිය කල්හි ජ්වාල උත්පන්න වෙයි. මෙසෙ මහත් ආනුභාව දක්වා ධාතුහු අන්තර්හිත වෙති. එකල්හි දෙවිබඹහු බුදුන් පිරිනිවි දවස් සෙයින් දිවගදමලින් තුර්‍යසොෂයෙන්[1] පුදා තුන්යලක් පැදකුණු කොට වැඳ "අනායෙහි[2] උපදනා බුදුන් දැක්මොව" යි කියා තමන් තමන්ගෙ වාසස්ථානයට යෙත්.

මෙ ධාතුඅන්තර්ධාන යැ.

මෙතෙකින් පඤ්ච අන්තර්ධාන කියනලදි.

---

(194). <u>සත්තවිත්‍යං</u> <u>කරොන්තො</u> <u>මහාමෙඝවනෙ</u> <u>විහාසි</u> යන තන්හි ධර්මදෙශකයන් දුර්ලභ වන බැවින් බැහැර නො ගොස් එහි මැ වූසූහ[3] යූ සෙ යි.

ධර්මදෙශකයන් දුර්ලභපරිදි කිසෙ යැ යත්?

වදාලෙ මැ නො:-

526. පඤ්චන්නං ලිච්ඡවි රතනානං පාතුභාවො දුල්ලභො ලොකස්මිං. කතමෙසං පඤ්චන්නං? තථාගතස්ස අරහතො සම්මාසම්බුද්ධස්ස පාතුභාවො දුල්ලභො ලොකස්මිං, තථාගතප්ප

---

[1] සොෂායෙන්CD [2] අනාගතයෙD [3] විසූහAD

වෙදිතස්ස ධම්ම විනයස්ස දෙසෙතා පුග්ගලෝ දුල්ලභෝ ලොකස්මිං, තථාගතප්ප වෙදිතස්ස ධම්මවිනයස්ස දෙසිතස්ස විඤ්ඤාතා පුග්ගලෝ දුල්ලභෝ ලොකස්මිං, තථාගතප්පවෙදිතස්ස ධම්මවිනයස්ස දෙසිතස්ස විඤ්ඤාත්වා ධම්මානුධම්මපටිපන්නො පුග්ගලෝ දුල්ලභෝ ලොකස්මිං, කතඤ්ඤූ කතවෙදී පුග්ගලෝ දුල්ලභෝ ලොකස්මිං. ඉමෙසං ඛො ලිච්ඡවි පඤ්චන්නං රතනානං පාතුභාවො දුල්ලභෝ ලොකස්මිං" යි.

මහාවිහාරපටිග්ගහණ කථා.

---

වෙතියගිරිවිහාරපටිග්ගහණ කථා.

(195). ථේරානං සන්තිකෙ පබ්බජිත්වා යනු ඔවුන් ඥාති සම්පදාදීන් ප්‍රයොජන නැති සෙ දැක පැවිදි වූ සෙ කියූහු.

එයින් ප්‍රයොජන නැතිපරිදි කිසෙ යැ යත්? සීල සම්පත්තීන් හා දෘෂ්ටිසම්පත්තීන් මැ මිස ඥාතිසම්පත්තීන් හො භොග සම්පත්තීන් හො ආරොග්‍යසම්පත්තීන් හො ස්වර්ගොත්පත්ති සිද්ධ නො වෙ.

වදාළෙ මැ නො:-

527. "පඤ්චිමා භික්ඛවෙ සම්පදා. කතමා පඤ්ච? ඤාතිසම්පදා, භොග සම්පදා, ආරොග්‍යසම්පදා, සීලසම්පදා,

දිට්ඨිසම්පදා, භික්ඛවෙ සත්තා ඤාණසම්පදා හෙතු වා හොග සම්පදා හෙතු වා ආරොග්‍යසම්පදා හෙතු වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති. සීලසම්පදා හෙතු වා භික්ඛවෙ සත්තා දිට්ඨිසම්පදා හෙතු වා කායස්ස භෙදා පරම්මරණා සුගතිං සග්ගං ලොකං උපපජ්ජන්ති" යි.

වෙතියගිරිවිහාරපටිග්ගහණකථා.

---

ධාත්වාගමන කථා.

(196). දසහාතිකසමාකුලං රාජකුලං යන තන්හි "කුල" නම් කවරේ ද? "උච්චාකුල යැ, මහාකුල යැ, උදරභොගකුල යැ, මහාභොගකුල යැ" යි චතුර්විධ වේ.

මෙහි "උච්චාකුල" නම් ක්ෂත්‍රියකුල යැ, බ්‍රාහ්මණකුල යි. "මහාකුල" නම් ක්ෂත්‍රියකුල යැ, බ්‍රාහ්මණකුල යැ, වෛශ්‍යකුල යි. මහාභොගකුල උදරභොගකුල වනාහි චතුර්විධයන් කෙරෙහි මැ සමාන වේ. සම්භවිකුලයෙක්හි ද උපන්නෙ පුණ්‍යබලයෙන් මහාභොග වේ මය යැ, උදරභොග වේ මැ යි.

මෙ සතරකුල යැ "කුල" නම්.

---

(197). සාධු භන්තෙ යන තන්හි "සාධු" ශබ්දය "සාධු භන්තෙ තිධෝ සො භික්ඛු භගවතො භාසිතං අභිනන්දිත්වා" යන තන්හි

සෙයින් සම්ප්‍රතිග්‍රහණයෙහි වැටෙයි. මෙයින් බැහැර "සාධු මෙ භන්තෙ භගවා සංඛිත්තෙන ධම්මං දෙසෙතු" යන තන්හි ආරාධනායෙහි වැටෙයි. "සාධු සාධු සාරිපුත්ත" යන තන්හි සම්ප්‍රහර්ෂණයෙහි වැටෙයි. "තෙන හි බ්‍රාහ්මණ සාධුකං සුණොහි" යන තන්හි දෘඪීකරණයෙහි වැටෙයි. "සාධු ධම්මරුචි රාජා සාධු පඤ්ඤාණවා නරො" යන තන්හි සුන්දරාර්ථයෙහි වැටෙයි.

ධාත්වාගමනකථා.

---

දුමින්දාගමන කථා.

(198). වාසං කප්පෙසි යනු යම්සෙ අනෙකරත්නයෙන් පරිපූර්ණ වූ මහනැවි බුන් පුවරු අතුරෙන් දියවදනා කලැ මුහුත්තයෙක්හි දු අධ්‍යුපෙක්ෂණීය නො වෙයි. ශීඝ්‍ර වැ විවරපිධාන කටයුතු වෙ. එසෙයින් මැ අභ්‍යන්තරයෙහි ශීලරත්නාදීන් නො නස්නා පරිද්දෙන් ක්ලෙශයන්ගෙ ප්‍රවෙශයට අවකාශ නො දී මුහුත්තයෙක්හි ද් උපෙක්ෂා නො වැ සතර ස්ථානයෙක්හි අප්‍රමත්ත වැ වුසුව යූ සෙ යි.

කවර සතර ස්ථාන යැ යත්?

වදාළෙ මැ නො:-

528. "චතුහි භික්ඛවෙ ඨානෙහි අප්පමාදො කරණීයො. කතමෙහි චතුහි? කායදුච්චරිතං භික්ඛවෙ පජහථ කායසුචරිතං

භාවෙථ තත්‍ථ ච මා පමාදත්‍ථ, වචීදුච්චරිතං භික්ඛවෙ පජහථ වචීසුචරිතං භාවෙථ තත්‍ථ ච මා පමාදත්‍ථ, මනොදුච්චරිතං භික්ඛවෙ පජහථ මනොසුචරිතං භාවෙථ තත්‍ථ ච මා පමා දත්‍ථ, මිච්ඡාදිට්ඨිං භික්ඛවෙ පජහථ සම්මාදිට්ඨිං භාවෙථ තත්‍ථ ච මා පමාදත්‍ථ. යතො ඛො භික්ඛවෙ භික්ඛු නො කාය දුච්චරිතං පහීනං හොති, කායසුචරිතං භාවිතං, වචීදුච්චරිතං පහීනං හොති වචීසුචරිතං භාවිතං, මනොදුච්චරිතං පහීනං හොති මනොසුචරිතං භාවිතං, මිච්ඡාදිට්ඨි පහීනා හොති සම්මාදිට්ඨි භාවිතා. සො න භායති යම්පරායිකස්ස-මරණස්ස"යි.

---

(199). අයත්‍ථඝාතාරහං යන තන්හි මහබොසැ සැත් පහර වන්නට නො නිසි පරිදි කිසෙ යැ යත්? එහි දැහැ වැ සැත් නො පැහැරිවියහැකි.

තථා හි.

මිළිඳු රජ නාසෙන්මහතෙරනට "බොරුක්මුලින් එක්බාපතක් ගෙන බැහැර පිව දෙවිසපුව ලැබෙති හො? නො ලැබෙති හො?"සි කීය. "මහරජ සසර සිටියහොත් සත්කප්සුවහසකුදු දෙවිරජ කෙරෙති" කිහු. මිළිඳුරජ "මෙසෙ බැවින් බොරුක් සහ කොළසහමුල්නෙන් උපුරුවා

බැහැර පිව හොත් පින්කම් එවර ද බොහො වෙයි. එබැවින් දඹදිව හැමරජුන් ගෙන්වා ගෙන පොරො හා හුදලු ගෙන්වා ගෙන දඹදිව්තෙලෙහි ඇතිතාක් බොරුක් කොටවා හුදැල්ලෙන් මුල් උපුරවා බොරුක් පයින් පැහැර පියවම් පින්කම් එවර ද බොහොවනු සඳහාය" යි කී. එසඳ මහතෙරහු රජු කියූ අසා "මහරජ තො කරකම් හා කරවයි?" යූහ. "නාසෙන මම් කරකම් කරවමි" යි කී. "මහරජ පුන පුනා කරකම් කරවත් තට දුකැ. තා සියුමැලිරජහට කොටුකර යෙන් දවදවා කෙස් බහවනු දු දුකට වැටෙන බැවින් තා කඳට ලා මැ කැපුව හොත් නැවත කෙස් නො නැඟෙනු වෙයි. තො එසෙ නො කොට නෑ වියහට සතුටුවිහි නම් සඟරා දෙහි දැහැවියෙහි නම් මරවහි. එසෙයින් මැ මහබොපරණලා හැමදැ හළ පින් බොහො[1] වෙයි. දැහැ වැ නියෙනු දු පහළ අවීචිමහනිරයැ පස්ති" යූහු. එසඳ මිලිඳු රජ සොම්නස් වැ අපොළා සාඩු කාර දින. දෙවිමිනිස්හු ගඳින් මලින් පිදූහු.

මහබො පිළිදග්නා සඳහා වූ කලැ ඔජොහරණශාඛා ද දිරා ගිය තැනු දු සිදුත් වටී.

එයින් කිහ සඟිඅටුවායෙහි:-

529. "බොධිපටිජඟනත්ථං ඔජොහරණසාඛං වා පුතිට්ඨානං වා ජිනදිතුං වට්ටතියෙව, සරීරපටිජඟනෙ විය පුඤ්ඤමපි හොති යෙව" යි.

---

[1] "බොහෝ" Ah. in ABD

(200). පීඨස්ස යන තන්හි "පීඨ" ශබ්දය ස්වර්ණපීඨයෙහි වැටෙයි. මෙයින් බැහැර "පාදපීඨං පාදකඨලිකං" යන තන්හි පා තබන්නට නිසි දුරු ඛණ්ඩයෙහි වැටෙයි. "පීඨසප්පි" යන තන්හි පඬුලයන් අතින් ගන්නට නිසි දඬුකඩැ වැටෙයි. "පීඨිකා" යන තන්හි ඇතම් ජනපදයෙකැ දෙශව්‍යවහාරවිසින් ආපණයෙහි වැටෙයි. "භූතපීඨිකා දෙවකුලපීඨිකා" යන තන්හි දෙවියනට බලි සාධන පිළැ වැටෙයි. "හද්දපීඨං උපනෙසි" යන තන්හි වෙත්‍රලතාදීන් උපරචිත අස්නෙහි වැටෙයි. "පීඨං තෙ සොවණ්ණමයං උළාරං" යන තන්හි පර්‍යාඩකයෙහි වැටෙයි.

---

(201). ජද්දන්ත දහං දස්සෙන්තා විය යන තන්හි සදත්දහ තළා නම් කවර යත්?

එහි මැද දෙළොස්යොජනක් තන්හි දිය දෙස්මුත් මිණිකදක් බඳු[1] පහන්දිය යැ. එදය වටා පළල යොජනක් තන්හි හුදු හෙල්මැලිවෙනෙන් පිරිඛෙවි ලදුයෙ යැ. හෙල් මැලිවනය වටා පළල යොජනක් තන්හි නිල්මහනෙල් වෙනෙන් පිරිඛෙවි ලදුයෙ යැ. එසෙයින් මැ යොජනක් තන්හි රත් මහනෙල්වෙනෙන්, යොජනක් තන්හි හෙළමහනෙල්වෙනෙන්, යොජනක් තන්හි රත්නෙළුම් වෙනෙන්, යොජනක් තන්හි හෙළ

---

[1] සේ BCL

නෙළුවෙනෙන් යොජනක් තන්හි කුමුදුවෙනෙන් පිරිඛෙවී ලදුයෙ යැ. මෙසේ සත් කුසුම්වනන්[1] වටා පළල යොජනක් තන්හි හෙල්මැලි නිල්මහනෙල් රත්මහනෙල් හෙළමහනෙල් රත්නෙළුඹු හෙළනෙළුඹු කුමුදු වෙනෙන් ව්‍යතිමිශ්‍ර වූ කුසුම් වෙනෙන් පිරිඛෙවී ලදුයෙ යැ. තුබූ තැනැ වර්ණනා වඩහිය සංයුක්තයෙහි කී පරිද්දෙන් දන්නෙ යැ.

මෙසෙයින් නන්විසිතුරු මුවරඳබර සුවඳගඳ වහන පියුම් වෙනෙන් සැදුමිලඳ ජලතල ඇති සඳත්දහතළා දක්වනුවන් බදු පස්පැහැ ඇති පද්මයන් විසින් ඒ මුහුදු සුපුෂ්පිත වී.

---

(202). උළාරාය පූජාය යන තන්හි "උළාර" ශබ්දය "අප්පමාණෝ උළ්ාරෝ ඔහාසෝ ලොකෙ පාතුරහොසි" යන තන්හි සෙයින් විපුල්‍යයෙහි වැටෙයි. "උළාරානි ඛාදනීයානි ඛාදන්ති" යන තන්හි මධුරයෙහි වැටෙයි. "උළාරාය ඛලු භවං වඣායනෝ සමණං ගොතමං පසංසාය පසංසති" යන තන්හි ශ්‍රේෂ්ඨයෙහි වැටෙයි.

---

(203). රාජා තඞ්ං සමයෙ යන තන්හි "සමය" ශබ්දය උණහ සමයෝ පරිළාහසමයෝ" යන තන්හි සෙයින් කාලයෙහි

---

[1]මෙසෙ සත්කුසුම්වෙනෙන්EP [1]මෙසත්කුසුම් වනCD

වැටෙයි. "අපෙව නාම සෙසපි උපසඞ්කමෙය්‍යාම කාලඤ්ච සමයඤ්ච උපාදාය" යන තන්හි සමවායයෙහි වැටෙයි. "එකොව ඛො යො භික්ඛවෙ ඛණො ච සමවායොව බ්‍රහ්ම චරියවාසාය" යන තන්හි ක්ෂණයෙහි වැටෙයි. "මහාසමයො පවනස්මිං" යන තන්හි සමූහයෙහි වැටෙයි. "සමයොපි ඛො තෙ භද්‍රාලි අප්පටි විද්ධා අහොසි" යන තන්හි හෙතුවැ වැටෙයි. "තෙන ඛො පන සමයෙන උග්ගහමානො පරිබ්බාජකො සමණමණ්ඩිකාපුත්තො සමයප්පවාදකෙ තින්දුකාචීරෙ එකසාලකෙ මල්ලිකාය ආරාමෙ පටිවසති" යන තන්හි දෘෂ්ටියැ වැටෙයි.

530. "දිට්ඨෙව ධම්මෙ යො අත්ථො යො ච සම්පරායිකො
අත්ථාභිසමයා ධීරො පණ්ඩිතොති පවුච්චති"

යන තන්හි ප්‍රතිලාභයෙහි වැටෙයි. "සමා මානාහි සමයා අන්තමකාසි දුක්ඛස්ස" යන තන්හි ප්‍රහාණියැ වැටෙයි. "දුක්ඛස්ස පීළනට්ඨො සඞ්ඛතට්ඨො සන්තාපට්ඨො විපරිණාමට්ඨො අභිසමයට්ඨො" යන තන්හි ප්‍රතිවෙධයෙහි වැටෙයි.

---

(204). බොධිගුත්තාදිහි පරිපාලිතා යනු බොධිගුප්තාදීන් විසින් මහබොසුතප්‍රේමයෙන් පරිපාලිත යැ යූ සෙ යි.

කිසෙ යැ යත්?

මෙරට මහබොපිහිටි හවුරුදු සියක් ඉකුත් කල්හි ලක්දිව මහලෙ විදුරිදුනාවො නම් කෙනෙක් වූහු. ඔහු මහබො

වැද දෑ වඳනට තුඹරුප් යන්නාහු උයන්වලැ පිවුරුපෙරෙවී සිටි පුරුෂ තෙනතුන් මෙවුන් සෙවුනා දැක "අප කුලදෙවියන්ගෙ වරදක් දුටුවිහ, ඔවුන්කෙරෙ කළ අප්‍රසාදයෙන් අපායභාග්‍ය වීහ, තෙ අප ඇස් ඇත්තෙන් කැරැණෙ යැ" යි ඇස් පුරා වැලි ඒවගෙත මිරිකා දෙඇස් නසා පිහ. පරිජනයෝ අවුදු වැලප වැහැස ගෙට ගෙන ගියහ. ඔවුන්ගෙ ගෘහයෙහි අධිෂ්ඨිත රාක්ෂසයෙක් ඔවුන් දුඃඛවෙදනායෙන් අභිභූත සෙ දැක "ඔවුන් කළ කම් උන්ට යැ තොප මෙදුක් වැඳගත් සෙකුමට යැ?" යි කීය. "ඒ තට කිවාහු කවරහ?" යි කිහ. "මම් මැ දත්මි" යි කීහ. එතැන සිට තමන්ගෙ ගෙහි වසා රාක්ෂසයා බවී දැන "යා මෙහි නො වසා" යි දැහැවියහ. හෙ "මෙ මහාපුරුෂයාගෙ ගුණ තුන්ලෙවිහි පහළ කළ මැනැවැ" යි පැන අඹමටයෙහි සිට තුන්යලක් කාලොද්ඝොෂණය කෙළෙ. එසඳ සියලු ලක්දිවිතෙලෙහි නසින් හා ඉවියෝ අවුදු රැස්වූහ. එ සමාගමයෙහි රාක්ෂස නාවන් කළ දෑ කීය. එකල්හි මහකෙළ නාරජ තමා අළ කඩුපුල්මලක් "මෙ උනට දෙව" යි දින, හෙ ඒ ගෙන ගොස් "මා කී සෙ නො යෙදෙයි; මට දඩුවමට මෙ මල ගන්නෙ ය" යි නාවනට දීහ. නාවො දිවමහනෙල් මලැ පියගඳින් සොමිනස් වැ "අප ඇස් ඇති කලක් වුව අප පුතණුවන් පළඳවා බලබලා හිඳිනාමිහ" යි කිහ. ඔවුන් එසෙ කී විගස අඳුරුයෙහි සතරරියනක් තැනැ වගුළ සිදුහතු හවුලා ගන්නට නියි දිවඇස් උපන. ඔහු එමැ වේලෙ ගොස් කඩුපුල් මල ගෙන මහබොකඳ පැළඳුවූහ. මල් නො මලා නො පර වැ

---

හවුරුදු තුන්සියක් මහබොයට පුදා ගෙනැ සිටියෙ යැ. එක්බිති ඒ වංශයෙහි උපන් කෙනෙක් මීමෙදෙන් උදම් වැ මලැ අත් පූහ. එකෙණෙහි මලින් වැහෙන කුසුම්දල බැස පොළොතල සැදී.

## දූමිඳුගමනකථා

(205). විරං තිට්ඨතු සද්ධම්මො යනු "බුදුන් විසින් සත්කාර ගරුකාර[1] නමස්කාර කොට නිසා වුසූ දහම් අමාරය වහන පුන්සඳක් සෙයින් සියල් ලෙවී සතහමින් බොහොකල් පවතීව" යි යූ සෙ යි.

බුදුන් දහම් නිසා වුසූ පරිදි කිසෙ යැ යත්?

බුදුහු ප්‍රථමාභිසම්බුද්ධ වැ "කා නිසා වෙසෙමි දෝ හෝ" යි සකලලොකධාතු බලන්නාහු යම්තැනෙක්හි තමන් හා සම කෙනකුන් හෝ තමනට වැඩි[2] සිටි කෙනකුන් හෝ නුදුටුහු.

එයින් වදළහ:-

531. "නාඤ්ඤං පනාහං පස්සාමි සදෙවකෙ ලොකෙ සමාරකෙ සබ්‍රහ්මකෙ සස්සමණබ්‍රාහ්මණියා පජාය සදෙවමනුස්සාය අඤ්ඤං සීලසමාධිං වා ප්‍රාඥමණං වා අත්තනා සීලසම්පන්නතරං යමහං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං" යි.

එසෙයින් මෑ සමාධීන් ප්‍රඥායෙන් විමුක්තීන් විමුක්තිඥාන දර්ශනයෙන් තමන් හා සමකෙනකුන් හෝ තමනට වැඩි සිටි කෙනකුන් හෝ නො දැක තමන් පිළිවිදූ දහම් නිසා වුසූහු.

---

[1] ගුරුකාර CDE  [2] වැඩෑ BCD

එයින් වදාළහ:-

532. "තස්ස මය්හං භික්ඛවෙ එතදහොසි: යන්නූනාහං යොපායං ධම්මො මයා අභිසම්බුද්ධො තමෙව ධම්මං සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරෙය්‍යං" යි.

එසඳ මහබඹ බුදුන්ගෙ පරිවිතර්ක දැන අවුදු බුදුන් වැඳ වට දැණී වැ මුදුනෙහි ඇඳිලි බැඳ හිඳ අතීතයෙහි බුදුන් දහම් නිසා වුසූ පරිදි, අනාගතයෙහි බුදුන් දහම් නිසා වසන පරිදි, දැන් අප බුදුන් දහම් නිසා වුසුව මනා පරිදි දක්වන්නට කීය.

533. "යෙපි තෙ භන්තෙ අහෙසුං අතීතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙපි භගවන්තො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරිංසු, යෙපි තෙ භන්තෙ භවිස්සති අනාගතමද්ධානං අරහන්තො සම්මාසම්බුද්ධා තෙපි භගවන්තො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරිස්සන්ති, භගවාපි භන්තෙ එතරහි අරහං සම්මාසම්බුද්ධො ධම්මඤ්ඤෙව සක්කත්වා ගරුකත්වා උපනිස්සාය විහරතු" යි.

අපි ච:-

නන්ද[1] මහතෙරුන් දෙවිරම් වෙහෙර උපස්ථාන ශාලා යෙහි වැඩහිඳ ධම් දෙසන කල්හි බුදුහු නො නහ[2] මැ ගොස් තියමුර සිට ධර්මකථා අසා දෙශනාපර්‍යවසානයෙහි සාධුකාර දුන්හ. මහතෙරහු අවුදු වැඳ "කවරවෙලෙක[3] වැඩිදැය වහන්සෙ?" යයි පුළුවුත්හ. "තා සූත්‍රයට ආරම්භ කළ විගසමැ

---

[1] නන්දකG [2] නො සනහාBCEF [2] නොසනාA
[3] කවරකලෙකB

ආමි" යි වදළහ. "වහන්සෙ කළ දැ දුෂ්කර යැ බුදුසුනුමාර වැ" යි කීහු. "ඉඳින් නන්දය, තෝ කපක් දවස් මෙසෙ හිඳ දෙසන්නට පොහොසත් විහි නම් කපක් දවසුදු මම සිට අසනු වෙමි" යි වදළෝ -

534. "සචෙ තුවං නන්ද කප්පං වා දෙසෙතුං සක්කුණෙය්‍යාසි කප්පමත්තම්පහං ඨිතකොව සුණෙය්‍යාං" යි.

මෙතෙකින් මෙ වංශයෙහි පරිකථානුකූල පද ගෙන ව්‍යාඛ්‍යාන කරනලදි.

ප්‍රකාශයන්ති සද්ධම්මං දීපයන්ති ච සත්ථවෙ
විභාතු භානුවද් භාතොරියං ධම්මප්‍රදීපිකා.-

ගුරුවරුන්ගෙන් විසින් කරන ලද "ධම්මප්‍රදීපිකා" නම් මහාබොධිවංශ පරිකථා නිමි.

---

(පෝතෝ හවුස්)

# APPENDIX

## SOURCES OF THE QUOTATIONS IN DHARMAPRADĪPIKĀ VA

---

The numbers indicate the quotations in order.

1-5. Probably quoted from oral tradition.

6. Pramāṇa-vārtikā, chap.4. stanzas 190-193.

7. Dhammapadaṭṭha-kathā, Buddha-vagga, Yamaka-pāṭihāriya vatthu.

8. Dīghanikāya, Pātheyya vagga, Lakkhaṇa-sutta.

9. The verses are quoted also in Jinālaṅkāra vaṇṇanā under the exegesis of 'Suppatiṭṭhitapādo'.

10. Dīghanikāya, Lakkhaṇa-sutta.

12. Jinālaṅkāra vaṇṇanā, end of Vijātamaṅgala-vaṇṇanā.

13. Jinālaṅkāro, v. 61.

14. Suttanipāta, Mahāvagga, Selasutta.

15&16. Aṅguttara-nikāya, 3.2. Saraviññāpanasutta.

17. Niddesa-Pāli, Sāriputta-sutta-niddesa 16.

18. Majjhima-nikāya, Mūlapaṇṇāsaka, Mahāsīhanāda-sutta.

19-32. See 17.

33. Pāṇini, 6. 3. 109.

34. Visuddhimagga, Buddhānussati niddesa where too the verse is quoted from some other source.

35. Visuddhimagga, Buddhānussati niddesa or Paṭisambhidāṭṭha kathā, Mahāvagga, Indriyakathā vaṇṇanā.

36. Niddesa Pāli, Tissametteyyasutta niddesa.

37-42. See 35. Sīlamaya-ñāna-niddesa.

43. See 17.

44. Jinālaṅkāra vaṇṇanā; in Navaguṇa-vaṇṇanā where too the verses appear to have been quoted from some other source.

45. Paṭisambhidāṭṭhakathā, Yuganandha-vagga, balakathā vaṇṇanā where the verse appears to have been quoted from tradition.

46. Aṅguttara-nikāya, 4. 1. Bhaṇḍagāma-vagga, Vesārajja sutta.

47-54. See 17.

55-56. Aṅguttara-nikāya, 5.4. Brāhmaṇa-vagga, Kāraṇapāla sutta.

57. Aṅguttara-nikāya ,4. 2. Apaṇṇaka-vagga, Acittaka sutta.

58. 'Sumaṅgala-vilāsinī' Dīghanikāyaṭṭhakathā, Sampasādanīya-sutta-vaṇṇanā.

59. See 17.

60. Mahāvaṃsa , 7. 42.

65. Aṅguttara-nikāya, 4. Mahāpaṇṇāsaka, Indriya-vagga, sutta,6.

68. Saṃyutta-nikāya , Anamatagga-saṃyutta, 1. 6.

69. See 68. 1. 5.

88-92. Aṅguttara-nikāya , 4. 2. Pattakammavagga, 2.

93-96. Aṅguttara-nikāya , 2. 1. 4. 2.

97-98. Aṅguttara-nikāya , 4. 1. 1. 6.

99-108. Saṃyutta-nikāya , anamatagga-saṃyutta; Tiṇakaṭṭha, assu, khīra, Tiṃsa, Duggata, Sukhita, Mātu-suttas.

109. Jātaka-Pāli, 2. Upasāḷhaka-Jātaka.

111. See 99. 1. Paṭhavī sutta.

113. Jātakaṭṭha-kathā, 60. Saṅkicca-Jātaka.

115. Saṃyutta-nikāya, Brahmasaṃyutta,1.or Aṅguttara nikāya ,10. Thera-vagga, Kokālika-sutta.

116-121. Aṅguttara-nikāya, 3. 1. or (11) Majjhima-nikāya, Upari Paṇṇāska, Suññata vagga, Devadūta sutta.

122-130. See 116. (11).

131. Jātakaṭṭhakathā, 60. Saṅkicca jātaka.

132.-141. Śiṣyalekhā-dharmakāvya of Candragomin.

142&143. See 122. Bālapaṇḍita sutta.

145. Aṅguttara-nikāya, 6. 2. Devatāvagga, Dānasutta or (11) Petavatthuppakaraṇa, Ubbarī-vagga, Aṅkurapeta-vatthu.

146&147. Aṅguttara-nikāya, 5. 1. 4. Suttas 2 and 6.

148-50. Aṅguttara-nikāya, 5. 3. Sappurisadāna-Asappurisadāna suttas.

151-154. Aṅguttara-nikāya, 5. 1. 4. Sumana-sutta.

155. Itivuttaka-Pāli, 1. 3. 6.

156. Aṅguttara-nikāya, 5. 1. 5. Manāpadāyī sutta.

157. Sumaṅgala-vilāsinī, Mahāpadāna sutta vaṇṇanā.

158&159. See 145. (11).

160. Aṅguttara-nikāya, 3. 2. Brāhmaṇa-vagga, vacaragotta paribbājaka-sutta.

161-163. See 158.

164. Saṃyutta-nikāya, Devatā-saṃyutta, Satullapakāyika-vagga, Sādhu-sutta or (11) Petavatthuppakaraṇa, Ubbarī-vagga, Aṅkurapeta vatthu.

165. Aṅguttara-nikāya, 9. 1. Sīhanāda vagga, Velama sutta.

166&167. Majjhima-nikāya, Upari-Paṇṇāsaka, Dakkhiṇā vibhaṅgasutta.

168. Aṅguttara-nikāya, 5. 1. Sumanavagga, Bhojana sutta.

169. Aṅguttara-nikāya, 8. 1. Dānavagga, Puññābhisanda-sutta.

170&171. Majjhima-nikāya, Mūlapaṇṇāsaka, Alagaddūpama sutta.

172. Dhammapada, Tanha vagga.

173-175. Majjhima-nikāya, Upari-Paṇṇāsaka, Saṅkhāruppatti sutta.

176. ''Papañca-Sūdanī'' Majjhimanikayaṭṭhakathā, Saṅkhāruppattisutta-vaṇṇanā.

177. Telakaṭāhagāthā, v. 78.

178. Dhammapada, Pāpa-vagga, v. 11.

179. Dhammapadaṭṭhakathā, Bālavagga, Kumuduppalānīta duggata-sevakassa-vatthu.

180. Jātaka-Pāli, Matakabhatta-jātaka.

183. See 169.

185. See 142.

187. Telakaṭāhagāthā , v. 79.

188. See 183.

189. Dhammapadaṭṭhakathā, citta vagga, Soreyyatthera-vatthu.

190. Telakaṭāha gāthā, v. 80.

192. Jātaka-Pāli, 4. Lohakumbhī-jātaka.

193. See 183.

194. Dhammapada, Lokavagga, v. 9.

195. Majjhima-nikāya, Majjhima-Paññāsaka,Ambalaṭṭhika-Rāhulovada sutta.

196. Telakaṭāha-gāthā ,v. 81.

197. See 183.

199. Saṃyutta-nikāya, vaṅgīsa-saṃyutta,Subhāsita sutta.

200. Aṅguttara-nikāya, 5.5. Akkosaka-vagga, Bahubhāṇī sutta; or Sutta-nipāta, Mahāvagga,Subhāsita sutta.

201. See 200. Here it is Mattabhāṇī sutta.

202. Telakaṭāha-gāthā, v. 82.

206. See 183.

208-213. Jātakamālā, Kumbhajātaka.

214-218. Suttanipāta, Cūlavagga, Dhammika sutta.

219. Quoted also in Visuddhimagga, Sīlaniddesa, A similar verse is found in 'Apadāna', Rāhulattherāpadana, 16.

220. Dīghanikāya , Mahāvagga, Mahāparinibbāna sutta.

221. Aṅguttara-nikāya, 5. 3. Tikaṇḍakī-vagga, Sagga-sutta.

222. Jātaka-Pāli, 3. Abbhantara-vagga, Sīlavīmaṃsa jātaka.

223&224. Theragāthā, 12. 1. 2. Sunītatthera-gāthā.

225. Theragāthā, Sīlavatthera-gāthā. 12. 1. 1.

226. Visuddhimagga, Sīlaniddesa.

227-229 Aṅguttaranikāya, 8. 3. Visākha sutta.

230-232. Aṅguttara-nikāya, 3. 1. Devadūta-vagga, Devarāja sutta.

233&234. Aṅguttara-nikāya, 8. 1. Uposatha-vagga, Anuruddha-sutta.

235. Aṅguttara-nikāya, 6. 1. Saraṇīya vagga, Maraṇasati-sutta.

239&240. Aṅguttara-nikāya, 5. 2. 1. Matāputtika-sutta.

241&242. Jātakaṭṭhakathā, 80. Kuṇāla-jātaka.

243. Aṅguttara-nikāya, 5. 5. Dīghacārika-vagga, Sappasutta.

244. See 241.

245. Jātakaṭṭhakathā, 1. 7. Andhabhūta-jātaka or see 241.

246-256. See 241.

257. Theragāthā, 6. Sabbakāmitthera-gāthā.

258. See 239.

259. Jātaka-Pāli, 11. Pānīya-jātaka.

260&261. See 239.

262&263. See 241.

264&265. Jātaka-Pāli, 3. 2. Mudupāṇī-jātaka.

266. Jātakaṭṭhakathā, 20. Mahāpalobhana-jātaka or see 241.

267-269. See 241.

270. See 243.

271. Suttanipāta, Uragavagga, Vijayasutta.

272&273. Jātaka-Pāli, 1. 2. Niggrodha-miga-jātaka.

275. See 241.

276. Pañcatantra, Mitrabheda, kathā 4.

277. Jātaka-Pāli, 6.1. Darīmukha-jātaka.

278. Majjhima-nikāya, Mūlapaṇṇāsaka, Alagaddūpama sutta.

279. See 259.

280. Jātaka-Pāli, 80. Mahāsutasoma-jātaka.

281. Jātaka-Pāli, 1. 9. Kimpakkajātaka.

282. Theragāthā, 29. 1. 2. Parāpariyatthera-gāthā.

283. See 279.

289. Aṅguttara-nikāya, 4. 1. Bhaṇḍagāma-vagga, Anusota-sutta.

290&291. Jātakaṭṭhakathā, 60. Soṇakajātaka.

292. Aṅguttara-nikāya, 4. 1. Cakka-vagga, Aparihāniya sutta .

293&294. Aṅguttara-nikāya, 4. 1. Uruvela-vagga, Kuhasutta.

295&296. Aṅguttara-nikāya, Rohitassa-vagga, Kodhasutta.

297&298. Aṅguttara-nikāya, 4. 1. Caravagga, Carasutta.

299. Aṅguttara-nikāya, 4. 1. 1. Taṇhā-sutta.

300&301. Itivuttaka-Pāli, 2. 5.

302&303. Theragāthā, 16. Aññākoṇḍaññattheragāthā.

306. Itivuttaka-Pāli, 3. 4. 7. or Dhammapada, 25.

307. Theragāthā, 30. Sāriputtattheragāthā.

309. Vibhaṅga, Saccaniddesa and in many suttas under the exegesis of 'Jāti'.

310. Visuddhimagga, Indriyasucca-niddesa, Jāti-vinicchaya.

311. See 309.

312. See 310. Jarā-vinicchaya.

313. See 309.

314-316. Quoted also in Visuddhimagga, Anussati-kammaṭṭhāna-niddesa.

317. Aṅguttara-nikāya, 5. 5. Akkosaka-vagga, Bhaṇḍana sutta.

318. Jātaka-Pāli, 4. 2. Khantivādī-Jātaka.

320. See 317. Khanti-sutta.

321. Bodhicaryāvatāra, chap. 6. v. 41.

322. Bodhicaryāvatāra, chap. 5. v. 12.

323. Dhammapada-Pāli, Yamaka-vagga.

324-326. 'Paramatthadīpanī' Cariyāpiṭaka-vaṇṇanā, Hatthināga-vagga, Cūlabodhi-cariyaṃ.

327. Jātakaṭṭha-kathā, 10. Cullabodhi-jātaka.

328. Jātakaṭṭha-kathā, 3. 1. 3. Jegucchī-Jātaka.

329. Majjhima-nikāya, 1. 3. Kakacūpama-sutta.

330. Aṅguttara-nikāya, 2. 4. Kodha-vagga, sutta 7.

331. 'Paramattha-dīpani' Cariyāpitaka-vaṇṇanā, Ekarāja-cariyaṃ.

333. Aṅguttara-nikāya, 4. 2. 1. Puññābhisanda-sutta.

334. Papañca-sūdanī, Uparipaṇṇāsaka, Araṇavibhaṅga-sutta-vaṇṇanā.

335. Aṅguttara-nikāya, 1. Metta-acchera-sutta.

336. Aṅguttara-nikāya, 8. 1. 1. Metta-sutta.

341. Aṅguttara-nikāya, 3. 1. 4. Madasutta.

342. Sumaṅgala-Vilāsinī, Samaññaphala-sutta-vaṇṇanā or Mahapadhāna-sutta-vaṇṇanā.

343. Sumaṅgala-Vilāsinī "Dīgha-nikāyaṭṭha-kathā", Samaññaphalasuttavaṇṇanā.

344. Saṃyutta-nikāya, Yakkha-saṃyutta, Ālavaka-sutta.

345. Majjhima-nikāya, Majjhima-Paṇṇāsaka, Brahmāyu sutta.

346. Dīgha-nikāya, Pātheyya-vagga, Sigāla-sutta.

347. Dhammapada, Buddha-vagga, v. 6.

348. Aṅguttara-nikāya, 1. Aṭṭhāna-Pāli, sutta 9.

349. Dīgha-nikāya, Mahāvagga, Mahāsamaya-sutta.

350. Saṃyutta-nikāya, Moggallāna-saṃyutta, sutta 10.

351. See 349.

353. Aṅguttara-nikāya, 8. 1. Gahapati-vagga, Mahānāma-sutta.

354. "Sumaṅgala-Vilāsinī" Dīghanikāyaṭṭhakathā, Samaññaphala-sutta-vaṇṇanā.

355. See 353.

356. Aṅguttara-nikāya, 5. 4. 3. Vānijja-sutta.

357. See 356. Caṇḍāla sutta.

358. See 356. Upāsaka-ratana-sutta.

359-368. Apadāna-Pāli, Uttarattherāpadāna. Similar stanzas found also in Tikanikara-pupphiyattherāpadāna.

369. Theragāthā, 1. 10. 6. Khaṇḍasumanatthera-gatha.

373. Saṃyutta-nikāya, Yakkha-saṃyutta, Sudatta-sutta.

374-377. Itivuttaka-Pāli, 3. 5. Sutta 1.

378-382. Itivuttaka-Pāli, 3. 3. Sutta 7.

383. Jātaka-Pāḷi, Mahā-Nipāta, Mahānārada-Kassapa-jātaka.

384&385. Jātakaṭṭhakathā, 13. Akitti-jātaka.

386. Aṅguttara-nikāya, 3. 1. 1. Bhayasutta.

387. Aṅguttara-nikāya, 1. 9. Pāpa-mitta-sutta.

388. See 387. Kalyāṇa-mitta-sutta.

391-399. Saṃyutta-nikāya, Dhātu samyuttaka, Hīnādhimuttika, Sagāthaka, Assaddha, Pañca-sikkhāpada, Dasakammapaṭa suttas.

400. "Paramattha-dīpanī", Itivuttakaṭṭhakathā 2. 1. 10. and many other places where "Āsavānaṃkhayāya" is explained.

402. Dīgha-nikāya, Pāṭhika-vagga, Cakkavatti-sīhanāda-sutta.

403&404. Aṅguttara-nikāya, 4. 1. Coravagga, Paññatti-sutta.

405. Dīgha-nikāya, Mahāvagga, Mahā-sudansana-sutta.

406. Itivuttaka-Pāli, 3. 4. Cavamāna-sutta.

407. Aṅguttara-nikāya, 5. 4. Brāhmaṇa-Vagga, Vassa-sutta.

408&409. Aṅguttara-nikaya, 4. 2. 2. Adhammika-sutta.

410&411. Aṅguttara-nikāya, 3. 1. Devadūta vagga, Sukhumāla-sutta. The intervening quotation from the commentary is also found in the notes of the same sutta in Manoratha-Pūranī.

412. Dīghanikāya, Pāṭhika-vagga, Pāsādika-sutta.

413. Jātaka-Pāli, Puṇṇaka-Jātaka.

414. Peta-vatthuppakaraṇa, Aṅkura-peta-vatthu.

415. Jātakaṭṭhakathā, 10. Mahā-Dhammapāla Jātaka.

416. Jātakaṭṭhakathā, Mahā-Nipāta, Nimi-Jātaka.

417. Jātakaṭṭhakathā, Gāmiṇī Jātaka.

418. Aṅguttara-nikāya, 5. 4. Brāhmaṇa-vagga, Supina-sutta.

419. Sārasvata, Karmadhāra-samāsa-prakriyā.

420. "Sārattha-ppakāsinī" Saṃyutta-nikāyaṭṭhakathā, 4. 3. 2. 1.

421. Jātakaṭṭhakathā, 20. Ayoghara Jātaka.

422. Mahāvagga-Pāli, Brahmāyacana-kathā or Saṃyutta nikāya, Brahma-saṃyutta, 1. Āyācana-sutta.

423. Aṅguttara-nikāya, 4. 3. Kesi-sutta.

424. Majjhima-nikāya, Mūla-Paṇṇāsaka, Ariyapariye-sana-sutta or Mahāvagga Pāli, Mahākkhandhaka, Paṭhamaka-bhāṇavāra.

425. Saṃyutta-nikāya, Devatā-saṃyutta, Ghaṭīkāra sutta.

426. "Papañca-Sūdanī" Majjhima-nikāyaṭṭhakathā, Pāyāsi-sutta-vaṇṇanā.

427. Saṃyutta-nikāya, Sacca-saṃyuttaka, Dhamma-cakka-sutta.

428. Suttanipātaṭṭhakathā, Parābhava-sutta-vaṇṇanā.

429. Mahāvagga-Pāli, Mahākkhandhaka, 3. Uruvela Pāṭihāriyakaṇḍa.

430. "Papañca-Sūdani" Majjhima-nikāyaṭṭhakathā, Sabbasava-sutta-vannana.

431-433. Aṅguttara-nikāya, 3. 2. 3. Avakujja-sutta.

434. Dhammasaṅgaṇippakaraṇa, Cittuppāda Kaṇḍa.

435. Paṭisambhidāṭṭha-kathā, Mahāvagga, Sīlamaya-Ñāṇa-niddesa. or Sumaṅgala-Vilāsinī, Brahmajāla sutta-vaṇṇanā.

436-437. Manoratha-pūraṇī, Ekaka nipāta-vaṇṇanā, or Sumaṅgala-Vilāsinī, Brahmajāla-sutta vaṇṇanā.

438. Sumaṅgala-Vilāsinī, Brahmajāla-sutta-vaṇṇanā or Iti-vuttakaṭṭhakathā, vagga 1. In Manoratha Pūraṇī, the stanzas are referred to as "Porāṇaṭṭha Kathāya vuttaṃ."

442. Aṅguttara-nikāya, 4. 1. Uruvela-vagga, Loka sutta.

443. Dīgha-nikāya, 3. Pāsādika- sutta.

444. Aṅguttara-nikāya, 4. 1. 3. Tatiya-Loka-sutta.

445. See 442.

446. Dhammapada, 21. 8.

447. Aṅguttara-nikāya, 4. 1. 5. Vipallāsa-sutta.

448. Aṅguttara-nikāya, 4. 1. Cakka-vagga, Sīha-sutta.

449&450. Aṅguttara-nikāya, 4. 5. Sappurisa-vagga, Pāpa-dhamma-sutta.

451. Sutta-nipāta, Mahā-vagga, Sabhiya-sutta.

452. Majjhima-nikāya, Majjhima Paṇṇāsaka, Vāseṭṭha-sutta.

455. Aṅguttara-nikāya, 3. 1. Devadūta-vagga, Hatthā ~~Ā~~lavaka-sutta.

456. "Papañca-Sūdanī" Majjhima-nikāyaṭṭhakathā, Upari-Paṇṇāsaka, 3. Ariyadhamma-sutta-vaṇṇanā.

457. Śiṣya-lekhā-dharma-kāvya of Candragomin

458. Iti Vuttaka Pāli, 4. Sutta 10.

459. Aṅguttara-nikāya, 5. 1. Muṇḍarāja-vagga, Dhana-sutta.

460. Aṅguttara-nikāya, 7. 1. Dhanasutta.

462. Aṅguttara-nikāya, 4. Cakkavagga, sutta 4.

463. Aṅguttara-nikāya, 1. Ekapuggala-vagga, sutta 6.

465. Paṭisambhidā-Pāli, Yamaka-Pāṭihīra-Ñāṇa-kathā.

468. Saṃyutta-nikāya, Brahmasaṃyuttaka,2. 4. Aruṇavatī-sutta. Note the slight adjustment of the text made.

469. Aṅguttara-nikāya, 1. Ekapuggala-vagga, sutta 3

470&471. Dhammapadaṭṭhakathā, Buddha-vagga, Yamaka-pāṭihāriya-vatthu.

472. Abhidhānappadīpikā, v. 131. Note the slight difference.

473. Aṅguttara-nikāya, 5. 1. 2. Hitasutta.

474. Aṅguttara-nikāya, 4. 2. 4. Saññojana-sutta.

475&476. Majjhima-nikāya, Mūlapariyāya-vagga,Anaṅgaṇa-sutta.

477. Aṅguttara-nikāya, 4. 1. 3. Ariyavaṃsa-sutta.

479. Iti-Vuttaka-Pāli, 3. 5. Sutta 2.

480. Aṅguttara-nikāya, 4. 1. 3. Kuha-sutta.

482. Aṅguttara-nikāya, 8. 1. 2. Pahārada-sutta or Udāna Pāli, 5, sutta 5. The third marvel in the Dhamma and Vinaya.

483. Aṅguttara-nikāya, 4.1. 2. Padhāna-sutta.

484. Paṭisambhidāṭṭha-kathā, Mahāvagga,Sīlamaya-Ñāṇa-niddesa.

485. See 482. The second marvel in the Dhamma and Vinaya.

486. Saṃyutta-nikāya, Sotāpatti-saṃyuttaka, Sappaññā vagga, suttas 9. 10. 11 . and Mahāpaññavagga, Suttas 1-13.

487. Aṅguttara-nikāya, 5. 3. 1. Sīlasampanna-sutta.

488. Jātaka-Pāli, 40. Sarabhaṅga-Jātaka.

489. Jātaka-Pāli, 30. Sambhava-Jātaka.

490. Ratnāvalī, 1. 5.

491. Aṅguttara-nikāya, 5. 3. 4. Cakkānuvattana-sutta.

494. Dīgha-nikāya, 3. Pāsādika-sutta.

495. Aṅguttara-nikāya, 8. 2. Sati-vagga, Yaso-sutta.

496. Aṅguttara-nikāya, 4. 2. 2. Rūpa-sutta.

498. Aṅguttara-nikāya, 4. 3. 2. Dassanīya-sutta.

499. Iti-vuttaka-Pāli, 2. 2. sutta 7.

500&501. Niddesa-Pāli, Mahā-viyūha-sutta-niddesa.

502. Aṅguttara-nikāya, 5. 2. 5. Buddha-pabbajita-sutta .

503&504. Aṅguttara-nikāya, 4. 1. Caravagga, Agati-nāgati-suttas.

505. Aṅguttara-nikāya, 1. 1. Kālakiriya-sutta.

506. Aṅguttara-nikāya, 4. 5. Seyyasutta.

507. Majjhima-nikāya, Mahāyamaka-vagga, Cūlagopāla sutta.

508. Pārājika-Pāli, Uttari-manussa-dhamma-pārājika.

509. Suttanipātaṭṭhakathā, Cūla-vagga, Ratana-sutta-vaṇṇanā.

510. Aṅguttara-nikāya, 5. 4. 5. Piṅgiyāni-sutta.

511. Aṅguttara-nikāya, 7. Vassakāra-sutta.

512. Udāna-Pāli, Pāṭaligāmiya-vagga , sutta 7.

513. Culla-vagga-Pāli, Sattasatika-kkhandhaka.

514&515. Aṅguttara-nikāya, 3. 1. 5. Mahā-cora-sutta.

516&517. Aṅguttara-nikāya, 4. 1. 1. Khata-akkhata suttas.

518. Aṅguttara-nikāya, 31 1. 5. Pabbata-sutta.

519. Aṅguttara-nikāya, 4. 5. 4. Samaṇa-sutta.

520&521. Aṅguttara-nikāya, 2. 1. 4. Cora-sutta.

522. Aṅguttara-nikāya, 4. Apaṇṇaka-vagga, sutta 3.

523. Itivuttaka-Pāli, 3. 5. sutta 10.

524. Aṅguttaranikāya, 3. Hatthālavakasutta.

525. Majjhimanikāya, Uparipaṇṇāsaka, Dakkhinā-vibhaṅgasutta.

526. Aṅguttaranikāya, 5. 3. 5. Sārandadasutta.

527. Aṅguttaranikāya, 5. 3. 3. Sampadāsutta.

528. Aṅguttaranikāya, 4. 3.2. Appamādasutta.

529. "Papañcasūdanī" Majjhimanikāyaṭṭhakathā, Uparipaṇṇāsaka, Vagga 2. Bahudhātukasutta. vaṇṇanā. or "Manorathapūranī" Ekaka-nipāta, aṭṭhāna-pāli-vaṇṇanā.

530. Dhammapada, Paṇḍita-vagga.

531-533. Saṃyutta-nikāya, Brahmasaṃyutta, 1. Gāravasutta.

---

Quotations the sources of which have not been traced

---

61-62. (p.79) Skt. Different meanings of 'Artha'

63-67. (pp.80-81) Skt. Cosmological accounts.

70-5. (pp.83-85) Skt. Cosmological accounts.

77-87. (pp.86-88) Skt. Cosmological accounts.

112(p.102) Skt. Names of eight apāyas

114(p.107) Skt. Duration of life in avīci

144(p.126) Skt. Span of life of animals etc.

181(p.161) Skt. On killing the living beings.

184 (p.162) Skt. On stealing.

186 (p.163) Skt. On stealing.

191 (p.167) Skt. on adultery.

207. (p.174) Skt. on taking intoxicants.

236-238 (pp.198-199) Skt. Foul smell of women.

284-288 (pp.222-224) Skt. On sensual pleasures.

308. (p.231) P. The pleasure gained by samādhi

319 (p.243) Skt. Good men

371 (p.275) P. delight taken in the Sangha.

390 (p.283) Skt. Association with the good and avoiding the wicked.

464 (p.393) P. Miraculous powers of the Buddha. (gāthās of the Vasanta-tilakā metre)

467 (p.397) P. On the twin-miracle of the Buddha. (gāthās of the Vasanta-tilakā metre).

478 (p.411) P. Difference between kāya-viveka and citta-viveka.

492 (p.433) P. Names of 80 chief disciples of the Buddha, (gāthās of Anuṣṭubh metre).

Of the sources given in the Appendix Nos.208-213, 321 and 322 had been traced by Paraṇa-vitāna[1] and guidance to Nos. 6, 132-141, 457 and 490 has been given by Goḍakuṁbura[2].

---

[1] "Mahāyānism of Ceylon, Journal of Science, Section G..Vol.II.

[2] Ceylon University Review, Vol. I, Pt. I.

# BIBLIOGRAPHY

## Texts


Agni-Purāna, ed. by Rajendra lal Mitra, Calcutta, 1873.

Amāvatura (Gurulu-Gōmi), ed. by Revd. Välivitiye Sorata, Colombo, 1931.

Dhampiyā-aṭuvā-gāṭapadaya (Kassapa v), ed. by D.B.Jayatilaka, Colombo, 1932.

Dharma-Pradīpikāva (Gurulu-Gōmi), ed. by Sri Dharmārāma Thera Pāliyagoda, 1906.

Jinālankāra (Buddharakkhita), ed. by Revd. W. Dīpankara ) " B. Dhammapāla ), 1900.

Jinālankāra (Buddharakkhita), ed. by Professor James Gray, London, 1894.

Mahābodhi-Vaṃsa (Upatissa), ed. by S.A. Strong, London, 1891.

Mahābodhivaṃsa-Granthipada-vivaraṇaya (Rājamurāri), ed. by Revd. R. Sri Dharmārāma, Pāliyagoda, 1910.

Mayūra-Sandēsaya (Kavīśvara), ed. by M. Kumāraṇatuṅga, Pānādura, 1938.

Medinī-koṣa.

Sidat-Saṅgarā (Patiraja Piruvana), ed. by M. Kumaranatuṅga, Pānadura, 1940.

Sinhala-Bodhi-Vaṃsa (Vilgammula Sangharāja) ed, by Palannoruvē Vimaladharma, Colombo, 1936.

Śabda-Kalpa-druma.


---

## General Works


H.W.Codrington, A Short History of Ceylon, London, 1926.

Wilhelm Geiger, Translation of Cūlavaṃsa, Oxford University Press, 1930.

G.P. Malalasekara, The Pāli Literature of Ceylon, London, 1928.

S. Paraṇa Vitāna, Journal of Science, Section G. Colombo.

98227

# A CRITICAL STUDY
# OF
# DHARMAPRADIPIKAVA

SUPPLEMENT TO THE
THESIS SUBMITTED FOR THE DEGREE
OF
DOCTOR OF PHILOSOPHY
IN THE
UNIVERSITY OF LONDON

BY

M. SRI RAMMANDALA, M. A. (London)

1954

17/5/54


SCHOOL OF ORIENTAL AND AFRICAN STUDIES
UNIVERSITY OF LONDON

CONTENTS


| | Pages |
|---|---|
| Chapter One | |
| The Text (A Criticism) | 1-18 |
| Chapter Two | |
| Mahabodhivamsa and its accessory works | 19-25 |
| Chapter Three | |
| Mahābodhivamsagranthipadavivaranaya and Dharmapradīpikāva | 26-36 |
| Chapter Four | |
| The General Trends of the time during which Dharmapradīpikāva was written. | 37-46 |
| Chapter Five | |
| Author and His Time | 47-58 |
| Chapter Six | |
